දික්සඟිය

(භාවය)

දික්සඟිය

(හාවය)

බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය
මහානායක ස්ථවිරයන් වහන්සේ
(අග්ගමහාපණ්ඩිත. සාහිත්‍යසූරි)

1965

දික්සඟිය

(භාවය)

සකසු:

විද්‍යෝදය විශ්වවිද්‍යාලයයේ බුද්ධධර්මාංශයයේ විනේතෘ,
අග්‍රමහාපණ්ඩිත, ශාසනසූරී
(D. Litt. Hon)
බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය
මහානායකස්ථවිරයන් වහන්සේ

පළ කැරැවුවෝ:
අභය ප්‍රකාශකයෝ
234, ගාලුපාර,
ගල්කිස්ස.

මුද්‍රණය:
ඩබ්ලිව්. ඩී. ජේ. රත්නායක
අතුල මුද්‍රණාලය
98, ඩීන්ස් පාර,
කොළොඹ 10.

2508

හැඳින්වීම

ශ්‍රීමත් තථාගත ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්සේ ද තච්ඡ්‍රාවක බොහෝ රහතුන් වහන්සේ ද වදාළ තාක් ධර්මයෙන් ප්‍රථම සංගීතියට නැඟුණු දෑ 'ත්‍රිපිටකය 'යන නමින් වැහැරුවෙයි. එහි ද නිකායාන්තරිකයන්ගේ ධර්මග්‍රන්ථ අළුතෙන් බහාලන ලද බොහෝ මිථ්‍යා මතයෙන් කිලිටි වැ ඇත. ස්ථවිරවාද (ථේරවාද) නමින් වැහැරුවෙන ධර්ම අතුරෙහි ද මිහිඳු මාහිමියන් විසින් ගෙනෙන ලද, හෙළදිවැ අනුරාධපුර මහාවිහාරයෙහි සඞ්ඝයා විසින් රැක ගත්, වළගම්බා මහ රජු දවස පුස්තකාරූඪ කැරුණු ශුද්ධමාගධීභාෂාමය ත්‍රිපිටකය පරිශුද්ධ ය. මෙහි යථා-තත්ත්වය තේරුම් නොගත් ඇතැම් කෙනකු මෙහි ද කිලිටි වූ තැන් ඇතැ යි කියතුදු ඒ වනාහි පිළිගත හැකි තරම් යුක්තිමත් සාධක නැති ඔවුන් ගේ 'අත්තනෝමති' මාත්‍ර ම ය. දෙවෙනි තෙවෙනි සංගීතිවලදී මෙයට යම් දහම්කොටස් එක් කැරිණි නම් එය අටුවාහි නො වළහා ම සඳහන් කරන ලද්දේ ය. ඒ හැර ඉතිරි සියල්ලෙහි වූ බුද්ධවචන බුදුරජුන් ධරමාණ සමය-යෙහි ම ඔබ වෙතින් අනඳමහතෙරුන් ද උපාලිමහතෙර ආදීන් ද අසා දරා සිය අතැවැසියනට පුහුණු කළ යලි පළමු ධර්ම සංගීතියේදී ඒ සැටියෙන් ම තබන ලද ධර්ම ම ය. අටුවාවනට කලින් කලැ කිසි බාහිරක මත එකතු වන්නට බැරි නැත. එහෙත් නිකායාන්තරිකයන් ගේ අටුවා තරම් මහාවිහාරික අටුවා කිලිටි නොවී ය. එය ද බුදුගොස් තෙරුන් හෙළබසින් තුබූ දෑය ම සකසා පෙළබසට නැගුයෙන් එයින් පසු අළුත් මතයකට ඇතුළු වන්නට ඉඩෙක් නො වී ය. ඉදින් අටුවාවට බාහිරක මතයක් ඇතුළු වූයේ නම්, එය වූයේ හෙළඅටුවා හෙළදිවැ මුවපරපුරින් ගෙනෙන අතරැ යැ. ඒ ද ධර්මයට නො වැ නිදසුන් වියින් දැක්වුණු කථාවස්තු ලෝකප්‍රවෘත්ති ආදි අප්‍රධාන දෑයට ය. පාලි ත්‍රිපිටකධර්මය එ දා සේ ම අද ද නිර්මල වැ මෙහි ඇත.

මේ පිටක ධර්මය සූත්‍රාභිධර්ම විනය විසින් කොටස් තුනෙකින් යුක්ත ය. එහි සූත්‍රපිටකය යනු දීඝාගම මජ්ඣිමාගම සංයුත්තාගම අංගුත්තරාගම ඛුද්දකාගම යැ යි සඟි පසෙකින් පරිපූර්ණ ය. එයින් දීඝාගමය (දික්සඟිය) දික් සූත්‍ර සූතිසෙකින් ප්‍රමිත ය. ඒ හැම සූත්‍රයෙක ම මුවපරපුරින් ගෙන ඊමේ පහසුව සලකා පළමු සංගීතියේදී ම පුන පුනා යෙදුණු එක්බඳු වාසගම් බොහෝ ය. ඒවා හැර දේශනා සාරාංශය හෙළබසින් ලියා පළ කළොත් මැනැවැ යි ද, එය දහම් උගන්නවුනට රුකුලෙකැ යි ද, විස්තාරරුචිකයනට

පළමුයෙන් මේය කියවා සැකෙවින් දැන පසු වැ පාලිය කියවා තේරුම් ගනුවට බස්වන දෙරක් බඳු වෙතැ යි ද සිතා මෙයින් තිස් හවුරුද්දකට ද පෙර **සංක්ෂිප්ත දික්සඟිය** නම් පොතක් පලකැරැවූම්හ. මේ වර එ තරම් ම සංක්ෂිප්ත නො කොට එයට වඩා සවිස්තර කොට මෙය සැකැසූම්හ. මෙය හදාළාහට පාලි දීඝනිකාය තේරුම් ගැන්ම පහසු වෙයි.

මෙහි ශුඩිපත්‍රය අනුව වැරැදි තැන් සකස් කොට ගෙන එයින් පසු ම මෙය කියවනු සුදුසු ය.

මේ ග්‍රන්ථය ධර්මකාමීන් ගේ මනදෙළ පුරවනු සමත් වේ වා. මෙ සේ ම මැදුම්සඟිය ද නොබෝ කල්හි එළි දකිනු ඇත.

මෙයට,
බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය සථවිර

2508 දුරුතු පුරපැළවිය ලත් රිවි දින
(1965 ජනවාරි 3)
ගංගොඩවිලැ
විද්‍යෝදයවිශ්වවිද්‍යාලයයේ දී යැ.

පටුන

	I ශීලස්කන්ධවර්ගය	**පිටු**
1.	බ්‍රහ්මජාල සූත්‍රය	1 – 20
2.	සාමඤ්ඤඵල සූත්‍රය	20 – 28
3.	අම්බට්ඨ සූත්‍රය	29 – 36
4.	සෝණදණ්ඩ සූත්‍රය	36 – 42
5.	කූටදන්ත සූත්‍රය	42 – 49
6.	මහාලි සූත්‍රය	50 – 52
7.	ජාලිය සූත්‍රය	52 – 53
8.	මහාසීහනාද සූත්‍රය	53 – 62
9.	පොට්ඨපාද සූත්‍රය	62 – 74
10.	ශුභ සූත්‍රය	75 – 81
11.	කේවට්ට සූත්‍රය	82 – 86
12.	ලෝහිච්ච සූත්‍රය	87 – 91
13.	තේවිජ්ජ සූත්‍රය	91 – 99
	II මහාවර්ගය	
14.	මහාපදාන සූත්‍රය	99 – 117
15.	මහානිදාන සූත්‍රය	117 – 129
16.	මහාපරිනිර්වාණ සූත්‍රය	130 – 148
17.	මහාසුදර්ශන සූත්‍රය	148 – 151
18.	ජනවසභ සූත්‍රය	152 – 156
19.	මහාගෝවින්ද සූත්‍රය	156 – 161
20.	මහාසමය සූත්‍රය	162 – 167
21.	සක්කපඤ්හ සූත්‍රය	167 – 177
22.	මහාසතිපට්ඨාන සූත්‍රය	177 – 191
23.	පායාසි සූත්‍රය	191 – 204
	III පාථිකවර්ගය	
24.	පාථික සූත්‍රය	205 – 212
25.	උදුම්බරික සූත්‍රය	212 – 222
26.	චක්‍රවර්ති සූත්‍රය	222 – 230

		පිටු
27.	අග්ගඤ්ඤ සූත්‍රය	231 – 237
28.	සම්ප්‍රසාදනීය සූත්‍රය	237 – 241
29.	ප්‍රාසාදික සූත්‍රය	241 – 249
30.	ලක්ෂණ සූත්‍රය	249 – 253
31.	සිගාලක සූත්‍රය	253 – 258
32.	ආටානාටිය සූත්‍රය	258 – 261
33.	සංගීති සූත්‍රය	261 – 299
33.	දසුත්තර සූත්‍රය	300 – 316
	උපග්‍රන්ථය	317 – 352
	පදානුක්‍රමණිකා	353 - 372

ශුඩිපත්‍රය

පිට	පෙල	අශුඩ	ශුඩ
7	7	වැලැකේ	වැලැක්කේ
13	16	ඇතැම්හු	ඇතැම් දෙවියෝ
21	32	සත්සුන්	සංසුන්
22	27	පෙලෙන්නහුට	පෙලන්නහුට
23	17	ගොසාලමසකරිත්	ගෝශාලමසකරිත්
24	16	කෙරෙත් යැ යි.	කෙරෙත් යැ යි,
25	4	පකුධයන්	කකුධයන්
27	10	දූක්ඛ දූක්ඛියැ	දූක්ඛැ
30	25	සිල්	සිල් ද ඉන් පසු සමාධි ප්‍රඥා ද
36	36	බතත	බතත
38	23	ජම	යැම
40	23	අනෙකක්	අනෙකෙක්
41	21	ගැණ	ගැන
43	23	පරිකරත්	පිරිකරත්
46	15	බමුහුණුහු	බමුණුහු
53	24	වෙසති	වෙසෙති
54	34	සවුසගන	සවු සඟගණ
57	34	බමුණැ යි	බමුණැ යි ද
59	9	ගෙයෙක යැ යි,	ගෙයෙක යැ යි ද
62	19	තන්වැදූරුම්	නත්වැදූරුම්
64	24	දෙතේ	දෙවෙති
69	31	වත්තේත් නොවත්තේත් වෙතැයි	වනුත් නොවනුත් ඇතැයි
69	33	නොම වත්තේත් නොම නොවත්තේත් වෙතැයි	නො ම වනුත් නො ම නොවනුත් ඇතැයි
75	10	සුබ	සුබ
81	32	නේවසඤ්ඤායතනය	නේවසඤ්ඤානාසඤ්ඤ-යතනය
86	28	පාමිණෙන	පැමිණෙන
90	9	ඔහු බස	ඔවුන් බස
93	17	අට්ටකවාමදේවාදි	අට්ටකවාමකාදි
97	3	මතසාකට	මනසාකට
114	29	මොවුන්	මොවුන්
123	32	සමුදාචාර්රතෘණා	සමුදාචාරතෘෂ්ණා
128	8	සිතට ආයතන	ආයතන
136	33	දන්වැටීම්	දත්වැටීම්
140	6	කි පමණින්	කී පමණින්

පිට	පෙළ	අශුඩ	ශුඩ
153	32	වදුරා	කියා
189	12	දුඃඛසමුදයාඨී සත්‍යය	දුඃඛසමුදයාඨීසත්‍යය
191	18	සේතව්‍ය	සේතව්‍යා
191	38	මෙතැන මැරී	මැරි
205	33	කථාවා	කථාව
206	12	භාවගීය	භාර්ගවය
206	37	රෝභසෙකි	රෝගයෙකි
207	11	ඬිදීම,	ඬිදීම, බඹසර රැක්ම,
207	12	නොයෑම,	නොයෑම, දකුණු දිගින් ගෝතමක දෙවොලින් එ පිට නොයෑම
214	25	දෙනෙකුන්	දෙනෙකු
217	3	එකෙක් ම	එකෙක් ම ද
218	34, 37	ඵලය	ඵලය
222	14	සංලාපය	සංලාපය,
224	5	ගත්හ	ගත්න
224	7	ගත්	ගත්න
224	31	දියමත් ද	දිමෙන් ද
224	34	පරිදි	පරිදි ඔවුන්
225	14	අබියෙස්	අබිසෙස්
228	6	ගුරබිරිය	ගුරුබිරිය
228	18	දෙදෙනකුනට	දෙදෙනකුට
228	30	අන්තර්කල්පය	අන්තඃකල්පය
228	30	දුර්භික්ෂාන්තර්කල්පය	දුර්භික්ෂාන්තඃකල්පය
228	31	ශස්ත්‍රාන්තර්කල්ප	ශස්ත්‍රාන්තඃකල්ප
233	23	එසිට	එයට
235	34	නම්	නම
242	28	වෙනි	වෙයි
245	36	නො විය	නො විය
253	5	බෙ-සතුන් ගේ	බෝසතුන් ගේ කුශලකර්ම
253	31	සැදූහැවහ	සැදූහැවත්
257	31	ඔවාදී	ඔවා දී
263	24	කුශලතා	කුසලතා
266	7	දිට්ඨවිපත්තිය	දිට්ඨිවිපත්තිය
271	9	අවිපරි-	විපරි-
283	26	අවිද්‍යෝස	අවිද්‍යෞඝ
286	21	අචේලකයා	අචේලකයා
295	8	කායසාක්ෂ්‍ය	කායසාක්ෂි
295	16	තස්ස පාපියසිකාව	තස්සපාපියසිකාව
303	36	තුණ	තුන
315	32	කාස	කාය-

දික්සඟිය

ඒ බගවත් රහත් සම්මාසම්බුදුරජුන් වහන්සේට
මගේ නැමදුම වේ වා.

බ්‍රහමජාල සූත්‍රය

1. එක් සමයෙක අප බුදුරජුහු මහත් මහණවුළුවක් හා **රජගහ** නුවරටත් නාලන්ද නුවරටත් අතර මහ මහට පිළිපන්හ. එ සෙමෙහි ම **සුප්පිය** නම් පිරිවැජ්ජෙක් ද **බඹදත්** නම් සිය අතැවැස්සා ද (තව අතැවැසි පිරිවැජිමුළුවක් ද) කැටුව එ මහට ම බටුයේ ය. එසේ යන **සුප්පිය** පිරිවැජි නොයෙක් කරුණු පපා බුදුරජුනට ද දහමට ද සඟනට ද දෙස් කියයි. එහෙත් ඔහු අතැවැසි බඹදත් මණෙවු නොයෙක් කරුණින් බුදුරජුන් ද දහම් ද සඟන ද යන තුනුරුවන්හි ගුණ කියයි. මෙසේ ඒ ඇදුරු අතැවැසි දෙදෙනා එකෙක් අනෙකාට ඉදුරා ම පටහැනි කතා ඇතියෝ බුදුරජුනුන් බික්සඟනත් පසු පස ම ගියහ.

2. එක්බිති බුදුරජුහු බික්සඟන හා නාලන්දයෙහි අඹයැටි[1] උයනැ රජගෙරෙහි[2] එක් රැයකට නවාතන් ගත්හ. සුප්පියයා ද අතැවැසියා හා (සෙසු අතැවැසි පිරිස ද හා) එහි ම පසෙක නවාතන් ගත. එහිදී ද සුප්පිය තෙමේ තෙරුවනට දෙස් නැඟී ය. ඔහු අතැවැසි බඹදත් තෙම තෙරුවන් ගුණ ම කී ය.

3. එ රැයැ අලුයම්හි නැඟී සිටැ හිඳුම්හලෙහි[3] රැස් වැ හුන් මහණ වහන්දෑවරුන් අතර,

"ඇවැත්නි, සියල්ල දන්නා සියල්ල දක්නා ඒ බගවත් රහත් සම්මාසම්බුදුන් විසින් සතුන් එකකු අනෙකකුට වෙනස් අදහස් ඇති නියා දූන වදළ සැටි කොතරම් අසිරි ද! මේ පිරිවැජ්ජාත් මොහු අතැවැසියාත් දෙදෙනා ගෙන් එකෙක්

1. අඹයැටි උයන = අම්බලට්ඨිකා උයන. අම්බලට්ඨිකා යනු අඹ පැලය යි. උයන දෙර අඹපැලයක් වූයෙන් උයන ද අම්බලට්ඨිකා නම් විය
2. රජගෙරෙහි = රාජාගාරකායෙහි. එ උයනෙහි රජු ගේ ක්‍රීඩා පිණිස කැරුණු පහයෙක් විය. ඉම් රාජාගාරකා යි දක්විණ. 3. හිඳුම්හලෙහි = නිෂීදන ශාලායෙහි.

තෙරුවනට දෙස් නඟයි. අනෙකා තෙරුවන් ගුණ කියයි. මෙසේ මොහු එකෙක් අනෙකාට ඉදුරා පටහැනි කතා ඇතියෝ අප පසු පස ආහ'' යි

මේ අතුරු කතාව උපන.

4. ඉක්බිති බුදුරජහු මෙය දැන හිඳුම්හලට වැඩම කළහ. පැණැවුණු අස්නෙහි වැඩහිඳ ''මහණෙනි, තෙපි දැන් කවර නම් කතාවෙකින් හුන්නහු ද? තොප අතර කවර කතාවෙක් අඩාල වී ද?'' යි අසා වදාළහ.

5. වහන්දූවරු තමන් අතර උපන් කතාවේ පවත් සැළ කළහ. එවිට බුදුරජ්හු ඒ වහන්දූවරුන් බණවා මෙසේ වදාළහ:

''මහණෙනි, අනුන් මට හෝ දහමට හෝ සඟනට හෝ දෙස් නගතුදු එහි තොප විසින් නොකිපියැ යුතු, දෙම්නස් නො කළ යුතු, තරහ නො ඉපිදැවියැ යුතු. ඉදින් තෙපි එහි කිපෙවු නම්, දෙම්නස් කරවු නම්, තරහ උපදවවු නම්, එසින් තොපට ම අවැඩ වන්නේ ය.[4] මහණෙනි, එබන්දෙහි තෙපි කිපෙවු නම්, අප ඇරැබැ ඒ අනුන් කි දෑ සරි යැ යි හෝ නො සරි යැ යි දැන ගත හැකි වන්නාහු ද?''

''දැන ගත නො හෙන්නමූ'' යි (වහන්දූ කීහු.)

එවිට බුදුරජ්හු වදාළහ:

''මහණෙනි, අනුන් මට හෝ දහමට හෝ සඟනට හෝ දෙස් කියතොත් එහි ලා තොප විසින් 'මෙසේත් මෙය නො වූයෙක (නැති දෙස් නැංවීමෙක), මෙසේත් මෙය නො සැබෑ වෙක, මේ දෙස අප කෙරේ නැත, මෙය අප කෙරේ නො මැතැ'යි නොසබා දෑ නොසබා සෙයින් වෙන් කොට හළ යුතු. වැලි දු මහණෙනි, අන්හු මගේ හෝ දහම්හි හෝ සඟන ගේ හෝ ගුණ කියන්නාහු නම්, එහි තොප විසින් පීතියෙන් ඉල්පුණු බව නො කළයුතු, සොම්නස නො කළයුතු.[5]

4. තොපට ම අවැඩ වන්නේ ය = තොප ගේ ම ධ්‍යානලාභාදියට අන්තරාය (බාද) වන්නේ ය. 5. පීතියෙන් ඉල්පුණු බව නො කළ යුතු= 'අපේ බුදුරජ' යන ආදි විසින් ඇති වන ගේහසිත සතුට මානයෙන් (උඩගු බැවින්) යුක්ත ය. ලෝභසහගත සිතැ උපදනේ ය. එය ද ධ්‍යානාදි උසස් ගුණ ලාභයට සරස් වෙයි. ඡන්න තෙරට බුදුරජුන් ගැන පැවැත්තේ මේ ගේහසිත ප්‍රේම ය යි. එය පැවැති තෙක් ම උසස් ගුණ බිඳකුත් ඉපිදවිය නො හැකිවී ය. බුඹාදීන් ගේ ගුණ දත්තවුනට ඇති වන නෙක්ඛම්මනිස්සිත පීතිසොම්නස වුව මනා ය. එය උසස් ගුණ ලැබීමට ඉවහල් ය. 'අපේ ශාස්තෘහු මෙසේ' යැ යි ආඩම්බරය අන්තරායකර යැ යි මෙ සුතුරු දක්විණ.

සිතැ ඉල්පුණු බව (උඩඟුව) දොම්නස් කළ යුතු. එහි තෙපි සතුටු වන්නාහු නම්, සොම්නසැත්තෝ වන්නාහු නම්, උඩඟු වන්නාහු නම්, එයින් තොපට ම අවැඩ වන්නේ ය.

6. මහණෙනි, අන්හු මගේ හෝ දහමේ හෝ සඟුන්ගේ හෝ ගුණ කියන්නාහු නම්, එහි ලා තොප උඩඟු සිතැත්තන් නො විය යුතු. මෙසේත් මේ ඇත්ත යැ, මෙසේත් මේ සැබැව, මේ ගුණ අප කෙරේ ඇත් ම ය, අප කෙරේ පවතී ම යැ' යි ඇති ගුණ ඇති ගුණ විසින් පිළිින කළ යුතු ය.

7. මහණෙනි, ලොවී ජන තෙම යමෙකින් තථාගත[6] බුදුහු ගුණ කියා නම්, එයට කරුණු විසින් ඔහු දක්වනුයේ ඇලුප්[7] ගුණයෙක, සුළු ගුණයෙක, සිල් පමණ වූ ගුණයෙක.

8. ඔහු මෙසේ කියනු ඇත:

"මහණ ගොයුම් දඬු ද අවි ද අතිනුදු නොගන්නා කෙනෙක. පණිවායෙන් වැළැක්කෙක, හේ හැම සත්නට හිතවත් වැ කුළුණුබර වැ වෙසෙයි" කියා හෝ බුදුගුණ කියන ලොවී ජන තෙම කියන්නේ ය,

"මහණ ගොයුම් අයිනාදනින්, අබ්රම්සරින්, මුසවායෙන්, පෙහෙසුන් තෙප්ලෙන්, පරොස් බසින්, පලප්දෙඩුමෙන් වැළැක්කෙකැ යි, කල් බලා කතා කරන, ඇත්ත ම කියන, දෙලෝවැඩ අසළ[8] බස් ම කියන, ලොවුතුරා දහම් අසළ බසක් ම කියන, විනයක් ම කියන, සිතැ තබාගත යුතු දූයක් ම කියන කෙනෙකැ" යි හෝ බුදුහු ගුණ කියනා ලොවී ජනා තෙමේ කියන්නේ ය.

8. මහණ ගොයුම් පැල වන දූ පැලවුණු දූ සිඳිම්බිඳිම් කෙරෙන් වැළැක්කේ යැ යි, එක් වේලක් ම බොජුන් ගන්නේ යැ යි, රෑ බොජුනෙන් වැළැක්කේ යැ යි, නොකල් බොජුනෙන් වැළැක්කේ යැ යි, නටනු ගනු වයනු විසුළුදසුන් යන මෙයින් වැළැක්කේ යැ යි, මල්ගඳ විලෙවුන් දැරීමෙන් වැළැක්කේ යැ යි, උසසුන් මහසුන් කෙරෙන් වැළැක්කේ යැ යි, රන්රිදී පිළිගැන්මෙන් වැළැක්කේ යැ යි, අමුමස් පිළිගැන්මෙන්, ඉහිරින්

6. තථාගත. උපග්‍රන්ථය බලනු. 7. ඇලුප්ගුණයෙක = අල්ප ගුණයෙක. සමාධි ආදි එයට උසස් ගුණ ඉදිරියෙහි ශීලය අල්පමාත්‍ර එකෙකි. එබැවින් ශීලය අල්පගුණයෙකැ යි මෙ තන්හි වදාරන ලදි. 8. දෙලෝවැඩ-අසළ - දෙලොවැ දියුණුව ඇසුරු කළ.

කුමරියන් පිළිගැන්මෙන්, දාසිදසුන් පිළිගැන්මෙන්, එළුවන් තිරෙළුවන් පිළිගැන්මෙන්, කුකුළන් හූරන් පිළිගැන්මෙන්, ඇතුන් අසුන් වෙළෙඹුන් ගෙරින් පිළිගැන්මෙන්, කෙත්වත් පිළිගැන්මෙන්, ගිහියනට දූත මෙවර ගමන්හි යෙදුමෙන්, මුදල් ගනුදෙනු කැරුමෙන්, හොරතරාදියෙන් කිරුමෙන්,[9] බොරු රන්බඳුනෙන් මුළා[10] කැරුමෙන්, හොර මිනුමෙන්[11] උක්කෝටනසාවියෝගයෙන් (අල්ලස් ගැන්මෙන්), වංචනසාවියෝගයෙන් (නන් උපායෙන් අනුන් රැවැටීමෙන්), නිකතිසාවියොගයෙන් (රන් නොවූ දෑ රන් ඇලෙයින් දක්වීමෙන්)[12] මෙරමා අත්‍ අෑ සිඳිමෙන් මැරීමෙන් බැඳීමෙන්, සැඟෙවී සිට අන් සතු දෑ පැහැර ගැන්මෙන්[13], ගම් ඈ පැහැරීමෙන්, මෙරමා සතු දෑ බලාත්කාරයෙන් ගැන්මෙන්, වැළැක්කෝ යෑ'" යි මෙසේ හෝ ලොවී ජන තෙමේ බුදුහු ගුණ කියන්නේ ය.

(සුළු සිළි)

9. "ඇතැම් මහණ බමුණෝ (ගිහියන්) සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, මුල්බිජු කඳබිජු අක්බිජු පුරුක්බිජු බිජුබිජු යෑ යි මෙ කී පැලවන පැලවුණු[14] පස් බිජු සිඳිනුබිඳිනුයෙහි යෙදී වෙසෙත්, මහණ ගොයුම් වූ කලි මෙබඳු දෑ සිඳුමෙන් බිඳුමෙන් වැළැක්කෝ යෑ යි මෙසේ හෝ ලොවී දෙනෝ බුදුහු ගුණ වණනුයේ කියන්නේ ය.

10. පසු දවසට අහර තබාගැන්ම, පසු දවසට බොන දෑ තබාගැන්ම, සිවුරු ඈ පිරිකර රැස් කොට තබාගැන්ම, දෙකකට වඩා යහන් පිළිගෙන තබාගැන්ම, සුවඳ දෑ තමා සඳහා තබාගැන්ම, තලසහල් ඈ රැස් කොට තබාගැන්ම දෑ යි

---

9. හොරතරාදියෙන් කිරිම තුලාකූට නම්. මෙය රූපකූට අංගකූට ගහණකූට පටිච්ඡන්නකූට යෑ යි සිවුවැදෑරුම්. උපග්‍රන්ථය බලනු. 10. කංසකූට යනුවෙන් බොරුරන්බඳුන් පෙන්වා රැවැටීම දක්විණ. උ. බ. 11. හොරමිනුමෙන් රැවැටීම මානකූට යි. උ. බ. 12. උක්කොටන - වඤ්චන - නිකති - සාවියොග = හිමියන් නොහිමියන් කිරීමට අල්ලස්ගැන්ම උක්කෝටන නම්. නන් උපායෙන් අනුන් රැවැටීම වඤ්චන යි. රන් මිණි ඈ නොවන දෑ රන්මිණි ආදි වශයෙන් අඟවා කරන රැවැටිල්ල නිකති නම්. සාවියෝග නම් උක්කෝටන වංචන නිකති යන තුන් සැටියෙන් ම කරණ කුටිලක්‍රියා යි. විස්තරඋපග්‍රන්ථය බලනු 13. සැඟෙවී සිට ගැන්ම - මේ විපරාමෝස නම්. මෙය හිමවිපරාමෝස (හිමෙන් වැසී සිට අන්සතු දෑ පැහැර ගැන්ම ය) ගුම්බවිපරාමොස (පඳුරකට මුවා වී, සැඟෙවී සිට අනුන් සතු දෑ කඩා ගැන්ම) යෑ යි දෙ වැදෑරුම් ය. 14. පැලවන දෑ බීජගාම යි. පැලවුණු දෑ භූතගාම යි. උ. බ.

මෙසේ ඇතැම් මහණ බමුණන් මෙබඳු සන්නිධිකාර පරිභෝග යෙහි[15] (රැස් කොට තබාගෙන වැළඳීමෙහි) යෙදෙතුදු මහණ ගොයුම් මෙයින් මෙබඳු දූසින් වැළැක්කේ ය.

11. නටනු ගයනු වයනු, නටසමජ්ජා දක්වනු[16], ආඛ්‍යාන[17] කියනු හෝ අසනු, පාණිස්වර (ලොහොබෙර අතින් ගසනු හෝ අත්තාලම් ගසනු), වේතාල (ලීමුවා තාලම්-පට ගසනු හෝ මතුරු දපා මළ සිරුරු නඟා සිටුවනු), සිවුරස් බෙර වයනු, ශෝභනක (දෙවියනට තුති විසිත් රඟ මඩලැ නාඤ්ගීත ගයනු නොහොත් ප්‍රතිභානචිත්‍ර කරනු)[18], චණ්ඩාල[19] (යගුළ කෙළි හෝ සනදෙවුන් කෙළි), වංස (උනගස් ඔසොවා කැරෙන කෙළි), ඇටදෙවුන් කෙළි[20], ඇත්පොර[21] අස්පොර මියුපොර ගොන්පොර, එළුපොර, බැටෙළුපොර, කුකුළුපොර, වටුපොර, දඬුයුද (පොලුහරඹ), මිටුයුද, මල්ල පොර, යුද පැවැති තන් දක්නට යනු, බලසෙන් ගණින තැන් දක්නට යනු, බලසෙන් බෙදනා තැනට යනු, ඇත්ඇනි අෑ බලඇනි දක්නට යනු යන මෙකී හෝ මෙබඳු වූ විසුළුදස්නෙහි ඇතැම් මහණ බමුණන් යෙදී වසතුදු මහණ ගොයුම් මෙයින් වැළැක්කේ යැ යි ද,

12. අටපාකෙළි,[22] දසපාකෙළි,[23] අහස්දූකෙළි,[24] මඬුලු පැනිලි,[25] සන්තිකා කෙළි,[26] දදුකෙළි, කල්ලිගැසිලි, ලහ-

---

15. සන්නිධිකාරපරිභෝගය යනු එක්රැස් කොට තබා පරිභෝග කිරීම ය. විසනර උ. බ. 16. නටසමජ්ජා - පෙක්ඛ. (උ. බ.) 17. අක්ඛාන = ආඛ්‍යාන = භාරතරාමායණාදි කථා. 18. ප්‍රතිභානචිත්‍ර. උ. බ. 19. චණ්ඩාල- සැඬොලින් ගේ ක්‍රීඩා බැවින් මේ චණ්ඩාල නම්. (උ. බ)

20 ඇටදෙවුන්කෙළි = ඇතැම් රටෙක මළ සිරුරු වළැලත්. මස් දිරා ගිය පසු ඇට ගොඩ නඟා සෝද සුවඳ කවා තබත්. සුබ නකත් උදුවෙහි ඔහු එක්තැනෙක ඒ ඇට රැස් කොට තබා හඬ හඬා රාබොත්. මෙබඳු තැන බොහෝ ආහාර පාන කැවිලි පෙවිලි රැස් කොට එයින් පැමිණියවුනට සංග්‍රහ කරත් මේ ඉන්ද්‍රජාල මහින් ඇට දෙවීම යැ යි කෙනෙක් කියති. 21. ඇත්පොර = ඇතුන් හා පොර ඇල්ලීම හෝ ඇතුන් හා මිනිසුන් හෝ ඇතුන් ඇතුන් ම හෝ පොර අල්ලනු බලන්නට යෑම හෝ පැවිද්දනට නො වටී. අස්පොර ආදිය ගැන ද මෙසේ ම ය. 22. අටපාකෙළි = එක් එක් පෙළෙහි කොටු අට බැගින් ඇති දම්පෙතැ කැරෙන ක්‍රීඩාව. 23. දසපාකෙළි = එක් එක් පෙළෑ කොටු දසය බැගින් ඇති දම්-පෙතැ කැරෙන ක්‍රීඩාව. 24. අහස්දූකෙළි - අටපා දසපා කෙළි මෙන් අහසැ දම්පෙත ඇති සේ සලකා කැරෙන ක්‍රීඩාව 25. මඬුලු පැනිලි = බිමැ මඬුලු ලකුණු කොට එකින් එකට පැන යෑම. 26. සන්තිකා කෙළි = එක් තැනැ වූ ගල් කැට ආදියෙන් එකක් සෙස්ස නොසැලෙන සේ නියෙන් ඉවත් කිරීම හෝ ඇතුළු කිරීම

අත්කෙළි,[27] ගුළුකෙළි, කොළනලා පිඹිනු, කෙළිනඟුලින් හානු, කරණම් පනිනු, කන්නංගුරුවා කෙළිනු,[28] කොළනැළියෙන් වැලි ඈ මණිනු, කුඩා (කෙළි) රිය පදවනු, කෙළිදුනුයෙන් විදිනු, ඇකිරිකෙළි,[29] මෙරමා සිතූ දෑ කියනු, විකළැඟියන් සේ ඉරියවු පවත්වනු[30] යැ යි මේ ඈඟි ඇතැම් මහණ බමුණන් යෙදෙතුදු මේ සියල්ලෙන් මහණ ගොයුම් වැළැක්කෝ යැ යි ද,

13. දික්හඟළාපුටුව, පළඟ,[31] ගන මල් යෙදූ එළලොම් ඇතිරිය, තිලිය (පුළුන් මෙත්තය), සිහ වග ඈ සතුන් රුවින් විසිතුරු කළ එළලොම්මුවා ඇතිරිය, දෙපස ම ලොම් ඇති එළලොම් මුවා ඇතිරිය, එක්පසැ ම ලොම් ඇති එළලොමින් කළ ඇතිරිය, රන්කසුකම් කොට තැනූ පසතුරුණ, පට හුසින් වියූ පසතුරුණ, සොළොසක් නිළියනට සිටැ නටන්නට තරම් දික් පුළුල් එළලොම්මුවා ඇතිරිය, ඇතුපිට එළන ඇතිරිය, අසුපිටැ එළන ඇතිරිය, රියැ එළන ඇතිරිය, අඳුන් දිවිසමින් ඇඳ පමණින් මසා කළ පසතුරුණ, ඉස්දෙරළ පාමුලැ රතු කොට්ට තබා ඇති රතු උඩුවියනින් යුත් මහඟු යහන යන මේ හෝ මෙබඳු උස් යහන් මහ යහන් ඇතැම් මහණ බමුණන් පරිහරණ කරතුදු මේ සියල්ලෙන් මහණ ගොයුම් වැළැක්කෝ යැ යි ද,

14. සුවඳ සුණුයෙන් ඇඟ උලනු, හැඩ ගන්වනුවට අත් පා ඈ තෙල් ගා මඩිනු, සුවඳ දියෙන් නාවනු, ඇඟමස් වැඩෙනුවට මුගුරින් තළනු, කැටපතින් මුහුණ බලනු, ඔප් ගන්වනුවට ඇහැ අඳුන් ගානු, මල් විලෙවුන් දරනු, මුව සුණු මුවවිලෙවුන් දරනු, අතැ පලඳනා පළඳිනු, හිසැ කුඩුම්බිය බඳිනු, විසිතුරු සැරයටි දරනු, විසිතුරු බෙත්නල දරනු, කඩු දරනු, විසිතුරු පාවහන් දරනු, නළල්පට බඳිනු, සිළුමිණි පළඳිනු, විසිතුරු සෙමෙර වල්විදුනා දරනු, දික් දවලු ඇති සුදු වත් හඳිනු යැ යි අඩුතැන් පුරාලනුවටත් ඇඟ සරසනුවටත් කරුණු වන මෙකී දෑයෙහි ඇතැම් මහණ බමුණන් යෙදෙතුදු මහණ ගොයුම් මේ සියල්ලෙන් වැළැක්කෝ යැ යි ද,

---

27. ලඟඅත්කෙළි = සායම් බඳුනැ ඉරටුම්පියක් බහා එයින් ඇත්අස් ඈ රූ ඇති වන සේ බිමට හෝ බිත්තියට ගැසීම. 28. කන්නංගුරුවං= හුලං පෙති. 29 ඇකිරිකෙළි = අක්ඛරිකා, අහසැ හෝ පිටැ ඇඳි අකුරු කීම. 30 විකළැඟියන් සේ ඉරියවු පවත්වනු = කනුන් කොරුන් සේ ඉරියවු පැවැත්වීම. 31. පළඟ = පල්ලඞ්ක (පර්‍යංක), පාදයන්හි සිංහරූපාදිය කොට තැනූ පුටුවං

15. රජ සොර ඇමැති යුදසෙන් බිය[32] යුද අහර පැන් වත් (වස්ත්‍ර) යහන් මල් ගඳ නෑයන් යාන ගම් නියම්ගම් නුවර දනවු ගැහැනු සුරා වීදි කුම්භස්ථාන[33] මළගියවුන් නානාත්ව[34] ලෝකාඛ්‍යායිකා[35] සමුද්‍රාඛ්‍යායිකා[36] වැඩීම්පිරිහීම්[37] යන මේ දෑ පිළිබඳ තිරිසන්කතාහි[38] ඇතැම් මහණ බමුණන් යෙදෙතුදු මහණ ගොයුම් මෙයින් වැළැකේ යැ යි ද,

16. 'තෝ මේ දහම්විනය නො දනී, මම් මැ දනිමි, මේ දහම්විනය කිමැ යි තෝ දනී හෝ? තෝ වැරදි පිළිපන්නෙහි, මම් මැ යැ මොනොවට පිළිපන්නේ, මා බසට කරුණු ඇත, තා බසට කරුණු නැත, මුලින් කිවමනාව තෝ අගින් කියෙහි, අගින් කිවමනාව මුලින් කියෙහි, කලක් තා ලත් පුහුණුව මගේ එක් බසින් ම පෙරළිණ, මගෙන් තට දෙස් නැඟිණ, මම් නිගනිමි, මා නැඟූ දෙසින් මිදෙන්නට තැන තැන ගොස් හෝ උගනුව, බල ඇත ! දන් ඇසූ පැණ විසඳව' යි මේ නොයෙක් සැටියෙන් ඇතැම් මහණබමුණන් බැණ දෙඩා ගනිතුදු මහණගොයුම් මේ සියල්ලෙන් වැළැක්කේ යැ යි ද,

17. රජුන් ඇමැත්තන් රදෙළුවන් බමුණන් ගැහැවියන් රජකුමරුන් යන කවුරුන් ගේ හෝ අණ පරිදි දූත මෙවරෙහි ඇතැම් මහණබමුණන් යෙදෙතුදු මේ සියල්ලෙන් මහණ ගොයුම් වැළැක්කේ යැ යි ද,

18. ගිහියන් ගෙන් සත්කාර ලබනුවට කොහොත් වත් පුරනු, වාටු බස් දෙඩනු, පසය ලබනුවට ඉඟි කරනු, තමන් හුවා අනුන් ගරහනු, අනුන් ගෙන් වැඩියක් ලබනුවට තමන් ගෙන් කිසිවක් දෙනු යැ යි මෙබඳු දූයෙහි ඇතැම් මහණ බමුණන් යෙදෙතුදු මහණ ගොයුම් මේ කිසිත් නො කෙරේ යැ යි ද,

මෙසේ හෝ ලොවී ජන තෙමේ බුදුහු ගුණ කියන්නේ ය.

(මැදුම් සිලි)

---

32. බිය = භය කථා. සොර සතුරු ආ බිය පිළිබඳ කථා. 33. කුම්භස්ථාන කථා=පැන්තොට ගැන කථාද කුම්භදාසීන් (දිය අදනා දාසියන්) පිළිබඳ කථාද. 34 නානාත්ව කථා = මුලින් කී ද පසු වැ කී ද කථා හැර සෙසු නානා ස්වභාව ඇති නිරර්ථක කථා. 35. ලෝකාඛ්‍යායිකා = ලොව අසෝ දෙවියා මැවී ආදි විසින් ලොව පිළිබඳ කැරෙන නිරර්ථක කථා ද, පිටින් කළු වුවත් ඇතුළත ඇට සුදු බැවින් කවුඩා සුදු එකෙක යන ආදි විසින් පැවැති ලෝකායත විතණ්ඩ කථා ද ලොකාඛ්‍යායිකා නමි. 36. සමුද්‍රාඛ්‍යායිකා = මුහුද ගැන කථා, සගර දේවයා කැණුයෙන් මේ සාගර නමැ යි ද, මෙය කැණූයේ මා විසිනැ යි ඔහු සිය හස්තමුද්‍රායෙන් පැහැරැ වූ බැවින් සමුද්‍ර නම් වී යැ යි යන ආදි විසින් කියන නිරර්ථක කථා. 37. වැඩීම් පිරිහීම් කථා = වැඩෙන පිරිහෙන සැටි දක්වන දහැමි කථායෙන් බාහිර වූ 'මෙසේ වැඩෙත්, මෙසේ පිරිහෙති' යි ප්‍රලාප විසින් කියන නිරර්ථක කථා. 38. තිරිසන් කථා = ස්වර්ග මාර්ග මෝක්ෂ මාර්ග දෙකින් තිරෝභූත (බාහිර වූ) කථා තිරශ්චීන කථා යි

19. ඇතැම්මහණබමුණන් සැදැහෙන් දුන් බොජුන් වළඳ, ඇඟසතර[39] (අංගශාස්ත්‍ර) [40]නිමිතිසතර, [41]උත්පාතලක්‍ෂණ, [42]මූෂිකාච්ඡින්නවිද්‍යා, ගිනිදෙවි පිදුම, [43]දබ්බිහෝම, [44]ථුසහෝම, [45]කණහෝම, [46]තණ්ඩුලහෝම, [47]සප්පිහෝම, [48]තෛලහෝම, [49]මුඛහෝම, [50]ලෝහිතහෝම, [51]අංගවිද්‍යා, ගෙබිම්සතර, [52]ක්‍ෂාත්‍රවිද්‍යා, [53]ශිවවිද්‍යා, [54]භූතවිද්‍යා, [55]භූරිවිද්‍යා, [56]අහිවිද්‍යා, [57]විෂවිද්‍යා, [58]වෘශ්චිකාවිද්‍යා, [59]මූෂිකාවිද්‍යා, [60]ශාකුනවිද්‍යා, [61]වායස-විද්‍යා, [62]පක්ඛධ්‍යාන, [63]ශරපරිත්‍රාණ, [64]මෘගපක්‍ෂ යන මෙකී තිරිසන්විදුයෙන් වැරදි දිවෙලින් දිවිපැවත්වතුදු, මහණ ගොයුම් මෙසේ වූ මිථ්‍යාජීවයෙන් (වැරදි දිවෙලින්) වැළැක්කේ යැ යි ද,

---

39. ඇඟසතර = අංග ශාස්ත්‍ර, අත් පා ඈ අවයව බලා සුබ අසුබ කියන අංගශාස්ත්‍රය 40. නිමිතිසතර = නිමිති බලා සිදු වන දෑ කියන සතර. රජෙක් මුතු තුනක් මිටැ මොලවා මා ඇතැ කිමෙක් ඇද්දැ යි නිමිති දතුවා විචාළේ ය. හේ වට පිට බලා සූතකු ඩැහැගත් මැස්සකු මුත්වනු (මිදී යනු) දුටා මුතු යි කී. කිංයෙක් දැ යි විචාළ විට අසළ කුකුළකු තුන් වරක් හඬ ලනු අසා තුනෙකැ යි කී. මෙ සේ නිමිති බලා වන නොවන දෑ කියන නිමිති සතර ය. 41. උත්පාතලක්‍ෂණ = නෙත ගැසුම් ආදිය බලා එහා සුබ අසුබ කියන ශාස්ත්‍රය 42. මූෂිකාච්ඡින්න විද්‍යා = වස්ත්‍රයෙහි මීයන් කෑ තැන බලා පලාපල කියන ශාස්ත්‍රය. 43. දබ්බිහෝම = දබ්බි යනු හැන්ද ය. මේ මේ වගියේ හැන්දෙන් මේ මේ දෑ ගින්නට ලූ කලැ මෙබඳු දෑ වෙතැ යි සලකා ඒ ඒ හැන්දෙන් ඒ ඒ දෑ ලමින් ගිනි පිදීම 44. ථුස හෝම = මෙබඳු තොහො ගින්නෙහි ලුව මෙනම් පල වෙතැ යි දහමිණා ගින්නැ බහාලීම. 45 කණහෝම = ඒ ඒ ධාන්‍ය කුඩු ගින්නෙහි බහා කරන හෝමය 46. තණ්ඩුලහෝම = සහලින් කරන හෝමය. 47. සප්පිහෝම = ගිතෙලින් කරන හෝමය. 48. තෛලහෝම = තෙලින් ගිනි පිදුම. 49. මුඛහෝම = අබ ඈ දෑ මුවින් ගෙන ගින්නෙහි ලැම හෝ මතුරැ දපා ගිනි පිදුම. 50. ලෝහිතහෝම = සිරුරැ ඒ ඒ තැනින් ලේ ගෙන ගිනි පිදුම 51 අංග විද්‍යා = සිරුර බලා සුබ අසුබ කීම. ඉහතැ අංග ශාස්ත්‍ර යනුයෙන් කියේ සිරුරැ එකී එකී අවයව පිරික්සීම යි. 52 ක්‍ෂාත්‍ර විද්‍යා = නීති ශාස්ත්‍රය 53. ශිව විද්‍යා = සොහොනැ දපා ශාන්ති කිරීම, සිවල් හඬැ සුබ අසුබ කීම යැ යි ද කියත්. 54. භූතවිද්‍යා = යක් බූ පිසසුන් සම්බන්ධ මතුරැ දපීම. 55 භූරි විද්‍යා = බිම් ගෙයැ සිද උගත යුතු මන්ත්‍ර ඉගැන්ම. 56. අහිවිද්‍යා = සපී විෂ බෑම, මතුරැ දපා සපුන් ගෙන්වීම. 57. විෂවිද්‍යා = විස බැඳීම, කලදී කායැ වැදූ සිටි විස රැඳැවීම හා අළුතින් විෂ කායැ ගැන්වීම. විෂ තන්ත්‍රය ද විෂවිද්‍යා නම්. 58. වෘශ්චිකාවිද්‍යා = ගෝනුසුවිස බැස්වීම 59. මූෂිකාවිද්‍යා = මීවිස බැස්වීම. 60. ශාකුනවිද්‍යා = කුරුල්ලන් හඬ ගමන ආදියෙන් පලාපල කීම 61. වායසවිද්‍යා = කවුඩු හඬ අසා පලාපල කීම. 62 පක්ඛධ්‍යාන = ජීවත් වන කාලසීමාව දූනගන්නා මුහුකාලු විත්තාව, ආයුදිංශ. 63. ශරපරිත්‍රාණය = ඊ බැඳුම, ඇඟැ හී නො වැදෙනුවට යන්ත්‍ර මන්ත්‍ර කිරීම. 64. මෘගපක්‍ෂ = සියලු පක්‍ෂි සිවුපා ආදීන්ගේ හඬැ අදහස් දූන ගන්නා ශාස්ත්‍රය.

20. ඇතැම් මහණ බමුණන්, මිණිලකුණු[65]. දඬුලකුණු වත්ලකුණු කඩුලකුණු ඊලකුණු දුනුලකුණු අවිලකුණු[66] ඉතිරිලකුණු පුරිස්ලකුණු කුමරලකුණු කුමරිලකුණු දස්ලකුණු දසිලකුණු ඇත්ලකුණු අස්ලකුණු මියුල්කුණු වහප්ලකුණු ගොන්ලකුණු එළලකුණු[68] බැටෙළලකුණු කුකුළලකුණු වටු-ලකුණු ගොය්ලකුණු[69] කැණිලකුණු[70] කසුබුලකුණු[71] මුව-ලකුණු (සියලු සිවුපාවන්ගේ ලකුණු) යන මේ ඈ තිරිසන්විදු-යෙන්[72] නොසරුප් දිවියෙන් දිවි ගෙවතුදු, මහණගොයුම් මෙබඳු හැම දසින් වැළැක්කේ යැ යි ද,

21. ඇතැම් මහණ බමුණන්, ‘රජුන් යුදට නික්මෙනු, පෙරළා එනු, සතුරු රජුන් මුන ගැසෙනු, සතුරු රජුන් පලා යනු, සතුරන් රටට වදිනු, රටෙහි රජු පලා යනු. රටෙහි රජු දිනනු, පිටතැ රජු පරදිනු, පිටතැ රජු දිනනු, රටෙහි රජු පරදිනු යන මේ දු අසෝ අසෝ දිනා වෙතැ’ යි දිනුම් පැරදුම් කියමින් නොසරුප් දිවියෙන් දිවි ගෙවතුදු මහණ ගොයුම් මෙබඳු දසින් වැළැක්කේ යැ යි ද,

22. ඇතැම් මහණ බමුණන් සඳුගැනුම් (චන්ද්‍රග්‍රහණ), හිරුගැනුම් (සූර්‍ය්‍යග්‍රහණ), නකත්ගැනුම් (නක්‍ෂත්‍රග්‍රහණ), සඳ හිරු නකත්තරුන් මඟින් යැම හා නොමඟින් යැම්, උල්කා වැටෙනු, දික්දැවිලි,[73] මිහිසැලුම්, දෙව්බෙර,[74] සඳ-හිරු-නකත්-තරුන් උදා වනු, බැස යනු, කෙලෙසෙනු, පිරිසිදු වනු යන

---

65. මිණිලකුණු = මිණෙහි පැහැ සටහන් ඈ ගුණ කීම. දඬු වස්ත්‍ර ආදියේ ද පැහැ ආදියේ ගුණාගුණ කීම දඬුලකුණු වත්ලකුණු යනා ආදියෙන් දක්විණ. 66 අවිලකුණු = කඩු හැර අන් ආයුධවල ලක්‍ෂණ කීම. 67. ඉතිරි ලකුණු පුරිස් ලකුණු ආදියෙන් ඒ ඒ ස්ත්‍රී පුරුෂාදීන් නිසා ඔවුන් ඉන්කා කාලයට වන වෘද්ධි හානි පැවැසීම කියනු ලදී. 68. එළ-ලකුණු = මෙබඳු එළුවා මස කෑ යුතු ය, මෙබන්දනු මස නොකෑ යුතු ය යනා ආදිය කීම. බැටෙළලකුණු ඈහි ද මේ නය ම ය 69. ගොය් ලකුණු සිතියම් පලදනා ඈහි ගොයා ගේ රුව සටහන් කිරීමේ පලාපල. වෙහෙරෙක බිත්තියෙහි ගොයකු ගිහි පුඹුනා සැටි ඇන්දුවිණ. එතැන් පටන් කොට එහි මහණුන් ගේ මහ ආරාවුල් ඇති විය. ආගන්තුක මහණෙක් එය දක සිතියම මකා ලී ය. එයින් පසු අවුල් අඩු වී යැ යි අටුවාහි මෙයට නිදසුනෙක් එයි. 70. කැණිලකුණු = ගෙයි ද පළඳනාහි ද කැණියෙහි ද සැටි එයින් වන පලාපල ද කීම. 71. කසුබුලකුණු = ගොය්-ලකුණුවලට කී නයින් මෙය දත යුතු 72. තිරිසන් විදු = තිරශ්චීන විද්‍යා උ. බ. 73. දික්දැවිලි = දිශාවන් ගිනිසිලු-දුම්සිලුයෙන් ආකුල වීම්, දිශාවන්හි අඳුරු බව. එයින් වන පල කීම මෙයින් දක්විණ. 74. දෙව්බෙර = වැසි නැති අහස්ගෙරුවුම, එයින් වන පල කීම.

මේ ද, වන දවස හා, මෙයින් වන ඵලාපල ද කියමින් නොසරුප් දිවියෙන් දිවි ගෙවතුදු, මහණ ගොයුම් මේ සියල්ලෙන් වැළැක්කේ යැ යි ද,.

23. ඇතැම් මහණ බමුණන් නකත් බලා, වැසි ඇති නැති සමය ද, රටට සුබික් හෝ දුබික් වන සමය ද, රටට උවදුරු වන නොවන සමය ද, ලෙඩ රෝග ඇති වන නොවන සමය ද කියනුවත් නොසරුප් දිවියෙන් දිවි පවත්වත් නමුදු, ඇඟිලිපුරුකැ සත්තබා ගිණුම ද එක දෙක ආ පිළිවෙළින් ගිණුම ද, පිඬුගිණුම ද[75] කාව්‍යසතර ද, ලෝකායත සතර[76] ද යි මෙකී නොසරුප් දිවියෙන් දිවි පවත්වතුදු, මහණ ගොයුම් මෙයින් වැළැක්කේ යැ යි ද,

24. ඇතැම් මහණ බමුණන් ආවාහ සඳහා ද විවාහ සඳහා ද වෙන් වූ අඹුසැමියන් එක් වනු සඳහා ද එක් වැ සිටිනා අඹුසැමියන් වෙන් වනු සඳහා ද දුන් ණය රැස් කරනු සඳහා ද ණයට පොලියට මුදල් දෙනු සඳහා ද නකත් කියතුදු, සිරි වැඩෙනුවට ද සිරි නසනුවට ද මතුරු දපතු දු, නස්නා දරු ගබ් රක්නට පිළියම් කරතුදු, මතුරු දපා දිවගුළු ලනු ද හනු තද කරනු ද අත් පෙරළනු ද කන් අගුළු ලනු ද කැටපතින් පේන බලනු ද කෙල්ලක ලවා පේන කියවනු ද යක්දෙස්සන් ලවා පේන කියවනු ද, හිරුපුදනු ද, මහතුපඬාන ද[77] මතුරු හෝ බෙහෙත් බෙලෙන් මුවින් ගිනි පිටත් කරනු ද, සිරිකත කැඳවනු ද යන මේ හෝ මෙබඳු තිරිසන් විදුයෙන් නොසරුප් දිවෙලින් දිවි පවත්වතුදු, මහණ ගොයුම් මෙ සියල්ලෙන් වැළැක්කේ යැ යි ද,

25. ඇතැම් මහණ බමුණන් ගිහියන් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, දෙවියනට බාර වනු ද, බාර ඔප්පු කරනු ද, බිම්ගෙහි පිරිවැහු මතුරට උවසර[78] කරනු ද, පණ්ඩකයා පිරිමියකු කරනු ද, පිරිමියා පණ්ඩකයකු කරනු ද, නව බිම්හි ගෙවල් කරනු ද, වතුබිලියම් (ගෙබිම් දෙස් නසනුවට බිලියම්) කරනු ද, මතුරු දපා මුව දෙවනු ද, මතුරු දපා අනුන් නාවනු ද, අනුන් පිණිස ගිනි පුදනු ද, බෙහෙත් දී වමන කරවනු ද, විරේක කරවනු ද, ළය විරේක බඩවිරේක කරවනු ද, ශීර්ෂවිරේක කරවනු ද

---

75. පිඬු ගිණුම උ. බ. 76. ලෝකායත සතර = යට; ලෝකාඛ්‍යායිකා යන්නට කළ විවරණයෙහි මෙය හෙළි ඝොට ඇත. 77. මහතුපඬානා = බඹහට උවටන් යැ යි අටුවාහි අරුත. සූර්‍ය සෝම මහති (පෘථිවි) ශ්‍රී යන මොවුනට වැඳුම් පිදුම් කිරිම තෛත්තිරිය උපනිෂත්හි සඳහන් වේ. එහි මහති යනු පෘථිවිය යි. 78. මතුරට උවසර = මන්ත්‍රයට උපචාර කිරීම යි.

කන්වැඩෙනුවට කන්දෙස් හරනට තෙල් සිඳිනු ද, නස්‍ය කරනු ද, ඇස පටල හරනට කාරම් අඳුන් සද දෙනු ද, ඇසැ සිසිල් ගන්වන අඳුන් සදනු ද, ඇසැ උල්ඇනූ ලෙඩට බෙත් කරනූ ද, ලෙඩට සැත්කම් කරනු ද, ළදරුවන් ලෙඩට පිළියම් කරනු ද, මුල්බෙහෙත් (කාය චිකිත්සා) කරනු ද, කාරම්බෙත් ඈ ගල්වා වණ සුව වූ පසු ඒ ගලවා දමනු දැ යි මේ හෝ, මෙබඳු නොසරුප් දිවෙලින් දිවි පවත්වතුදු මහණ ගොයුම් මේ සියල්ලෙන් වැළැක්කේ යැ යි ද,

මෙසේ හෝ ලොවී ජන තෙමේ බුදුහු ගුණ කියයි.

මෙය හුදු සිල් පමණක් වූ ම ඇලුප් ගුණයෙක.

(මහසිල් නිමි)

බුදුහුගුණ ඇනිසැටියෙන් කියන තැනැත්තවුන් හැර පාන, බුදුහු තමාම දත්, සෙස්සවුන් විසින් දුකසේ දත යුතු, ගැඹුරු, සියුම් අත් ම දහම් කෙනෙක් ඇත.

ඒ වනාගි දෙසැට මිසදිටුයෙහි තතු ය.

එහි **පූර්වාන්තකල්පික**[79] (පෙර අත්බව් පිළිබඳ) මිසදිටු අටළොසෙක. **අපරාන්තකල්පික**[80] (මතු අත්බව් පිළිබඳ) මිසදිටු සුසාළිසෙක. එහි ද **සෝවලශාශවතවාද**[81] (සියල්ල නො-වෙනස් ව සදහට ම පවති යි ගත් මිසදිටු) සතරෙක. **ඒකත්‍ය-ශාශවතවාද** (කොටසක් ම නොවෙනස් ව සදහට පවති යි ගත් මිසදිටු) සතරෙක. **අනන්තානන්තික** (ලොව කෙළවරක් ඇති නැති බව පිළිබඳ මිසදිටු) සතරෙක. **අමරාවික්ෂෙපක**[82]

---

79. පූර්වාන්තකල්පික = පූර්ව අන්තය. මෙයින් පෙර වූ ස්කන්ධපරම්පරා කොටස තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් වරදවා කල්පනා කොට පහළ කැර ගත් දෘෂ්ටි පූර්වාන්තකල්පික දෘෂ්ටි නම **80.** අපරාන්තකල්පික = අපර අන්තය (මතු ස්කන්ධ පරම්පරාව, මතු අත් බව) තෘෂ්ණාදීන් වරදවා කල්පනා කොට පහළ කැර ගත් දෘෂ්ටි අපරාන්තකල්පික දෘෂ්ටි නම. **81.** ශාශවතවාද = වෙනස් නොවැ සදකල් ම පවත්නා ආත්ම නම් දෑයක් ඇතැ යි ගත් දෘෂ්ටිය ශාශවතවාද නමි. දෘෂ්ටි ද දෘෂ්ටිප්‍රකාශක වචන ද වාද නමි. **82.** අමරාවික්ෂෙපික = අමර යනු ආඳුනට නම් ඉවි. අතට නොහසු වන ආඳකු සේ ප්‍රශ්නයට උත්තරයෙන් හසු නොවන්නට තැත් කරන්නහු ගේ දෘෂ්ටියත් වචනයත් අමරාවික්ෂෙපවාද නමි.

(නොහසුවන සේ ප්‍රශ්නයට උත්තර දෙන්නහු පිළිබඳ මිසදිටු) සතරෙක. යදෘච්ඡාසමුත්පන්න[83] (සියල්ල ඉබේ හැදෙතැයි යන) මිසදිටි දෙකෙක.

මෙසින් කේවලශාශ්වතවාද දෘෂ්ටිය ගත්තෝ සතර දෙන නම්:

කිසිවෙක් දහන් වඩා පෙර දෑ සිහි කරන නුවණ උපදවා එයින් තමා පෙර අත්බව් සියදහස් ගණින් දකී. පෙර අත්බැවින් පසු අත්බවට රූපාදීන් කිසි දහමක් එතැ යි ද, එය 'ආත්ම' යැ යි ද 'ලෝක' යැ යි ද හේ ගනී. ඒ ආත්මය, ඒ ලෝකය නොනැසී හැම කල්හි පවතී යැ යි මිසදිටු ගනී.

තව එකෙක් යටකී සේ ම දහන් වඩා යටත් පිරිසෙයින් කපක් ද උඩත් පිරිසෙයින් කප් දසයක් ද ඉයු කල (අතීත කාලය) දකී. දැක, පළමු තැනැත්තා සේ ම ආත්ම ලෝක හැමකල් පවතිතැ යි දිටි ගනී. අනෙකා ද ඔහු සේ ම දහන් වඩා යටත් පිරිසෙයින් කප් දහසක් ද උඩත්පිරිසෙයින් කප් සතළිසක් ද අතීතය දකී. හේ ද පළමු වැන්නා සේ ම ආත්මයත් ලෝකයත් සදහට ම පවතී යි දිටි ගනී. තව එකෙක් හුදු විමැසුම් නුවණින් ම සලකා බලා ආත්මයත් ලොවත් සදහට ම පවතී යැ යි දිටි ගනී.

ඒකත්‍යශාශ්වතවාදය ගත් සතර දෙනා නම්:

එකෙක් පොළොව ඇති වූ නොබෝ කල්හි ම ආභස්සර බඹලොවින් සැව මෙහි කලින් ම පහළ වැ තුබූ ශූන්‍ය හිස් විමනෙක ඕපපාතික උපතින් උපදී. හුදෙකලා වැ බොහෝ කල් ගෙවූ ඔහුට 'තවත් සත්හු වෙත් නම් මැනැවැ' යි සිතෙයි. කල් යැමෙදී ආයු හෝ පින් හෝ ගෙවී ආභස්සරයෙන් සැව තවත් කිසි කෙනෙක් එහි උපදිත්. පළමු ව ඉපැද සිටියේ පසු ව උපන්නාවුන් දැක 'තමා සිතූ බැවින් ඔහු උපන්හ'යි සිතා 'මම මොවුන් මැවීමි'යි 'මහබඹයෙමි'යි සිතයි. පසු වැ උපන්නන් එයින් මැරි යද්දීත් පළමු තැනැත්තේ තව ම ජීවත් වේ.

83. යදෘච්ඡාසමුත්පන්න = අධිච්චසමුප්පන්න යනු පාලියෙහි එන සැටියි මෙ තැන අධිච්ච යනු යදෘච්ඡා යන්නෙහි ප්‍රාකෘත රූපයෙකි. පාලියෙහි යදිච්ඡා යි ද මේ සිටී. බෞඬ සංස්කෘතයෙහි මෙය අධීත්‍යසමුත්පන්න සී. සකුවෙස් දී අදහස් නොසොයා තැනු රූපය ධම්ප්‍රදීපිකාවට ද ගෙන ඇත. හේතුවක් ප්‍රත්‍යයක් නැති ව අහම්බෙන් පහළ වූ දෑ යනු අධිච්චසමුප්පන්න (යදෘච්ඡාසමුත්පන්න) යන්නෙහි අර් යි එසේ පහළ වූ දෑ ඇතැයි දෘෂ්ටිය අධිච්චසමුප්පන්න (යදෘච්ඡාසමුත්පන්න) වාද යි.

ආයු පැහැ සැප බල නුවණ යන ඍද්ධියල්ලෙන් ද පළමු තැනැත්තේ පසුව උපන්නනට වැඩි තත්හි සිටී. එ බැවින් පසු වැ උපන්නෝ ඔහු තමන් මැවූවහු කොට සිතත්. ඔවුන් අතුරෙන් එයින් සැව මිනිස් ලොව උපන්නවුන් ගෙන් කිසිවෙක් දහන් වඩා අතීතය බලයි. එහි තමනට පළමු ඒ බඹහු උපන්නා ද ඔහු තව ම හිඳිනු ද දැක 'ඒ මහබඹා ය, හේ නිත්‍ය ය, ඇපි අනිත්‍යයම්හැ' යි දිට්ඨි උපදවයි.

ඇතැම් දෙවිහු පමණ ඉක්මැ කෙළිසුවැ ඇලුණාහු බොජුන්-ගනුවට ද සිහි නො කොට කල් ගෙවත්. එක් බොජුන් වේලක් ඉක්මී පසු නිරතුරු ම අහර ගත ද මැලැවෙන්නට බට ඔවුන් සිරුරු මැලැවේ ම ය. එයින් නොබෝ වේලෙහි මියෙත් ම ය. ඔවුන් අතුරෙන් මිනිස් ලොවැ උපන්නවුන් ගෙන් කිසිවෙක් දහන් වඩා පෙර අත්බව බලා, පෙර දවසැ එහි තමන් හා සිටි දෙවියන් තව ම එහි සිටුනා දැක, 'එහි දෙව්ලොවට අයත් ඇතැම් දෙවියෝ නො මියෙති. සෙසු ඇතැම්හු මියෙති' යි ඒකත්‍යශාශ්වතදෘෂ්ටි ගනිති, ලොවට ද කියා පාති. මේ දෙවෙනි ඒකත්‍යශාශ්වතදෘෂ්ටි ගත් පක්ෂය යි. (සිවුමහරජයෙහි) ඇතැම් දෙවිහු අනුන් යසඉසුරු දැක, එය ඉවැසිය නොහී කොවහින් ඇවිලෙති. එයින් ම මියැ ඇතැම්හු මිනිස්ලොවැ උපදිති. ඔවුන් ගෙන් කෙනෙක් දහන් වඩා පෙරත්බව දැක, පෙර එහි සිටියවුන් තව ම නො සැවැ සිටිනු දැක 'එහි කෙනෙක් නො මියෙති කෙනෙක් මියෙති' යි දිට්ඨි ගෙන ලොවට කියති. මේ **තෙවෙනි ඒකත්‍යශාශ්වතවාද** ගත් පක්ෂය යි.

අන් කෙනෙක් හුදු තැකුම් (තර්ක) විමැසුම් පමණින් රුව (රූපය) නැසෙයි, අත (ආත්මය) නො නැසේ යැ යි දිට්ඨි ගෙන ලොවට කියයි. මේ **සිවුවන ඒකත්‍යශාශ්වතවාද** ගත්තෝ යි.

අන්තානන්තික වාදය ගත් සතර දෙන නම්:-

කෙනෙක් කිසුණුඑළිය වඩා තමන් කැමැති සියලු තැන පැතිරැවියැ නො හැක්කෝ මඳ දුරක් ම එය වඩා, එය පතළ සීමාව ම ලොවැ යි ගෙන, එයින් එපිට ලොව නැතැ යි සිතා 'ලොවැ කෙළවර ඇතැ' යි දිට්ඨි ගනිත්. මේ පළමු වන **අන්තානන්තිකවාදිහු** ය.

කෙනෙක් කිසුණුඑළිය තමනට අරමුණු කළ හැකි තාක් ඈතට පතුරුවා කෙළවරක් නො දැක 'ලොව අනන්ත යැ' යි දිට්ඨි ගනිත්. මොහු **අන්තානන්තිකවාද** ගත් දෙවැන්නෝ ය.

කෙනෙක් කිසුණුළුළිය සරස හැම දෙසැ පතුරුවා උඩුයැටි දෙ දෙසැ නො පතුරුවා 'ලොව උඩුයැටි දෙදෙසැ ඉම් (කෙළවර) ඇත. සරසට ඉමක් (කෙළවරක්) නැතැ' යි දිටි ගනිත්. මොහු **තෙවෙනි අනන්තානන්තිකවාදිහු** ය.

කෙනෙක් හුදු තැකුම් (තර්කණ) විමැසුම් පමණින් බලා 'ලොව් අනන්තවත් (කෙළවරක් ඇත්තේ) ද නො වේ, අනන්ත (කෙළවරක් නැත්තේ) ද නො වේ යැ' යි දිටි ගනිත්. මේ සතරවන **අනන්තානන්තිකවාදිහු** ය.

අමරාවික්ෂෙපක දෙ දෙනා නම්:

'මේ කුසල් ද? අකුසල් ද? මේ කුසල් අකුසල් දෙකෙන් පිටත් **දූයෙක්** ද? මේ තුන් අයුරින් ම ඔබ ලබ්ධිය නො වේ ද? මෙසේ ලබ්ධියක් ඔබට නැතැ යි වැටැහීමෙකුත් ඔබ සිතැ නැද්ද?' යන ඈ විසින් ඇසූ ඇසූ හැම පැණයට 'එසේ මගේ පිළිගැන්මෙක් නැතැ' යි පැණයෙන් මඟ හැර කතා කරන්නෝ වෙති. තමන් බස බොරු වුවොත් එය තමනට හානියෙකැ යි බියෙන් ඔහු මෙසේ මඟ හරිත්. මේ **පළමු වන අමරාවික්ෂේපකයෝ** ය.

කෙනෙක් කුසල් අකුසල් පිළිබඳ වැ තහවුරු වැටැහීමක් නැත්තාහු මේ කුසලැ යි හෝ අකුසලැ යි හෝ දැඩි කොට ගැන්ම තමනට අවැඩ ගෙන දෙතැ යි බියෙන් උත්තර දීමෙහි මඟ හරිත්. මේ **දෙවෙනි අමරාවික්ෂේපකයෝ** ය.

තව කෙනෙක් උගතුන් ගෙන් දෙස් නැගෙති යි නින්දා ලැබෙති යි බියෙන් කුසලාදීන් පිළිබඳ පැණයෙහි නො හසු වන සේ මඟ හැර කතා කෙරෙති. මේ **තෙවෙනි අමරාවික්ෂේපකයෝ** ය.

අන් කෙනෙක් අඳබල් බැවින් ම ඇසූ පැණයට 'එසේත් නො වේ, අන් සේත් නො වේ, එසේ නො වන්නේත් නො වේ' යන ඈ විසින් නොහසුවන පරිදි කතා කෙරෙත්. මේ **සිවුවන අමරාවික්ෂේපකයෝ** ය.

යදෘච්ඡාසමුත්පන්න (අධිච්චසමුප්පන්න) **වාදයෝ නම්**:-

අසන්සත් (අසංඥසත්ත්ව) බඹ ලොවින් සැව මිනිස් ලොවැ උපන් කිසි කෙනෙක් පැවිදි වැ දහන් වඩා පෙර වූසු අත්බව සිහි කරන නුවණ උපදවා, ඉසු අත්බව දැක, 'සංඥව පහළ වූයේ

මෙ අත්බවැ මුල දී යැ යි’ ද, ‘පෙර අත්බැවැ සංඥව නො වී යැ’ යි ද දැක, ඒ සංඥවේ හේතුව නො දැක, සංඥව ආත්ම වශයෙනුත් ලෝකවශයෙනුත් ගෙන, ආත්මයත් ලෝකයත් හේතුරහිත ව (ඉබේ, අහම්බෙන්) පහළ වූහ යි දිට් ගනිති. මේ පළමු වන **යදෘච්ඡාසමුත්පන්නවාදීහු** ය.

කෙනෙක් හුදු තැකුම් විමැසුම් පමණින් ලත් වැටහීම අනුව ආත්මයත් ලෝකයත් ඉබේ ම අහම්බෙන් පහළ වූහ යි දිට් ගනිති. මේ දෙවෙනි **යදෘච්ඡාසමුත්පන්නවාදීහු** යි.

මෙසේ පූර්වාන්තකල්පිකවාදීන් අටොළොස් දෙනා ගේ වශයෙන් පෙරඅත්බව පිළිබඳ දිට් සොළොසෙකි.

අපරාන්තකල්පික දෘෂ්ටි ගත් සුසාළිසෙකි. ඔවුන් ගෙන් **සංඥීවාද** ගත් **සොළොස** නම්:

කෙනෙක් කිසුණු පිරියම් වඩා කිසුණුරුව ආත්ම විසින් ගෙන, එහි එල්බුණු දහන් සිතැ සංඥව ‘ආත්මයාගේ සංඥ’ යි ගනිත්. කෙනෙක් හුදු තැකුම් විමැසුම් පමණින් ‘රූපය ආත්ම යැ, එහි එල්බුණු සංඥව ආත්මසංඥ’ යි ගනිත්. මොහු **‘ආත්මය රූපවත් ය, මරණින් පසු නිත්‍ය යැ, සංඥ ඇත්තේ යැ’** යි දිට් ගනිත්.

කෙනෙක් අරූදහන් උපදවා එහි **අරමුණ ආත්ම යැ යි ද,** ඒ දහන්සිතැ වූ සංඥව **ආත්මයා ගේ සංඥ** යි ද දිට් ගනිත්,

කෙනෙක් තැකුම් විමැසුම් පමණින් ‘ආත්මය අරූප යැ. සංඥවත්යැ’ යි දිට් ගනිත්. මේ දෙ දෙනා ම **‘ආත්මය අරූප ය, සංඥී යැ, මරණින් මතු නිත්‍ය යැ’** යි දිට් ගනිත්.

(රූ දහන් හා අරූ දහන් වැඩූ) කෙනෙක් (ඒ දහන්හි අරමුණ ආත්ම යැ යි ද, දහන් සිතැ වූ සංඥව ආත්මයේ සංඥව යැ යි ද ගෙන) **‘ආත්මය රූපීත් අරූපීත් වේ, මරණින් මතු නිත්‍ය යැ’** යි දිට් ගනිත්.

කෙනෙක් තැකුම් විමැසුම් පමණින් **‘ආත්මය රූපීත් අරූපීත් නො වේ. මේ දෙඅයුරින් ම පිටත් යැ, මරණින් මතු සංඥී වේ’** යැ යි දෘෂ්ටි ගනිත්.

(කිසුණු වැඩූ) ඇතැම් කෙනෙක් (කිසුණු එළිය රිසි තාක් දුර පැතිරවියැ නො හෙති. ඔහු කිසුණුඑළිය ආත්ම විසින් ගනිති. එහි සීමාව දක්නෝ) **‘ආත්මය අන්තවත් යැ, මරණින් මතු නිත්‍ය යැ, සංඥී යැ’** යි දිට් ගනිති.

කෙනෙක් (ඉහත අනන්තානන්තිකවාදයෙහි දෙවෙනි දිට්ඨිගතුවා සේ) ආත්මය අනන්ත යැ සි ගන්නාහු **'එය මරණින් මතු සංඥී යැ'** සි දිට් ගනිත්.

කෙනෙක් (යටැ තෙවෙනි අනන්තානන්තවාදියා සේ) ආත්මය අන්තවත් ද අනන්ත ද වේ යැ සි දිට් ගෙන, එය **මරණින් මතු නිත්‍ය යැ, සංඥී යැ** සි දිට් ගනිත්.

කෙනෙක් (යටැ සිවුවන අනන්තානන්තිකවාදියා සේ)'ආත්මය අන්තවත් ද නො වේ, අනන්ත ද නො වේ යැ' සි ගෙන එය **මරණින් මතු නිත්‍ය යැ, සංඥී යැ** සි දිට් ගනිත්.

කෙනෙක් (දහනට සමවත් අවස්ථා විසින්) ආත්මය (එක් අයුරු සංඥ ඇත්තේ' සි ගෙන) **'මරණින් පසු** එය **නිත්‍ය යැ සංඥී යැ'** සි දිට් පහළ කෙරෙත්.

කෙනෙක් (දහන් සමවත් අවස්ථා විසින්) ආත්මය (නොයෙක් අයුරු සංඥ ඇත්තේ සි සලකා එය) **මරණින් මතු නිත්‍ය යැ** සි දිට් ගනිත්

කෙනෙක් (දහන් නොසමවත් අවස්ථා විසින්) ආත්මය (නොයෙක් අයුරු සංඥ ඇත්තේ සි සලකා, එය) **මරණින් මතු නිත්‍ය** සි දිට් ගනිත්.

කෙනෙක් මහත් කොට නොවැඩූ කසිණ එළිය **ආත්ම** යැ සි ද **ඒ නොමහත් සංඥා ඇත්තේ** සි ද **මරණින් මතු නිත්‍ය යැ** සි ද දිට් ගනිත්.

කෙනෙක් මහත් කොට වැඩූ කිසුණුඑළිය **ආත්ම යැ සි** ද, එහි එල්බැ පැවැති **සංඥාව අප්‍රමාණ යැ සි** ද, **මරණින් මතු ඒ නිත්‍ය සි** ද දිට් ගනිත්.

කෙනෙක් දහන් වඩා දිවැස උපදවා බලන්නාහු සිවුවන දහන්බිමැ උපදනාවුන් දැක ඔවුන් දහන්මුවා සිත සුව සහගිය බව ම සලකා, **'ආත්මය මරණින් මතු ඒකාන්තසුඛි වැ නිත්‍ය වැ සංඥී වැ සිටි'** සි දිට් ගනිත්.

කෙනෙක් නිරයැ උපදනකු දිවැසින් දැක, **'ආත්මය සංඥී යැ, මරණින් මතු ඒකාන්තදුඃඛී'** සි දිට් ගනිත්.

කෙනෙක් සුවදුක් මුසු මිනිස්ලොවැ උපදනකු දිවැසින් දැක, **ආත්මය මරණින් මතු සුවදුක් දෙක ම විඳී යැ** යි **නිත්‍යත් සංඥීත්** වේ යැ සි දිට් ගනිත්.

කෙනෙක් වේහප්ඵල බඹලොවැ උපන්නකු දිවැසින් දැක, **'මරණින් මතු ආත්මය නිත්‍ය ය, සංඥී ය, නොසුව නොදුක් වේදනා ඇත්තේ යැ'** යි දිට්ඨි ගනිත්.

මෙසේ මේ සොළොස් දිට්ඨි ගතුවන් විසින් සංඥීවාද සොළොසෙකි.

අසංඥීවාද ගත් අට දෙනා නම්:

(කිසුණු රුව ආත්ම යැ යි ගත්) ඇතැම් කෙනෙක් එය **මරණින් මතු නිත්‍ය යැ** යි **අසංඥී යැ** යි දිට්ඨි ගනිත්.

කෙනෙක් (අරූදහන්-අරමුණු ආත්ම විසින් ගෙන එය සංඥරහිත යැ යි දැක) **'ආත්මය අරූපී ය, මරණින් මතු නිත්‍ය යැ'** යි අසංඥී යැ යි දිට්ඨි ගනිත්.

කෙනෙක් (රූ-අරූ-දහන්-අරමුණු ආත්ම විසින් ගෙන එය රූපීත් අරූපීත් වේ යැ යි සලකා) **'ආත්මය රූපීත් අරූපීත් වේ, මරණින් මතු නිත්‍යත් අසංඥීත් වේ'** යැ යි දිට්ඨි ගනිත්.

කෙනෙක් (යටැ සංඥීවාදයෙහි කී පරිදි ම) **ආත්මය අරූපීත් නො වේ, රූපීත් නො වේ, මරණින් මතු නිත්‍ය** ය, **සංඥ රහිත යැ'** යි දිට්ඨි ගනිත්. කෙනෙක් **'ආත්මය අනතවත් යැ, මරණින් මතු නිත්‍ය යැ, අසංඥී යැ'** යි දිට්ඨි ගනිත්.

කෙනෙක් **'ආත්මය අනනත යැ, මරණින් මතු නිත්‍ය යැ, අසංඥී යැ'** යි දිට්ඨි ගනිත්.

කෙනෙක් (යට සංඥීවාදයේ කී පරිදි) **'ආත්මය අන්තවත් ද අනනත ද මරණින් මතු නිත්‍ය ද අසංඥී ද වේ'** යැ යි දිට්ඨි ගනිත්.

කෙනෙක් ආත්මය **'අනතවත් ද නො වේ, අනනත ද නො වේ, මරණින් මතු නිත්‍ය වේ, අසංඥීත් වේ යැ'** යි දිට්ඨි ගනිත්.

මෙසේ දිට්ඨිගතුවන් අට දෙනා ගේ විසින් අසංඥීවාද අටෙක.

නෙවසංඥනාසංඥවාද ගත් අට දෙනා නම්:

කෙනෙක් **'ආත්මය රූපී යැ, මරණින් මතු නිත්‍ය යැ, සංඥීත් අසංඥීත් නො වේ'** යි දිට්ඨි ගනිත්.

කෙනෙක් 'ආත්මය අරූපී යැ, මරණින් මතු නිත්‍ය යැ, සංඥීත් අසංඥීත් නො වේ' යි දිට් ගනිත්.

කෙනෙක් 'ආත්මය රූපීත් අරූපීත් වේ, මරණින් පසු නිත්‍ය ය, සංඥීත් අසංඥීත් නො වේ' යි දිට් ගනිත්.

කෙනෙක් 'ආත්මය රූපීත් අරූපීත් නො වේ, මරණින් මතු නිත්‍ය ය, සංඥීත් අසංඥීත් නො වේ' යැ යි දිට් ගනිත්.

කෙනෙක් 'ආත්මය අන්තවත් ය, සංඥීත් අසංඥීත් නො වේ' යි දිට් ගනිත්.

කෙනෙක් 'ආත්ම ය අනන්ත ය, සංඥීත් අසංඥීත් නො වේ' යි දිට් ගනිත්.

කෙනෙක් 'ආත්මය අන්තවත් ද අනන්ත ද නො වේ, සංඥීත් අසංඥීත් නො වේ' යි දිට් ගනිත්.

මෙසේ මේ දිට්ගතුවත් අට දෙනා ගේ වශයෙන් නෙවසංඥ-නාසංඥවාද අටෙකි.

උච්ඡේදවාද ගත් සත් දෙනා නම්:

'මේ ආත්මය මරණින් මතු උච්ඡින්න වෙයි, පුනර්භවයෙක් නැතැ' යි කෙනෙක් කියත්.

'මේ ආත්මය කම්වැදූරි දෙව්ලොවැ ගොස් කබලීකාර ආහාර වළඳ අන් දෙව් අත්බවෙක් වැ සිට මැරී එයින් ම උච්ඡින්න වේ' යි කෙනෙක් කියත්.

'මේ ආත්මය දෙව්අත්බවකට පැමිණ ද එතෙකින් නොසුන් වේ. ඒ රූපී වැ ඉඳුරන්ගෙන් පිරිපුන් මනෝමය වූ අන් ආත්මයෙක් වැ එහිදී මරණයෙන් මුල්සුන් වේ' යි කෙනෙක් කියත්.

'මේ ආත්මය ආකාශානන්තායතන තලයට පැමිණ එහිදී මැරී මුල්සුන් වේ' යි කෙනෙක් කියත්.

'මේ ආත්මය විඥානානන්තායතනයට පැමිණ එහි මරණයෙන් මුල්සුන් වේ' යි කෙනෙක් කියත්.

'මේ ආත්මය ආකිඤ්චන්‍යායතනයට පැමිණ එහිදී මරණයෙන් උච්ඡින්න වේ යැ' යි කෙනෙක් කියත්.

'මේ ආත්මය නේවසඤ්ඤානාසඤ්ඤායතන තලයට වැද මරණයෙන් එහිදී උච්ඡින්න වේ' යැ යි කෙනෙක් කියත්.

මේ දිට්ගතුවත් සත් දෙනා විසින් දිට් සතෙකි.

දෘෂ්ටධර්මනිර්වාණවාද[84] ගත් පස් දෙනා නම්:

'පස්කම්ගි ගැලී ඉඳුරන් පිනැවීම ම මෙ අත්බැව, නිවන්සුව විඳිනු යැ, අන් සුවෙක් නැතැ' සි කෙනෙක් කියත්.

'පළමු දහන් ලැබීම ම පරම දිටුදම් නිවනැ' සි කෙනෙක් යෙත්.

'දෙවෙනි දහන්සුවය පරම දිටුදහම් නිවනැ' සි කෙනෙක් දිට් ගතිති.

'තෙවෙනි දහන්සුව විඳිනු පරම දිටුදම් නිවනැ' සි කෙනෙක් යෙත්.

'සිවුවන දහන්සුව විඳිනු ආත්මයේ පරම දිටුදම් නිවනැ' සි කෙනෙක් යෙත්.

මොවුන් පස්දෙනා ගේ විසින් **දෘෂ්ටධර්මනිර්වාණවාද** පසෙකි.

සංඥීවාද සොළොස ය, අසංඥීවාද අට ය, නෛව-සංඥනාසංඥවාද අට ය, උච්ඡේදවාද සත ය, **දෘෂ්ටධර්මනිර්වාණ**වාද පස යැ යි සියලු **දෘෂ්ටිවාද** සුසැළිසෙකි.

මෙසේ පූර්වාන්තකල්පික දෘෂ්ටි ගතුවෝ අටොළොසෙක, අපරාන්තකල්පිකදෘෂ්ටිවාදීහු සැළිසෙකැ යි සියලු දිට්ගතුවෝ දෙසැට දෙනෙකි. අතීත හෝ අනාගත අත්බව් (කඳ කොටස්) ඇරැබැ **දෘෂ්ටිවාද** පවසන සියල්ලෝ මේ දෙසැටට ඇතුළත් ම වෙති. මෙයට නො හසු වන **දෘෂ්ටිවාදියෙක්** නැත. මෙ කරුණු ද මේ දිට්ගතුවනට වන පරලොව්ගතිය ද මෙයින් අන්‍ය ශීලසමාධිආදි දෑ ද තථාගත තෙමේ දනී. එහෙත් 'මේ මේ දෑ දනිමි' යි ඒ දැනීම තෘෂ්ණා දෘෂ්ටි මාන වියින් පරාමර්ශන නො කෙරෙයි. ඒසේ පරාමර්ශන නො කරන ඒ බුදුහු විසින් මෙරමා උපදෙස් නැති වැ තමා විසින් ම ඒ තෘෂ්ණාදීන් ගේ නිවීම දන්නා ලද්දේ ය. ඒ **දෘෂ්ටිවාදයනට** බැස ගැන්මට හේතු වූ වේදනාවන් ගේ ඉපැත්ම ද නිරෝධය ද ආස්වාදය (රසය)ද ආදීනවය (දොස)ද නිඃසරණය (නික්මීම)ද තථාගත තෙමේ ඇති සැටියෙන් ම දනී. එසේ දන්නේ උපාදානරහිත ව[85] මිදුණේ වේ.

බුදුගුණ තිසි පරිදි වණත්නහු විසින් මෙකී දෘෂ්ටීන් ගේ තතු දක්නා බුදුහු සියල්ල දක්නා නුවණ වැණියැ යුතු.

---

84 දෘෂ්ටධර්මනිර්වාණවාද = දෘෂ්ට ධර්ම යනු මෙ අත් බව යි. මෙ අත් බව්හිම ලබන සුවය මෙ තන්හි දෘෂ්ටධර්ම නිර්වාණ නම්. 85. උපාදානරහිත ව = දැඩිගැනුම් නැති වැ, ඡන්දරාගයෙන් ග්‍රහණය නො කොට. උ. බී.

යම් දෘෂ්ටිවේදනාවෙකින් (දිටුසහගිය සොම්නසින්) යුත් මහණබමුණු කෙනෙක් 'ලෝකයත් ආත්මයත් ශාශ්වත ය (හැමකල් පවතී)' යන ආදි විසින් දිටු පවසන බස් කියත් ද, ඔවුන් ගේ ඒ වේදනාව දහවියා ගොඩෙක සිටුවන ලද කණුවක් මෙන් නොතහවුරු ය, සැලෙන්නේ ය (සෝවාන් ආදි ආර්‍යපුද්ගලයන් ගේ සම්දිටුව සේ තහවුරු නො වේ).

ඒ දිට්ඨිගතුවන්ගේ දෘෂ්ටිවේදනාව ද ස්පර්ශප්‍රත්‍යයයෙන් වේ. ස්පර්ශය නැති වැ වේදනාවෙක් නො වේ. චක්ෂුරාදි සයෙහි පහළ වන ස්පර්ශයන් ගේ ප්‍රත්‍යයයෙන් රූපාදි අරමුණු ස්පර්ශ කොට ඔහු දෘෂ්ටිවේදනාව ලබත්.

ඔවුන් ගේ ඒ දෘෂ්ටිවේදනාවන් ගේ ප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව ද, තෘෂ්ණාප්‍රත්‍යයයෙන් උපාදානය ද, උපාදානප්‍රත්‍යයයෙන් භවය ද, භවප්‍රත්‍යයයෙන් ජාතිය ද, ජාතිප්‍රත්‍යයයෙන් ජරා-මරණ ශෝක පරිදේව දුක් දොම්නස්හු ද පහළ වෙත්.

යථෝක්ත ස්පර්ශායතන සදෙනා ගේ හටගැන්ම ද නිරෝධය ද ආස්වාදය ද ආදීනවය ද නිඃසරණය ද යම් වේලාවෙක මහණ තෙමේ ඇතිසැටි දකී ද, එකල ඒ සියල්ලත් එසින් වැඩි වූ ශීලසමාධි ආදියත් හෙ තෙම දකී.

පූර්වාන්තකල්පික වූ ද අපරාන්තකල්පික වූ ද දෘෂ්ටි ගත් සියල්ලෝ (සියලු දෘෂ්ටිගතිකයෝ) මේ දිටු තතු පවසන දේශනා නැමැති දැලට ඇතුළත් වෙත්. මේ දේශනා දැලට නො හසු වූ කිසි ද දෘෂ්ටිගතිකයෙක් නැත.

එහෙත් තථාගත තෙමේ වනාහි තෘෂ්ණා නැසූයේ යට කී දිටුදැලට නො හසු වූයේ ය. ඔබ ජීවත් ව සිටින තෙක් දෙව් මිනිස්සු ඔබ දකිති. පිරිනිවනින් පසු (නැවත භවප්‍රතිසන්ධි නැති බැවින්) ඒ කිසි කෙනෙක් ඔබ නො දකිති."

බුදුරජුන් මෙය වදාළ කලැ අනඳ තෙරුහු 'මේ ආශ්චර්‍ය දේශනාවෙකැ' යි කියා, 'මේ දෙසුම කිනම් වේ දැ?' යි විචාළහ. 'මේ **අර්ථජාලයැ** යි ද **ධර්මජාලයැ** යි ද **බ්‍රහ්මජාලයැ** යි ද **දෘෂ්ටිජාලයැ** යි ද **නිරුත්තරසංග්‍රාමවිජයයැ** යි ද යන නම්වලින් සලකව" යි බුදුරජුහු වදාළහ.

[තෙරුවනට නිගාවට නොකිපිය යුතු බව, තෙරුවන් ගුණ වණනු අසා උඩඟු නොවිය යුතු බව, සුළුසිල්, මැදුම්සිල්, මහසිල්, දෙසැට දිටු බෙදුම්, දිටුහිසින් පිළිසඳුපාව, බුදුරජුන් දිට්ඨිදැලින් මුත් බව යන මෙතෙක් දෑ මෙහි දැක්වේ.]

2. සාමඤ්ඤඵල සූත්‍රය

1. එක් සමයෙක බුදුරජ්ජු රජගහ නුවර නිසා කෝමාරභච්ච ජීවකයා ගේ අඹවෙනෙහි වූ වෙහෙරැ වෙසෙති.

එ සෙමෙහි එක් පුණුපොහෝ දිනෙක රෑ කල්හි අජාසත් රජ[86] ඇමැතියන් බණවා, කිසි මහණක්හු හෝ බමුණක්හු කරා එළැඹ දහම් කතාවෙක යෙදෙනුවට රිසි ඇතැ යි පවසා, 'කවර මහණක්හු හෝ බමුණක්හු කරා එළැඹියැ යුතු දෑ?'යි විචාළේ ය.

2. ඇමැතියෝ සදෙනෙක් තමන් ශාස්තෘ කොට හදහන කස්සපගොත්තිය **පූරණ**, ගෝසාල **මක්ඛලි**, කච්චානගොත්තිය **කකුධ**, බෙලට්ටිපුත්ත **සඤ්ජය**, කේසකම්බලී **අජිත**, **නාතපුත්ත** නිගණ්ඨ යන තොටුගුරුන්[87] සදෙනා ගේ නම් සඳහන් කළහ. රජ නිහඬ විය. ඉක්බිති කිසිත් නොබැණ ළඟ හුන් ජීවක කෝමාරභච්චයා බණවා 'ඔබ කුමක් කියත් දෑ'යි විචාළේ ය. හේ බුදුගුණ පැවැසී. 'බුදුරජුන් දක්නට යනු මැනැවැ' යි ද කී ය. 'බුදුරජ්ජු කොහි වෙසෙත් දෑ?' යි රජ පුළුවුත. එක්දහස් දෙසිය පනසක් පමණ පැවිදි සව්වන් හා තමා අඹවෙනෙහි ඔබ විසන පවත් හේ කී ය. 'එහි යම්හ. ගමන පිළියෙල කරව'යි රජ ඇණැවී ය. හේ ද ගමන පිළියෙල කෙළේ ය. රජ ද මැතියන් සහිත ව මහ පෙරහැරින් අඹඋයන බලා නික්මිණ.

3. අඹවෙනෙහි වෙහෙර වෙත පැමිණි රජ, එතරම් මහත් මහණමුළුවක් ඇත ද, හැම තැන ම පැවැති නිහැඬියා-වෙන් සැක සිතී. 'කෝමාරභච්චය, තෝ මා රවටා ගෙනවුත් සතුරන් අතට පාවා දෙයි ද? එසා මහත් මහණමුළුවක් ඇති තැන කිසිවක්හු කිවිසින හෝ කසින හඬ පමණෙකුත් නැතියේ කිමැ?'යි ඇසී ය. 'දේවයිනි, බිය නො ගන්න. තෙල අසුන්හලැ මැදෑ කණුවට පිටු දී පෙර දිගට මුහුණ ලා බික්සඟන මැදෑ වැඩැ හිඳිනුවෝ බුදුරජ්ජු යැ' යි කෝමාරභච්ච කී ය.

4. අජාසත්රජ බුදුරජුන් වෙත් ගියේ ය. ගොස් පසෙකැ සිටැ, නිහඬ වැ සන්සුන් වැ හුන් බික්සඟන බලා, 'මාපුත් **උදයිභද්‍ර** ද මේ බික්සඟන සේ සංසුන් බැවින් යුත් වේ වා' යි.

86. උපග්‍රන්ථය බලනු. 87. පූරණාදීන් ගැන උපග්‍රන්ථය බලනු.

උදත් ඇති. 'මහරජ, තොප සිත ප්‍රේමය ඇති දෙසට ගිය නියා'යි බුදුරජ්ජුහු වදළහ. 'වහන්සේ, උදයිභද්‍ර කුමර මට ප්‍රිය යැ. මේ භික්සඟන කෙරෙහි ඇති සංසුන් බව බඳු ම වූ සංසුන් බැවින් මාපුත් උදයිභද්‍ර කුමර සමන්වාගත වේ වා'යි රජ කී.

5. ඉක් පසු රජ බුදුරජුන් ද භික්සඟන ද නැමැද පසෙක ඉඳ ගත. එසේ හිඳ අවසර ගෙන බුදුරජුන් හා කතාවට බටුයේ ය.

අජාසත් – වහන්ස, ඇතරුවම්[88] ඈ සිප් පුහුණු කළාහට එහි පල මෙ ලොවැ දී ම ලැබෙනු ඇත. මහණදම් පිරුමෙනුත් මෙ ලොවැ මැ ලැබෙන පලයක් දක්විය හෙයි ද?

බුදුරජුහු – මහරජ, මෙ කරුණ තොප අන් මහණබමුණන් වෙතිනුත් විචාළා ඇද්ද?

අජාසත් – එසේය, වහන්ස.

බුදු: – ඔහු කෙසේ කිවු ද? ඔබට බරෙක් නො වේ නම් කියන්නැ.

අජා: – වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බඳු කෙනෙකුන් හමුයෙහි එය පවසනු මට බරෙක් නො වේ.

බුදු: – එසේ නම් කියන්නැ.

අජා: – වහන්ස, දවසෙක කාශ්‍යපගෝත්‍රික **පූරණයන්** කරා ගොස් මේ ඔබ (ගෙන්) විචාළ පැණය ම විචාළෙමි. එවිට ඔහු—

"සියතින් යමක් කරන්නහුට ද මෙරමා ලවා කරවන්නහුට ද, මෙරමා අත් ඈ තමා ම සිඳුනාහට ද අනුන් ලවා සිඳුවන්නහුට ද, මෙරමා දඬු ආදියෙන් පෙළෙන්නහුට ද පෙළවන්නහුට ද, පරා සතු දෑ පැහැරගැනුම් ආදියෙන් ඔවුන් තවන්නහුට ද තවවන්නහුට ද, අහර වැළැක්වීම් ඈ විසින් පරා වෙහෙසන්නහුට ද වෙහෙසවන්නහුට ද, මෙරමා සොලොවන්නහුට ද සොලොවවන්නහුට ද, පණිවා කරන්නහුට ද කරවන්නහුට ද, අසිනාදන් කරන්නහුට ද, කරවන්නහුට ද, ගෙවල් බිඳින්නහුට ද බිඳුවන්නහුට ද, කිසිත් නොඉතිරි කොට මෙරමා දෑ

---

88. ඇතරුවම් = හස්ත්‍යාරෝහකර්මය, ඇත්ගොවු කම.

විලුම්බුනාහට[88] ද, විලුප්වත්නාහට ද, ගෙවටා සිට එහි වූ බඩුමුට්ටු පැහැරැ ගන්නාහට ද, ගන්වන්නාහට ද, මං කොල්ල කන්නා-හට ද මං කොල්ල කවන්නාහට ද, පරඹුන් සෙවුනාහට ද, මුසවා තෙපලන්නාහට ද, පවක් කරමී සිතා කරන්නාහට ද, පවෙක් නම් නො වෙයි. තියුණු පාරාවළල්ලෙකින් මෙ පොළොවැ සතුන් මරා එක් මස්ගොඩක් කරන්නහුට ද එයින් වන පවෙක් නැත. සත්නට වද කෙරෙමින් කරවමින් ගංගා නදියේ දකුණු තෙර තෙක් ගිය ද පව් නැත. දන් දෙමින් දෙවමින් යාග කරමින් කරවමින් ගංගානදියේ උතුරැ තෙර තෙක් ගිය ද, එයින් වන පිනෙක් ද නැත. දීමෙන් ඉඳුරන් දැමීමෙන් සිල්රැකීමෙන් සබවස් රැක්මෙන් වන පිනෙකුත් නැතැ"යී අක්‍රියාවාදය පැවැසුහ. 'මා රටැ වෙසෙන මහණකු හෝ බමුණකු හෝ වෙහෙසීමට සිතනු මා වැන්නක්හට නො වටී' යැ යි මට සිතුණි. ඔවුන් බසෙහි මා කලකිරුණ ද, එබව නො අඟවා සතුටකුදු නො දක්වා නික්මැ ආමි.

6. වහන්ස, අන් වරෙක මම **ගෝසාලමක්ඛලීන්** වෙත ද ගියෙමි. ගොස් මහණදම්හි මෙ ලොවැ ලැබෙන පල විචාළෙමි. එ විට ගෝසාල මස්කරිහු,

"සතුන් කෙලෙසන හේතුවෙක් ප්‍රත්‍යයෙක් නැත. ඉබේ ම (හේතුප්‍රත්‍යය නැති ව) සත්හු කෙලෙසෙත්. ඉබේ ම පිරිසිදු වෙත්. තමා ගේ වැඩ පිණිස කළයුතු දෑයෙක් නැත. මෙරමා වැඩ පතා කළ යුතු දෙයෙක් ද නැත. සැප දෙන පුරුෂකාර්‍යයෙක් නැත. සැපතට ඉවහල් බලය කියා එකෙක් නැත. වීර්‍යයැ යි පුරුෂශක්තියැ යි පුරුෂපරාක්‍රමයැ යි ගත යුතු කිසිත් නැත. හැම සත්හු හැම භූතයෝ හැම ජීවයෝ තමන් සවියක් බලයක් වැරක් නැත්තෝ ව ම නියමය ද සංගතිය ද (=තම තමා අයත් වර්ගයට පැමිණීම ද) සවභාවය ද යන තුනින් පරිණාමයට, මිහිකිරීමට යන්නාහු අභිජාති සයෙක ම සුව ද දුක් ද විඳිත්. එහි මේ පාමොක් යෝනිහු තුදුස් ලක්‍ෂ හදහස් හසියයෙක. කම් පන්සියයෙක. අන් සැටියෙකින් කම් පසෙක් ද තුනෙක් ද වේ. (කායකම් වාක්කම් නැමැති) පූර්ණකම් ද, (මනඃකම් වූ) අර්ධකම් ද වේ. පිළිවෙත් දෙසැටෙකි. අතුරුකප්දෙසැටෙකි. අභිජාතිසයෙකි. පුරිස්බිම් අටෙකි. දිවෙල් සාරදහස්නවසිය-යෙකි. පිරිවැජිපැවිජිකම් සාරදහස්නවසියයෙක. නාමඬුලු සාරදහස්නවසියයෙක, ඉඳුරෝ දෙදහසෙකි. නිරය තුන්දහසෙකි,

89.. විලෝපනය කරන්නාහට, පැහැරැ ගන්නාහට.

දුහුවිලි තැවැරෙන තැන් සතිසෙකි. සංඥීගභී සතෙකි. අසංඥී-ගභී සතෙකි. නිවටගප් සතෙකි. දෙව්වග සතෙකි. මිනිස්වග සතෙකි. පිසස්වග සතෙකි. මහවිල් සතෙකි. මහ පිරිවට සත්සියෙකි, මහ පල්ලම් සතෙකි. කුඩා පල්ලම් සත්සියෙකි. මහ සීන සතෙකි. කුඩා සීන සත්සියෙකි. නුවණ ඇති නැති හැම දෙනා ම සසර හැවිදූ දුක් කෙළවර කරනුවට ගෙවියැ යුතු කප් ගණන අසූසාරලක්‍ෂයෙකි. එහි නොමුහුකළ කම් මුහුකර-වනුවට රැක්කයුතු සිල් හෝ ව්‍රත හෝ තපස් හෝ බඹසර කියා එකෙක් නැත. ද්‍රෝණයෙන් මැන පමණ කළ දූයක් සේ සුවදුක් විඳීම නියම කල්ඉම ගෙවුණු කලැ අවසන් වෙයි. සසර ගමනෙහි අඩුවැඩි වීමෙක් නැත. නැඟීමෙක් නැත. දමාලූ හුවටක් දිග ඇති තෙක් ලිහිලිහී යන්නා සේ, එහි දික් පමණ ඉක්ම යැ නොහැකියා සේ, නුවණ ඇති නැති සියල්ලෝ නියමිත කාලසීමාව ගෙවෙන තුරු සසරැ දිව හැවිද දුක් අවසන් කෙරෙත්[90]" යැ සී.

මෙසේ සංසාරශුඞිවාදය පැවැසූහ. ඔවුන් බසට සතුටක් නො වූ නුමුත් කිසිත් නො බැණ පෙරළා ආමි.

7. වහන්ස, තව විටෙක කේශකම්බලී **අජිතයන්** කරා ගියෙමි. මහණදහම් රැක්මෙහි මෙ ලොවැ ලැබෙන පල විචාළෙමි. මා බසට ඔහු,

"දත්දීමෙහි, මහායාහයෙහි, කුසල් අකුසල්හි පලවිපාක නැත ැ.පරලොව සිටියාහට මෙ ලොවෙක් නැත. මෙ ලොවැ සිටියාහට පරලොවෙක් නැත. මවට පියාට උපකාර අපකාර කැරුම්හි කිසි පලයෙක් විපාකයෙක් නැත. මෙයින් මැරී උපදනා සත් කෙනෙක් නැත. නිවැරැදි මඟ පිළිපන්, දෙලොව තුමූ ම වෙසෙසින් දැන පසක් කොට හෙළි කරන මහණබමුණු කෙනෙක් නැත. මහාභූත සතරින් හැදුණු මේ සිරුර මළ කල එහි වූ සතර මහාභූතයෝ බාහිර සතර මහාභූතයන් කරා යෙති. ඉඳුරෝ අහසට යෙත්. මළසිරුර සොහොනට ගෙන යන්නාහ. සොහොන තෙක් ම ගුණාගුණ පැවැසීම වෙයි. ඇට පරෙවිපැහැ ඇති වේ. අමුතුබත් දෑ විසින් දුන් දත් මළසිරුරැ අළුකිස නිවහම් තෙක් ම වේ. දානය මූඪයන් විසින් පණවන ලද්දෙකි. පරලොව ඇත යන ආදි වූ ආස්තික වාදය ඔවුන් ගේ හිස් ප්‍රලාපයෙක. ඇති නැති සියල්ලෝ මරණින් මුල්සුන් වෙත්, මරණින් පසු නො උපදිත්" යැ සි උච්ඡෙදවාදය පැවැසූ හ.

---

90. උපග්‍රන්ථය බලනු.

ඔවුන් ගේ කතාවට මම් සතුටු නොවීමි. එහෙත් ඒ බව නො අගවා ආමි.

8. වහන්ස, අන් වරෙක කාත්‍යායනගෝත්‍රික **පකුධයන්** කරා ගොස් මහණදමෙහි මෙ අත්බව්හි පල විචාළෙමි. එයට ඔහු,

"කිසිවකු විසින් නො කැරුණු නො මැවුණු, පවුකුළක් සේ තහවුරු වැ සිටින, තුමූත් කිසිත් නො උපදවන කායපදාර්ථ සතෙකි: පඨවිකාය, ආපෝකාය, තේජෝකාය, වායුකාය, සුඛ, දුක්ඛ, ජීව යන සත ය. ඔහු සැලුම් පෙරළුම් නැතියහ. උනුත් නො පෙළත්නෝ ය. සුව හෝ දුක හෝ සුවදුක් දෙක ම හෝ දෙනුයෙහි නො සමත්හ. ඒ සත් කයෙහි නසන්නෙක් නස්වන්නෙක්, අසන්නෙක් අස්වන්නෙක්, දැනගන්නෙක් දන්වන්නෙක් හෝ නැත. සැතෙකින් කිසිවක්හුගේ හිස සිඳුතේ දිවි තොර කරන්නේ නො වේ. එහි අවිය සත්කය අතුරෙහි විවරයට වැද ගනී[91]" යි කීහ.

වහන්ස, මහණදමෙහි මෙ අත්බව්හි දී ම විඳුනා පල විචාළ මට ඔහු අනෙකක් අනෙකක් ම කීහ. එයින් නොසතුටු වැ නිහඬ ව මම් ආමි.

9. වහන්ස, තව ද වරෙකැ **නාතපුත්ත** නිගණ්ඨයන් වෙත ගොස් පිළිසඳර කතා කොට පළමු පැණය ම පුළුවුතිමි. ඔහු මට මෙය කීහ:

"නිවට සස්නැ නිවට තෙමේ යාම සතරක් ඇති සිල්හැවුරු–මෙන් හැඬිරුණේ වෙයි. මෙසේ ය: නිවට සියලු සිසිල් දියෙන් වැළැකුණේ වෙයි. සියලු අයුරු සංවර ලකුණින් යුත් වේ. පිඹහළ සියලු පව් ඇත්තේ ය. සියලු පව් වැළැක්වීමෙන් මෝක්ෂය සපශී කොට සිටියේ වේ. මෙසේ නිවට තෙම සිවු යම් හැවුරුමෙන් හැවුරුණේ වේ. නිවට මෙසේ සිවුයම් හැවුරුමෙන් සැදුණු බැවින් තව දුරට කළයුත්තක් නැත්තෙන් සංයම කළ ආත්ම ඇතියේ මොනොවට පිහිටි සිතැත්තේ වේ[92]."

වහන්ස, මහණදමැ මෙලොවැ පල විචාළ මට නාපුත් නිවටාණෝ සතර යම් හැවුරුම පැවැසූහ.

10. වහන්ස, වරෙක **බෙලට්ඨිපුත්‍ර සංජයයන්** කරා ද ගියෙමි. ගොස් පිළිසඳර කතා කොට පසෙක හිඳ මහණදමෙහි මෙ ලොවැදී මැ ලබන පල විචාළෙමි. ඔහු මට මෙසේ කීහ:

91; 92 උපග්‍රන්ථය බලනු.

‘පරලොවක් ඇද්ද?’ යි මා විචාරයි නම්, ‘පරලොවක් ඇතැ’ යි මට සිතුණොත් එය ඇතැ යි ඔබට කියන්නෙමි. එහෙත් එසේ ‘පරලොවක් ඇතැ’ යි අදහසෙක් මා තුළ නැති. ‘පරලොවක් නැතැ’ යි කියා අදහසෙකුත් මට නැත. ‘පරලොවක් ඇත්තේත් නැත්තේත් වේ’ යැ යි කියා හෝ ‘පරලොවක් නොමැත්තේත් නො ම නැත්තේත් වේ’ යැ යි කියා හෝ අදහසෙකුත් මට නැත. ‘මෙයින් මැරී පර ලොවැ උපදනාහු ඇද්ද?’ යි මා විචාරත් නම් ‘එසේ අදහසක් මට නැතැ’ යි කියමි. ‘පරලොව යන්නාහු නැද්ද?’ යි විචාරතොත් ‘එබඳු අදහසෙකුත් මට නැතැ’ යි කියමි. මැරී පර ලොව යන්නෝ ඇත්තෝත් නැත්තෝත් වෙද්ද?’ යි විචාළොත් ‘එසේ වූ අදහසෙකුත් මට නැතැ’ යි කියමි. ‘පර ලොව යන්නෝ නැත්තාහු ද නො ම නැත්තාහුද වෙද්ද?’ යි විචාළොත් ‘එසේ අදහසෙක් මට ඇතැ’ යි ද නො කියමි. කුශලාකුශලයන් ගේ පල ඇතැ යි හෝ නැතැ යි හෝ කුශලාකුශල පල ඇත්තේත් නැත්තේත් වේ යැ යි හෝ පල නැත්තේත් නොම නැත්තේත් වේ යැ යි කියා හෝ, සත්‍වයා මරණින් මතු වෙ යි හෝ නො වෙ යි හෝ වන්නේත් නොවන්නේත් වෙයි හෝ නොවන්නේත් නො ම නොවන්නේත් වෙයි හෝ නො කියමි. එසේ වූ අදහසක් ඇතැ යි හෝ අන් සැටියෙකින් එකි දූ වෙතැ යි හෝ මට අදහසෙක් නැත.’’

මෙසේ මහණකමින් මෙ අත්බව්හි දී ම දක්ක හැකි පල විචාළ මට වෛරාටීපුත්‍ර සංජයයෝ අමරාවික්ෂේපය* පැවැසූහ. මොහු මහණබමුණන් අතුරෙහි මූස්තම ය. ‘මා රටැ වසන මහණකු බමුණකු වෙහෙසනු මට නො වරී’ යි සිතා ඔවුන් බසට කිසිත් නො කියා මා තුළැ නොසතුට පහළ වුව ද එය නො හඟවා හුනස්නෙන් නැගී ආයෙමි.

11. වහන්ස, මම් ඔබත් විචාරමි. ඇතරු අසරු ආදීනට පවා තම රැකියාවෙන් මෙහි දී ම දක්නා ලැබෙන පල ඇත. මහණදම් රැක්මෙනුත් මෙලොව්හි දී ම දක්කැ හැකි පලයෙක් ඇද් ද?’’

බුදුරජුහු – මහරජ, මහණදමෙහි මෙලොවැ දී ම දක්ක හැකි පල දක්විය හැක්ක. මෙහි ලා ඔබ විචාරමි. මහරජ, ඔබේ කටයුතු කරන කිකරු දසයෙක් පැවිදි වැ තුන් දෙර හවුරා ගෙන මොනොවට මහණදම් රක්නේ නම්, ඔහු මහණ වූ පවත් ඇසූ ඔබ යළිත් ඔහු සිය (තමන්ගේ) දසයකු කැරැ ගන්නට සිතත් ද?

---

* ඉහත බ්‍රහ්මජාල සූත්‍රයෙහි අමරා වික්ෂේපය දක්වා ඇත.

අජාසත් – නැත, වහන්ස. වැලි අපි ම ඔහු ආදරයෙන් වඳිමු, පුදමු, දැක හුනස්නෙන් නැගී සිටිමු, අස්නෙන් නිමතමු, සිවුපසයෙන් නිමතමු, ඔහු රක්නමු.

බුදු: – මහරජ, මෙසේ කලැ මහණදමේ පල ඇද්ද? නැද් ද?

අජා – ඇත, වහන්ස.

1. **බුදු**: – මේ මෙ අත්බවහිම දක්ක හැකි මහණදමේ පලයෙකි

අජා: – තවත් මහණදමේ මෙ අත්බවැ දක්ක දක්වියැ හැකි පලයෙක් ඇත් ද, වහන්ස ?

බුදු: – එසේ ය, ඇත මහරජ.

[මෙසේ එක එකක් පාසා මතු මත්තෙහි මහණදමෙහි මෙ ලොව පල විවාල රජුට මහණදම්පල තුදුසක් ම වදළහ.]

2. රජුට බදු ගෙවන ගැහැවියකු හෝ අන් එබන්දකු පැවිදි වැ තුන් දොර හවුරා සිල්වත් ව ඉන්නහු රජ ඇමති ආදීන් ගෙන් පවා පුද ලබනුවට සුදුසු වීම මහණදම්හි දෙවෙනි දිටුදම්පලය යි.

3. බුදුගුණ අසා සස්නැ පැවැදි වැ සුලුසිල් මැදුම්සිල් මහසිල් ද[93] පුරනුයේ, ඉන්‍ද්‍රියසංවර[94], සතිසම්පජඤ්ඤ[95] යථාලාභ-සන්තොෂ[96] යන මෙයින් යුතු ව බවුන් වඩා පළමුදහන්[97] ලැබ ඒ දහන්සුවයෙන් කල් ගෙවයි. මේ පළමු කියන ලද්දට වඩා උතුම් සාමඤ්ඤඵලයෙකි. (මහණදමේ පලයෙකි).

4. දෙවෙනි දහන් ලැබැ[98] වසනු එයට ද වැඩිතරම් වූ සාමඤ්ඤ ඵලයෙකි.

5. තෙවෙනි දහන් ලැබ[99] වසනු දෙවෙනි දහන් ලැබ වසනු-වටත් වඩා උසස් සාමඤ්ඤඵලයෙකි.

6. සතරවන දහන්[100] ලැබ වසනු උඩ කී පසට ම වඩා උතුම් සාමඤ්ඤඵලයෙකි.

7. අට සමවත්[101] වශිතා පසින්[102] පුරුදු කළ මහණ සිත්සතන් විවසුන්නුවණ අතට යොමු කොට නම්රූදහම් පරපුරැ ඉපැත්මත් නැස්මත් බලනුයේ කෙලෙසුන් මැඩ නිවී සැනැහී විවසුන්සුවෙන් කල් යවයි. මේ උඩ කී හැමට ම වඩා උතුම් දිටුදම්හි වූ සාමඤ්ඤඵලයෙකි.

---

93. මේ සුලුසිල් මැදුම්සිල් මහසිල් ඉහත බ්‍රහ්මජාලසූත්‍රයෙහි දක්වුණ පරිදි ම ය. 94, 95, 96, 97, 98, 99, 100, 101, 102, මේ තැන්වල විස්තර උපග්‍රන්ථය බලා දතයුතු.

8. දහන් ලත් මහණ මනෝමය සෘද්ධි[103] ලැබ වෙසෙයි. මේ යටදැක්වුණට වඩා උතුම් දිටුදහම්හි දැක්කැ හෙන සාමඤ්ඤඵලයෙකි.

9. බවුත්වඩා සෘද්ධිවිධඥානය[104] ලබනු උඩ කියන ලද්දට වඩා උසස්, දිටුදැම්යෙහි දැක්කැ හැකි සාමඤ්ඤඵලයෙකි.

10. දහන් ලදහු දිවකන් නුවණ[105] ලබනු උඩ කී හැමට වැඩි තරම් දිට්ඨධම්මික සාමඤ්ඤඵලයෙකි.

11. දහන් ලදහු පරසිත්දන්නා නුවණ[106] ලබනු යටකී හැමට වැඩි තරම් වූ දිට්ඨධම්මික සාමඤ්ඤඵලයෙකි.

12. දහන් ලදහු පෙරැවුසු කඳපිළිවෙළ දක්නා නුවණ[107] (පූර්වේනිවාසානුස්මෘතිඥානය) ලබනු යටකියන ලද්දට ද වැඩිතරම් වූ දිට්ඨධම්මික සාමඤ්ඤඵලයෙකි.

13. දහන්ලදහු දිවැස්ලබනු[108] උඩ කී හැමට වැඩි දිට්ඨධම්මික සාමඤ්ඤඵලයෙකි.

14. මහණහු සියල් කෙලෙස් නසනු, රහත් වනු,[109] උසස් ම සන්දිට්ඨික සාමඤ්ඤඵලය යි.

මහණදම් රැක්මෙහි මෙයට වඩා උතුම් පලයෙක් නැත."

මෙසේ බුදුරජුහු රහත්බව කුළු ගන්වා සන්දිට්ඨික සාමඤ්ඤඵලවිභාගය වදාළ හ.

අජාසත් රජ මෙය අසා පැහැදුණේ තෙරුවන් සරණ ගියේ ය. දැහැමි වූ සිය පියාණන් මැරීමෙන් තමා කළ වරද කියා ආයතිසංවරයෙහි පිහිටියේ ය. කළ වරදට කමාව යැද්දේ ය. බුදුරජුහු ඔහුට කමා කළහ. රජ තෙමේ බුදුරජුන් වැඳ පැදකුණු කොට නික්මැ ගියේ ය.[110]

[මෙහි මහ තොටුගුරුන් සදෙනා ගේ දහම් ද, සිල්රැක්ම පටන් කොට රහත්බව තෙක් ලැබියැ හැකි ගුණ වෙසෙස ද දැක්විණ]

103, 104, 105, 106, 107, 108, 109 මේ තැන්වල විසතර උපග්‍රන්ථයෙහි

110. මෙ රජ පියාමැරිම නො කෙළේ නම් එ අස්නෙහි ම සෝවාන් වන්නේ ය. පවිටු මිතුරන් ඇසිරෙන් පියා නසා මතු ලද හැකි ගුණ-යනට හානි කැරැ ගත්තේ ය. එහෙත් සිය වරද පිළිගෙන මතු එවැන්-නක් නොකරන්නට ඉටා, තෙරුවන් සරණ ගොස් බොහෝ පින් කෙළේ ය. පියා මැරූ තන් පටන් නපුරු සිහින දක්මෙන් රෑදවල් නිදි නො ලැබ සිටියෙන් කල් යැවූ රජ මේ බණ ඇසූ ද පටන් හොඳට නිදි ලද්දේ ය. මොහු තරම් පුහුදුන් සැදැහැයෙන් යුත් තෙරුවනට සත්කාර කළ අන් කිසිවෙක් පුහුදුනන් අතරැ නො වී ය. මෙ තෙම මතු නිරයෙහි මිදී මිනිස් වැ පැරැම්පුරා විදිතවිශේෂ නම පසේබුදු වන්නේ ය.

3. අම්බට්ඨ සූත්‍රය.

1. එක් සමයෙක බගවත් බුදුරජ්හු මහත් මහණමුළුවක් හා කොසොල්රටැ සැරිසරන්නාහු **ඉච්ඡානඞ්ගල** නම් බමුණගමට වැඩියහ. ඔබ එහි ගමට නොදුරැ පිහිටි වනලැහැබැ වෙසෙති.

එ සමයෙහි **පොකුරුසැත්** නම් බමුණුඇදුරා කොසොල්රජු ගෙන් පඬුරැ විසින් ලත් **උක්කට්ඨා** නම් නුවරට අදිපති වැ වෙසෙයි. හෙ තෙම බුදුරජුන් ඉච්ඡානඞ්ගල වනලැහැබැ වසන පවත් ඇසී. මිනිසුන් අතරැ නැගී ගිය බුදුගුණකතාව ද ඇසී. හේ සිය දෙටු අතැවැසි අම්බට්ඨ නම් මණවුහු බණවා 'මහණ ගොයුමන් පිළිබඳ වැ පැන නැග පැතිරැ පවත්නා ගුණකතාව සබා එකෙක් දැ?' යි ගොස් විමසා එවයි කී ය. 'එය කෙසේ දැනගනිම් දැ?' යි හේ පුළුවත. 'අප වේදයන්හි බුදු වන හෝ සක්විති වන මහපුරිස්හු කෙරෙහි වන මහපුරිස්ලකුණු දක්වා ඇත. එ මගින් දත මැනැවැ'යි පොකුරුසැත් කී ය. 'මැනැවැ'යි අම්බට්ඨ ගුරු බස පිළිගත. බමුණු තෙමේ තමා අතැවැසි පිරිසක් පිරිවර කොට දී ඔහු සිය රියෙන් ම යැවී ය.

2. අම්බට්ඨ තෙම බුදුරජුන් වෙත ගියේ ය. ගොස් තමා උඩඟුබැවිනුත් සැහැරජුන් කෙරෙහි බැඳගත් පරණ එදිරියක් ඇති බැවිනුත් බුදුරජුනටත් සැහැරජුනටත් ගැරැහුම්මුවින් නොයෙක් දෑ කියේ ය. සැහැරජුන් ගෙන් ඔහුට වරදෙක් වත් වී දැ? යි බුදුරජ්හු පුළුවුත්හ. 'එසේ යැ' යි හේ වූ පවත් කී ය. 'ඒ පමා දෙසට කමන්නැ' යි බුදුරජ්හු වදාළහ. එහෙත් හේ වඩා ලා ම සැහැරජුනට ගරහන්නට වන. 'දැන් මොහු මත් බින්දෑ යුතු යැ' යි බුදුරජ්හු සැලැකූහ. ඔහු ගේ පරපුර කිමැ යි විචාළහ. හේ තමා කණ්හායන පරපුරැ එකෙකැ යි පැවැසී. බුදුරජ්හු කණ්හායන පරපුරේ වතගොත හෙළි කරනුවෝ, සැහැරජුන් ඔකාවස් රජකුලෙහි වූවන් බව ද, කණ්හායන යනු එක් ඔකාවස් රජක්හු ගේ දෑස්සක රජු නිසා ලත් කණ්හ (කෘෂ්ණ) නම් දරුවක්හු පරපුරක් බව ද වදාළහ. තමා සැහැ රජුන් මුල් පියාණන් ගේ දෑස්සක දරුවා ගේ පරපුරට අයත් බව නොපිළිගෙන නිහඬ වනුවට තැත් කළ ද, එයට ඉඩ නො ලැබිණ. හේ එය පිළිගත. මෙයින් ඔහු මත් බුන.

ඔහු පිරිසැ වූ බමුණු කුමරුවන් ඔහු දෑස්සක පුතැ යි හෙළා කතා කරන ඉඟියක් පැතුණෙත් බුදුරජ්හු අම්බට්ඨයා සනසනුවෝ, ඔහු පරපුරැ මුල් පිය කණ්හයා ගේ පියා ඔකාවස් රජක්හු බව ද, දක්වා සැහැරජුන් හා ඔහු ගේ නෑසැබැඳියාවක් ඇති නියා ද වදුරා ඔවුන් නිහඬ කළහ.

ඉක්ඛිති ලොවැහිද පරිදි කැත් බමුණු කුල දෙකෙන් කැත්කුල ම වඩා උතුම්බවට කරුණු බමුණු කියමනින් මැ දැක්වූහ:

"ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං
යෙ ගොත්තපටිසාරිනො
විජ්ජාචරණසම්පන්නො
සො සෙට්ඨො දෙවමානුසෙ"

මේ සනත්කුමාර බඹහු කිවකි.

("සිය පරපුර සිහි කරන ජන මුළුයෙහි කැත් තෙමේ උතුම. දෙව්මිනිසුන් අතුරෙහි විදු සරණ (විජ්ජා චරණ) දෙකින් යුතුයේ උතුම"[109] යනු එහි අදහස ය.)

3. මෙ බස් ඇසූ අම්බට්ඨ තෙම සිය සමය අනුව සලකනුයේ, "විදුහු (විජ්ජා) නම් තුන් වේදයෝ ය. සරණ (චරණ) නම් පන්සිල් ය. මෙ දහම් අප තුළ ඇත. එබැවින් විදු සරණ දෙකින් යුතුයේ දෙව්මිනිසුන් අතුරැ උතුමම තැනැත්තේ වේ නම්, උතුම් ම අය අපි යැ" යි සිතී ය. මෙසේ සිතා, "ඒ සරණ (චරණ) නම් කවර යැ? විදු නම් කවරයැ?" යි පුළුවුත. "බමුණනට ම මෙය සුදුසු යැ, සෙස්සනට නො සුදුසු යැ" යන ඈ විසින් බමුණුදහමිහි ජාතිවාදකථායෙහි එන විදු සරණ දෙක එ නමින් තමන් අදහස් නො කරන බව බුදුරජුහු වදාළහ. එවිට අම්බට්ඨ තෙම බුදුරජුන් අදහස් කරන විදුවත් සරණත් කවරැ? යි පුළුවුත.

බගවත් බුදුහු (යටැ බ්‍රහ්මජාල සාමඤ්ඤඵල සූත්‍රයන්හි දැක්වූ පරිදි) පළමුකොට සිල් දැක්වූහ:

4. බගවත් බුදුහු ලොවැ පහළ වෙති. ගැහැවි ආදීන් අතුරෙන් කිසිවෙක් ඔබ දහම් අසයි. බුදුන් කෙරේ පැහැද, ගිහිගෙහි දෙස් සලකා ඔබ වෙත පැවිදි වෙයි. හේ පාතිමොක්ඛ සංවරයෙන්[110] හැවුරුණේ, මනා ආචාරගෝචර[111] දෙකින් යුතු වැ, ඇලුප් වරද පවා මහ නපුරක් සේ දක්නා සුලු වැ, වෙසෙයි. පිරිසිදු දිවෙල ඇතිවැ[112] ඉඳුරන්හි වැසූ දෙර ඇති වැ, බොජ්නැ පමණ දන්නේ[113], සිහිනුවණින්[114] යුතු වැ, ලද පසයෙන් සතුටු වැ වෙසේ.

---

109. උපඤත්ථය බලනු. 110. ඓ. බ. 111. ඓ. බ. 112. ඓ. බ. 113 ඓ. බ. 114. ඓ. බ.

5. හේ පණිවායෙන්, අයිනාදනින්, මෙවුන්දම්න්, මුසාවායෙන්, පෙහෙසුන්බසින්, පරොස්බසින්, බොල් තෙප්ලෙන් වැළැකේ. පැල වන දෑ පැල වුණු දෑ සිඳුමෙන් බිඳුමෙන්, රෑබොජුනෙන්, නටනු ගනු වයනු විසුළුදස්න යන මෙයින්, මල්ගඳවිලෙවුන් දැරුමෙන්, උසසුන් මහසුන් කෙරෙන්, රන්රිදී මසුකහවණු පිළිගැන්මෙන්, අමු ධාන්‍ය පිළිගැන්මෙන්, අමු මස් පිළිගැන්මෙන්, ගැහැනුන් දැරියන් පිළිගැන්මෙන්, දැසිදසුන් පිළිගැන්මෙන් එළු බැටළු කුකුළු ඌරු ඇත් ගෙරි අස් වෙළෙඹ යන සතුන් පිළිගැන්මෙන්, ගිහියනට දූතමෙහෙවර කැරුමෙන්, ගනුදෙනු කැරුමෙන්, තුලාකූටාදි හොර මිනුමෙන්, අල්ලස්-ගැනුම් රැවැටුම් නිකති සාචියෝග යන මෙයින්, ඡේදන වධ-බන්ධනාදියෙන් වැළැක්කේ වෙයි.

6. බීජගාම භූතගාම සිඳීමෙන්, සන්නිධිකාර පරිභෝග-යෙන්, විසුළුදස්නෙන්, දූකෙළියෙන්, උස් යහන් මහ යහන් පරිභෝගයෙන්, ඇඟ අඩු තැන් පිරැවීමටත් කය සැරැසීමටත් කරුණු වන දැයින්, තිරිසන් කතායෙන්, උනුන් හා බැණ දෙඩාගැන්මෙන්, දූත මෙහෙවරෙන්, කුහන ලපනයෙන්, තිරිසන් විදූයෙන්, වැරැදි දිවෙලින්, ලකුණු සතරෙන්, රජුන් ගේ ජය පරාජය කීමෙන්, ග්‍රහසතරින්, වැසිනියඟ ආදිය කීමෙන්, ආවාහ විවාහාදිය පිණිස නකත් කීම් ආදියෙන්, ශාන්තිකර්මාදියෙන්, වැළැක්කේ වෙයි[115] මේ ඔහු ගේ සිල් ය.

මුදුනැ අබිසෙස් ලත්, බිඳී ගිය සතුරන් ඇති රජක්හු සෙයින්, අසංවරයෙකින් පහළ විය හැකි කිසි ද බියක් තමාට නො වන බව් දක්නා හේ සිය සතන්හි කාවිසිමුනි නිදෙරු සුව විඳී.

7. හේ ඇස් ඈ සයිඳුරන් ද හවුරා රැක ගනී. ඉදිරියට යෑම් පෙරළා ඊම් ඈඟි සිහියෙන් නුවණින් යුත් වෙයි. කයට පමණ වූ සිවුරෙන් ද කුසට පමණ වූ අහරින් ද තිත් වනුයේ, යන තැනට පියාපත් බර පමණක් ගෙන යන කුරුල්ලකු සේ තමා යන තැනට පාසිවුරු පමණක් ගෙන යෙයි. මෙසේ ලත් පසයෙන් සතුටු වෙයි.

8. සිල්ගුණ, ඉඳුරන් හැවුරුම, සිහි නුවණ, ලද දෑයෙහි සතුට යන මෙයින් යුත් වූ හේ ජනයා ගෙන් තොර කිසි සෙනස්නක් බෙජෙයි. පසුබතැ පළක් බැඳ උඩුකය කෙළින් තබා සිහිය කමටහනට යොමු කොට එළවා හිඳි යි. හේ අභිධ්‍යා ව්‍යාපාද ථීනමිද්ධ උද්ධච්ච කුක්කුච්ච විචිකිච්ඡා යන නීවරණ

115. මේ ශීලවිස්තරය බ්‍රහ්මජාල සූත්‍රයෙහි ආ නයින් දතයුතු.

කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. යම්සේ ණය ගෙන කිසි වැඩෙක යොද එයින් මහත් දන ඉපැයූයේ, ගත් ණය දී ඉතිරි වූ දෑ අඹුදරුවන් රක්නට පොහොනා නියා දැක සතුටට පැමිණෙයි ද, යම්සේ අහර රිසිය ද නැති දුබුල් ගිලනෙක් බෙහෙත් ගෙන සුව ලබා සතුටට පැමිණෙයි ද, යම්සේ සිරගෙයි වැටුණෙක් තමා සතු දේපොල නො විසඳ ම සුව සේ එයින් මිදුණේ සතුටු වෙයි ද, යම්සේ තමා රිසි පරිදි පවතිනු නොහැකි අනුන් සටතේ වසන දසයෙක් පසු කලැ නිදහස් ව සිය කැමැත්ත පරිදි හැසිරෙන්නේ සතුටට පැමිණෙයි ද, යම්සේ උවදුරු සහිත කතරමඟට බට දනවතෙක් සුවසේ එය තැර සිය ගමට පැමිණ සතුටු වෙයි ද, එසේ ම හෙ තෙම ණය ගිලන්බව් ඈ බඳු වූ තමා කෙරේ පවත්නා නීවරණයන් දැක, පසු ව ඔවුන් තමා ගෙන් දුරු වූ නියා ද දැක සතුටට පැමිණෙයි. සතුටු වූ ඔහු තුළ පීතිය වෙයි. පීතියට පැමිණියහු ගේ නම්කය සංසිඳෙයි. සංසුන් නම්කයැත්තේ සුව විඳී. සුවපත්හු සිත එකඟ වේ.

9. මෙසේ වූ හේ අකුසලුන් කෙරෙන් වෙන් වැ සමාදි වඩා පළමු රූ දහන් ලබයි. එයට පසු පිළිවෙළින් දෙවෙනි රූදහන තෙවෙනි රූදහන සිවුවන රූදහන ලබයි.

මේ පළමුවන දෙවෙනි සිවුවන රූදහන් ලැබ වසනු ඔහුගේ සරණදහම් (චරණධම්) ය.

මෙසේ සිවුවන දැහැනින් සිත නිසල වූ කලැ, එය විවසුන් නුවණ අතට යොමු කෙරෙයි: “මේ කය රූපී යැ, මහාභූත සතරින් පහළ වූයෙක, මාපියන් ගේ සුකුරුසෝණිත දෙකින් උපන්නෙක, බත් ඈ අහරින් වැඩුණෙක, අනිස වූ දෑයෙක, දුගඳ හරනට සුවඳවිලෙවුන් ඉළියැ යුත්තෙක, ලෙඩ දුර ලනුවට පිරිමැදුම් ඈ කළ යුතු ය. එහෙත් බිඳෙන සුලු ය, විසිරෙන සුලු ය. මා සිත මේ මෙ බඳු කයැ ලැග්ගේ ය, බැඳුණේ යැ” යි හේ සලකයි. මෙය ඔහු ලත් විදුවෙක (විද්‍යාවෙක).

10. නව ද හේ තමා සිත එකඟ කලැ, ඉදුහු උපදවනුවට යුහු කලැ, මනෝමය සිරුරක් මවා පාන්නට සිය සිත යොමු කෙරෙයි මේ සිරිරෙන් හැම අඟපසඟින් යුත් මන්මුවා සිරුරක් මවා පායි. මේ ද ඔහු ලත් විදුවෙක. හෝ දැහැනින් සිත නිසල වූ කලැ ඉදුවිද (ඍඩිවිධ) නුවණ පිණිස සිත යොමු කෙරෙයි. නොයෙක් ඉදුහු කෙරෙයි. පියෙවියෙන් එක්කෙක් වූ හේ බොහෝ දෙනෙක් වැ පෙනෙයි. බොහෝ වැ පෙනී සිටැ

යලි එකෙක් වෙයි. තෙමේ අනුන් ඉදිරියේ පෙනී සිටී, නොපෙනී ද සිටී. අහසැ මෙන් කිසිවෙකැ නො ගැටී බිත්ති- යෙන් පවුරෙන් පව්වෙන් පිටතට විනිවිදගෙන යෙයි. දියෙහි මෙන් පොළොවැ ගැලෙයි, මතු වෙයි. පියහසර කරන කුරුල්ලකු සෙයින් අහසැ ද පලඟින් යෙයි. එසා මහ තෙදැති සඳහිරුහු අතින් පිරිමදී. බඹලොව දක්වා ද කයින් තමා වශයෙහි පවත්වයි. මේ ද ඔහු ලත් විදුයෙක.

21. (දැහැනින්) සිත එකග වැ නිසල වූ කලැ, හේ දිවකන් නුවණ ලබනුවට පිරියම් කෙරෙයි. එය ලැබ ළඟ දුර දෙක්හි දෙවියන් ගේ ද මිනිසුන් ගේ ද හඬ අසයි. මේ ද ඔහු ලත් විදුයෙක.

හේ යට කී පරිදි (දැහැනින්) සිත එකග වැ නිසල වූ කලැ පරසිත් දන්නා නුවණ ලබනුවට පිරියම් කෙරෙයි. එය ලැබ එයින් මෙරමා ගේ සිත දැන ගනී. ඒ ඒ කෙලෙසුන් ඇති සිත ඒ ඒ කෙලෙස් ඇති සිතැ යි ද, එකි එකි කෙලෙසුන් ගෙන් මිදුණු සිත මිදුණු සිතැ යි ද දනී. මේ ද ඔහු ලත් විදුවෙක.

හේ මෙසේ දැහැනින් සිත එකග වැ නිසල වැ පැවැති කලැ, පෙර අත්බව් දක්නා නුවණ ලබනුවට පිරියම් කෙරෙයි. හේ එය ලැබැ එක් දැයක් ද දෙ දැයක් ද යන ඈ පිළිවෙළින් උඩත්පිරිසෙයින් කප් බොහෝ ගණනක් නොයෙක් සැටියෙන් වූ පෙර අත්බව් සිහි කරයි. මේ ද ඔහු ලත් විදුවෙක.

හේ සිත දැහැනින් එකඟ වැ නිසල වැ සිටි කලැ, දිවැස ලබනුවට පිරියම් කෙරෙයි. එය ලැබ එයින් ඒ ඒ කුසල් අකුසල් කරන්නවුන් ද, මියෙන්නට ළං වැ සිටියවුන් ද, මියැ කම් වූ පරිදි උපන්නවුන් ද දකී. මේ ද ඔහු ලත් විදුයෙක.

හේ දැහැනින් සිත එකග වැ නිසල වැ සිටි කලැ කෙලෙස් නසන නුවණ ලබනුවට පිරියම් කෙරෙයි. හේ එය ලබයි. මේ දුකැ යි, මේ දුක් මුලැ යි, මේ දුක්නිරොදැ යි, මේ දුක් නිරොදට යන මඟැ යි, ඇති සැටියෙන් දනියි. මෙ ආසව යැ යි, මේ ආසවසමුදය යී, මේ ආසවනිරෝධයැ යි, මේ ආසවනිරෝධයට යන පිළිවෙතැ යි තතු වූ පරිදි දනියි.

මේ දන්නා දක්නා ඔහු සිත කාමාසව භවාසව අවිජ්ජාසව යන තුන් ආසව[115] කෙරෙන් මිදෙයි. අනතුරු වැ 'මා සිත ආසව කෙරෙන් මිදිණැ' යි ඔහුට පස්විකුම්නුවණ පහළ වෙයි.

115. තුන් ආසව උ. බ.

'බව උපත නැවැතිණ, බඹසර වැස නිමැවිණ, කෙලෙස් නසනුවට කළ යුතු සියල්ල කොට නිමැවිණ. මෙහි ලා තවත් කළ යුතු දෑයෙක් නැතැ'-යි හේ දැනගනී. මේ ඔහු ලත් උසස්තම විදුව ය.

මෙසේ මෙකී අටවිදුයෙන් ද ඉහතැ කී සරණින් ද යුත් වූ මහණ තෙමේ විදුයෙන් යුත් තැනැත්තේ යැ යි ද, සරණින් යුත් තැනැත්තේ යැ යි ද කියනු ලැබේ. මේ විදුසපුවටත් (විජ්ජාසම්පදාවටත්) සරණසපුවටත් (චරණසම්පදාවටත්) වැඩි-තරම් වූ කිසි දු අන් විදුසපුවෙක්, අන්සරණසපුවෙක් නැත.

මේ ලොවුතුරු විදුසරණසපුවට අවාමුව[116] (නැසෙන මග) සතරෙක් ඇත. රුක්නෙන් වැටුණු පල වළඳා දිවි රක්නා (පවත්තඵලභෝජී) තවුස් බව එකෙක. අල මුල් ගෙඩි වළඳා දිවි රක්නා තවුස් බව එකෙක. ගිනි පුදනා තවුස් බව එකෙක. මේ තුන් තවුසට ම බල නැතියක්හු සතරදිගින් එන මහණ බමුණනට දන්දෙනුවට සතරමංසන්දියෙක දන්හලක් පවත්වනු එකෙක. මොහු විදුසරණසපුයෙහි වනස්මුව (සස්නැ පැවිද්දේ වනසට ලං වැ ඇති වන දෑ) සතර ය.

බුදුරජ්ජු මෙය විස්තරයෙන් වදාරා, මේ තවුස්පැවිද්ද ගන්නාහු උඩ කී චරණ හා විද්‍යා හා ඇති සස්නැ පැවිද්දාගේ වතාවත් කරුවන් බඳු හ යි පැවැසූ හ. ඉක්බිති අම්බට්ඨයාත් ඔහු ගුරු වූ පොක්රුසැතාත් එසේ වූ සසුන්වනස්මුව වූ තවුස්පැවිදිකම් පමණකුදු නැති ගිහිගෙයි පස්කම්සුව විඳින්නවුන් බවත්, මෙසේ වූ ඔවුන් ලොවුතුරා විදුසරණසපුයෙන් බැහැරැ ම සිටුනා බවත්, එවත් පොකුරුසැත් බමුණු 'බඹා පිටුපතුලින් උපන් මුඬුමහණුනට තෙවිදු දත් බමුණන් හා මොන කතා දැ'යි ඔවුන් පිරිහෙළා අම්බට්ඨයාට ඉගැන්වීම පොකුරුසැත්හු ඔහුට කළ ලොකු වරදක් බවත් වදාළ හ. තව ද බමුණන් **අට්ඨක වාමක වාමදෙව වෙස්සාමිත්ත යමතග්ගි අංගිරස භාරද්වාජ වසිට්ඨ කස්සප භගු** යන ඉසිවරුන් පෙරැ ගැයූ කියූ දෑ උන් අනුව ගයනු කියනු ම මුත් ඔවුන් පිරූ ගුණදහම් නොපුරන බවත් අම්බට්ඨයා ලවා ම කියවා, ඔහුත් ඔහු ගුරුත් දෙදෙනා ම ඉසිවරුන් නො වෙති යි ඉසිබව පිණිස පිළිපන්නෝ හෝ නො වෙතියි ද වදාළ හ.

---

116 අවාමුව.- අපායමුඛ = මෙ සස්නැ පැවිදි වැ තුන් සික පුරනු නො හැක්කාහු තවුස් පැවිද්ද පහසු යැයි සලකා සිවුරු හැර තවුස් පැවිද්ද ගනිති. සිය කැමත්ත පරිදි විසිය හැක්කැයි ඔවුන් අනුව තවත් අන ද එයට බැඳෙති. මෙසේ වීමෙන් කල් යැමේදි සසුන් පැවිද්ද අතුරු දහන් වේ. එබැවින් තවුස් පැවිද්ද ශාසනික පැවිද්දේ අපායමුඛ යයි, සසුන් පැවිද්දේ විනාශයට ලං ව ඇති වන එකෙකි.

මෙයට පසු අම්බට්ඨ තෙම බුදුරජුන් ගේ දෙතිස්මහපුරිස් ලකුණු පිරික්සා, සිය ගුරුහු වෙත ගියේ ය. ගොස් 'මහණ ගොයුමාණන් පිළිබඳ ව නැඟි ගුණකතාව සබා යැ' යි ද, 'ඔබ මහපුරිස්ලකුණු ඇතියෝ යැ' යි ද සැළ කළහ.

'තා හා මහණ ගොයුමාණන් හා කිසි කතාබහෙකුත් වී දැ?' යි බමුණු ඇසී ය. බුදුරජුන් හා තමා අතර වූ කතාව මුළුල්ල ම හේ කී ය. එය ඇසූ පොකුරුසැත් අම්බට්ඨයාට ගැරහී ය. කිපී පයින් පැහැර ඔහු බිමැ හෙළී ය. එකෙණෙහි ම බුදුරජුන් දක්නට යනු කැමැති විය. සෙසු බමුණෝ පොකුරු-සැත්හට 'මහණගොයුමන් දක්නට යනුවට දැන් කල් නොවෙ යි. සෙට යත හැකි' යි කිවූ ය. බමුණු ද සිය ගෙහි කැවිලිපෙවිලි සකසවා යානයන්හි ලවා, පසු දට එළි වෙන වේලේ උක්කට්ඨා-යෙන් ඉච්ඡානංගලය බලා නික්මියේ ය. එයට නොදුර වෙනෙහි බුදුරජුන් වැඩ ඉන්නා තෙනට ගියේ ය. බුදුරජුන් දැක පිළිසඳර කතා කොට පසෙක හිඳ 'පින්වත් ගොයුමාණන් වහන්ස, අප අතැවැසි අම්බට්ඨ මණෙවු මෙහි ආයේ දැ?' යි විචාළේ ය.

'එසේ යැ,' යි බුදුරජුහු වදාළහ.

'ඔබගේත් ඔහුගේත් කිසි කතාබහෙකුත් වී දැ?' යි බමුණු ඇසී ය.

'එසේ යැ' යි බුදුරජුහු වදාළහ.

'ඒ කෙබඳු කතාබහෙක් දැ?' යි බමුණු ඇසී ය.

බුදුරජුහු මුල පටන් සියලු කතාව වදාළහ. එවිට පොකුරු-සැත් තෙම 'පින්වත් ගොයුමාණන් වහන්ස, අම්බට්ඨයා ළාමක ය. පින්වත් ගොයුමාණන් වහන්සේ අම්බට්ඨයාට කමා කරන සේක් ව' යි කී ය. 'බමුණ, අම්බට්ඨ තෙම සුවපත් වේ ව' යි බුදුරජුහු වදාළහ.

ඉක්බිති පොකුරුසැත් තෙම බුදුරජුන් දෙතිස් මහපුරිස්-ලකුණු පිරික්සා දැන, 'මොහු බුදුහු මැ යැ' යි නිසැක විය. ඉක්බිති බික්සඟන සහිත බුදුරජුනට නිමැතුම් කොට තමා පිරිවෙස්නට වැඩම කරවා දන් දින.

බුදුරජුහු බොජුන් වළඳා ඉක්බිති දානකථා, ශීලකථා, ස්වර්ගකථා, කාමාදීනව, කාමලාමකතා, කාමසංක්ලේශතා, නිෂ්ක්‍රාමතායෙහි අනුසස් යන පිළිවෙළකතාව වදාළහ. එයට පසු සිවුසස් දෙසූහ. එයැසූ පොකුරුසැත් සෝවන් වී ය.

ඉක්බිති බමුණු තෙම බුදුරජුන් දම් දෙසූ තියාවට පසසා, අබුද්රුවන් නැදූයන් මෙහෙකරුවන් සහිත වැ වචන යෙන් ද තමන් තෙරුවන් සරණගිය බව සැළ කෙළේ ය.

[අම්බට්ඨයා ගේ මත් මැඬිම, ලොවැ වහර පරිදි කැත්-කුලය බමුණුකුලයට වඩා උසස් බව, වෛදික විද්‍යාචරණයනට වඩා ශාසනික විද්‍යාචරණ උතුම් බව, තවුස්පැවිද්ද සස්නැ වැනැස්මට ළං වැ පහළ වන බව මෙයින් දැක්විණ.]

---

4. සෝණදණ්ඩ සූත්‍රය.

1. එක් සමයෙකැ, බගවත් බුදුරජ්ජු මහත් මහණමුළුවක් හා අඟුරටැ සැරි සරන්නාහු චම්පා පුරයට[117] වැඩැ, එයට නොදුරු වූ **ගග්ගරා** නම් පොකුණ තෙර[118] වෙසෙති.

2. එ සමයෙහි සෝණදණ්ඩ නම් බමුණු, පසේනදි කොසොල් රජ තමාට පඬුරු විසින් දුන් චම්පාපුරයෙහි, යස ඉසුරු විඳ වෙසෙසි. එ සමයෙහි ම බොහෝ බමුණෝ ද ගැහැවියෝ ද බුදුරජුන් වසන පවත් අසා ඔබ දක්නා සඳහා ගග්ගරා පොකුණ අතට යෙති. එසේ යන්නවුන් සිය පහයැ හුන් සෝණදණ්ඩ තෙමේ දිටී. දැකැ කත්තුවා[119] කැඳවා එසා මහ දන මුළුවක් කොයි යෙතැ යි විමසවා, ඔවුන් බුදුරජුන් දකිනුවට යතැ යි අසා තෙමේත් ඔවුන් හා ම යන්නට සැරැසිණ. එ සෙමෙහි කිසි කටයුත්තෙකින්[120] බැහැරින් ඒ බමුණන්හු වෙත අවුත් සිටි බොහෝ බමුණෝ වූහ. ඔහු සෝණ-දණ්ඩයා මහණ ගොයුමාණන් දක්නට යෙති යි අසා, එහි විත් ඒ ගමන නවතාලන්නට නොයෙක් කරුණු හැරැ පෑහ:

3. "හවත් සෝණදණ්ඩයෝ මහණ ගොයුමන් දක්නට නො යෙත් වා. මහණ ගොයුමන් දක්නට යනු සෝණදණ්ඩයනට මදිකමෙක. එ සේ ගියොත් සෝණදණ්ඩයන් ගේ යසස පිරිහෙයි. මහණ ගොයුමන් යසස් වැඩෙයි. වැලි එකෙක් ඇත. මහණ ගොයුමන් හවත් සෝණදණ්ඩයන් කරා එතොත් එය වටනේ ය. එයට කරුණු ඇත. සෝණදණ්ඩයෝ සත්වන කුල පරපුර තෙක් ද මාපිය දෙපසින් පිරිසිදු හ. ධනයෙන් ආඪ්‍ය හ.

---

117. උ. බ. 118. ගග්ගරා නම් මෙහෙසිය කැරැවූ බැවින් මෙ පොකුණ ගග්ගරා නම් වී මෙහි තෙරැ මහත් සපුවනයෙක් විය. බුදුරජහු එහි වුසූහ 119. කත්තුවා (බතත) යනු ඇසූ පෑණ විසඳනු සමත් මහමැත්තා යි අටුවාහි දැක්විණ. උපග්‍රන්ථය බලනු. 120. මන්ත්‍ර සජ්ඣායනාය පිණිස.

වේවෙයගැ[121] පරතෙර පත්තෝ ය. මනා පැහැසපු ඇත්තෝ ය, සිල්වත් හ, මනා වදන් ඇත්තෝ ය. බොහෝ දෙනාට ආචාර්‍ය්‍ය ද වෙති, පන්සියයක් පමණ බමුණු දරුවනට වේද හදුරවති. නන් රටින් නන් රජයෙන් වේද හදුරනුවට බොහෝ මණෝච්චෝ සෝණදණ්ඩයන් කරා එති. භවත් සෝණදණ්ඩයෝ පැසිම් විය පත්තෝ ය, මහළු හ, මහණ ගොයුම්හු වූ කලි යොවුන්හි සිටියෝ ය, තුරුණු පැවිදි කෙනෙක. භවත් සෝණදණ්ඩයෝ මගදරටට අදිපති බිම්සර මහරජාණන් ගෙන් ගරුබුහුමන් ද පූජා ද ලදුවහ, පොකුරුසැත් ඈ මහ යසස් ඇති බමුණු පඬිවරන් විසිනුදු මානිතය හ. පූජිතය හ. මගදරට අදිපති බිම්සර මහරජාණන් පඬුරු කොටැ දුන් සාරවත් චම්පාපුරයට ඉසුරු වැ වෙසෙති. මේ එක එක කරුණෙකිනුදු මහණ ගොයුමන් භවත් සෝණදණ්ඩයන් කරා එනු විනා භවත් සෝණදණ්ඩයන් ඔවුන් දක්නා සඳහා යනු නො යෙදෙයි.”

4. බමුණන් ගේ මේ කතාව ඇසූ සෝණදණ්ඩ තෙම ඔවුන් බණවා, ‘භවත්නි, එසේ නම් ඒ පින්වත් මහණ ගොයුමන් වහන්සේ අප කරා එනුවාට වඩා අප ඔබ දක්නා සඳහා යනු ම සුදුසු නියාවට කරුණු දක්වමි. එයට කන් දුන මනා යැ. ඒ පින්වත් මහණ ගොයුමන් වහන්සේ සත්වනු මුත්තනු යුගය තෙක් ද මාපිය දෙපෙළපතින් මැ පිරිසිදු සේක. කුලයෙන් නොකැලැල් සේක. මහත් නෑමුළුවක් හැරදමා ගොස් පැවිදි වූ කෙනෙක. පොළොවැ ද අහසැ ද[122] තමන් අයත් මහ දනසම්පත් හැර පැවිදි වූ සේක. යොවුනෙහි මැ පළමු වියෙහි මැ ගිහිසුව හැරලා පැවිදි වූ සෙයෙක. තමන් ගිහි ගෙන් නික්මි කලැ එය නො කැමැති සුළු මව හා පියාණන් කඳුළු සලා හඬති සි දැන, එය නො තකා ගිහිගෙන් නික්මැ කෙහෙ රවුලු බහවා කසාවත් හැඳ පැවිදි වූ සෙයෙක. පින්වත් මහණ ගොයුමන් වහන්සේ මනා පැහැ සපු ඇති සෙයෙක, උතුම් සිල්ගුණ ඇති සෙයෙක. මනා බස් තෙපලන සෙයෙක. බොහෝ දෙනාට ආචාර්‍ය්‍ය ද ප්‍රාචාර්‍ය්‍ය ද වන සෙයෙක, කාමරාග–චාපල්‍ය[123] නැති සෙයෙක. කම්වාදී[124] සෙයෙක. ක්‍රියාවාදී[125] සෙයෙක. තමනට සතුරු බමුණු පිරිසට ද හිත වැඩ කැමැති සෙයෙක. උසස් කැත් කුලෙන් නික්මැ පැවිදි වූ සෙයෙක. පොහොසත් දනවත් කුලයෙන් නික්මැ පැවිදි වූ සෙයෙක.

---

121. වේවෙයගැ = වේදවේදාංගයෙහි. උ. බ 122. උ. බ. 123. චාපල්‍ය = පිරිකර සැරසීම. 124. කම්වාදි උ. බ. 125. ක්‍රියාවාදි උ. බ.

නත් දෙසින් තන් රජයෙන් බොහෝ ජනයෝ පැණ විචාරා සැක හැරගන්නට ඔබ වෙත එන්නාහ. බොහෝ දහස් ගණන් දෙවියෝ ද දිවිහිමින් ඔබ වහන්සේ සරණ ගියහ. 'මේ බගවත් තෙමේ රහත් යැ, සම්මාසම්බුදු යැ, විදුසරණින් යුතු යැ, සුගත යැ, ලොව දතුයේ ය, ලොවුතුරු නරදම්සැරි ය, ඥදෙව්-මිනිස්නට සථර ය, බුදු යැ, බගවත් යැ' සි මෙසේ ඔබ පිළිබඳ යසගී හඬ ඉතා උස් වැ නැංගේ යැ. ඒ භවත් මහණ ගොයුමන් වහන්සේ දෙතිස් මහපුරිස් ලකුණෙන් යුතු සේක. තමන් වෙත ආවුන් පිය බසින් පිළිගන්නා සෙයෙක. සිවුපිරිස් විසින් බුහුමන් කරනු ලැබූ පුදනු ලැබූ සෙයෙක. ඔබ කෙරේ බොහෝ දෙව්මිනිස්සු වෙසෙසින් පහන්හ. ඔබ වසන ගම්හි නියම්ගම්හි මිනිස්නට යක්බූපිසසුන් ගෙන් බියෙක් නැත. ඔබ ගණයාට ඇදුරුසෙයෙක, නායක සෙයෙක. තීර්ථංකරයන් අතුරෙහි අග් හ යි සලකනු ලබන සෙයෙක. ඔබ යසස ඇතැම් මහණ-බමුණන් ගේ මෙන් පිටනින් දැක්වෙන සෙලුබව් ඈ කිසි වත් පමණෙකින් නොව, තමන් තුළැ වූ ම ලොවුතුරා විදුසරණ-ගුණ[126] හෙයින් ම නැංග එකෙක. මගදරටට අදිපති බිම්සර රජ නෑ දූ පිරිස් හා ඔබ සරණ ගියේ යැ. පසේනදි කොසොල් රජ ද නෑ දූ පිරිස සහිත වැ ඔබ සරණ ගියේ ය. පොකුරුසැත් බමුණු ද නෑ දූ පිරිස් හා ඔබ දිවිහිම් කොට සරණ ගියේ ය, මෙකී හැම කරුණෙන් ම මහණ ගොයුමන් වහන්සේ අප කරා ඊම නො වැ අප ම ඔබ කරා ඊම සුදුසු ය. මෙකී ගුණ ඇති මහණ ගොයුමන් වහන්සේ මෙහි චම්පා පුරයට වැඩැ ගඟීරා විල් තෙර වෙසෙන සෙයෙක. අප පෙදෙසට පැමිණෙන මහණබමුණෝ අප අමුත්තෝ ය. ඒ අමුත්තනට සැලැකිලි ගරුබුහුමන් කරනු, යටත් පැවැතුම් දක්වනු අප යුතුකම යැ. මෙ කරුණින් ද භවත් මහණ ගොයුමාණන් වහන්සේ අප කරා වඩිනු නොව අප ම ඔබ වෙත යනු වටනේ ය. භවත්නි, ඒ පින්වත් ගොයුමාණන් වහන්සේ පිළිබඳ වූ මා දන්නා ගුණ මෙ පමණ ය. එහෙත් ඔබ වනාහි පමණ කට නොහැකි සේ වූ ගුණ ඇත්තෝ යැ'' සි කී ය.

5. සෝණදණ්ඩ බමුණුහු ගේ කතාව ඇසූ ඒ බමුණෝ ''භවත් සෝණදණ්ඩයන් කියන පරිදි යොදුන් සියක් දුරැ සිටිතුදු සැදැහැවත් කුලපුතුහු විසින් ගමන්වියදම් ගෙන වුව ද ඒ මහණ ගොයුමාණන් දක්නට යෑ යුතු මැ යැ'' සි කීහු. ඉක්බිති ඔහු සියල්ලෝ ම ගමනට සැරැසුණහ. සෝණදණ්ඩ

126. ලොවුතුරා විදුසරණ = අනුත්තරවිජ්ජාචරණ.

බමුණෝ ද ඔවුන් කැටුවැ නික්මිණ. ගැඹුරා පොකුණු තෙරැ වන ලැහැබට[127] පිවිසි ඔහුට 'මහණ ගොයුම්ාණන් වහන්සේ ගෙන් මා කිසි පැණයක් විචාළ කලැ එය නො ඇසියැ යුත්තෙකැ'යි ආදීන් ඔබ ගෙන් නිගාවක් ලදෙත් හෝ ඔබ පුළුපුස්නා පැණයකට ඔබ සිත් ගන්නා උත්තරයක් දීගත නුහුණු වුවොත් හෝ මේ පිරිස මට ගරහනු ඇතැ'යි, 'එයින් තමා යසස් පිරිහෙතැ''යි බියෙක් පහළ විය. මේ බිය සැක ඇති ව ම සෝණදණ්ඩ තෙම බුදුරජුන් වෙත ගියේ ය. ගොස් පිළිසඳර කතා කොට පසෙක ඉඳ ගත. සෙස්සෝ ද පිළිසඳර කතා ඇ කොට පසෙකැ ඉඳගත්හ. [128] එහිදී ද සෝණ-දණ්ඩ තෙම පළමු සේ ම සැක බිය පහළ කෙළේ ය.

6. භගවත් බුදුරජුහු සෝණදණ්ඩයා තුළැ වූ බිය සැක දුටුහ. දැකැ ඔහුට රිසියෙන ලෙහෙසි පැණයෙකින් කතාව ඇරැඹූ හ.

බුදුරජුහු – භවත් සෝණදණ්ඩයෙනි, අංග කියක් ඇත්තා බමුණෙකැ යි බමුණෝ කියත් ද?

සෝණදණ්ඩ – පින්වත් ගොයුමන් වහන්ස, අංග පසක් ඇත්තේ ම බමුණැ යි බමුණු තමැ යි බමුණෝ කියත්. සත්වන මුත්තනු යුගය තෙක් ද මාපිය දෙපසින් පිරිසිදුබව, වේවෙයහ හදුරන බව, මනා රූසපු ඇති බව, සිල්වත්බව, නුවණැතිබව යනු ඒ අංග පස යැ.

බුදු: – මේ පසගින් එකක් හැරැ නෙසු සතරින් යුතුවහු සැබෑ බමුණැ යි පැණැවියැ හැකි ද?

සෝණ: – හැකි යි භවත් ගොයුමත් වහන්ස, රූසපුයෙන් කවර වැඩ ද? එය හැරැ තුබූ සතරහ ඇතියහු බමුණැ යි පැණැවියැ හැක්ක.

බුදු: – ඒ සතරගිනුදු එකක් හැරැ තුබූ තෙයහින් යුතුවහු සැබෑ බමුණැ යි පැණැවියැ හැකි ද?

---

127. වනලැහැබැ වූ වෙහෙර තුළට. 128. සෝණදණ්ඩයා පිළිසඳර කතා කොට ඉඳ ගත කෙනෙක් වැඳැ පසෙක ඉඳගත්හ, කෙනෙක් පිළිසඳර කතා නොකොට ද, කෙනෙක් තමන් නම් ගොත් කියා හැඳින්වීම් පමණක් කොට ද, කෙනෙක් මේ කිසිත් නොකොට නිහඬ ව ද ඉඳගත්හ.

සෝණ: – හැකි සි, පින්වත් ගොයුමත් වහන්ස, වේවෙයඟ හළේද ඉතිරි තෙයඟින් යුතුවහු සැබෑ බමුණැ යි පැණැවියැ හැකි.

බුදු: – මේ තෙයඟිනුත් එකක් හැර සෙස්සෙන් යුතුවහු සැබෑ බමුණැයි පැණැවියැ හැකි ද?

සෝණ: – හැකි සි, පින්වත් ගොයුමත් වහන්ස, මේ තුන් අඟින් දූය (ජාතිය) හැරිය ද, ඉතිරි දෙයඟින් යුතුවහු සැබෑ බමුණැයි පැණැවියැ හැක්ක. දූයෙන් කවර වැඩෙක් ද? සිල් හා නුවණ ම පමණ ය.

බමුණුපිරිස – භවත් සෝණදණ්ඩයෝ එසේ නො කියත් වා. භවත් සෝණදණ්ඩයෝ වණ්යත් වේදයත් ජාතියත් පිරිහෙලති. මහණ ගොයුමාණන් ගේ මතයට ම බැසැගත්තවුන් සේ වෙති.

සෝණ: – භවත්නි, එසේ නො කියවු. මම වණ්ය හෝ වේද හෝ ජාතිය පිරිහෙලා නො කියමි. භවත්නට අප බෑහැන මේ අඞ්ගක මාණව නො පෙනේ ද?

බමුණුපිරිස – පෙනේ ය, භවත්නි.

සෝණ: – භවත්නි, මේ අඞ්ගක මාණව පැහැපත් යැ. මෙහි මහණ ගොයුමත් වහන්සේ හැර පැහැ–සපුයෙන් මොහුට සම අනෙකක් නැත. මේ තෙම වේවෙයඟ දරන්නේ යැ, සත්වන මුත්තණ්ඩ යුගය තෙක් ම දෙකුලෙන් පිරිසිදු යැ. එතෙකුදු වුව මොහු පණිවා හෝ අයිනාදත් හෝ පරඹුන් සොයනු හෝ මුසාබණිනු හෝ රහමෙර බොනු හෝ මෙකී වරද දූ කරතොත් මොහුගේ පැහැයෙන්, වේවෙයඟ දූතිමෙන්, ජාතියෙන් කවර වැඩ ද? සිල් හා නුවණ හා දෙකින් යුතු වේ නම් එතෙකින් මැ බමුණු නැමැ යි බමුණෝ සබා අනුවැ කියන්නෝ කියත්.

බුදු: – බමුණාණනි, මෙකී දෙ අඟින් එකක් පමණෙකින් සබා බමුණැ සි පැණැවියැ හැකි ද?

සෝණ: – එය නම් කළ නො හැක්ක, ගොයුමන් වහන්ස, ශීලයෙන් ප්‍රඥවත් ප්‍රඥයෙන් ශීලයත් පිරිසිදු වේ. ශීලය ඇති තැනැ ප්‍රඥව ඇත. ප්‍රඥව ඇති තැන ශීලය ඇත. සිල්වතාට නුවණත් නුවණැත්තාට සිලුත් වෙයි. **සිල් ද නුවණ ද දෙක ලොවැ අග්‍ර ම දූ යැ** යි කියනු ලැබේ.

බුදු: – එසේ ය, බමුණාණනි, ශීලයෙන් ප්‍රඥවත් ප්‍රඥයෙන් ශීලයත් පිරිසිදු වේ. ශීලය ඇති තැනැ ප්‍රඥව ද, ප්‍රඥව ඇති තැනැ ශීලය ද ඇත. සිල්වතාට ප්‍රඥවත් ප්‍රඥවතාට සිලුත් ඇත. **ශීල ප්‍රඥ දෙක ලොවැ අග්‍රම දූ යැ.**

සෝණ: – පින්වත් ගොයුමන් වහන්ස, අතින් අතත් පයින් පියත් දෙවන්නා සේ, ශීලයෙන් ප්‍රඥවත් ප්‍රඥයෙන් ශීලයත් දෙවෙයි (පිරිසිදු වෙයි). ශීලය ඇති තැන ප්‍රඥවත් ප්‍රඥව ඇති තැන ශීලයත් ඇත. සිල්වතාට ප්‍රඥව ද ප්‍රඥවතාට ශීලය ද වෙයි. ශීල ප්‍රඥ දෙක ලොවැ අග්‍ර ම දූ යි කියනු ලැබේ.

බුදු: – ඒ ශීලය කවර යැ? ප්‍රඥව කවර යැ?

සෝණ: – මේ ගැණ අප දතුයේ මෙ විවර ම ය. මෙහි ශීල නම් කිමැ යි, ප්‍රඥ නම් කිමැ යි නො දනුම්හ. භවත් මහණ ගොයුමන් වහන්සේ ම මෙය අපට හෙළි කොට වදරන සේක් වා.

බුදු: – එසේ නම් අසන්නැ, මොනොවට සිතැ කරන්න, කියන්නෙමි.

සෝණ: – එහෙයි, ගොයුමාණන් වහන්ස.

7. මෙයින් පසු බුදුරජුහු ඉහත සාමඤ්ඤඵල සූත්‍රයෙහි වදළ පරිදි ශීල ප්‍රඥ දෙක විස්තරයෙන් වදළ සේක. දෙසුම් කෙළවරැ සෝණදණ්ඩ තෙම දම්දෙසුවා මැනැවැ යි තියු දී තෙරුවන් සරණ ගියේ ය. ඉක්බිති පසු දිනැ දවල් බොජුනට තමා ගෙට වඩනා සේ අයැද නික්මැ ගියේ ය. හේ පසු දිනැ දන් පිළියෙල කොට දන්වා එවී. බුදුරජුහු ද බික්සඟන හා ඔහු කරා වැඩියහ. සෝණදණ්ඩ තෙම මිහිරි බොජුනෙන් බුදුපාමොක් මහසඟන පිදී. බුදුරජුන් බොජුන් වැළැඳූ අවසනැ සෝණදණ්ඩ තෙම ඔබ වෙත එළැඹැ මිටි අස්නෙක හිඳ මෙය කී ය:

"වහන්ස, පිරිස් මැද දී ඔබ දැක මා නැගී සිටියොත් මුනු-බුරක්හු පමණට ද වයසින් අඩු කෙනෙකුත් දැක නැගී සිටියේ යැ යි ඒ පිරිසැ වූවෝ් මා ගරහති. ගැරැහුම් ලදුවහු යසස් පිරිහෙයි. යසස් පිරිහෙත ධනහානිය වෙයි. අප ධනසම්පත යසසින් ම ලැබෙන බැවිනි. එ බැවින් පිරිස මැද දී ඔබ දැක මා නො නැගී මැ දෙහොත් මුදුනැ තබනු ඇත. එයින් මා නැගී සිටියා සේ සලකන සේක් වා. පිරිසෙහි දී ඔබ දැක මා සිය හිස්-වෙළුම මුදනු ඇත. මා හිස නමා ඔබ වැන්දහ යි එයින් සලකා වදාරන්නැ. යානයෙකින් යන මා ඔබ දැක එයින් බටුවොත් පිරිස මා ගරහනු ඇත. එ බැවින් එ බඳු තැනැ ඔබ දැකැ කෙවිටි යට ඔසොවන්නෙමි. එයින් මා යානයෙන් බටුවා කොට සලකා වදාරන්නැ. යානයෙහි හුන් මා ඔබ දැක කුඩය පසකට බානු ඇත. එය මා හිස නමා ඔබ වැන්දුව කොට සලකා වදාරන්නැ".

මෙසින් පසු බුදුරජ්හු ඔහුට දහම් දෙසනුවෝ්, දෙලෝ් දියුණුව දක්වා, ගුණදහම් වඩනුයෙහි ඔහු සිත උනන්දු කොට, ඔහු සිතැ ගුණදහම් ගන්වා, ඔහු කෙරෙහි වූ ගුණ පසසා, හුනස්නෙන් නැඟැ නික්මැ වැඩියහ.

[සෝ්ණදණ්ඩයා ගේ බුදුගුණ වැණුම, බමුණන් ගේ ජාති-වාදදියේ නිසරුබව, සැබෑ බමුණකු වන කරුණු, සිල් ගුණ දෙකේ අගය, සෝ්ණදණ්ඩයා තෙරුවන් සරණ යෑම, ඔහු කොහොන් ගතිය යන මෙතෙක් දෑ මේ සුත්හි වෙයි.]

---

5. කූටදන්ත සූත්‍රය.

1. එක් සමයෙක බගවත් බුදුරජ්හු මහත් මහණමුළුවක් හා මගදරටැ සැරි සරන්නාහු **ඛාණුමත** නම් බමුණුගමට වැඩම කොට, එහි **අඹයැටි**[129] උයනැ වෙසෙති.

2. එ සමයෙහි **කුළුදත්** (කූටදන්ත) නම් බමුණෙක් බිම්සර රජ්හු ගෙන් පඬුරු විසින් ලද සරු වූ ඒ ඛාණුමත ගමට ඉසුරු වැ වෙසෙයි.

බුදුරජුන් එ ගම් වැඩියේ කුළුදත් බමුණා ගේ මහා යාගයක් එළැඹැ සිටි කල්හි යැ. එ සමයෙහි යාග පිණිස ගොන්නු දෙන්නු වස්සෝ් වැස්සෝ් එළුවෝ් එළුපැටවු නොයෙක් මෘග-පක්ෂිහු සත්සියය බැගින් යාග ටැඹ වෙත ගෙනෙන ලදහ.

---

129. අඹයැටි (අම්බ-ලට්ඨිකා) යනු නාඹු අඹරුක ය. උයන්දොර තඹු අඹරුකක් වූයෙන් මෙ උයන අම්බලට්ඨිකා (අඹයැටි) නම් වී.

3. ඛාණුමත ගමැ වසන බමුණෝ ද ගැහැවියෝ ද බුදු රජුන් එ ගම් වැඩ අඹයැටියෙහි වසන පවත් ද, ඔබ රහත්බව් සම්මා සම්බුදු බව් ආදී ගුණවලින් යුත්හ යි උස් වැ නැගි ඔබ පිළිබඳ යසගී හඬ ද ඇසුවෝ, මුළු මුළු වැ ඔබ දක්නට එති යෙති.

4. දවසෙක සිය පහයැ උඩුමහලැ සිටි කුළුදත් එසේ යන මහ පිරිස් දුට. දකැ, කොත්තා බණවා, එසා පිරිසක් කොයට යෙති යි විචාරා, බුදුරජුන් දක්නට යන නියා අසා, තමා ද ඔවුන් හා යනු මැනැවැ යි සිතා, මදක් පොරොත්තු වන්න යි කියා යවා, තෙමේ ද ගමනට සැරසිණ. කුළුදතු ගේ යාග බත වළඳනුවට අවුත් සිටි බමුණෝ ඔහු බුදුරජුන් දක්නා පිණිස යන පවත් අසා, ඔහු ගමන නවතාලන්නට නොයෙක් සැටියෙන් කරුණු[130] කියා පෑහ. කුළුදතුහු ගමන නවතා ලනු නොහැකිවූහු තුමූ ද ඔහු හා නික්මුණහ.

5. කුළුදත් තෙම බුදුරජුන් වෙත එළැඹියේ ය. එළැඹැ පිළිසඳර කතා කොට පසෙක ඉඳ ගත. ඔහු හා ගිය සෙස්සෝ ද පිළිසඳර කතා ඈ කොට පසෙකැ ඉඳගත්හ. එයින් පසු කුළුදත් තෙම,

"භවත් ගොයුමාණනි, ඔබ යාගවිධා තුනත් එහි සොළොස් පිරිකරත් දනිති යි මා අසා ඇත. මම් නම් එය නො දනිමි. මහායාගයක් කරනු රිසියෙමි. එ බැවින් භවත් ගොයුමාණෝ යාග සම්පත් තුනත් සොළොස් යාග පරිකරත් මට පවසත් වා" යි කී ය.

6. එයසා බුදුරජුහු 'එසේ නම් බමුණාණනි, එය අසා ගන්නැ, මොනොවට සිතැ ලා දරන්නැ' යි වදැරා, 'එසේ යැ, භවතාණනි' යි කී බමුණාට මෙය දෙසූහ:

"බමුණාණනි, පෙර මහාවිජිත නම් රජෙක් විය. දවසෙකැ, එ කලා වැ සිහිවිලියෙහි යෙදී හුන් හෙ තෙම තමා ඉසුරු-සැපත් බලා, 'මතු හිතසුව පිණිස යාගයක් කළොත් මැනැවැ' යි සිතී. ඉක්බිති පෙරෙවි බමුණා කැඳවා තමාට වූ අදහස පවසා, යාගය කළ මනා සැටි විචාළ. එ විටැ පෙරෙවි මෙසේ කී:

130. කුළුදතුත් බමුණනුත් අතර පැවැති කතාව යට සෝණදණ්ඩයාත් බමුණනුත් අතර වූ කතාව බඳු මැ යැ. මේ බමුණන් තමන් උසස් කම් දක්වනුවට හැම දු ම කියන කතා යැ.

"දේවයිනි, ඔබේ මේ දනව්ව සොරුන් ගෙන් පෙළුණේ ය. සොරුන් ගම් නියම්ගම් නුවරවල් පැහැරැ ඇති නියාව පැණෙයි. මං පැහැරැ ඇති නියාව පැණෙයි. මෙසෙවු උවදුරු ඇති රටෙකින් අයබදු ගනු නො යෙදෙයි. වද දී, සිරගෙහි ලා, දඩ ගසා, නිගහා, රටින් නෙරැ හෝ සොරඋවදුරු නවතන්නට තැත් කළ ද වැඩෙක් නොවේ. දඬුවම් ලදවුන් ගෙන් ඉතිරියෝ පසුකලැ යළි දු රට පෙළති. එ බැවින් මෙසේ පිළිපැදියැයුතු:

7. ගොවිතැන් කරනුවනට වීබිජුවට ද, ගෙරිසරක් රක්නවුනට බත්වැටුප් ද දියැ යුතු. වෙළෙඳුනට වෙළෙඳුම වඩනුවට මුදල් ද, රාජකාරියේ යෙදුණවුනට දිනපතා බොජුන් ද, මාසික ඈ විසිත් වැටුප් ද දෙනු ලැබේවා. මෙසේ කළ පසු ඒ ඒ ජනයෝ තම තමන් අයත් කාරියෙහි නිසි සේ යෙදෙති. ගම්පැහැරුම් ඈ නො කරති. මහරජාණන් ගේ ආදායම ද වැඩෙයි. රටෙහි උවදුරු ද නැවැතෙයි. මිනිස්සු තුටු පහටු වැ දරුවන් ළෙහි නටවන්නාහු, සිය ගෙවල් දොර හැරැ තුබූවන් සේ කොටැ සැක බිය නැති වැ වසන්නාහ" යනු යි.

8. රජ ද පෙරෙවියා කී පරිදිම කෙළේය. එයින් නොබෝ කල්හි ම සොරබිය දුරු විය. මහත් ආදායම් ද ලැබිණ. මහ දෙනෝ ද සුවපත් විය. තුටු පහටු වැ විසී ය. රජ එ පවත් පෙරෙවියාට දන්වා, මහායාගයට උපදෙස් යැදී. තමා මහායාගයක් කරනුවට අදහස් කරන බව සියරටෙහි ගම්නිගම්හි ජනවුහි වැසි කැත් ඇමැති බමුණු ගැහැවි යන සිවු පිරිසට දන්වා, උන් ගෙන් අනුමතිය ගත යුතු යැ'යි පෙරෙවි කී. රජ ඒ සියල්ල කෙළේ ය. ඒ කැත්ඈහු ද 'යාගය කෙරෙත් වා, දේවයිනි, යාගයට කලැ'යි කිවු ය. මෙහි යාගයට අනුමතිය දුන් කැත් ඇමැති බමුණු ගැහැවි යන සිවු පිරිස යාගයට පිරිවර වේ. එ රජ වනාහි සත්වන මුත්තණු යුගය තෙක් දෙකුලයෙන් පිරිසිදු යැ, මනා රූසපුව ඇත්තේ යැ, දනයෙන් පොහොසත් යැ, මහ සෙනඟ ඇත්තේ යැ, දානපති යැ, සිප්සතර දත්තේ යැ, බොහෝ ඇසුපිරූ තැන් ඇත්තේ යැ, ඇසූ දූයෙහි අරුත් දන්නේ යැ, ඉයුනා වත්මන්හි අරුත් වටහා ගතැකි නුවණ ඇත්තේ යැ. මෙසේ එ රජු මේ අටඟින් යුතු ය. මේ අඞග අට යාගයට පිරිකර යැ [131]

131. මේ අටෙහෙි දානපති බව යනු දෙන දානයට තමා හිමි වනු යි. තමා මීහිරි දූ වළඳා අනුනට නොමිහිරි දූ දෙනුයේ දානදාස යැ. තමා වළඳන දූයට සම දූ දෙනුයේ දානසහාය යැ. තමා වළඳන දූයට වඩා වටිනා දූය දෙනුයේ දානපතී යැ.

එරජුගේ පෙරෙවි ද සිවු අඟෙකින් යුතු යැ: හේ සත්වනු මුත්තණු යුගය තෙක් මැ දෙකුලෙන් පිරිසිදු යැ, වේවෙයඟ දරන්නේ යැ,[132]. සිල්වත් යැ, පණ්ඩිත යැ. පෙරෙවියා කෙරෙහි වූ මේ සිවු අඟ ද යාගයට පිරිවර දහම් යැ.

9. තවද, ඒ පෙරෙවි තෙම යාගය අරඹනුවට කල් තබා මැ නොසැලී තරයේ සිටියැ යුතු තැන් දැක්වී. ඒ යාගයේ මුල මැද අග යන තුන යැ. දනයට පෙරාතු වැ මැ 'මෙයින් දන වියදම් වතැ' යි හෝ දන් දෙනුවහු 'දනය බොහෝ වියදම් වතැ' යි හෝ දී ඉක්බිති 'බොහෝ දන වියදමෙක් වී' යැ යි හෝ විපිළිසර නො වියැ යුතු. මෙකී තුන් තැනැ සිතැ පිරිසිඳු බව, සිත තරයේ සිටි බව, නොසැලෙන බව ත්‍රිවිධා (තුන් තඟවුරුබව්) නම් වේ.

මේ තුන් විධා ද දක්වා, ඉක්බිති "දන් පිළිගන්නවුන් අතුරෙහි අකුසල් කරන්නවුන් වුව ද විපිළිසැරි නො වියැ යුතු තමා දෙනුයේ ගුණවත්නට මැ යැ. එබැවිනි" යි කියා ඉක්බිති කැත් ඈ අනුමති දෙන සිවුපිරිස ද, දෙකුලපිරිසිඳුබව් ඈ අට පිරිකර ද, පෙරෙවියා කෙරේ වූ සිවු පිරිවර අංග ද යන මොහු හැම සොළොස් පිරිකර යැ යි ද, එයින් කිසිවකු විසිනුදු දෙසක් නැඟියැ නො හැකි යැ යි ද පෙරෙවි තෙම රජුට සැළ කොටැ රජහු සිත තුටුපහටු කෙළේ ය.

10. ඒ යාගයෙහි කිසි ද සතක්හු දිවි නො නැසූහු. යාග ටැඹ පිණිස රුක්සිඳිනු ද නො වී. යාග හලැ හෝ යාග බිමැ අතුරනුවට බබුස්තණ සිඳිනු ද නො වී. බල පෑමකට දඬුවමකට, තරවටුවකට හෝ බියෙන් දැසිදස්ආදීන් ගේ මෙහෙ කැරුමෙක් ද එහි නො වී. රිසියෝ තමන් රිසිය පරිදි මෙහෙ කළහ. ගී තෙල් මිහි සකුරු ආදි දැයින් ඒ යාගය සිදු කැරිණ.

කැත් ඇමැති ආදීන් රජුට සහාය වනුවට ගෙනා දැය එරජ නො ගත. තමා සතු දැ මැ විසදැ ඒ මහා යාගය පැවැත්වී. සහාය වනුවට වස්තු ගෙනාවුනට එරජ තමා ගෙන් ද බොහෝ වස්තු දුන. එවිට තෙසු කැත් ඈ සිවු පිරිස්ද රජුහු දෙන දන අදෙසට ගෙන ඔහුගේ යාගාවාටයට සිවු පසැ දන්හල් කරවා දන් දුන්හ. ඔවුන් ගේ ඒ යාගයෙහිත් පණිවා නො කැරිණ. බල පා සිත් පෙළා මෙහෙ ගැනුම් ද නො වී. ගී තෙල් වෙඬෙරු මිහි ඈහු ම දනවසතු වූහ. මෙසේ

132. වේ යනු සෘග් ආදි තුන් වේද ය. වෙයඟ (වේදාංග) උ. බ.

අනුමතිය දෙන සතර පස යැ, එ රජහු ගේ අට අඟ යැ, පෙරෙවියා සිවු අඟ යැ යන මොහු සොළොස් පිරිකර යැ, තුන් යාගසම්පත්හු තුන් විධාවෝ යැ.''

11. බුදුරජුන් මේ පවත විතරින් වදාළ කලැ එයැසූ බමුණු පිරිස 'අහෝ, උතුම් යාගයෙක්! අහෝ, උතුම් යාගසම්පතෙක්!! යි' හඬ නැගූහ. කූළදත් වූ කලි නිහඬ වැ මැහුත්තේ ය.

බමුණුපිරිස – හවත් කූළදතුවෝ නිහඬහ. ඔබ හවත් මහණ ගොයුමාණන් ගේ මනා බස මනා බසක් සේ නො පිළිගනිත් හෝ?

කූළදත් – හවත්නි, පින්වත් මහණ ගොයුමාණන් බස නො පිළිගනුයෙම් නො වෙමි. වැලි, මහණ ගොයුමන් එ කලැ ඒ යාගය කළ මහාවිජිත රජුහු හෝ එය කැරවූ පෙරෙවි බමුහුණුහු හෝ වියැ යුතු මැ යැ යි සිතමින් උනිමි. මෙ සෙවු යාගයක් කොටැ හෝ කරවා සගැ උපදිතැ යි හවත් මහණ ගොයුමාණෝ පිළිගනිත් ද?

බුදු: – එසේ යැ බමුණාණනි, මෙසෙවු යාගයක් කැරැ හෝ කරවා සග යෙති යි පිළිගනිමි. එදා ඒ යාගය කැරැවූ පෙරෙවියා මම් මැ යැ.

කූළදත් – මේ තුන් විධාත් සොළොස් පිරිකරත් තරම් සපුරාලන්නට නො පහසු නො වන, මෙයට වඩා ලෙහෙසි, එහෙත් මෙයට වඩා මහත් පල උපදවන, වඩා මහත් අනුහස් ඇති කිසි යාගයෙක් ඇත් ද?

බුදු: – ඇත, බමුණාණනි.

කූළදත් – ඒ කවර යැ, හවත් ගොයුමාණනි?

බුදු: – කුලපරපුරැ පැවැත්වෙන පරිදි දින පතා සිල්වතුන්නට දන් දෙනු උඩ කී යාගයට වඩා මහත් පල මහත් අනුසස් ඇතියෙක.

කූළදත් – එය උඩ කී මහායාගයට වඩා මහත් පල මහත් අනුසස් ඇති වන්නට කරුණු කවර යැ?

බුදු: – යාගයෙහි දත් ලබන දුගීමගී ආදීන් පේළි ගස්–වනු ඈ පිණිස දඬුයෙන් පහරිනු ද ගෙලැ අල්ලා පසකට යවනු ආදිය ද එහි වෙයි. එවන් යාග පිළිගන්නට රහත්හු හෝ රහත්මඟ පිළිපන්නෝ හෝ නො එති. ඔවුන් එනුයේ සිල්වතුන් උදෙසා දෙන දනට යැ. මෙයින් මේ පසු කී යාගය පලයෙන් අනුහසින් වඩා මහති. පළමු යාගයා සේ මහ වෙහෙසත් මහංසියත් නැති වැ දිය හැකි එකෙකි.

කූළුදත් – මෙයට ද වඩා මහ පල මහ අනුසස් ඇති, එහෙත් දෙනුයෙහි මෙ තරම් ආයාස නැති යාගයෙකුත් ඇත හෝ?

බුදු: – ඇත, සිවු දිගින් එන සඟන සඳහා වෙහෙරක් කරනු පල අනුසස් දෙකින් පළමු කී හැමට වැඩි පල අනුසස් ඇති, කරනුයෙහි ද වඩා පහසු, යාගයෙක.

කූළුදත් – මෙයටත් වඩා පල අනුසස් ඇති, කරනුයෙහි වඩා පහසු යාගයෙක් ඇත හෝ?

බුදු: – ඇත, පහන් සිතින් තෙරුවන් සරණ යනු මේ හැමට වැඩි පල අනුසස් ඇති, කරනුයෙහි වඩා පහසු ද යාග යැ.

කූළුදත් – මේ උඩ කී සියල්ලට ද වඩා පල අනුසස් ඇති, කරනුයෙහි මෙ හැමට වඩා කයට පහසු යාගයෙක් ඇද්ද?

බුදු: – ඇත, ඒ තිසරණ පන්සිල් රකිනු යැ.

කූළුදත් – මෙයට ද වඩා පල අනුසස් ඇති, කරනුයෙහි මෙයට වඩා මහංසි අඩු යාගයෙක් ඇත හෝ?

බුදු: – ඇත, ඒ සස්නැ පැවිදි වැ සුළුසිල්[133] පුරනු යැ.

කූළුදත් – මෙයට ද වඩා පල අනුසස් ඇති, කරනුයෙහි කයට මහංසි අඩු යාගයෙක් ඇත හෝ?

බුදු: – ඇත, ඒ මැදුම්සිලින්[134] හැවිරී වසනු යැ.

133. සුළුසිල් - බ්‍රහ්මජාලසූත්‍රය බලනු. 134. මැදුම්සිල් - බ්‍රහ්මජාලසූත්‍රය බලනු.

කුළුදත් – මෙයට ද වඩා මහත් පල අනුසස් ඇති කරනුයෙහි කය වෙහෙසනු අඩු, යඥයෙක් ඇත හෝ?

බුදු: – ඇත, ඒ මහසිල්,[135] පුරනු යැ.

කුළුදත් – මෙයට ද වඩා මහත් පල අනුසස් ඇති, කරනු-යෙහි කාවෙහෙස අඩු යඥයෙක් ඇත හෝ?

බුදු: – ඇත. ඒ පළමු රූදහත් වඩනු යැ.

කුළුදත් – මෙයට ද වඩා පල අනුසස් ඇති යඥ ය?

බුදු: – ඒ දෙවෙනි රූදහත් වඩනු යැ.

කුළුදත් – එයට ද වැඩි පලානුහස් ඇති යඥ ය?

බුදු: – තෙවෙනි රූදහත් වඩනු යැ.

කුළුදත් – එයට ද වැඩි පලානුහස් ඇති යඥ ය?

බුදු: – සිවුවන රූදහත් වඩනු යැ.

කුළුදත් – එයටත් වැඩි පලානුහස් ඇති සම්බාධ අඩු යඥයෙක් ඇත?

බුදු: – ඇති. ඒ විවසුන් නුවණ අතට සිත යොමු කරනු යැ.

කුළුදත් – මෙයට ද වැඩි පලානුහස් ඇත්තෙක් ඇත? ඒ කිම?

බුදු: – ඇත, ඒ ඉදුහු පුරුදු කොටැ මන්මුවා ඉදුහු (මනෝමයර්ධිය) ලබනු යැ.

කුළුදත් – මෙයට ද වැඩි පලානුහස් ඇති යඥයෙක් ඇත?

බුදු: – ඇති. ඒ ඉදුවිදුනුවණ (සෘඬිවිධඥනය) පිණිස පිරියම් කැරැ එය ලබනු යැ.

කුළුදත් – මෙයට ද වැඩි පලානුහස් ඇති යඥයෙක් ඇත?

බුදු: – ඇත. ඒ දිවකන්නුවණ ලබනු යැ.

කුළුදත් – මෙයට ද වැඩි පලානුහස් ඇති යඥයෙක් ඇත?

---

135. මහසිල් – බ්‍රහ්මජාල සූත්‍රය බලනු

බුදු: – ඇත. ඒ පරසිත් දන්නා නුවණට පිරියම් කොටැ එය ලබනු යැ.

කුළුදත් – මේ හැමට වැඩි තරම් පලක් අනුහසුත් ඇති කරණී අඩු යාගයෙක් ඇත් හො? ඒ කවර යැ?

බුදු: – ඇත. ඒ පෙර වුසු කඳපිළිවෙළ දන්නා නුවණ ලබනුවට පිරියම් කොට එය ලබනු යැ.

කුළුදත් – මෙයටත් පලානුසස් වැඩි, කරණී අඩු, යඥයෙක් ඇත?

බුදු: – ඇත. ඒ දිවැස්නුවණ ලබනුවට පිරියම් කොටැ එය ලබනු යැ.

කුළුදත් – මෙයට ද වඩා පලානුහස් මහත්, කරණී අඩු යඥයෙක් ඇත් හො?

බුදු: – ඇත. ඒ ආසව[136] නසන නුවණ ලබනුවට පිරියම් කොට එය ලබනු ය. මෙයට වඩා උතුම් යාගසම්පතෙක් නැත. මේ පරම යාග-සම්පත යැ.[137]"

12. මෙය අසා කුළුදත් පැහැදිණ. (යට සුතුරැ සෝණ දණ්ඩයා සේ ම දම් දෙසූ නියාව මැනවැ යි පසසා තෙරුවන් සරණ ගියේ ය. යඥය පිණිස බැඳ තැබූ සියලු සතුන් මුදා හරන බව ද පැවැසී. බුදුරජහු දානකථා ආදි ආනුපුබ්බිකථායෙන් ඔහුට බණ වදාළහ. ඉක්බිති සිවුසස් දෙසූහ. දෙසුම් කෙළවරැ කුළුදත් බමුණු සෝවාන් වී ය. හේ පසු දින බුදුපාමොක් මහසඟන සිය යාග හලට වැඩම කරවා දන් වැළඳැවී ය බුදු-රජහු ද ඔහුට දම් දෙසා සිත පහත් කරවා ගුණදම් වැඩුම්හි දිරි ගත්වා හුනස්නෙන් නැඟී වැඩියහ.

[මෙහි දැහැමි යාගයේ විධා තුන ද, සොළොස් පිරිකර ද, පෙර පැවැති දැහැමි යාග ද, පිළිවෙළින් අනුසස් වැඩි යාග වැල ද, කෙලෙස් නැසීම උසස් ම යාගය වන නියා ද දක්විණ.]

---

136. ආසව යනු කාමාසව භවාසව දිට්ඨාසව අවිජ්ජාසව යන සතර ය. උපග්‍රන්ථය බලනු. 137. උපග්‍රන්ථය බලනු.

6. මහාලි සූත්‍රය.

1. එක් සමයෙක බගවත් බුදුරජ්ජු **විසල්පුර** අසල මහ වෙනෙහි **කුළාරහල් වෙහෙර**[138] වෙසෙති.

එකලැ මගද කොසොල් දෙ රටෙන් කිසි කටයුත්තකට පැමිණි බමුණු දූත කෙනෙක් විසල් පුරැ නවා තන් ගෙනා වෙසෙත්. ඔහු බුදුරජුන් පිළිබඳ උස් වැ නැඟි කිත් ගොස අසා ඔබ දක්නා සඳහා කුළාරහල් වෙහෙර කරා ගියහ.

2. එ සෙමෙහි **නාගිත** තෙරණුවෝ බුදුරජුනට උවටන් කෙරෙති. ඒ බමුණු දූතයෝ "බගවත්හු කොහි ද ?" විචාළහ "දැන් බගවත්හු විවේකි වැ හිඳිති. මේ ඔබ දක්නට වේලාව නො වෙයි" තෙරණුවෝ සැළ කළහ. 'අපි ඔබ දැකලා ම යම්හ'යි ඒ බමුණුදූතයෝ අරමැ තැන් තැන රුක්සෙවණැ ඉඳගත්හ. අඩතොලු[139] **මහාලි** ලිච්ඡවි රජ ද මහත් ලිච්ඡවී පිරිසක් හා එහි පැමිණියේ ය. 'බුදුරජුන් දක්නට මේ නො කලැ'යි නාගිත තෙරුන් කී බස් අසා, 'බුදුරජුන් දැක ම යම්'යි රුක්සෙවණෙක ඉඳගත. නාගිත තෙරුන් ගේ බෑහැන **සිංහ** හෙරණ ඒ රැඳී හුන් මහ පිරිස් දැක, ඔවුනට බුදුරජුන් දක්වියැ යුතු ම බව් තෙරුනට කී ය. තෙරණුවෝ හෙරණට ම එය පැවැරූහ. සිංහ තෙම බුදුරජුන් කරා ගියේ ය. ගොස් ඔබ දක්නට මහ පිරිස් අවුත් ඉත්නා බව් සැළ කෙළේ ය.

3. 'වෙහෙරැ ඉදිරිපසැ අස්නක් පණවවු'යි බුදුරජ්ජු වදාළහ. හෙරණ ද එය කෙළේ ය. එක්බිති බුදුරජ්ජු එහි වැඩියහ. පැණැවුණු අස්නැ වැඩහුන්හ. කොසොල් මගද දෙරටෙන් අවුත් සිටි බමුණු දූතයෝ ඔබ වෙත් ගියහ. ගොස් පිළිසඳර කතා කොට පසෙක උන්හ. මහාලී ලිච්ඡවී ද සිය පිරිස හා ගොස් වැඳ පසෙක හිඳගත. එයට පසු ඔහුත් බුදුරජුනුත් අතරැ සාකච්ඡාව විය.

4. **මහාලි** – වහන්ස, කිහිප දිනකට පෙරැ ලිච්ඡවිපුත්‍ර **සුනක්ඛත්ත** වහන්දෑ මා වෙත අවුත් තමන් බුදුරජුන් වෙත මහණ වැ තුන් වසක් ගෙවිණැයි ද, මේ කාලය තුළැ තමනට දෙව්රූ දක්නට හැකි වී යැ යි ද, එහෙත් දෙව්හඬ අසනු හැකි

138. කුළාරහල් වෙහෙරැ = කූටාගාරශාලා විහාරයෙහි. 139. ඔට්ඨඞ = අඩතොලු. මහාලී යනු ඔහු නම ය. අඩතොලු බැවින් ඔට්ඨඞ සී ද හැඳින්විණ.

නො වී යැ යි ද කිහ. වහන්ස, දෙව්හඬක් නැති බැවින් ම ඔහු එය නෑසූ ද? නොහොත් ඇති දෙව්හඬ ම නෑසූ ද?

බුදුරජුහු – මහාලිය, දෙව්හඬ ඇත. ඇති දෙව්හඬ ම හේ නෑසී.

මහාලි – වහන්ස, එය ඔවුන් අසනු නොහැකි වන්නට කරුණු කවර යැ?

බුදුරජුහු – මහාලිය, පෙර අපර ඈ කිසි එක් දෙසෙකැ දෙව්රූ දක්නා පිණිස සමාදි කොටස වැඩුවහුට එ දෙසැ දෙව්රූ පමණෙක් පැණේ. වැලි දූ දෙව්හඬ නො ඇසේ. යම් එක් දෙසෙක දෙව් හඬ අසනුවට සමාදිය එක් කොටසක් වැඩුවාහට එ දෙසැ දෙව්හඬ ම ඇසේ. දෙව්රූ නො පැණේ. අන් දෙසෙක දෙව්හඬ ද නො ඇසේ. යම් දෙසෙකැ දෙව්රූ දකිනුවටත් දෙව්හඬ අසනුවටත් හැකි වන පරිදි සමාදිය වැඩී නම් එ දෙසැ දෙව්රූ දක්කැ හැකි වෙයි, දෙව්හඬ ද ඇසියැ හැකි වෙයි. දෙව්හඬ අසනුවට ඇවැසි සමාදි කොටස හේ නො වැඩී ය. එ හෙයින් දෙව්හඬ අසනුයෙහි නො සමත් වී ය. ඇති දෙව්හඬ ම හේ නො ඇසී ය.

මහාලි – වහන්ස, පැවිදි තැන් ඔබ වෙත මහණදම් කරනුයේ දෙව්රූ දකිනුත් දෙව්හඬ අසනුත් පිණිස ද?

බුදුරජුහු – නැත, මහාලිය. පැවිදි තැන් මා වෙත මහණදම් කරණුයේ දෙව්රූ දෙව්හඬ දක්කැකි ඇසියැකි සමාදි ලබනුවට නො වේ. වැලි එයට වැඩි උසස්, එයට වැඩි උතුම් දහම් කෙනෙකුන් ලබනුවට ය.

මහාලි – වහන්ස, ඒ උසස් උතුම් දහම්හු කවුරු යැ?

බුදුරජුහු – සෝවන් පල, සෙදගැමි පල, අනාගැමි පල, රහත් පල යන සිවු අරි පල ලබනුවට ය, ඔවුන් මා වෙත මහණදම් රකිනුයේ.

මහාලි – වහන්ස, මේ අරි දහම් ලබනුවට යැ යුතු මඟෙක් ඇත් හො?

බුදුරජුහු – ඇත, මහාලිය.

මහාලි – ඒ කවර යැ වහන්ස?

බුදුරජුහු – මහාලිය, අරි අටැඟි මඟ පුරනු ඒ අරි පල ලබනුවට මඟ ය.

5. මේ ලිච්ඡවි රජ රූව අතැ සි[140] දිට් ගත්තෙකි. එ බැවින් එය දුරු ලවනු පිණිස බුදුරජුහු තමන් පෙරැ කොසොඹෑ පුරැ ඝෝෂිතාරාමයේ දී වදළ දහමක් මී ළහට[141] වදළහ. එයසා ලිච්ඡවි රජ සතුටු විය.

[මෙ සුතුරු දෙව්රුදුකුම් ආදියට සමාදි වැඩියැ යුතු සැටි, මහණදම් පුරනු කුමට ද යන වග, ජීව ශරීර දෙක එකකැයි ම හෝ දෙකෙකැ යි කියනු සදෙස් බව යන මෙතෙක් දෑ දැක්විණ.]

---

7. ජාලිය සූත්‍රය.

1. එක් සමයෙක බගවත් බුදුරජුහු **කොසොඹෑපුරු ගොසුඅරමැ**[142] වැඩ වෙසෙති: එ සමයෙහි **මුණ්ඩිය** නම් පිරිවැජ්ජෙකුත් දරපයුවක්හු[143] අතැවැසි **ජාලිය** නම් පිරිවැජ්ජෙකුත් ඔබ දක්නට එහි ගියහ. ගොස් පිළිසඳර කතා කළහ. එයට පසු බුදුරජුන් හා ඔවුන් හා කතාබහ පැවැතිණ.

2. **පිරිවැජියෝ** – වහන්ස, දිවතත්[144] සිරුරත් එකෙක් ම ද නැත හොත් වෙන් වෙන් වූ දෙ දෙනෙක් ද?[145]

බුදුරජුහු – සැදැහැවත් කුලපුත් සසුන් වැද සුළුසිල් මැදුම්සිල් මහසිල් පුරා පළමු දහන් උපදවයි. ඒ පළමු දහන් ලත් මහණ විසින් 'දිවතත් (ජීවයත්) සිරුරත් දෙක ම එකැ සි හෝ වෙන වෙන දෙකෙකැ යි කියැ හැකි ද?

---

140. රූපය ආත්ම යැ යි 141. එය ජාලිය සූත්‍රයයි. මෙයට අනතුරුව ඒ සුතුර දක්වෙයි. 142. ඝෝෂක සිටුහු කැරවූ ඝෝෂකාරාමය ඝෝෂිතාරාම නමිදු මේ ම ය. 143. දරුමය පත්‍රයක් දරන අන්තෙවාසිකයෙකුගේ ශිෂ්‍ය. 144. ජීවාත්මයත්. 145. දිවතත් සිරුරත් එකෙක් මැ යැ යි කීවොත් සිරුර මැරෙන බැවින් දිවතත් මැරේ යැ යි කිය යුතු. එවිට උච්ඡෙද දෘෂ්ටිය වේ. දෙකෙකැයි කිව නොමැරෙන එක ශාශ්වත වනුයෙන් ශාශ්වතදෘෂ්ටි වේ. මේ කුමක් කිව ද වාද නගනුවට මේ පැණය විචාළහ.

පිරිවැජියෝ – කියැ හැකි සි වහන්ස.[146]

බුදුරජුහු – දෙවෙනි, තෙවෙනි, සිවුවන දහන් ලදුවහු විසිනුත් එසේ කියැ හැකි ද?

පිරිවැජියෝ – කියැ හැකි වහන්ස.[147]

බුදුරජුහු – විවසුන් නුවණ අතට සිත නමා හැර නැණදසුන්[148] ලැබ සියලු කෙලෙසුන් නසා රහත් වූවහු. විසින් දිවතත් සිරුරත් එක මැ යි හෝ වෙන වෙන දෙකෙකැ යි කියැ හැකි ද?

පිරිවැජියෝ – අරි නුවණ ලදුවහු විසින් එසේ කියැ නො හැක්ක.[149]

බුදුරජුහු – මෙසෙ මම දනිමි, දකිමි. එ හෙයින් දිවි සිරුරු යන දෙක එකෙක් මැ යැ යි හෝ වෙන් වෙන් දෙකෙකැයි ම හෝ නො කියමි.

3. ඒ පිරිවැජියෝ බුදුරජුන් වදළ බසසා සතුටු වූහ.

[මෙහි ජීවයත් ශරීරයත් එකෙක හෝ දෙකෙකැ යි තතු දන්නා නුවණ ලදුවහු විසින් නො කියැ හැකි බව ද තමන් ගේ දහම මේ දෘෂ්ටි දෙකට ම නො බැය මැදුම් පිළිවෙත දක්වන එකක් බව ද දැක්විණ.]

---

8. මහා සිංහනාද සූත්‍රය.

1. බගවත් බුදුරජුහු එක් සමයෙකැ **උජුඤ්ඤ**[150] රටැ උජුඤ්ඤ නුවරට නොදුරු **කණ්ණකථල**[151] මුවලැව්හි වැඩ වෙසති.

2. එ සමයෙහි **කසුප්** නම් නිරුවත් පිරිවැජ්ජෙක් ඔබ දක්නට ආ ය. අවුත් පිළිසඳර කතා කොට පසෙක සිටියේ ය. එසේ සිට ම පැණයක් විචාළේ ය. එයින් **කතාව** ඇරැඹිණ.

2. **කසුප්** – පින්වත් ගොයුම්මණනි, සියලු තපසටත් රළු දිවි වැටුම්[152] ඇති සියලු තවුසනටත් මහණ ගොයුම්මණන් ගරහන බවක් මා ඇසුවා ඇත.

146, 147. පුහුදුන් බැවින් එසේ කියැ හැකි සි. 148. ඥානදර්ශනය.
149. සක්කායදිට්ඨි විචිකිච්ඡා දුරු වූ බැවිනි. 150. උරුඤ්ඤ=කිසි පොතෙකැ.
151. කණ්ණකත්ථල නම් මෘගදවයෙහි (මුව වෙනෙහි) 152. ජීවිතය පැවැත්වීම.

පින්වත් ගොයුම්ාණනට ඔහු නැති දෙස් නඟන්–නෝ ද? නොහොත් ඔබ කී දූය අනුව ම ඔහු එසේ කියන්නෝ ද? අපි ඔබට ගරහනු නො රිස්සමු.

3. **බුදුරජුහු** – 'මහණ ගොයුම්හු සියලු තපසටත් සියලු තවුසනටත් ගරහති' යි කියන්නෝ මා නො කිවක් ම කියන්නෝ ය. මට නොවූ දූයෙන් දෙස් නඟන්–නෝ ය. කස්බ, රළු දිවිවැටුම් ඇති ඇතැම් තවුසකු මරණින් මතු සුගතියෙහි උපන්නහු ද, ඇතැම් තවුසකු දුගතියෙහි උපන්නහු ද, රළු දිවිවැටුම් නැති ඇතැම් තවුසකු සුගතියෙහි උපන්නහු ද, ඇතැමකු දුගතියෙහි උපන්නහු ද මම් දිවැසින් දකිමි. කම් වූ පරිදි අන් තැනෙකින් සැවැ මෙහි එනුත් මෙයින් සැව පර ලෝ යනුත් එයින් මැරෙනුත් අන් තැනෙක උපදිනුත් දකිමි. එසේ දක්නා මම් සියලු තපසටත් රළු දිවිවැටුම් ඇති සියලු තවුසනටත් කෙසේ නම් ගැරහියැ හෙම් ද?

4. කස්බ, නියුණු නුවණ ඇති ඇතැම් මහණ බමුණෝ ලොවැ වෙති. ඇතැම් කරුණෙහි ඔවුන් ගේ ද අපගේ ද අදහස් සම ය. ඇතැම් කරුණෙහි සම නො වේ. ඔවුන් 'මැනැවැ'යි පිළිගන්නා ඇතැම් දෑ අපි ද 'මැනැවැ'යි පිළිගනුම්හ. ඔවුන් පිළිගන්නා ඇතැම් දෑ නො පිළිගනුම්හ. ඔවුන් නො පිළිගන්නා ඇතැම් දෑ අපිත් නො පිළිගනුම්හ. අප පිළිගන්නා ඇතැම් දෑ ඔහු නො පිළිගනිත්. එසේ වූ ඔවුන් කරා අපි යමු. ගොස් මෙසේ කියමු.

"අපත් තොපත් සම අදහස් නැති තැන් හැර, අප දෙපස ම සම අදහසින් පිළිගන්නා තැන් පමණක් ගනිමු. ගෙන අප දෙ පස ම 'වරදූ'යි එක්සේ සලකන අකුසල් මුළුල්ල බැහැර ලා පවත්නෝත් 'නිවරදූ' යි කවරුනුත් සලකන කුසල් දහම් හැම සැටියෙන් සමාදන් වැ ගෙන සපුරා සිටිනුවෝත් කවුරු ද? මහණ ගොයුම්හු ද? නැත හොත් අන් ගණැදුරෝ ද? ගොයුමන් ගේ සවුසඟන ද? නැත හොත් අන් තොටුගුරුන් ගේ සවුමුළුහු දූ?' යි ගුරුන් ගෙනුත් සච්චන් ගෙනුත් අසා බලන නුවණැත්තෝ "ඒ අකුසල් මුළුල්ල දුරු කළෝත් කුසල් හැම සපුරා වඩනුවෝත් මහණ ගොයුමාණෝ ද ඔබ සච්චෝ ද වෙති'යි,

'අන් තොටුගුරුහුත් ඔවුන් සව්වෝත් අකුසල් දුරුලූ වෝ ද කුසල් වඩනුවෝ ද එක් ලෙසෙකින් ම යැ සි. හැම ලෙසින් නො වෙති'' සි බෙහෙවින් අප ම පසසත්. ඛස්බ, මහණ-ගොයුම්හු කාලවාදී ද (කියැ යුතු වෙලාව බලා ම කියත්නෝ ද), භූතවාදී ද (ඇත්ත ම කියත්නෝ ද), අර්ථවාදී ද (දෙලෝ වැඩ අසල දෑ ම කියත්නෝ ද), ධර්මවාදී ද (දහමක් ම කියනුවෝ ද), විනයවාදී ද වෙති'' සි තමත් අත් දැක්මෙන් ම දැන කියත්නාහු වෙති. මහණගොයුම්හු එසේ මැ යැ යි දැන ගත හැකි වනුවට මඟෙක් ඇත. එ නම්: සම්මාදිට්ඨි සම්මාසංකප්ප සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව සම්මාවායාම සම්මාසති සම්මාසමාධි යන අඞ්ග අට ම වූ පිළිවෙත ය. එහි පිළිපන්නේ 'මහණ-ගොයුම්හු කාලවාදී ද භූතවාදී ද අර්ථවාදී ද ධර්මවාදී ද විනය-වාදී ද වෙති' සි තෙමේ ම දැන ගත්තේ ය, තෙමේ ම දක්නේ ය.

5. **ඛසුජ්** – ඒ ඇතැම් මහණබමුණන් ගේ මහණුවම් බමුණු-වම්[153] සේ ගැනෙන තවඋවහම්[154] කෙනෙක් ඇත: එකෙක් නිරුවත් ය. සිටැගෙන ම හෝ මලමූ පහ කෙරෙයි. කා අත ලොවී. බික් පිළිගන්නට නිමැතු විට නො එයි. බොජුන් ගෙනෙන තෙක් වැඩ සිටින්නැ යි කිවොත් නො සිටැ යෙයි. වෙලාවෙන් පළමු එළැවූ බොජුන් නො පිළිගනී. තමා උදෙසා කළ බොජුන් නො ගනී. නිමතා පිළියෙල කළ බොජුන් නො ගනී. සැළිමූවින් නගා දුන් බොජුන් නො ගනී. සැළිපැසින් නගා දුන් බොජුන් නො ගනී. එළිපතැ හෝ දංඩක් හෝ මොහොලක් අතරැ කොට (එළිපත් ආදියෙන් එහා ගෙය තුළැ) තුබූ බොජුන් නො පිළිගනී. බොජුන් වළඳනා දෙදෙනෙකුන් ගෙන් එකක්හු නැඟී එළැවූ බොජුන් නො පිළිගනී. ගැබින්නක දුන් බොජුන් නො පිළිගනී. කිරි පොවන්නියක

153. ශ්‍රාමණ්‍ය (මහණකම්), බ්‍රාහ්මණ්‍ය (බමුණුකම්). 154. තපඋපක්‍රම මේ තපස්කම් ම ය. රූකය තැවීම ඔවුන් ගේ තපස යි. මෙහි දක්වුණු නිරුවත්බව් ඈ ඇතැම් වත් ආජීවිකයන් ගේ ය. අනශන, අවමෞදර්‍ය්‍ය, වෘත්තිපරිසංඛ්‍යාන, රසපරිත්‍යාග, විවික්තශය්‍යාසන, කායක්ලේශ යන මොහු තපස් නමින් ජෛන තත්ත්වාර්ථාධිගමසූත්‍රයේ දක්වේ. මෙහි දක්වුණු සමහර තපඋපක්‍රම භට්ටකේරයන් ගේ මූලාචාර නම් ජෛන ග්‍රන්ථයේ ද, ගුරුදාස ජෛනාචාර්‍ය්‍යයන් ගේ ප්‍රායශ්චිත්තසමුච්චය නම් පොතේ ද දැක්වේ.

දුන් අහර නො පිළිගනී. සැමියා හා වාසයට ගිය ගැහැනියක දුන් බොජුන් නො පිළිගනී. බොහෝ දෙනා ගෙන් එකතු කොට පිළියෙල කැරූ දුන් බොජුන් නො ගනී. ළඟැ හුන් බලුට හෝ නොදී එළැවූ අහර නො ගනී. මැස්සන් ගැවැසෙන තැනින් ගෙනැ දුන් අහර නො ගනී. ගොඩමස් දියමස් නො පිළිගනී. රහමෙර නො පිළිගනී. හස්කාඩි[155] නො පිළිගනී. එක් ගෙයෙකින් ම ලත් බොජුනෙන් හෝ එක් බත් පිඬෙකින් ම යැපේ. සත් ගෙයෙකින් ලත් බොජුනෙන් ම හෝ (සත් බත් පිඬෙකින් ම) යැපේ. කුඩා බික් අමත්[156] එකෙකින් දෙකෙකින්......සතෙකින් ම හෝ යැපේ. දිනක් හැර දිනක් හෝ දෙ දිනක් හැර දිනක් හෝ ......සතියක් හැර දිනක් හෝ බොජුන් වළඳයි. අඩමසක් හැර දිනක් හෝ බොජුන් ගනී. මේ ඇතැම් මහණුන් ගේ බමුණන් ගේ මහණුවම් බමුණුවම් ය.

6. කිසි මහණෙක් හෝ බමුණෙක් අමු පලා කයි, බොඩහමු තණ හෝ සහල් හෝ කයි. එකෙක් සියදෑ[157] හැල් කයි. සොම්මරුන් ලියා දැමූ සම්කසට හෝ බුදී. මැලියම් හෝ දියසෙවෙල් බුදී. වීපිටි කයි. වළන් සේදූ තැනැ හුණු දඹු බත් අවුලා කයි. මුරුවට කයි. තණකොළ කයි. ගොම කයි. වනමුල්පලාපල හෝ වළඳයි. තමන් ම හුණු පලයෙන් දිවි පවත්වයි. මේ ඇතැමුන් ගේ මහණුවම් බමුණුවම් ය.

7. කිසි මහණෙක් හෝ බමුණෙක් හනවැහැරි හඳී. හනවැහැරිමුසු රෙදි හෝ හඳී. මළසිරිරින් ඉවතැ ලූ රෙදි හෝ හඳී. එරුතණ ආදියෙන් වියූ අගය අඩු රෙදි හෝ හඳී. එකෙක් පහුල්වත්[158] ද, එකෙක් රුක්සුඹුලින් කළ වත් ද, අනෙකෙක් නො පැළු අඳුන්දිවි සම් ද, තවෙකෙක් මැදින් පැළු අඳුන්දිවි සම් ද, වෙනෙකෙක් කුසවැහැරි ද හඳී. කිසි තවුසෙක් නියඳවැහැරි ද, නැත හොත් කෙෂහමුවා කම්බල ද, අනෙකෙක් අස්ලොම්මුවා කම්බල ද, තවෙකෙක් බකමූණු පියාපතින් කළ වත් ද දරයි. එකෙක් කෙහෙ රැවුලු උදුරයි.

155. ශශ්‍යයෙන් කළ කාඩිය. 156. භික්‍ෂාපාත්‍ර. 157. සවයංජාත හැල්. 158. පාංශුකූලවස්ත්‍ර.

අනෙකෙක් උත්කුටුක ව ම හිඳී. උත්කුටුක ව ම යෙයි. එකෙක් කටුමත්තෙහි ඉඳුම් හිටුම් ඈ කෙරෙයි. පෝරුවක් මත හෝ සැතැපෙයි. උස් බිම් කාංඩිවල හෝ ලගී. එක් ඇලයෙකින් ම හෝ වැද හෙයි. දූලි වැකි ඇඟ ඇති වැ හෝ හිඳී. එළිමහනේ ම හෝ වෙසෙයි. පළමු අතුල පරිදි වූ අස්නැ ම හෝ ඉඳී. එකෙක් වසුරු කයි. එකෙක් ඇල් දිය නො බොයි. පාන්දෙර මැද්දහන හැන්දෑව යන තුන් සැඳෑහි පව් සෝදන අදහසින් දියැ ගැලේ. මේ ඇතැම් මහණුන් බමුණන් මහණුවම් බමුණුවම් කොට ගත් තවළුවහම් (තපස්කම්) ය.

8. කස්බ, මේ නිරුවත්වීම් ඈ වත් පිරුමෙන් කිසි ම නැනැත්තකු ගේ සිල් සමාදි පැණ යන තුන් සපුහු[1.59] නො ම වැඩෙත්. එ බැවින් ඒ නිරුවත්බව් ඈ වත් පුරනුවෝ මහණ කමින් බමුණුකමින් ඈත්හි ම සිටියෝ ය. කස්බ, සසර බිය දක්නා යමෙක් මෙත් සිත් වඩා නම්, මේ දිවියෙහි ම (එයින් ලත් දහන් පාදක කොට විවසුන් වඩා) පලසමාදියත් පල නුවණත් පසක් කොට ලැබ වෙසේ නම්, එයින් හේ මහණ ද වේ, බමුණු ද වේ.

කාසුප් – පින්වත් ගොයුමාණනි, මහණහු බමුණහු දූනැ ගැන්ම බැරි ය, අමාරු ය.

බුදුරජහු – කස්බ, 'මහණහු බමුණහු දූනැ ගැන්ම බැරි ය, අමාරු ය' යනු ලොවැ පියෙවි කතාව ම ය. කස්බ, ඉහත කී තවළුවහම්වලින් එය කරන්නා මහණෙක් බමුණෙක් වේ නම් ගොවියකු හෝ ගොවි දරුවකු හෝ යටත් පිරිසෙයින් දිය අදනා දස්සකා විසිනුදු එය දත හැකි බැවින් 'ඒ මහණහු බමුණහු දූනගැන්ම බැරි ය, අමාරු ය' යනු නො කියැ යුතු වෙයි. වැලි කිසිවකුත් තවළුවහම් පමණින් මහණකු බමු-ණකු නොවන බැවින් ම මහණහු බමුණහු දූනගනු අමාරු ය, ලෙහෙසි නො වේ. කස්බ, මෙත් සිත් වඩා නම්, කෙලෙස් නසා රහත් වැ පලසමාදියත් පලනුවණත් ලැබ වෙසේ නම් හේ මහණැ යි ද බමුණැ යි කියනු ලැබේ.

කාසුප් – පින්වත් ගොයුමාණනි, ඒ සිල් සපුව, ඒ සිත් සපුව, ඒ පැණ සපුව කවර යැ?

1.59. ශීල සමාධි ප්‍රඥ යන තුන් සම්පත්තිහු.

9. **බුදුරජුගු** – කස්බ, කුලපුතෙක් ලොවුතුරා බුදු කෙනෙකු ලොවැ පහළ වූ කලැ, බුදුගුණ අසා පැහැද, ඔබ වෙත පැවැදි වැ, සුළු සිල් මැදුම් සිල් මහ සිල් පුරනුයේ සිල්වත් වෙයි. මෙසේ සිල් පිරූ හෙ තෙම සතුරන් නැසූ අබිසෙස් ලත් රජක්හු සේ, සිල්හැවුරුමෙන්[160] යුත් වූයේ, කොතැනෙකිනුත් බියක් නො දකී. මෙසේ වූ හෙ තෙම අරි සිල්කඳින් යුත් වූයේ, එයින් උපන් නිවැරැදි සුවය විඳී. මේ ඔහු සිල්සපුව යි (ශීල සම්පත යි).

ඉක්බිති හේ සමාදි වඩා පස් නීවරණ මැඩැ පළමු දහන් ලැබැ ඒ දහන් සුවෙන් කල් ගෙවයි. පිළිවෙළින් දහන් වඩා දෙවෙනි තෙවෙනි සිවුවන දහන් ලැබ ඒ දහන්සුවෙන් කල් යවයි. මේ ඔහු ගේ සිත්සපුව (චිත්තසම්පත්තිය) යි.

සමාදියෙන් සිත එකඟ වූ කලැ හේ විවසුන් නුවණ අතට සිත යොමු කෙරෙයි. හේ කඳපරපුරැ ඉපැත් ම හා නැස්ම හා දකිනුයේ, නිවි සැනැහී ඒ විවසුන් සුවයෙන් වෙසෙයි. මේ ඔහු පැණසපුව ය. (ප්‍රඥසම්පත් ය).

හේ ඉක්බිති ඉදුහු වඩා මනස්මුවා ඉදුවිදි නුවණ ලබයි. මේ ද ඔහු ගේ පැණසපුවෙක. ඉක්බිති හේ එයට සුදුසු පිරියම් වඩා දිවකන් නුවණ ද, පරසිත් දන්නා නුවණ ද, පෙරැ වුසු කඳපිළිවෙළ දක්නා නුවණ ද, දිවැස ද ලබයි. කෙළවරැ ආසව නසන නුවණ ලබයි. මේ ඔහු ගේ පැණසපු (ප්‍රඥ සම්පත්) ය. කස්බ, මෙ සිල්සපු සිත්සපු පැණසපු යන තුන් සපුවට (තුන් සම්පත්නට) වඩා උතුම් එකෙක් නැත.

10. කස්බ, මහණබමුණන් ගෙන් කෙනෙක් ශීලවාදී හ,[161] කෙනෙක් තපෝජුගුප්සාවාදී හ,[162] කෙනෙක් ප්‍රඥවාදී හ,[163] කෙනෙක් විමුක්තිවාදී හ.[164] ඔවුන් ගෙන් ශීලවාදිහු ශීලය ද,[165] තපෝජුගුප්සාවාදිහු තපෝජුගුප්සාව ද,[166] ප්‍රඥවාදීහු

---

160. ශීල සංවරයෙන්. 161 ශීලය පවසන්නෝ. 162. තපෝජුගුප්සාව පණුවන්නෝ 163. ප්‍රඥව වැඩියැ යුතු යැ යි ප්‍රඥවට මඟ දෙසන්නෝ 164. මේ විමුක්ති යැ යි, මේ එයට මඟැ යි කියන්නෝ. 165. පන්සිල් පටන් කොට පාතිමොක්ඛ සීලය තෙක් සිල් නම. ලොකොත්තර මාර්ග සම්ප්‍රයුක්ත ඵලසම්ප්‍රයුක්ත ශීලය අධිශීල (පරමශීල) නම. 166. ශාසන පක්ෂයෙහි කෙලෙස් තවන වීර්‍ය තප නම්. කෙලෙසුනට පිළිකුල ජුගුප්සා නම් විවසුන් වඩනුයෙහි වීර්‍ය ශාසනයෙහි තපෝජුගුප්සා යි, මාර්ගඵල සම්ප්‍රයුක්ත වීර්‍ය අග්‍රතපෝජුගුප්සා නම්.

ප්‍රඥාව ද,[167] විමුක්තිවාදීහු විමුක්තිය ද[168] නොයෙක් කරුණු පාමින් වණන්නාහ. එහෙත් ඒ සියලු ශීල තපෝජුගුප්සා ප්‍රඥාවිමුක්තීන් ගෙන් මට සම එකකු ඒ මහණ බමුණන් අතුරෙ නො දකිමි. එයින් මට වැඩිතරම් එකකු කොයින් දකිම් ද? වැලි එකෙක් ඇත. යම් අධිශීල අධිජුගුප්සා අධිප්‍රඥා අධිවිමුක්ති කෙනෙක් ඇත් ද, ඒ සියල්ලෙන් මම් මැ වැඩිතරම් වෙමි.

කස්බ, මෙසේ මා කියනු අසා 'මහණ ගොයුම් සිනද (සිංහනාද) කෙරෙයි. එ ද පාලු ගෙයෙක යැ යි, මහ පිරිස්හි නො වෙයි ද අන් තොටුවන් කියනු ඇත. 'ඇත්ත එසේ නො වේ යැ'යි ද, 'මහණ ගොයුම් සිනදත් කෙරෙයි, පිරිස් මැද එය කෙරේ'' යැ යි ද ඔවුනට කියැ යුතු.

'මහණ ගොයුම් සිනද කෙරෙයි, පිරිස් මැදූ ද එය කෙරෙයි, වැලි අබිරැ වැ එය නො කෙරෙ යි' අන් තොටු පිරිවැජ්යෝ කියන්නාහු ද වෙති.........

'මහණ ගොයුම් සිනද කෙරෙයි, පිරිස් මැදූ ද එය කෙරෙයි, අබිරැ ව ද එය කෙරෙයි, එහෙත් ඔහු ගෙන් පැණ නො විචාරත්.........

'මහණ ගොයුම් සිනද කෙරෙයි, පිරිස් මැදූ ද එය කෙරෙයි, අබිරැ ව ද එය කෙරෙයි, පැණ ද විචාරති, එහෙත් ඒ නො විසඳයි.........

'මහණ ගොයුම් සිනද කෙරෙයි, පිරිස් මැදූ ද එය කෙරෙයි, අබිරැ ව ද එය කෙරෙයි, ඔහු ගෙන් පැණ ද අසති, හේ ඒ විසඳ යි, එහෙත් අසනුවන් සිත් නො ගනී යි ද...........

'මහණ ගොයුම් සිනද කෙරෙයි, පිරිස් මැදූ ද එය කෙරෙයි, අබිරැ ව ද එය කෙරෙයි, අන්හු ඔහු ගෙන් පැණ ද විචාරත් හේ ද ඒ විසඳයි, අසනුවන් සිත් ද ගනී, එහෙත් ඔහු බස ඇසියැ යුතු කොට නො සිතත් යැ යි ද.........

11. 'මහණ ගොයුම් සිනද කෙරෙයි, පිරිස් මැදූ ද එය කෙරෙයි, අන්හු ඔහු ගෙන් පැණ ද විචාරත්, හේ ද ඒ විසඳ යි, අසනුවන් සිත් ද ගනී, ඔහු බස් ඇසියැ යුතු කොට අන්හු සිතත්, එහෙත් එය අසා නො පැහැදෙත් යැ යි ද.........

---

167. ශාසනයෙහි කර්මස්වකතාප්‍රඥාවත් විදර්ශනාප්‍රඥාවත් ප්‍රඥා නම්. මාර්ගඵලසම්ප්‍රයුක්ත ප්‍රඥාව අධිප්‍රඥානම්. 168. තදංගවිමුක්ති විෂ්කම්භණ විමුක්තිහු විමුක්ති නම්හ. සමුච්ඡේද පටිප්පස්සද්ධි නිස්සරණවිමුක්තිහු අධිවිමුක්ති නම්හ.

'මහණ ගොයුම් සීනාද කෙරෙයි, පිරිස් මැදැ ද එය කෙරෙයි, අබිරැ ච ද එය කෙරෙයි, අන්හු ඔහු ගෙන් පැණ ද විචාරත්, හේ ද එය විසඳ යි, අසනුවන් සිත් ද ගනී, ඔහු බස් ඇසියැ යුතු කොට අන්හු සිතත්, එය අසා පැහැදෙත්, එහෙත් පැහැදුණු සැටියක් නො දක්වත් යි ද ...... '

'මහණ ගොයුම් සීනාද කෙරෙයි, පිරිස්හි ද එය කෙරෙයි, අබිරැ ච ද එය කෙරෙයි, අන්හු ඔහු ගෙන් පැණ ද විචාරත්, හේ ද එය විසඳ යි, අසනුවන් සිත් ද ගනී, අන්හු ඔහු බස් ඇසියැ යුතු යි සිතත්, අසා ද පැහැදෙත්, පැහැදුණු සැටිය ද දක්වත්, එහෙත් එය අනුව පිළිවෙතැ නො යෙදෙත් යි ද......'

'මහණ ගොයුම් සීනාද කෙරෙයි, පිරිස්හි ද එය කෙරෙයි, අබිරැ ච ද එය කෙරෙයි, අන්හු ඔහු ගෙන් පැණ ද අසත්, හේ ද එය විසඳයි, අසනුවන් සිත් ද ගනී, අන්හු ඔහු බස් ඇසියැ යුතු යි සිතත්, අසා ද පැහැදෙත්, පැහැදුණු සැටිය ද දක්වත්, එය අනුව පිළිවෙත්හි ද යෙදෙත් යි ද.........'

12. 'මහණ ගොයුම් සීනාද කෙරෙයි, පිරිස්හි ද එය කෙරෙයි, අබිරැ ච ද එය කෙරෙයි, අන්හු ඔහු ගෙන් පැණ ද අසත්, හේ ද එය විසඳයි, අසනුවන් සිත් ද ගනී, අන්හු ඔහු බස් ඇසියැ යුතු යි සිතත්, අසා ද පහදිත්, පැහැදුණු අයුරැ ද දක්වත්, එහි පිළිපදිත්, එහෙත් එය සපුරාලන්නට, ඒ පිළිවෙතින් මහණ ගොයුම්හු සිත් ගන්නට නො හැකි වෙත් යැ' යි ද අන් තොටු පිරිවැජ්ජන් කියනු ඇත. ඔවුනට 'මහණ ගොයුම් සීනාද කෙරෙයි,[169] පිරිස්හි ද එය කෙරෙයි, අබිරැ ච ද එය කෙරෙයි, අන්හු ඔහු ගෙන් පැණ ද අසත්, හේ ද එය විසඳයි, අසනුවන් සිත් ද ගනී, අන්හු ඔහු බස් ඇසියැ යුතු යි සිතත්, අසා ද පහදිත්, පැහැදුණු අයුරැ ද දක්වත්, එය අනුව ද පිළිපදිත්, එය සපුරා මහණ ගොයුම්හු සිත් ගන්නට ද හැකි වෙත් යැ යි ද කියැ යුතු.

කස්බ, වරෙක රජගහ පුරැ ගිජ්ජකුළෙහි දී නුග[170] නම් වූ තවබඹසැරියෙක්[171] අධිජෙගුච්ඡය ගැන පැණයක් මා විචාළේ ය. මම එය විසැඳීමි. එයසා හේ ඉතා සතුටු විය.[172]

---

169. සිංහනාද එක්සියදසයෙකි. උපග්‍රන්ථය බලනු. 170. නිග්‍රොධ. 171. තපෝබ්‍රහ්මචාරියෙක් = මහ තපස් පුරන තවුසෙක්. 172. මේ පැණ පිළිවිසුම් පවත මතු උදුම්බරිකාසීහනාද සූතුරැ එයි

13. කසුප් – වහන්ස, කවරෙක් නම් ඔබ දහම් අසා සතුටු නො වන්නේ ද? වහන්ස, මම් ද ඔබ දෙස්ම අසා මහත් සේ සතුටු වීමි. වහන්ස, ඔබ දෙස්ම ඉතා මැනැව, මූහුණින් නමා තුබුණක් උඩුකුරු කරන්නා සේ, වැසුණු දැයක් වසුන් හැර දක්වන්නා සේ, මං මුළාවූවකුහට මඟ දක්වන්නා සේ, ඇසැතියනට දක්නැ හැකි වනුවට අඳුරැ පහනක් දරන්නා සේ, නොයෙක් කරුණු දක්වා දහම් පැවසිණ. එසැසු මම් ඔබ ද දහම් ද සඟන ද සරණ යෙමි. වහන්ස, ඔබ වෙත පැවිද්ද හා උපසපුව ලබනු රිසියෙමි.

බුදුරජුහු – කස්බ, මෙ සස්නැ මහණ වනු රිසි, පෙරැ අන්තොටු වූයේ සිවු මසක් පිරිවෙස්[173] වෙසේ. සිවු මස ගෙවුණ කලැ ඔහු ගේ පැවැත්මෙහි පහන් වූ මහණහු ඔහු පැවිදි කරත්, උප-සපත් ද කරත්. (එහෙත් මෙ කරුණෙහි ඒ ඒ තැනැත්තහු පිළිබඳ වෙසෙස (මොහුට එය ඇවැසි නො වේයැ යි) මා විසින් දන්නා ලදි.

14. කසුප් – වහන්ස, එසේ නම් මම් සිවු මසක් පිරිවෙස වසන්නෙමි. ඉන් පසු වහන්දූ මා පැවිදි උපසපත් කෙරෙත් වා.

---

173. අන්තොටු සස්නෙකැ පැවිදි වැ හුන්නක්හු බුදුසස්නැ උපසපුව ලබනු රිසි නම් හෙරණ වැ සිවු මසක් පිරිවෙස් විසියැ යුතු. මෙහි පිරිවෙස් යනු වත් අටක් පුරනු ය. වත්පිළිවෙත් කරන වේලේ ගම් නො වදිනු, ගම් වන්නහු දහවල් තෙක් කල් නො යවනු, වේසියන් වසන තැන් ඈ අගෝචර තැනට නො යනු, සබ්රම්සරුන් ගේ කටයුතු අසා නො දක එය කැරැ දීමෙහි අලස නො වනු, උද්දෙසපරිපුච්ඡාහි දැඩි රිසි ඇති වනු, තමා හැරැ දුම්ම තොටු ගෙණෙහි ඇති දෙස් කියනු අසා නො කිපෙනු, තෙරුවන් ගුණ කියන අසා සතුටු වනු, තමා හළ තොටුගෙණෙහි ඇති දෙස් කියනුයෙහි මැලි නො වනු, තෙරුවන් ගුණ කියනුයෙහි නොමැලි වනු යනු ඒ අට වත් ය. මේ වත් අට ම නොබිඳ සිවු මසක් රැක්කහුට උපසපුව ලැබෙයි. මේ වත් රැක්වීම ඔහු විමසනුවට ය. මෙයින් එක් වතකුදු බින්ද හොත් එද සිට යළි දු සාර මසක් පිරිවෙස රැක්ක යුතු පිරිවෙස් පුරන සමයෙහි ධ්‍යාන පංචාභිඥ ලද ද, උපසපත් නො කළ යුතු. සෝවාන් වී නම් පියෙවියෙන් ම පිරිවෙසින් මිදෙ යි. උපසපුව දියැ යුතු.

කසුප් පිරිවැජි නොවක් නිසා, පැවිද්දෙහි දැඩි ලැදි නිසා දුටු බුදුරජ්ජුහු 'මොහුට පිරිවෙසෙක් ඇවැයි නොවෙයි' වදාළහ. හේ බුදුරජුන් වෙත පැවිද්ද හා උපසපුව ලද. කෙලෙස තවන වැර ඇති ව මහණදම් පුරන කසුප් තෙමේ නොබෝ කල්හි ම සියල් කෙලෙස් නසා රහත් විය.

[මෙහි අන්තොටුවන් ගේ තවුස් දහම් ද, බුදුසස්නෑ තපස ද, බුදුරජුන් ගේ සීනද එක්සියදසයෙක් ද, අචේලකස්සපයා සසුන් ගත වනු ද දැක්විණ.]

---

9. පොට්ඨපාද සූත්‍රය.

1. එක් සමයෙක බගවත් බුදුරජ්ජුහු සැවැත්පුරට නොදුරැ දෙව්රම් වෙහෙරැ වැඩ වෙසෙති. එ සමයෙහි පොටුපා (පොට්ඨපාද)[174] නම් පිරිවැජියෙක් මහ පිරිවැජිමුළුවකට ගුරු වැ **සමයප්‍රවාදක** නම් වූ මලලිකාව ගේ අරමැ [175]වෙසෙයි.

2. එ සමයෙහි දිනෙක පෙරවරුයෙහි බුදුරජ්ජුහු පිඬුපිණිස සැවැත්නුවරට පිවිස්නාහු, තව ම කල් ඇති බැවින් යටකී පිරිවැජි අරමට වැඩියහ. එ වේලෙහි පොටුපා තෙම පිරිවැජි-පිරිස හා නන්වැදෑරුම් තිරිසන් කතාහි යෙදී හුන්නේ, ඈත වඩනා බුදුරජුන් දිටී. දැක කලබොල වැ "නිහඬ වෙත් වා, හඬ නො නඟත් වා, තෙල මහණගොයුම්හු වඩිති, ඔබ නිහැඬියාව රුස්නෝ ය, නිහැඬියායෙහි ගුණ කියන්නෝ ය, අප නිහඬ වැ ඉන්නවුන් දැන, අප කරා වඩනට සිතුහු නම් මැනැවැ"[176]යි සිය පිරිවැජි පිරිස නිහඬ කෙළේ ය. බුදුරජ්ජුහු ද

---

174 පොට්ඨපාද – ප්‍රෝෂ්ඨපද (පුවුපා) නැකැතින් උපන්නේ ප්‍රෝෂ්ඨපාද නම් වෙයි. 175. මල්ලිකා යනු පසේනදිරජ්ජුහු අග් බිසෝ ය. ඇය උයන මල්ලිකාරාම නම. නොයෙක් ආගම් අදහන මහණ බමුණෝ, එහි රැස් වැ තම තමන් සමය ඇරැබැ කතාබහ (සාකච්ඡා) කෙරෙති. එහෙයින් එය සමයප්‍රවාදක නම් විය. 176 බුදුරජුන් හෝ බුදුසව්වන් තම අරමට ඊම තමාට නම්බුවක් කොට පිරිවැජියෝ සැලැකූහ. අද මහණගොයුම්හු, අද සැරියුත්හු, අද මහණගොයුමාණන් අසෝ අතවැසිහු අප වෙත් ආහ ඔබ අන් තෙනක නො යෙති. අප වෙත්ම එති. බලවු අපට ඔවුන් සලකන සැටියි තමන් උසස් බව සිය උවසුවනට කියති බුදුරජුන්ගේ උවසුවන් දැක තොප සරණු අද අප අරමට ආහ. ඔබත් අපිත් සමග ව ඉදුම්හ. එහෙත් තෙපි අප දක්නට ද සතුටු නො වූහු. අප කළ වරද කිමැ?'යි කියත්. එයසා ඇතැම් බොදු උවසුවෝ උනට ද සලකති. එහෙයින් බුදුරජුන් එහි වඩිනු ඔහු රිසියෙති.

පිරිවැජි අරමට වැඩවදළහ. පොට්ඨපා තෙම නැගී ඉදිරියට ගියේ ය. බුදුරජුන් පිළිගෙන ඇතුළට වැඩම කරවා අස්නක් පිළිගැන්වී ය. බුදුරජුහු එහි වැඩහුන්හ. පොට්ඨපා ද මිටි අස්නක් ගෙන පසෙක ඉඳගත. ඉක්බිති ඔබ දෙදෙනා අතරැ පහත දැක්වෙන පරිදි වූ කතාබහෙක් විය:

3. **බුදුරජුහු** – පොට්ඨපාවෙනි, දැන් තෙපි කවර කතාවෙකින් හුන්නහු ද? තොප කිනම් කතාවෙක් අඩාළ වී ද?

පොට්ඨපා – වහන්ස, අප අතුරැ පැවැති කතාව පසෙකැ තැබේ වා. එය පසු වැ වුව ද අසනු හැක්ක. දැන් දැනැගන්නට ඇවැසි කරුණෙක් ඇත. එය ඔබ විචාරමි. වහන්ස, ගිය දවසෙක, කුහුල්හලැ[177] මුළු දෙවුණු නන් තොටු මහණ බමුණන් අතරැ සැණින් සැණේ වන සිතැ නැස්ම ඇරැබැ කතාවෙක්[178] උපන සිත හෙයක් (හේතුවක්) පසයක් (ප්‍රත්‍යයක්) නැති ව ඉබේ ම උපදී යැ යි, ඉබේ ම නැසේ යැ' යි එකෙක් කී ය.[179] 'සිත උපදනා කලැ සංඥි වේ, නැසුණු කලැ විසංඥ වේ[180] යැ යි එකෙක් කී ය.

'සංඥුව ආත්ම යැ, එය පහළ වූ කලැ සංඥි වේ. එය ඉවත් වූ කලැ අසංඥි වේ' යැ යි එකෙක් කී ය.[181]

---

177. නොයෙක් මහණ බමුණන් රැස් වැ නන්වැදෑරුම් කතා පවත්වන තැන කුහුල්හල (කුතුහලශාලා) නම් 'දැන් මෙ තෙම කුමක් කියා ද?'යි කුහුල උපදවන තැන ය. මෙ නමින් වෙසෙසි හලෙක් නැත. මෙබඳු කතා පැවැත්වෙන කවර තැනක් වුව ද කුහුල්හලැ යි හැඳින්වේ. 178. බුදුරජුන් පෙර දුහි නොරතුරු වදරනු ඇසූ තොටුවෝ අපි ද පෙර දූ පවත් කියනු හැක්කම්හ යි අතීත ජාතියෙකැ පවතැ යි කිසි කතාවක් කියත්. බුදුරජුන් සව්වනට සිකපද පණවතැ යි ඇසූ අන්තොටුවෝ තුමූ ද සිය සව්වනට සිකපද පණවති. බුදුරජුන් නිරෝධකථාව වදරතැ යි. ඇසූ ඔහු සංඥානිරෝධය ගැන ද කතාබහ කළහ. 179. සිත නැති බඹලොවෙන් සැව මෙහි ඉපිද දහන් වඩා පෙර දූ දක්නෝ ද, විමැසුම් නුවණින් සලකන්නෝ ද, හේතුවක් ප්‍රත්‍යයක් නැති ව ඉබේ සිත උපදි. නැ යි නැසෙනැ යි දිව්ගනිත්. මිගසිංහ තවුසා සක්දෙවිඳු එවූ අලම්බුසා දෙවඟන ගේ අත ගත. දිවපහස ලත් හේ විසංඥ වැ තුන් වසෙකින් පසු සංඥුව ලද. එය සංඥානිරෝධයෙන් නැඟී සිටීමෙකැ යි සිතා හේ මෙසේ කිව. 181. ආථර්වණිකයෝ ඉන්ද්‍රජාලමන්ත්‍රබලයෙන් පණ ඇත්තකු මළ එකකු හෝ හිස්සුන් එකකු සේ කොට දක්වති. යළි ඔහු පියෙවියෙන් සිටිනු. දුක 'සංඥානිරෝධයෙන් නැඟිසිටියේ වතැ' යි සලකා මෙසේ කියත්.

‘ලොංවැ මහතෙදනි මහ ඉදුමත් මහණබමුණෝ ඇත. සතුන් තුළට සිත හෙලන්නෝ ද සතුන් කෙරෙන් සිත ඉවතට ඇද ලන්නෝ ද ඔහු ය. ඔවුන් යමක්හු තුළ සිත හෙළූ කලැ හේ සංඥි වේ. ඔහු ගෙන් සිත ඉවතට ඇද ලූ කලැ අසංඥී වේ’’ යැ යි එකෙක් කි ය. ‘සිත පිවිස්වීමත් ඉවත් කිරීමත් මහ තෙදනි දෙවියන් කරන දෑයෙකැ’යි එකෙක් කී ය.

වහන්ස, මේ දහම් අතේ සුනිපුණ වූ පින්වත් සුගතයන් වහන්සේ මේ වේලැවට මෙහි ඉන්නා සේක් නම්!’යි එහි උන් මම ඔබ සිහි කෙළෙමි. වහන්ස, බගවතුන් වහන්සේ සිත නිරුඬ වන සැටි දන්නා සේක. වහන්ස, වදාළ මැනැව. සිත කෙසේ නිරුඬ වෙයි ද?

4. **බුදුරජුහු** – පොටුපාව, ‘හේතුප්‍රත්‍යය නැති ව ඉබේ ම සිත ඉපැත්මත් නැස්මත් වෙයි’ කිවහුට මුල ම වැරැදිණ. සිත හේතුයෙන් ප්‍රත්‍යයෙන් ම උපදනා බැවිනි. සික වැඩුමෙන් (ශික්ෂායෙන්) ඇතැම් සංඥවෝ පහළ වෙත්, ඇතැම්හු නිරුඬ වෙත්. ඒ ශික්ෂා කවර යැ? සස්නැ පැවිදි වැ සුළුසිල් මැදුම්සිල් මහසිල් පුරා පළමු දහන් වඩන්නහුට ඒ පළමු දෑහැනින් යුත් සංඥව පහළ වේ. එයට පළමු උපදනා සුලූ ව පැවැති කාමසංඥව නිරුඬ වේ. මේ එක් සිකෙකි (ශික්ෂාවෙකි.)[182]

යළි දෙතේ දහන් පිණිස කමටහන් වැඩූ කලැ දෙවෙනි දහන් පහළ වන එය හා යෙදුණු සන (සංඥව) උපදී. පළමු දහන්සන (ප්‍රථමධ්‍යාන සංඥව) නිරුඬ වෙයි. මේ දෙවෙනි දහන් වඩනු ද එක් සිකෙකි.

යළි දූ කමටහන් වඩන හේ තෙවෙනි දහන ලබයි. එයින් ඔහුට තෙවෙනි දහන්-සුව-සන (තෘතීයධ්‍යානසුඛසංඥව) උපදී. කල දී ලබා තුබුණු දෙවෙනි දහන්-සුව-සන (විතීයධ්‍යානසුඛ සංඥව) නිරුඬ වේ. මේ තෙවෙනි දහන් වඩනු ද එක් සිකෙකි.

182. පළමු ඉපිදෙමින් පැවැති කාමසංඥව දහන් සමවත් කලැ නො උපදී. මේ විවේකජ පීතිසුඛ නැමැති සියුම් සංඥව ය. සික යනු පුහුණු කිරීම ය. දහන් සමවදිනුයේ මෙතෙක් කල් සමවැද ඉඳිමි ආදින් ඉටනුයේ රිසි විටෙක නැඟී සිටින්නේ හික්මෙයි, මේ ඈ විසින් වශිතා පුරුදු කරනු මෙහි සික (ශික්ෂා) නමි.

නැවත ද කමටහන් වඩන හේ සිවුවන දහන ලබයි එයින් ඔහුට සිවුවන දහන්-සුව-සත් (චතුර්ථධ්‍යානසුඛසංඥව) උපදී. තෙවෙනි දහන්-සුව-සත් නිරුඬ වේ. මේ ද එක් ධ්‍යානසංඥවක් උපදවන අන් ධ්‍යානසංඥවක් නිරුඬ කරන සිකෙකි.

මෙයට පසු අරූදහන් වඩා ආකාසානංචායතන දහන් ලැබ ගත් කලැ හැම ලෙසින් රූපසංඥ නිරුඬ වේ. රූපසංඥවට වඩා සියුම් වූ ආකාසානඤ්චායතන දහන හා යෙදුණු පළමු අරූ-සත් (ප්‍රථමාරූප්‍යසංඥව) පහළ වේ. මේ ද එක් සංඥවක් නිරුඬ කරන තවෙකක් පහළ කරන සිකෙකි.

තව ද දහන් වඩන හේ විඤ්ඤණඤ්චායතන දහන් ලබයි. එයින් ඒ දහන් හා එක් ව ගිය සංඥව පහළ වනු ද, එයට වඩා දළ වූ ආකාසානඤ්චායතන සංඥව ගේ නිරෝධය ද වේ. මෙ සේ මේ දෙවෙනි අරූ දහන් වඩනු ද එක් සිකෙකි.

හේ තව ද දහන් වඩා සංඥග්‍රය[183] (ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය) ලබයි. එයින් ඔහු ගේ විඤ්ඤනඤ්චායතන සංඥව නිරුඬ වේ. ආකිඤ්චඤ්ඤායතන සංඥව පහළ වේ. මෙසේ මේ තෙවෙනි අරූ දහන ද එක් ධ්‍යානසංඥවක් නිරුඬ කරන තව ධ්‍යානසංඥවක් උපදවන සිකෙකි.

ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය ලත් මහණ තෙම 'නොසිතිම මැනැවැ'යි ද, සිතුවොත් ආකිඤ්චඤ්ඤායතන සංඥව නිරුඬ වූ පසු අන් දළ සංඥවක් පහළ වියැ හැකි යැ යි ද දැන, දහන් නො සමවදී, මතු සමවත් සමවදින රිසියක් ද නො කෙරෙයි. එසේ වූ ඔහු ගේ ආකිඤ්චඤ්ඤායතන සංඥව ද නිරුඬ වේ. අන් ඖදරික (දළ) සංඥවෙක් ද පහළ නො වේ. මෙසේ එ මහණ නිරෝධය ස්පර්ශ කෙරෙයි, අචිත්තක වෙයි. සංඥව පිළිවෙළින් නිරුඬ කරනුයේ මේ කී සැටියෙනි.

පොට්ඨපාවනි, සංඥව නිරුඬ කරන මේ පිළිවෙළ තොප මෙයින් පෙර ඇසුවා ඇද්ද?

5. **පොට්ඨපා** - නැත, වහන්ස. එහෙත් දැන් බගවතුන් වහන්සේ වදාළ බසසා මෙය දැනගනිමි.

---

183. ලොවී සමවත්හට අක් බැවින් මේ සංඥග්‍ර නම. නෛවසංඥ-නාසංඥායතනයට ද නිරෝධ සමාපත්තියට ද සමවදිනුයේ මෙහි සිට යැ.

බුදුරජුහු – එසේ ය, පොට්ඨපාවනි, මේ කී පරිදි වූ අනුපුබ්බ සත් නිරෝද (අනුපුබ්බිසංඥා නිරෝධය – පිළිවෙළින් සංඥාව ගේ නිරෝධය) වේ.

පොටුපා – වහන්ස, බගවතුන් වහන්සේ එක් සනගක් (සංඥාග්‍රයක්) ම පණවන සේක් ද? නැත හොත් බොහෝ සනග (සංඥාග්‍ර) පණවන[184] සේක් ද?

බුදුරජුහු – යම් යම් කසිණයෙකින් හෝ දහනෙකින් පළමු සත්හු (සංඥාවගේ) නිරෝද පහසී (ස්පර්ශී කෙරේ) නම්, ඒ ඒ කසිණයෙන් හෝ දැහැනින් සනග (සංඥාග්‍රය) පණවමි. මෙසේ සනග (සංඥාග්‍ර) එකකුත් බොහෝවකුත් පණවමි.

පොටුපා – නිරෝදෙන් නැඟී සිටුනා මහණහට පළමුයෙන් පහළ වනුයේ සත් (සංඥාව) ද? නැත හොත් සත් නැණ (සංඥා හා ඥාන) දෙක ම එක් පැහැරැ පහළ වේ ද?

බුදුරජුහු – රහත්පල-සත් (අර්හත්ඵලසංඥාව) පළමු උපදී. පස්විකුම් නුවණ පසු ව උපදී. සත් ඉපැද්මෙන් (සංඥෝත්පාදයෙන්) පසු නුවණ උපදී.

6. **පොටුපා** – වහන්ස, සංඥාව ආතමය ද? නැත හොත් සංඥාවත් ආත්මයත් වෙන වෙන දෙකෙක් ද?

බුදුරජුහු – 'ආත්ම' යන්නෙන් තෙපි කුමක් සලකවු ද?

පොටුපා – දැඩි වූ, සතර මහාභූතයන් ගෙන් උපන් රූපයක් ඇති, දළ අහර (කබලීකාර ආහාරය) බුදින්නක්හු 'ආත්මයැ' යි සලකමි.

බුදුරජුහු – 'ආත්ම' යන්නෙන් එබන්දකු ගත හොත් සංඥාවත් ඒ ආත්මයත් දෙදෙනෙකි, එකෙක් නො වේ. අන් අන් සංඥාවෝ උපදනාහ. මුලින් මුලින් වූ සංඥාවෝ නිරුඬ වෙති. මෙයින් සංඥාව ආත්මය නො වේ යැ යි සලකා ගත හැක්ක.

---

184. සංඥාග්‍ර = පඨවිකසිණ සමාපත්තියට සමවදනේ ඉන් පළමු තුබුණු සංඥාව නිරුද්ධ කෙරෙයි. මේ එක් සංඥාග්‍රයෙකි මෙසේ ලක්ෂයක් වාර නමුදු සමවදනේ පළමු පළමු තුබුණු සංඥා නිරුඬ කෙරෙයි. ලක්ෂයක් සංඥාග්‍ර ලබයි. සංඥාව ම අග්‍ර වූයේ සංඥාග්‍ර නම් පළමු පළමු සංඥාවට වඩා උසස් උසස් වූ පසු පසු ව ලත් සංඥා පළමු ලත් සංඥාවකට අග්‍ර ය හෙවත් පළමු සංඥාවන් ගේ මුදුන ය.

පොට්ඨපා – වහන්ස, හැම අඟ පසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති, මනෝමය ධර්මයක් (දහන් සිතින් රූ ලොවැ පහළ වූ සිරුර)[185] ආත්ම යැ යි සලකමි.

බුදුරජුහු – එසේ සැලැකූවත් ආත්මයත් සංඥවත් එකෙක් නො වෙති. කවර හෙයින? ඔහුට අන් සංඥවෝ ම උපදිත්, අන් සංඥවෝ නිරුඬ වෙත්. මෙසේ කලැ සංඥව එකෙක, ආත්මය වෙන එකෙකැ යි ගතයුතු වෙයි.

පොට්ඨපා – වහන්ස, ආත්ම යනු සංඥමය වූ අරූපි වූ දැයක් වශයෙන් සලකමි.

බුදුරජුහු – පොට්ඨපාවනි, ආත්මය සංඥමය අරූපි ධර්මයක් වතොත් එසේ ඇති කල්හි ද, සංඥව අනෙකෙකුත් ආත්මය වෙන එකෙකුත් වේ.

7. **පොට්ඨපා** – වහන්ස, සංඥව පුරුෂයාගේ ආත්මය ද? නොහොත් සංඥව එකෙකුත් ආත්මය අනෙකෙකුත් වේ දැ යි දත හැකි ද?

බුදුරජුහු - පොට්ඨපාවනි, අන් දිට්ඨිගත් තොප විසින් එය දත නො හැක්ක.

පොට්ඨපා – වහන්ස, එසේ නම් 'ලෝකය (ආත්මය) ශාශ්වත ය' යන මේ මතය සබා ද? සෙසු මත හිස් ද?[185]

බුදුරජුහු – පොට්ඨපාවනි, ලෝකය (ආත්මය) ශාශ්වත යැ යි මම නොපැණැවිමි.

පොට්ඨපා - වහන්ස, එසේ නම් ලෝකය (ආත්මය) අශාශ්වත ද?

බුදුරජුහු – පොට්ඨපාවනි, එසේත් මගේ පැණවීමෙක් නැත.

පොට්ඨපා – වහන්ස, ලොව (ආත්මය) අනතවත් ද?

බුදුරජුහු – පොට්ඨපාවනි, මම එසේ නො පැණැවීමි.

---

185. මෙ තෙම ආත්මය අරූපි යි ලබ්ධි ගත්තෙකි. හෙ තෙම බුදුරජුන් වදළ වචන අසැත් ආත්මදෘෂ්ටියට ම බැස ආත්මය ගැන කතාවට බටුයේ ය.

පොට්ඨපා – වහන්ස, ලොව (ආත්මය) අනන්ත ද?

බුදුරජුහු – එසේත් නො පැණැවීමි.

පොට්ඨපා – වහන්ස, ජීවයත් ශරීරයත් එකෙක් ද?

බුදුරජුහු – පොට්ඨපාවනි, ජීවයත් ශරීරයත් එකෙකැ යි මම් නො පැණැවීමි.

පොට්ඨපා – එසේ නම් ඒ වෙන වෙන දෙකෙක් ද?

බුදුරජුහු – එසේත් මගේ පැණැවීමෙක් නැත.

පොට්ඨපා – වහන්ස, තථාගත තෙම (ආත්මය) මරණින් මතු වෙයි ද?

බුදුරජුහු – ආත්මය මරණින් මත්තෙහි වෙතැ යි මම් නො කීමි.

8. **පොට්ඨපා** – එසේ නම් එය මරණින් මත්තෙහි නො වන්නේ ද?

බුදුරජුහු – එසේත් මම් නො පැණැවීමි.

පොට්ඨපා – වහන්ස, ආත්මය මරණින් මත්තෙහි වන්නේත් නො වන්නේත් වෙයි ද?

බුදුරජුහු – එසේත් මා කියා නැත.

පොට්ඨපා – වහන්ස, ආත්මය මරණින් මතු නො ම වන්නේත් නො ම නො වන්නේත් වේ ද?

බුදුරජුහු – පොට්ඨපාවනි, එසේත් මම් නො කීමි.[186]

පොට්ඨපා – වහන්ස, කවර හෙයින් බගවතුන් වහන්සේ මේ එකකුත් නො වදාළ සේක් ද?

බුදුරජුහු – පොට්ඨපාවනි, 'ලොව ශාශ්වත ය' යන ආදි වූ මේ දිට්හු දෙලෝවැඩ පිණිස හෝ අත්වැඩ පරවැඩ පිණිස හෝ නො පවතී, ලොවුතුරු දහම් අසළේ (අසුරු කළේ) ද නො වෙයි. සසුන් බඹසරැ මුල වූ අදිසිල් පමණෙකුත් නො වේ. සසරැ කලකිරෙනු පිණිස නිවන් පසක් කරනු පිණිස නොපවතී. එ හෙයින් මම් එය නොපැවැසීමි.

---

186. මේ අව්‍යාකෘත (බුදුරජුන් නොවදාළ දෑ) දසය යි.

පොට්ඨපාවනි, 'දුක් නම් මේ යැ, දුක්සමුදය (දුකට කරුණ) මේ යැ, දුක්නිරොද නම් මේ යැ, දුක්නිරෝදට පිළිවෙත නම් මේ යැ' යි මා විසින් පැවැසිණ.

9. **පොටුපා** – වහන්ස, කවර හෙයින් මේ දූ වදළ සේක් ද?

බුදුරජුහු – පොටුපාවනි, මේ දෙලෝ වැඩ ද අත්වැඩ පරවැඩ ද අසළේ (ඇසුරු කෙළේ) වෙයි. මේ ම ලොවුතුරු දහම් අසළේ වෙයි. මෙය දූත්ම ම සසුන්බඹසරට මුල් වූ අදිසිල්සික වඩනු පිණිස, පවතී. මේ ම සසර කලකිරෙනු පිණිස, සසර නො ඇලෙනු පිණිස, දුක් නසනු පිණිස, දුක් සංහිඳුවනු පිණිස, දුක් පසක් කරනු පිණිස, සසරවට් දැනැගනු පිණිස අමා මහ නිවන් පසක් කරනු පිණිස පවති. එහෙයින් මෙය ම මා විසින් පැවැසිණි.

පොටුපා – එසේ ය, බගවතුන් වහන්ස, එසේ ය, සුගතයන් වහන්ස.

ඉක්බිති බුදුරජුහු හුනස්නෙන් නැඟී පිඹු පිණිස වැඩි සේක.

එයින් පසු එහි වූ පිරිවැජියෝ බුදුරජුන් වදළ බසටත් ඒ 'එසේ යැ' යි පොටුපාවන් එය පිළිගත් තියාවටත් දෙස් නගන්නාහු,

"ලෝකය (ආත්මය) ශාශ්වතයැ යි හෝ,
ලෝකය අශාශ්වතයැ යි හෝ,
ලෝකය අන්තවත් යැ යි හෝ,
ලෝකය අනන්තයැ යි හෝ,
ජීවයත් ශරීරයත් එකැ යි හෝ,
ජීවයත් ශරීරයත් දෙකෙකැ යි හෝ,
ආත්මය මරණින් මත්තෙහි වෙතැ යි හෝ,
ආත්මය මරණින් මත්තෙහි නො වෙතැ යි හෝ,
ආත්මය මරණින් මත්තෙහි වත්නේත් නොවත්නේත් වෙතැ යි හෝ,
ආත්මය මරණින් මත්තෙහි නො ම වත්නේත් නො ම නො වත්නේත් වෙතැ යි හෝ,

ඒකාන්ත කොට මහණ ගොයුමන් කියූ කිසිවක් අපි නො දනුම්හ. එහෙත් පොට්ඨපාවෝ ඔබ කියූ හැම බස ම 'එසේ යැ, එසේ යැ,' යි පිළිගත්තාහු යැ'' යි ඇනුම් බැණුම් කළහ. එවිට පොට්ඨපා තෙම 'පින්වත් ගොයුමාණන් වහන්සේ ලොවුතුරු දහම් ලබන සැබෑ පිළිවෙතක් ම වදාරන සේක. එසේ වූ උන්වහන්සේ ගේ සුභාෂිත වචන සුභාෂිත සේ සිහිනුවණැතියෙක් කෙසේ නම් නො පිළිගත හෙයි දැ?' යි උනට පිළිතුරු දුන.

කිහිප දිනෙකින් පසු පොට්ඨපා තෙම ඇත්ගොච්චක්හු පුත් **සිත්** (චිත්‍ර)[187] නම් මණෝච්චක්හු කැටුවැ බුදුරජුන් දක්නට ආයේ ය. අවුත් පිළිසඳර කතා නිමවා, පසෙක හිඳ, එදා පිරිවැජිපිරිස තමාට දෙස් නැඟූ පවත් සැළ කෙළේ ය.

10. **බුදුරජුහු** - පොට්ඨපාවනි, ඒ සියලු පිරිවැජියෝ අඳබල්හු ය, ඇස් නැත්තෝ ය. උත් අතුරෙහි ඇස් ඇති එක් ම තැනැත්තහු තෙපි ය. පොට්ඨපාවනි, මා විසින් ඒකාන්ත කොට දෙසන ලද දහම් ඇත. ඒකාන්ත කොට නොදෙසූ දහම් ඇත. 'ලෝකය ශාශ්වත යැ යි, හෝ අශාශ්වත යැ යි හෝ, ලෝකය අනතවත් යැ යි හෝ අනනත යැ යි හෝ, ජීව ශරීර දෙක එකෙකැ යි කියා හෝ වෙන වෙන දෙකෙකැ යි හෝ, ජීවය මරණින් පසු උපදී යි හෝ, නො උපදීයැ යි හෝ, උපදනේත් නො උපදනේත් වේ යැ යි හෝ, නො ම උපදනේත් නො ම නො උපදනේත් වේ යැ යි හෝ මා විසින් ඒකාන්ත කොට නො කියන ලදි. එයින් වන වැඩක් නැති බැවිනි, එසේ දෙසන දහම නෛර්‍යාණික නො වන බැවිනි. මා විසින් ඒකාන්ත කොට දෙසූණු දහම් : දුක් මේ යැ, දුක් සමුදය මේ යැ, දුක්නිරොද මේ යැ, දුක්නිරොදට මඟ මේ යැ' යනු යි. මේ සතර දහම් ම ඒකාන්ත කොට මා විසින් දෙසිණ. එය අරුත් අසල දහම් අසල බැවිනි, නිවන් පිණිස පවත්නා බැවිනි.

187. **සිත් (චිත්‍ර) තෙම බුදුසස්නැ පැවැදි ව ඉඳ සත් වරක් සිවුරු හළෙයෙකි පොට්ඨපා තෙම සත් වන වරට ද ඔහු සිවුරු හැරියහු දැක, 'ඔබ කළ පස් නො යෙදෙ යි' ඔවා දී යළි ද පැවිදි කරවනු පිණිස ඔහු බුදුරජුන් වෙත ගෙනායේ ය.**

පොට්ඨපාදය, 'ආත්මය මරණින් මත්තෙහි ඒකාන්තයෙන් සුවපත් වන්නේ යැ' යි දිට්ඨි ගත් ඇතැම් මහණ බමුණෝ ඇත. ඔවුන් 'එසේ දිට්ඨි ගත්තා සැබෑ දැ?' යි මම් විචාරමි. 'එසේයැ' යි ඔහු පිළිතුරු දෙති. ඒ ඒකාන්ත සුඛිත වූ ලෝකය (ආත්මය) ඇති දෙස (පැත්ත) දනිවු දැ? යි විචාරමි. නො දනුම්හ' යි ඔහු කියත්. 'එක් රැයක් දවලක්, අඩ රැයක්, අඩ දවලක් හෝ ඒකාන්තයෙන් සුව පත් ව සිටුනා ආත්මයක් දනිවූ දැ?'' යි පුළුවුත් විට ද, 'නො දත්මහ' යි ඔහු කියත්. ඒකාන්ත සුව ඇති ලෝකයට යන මඟ (ඒකාන්ත සුඛි ආත්මය ලැබ ගන්නා උපාය) විචාළ විට ද 'එය නො දත්මහ' යි ඔහු කියත්. එසේ සුව ඇති ලොවෙක උපන් (ඒකාන්ත සුඛි ආත්මයක් අත් කැරගත්) කිසි දෙව් කෙනෙකුත් හෝ එය ගැන කී බසක් හෝ ඇසුහු දැ?'' යි පුළුවුත් කල්හි ද 'එසේ නො ඇසු මූ' යි ද ඔහු කියත්. මෙසේ කල්හි ඔවුන් ගේ කතාව පිළිපක්හු ගේ පැණයනට පිළිතුරු නොදී මඟ හැරීමෙක් නො වේ ද?''

පොට්ඨපා – එසේ ය, ඔවුන් බස පිළිතුරෙක් නො වේ, පිළිපක්හු බසට උත්තර නො වේ.

11\. **බුදුරජුහු** – පොට්ඨපාදය, උවමක් කියමි. කිසිවෙක් සිය පෙදෙසැ රූමත් ම වම්ය පතයි. අනෙකෙක් 'තෝ ඇය දනිහි දැ?' යි විචාරයි. 'නො දත්මි'යි හේ කියයි. 'තෝ තමා නොදුටු නොදත්නා වම්යක පතයි දැ යි අනෙකා පුළුවුසි. එසේ යැ' යි හේ කියයි. ඔහු ගේ කතාව පිළිමලුන් ගේ සකරුණු නිගාවට ගොදුරු වෙයි. මරණින් පසු ඒකාන්ත සුඛිත ආත්මයක් ලබන්නට පතන්නේ ද එකී තමා නොදුටු නොදත්නා වම්ය පතන්නහු වැන්න.

පොට්ඨපාදය, මිනිසෙක් 'පහයකට නඟිමි'යි සිවුමං හන්දියෙක මඟ හිණිමඟක් තනයි. එය දුටුවෝ තෝ මේ හිණිමඟින් නඟින පහය උස් එකෙක් ද? මිටි එකෙක් ද? එය කවර පැත්තෙක ඇත් දැ?'' යි අසත්. හේ 'ඒ කිසිත් නො දනිමි'යි කියයි. 'තමා නො දත්නා නො දක්නා පායකට නඟින්නට හිණිමඟක් සදයි දැ?' යි ඔවුන් ඇසූ විට, 'එසේ යැ' යි කියයි. මරණින් පසු ඒකාන්ත සුඛී ආත්මයක් පතන්නේ ද ඒ මිනිසා බඳුය. පොට්ඨපාදය, මේ අන්බව්

ලැබුම් තුනෙක. දළ (ඖදාරික) අත්බව ය, සිත්මුවා (ධ්‍යාන- මනසින් උපන්) අත්බව ය, අරූ අත්බව ය[188] යනු යැ. සතර මහාභූතයන් ගෙන් නිපන් දළ බොජුන් වළඳනසුලු වූයේ දළ අත්බව ය. අඟපසඟ ඇති නොපිරිහුණු ඉඳුරන් ඇති රූපවත් වූ, රූපධ්‍යානමනසින් උපන්නේ මනෝමය අත්බව ය. රූපයක් නැත්තේ, අරූපධ්‍යානසංඥයෙන් උපන්නේ අරූපී අත්බව ය. දුක් වූ මේ තුන් අත්බව් ලබනු වළක්වන, කෙලෙස් දුරු ලන, ශමථවිදර්ශනා ඥාන වඩාලන, මහපලනුවණ මෙ අත්බැවැ ම පසක් කරවන, පිළිපන්නහුට ප්‍රීතිය ද සතුට ද සිතැ නිවීම ද සිහිය ද උතුම් නුවණ ද සුව වුසුම ද ලබවන පිළිවෙත්මඟ මම් පෙන්වමි එ මඟින් පිළිපන්, මහපලනුවණ පසක් කොට වසන්නහු ගේ ඒ විසීම දුකැ යි තොපට සිතක් වියැ හැක්ක. එහෙත් මෙය එසේ නො දත යුතු. මෙ මඟින් පිළිපන්නහු ගේ කෙලෙස් පහ වෙයි. ශමථ විදර්ශනා වැඩෙයි. ප්‍රඥාව මුකුරයි. එයින් සුඛවිහරණය (සුව- විසීම) ද වෙයි. පොට්ඨපාවනි, මේ තුන් අත්බව් ලබනු වළක්වාලන මඟ මම් දෙසමි. අන්හු 'ඒ තුන් අත්බව් කවරු?'යි මා විචාරත් නම්, මම් නො වළහා උනට එය පවසමි. එවිට ඔහු විරුඬකථා නැති බවට නො පැමිණෙත් ද?

පොට්ඨපා – පැමිණෙති, වහන්ස.

12. **බුදුරජුහු** – පහයක් යට එයට නැඟෙනුවට හිණිමඟක් තනන්නහු දැක, එයින් ඔහු නැඟෙන්නට පතන පහයත් එය ඇති දෙසත් විචාරති. එවිට 'මේ ඒ පහයැ' යි ඔහු පෙන්වා නම්, ඔහු ගේ ඒ කතාවට 'එය සදොසැ'යි පිළිපක් වැ කතා කරන්නට ඉඩක් නැත්තේ නො වේ ද?

පොට්ඨපා – නැත, වහන්ස.

බුදුරජුහු – පොට්ඨපාවනි, තුන් අත්බව් ලබනු වළක්වනුවට දහම් දෙසමි. 'ඒ අත්බව්හු කවුරු ද?' යි අසන පැණයට 'ඒ මොහුයැ' යි කරුණු සහිත ව පවසමි. එසේ කලැ මා කී ඒ කතාවට පටහැණි වූ ඇසියැ හැකි කිසිත් පිළිමල්නට නැත්තේ නො වේ ද?

පොට්ඨපා – නැත, වහන්ස,

188. දළ අත්බව (ඖදාරික ආත්මභාවය) යනුයෙන් කාමභවය දැක්විණ. සිත්මුවා (මනෝමය) අත්බව යන්නෙන් රූපභවය ද, අරූ අත්බව (අරූපී ආත්මභාවය) යන්නෙන් අරූපභවය ද දැක්විණ.

මේ කතාව අසා හුන් සිත්හු (චිත්‍රයා) ද බුදුරජුන් ද අතර මී ලඟට මෙසේ කථාව විය:

චිත්‍ර – වහන්ස, දළ අත්බව ලදුවා හට සිත්මුවා අත්බවෙක් නො වේ. අරූ අත්බවෙක් ද නො වේ. දළ අත්බව ම ඇත. අන් අත් බව් දෙකින් එකක් ඇත්තහුට ද සෙසු අත්බව් දෙකෙන් එකෙකුත් නැත.

බුදුරජුහු – චිත්‍රයෙනි, දළ වූ හෝ සිත්මුවා හෝ අරූප වූ හෝ අත්බව් ඇති කලැ එකි එකි අත්බවක් ඇතැ යි වහරවත්. චිත්‍රයෙනි, 'පෙරැ වූයෙහි ද? අනාගි වත්නෙහි ද? 'දැන් වෙහි දැ?'යි විචාළොත් එය තෙපි කෙසේ විසඳන්නහු ද?

චිත්‍ර – වහන්ස, 'මම් පෙරත් වීමි, අනාගිත් වත්නෙමි, දැනුත් වෙමි' යි උත්තර දෙමි.

බුදුරජුහු – චිත්‍රයෙනි, තොප ගේ යම් පෙරැ අත්බවෙක් වී නම්, එය සත්‍ය නම්, අනාඅත්බවත් වත්මත් අත්බවත් හිස් ය. මතු අත්බවෙක් වත්නේ නම් එය ම සත්‍ය නම්, ඉයු වත්මත් අත්-බව්හු හිස් හ, අවිදුමන්හ. වත්මත් අත්බව සත්‍ය නම්, ඉයු අනා අත්බව්හු හිස් හ, අවිදු-මත්හ. මේ මෙසේ නො වේ දැ?'යි අත්හු තොප විචාරත් නම්, කෙසේ තෙපි උත්තර දෙන්නහු ද?

චිත්‍ර – වහන්ස, 'මගේ පෙරැ අත්බැවෙක් වී නම්, එය එ කල්හි ම විය. අනා අත්බැවෙක් වේ නම්, ඒ අනාගි ම ඇත. වත්මත් අත්බව වත්මත්හි ම ඇත. අන් කල්හි ඒ නැතැ' යි උත්තර දෙමි.

14. **බුදුරජුහු** – චිත්‍රයෙනි, එසේ ම දළ (ඖදාරික) අත්බව ඇති කලැ සිත්මුවා (ධ්‍යානමනෝමය) අත්බව හෝ අරූ අත්බව (අරූපී ආත්මභාවය) නැතැ යි ද, සිත්මුවා අත්බව ඇති කලැ සෙසු දළ වූ හෝ අරූපී වූ අත්බව් නැතැ යි ද, අරූ අත්බව් ඇති කලැ දළ වූ හෝ සිත්මුවා අත්බව් නැතැ යි ද, මේ එක එක අත්බවක් ඇති කල්හි එය පමණක් ඇතැ යි සෙස්ස නැතැ යි ද බැවහරය වේ.

චිත්‍රයෙනි, දෙන ගෙන් කිරි ද, කිරෙන් දිහි ද, දීයෙන් වෙඬරු ද, වෙඬරුයෙන් ගී ද, ගීයෙන් ගීමඬ ද වේ. එහි කිරි ඇති කලැ එයට දිහි වෙඬරු ගී ඈ වහර නො වේ. කිරි ඈ ඒ ඒ ඇති දූයේ ම නම බැවහර වේ. එසේ ම දළ අත්බව් ආංදීන් අතුරෙන් යම් එක් අත්බවක් ඇති කලැ මැ එය ඇතැ යි යෙත්. ඒ නැති කලැ ඇතැ යි වහරෙක් නැත. යම් සැටියක් බලා කිරි දිහි ඈ වහර වෙයි නම්, එය වෙනස් වන කලැ වහර ද වෙනස් වෙයි. මෙසේ ම යම් යම් සැටියක් බලා දළ අත්බව් ඈ වහරෙක් වෙයි නම්, ඒ සැටිය වෙනස් වන කලැ එහි වහර ද වෙනස් වෙයි. චිත්‍රයෙනි, මේ දළ අත්බව් ඈහු තථාගතයන් තෘෂ්ණා මාන දෘෂ්ටි විසින් පරාමර්ශන නැති වැ හුදු බස්වහර විසින් වහරවන, හුදෙක් ලොවැස්සා ගේ පැණැවුම් පමණෙක් ම ය, ලෝවැස්සා ගේ සම්මුති පමණෙක් ම ය.

15. **පොට්ඨපාද** – වහන්ස, දම් දෙසූ නියා මැනැව, ඉතා මැනැව. යැටිකුරු කොට තුබූවක් උඩුකුරු කරන්නක්හු සේ, වැසුණු දූයෙක වැස්ම හරනක්හු සේ, මං මුළාවූවක්හට මඟ දක්වන්නක්හු සේ, ඇස් ඇත්තවුනට රූප දක්කැ හැකි වනු පිණිස අඳුරැ තෙල්පහනක් දරන්නක්හු සේ නොයෙක් කරුණු දක්වා දහම් පැවැසිණ. එයැසු මම් බගවතුන් වහන්සේ ද දහම ද සඟන ද සරණ යෙමි. වහන්සේ මා අද පටන් කොට යව්දිව් සරණ ගිය උවසකු කොට සලකා වදාරන සේක් වා.

චිත්‍ර – වහන්ස, දම් දෙසූ නියා මැනැවි, ඉතා මැනැවි. යැටිකුරු කොට තුබූවක් උඩුකුරු කරන්නක්හු සේ.........නොයෙක් කරුණු දක්වා දහම් පැවැසිණ. ඒ මම් බගවතුන් වහන්සේ ද දහම් ද සඟන ද සරණ යෙමි. වහන්ස, බගවතුන් වහන්සේ වෙත පැවිදි වන්නට, උපසපුව ලබන්නට ඇත මැනැවි''

ඇත්සැරිපුත් සිත් (චිත්‍ර) තෙම බුදුරජුන් වෙත පැවිදි විය, උපසපුව ද ලැබී. විවසුන් වඩා නොබෝ කල්හි රහත් විය.

[සංඥනිරෝධය, තුන්සික, ආත්මවාදය, බුදුරජුන් වදාළ නොවදාළ දෑ, තුන් අත්බව් සන මෙතෙක් දෑ මෙහි දැක්විණ.]

10. ශුභ සූත්‍රය

1. බුදුරජුන් පිරිනිවි (මසෙකින් පමණ) පසු **අනද මහ** තෙරණුවෝ සැවැත් නුවර දෙව්රමහි වෙසෙති. එ සමයෙහි තෝදෙය්‍ය බමුණහු පුත් සුබ මණෙවු කිසි කටයුත්තක් සඳහා සිය ගමින් නික්මැ සැවැත්පුර බලා ගියේ ය. ගොස් එහි වසනුයේ දවසෙක අනඳතෙරුන් සිය නිවෙසට කැඳැවි ය. තමන් බෙහෙදක් පී ඉන්නා බැවින් එ දිනැ ඉයැ නො හැක්කැ යි ද, පසු දින කල් වේලා බලා ඉයැ හැක්කැ' යි ද තෙරණුවෝ කියා එවූහ. සුබ තෙම එයසා 'ඒත් මැනැවැ'සි සතුටු විය.

පසු ද තෙරණුවෝ **චේතකා** නම් මහණහු හා සුබ මණෙවිහු නිවෙස්න කරා වැඩියහ. පණවා තුබූණු අසුන්හි වැඩහුන්හ.

සුබ මණෙවු ද අවුත් පිළිසඳර කතා කොට දත් වළඳවා, ඉක්බිති කතාවට පටන් ගත.

2. සුබ – පින්වත් අනඳ තෙරුනි, ඔබ බොහෝ කල් ම ඒ පින්වත් ගොයුමාණන් වහන්සේ ගේ උවටු වූහ, ළඟ ම හසළහ. එ බැවින් පින්වත් ගොයුම් වහන්සේ ගුණ වැණූ, ජනයාට ගැන්වූ, ජනයා පිහිට්වූ ගුණ දහම් ඔබ දනිති යි සිතමි. පින්වත් අනඳ තෙරුනි, ඒ ගොයුමාණන් වහන්සේ කිනම් දහමෙක ගුණ වැණූහු ද? කිනම් දහමෙක ජනයා පිහිටුවූහු ද?

තෙරණුවෝ – දරුව, ඒ බගවත්හු ගුණකඳු තුනෙක ගුණ වදළහ. එය ජනයාට ගැන්වූහ. එහි ඔවුන් පිහිටුවූහ.

සුබ – කවර ගුණකඳු තුනෙක ද, අනඳ තෙරුනි?

තෙරණුවෝ – අරීසිල්කඳ, අරීසමාදිකඳ, අරීපැණකඳ[189] යන දහම්කඳු තුනෙහිය ය.

3. සුබ – පින්වත් අනඳ තෙරුනි, ඒ අරී සිල්කඳ කවර යැ?

189. ආර්‍ය්‍යශීලස්කන්‍ධය, ආර්‍ය්‍යසමාධිස්කන්‍ධය, ආර්‍ය්‍යප්‍රඥාස්කන්‍ධය..

තෙරණුවෝ - බුදුකෙනෙක් ලොවැ පහළ වෙති. ඔබ මුල මැද අග කලණ වූ හැම ලෙසින් පිරිපුන් දහම් දෙසති. හැම ලෙසින් පිරිසිදු සසුන් බඹසර පවසති. ගැහැවියෙක් හෝ ගැහැවි පුතෙක් හෝ එය අසා පැහැද නෑදෑසනුත් දනසම්පතුත් හැර දමා සසුන් වදී. හේ පැවැදි වැ පාමොක් සිලින් හැවුරුණේ,[190] පිරිසිදු දිවෙලින් යුතු වූයේ,[191] ඉඳුරුහැවුරුම්[192] ඇත්තේ, බොජුන්හි පමණ දන්නේ වෙසේ. මෙහි හේ කෙසේ සිල්වත් වේ ද? හේ පණිවා ආදියෙන් වැළැක්ම වූ චුල්ලසීලයෙන් ද, බීජගාම සමාරම්භාදියෙන් වැළක්ම වූ මජ්ඣිමසීලයෙන් ද, මිථ්‍යාජීවවිරමණාදි මහාසීලයෙන් ද යුත් වෙයි.[193] මෙසේ සිල්වත් වූ හේ මහණ තෙම සතුරුබල බිඳ අබිසෙස් ලත් රජක්හු සේ කිසිදු අතෙකින් එන බියක් නො දක්නේ, මේ අරි සිල්කඳින් යුක්ත වූයේ, උතුම් කායික චෛතසික සැපය විඳී. මේ ඒ බගවත් බුදුරජුන් ගුණවැණූ ජනයාට ගැන්වූ ජනයා පිහිටුවාලූ අරි සිල්කඳ ය. වැලි මෙයින් මත්තෙහි පිරියැ යුතු ගුණදහම් ද ඇත. ඒ අරි සමාදිකඳ යි.

4. සුබ - අසිරි යි! අනඳ තෙරුනි, පුදුම යි! මේ අරි සිල්කඳ පිරිපුන් ය මෙසේ වූ සිල්කඳක් අන් තොටු මහණ බමුණන් කෙරෙහි නො දකිමි. ඔවුන් මෙබන්දක් තමන් කෙරෙහි දුටුවොත් 'මෙතෙකින් සෑහෙයි, මෙතෙකින් සියල්ල සපුරන ලදි, මහණකමේ පරම පල ලැබිණ, මෙයට වඩා තවත් කටයුත්තෙක් නැතැ'යි මෙතෙකින් සෑහීමට පැමිණෙත්. එහෙත් 'තවත් පිරියැ යුතු ගුණදහම් ඇතැ'යි පින්වත් අනඳ තෙරණුවෝ වදරත්! පින්වත් අනඳ තෙරුනි, ඒ තවත් පිරිය යුතු යැ යි ඔබ වදළ අරි සමාදි කඳ කවර යැ?

---

190. පාතිමොක්ඛ සීලයෙන් සංවෘත වූයේ. 191. පරිශුද්ධාජීවයෙන් යුක්ත වූයේ. 192. ඉන්ද්‍රියසංවරය. 193. මේ සුලුසිල් මැදුම්සිල් මහසිල් ගැන විස්තර බ්‍රහ්මජාල සූත්‍රය බලා දත යුතු.

තෙරණුවෝ - දරුව, මෙ සස්නැ මහණ තෙම මෙහි ඉඳුරන්හි වැසූ දොර ඇත්තේ වෙයි. හේ ඇසින් රුවක් දැක, කනින් හඬක් අසා, නැහැයෙන් ගඳක් අඝා, දිවින් රසක් විඳ, කයින් ඇහැ හැපෙන දැයක් පැහැස, මනසින් දහම්අරමුණක් සිතා එහි නිමිති[194] නො ගනී. අනුව්‍යංජන නො ගනී.[195] ඉන්‍ද්‍රියසංවර නැති ව වසන්නහුට පහළ වියැ හැකි රාගද්වෙෂාදි අකුසල් ද ඇති විය හැකි නොවන සේ ඉන්‍ද්‍රියසංවරය කෙරේ. මෙසේ හේ ඉඳුරන්හි වැසූ දොර ඇත්තේ වෙයි.

දරුව, මහණ තෙම ඉදිරියට යෑම, පෙරළි ඊම, ඉදිරි බැලීම, අනුදික් බැලීම, අත් පා නැමීම, අත් පා දිග හැරීම, පාසිවුරු දැරීම, බොජුන් ගැන්ම, මල මූ පහ කිරීම, යෑම, සිටීම, ඉඳීම, පිබිදීම, නිහඬ වීම යන මේ හැම තැන දී ම ඒ කරන දෑ සිහියෙන් නුවණින් කෙරෙයි. මේ හැම තැන දී ම සිහියෙන් නුවණින් යුත් වෙයි. යන යන තැනට තම පියාපත් පමණක් සහිත ව යන ලිහිණියකු සේ මහණ තෙම කය රක්නා සිවුරෙනුත් කුස රක්නා පිඬුපාබොජුනෙනුත් තෘප්ත වෙයි. යන එන තැන එය පමණක් ඇති ව යයි, එයි. මෙසේ හේ ලත් මඳ වූ දැයෙකින් සතුටු වන ගුණැත්තේ වෙයි.

5. හේ මේ ආර්‍ය්‍ය ශීලයෙන් ද, ආර්‍ය්‍ය ඉන්‍ද්‍රියසංවරයෙන් ද, ආර්‍ය්‍ය ස්මෘතිසම්ප්‍රජානනයෙන් ද, ආර්‍ය්‍ය සන්තුෂ්ටියෙන් ද යුක්ත වූයේ විවික්ත සෙනසුනක් බෙජෙයි. පිඬුපායෙන් පසු පලක් බැඳ කය කෙළින් පිහිටුවා එළැඹැ සිටි සිහි ඇති වැ හිඳී. පස් නීවරණ[196] දුරු ලා සිත එය කෙරෙන් පිරිසිදු කෙරෙයි. ණයක් ගෙන වෙළෙඳාම් ඈ කිසි කර්මාන්තයක් කොට ධන උපයා, එයින් කලදී තමා ගත් ණය ද බේරා, බිරියක රක්නට තරම් තවත් ධනය ඉතිරි ව ඇති නිසාව දක්නකු සේ ද, දැඩි ගිලන් ව අහර ගැන්ම ද නො හැකි ව සිට ඒ ලෙඩින් මිදී අහරු රිසිය ලදුවකු සේ ද, හිරගෙයි බැඳී සිට ධන හානියකුත් නැති ව සුව සේ ඉන් මිදී ගත්තකු සේ ද, දස බැවින් මිදී

---

194. ඒ රූපාදිය ශෝභන යැ යි නො තකයි. දුටු පමණෙකි ම නවතී. එයින් එ පිටට සිතින් නො ය යි. 195. අත් පා ඈ ද සිනා කතා බස් බැලුම් යන ආදි, ආකාරවිශේෂ ද නොබනේ යැ යි නො ගනී 196. නීවරණ නම් අභිජ්ඣා ව්‍යාපාද ථිනමිද්ධ උද්ධච්චකුක්කුච්ච යන පස යි

නිදහස් වැ රිසි තැනක යෑ හැකි වූවක්හු සේ ද, කතර මඟකට බැස ගොස් එය ඉක්මැ සුව සේ ගමට පැමිණියක්හු සේ ද ඒ නීවරණ පසින් සිත මුදා ගත් මහණ මහත් සතුට ලබයි.

6. හෙතෙම කාමච්ඡන්දය ණයක් සේ ද, ව්‍යාපාදය ලෙඩක් සේ ද, ථිනමිද්ධය හිරගෙයක් සේ ද, උද්ධච්චකුක්කුච්චය දාස බවක් සේ ද, විචිකිච්ඡාව වැලිකතරක් සේ ද, ඒ නීවරණ පසින් මිදීම පිළිවෙළින් ණයෙන් ද, ලෙඩින් ද, හිරගෙන් ද, දාස බැවින් ද, කතරින් ද මිදීමක් සේ ද දකී. මෙසේ දක්නහුට සතුට ඇති වේ. සතුටු වූවහු සිත පිනා යයි. සිත පිනා ගියහු නාම කය සංහිඳේ. සංසුන් සිතැති හේ කායික මානසික සුව විඳී. මේ නෛෂ්කාම්‍ය (නිෂ්කාමභාව) හේතුයෙන් උපන් සුවයෙන් සුවපත්තහු සිත එකඟ වේ. එසේ වූ හේ පළමු රූපධ්‍යානය ලැබ ඒ දහන්සුවෙන් වෙසේ. ඒ දහන්සුවෙන් සියලු කරජකය පහසී. දියැ ඉසැ මොනවට මැඩ ගුළි කළ නාන සුණුපිඩෙහි ඒ ඉස්නා ලද දිය තදින් කා වැදී පැතිර පවත්නා සේ, ඒ පළමු දහන්සුවය ඔහු මුළු සිරුර කාවැදී පැතිර පවතී. මේ ද ඔහු ලත් සමාධියෙකි.

7. හේ මත්තෙහිත් දහන් වඩා දෙවෙනි රූදහන් ලබා ඒ දහන්සුවයෙන් කල් ගෙවයි. සිසිල් දිය උනන පොකුණෙක ඒ උනන දිය අස්සක් මුල්ලක් නැර හැම තැන ම පැතිර වැද ගෙන සිටුනා සේ ඒ දෙවෙනි දහන්සුව ඔහු මුළු සිරුර කා වැදී පැතිර හැම තැන ම වැදගෙන සිටී. මේ ද ඔහු ගේ සමාධිලාභයෙකි.

8. හේ මත්තෙහි ද දහන් වඩා තෙවෙනි රූදහන ලැබ ඒ දහන්සුවින් කල් යවයි. පොකුණෙකැ වැඩෙන නෙළුම් ගස්හි අග සිට මුලට ද මුල සිට අගට ද හැම තැන සිසිල් දිය වැද පැතිර සිටුනා සේ හේ සියලු සිරුර තෙවෙනි දහන්සුවින් පහසී. ඒ දහන්සුව පහස නොලත් කිසි තැනෙක් ඔහු සිරුර නැත. මේ ද ඔහු ලත් සමාධියෙකි.

9. හේ මත්තෙහි ද දහන් වඩා සිවුවන රූදහන් ලබා වෙසේ. මොනොවට දිය සනා සුදු වතක් හිස වසා පෙරෙවැ උන්නහු සිරිරෙන් නික්මෙන ඍතුගුණය ඒ සියලු වස්ත්‍රයැ පැතිර වැද ගෙන සිටුනා සේ දහන්සුව ඔහු සියලු කරජකයැ පැතිර වැද ගෙන සිටී. ඒ දහන්පහස නො ලත් තැනෙක් ඔහු සිරිර නැත. මේ ද ඔහු ලත් සමාධියෙකි.

දරුව, ඒ බගවත් බුදුරජුන් ගුණ වැණූ, ජනයා ගැන්වූ, ජනයා පිහිටුවූ අරි සමාදි කඳ මේ ය. තව ද මෙ සස්නැ මෙයින් මත්තෙහිත් පිරියැ යුතු පැණකඳ ඇත.

10. සුබ – අසිරි සි, පින්වත් අනඳ තෙරුනි, පුදුම සි! මේ අරි සමාදි කඳ පිරිපුන් ය. මෙ වැන්නක් අන් තොටු මහණබමුණන් කෙරෙහි නො දකිමි. ඔහු මෙ වැන්නක් තමන් කෙරේ දකිත් නම්, 'මෙතෙකින් සෑහේ......මෙයට වඩා තවත් අප විසින් කළ යුත්තෙක් නැතැ'යි තෘප්ත වෙති. එහෙත් තවත් පිරියැ යුතු දෑ ඇතැ යි පින්වත් අනඳ තෙරණුවෝ වදරති, පින්වත් අනඳ තෙරුනි, ඒ පින්වත් ගොයු-මාණන් වැණූ ජනයා ලගැන්වූ, ජනයා පිහිටුවාලූ ඒ අරි පැණකඳ (ආයී ප්‍රඥාස්කන්ධය) කවර යැ?

තෙරණුවෝ – දරුව, මහණ තෙම යටකී සේ සිත සමාධිගත කලැ එය විවසුන් නුවණ පිණිස ඒ අතට නමා හරී. නොතිර පිළිකුල් පසයෙන් සිටුනා මෙ සිරුරැ මා සිත බැඳී සිටී යැ යි හේ නුවණින් දකී. ඇමුණූ නූලක් සහිත වෙරළුමිණක් අත්ලැ තබා බලන්නාහු ඒ වෙරුළුමිණ විනිවිද නූලත් පැහැයත් දක්නා සේ සමාහිත සිතැති මහණ තෙම සිරුරත් එයැසිරැ සිටුනා සිතත් විවසුන් නුවණින් දකී. මෙසේ නුවණින් දකිනු ද ඔහු ගේ පැණෙකි (ප්‍රඥවෙකි.)

යටකී පරිදි සිතැ සමාදිය ලත් මහණ මන්මුවා සිරුරක් මවනු පිණිස සිත එය අතට යොමු කෙරෙයි. මුදුතණ ගසක් එහි පතුයෙනුත්, කඩුවක් එහි කොපුයෙනුත්, සපකු උහු සැවයෙනුත් මෑත් කරන්නා සේ, හේ සිරිරෙන් එය බඳු ම මන්මුවා අන් කයක් මෑත් කෙරෙයි. මෙහි නුවණ ද ඔහු ගේ පැණෙකි.

11. සිතැ සමාදි ලත් ඒ මහණ එකකු වූ තමා බොහෝ දෙනෙකුන් සේ දැක්වීම, යලි එකකු වැ පෙනී සිටීම, නොපෙනී සිටීම, යලි පෙනී සිටීම යන ආදි නොයෙක් ඉදුහ කරනුයෙහි[197] සමත් නුවණ ලබයි. කුඹලකු මැටියෙනුත් දතරුවකු ඇත්

197. විශුඩිමාගියේ සාඞ්ම්ඛහිර්දෙශය බලා මෙහි විස්තර දත යුතු.

දළෙනුත් රත්කරුවකු රනිනුත් තමා රිසි බදුන් ඈ දෑයක් කරන්නා සේ යටකී මහණ තමා රිසි සේ නොයෙක් ඉදුග කරනුයෙහි සමත් වෙයි. එහි නුවණ ද එක් පැණෙකි (ප්‍රඥවෙකි).

12. තව ද යටකී පරිදි සිතැ සමාදි ලත් මහණ දිවකන් නුවණ ලබනුවට පිරියම් කෙරෙයි. හේ එය ලැබ ළඟ වූ ද දුර වූ ද දෙව්හඬ ද මිනිස්හඬ ද අසයි. දික් මඟින් යන්නකු තමා කනැ හෙන බෙරහඬ සක්හඬ ඈ කවර හඬක් වුව වෙන් වෙන් කොට හැඳිනැ ගන්නා සේ හේ මහණ තමා ලත් දිවකන් නුවණින් ළඟ වූ ද දුර වූ ද දෙව්හඬ ද මිනිස්හඬ ද වෙන් කොට හඳුනයි. මේ ද ඔහු ගේ පැණෙකි.

13. යටකී පරිදි සිතැ සමාදිය ලත් මහණ පරසිත් දන්නා නුවණ පිණිස සමාදිසිත නමා හරී. එසේ කොට සරාග වීතරාග යන ඈ විසින් සොළොස් සැටියෙකින්* වෙනස් වූ මෙරමා සිත් දැන ගනී. කැටපතෙක හෝ පිරිසිදු දියබඳුනෙක හෝ සිය මුහුණෙහි පිළිබිඹුව දක්නහු එහි ඇති තලකැලැල් ඈ දක්නා සේ හේ මෙරමා සරාග සිත් ඈ දැනැගනී. මේ දැන්ම ද ඔහු ගේ පැණෙකි.

14. යට කී සිතැ සමාදිය ලත් හේ පෙරවුසු කඳපිළිවෙළ දක්නා පිණිස තමා සමාදිසිත නමා හරී. එසේ කොට ගමෙකින් ගමකට යන්නහු තමා පසු කළ ගම් සිහි කරන්නා සේ නොයෙක් පෙර ජාති දකී. මේ දක්නා නුවණ ද ඔහු ගේ පැණෙකි.

15. යට කී පරිදි සිතැ සමාදිය ලත් පසු ඒ මහණ ඒ ඒ සතුන් මැරෙනු ද මරනින් මතු උපදිනු ද දක්නට සමාදි සිත නමාලයි. එසේ කොට සිව්මංහන්දියෙකැ පහයෙකැ සිටැ එහි පිවිසෙන එයින් බැහැර වැ නොයෙක් අතැ යන එන ජනයා දක්නා සේ, මැරෙන උපදින, කම් වූ පරිදි සුගති දුගති කරා යන සතුන් දකී. මෙසේ වූ ඔහු ගේ මේ දිවැස ද එක් පැණෙකි

16. යට කී සේ සිතැ සමාදිය ලත් එ මහණ සියල් කෙලෙස් නසන නුවණ පිණිස විවසුන් වඩයි. එසේ කොට නුවණ වඩා හෙ තෙම දුකත් දුක්මුලත් දුක්නිරොදත් දුක්-නිරොදට මහත් තත් වූ පරිදි දකී. ආසව ද ආසව සමුදයය ද ආසවනිරෝධය ද ආසවනිරෝධයට මඟ ද ඇති සැටියෙන්

---

* සොළොස්වැදෑරුම් සිත් මතු සතිපට්ඨාන සූත්‍රයේ එයි. එය බලා දත යුතු.

දැනගනී. මෙසේ දක්නා දන්නා ඔහු සිත කාමාසව භවාසව අවිජ්ජාසව යන තුන් ආසව කෙරෙන් මිදේ.[198] සිත මිදුණු කලැ මිදිණැ යි දැනීම[199] වෙයි. 'බවඋපත නැවැතිණ. මහ-බඹසර වැසැ නිමැවිණ. දුකින් මිදෙනුවට කළ යුතු හැම දෑ කැරැ අවසන් විය. එහි ලා තවත් කටයුත්තෙක් නැතැ'යි හේ දැනගනී. කඳුමුදුනෙක පහන් දියවිලක් අසැ සිට බලන්නහු එහි ඇති මසුන් ද බෙල්ලන් ද කැටකැබැලිති ඈ ද පැහැදිලි ලෙස දක්නා සේ ම එ මහණ ආසව නසන නුවණ අතට සිත නමා හැර සිවුසස් තත් වූ පරිදි දැක්ම ද ඔහු ගේ පැණෙකි. දරුව, මේ ඒ බගවතුන් වහන්සේ ගුණ වැණූ ජනයා පිහිටුවාලූ අරි පැණකඳ යි. මෙහි මෙයින් මත්තෙහි පිරියැ යුත්තෙක් නැති.

17. සුබ – පින්වත් අනඳ තෙරුනි, පුදුම යි! ඒ අරි ගුණකඳ පිරිපුන් ම ය, නොපිරිපුන් නො වේ. මෙසේ පිරිපුන් පැණකඳක් මෙයින් පිටත් අන් මහණබමුණන් කෙරෙහි නො දක්මි. මෙහි මත්-තෙහි කළයුතු සේ වූ තවත් ඉතිරි කිසි දු නැති.

පින්වත් අනඳ තෙරුනි, ඔබ දහම් පැවැසුවා සොඳුරු ම ය, සිත්කලු ම ය. යැටිකුරු බඳුනක් උඩුකුරු කරන්නක්හු සේ, වැසුණු දැයක් විවරන්නක්හු සේ, මංමුළා වූවකුට මඟ දක්වන්නක්හු සේ, අඳුරැ ඇසැත්තවුනට රූ දකිනු හැකි වනුවට පහනක් දරන්නක්හු සේ, නොයෙක් කරුණු හැරැ පාමින් ඔබ විසින් දහම් පැවැසිණ. පින්වත් අනඳ තෙරුනි, ඔබ දහම් කතාව ඇසූ මම් ඒ පින්වත් ගොයුමන් වහන්සේ ද ඔබ දහම ද ඔබ බික්සඟන ද සරණ යෙමි. අද පටන් කොට දිවිහිමින් තෙරුවන් සරණ ගිය උවසුවකු කොට ඔබ මා සලකත් වා.

[මෙහි බුදුසස්නැ අරිසිල්[200] අරිසමාදි අරිපැණ යන තුන් සපුයෙහි තතු දැක්විණ.]

---

198. ආසව — ඇස් ඈ සදොරෙන් අරමුණු අතට ගලන්නෝ ය, වැස්සෙන්නෝ ය යන අරුතින් කාමරාගාදීහු ආසව නම් වෙති. බිම් විසින් නේවසඤ්ඤානාසඤ්ඤායතනය තෙක් ද දහම් විසින් ගෝත්‍රභූ සිත තෙක් ද ගලන්-නෝ ය, පවත්නෝ ය යන අරුතින් ද ඔහු ආසව නම් වෙති. කාමාසව යනු කාමරාගය යි. භවාසව යනු භවරාගය යි. අවිජ්ජාසව යනු පුබ්බන්තාදී අට තැන නොදැනීම යි. මෙහි පෙළෙහි ආසව තුනෙක් ම දැක්විණ. භවාසව යන්නෙහි දිට්ඨාසවය ද ඇතුළත්. 199 මිදිණැ යි දැනීම යනු පස්විකුම්නුවණ යි. 200. මෙහි අරිසිල් (ආර්‍යශීල) ආදියෙහි පිරිබදු සිලාදිය ම දැක්විණ.

11. කේවට්ට සූත්‍රය

එක් කලෙක බුදුරජුහු **නාලන්ද** නුවරට නොදුරු නො ළඟ **පාවාරික** සිටුහු ගේ අඹවෙනෙහි වූ වෙහෙර වැඩවෙසෙති.

2. එ සෙමෙහි දිනෙක **කේවට්ට**[201] නම් ගැහැවිපුතෙක් බුදුරජුන් වෙත එළැඹ වැඳ පසෙක හිඳගත. එයට පසු ඔබ දෙදෙනා ගේ කතාව ඇති විය:

3. **කේවට්ට** – වහන්ස, මේ නාලන්ද නුවර සැරු එකෙක මෙහි බොහෝ මිනිස්සු ඔබ කෙරෙහි පහන්හ. වහන්ස, එක් වහන්දෑ කෙනෙක්හට උතුරු මිනිස්දැමින්[202] ඉදුපෙළහර පාන්නට අණ-වත් වා. මෙසේ මෙහි වසනුවෝ වඩාත් ඔබ කෙරේ පහදනාහ.

බුදුරජුහු – 'ගිහියන් ඉදිරියෙහි උතුරුමිනිස් දහමින් පෙළහර කරවූ' යැ යි සව්වනට නො කියමි.

කේවට්ට – වහන්ස, ඔබට අයසක් නො පතමි. වැඩක් ම පතනුයෙමි මෙසේ අයදිමි. මෙ නුවර බොහෝ ජනයා ඇති සරු එකෙක. ඉදුපෙළහර පාන්නට එක් වහන්දෑ නමකට අණවතොත් මැනැව.

බුදුරජුහු – කේවට්ටය, 'ගිහිනට උතුරුමිනිස්දැමින් ඉදු-පෙළහර පාවූ යැ' යි නො කියමි.

කේවට්ට – වහන්ස, ඔබට අයසක් අවැඩක් නො පතමි… ……එක් වහන්දෑ නමකට උතුරුමිනිස්දැමින් පෙළහර පානුවට අණවතොත් මැනැව.

බුදුරජුහු – කේවට්ටය, සිය නුවණින් මා දැන හෙළි කළ පෙළහර තුනෙක. ඉදුපෙළහර, ආදේසන පෙළහර, අනුසාසන පෙළහර විසිනි. එහි ඉදුපෙළහර නම් – දහත් වඩා පසබිනා[203] උපදවා නොයෙක් ඉදුහ කරනු යි.

---

201. කෙවුළක්හු දරුනත්හි වැඩුණෙන් මේ කේවට්ට නම් වී යැ යි ටීකායෙහි දක්වේ. 202. පියෙවි මිනිස්හට වැඩි තරම් වූ මිනිස්හු උතුරු-මිනිස්හු (උත්තරිමනුස්ස) ය, ධ්‍යාන මාඟිඵල ලදුවෝ ය. ඔවුන් ලත් ධ්‍යාන අභිඥ, මාඟිඵල උතුරුමිනිස්දම් නම 203. පසබිනා = පංචාභිඥ: රූප මවා පෑම් ආදි සෘද්ධිවිධය, දිවකන, පරසිත් දන්නා නුවණ, පෙරජාති දක්නා නුවණ, දිවැස.

පියෙවියෙන් එකකු වූ තමා බොහෝ දෙනෙකුන් සේ කොට දැක්වීම,

යලි එකකු වැ පෙනී සිටීම,

ඉදිරියේ නොපෙනී තුබුණු දෑ පෙන්වීම,

පෙනි පෙනී තුබුණු දෑ නො පෙනෙනුවන් කිරීම,

ගෙබිතු කඳුහෙල් ආදිය විනිවිඳ එහි නොගැටී අහසින් සෙයින් පරභාගයට යෑම,

දියෙහි මෙන් පොළොවෙහිත් ගැලීම, මතු වීම,

අහසැ පලක් බැඳ යෑම,

පොළොවෙහි මෙන් දිය මතුපිටැ යෑම,

ඉරු සඳු අතින් පිරිමැදීම,

බඹලොව තෙක් දු කයින් තමා වසයෙහි පැවැත්වීම යන මොහු ය.

මේ පෙළහර දැක සැදැහැ පැහැදුණක්හු මෙ පවත් සැදැහැ නැති එකකුට කි විට හේ මේ හැම ඉද්ධිවිදි කළ හැකි **ගාන්ධාරී**[204] නම් විද්‍යාවෙක් ඇතැ යි ද, එ මහණහු ඒ විද්‍යාවෙන් එකි පෙළහර දැක්වූහ යි ද කියන්නේ ය. කේවට්ටය, ඒ නො පහන් තැනැත්තේ එසේ නො කියන්නේ ද?

කේවට්ට – වහන්ස, එසේ කියන්නේ ය.

5. **බුදුරජුහු** – කේවට්ටය, ඉදුපෙළහරහි මේ දෙස් දැක මම එයට පිළිකුල් කෙරෙමි. කේවට්ටය, ආදේසන පෙළහර යනු මෙරමා සිතැ සැටිය කියනු යි. දහන් වඩා අභිඥා ඉපැදවූයේ මෙරමා

204 ගාන්ධාරවිද්‍යාව ක්‍ෂුද්‍රගාන්ධාරී මහාගාන්ධාරී යැ යි දෙවැදෑරුම් මැ යි තුන් හවුරුද්ද වත තුරු ඒ මළාහු උපන් තැන් කියැ හැකි විද්‍යාව ක්‍ෂුද්‍රගාන්ධාරීවිද්‍යා නම වංගීස බමුණු දත්තේ මෙය ය මේ දත් තමා බොහෝ දෙනෙකුන් සේ පෙන්වීම් ආදියත් මහාගාන්ධාරීවිද්‍යාවෙන් කළ හැක්ක ඉන්ද්‍රජාලතන්ත්‍ර මේරුතන්ත්‍ර සිඬනාගර්ජුනකක්‍ෂපුටතන්ත්‍ර ආදියෙහි ද මේ දෑ සඳහන් වේ. Persian Magic නමින් වැහැරුවෙන විද්‍යායෙන් මේ පුදුම දෑ බොහෝවක් කළ හැක්ක. පරකායප්‍රවේශය, දූරදර්ශනය, දූරශ්‍රවණය, මනෝමය පණ්වුඩ යැවීම, කායදඬුකඬක් සේ කිරීම, ලෙඩ සුව කිරීම, රූප මවා දැක්වීම යන මේ ඈ කටහැකි Self-projection. Clairvoyance, Clairaudience, Telepathy යන ආදි නම්වලින් හැඳින්වෙන විද්‍යාංගයෝ මේ ගාන්ධාරීවිද්‍යාවේ ශාඛාවෝ ය.

සිතැ වූ වේදනාව, කල්පනාව, සිතැ විචාරය දැන, 'තොප සිත මෙසේ යැ, මෙසේ යැ' යි කියයි. මෙය දැක සස්නැ පහන් වූයෙක් නොපහන් එකක්හට මෙ පවත සැල කරයි. එවිට හේ පරසිත් දත හැකි **මනිකා** නම් විද්‍යුයෙක්[205] ඇතැ යි, එ මහණ එයින් පරසිත් දැන කියතැ යි කියන්නේ ය. ඒ පරසිත් දැන්ම ලුහු කොට උසස් ගුණ වැඩුමෙක අනුහසක් නොවූ සේ කොට කියා පායි. එසේ හේ නො කියන්නේ ද?

කේවට්ට – එසේ කියන්නේ ය, වහන්ස.

6. **බුදුරජුනු** – කේවට්ටය, ආදේසනා පෙළහර මේ දෙස දැක එය පිළිකුල් කෙරෙමි. කේවට්ටය, අනුසාසනා පෙළහර යනු 'කුශල විතර්ක කරවු, අකුශල විතර්ක නො කරවු. අනිත්‍යසංඥාදීන් අතුරෙන් එකක් සිත්හි කරවු. නිත්‍යසංඥාදිය බැහැර කරවු. රාගාදි කෙලෙස් දුරු ලවු. ලොවුතුරා දහම් පසක් කොට ගෙන වසවු'යැ යි මෙසේ දහම් දෙසනු ය.

කේවට්ටය, ලොවුතුරා බුදුවරයෙක් ලොවැ පහළ වෙයි.[206] ගැහැවියෙක් හෝ ගැහැවිපුතෙක් ඔබ වදාරන තෙකලණ දහම් අසා පැහැද පැවිදි වැ සුළුසිල් මැදුම්සිල් මහසිල් පුරයි, ඉඳුරන් හවුරා ගනි, සතිසම්පජඤ්ඤයෙන් යුත් වෙයි. ලද පසයෙන් සතුටු වෙයි. මෙසේ සිල්කඳින් යුත් හේ විවික්ත සෙනසුනක් බජයි. හේ එළැඹැ සිටි සිහි ඇත්තේ **අභිජ්ඣා ව්‍යාපාද ථිනමිද්ධ උද්ධච්චකුක්කුච්ච විචිකිච්ඡා** යන නිවරණයන් බැහැර කොට සිත පිරිසිදු කෙරෙයි. එය සලකා බලන හේ සතුට ද එයින් ප්‍රීතිය ද, එයින් නාමකායයේ සංසිඳුම ද, එයින් සුව ද, එයින් සමාදිය ද ලබයි. මෙසේ වූ හේ දහන් වඩනුයේ පළමු

205. මනිකා යනු පරසිත් දක්නා විද්‍යුව යි චින්තාමණිවිද්‍යා නමින් ද මේ වැහැරුණෙයි. ගාන්ධාරීවිද්‍යාව සේ ම සුදුසු කල් වේලා ආදිය බලා මතුරු දපා මෙය උපදවා ගත හැක්ක. නිමිති මගින් හෝ කී බසෙහි අකුරු මගින් හෝ මෙරමා සිතුවා දක්නට උපාය දක්වන ශාස්ත්‍රය ද මනිකාවිද්‍යා නමින් වැහැරුණේ. පදකුසලමාණව ජාතකයෙහි ද මේ මනිකාවිද්‍යාව සඳහන් වේ. 206. යට සාමඤ්ඤඵල සූත්‍රයේ දැක්වුණු පරිදි මෙහි විස්තර දත යුතු.

දහන් ද දෙවෙනි දහන් ද තෙවෙනි දහන් ද සිවුවන දහන් ද ලබයි. හේ අනතුරු වැ එකී එකී අභිඥවට සුදුසු පරිදි පිරියම් කොට, පිළිවෙළින් මනෝමයිඞ්ඪි ඉඞ්ඪිවිධඤාණ දිබ්බසෝත පරචිත්තවිජානන පුබ්බෙනිවාසානුස්සති චුතූපපාතඤාණ (දිබ්බ-චක්ඛු) සන අභිඥවන් ලබයි.

එයට පසු ආසව නසන නුවණ පිණිස සිවුසස් සිත් වඩා සිවුසස් පිළිවිද රහත් වෙයි. මෙසේ පැවිදි වීම පටන් කොට රහත් වීම තෙක් එය පිණිස අනුසාසන කරනු අනුසාසනා පෙළහර යි.

කේවට්ටය, පෙරැ මෙ සස්නැ මහ ඉදුමත් මහණෙක්හට 'කොතැනැ කුමකට පැමිණියක්හු ගේ සතර මහාභූත නිරුඬ වේ ද?' යි කල්පනාවෙක් විය. හේ ඉදුහු බෙලෙන් සිවුමහ-රජයෙහි දෙවියන් වෙත එළැඹ මෙය විචාළේ ය. 'අපි නො දනුම්හ, වරම්රජුන් දනිති'යි ඔහු කිහ. එ බස් අසා හේ පිළිවෙළින් ධෘතරාෂ්ට්‍රාදීන් වෙත ගොස් එය විචාළේ ය. ඔහු ද තමන් නොදන්නා බව කියා තව්තිසාවැසි දෙවියන් විචාරන්නැ යි කිහ. හේ තාවතිංස යාම තුසිත නිම්මානරති පරනිම්මිතවසවත්ති දෙව්ලෝ කරා පිළිවෙළින් ගොස් විචාළේ ය. ඔවුන් ගෙන් ද උත්තර නොලැබ බ්‍රහ්මකායික දෙවියන් වෙත ගොස් විචාරා, කෙළවරැ මහබඹා වෙත ගියේ ය. පැණය විචාළේ ය. එ විට මහබඹ තෙම "මම් බඹා වෙමි, මහබඹා වෙමි, සියල්ල මැඩ සිටින්නෙමි, අනුන් විසින් නො මැඩැලියැ හැකියෙමි, සියල්ල දක්නෙමි, සියල්ල සිය වශයෙහි පවත්-වන්නෙමි, ලොව්සුරු වෙමි, ලොව මැවූයෙමි වෙමි, මාපක ද කාරක ද භාජක ද වෙමි, ලොව වශයෙහි තබන්නෙමි වෙමි, තුන්කලට අයත් සියල්ලන් ගේ පිය වෙමි" යි තමා මහත්බව කියා පෑ ය. තමා ඇසූයේ ඔහු ගේ වගතුග නොවේ යැ යි ඒ මහණ යළි දු තම පැණය මතු කෙළේ ය. එ වරැ ද මහබඹ පළමු කී ලෙස ම තමා මහත්බව කී ය. තමා අසනුයේ එය නො වේ යැ යි යළි දු එ මහණ තමා පැණය මතු කෙළේ ය. එවිට මහබඹ තෙම එ මහණ අතින් ගෙන පසකට ගොස්, 'මහණ, මේ බඹහු මා නො දන්නා දෑයක් නැතැ යි මා සියල්ල දනිතැ යි පිළිගන්නෝ ය. එ හෙයින් ඔබට ඔවුන් හමුයෙහි ඇත්ත නො කිමි. මහණ, ඕ පැණයට උත්තර මමත් නො දනිමි. මහණ, මෙය භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසා නො ගෙන මෙ තෙක් දුර මේ බඹලොව දක්වා අවුත් කෙළේ වරදෙකි. ගොස් භාග්‍යවතුන් වහන්සේ අතින් විචාරන්නැ' යි කී ය.

8. ඉක්බිති එ මහණ සැණෙන් එයින් අතුරුදහන් වැ මා හමුයෙහි පෙනී සිට වැඳ පසෙක හිඳ ඒ පැණ විචාළේ ය. එ විට මම් ඔහුට මෙය කීමි:

'නැවින් වෙළෙඳමේ යන වෙළෙඳමුළුවෙක් තෙර දක්නා ලිහිණියකු ගෙන ගමන් ඇරැඹි ය ඔහු සයුර මැදට වන්නාහු තෙරක් නො දක්නෝ ලිහිණියා මුදා හළහ. හේ අහස් නැග සිවු දිගට ම පියාඹා ගොස් තෙරක් නොදැක පෙරළා නැවට ම ආ ය. මහණ, ඌ සේ ම තෝ ද බඹලොව දක්වාත් ගොස් මේ පැණය විසැඳිය හැකිකකු නො ලැබ අප වෙත ම පෙරැළී අවු ය. මහණ, මෙය විචාළ යුත්තේ, 'උපාදින්න වූ[207] සතර ධාතුහු කොතන්හි පිහිට නො ලබත් ද? උපාදින්න රූප රාශිය කොතැනෙක නො පිහිටයි ද? නාමරූපයෝ කො-තැනෙක අනුත්පාදනිරෝධයට පැමිණෙත් දැ?' යි කියා ය. මෙයට උත්තරය මෙසේ ය:

"ලොවුතුරා නුවණින් දත යුතු, මසැසට නො පැණෙන, කෙළවරක් නැති, හැම කම්සථානමුඛයක් ම[208] තීර්ථ කොටැති නිවනෙහි (නිවනට පැමිණ) පඨවිආදි සතර මහාභූතයෝ පිහිට නො ලබත්. සියලු උපාදින්න රූපරාශිය මෙ නිවනෙහි (මෙ නිවන වෙත පැමිණ) පිහිට නො ලබයි. සියලු නම්රූ රැස මෙහි යලි නො උපදනා සේ නිරුඬ වේ. අන්තිම විඥනයේ (චුති සිතේ) භංගයෙන් සියලු නම්රූ රැස මෙ නිවනෙහි (නිවන වෙත පැමිණ) අනුත්පාදනිරෝධයට පැමිණේ."

10. බුදුරජුන් වදාළ බස කේවට්ට තෙම සතුටින් පිළි-ගත්තේ ය.

[තුන් පෙළහර, අනුසාසනපෙළහරේ සැටි, එහි මහගු බව, නාමරූප අනුත්පාදනිරෝධයට පාමිණෙන තැන යන මෙ තෙක්දෑ මෙහි දැක්විණ]

---

207. උපාදින්න — කර්ම චිත්ත සෘතු ආහාර යන සතර පසයෙන් පහළ වූ, සත්ත්වයා පිළිබඳ වූ. 208. කම්සථානමුඛ. උපග්‍රන්ථය බලනු.

12. ලෝහිච්ච සූත්‍රය.

එක් සමයෙක්හි බගවත් බුදුරජුහු මහත් මහණමුළුවක් හා **කොසොල්රටැ** සැරිසරන්නාහු, **සාලවතිකා** ගමට වැඩියහ· එ සමයෙහි ලෝහිච්ච නම් බමුණෙක් එ ගමට අදිපති වැ වෙසෙයි.

2. එ බමුණුහට මෙබදු දුර්මතයෙක් වෙයි: "යම් මහණෙක් හෝ බමුණෙක් දහන් විමොක් ඈ උසස් ගුණ ලද්දේ නම්, ඔහු එය අනුනට කියනු නො සුදුසු ය. එය අසා ගත් තැනැත්තේ ඒ කියුවාහට කවර වැඩක් සිදු කෙරෙයි ද? තමා ලත් ගුණ මෙරමාට දන්වනු පොරණ බැම්ම සිඳැ අළුත් බැම්මෙකින් බැඳෙනු වැනි ලෝභයෙන් කැරෙන එකෙක. තමා වැඩ සිදු කැරී ගැන්ම තමාට ම අයත් එකෙක. අනෙකකු ගේ උදව්වෙක් ඈවැසි නො වේ" යනු යැ.

3. ලෝහිච්ච තෙම තමා ගමට බුදුරජුන් වැඩි පවත් අසා, **භේසිකා** නම් සිය කරනැවැහැමියා බණවා, 'මහණගොයුමා–ණන් වෙත ගොස් බික්සඟන සහිත ව පසු ද බතට තම නිවෙසට වඩනා ලෙසට නිමතන්නැ' යි කී ය. හේ ද බුදුරජුන් වෙත ගොස් පසු ද බතට නිමැති ය.

4. පසු දිනැ නැහැවි තෙම ලෝහිච්චයා ගේ ගෙය කරා වඩනා බුදුරජුන් පසු පස්සෙන් එනුයේ එ බමුණා ගේ මිසදිට ගැන සඳහන් කෙළේ ය. ලෝහිච්චයා ද බික්සඟන සහිත බුදුරජුන් වළඳවා ඉක්බිති මිටි අස්නක් ගෙන පසෙක හිඳ ගත. බුදුරජුහු ඔහු බණවා, 'අනුනට දහම් දෙසනු නොයුතු යැ' යි මෙසේ වූ අදහසක් ඔහු තුළ පහළ වැ ඇති නියා සබා ද?' යි අසා වදාළහ. 'සැබැවැ' හේ කී ය.

5. **බුදුරජුහු** – ලෝහිච්චයෙනි, තෙපි සාලවතිකායෙහි වසන්–නෝ නො වහු ද?

ලෝහිච්ච – ඒසේ ය, වසන්නෝ වමු, ගොයුමාණන් වහන්ස.

බුදුරජුහු – 'ලෝහිච්ච බමුණාණෝ සාලවතිකාවට අදිපති වැ එහි උපදනා තාක් භෝග තුමූ ම එකලා වැ බුදිති, අනෙකකුට කිසිත් නො දෙති'යි යමෙක් කියා නම්, හේ ඔබෙත් රැකෙන්නන් ගේ ලාභයට අන්තරාය කරන්නේ නො වේ ද?

ලෝහිච්ච – එසේ ය. මගෙන් ඔවුන් ලබන ලාභයට හෝ අන්තරාය කරන්නෝ වේ.

5. **බුදුරජුහු** – ඒ ලාභයට අන්තරාය කරන තැනැත්තෝ ඔවුනට හිතානුකම්පා ඇත්තෝ ද, නැත්තෝ ද?

ලෝහිච්ච – හිතානුකම්පා නැත්තෙක.

බුදුරජුහු – හිතානුකම්පා නැතියහුට එළැඹැ සිටියේ මෙත් සිත ද වෙර සිත ද?

ලෝහිච්ච – වෙර සිත ය.

බුදුරජුහු – වෙර සිත එළඹැ සිටි කලැ ඔහු තුළ වනුයේ සම්දිට ද, නැත හොත් මිසදිට ද?

ලෝහිච්ච – මිසදිට ය.

6. **බුදුරජුහු** – මිසදිට ගත්තාහට මරණින් මතු නිරය හෝ තිරිසන් ගතිය වේ යැ යි මම් කියමි. ලෝහිච්ච– යෙනි, පසේනදි කොහොල් රජ කසි කොසොල් දෙ රටට අදිපති නො වේ ද?

ලෝහිච්ච – එසේ ය, අදිපති ය.

බුදුරජුහු – 'පසේනදි රජ කසි කොසොල් දෙරටට අදිපති වැ එහි උපදනා සියලු භෝග තෙමේ ම බුදී යැ' යි යමකු කියතොත්, හේ එ රජු නිසා රැකෙන ඔබ ගේත් සෙස්සන් ගේත් ලාභයනට හානි කරන්නෝ නො වේ ද?

ලෝහිච්ච – හානි කරන්නෝ ය.

7. **බුදුරජුහු** – ලාභයට හානි කරන්නෝ වැඩ කැමැත්තෝ ද? අවැඩ කැමැත්තෝ ද?

ලෝහිච්ච – අවැඩ කැමැත්තෝ ය.

බුදුරජුහු – අවැඩ කැමැත්තහු තුළැ වනුයේ මෙත් සිත ද, නැත හොත් වෙර සිත ද?

ලෝහිච්ච – වෙර සිත ය.

බුදුරජුහු – වෙර සිත ඇති කලැ මිසදිටු වේ ද, සම්දිටු වේ ද?

ලෝහිච්ච – මිසදිටු වේ.

8. බිඳුරජුහු – ලෝහිච්චයෙනි, මිසදිටුහට මරණින් පසු නිරය හෝ තිරිසන් ගතිය වේ යැ යි මම් කියමි. ලෝහිච්චයෙනි, යමෙක් 'ලෝහිච්ච බමුණා සාලවතිකා ගමට අදිපති වැ එහි උපදනා සියලු භෝග හුදෙකලා වැ තෙමේ ම වළඳා යැ' යි කියා නම්, හේ ඔබ නිසා රැකෙන්නනට හානි කරන්නේ, ඔවුනට ඇවැඩ කැමැත්තේ, එළැඹ සිටි වෙර ඇත්තේ මිසදිටු වෙයි. එසේ ම උසස් ගුණ ලත් මහණකු හෝ බමුණකු විසින් මෙරමාට එය නො කියැ යුතු යැ සි ද, එයින් මෙරමාට වන වැඩෙක් නැතැ යි ද, හේ පොරණ බැම්ම සිඳ අළුත් බැම්මෙකින් බැඳෙන්නක්හු වැන්නැ යි ද, ඔහු ගේ ඒ ක්‍රියාව ලෝභයෙන් කැරෙන්නෙකැ යි ද, එකකු තව එකකුට කළ හැකි වැඩෙක් නැතැ යි ද කියන තැනැත්තේ වනාහි මෙ සස්න වැද මඟ පල පසක් කරන කුලපුත්-නට ද, දන් ඈ පින් කෙරෙමින් දෙව්ලෝ යන පිළිවෙත පුරන කුලපුත්නට ද ලාභාන්ත-රායකර එකෙකි, අවැඩ පතන සතුරෙකි. එහෙයින් මිසදිටුවෙකි. මිසදිටුහට නිරය හෝ තිරිසන්යොන මරණින් මතු ගතිය වේ යැ යි කියමි.

තව ද, පසේනදි රජුන් රටෙන් ලත් භෝග මුළුල්ල අනුනට නො දී තෙමේ ම වළඳා යැ යි කියන්නහු සේ ම, තමන් ලත් ගුණ ලොවට සැළ කොට අනුසස්නහු ගේ ඒ ක්‍රියාවට දෙස් නගන්නේ ද ගුණදම් වඩනුවන් ගේ මාගීසම්පත් ඵල-සම්පත් දිව්‍යසම්පත් යන මේ හැමට හානි කරන, අවැඩ කැමැති සතුරෙකි, මිසදිටුවෙකි, නිරයට හෝ තිරිසන් ගතියට කැප වූයෙකි.

9. ලෝහිච්චයෙනි, ලොවැ චෝදනා ලැබීමට සුදුසු සථරහු[209] තිදෙනෙකි:

රහත්බව පතා පැවිදි වැ තමා පැතූ පලය නො ලැබ ම ලොවට දහම් දෙසන කෙනෙක. මොවුන් බසට සව්වෝ නො නැමෙත්. 'තමන් බස නො ගන්නා පිරිසක් සව්වන්

209. සථරහු = ශාසතෘහු

කැරැ ගන්නට තතනන ඔබේ මේ ක්‍රියාව ලෝභයෙන් කැරෙන එකෙකැ' යි ද, 'මෙරමාහට මොනා අනුශාසන දෑ?' යි ද, 'තමන් පළමු කොට පැතූ ඵලයට පැමිණිය යුතු යැ' යි ද, ඒ සථරහට චෝදනා කළ යුතු වෙයි. මේ චෝදනා ලැබියැ යුතු සථර (ශාස්තෘ) කෙනෙකි.

10. තව කෙනෙක් අක් පල පතා ගිහිගෙන් නික්මැ ගොස් එය නො ලබා ම ලොවට අනුශාසන කෙරෙති. අනුවැ යන්නෝ ද, ඔහු බස නො පිළිගනිත්. ඒ සථරහට "ඔබ තමන් පැතූ අක් පල නොලැබ සව්වනට අනුශාසන කෙරෙති. ඔහු ද එය පිළිගනිත්. ඔබ සිය කෙත වල්බිහි වියැදී අනුන් කෙත්හි වල් උදුරන්නට සිතන සේ ය. ඔබ මේ පැවැත්ම ලෝභගතියෙක ඔබ මෙරමාහට කුම් කෙරෙත් දෑ?'යි චෝදනා ලැබියැ යුතු හ. මේ ද චෝදනා ලැබියැ යුතු සථර කෙනෙකි.

11. තව කෙනෙක් ගිහි ගෙන් නික්මැ අක් පල ලැබ මෙරමාහට දහම් දෙසත්. ඔහු සව්වෝ වූ කලි ඔවුන් දහම මොනොවට නො අසත්, නො ම පිළිපදිත්. මෙබඳු සථරහු 'පරණ බැම්මක් සිඳැ අළුත් බැම්මක් කරනුවන් සේ සව්වන් හික්මවන සැටි නො දන මොවුන් මේ කරනුයේ ලෝභ ගතියෙනැ'යි ලෝවැස්සා කරන චෝදනාවට ලක් වෙති.

මොහු විනාහි චෝදනා ලැබිය යුතු සථරහු ය.

ලෝහිච්ච – චෝදනා නොලැබියැ යුතු සථර කෙනෙකුත් ලොවැ ඇත් ද?

බුදුරජුහු – ඇත, ලෝහිච්චයෙනි

ලෝහිච්ච – ඒ කවුරු යැ?

බුදුරජුහු ලොවැ ලොවුතුරා බුදුකෙනෙක් පහළ වෙත් කුලපුතෙක් ඔබ දහම් අසා පැවිදි වැ සිල් ඇක බවුන් වඩා පිළිවෙළින් පළමු දෙවෙනි තෙවෙනි සිවුවන දහන් ලබයි, විවසුන් ද වඩා රහත් වෙයි.[210] මෙසේ දහන්හි ද, උඩත්-පිරිසෙයින් රහත්බව්හි ද සව්වන් හික්මවන සථරහු චෝදනා ලැබියැ යුතු නො වෙති. ඔවුනට නගන චෝදනා නොසබා ය, නොදැහැමි ය.

210. යටැ සාමඤ්ඤඵල සූත්‍රයෙහි කී සේ ම රහත් බව තෙක් ම සුළු සිල් ඈ සියළු පිළිවෙත විසතරයෙන් ගත යුතු.

13. **ලෝහිච්ච** – වහන්ස, නරාවලෙක වැටෙන්නක්හු හිසකෙසින් ගෙන ඔසොවා ගොඩැ ලන්නවුන් සේ, පින්වත් ගොයුම්‍ාණන් වහන්සේ අවානරායෙහි වැටෙන සේ වැ සිටි මා ඔසොවා ගොඩැ ලූ සේක. වහන්ස, දහම් පැවැසුවා මැනැව, ඉතා යහපත, යටිකුරු දැයක් උඩුකුරු කරනුවන් සේ........ පින්වත් ගොයුම්‍ාණන් වහන්සේ නොයෙක් කරුණින් මට දහම් පැවැසූ සේක. ඒ මම් පින්වත් ගොයුම්‍ාණන් වහන්සේ ද දහම් ද සඟන ද සරණ යෙමි. අද පටන් කොට දිවි හිමියෙන් තෙරුවන් සරණ ගිය උවසක්හු කොට පින්වත් ගොයුම්‍ාණන් වහන්සේ මා සලකන සේක් වා.

[ලෝහිච්ච බමුණා ගේ මිසදිටුව ද, ගැරහුමට ලක් වන නොවන ශාස්තෘහු ද මෙහි දක්වුණහ.]

---

13. තේවිජ්ජ සූත්‍රය

එක් සමයෙක බුදුරජ්හු මහත් මහණමුළුවක් හා කොහොල් රටැ සැරි සරනුවෝ **මනසාකට** නම් බමුණු ගමට වැඩ, එයට නොදුරු නොළඟැ එහි උතුරුදෙසැ **අචිරවතී** නදියැ තෙරැ අඹ වෙනෙහි වෙසෙති.

2. එ සමයෙහි **චඞ්කී තාරුක්ඛ පොක්ඛරසාදි ජානුස්සෝණි තෝදෙය්‍ය** ආදි අදිපති බමුණෝ[211] වේදසජ්ඣායනය පිණිස එහි අවුත් වෙසෙති. දවසෙක ජංඝාවිහරණයෙහි[212] යෙදුණු, ඔබ මොබ සක්මන් කරන **වාසෙට්ඨ භාරද්වාජ** යන බමුණු මණෝව්වන් දෙදෙනා අතරැ බඹා හා

---

211. චංකී බමුණු ඕපසාද ගමැ වැසියෙකි. තාරුක්ඛ ඉච්ඡානංගලනගරවාසියෙකි. පොක්ඛරසාදි උක්කට්ඨානගරවාසියෙකි ජානුස්සොණි සැවැත් නුවර වැසියෙකි තෝදෙය්‍ය තුදී ගම්වැසියෙකි. මොවුන් එහි අවුත් සිටියේ ආලම්බනමන්ත්‍ර සජ්ඣායනයට ය. ආලම්බන යනු හඬ නො නඟා මැතිරියැ යුතු මතුරැ වෙසෙසකි. සෙස්සන් එනු නොදී රහසේ මෙය දපති. යෝගීන් ආත්මාවබෝධය පිණිස කරන සමාධි භාවනාවෙක් ද ආලම්බන නමින් වැහැරුවේ

212. ජඞ්ඝාවිහරණ නම් කෙංඩා රිදෙනු වළක්වනුවට සක්මන් කරනුයි. එක් තැන ම හුන්නහු කෙංඩා රිදෙයි. එ බැවින් ව්‍යායාම වශයෙන් ඔහු අචිරවතී නදිය අද්දරැ සක්මන් කළහ.

එක් වන මඟ ඇරැබෑ කතා පහළ විය. එක් මතයෙකැ පිහිටියැ නො හැකි ඔහු බුදුරජුන් වෙත ආහ. අවුත් පිළිසඳර කතා කොට පසෙක හිඳ තමන් අතරැ උපන් කතාව සැළ කළහ. එයින් ඔවුන් හා බුදු රජුන් ගේ කතාව ඇරැඹිණ.[213]

3. **බුදුරජුහු** – වාසෙට්ඨයෙනි, **පොක්ඛරසාදි** බමුණුහු දෙසූ මඟ ම බඹා හා එක් වන නොවක් උපාය යැ යි තෙපි කියහු. මේ භාරවාජයෝ **තාරුක්ඛ** බමුණා දක් වූ මඟ ම බඹා හා එක් වන නොවක් උපායයැ යි කියති. මෙසේ කි තොප ගේ විවාදය කවර කරුණෙක්හි ද?

වාසෙට්ඨ – පින්වත් ගොයුමාණන් වහන්ස, අප විවාදය මඟ නොමඟ හැරැබ ය. **අඩරියබ්‍රාහමණ තිත්තිරිය බ්‍රාහමණ ඡන්දොක බ්‍රාහමණ බව්හිරිය බ්‍රාහමණ** යන මේ නොයෙක් කොටස්වලට අයත් බමුණෝ[214] නොයෙක් මං දක්වති. ඒ එකෙක් අනෙකට වෙනස් ය. එහෙත් ඒ සියලු මංහු බඹා හා එක්වනුවට පමුණුවත්නෝ ය. ඔහු. හැම නෛර්‍යාණිකහ.[215] ගමක් නියම්ගමක් අසලැ ඇති හැම මංහු ඒ ගම ඒ නියම්ගම තෙක් ම වැටී ඇත. එසේ ම අඩරියබ්‍රාහමණ ආදියේ දක්වෙන නන්වැදෑරුම් සියලු මංහු ම බඹා හා එක් වනුවට අනුවයන්නවුන් පමුණුවත්.

4 **බුදුරජුහු** – වාසෙට්ඨයෙනි, ඒ සියලු මාඟී ම නෛර්‍යාණික යැ යි කියවූ ද?

වාසෙට්ඨ – එසේ ය, පින්වත් ගොයුමාණන් වහන්ස... [බුදුරජුහු තෙවරක් ම අසා වාසෙට්ඨයා ලවා තෙ වරක් ම ප්‍රතිඥව කැරැවූහ.]

බුදුරජුහු – වාසෙට්ඨයෙනි, තුන් වේද දරන බමුණන් අතුරෙන් කිසි එකකුත් බඹහු සියැසින් දුටුවා ඇද්ද?

---

213 වාසෙට්ඨ යනු පොක්ඛරසාදිහු ගේ අතැවැස්සෙකි. භාරමාජ යනු තාරුක්ඛ (තාර්ක්‍ෂ්‍ය) බමුණා ගේ අතැවැස්සෙකි. 214. අඩරිය = අධ්වර්‍යු, තිත්තිරිය = තෛත්තිරිය, ඡන්දොක = ඡාන්දොග්‍ය. බව්හරිය = බහ්වෘක, විස්තර උපග්‍රන්ථයේ බලනු 215. නෛර්‍යාණික = නිර්යාණය (මෝක්‍ෂය අතට නික්ම'යනු) පිණිස පවත්නා.

වාසෙට්ඨ - එසේ දුටු එකෙක් නැත.

බුදුරජුහු - කිම, ඒ තෙවිදු දත් බමුණන් ගෙන් කිසි එක් ඇදුරෙක් හෝ ඇදුරක්හු ගේ ඇදුරෙක් හෝ සියැසින් බඹා දුටුයේ ද?

වාසෙට්ඨ - නැත, ගොයුමන් වහන්ස.

5. **බුදුරජුහු** - කිම, තෙවිදු දතුවන් පෙර පුරිස් වූ මතුරු බැන්ද **අට්ඨක වාමක වාමදේව වෙස්සාමිත්ත යමතග්ගි අංගිරස භාරද්වාජ වසිට්ඨ කස්සප භගු**[215] යන ඉසිවරු හෝ බඹහු ඉන්නා තැන් ආදිය තමන් දන්නා බව් කීහු ද?

වාසෙට්ඨ - නැත, පින්වත් ගොයුමාණන් වහන්ස.

බුදුරජුහු - වාසෙට්ඨයෙනි, මෙසේ තෙවිදු දත් බමුණෙක් හෝ ඔවුන් කිසි එකක්හු ගේ ඇදුරෙක් හෝ උන් ගේත් ඇදුරෙක් හෝ සියැසින් බඹහු දුටුයෙක් නැත. ඔවුන් ගේ වේද මතුරු රුසැයූ **අට්ඨකවාමදේවාදි** ඉසි කෙනෙක් ද බඹා සියැසින් දුටු නියාවක්, ඔහු ඉන්නා තැන් ආදියක් දත් නියාවක් නො කීහ. එසේ කලැ තෙවිදු දත් බමුණෝ 'අපි තමන් නො දන්නා බඹහු හා එක් වනුවට මඟ දක්වමු' යි ද, 'මේ ම එයට නොවක් මඟැ' යි ද කියත්. මෙසේ කලැ පිළිමලුන් ගේ විරුඬ කථාවනට උත්තර දී මිදී ගන්නට ඔහු නොහැකි වන්නාහ. ඔවුන් බස පිළිමලුන් ගේ පහරට ලක් වෙයි.

වාසෙට්ඨයෙනි, 'තමන් නො දන්නා නො දක්නා කෙනෙකුන් හා එක් වනුවට නොවක් මඟක් තෙවිදු දත් බමුණෝ දෙසති'යි කියත් නුමුත් එය නො වියැ හැක්ක.

එක් අඳකු ගත් සැරයටියේ කොන තවෙකෙක් දූයි, මෙ සේ සැරයටි කොනින් ගැන්මෙන් බැඳුණු අඬයන් වැලෙක මුලින් ම යන්නේ ද මඟ නො දකී. මැදින් යන්නෝ ද මඟ නො දකිත්. අගින් ම යන්නේත් මඟ නො දකී. තෙවිදු බමුණන් ගේ දෙසුම් ද මේ අඳ - වැලේ සැරයැටි ගැන්ම සේ වැඩකට නැති ලමා හිස් එකෙක් වැ පෙනේ. දෙගොත් මූදුනැ දී

215 මොවුන් ගැන විසතර උපග්‍රන්ථය බලා දතයුතු

බිමැ පෙරළෙමින් හිරුට සඳුට වැඳුම් පිදුම් කරන හියු දෙන යාග කරන තෙවිදු බමුණෝ සෙස්සන් සේ ම ඉරහඳත් ඔවුන් නැගෙන බස්නා සේ වැ පෙනෙන ඉමුත් දකිත් ද?

වාසෙට්ඨ – එසේ ය දක්නාහ.

6. **බුදුරජුහු** – කිම? එසේ හිරු සඳු නගිනා බස්නා ඉම් දත් පමණින් ඒ හිරු හා සඳු හා එක් වන්නට නො වක් මඟ දක්වනුයෙහි සමත් වෙත් ද?

වාසෙට්ඨ – මෙය නො වන්නෙකි, ගොයුමන් වහන්ස.

බුදුරජුහු – එසේ නම්, තමන් හෝ සිය ඇදුරු පැදුරු ආදීන් හෝ නොදුටු, තමන් ගේ වේමතුරු ගෙතු ඉසිවරුන් හෝ දත් බවක් දුටු බවක් නො පැවැසුණු, බඹා හා එක් වනුවට නොවක් මඟ දෙසම්හ' යි කියන තෙවිදු බමුණන් ගේ බස දුඹුත් නො වේ ද?

වාසෙට්ඨ – එසේ ය, උන් ගේ ඒ වචන දුබල බවට, නො පිළිගත යුතු බවට පැමිණේ.

7. **බුදුරජුහු** – තොප කිවා සරි ය. මෙසේ වූ තෙවිදු බමුණෝ බඹා හා එක් වනුවට මඟ පෙන්වත් යනු නො වියැ හැක්කෙකි.

වාසෙට්ඨයෙනි, 'රටේ ඉන්නා හොබනා ම වමිය රිසියෙමි' යි යමෙක් කියා නම්, සෙස්සන් ඔහු රිසියෙන ඒ වමිය ගේ තතු ඇසූ විට, 'ඇගේ කුලය සැටිය නම ගම යන මේ ඈ ඈය පිළිබඳ කිසි කරුණක් නො දනිමි' යි හේ කියා නම්, තමා නො දක්නා නො දුටු වමියක පතනා ඔහු ගේ 'මේ රටේ හොබනා ම වමිය රිසියෙමි' යි යන බස දුබල ලමා එකෙක. එසේ ම තමන් කිසිදු නො දක්නා බඹකු හා එක් වනුවට මඟ දෙසම්හ යි කියන තෙවිදු බමුණන් ගේ කතාව හිස් වෙයි, ලමා වෙයි.

තව ද 'පහයකට නගිමි' යි සිවුමංහන්දියෙක හිණක් කරන්නකු ගෙන් 'මෙය කුමට කරයි දැ?' යි සෙස්සන් විචාළ විට, 'පහයකට නගින්නට යැ' යි හේ කිය යි. 'ඒ පහය කොයි දැ?' යි විචාළ විට 'එය ඇති තැනක් හෝ එහි උස් මිටි පමණක් හෝ ඒ පිළිබඳ අන් කිසිත් හෝ නො දනිමි'යි ද, 'එහෙත් ඒ පායට නගින්නට මේ හිණ බඳිමි' යි ද හේ කියයි.

බඹහු නො දක්නා නො දුටු මේ තෙවිදුදර බමුණන් 'බඹා හා එක් වනුවට නොවක් මඟ දක්වමු' යි කියන බසත් ඒ නො දන්නා පාසට ඉණිමං බඳින්නහු ගේ කතාව බඳු ය. මෙසේ මේ තෙවිදුදර බමුණන් කියන බස ලාමක නො වේ ද?

වාසෙට්ඨ – ලාමක ය, ගොයුමන් වහන්ස.

9. **බුදුරජුහු** – පිරී දෙගොඬ තළා ගලන අචිරවතී නදියේ මෙ තෙරැ සිටියකු 'පින්වත් එ තෙර, මෙහි එව!' යි කොතරම් හඬ ගෑව ද, අයැදුව ද, පැතුව ද, තියු කළ ද, එයින් එ තෙර මෙ තෙර කරා එයි ද?

වාසෙට්ඨ – මෙය නො වන්නෙකි, ගොයුමන් වහන්ස.

බුදුරජුහු – එසේ ම තෙවිදුදර බමුණන් බමුණබව සිදු කරන දහම් හැර, නො බමුණුබව කරන දහම් සමාදන් කොටගෙන, **ඉන්ද්‍ර සෝම වරුණ ඊශාන ප්‍රජාපති බ්‍රහ්ම** යන මොවුනට අඬ ගෑමෙන් අයැදීමෙන් පැතිමෙන් තියු දීමෙන් 'බඹා හා එක් වනු සිදු වෙති' යනු නො වන්නෙකි. පිටිතල හයා දැඩි සේ බඳිනු ලැබූ මිනිසෙක් දෙගොඬ තළා ගලන මේ නදියෙන් එ තෙරට පිහිනනු සමත් වෙයි ද?

වාසෙට්ඨ – සමත් නො වෙයි, ගොයුමන් වහන්ස.

10. **බුදුරජුහු** – වාසෙට්ඨයෙනි, මෙ සස්නැ දැක්වෙන පරිදි පස්කම්හු සතුන් බඳනා බැඳුම් ය. 'එයින් බැඳුණා වූ ද, බමුණුබව කරන දහම් කෙරෙන් තොර වූ ද, නො බමුණුබව් කරන දැයින් යුත් වූ ද තෙවිදු බමුණෝ බඹා හා එක්වනුවට යෙති' යනු නො වියැ හැක්කෙකි. මෙ නදියෙන් එ තෙරට යනු රිසි ව අවුත් මෙ තෙරැ හිස වසා පෙරැවැ වැදූ හෙයි නම්, කිම? හේ නදියෙන් එ තෙරට යනු හැකි වෙයි ද?

වාසෙට්ඨ – මෙය නො වන්නෙකි, ගොයුමාණන් වහන්ස.

බුදුරජුහු – වාසෙට්ඨයෙනි, එසේ ම කාමච්ඡන්ද ව්‍යාපාද ථීනමිද්ධ උද්ධච්ච කුක්කුච්ච විචිකිච්ඡා යන නිවරණ පසින් ඇවුරුණු බැඳුණු මැඬුණු

බමුණුබව් කරන දහමුත් ගෙන් තොර වූ. නො බමුණුබව් කරන ගති පැවැතුම් ඇති තෙවිදුදර බමුණෝ මරණින් මතු බඹු හා එක්වනුට යෙති' යනු නො කරුණෙකි, නොවියැ යුත්තෙකි. වාසෙට්ඨයිනි, කිම? තොප වැඩි සිටි ගුරුන් ගෙන් අසා ඇති පරිදි බඹ තෙම සත්‍රීපරිහරණය, වෛරය, වෙෂය, සිත කෙලෙසීම, සිතට වසඟබව යන මේ දූයින් යුතු ද? වියුතු ද?

වාසෙට්ඨ – ගොයුමින් වහන්ස, බඹ තෙම සත්‍රීපරිහරණාදියෙන් තොර ය.

බුදුරජුහු – තෙවිදුදර බමුණෝ එයින් යුතු ද, වියුතු ද?

වාසෙට්ඨ – ගොයුමින් වහන්ස, තෙවිදුදර බමුණෝ මේ දූයින් වෙන් වූවෝ නො වෙති. ඔහු මෙයින් යුතුවෝ ය.

බුදුරජුහු – ඒ සත්‍රීපරිහරණාදියෙන් යුක්ත තෙවිදුදර බමුණෝ ඒ සියල්ලෙන් වෙන් වූ බඹහු හා ගැළැපෙත් ද?

වාසෙට්ඨ – නො ගැළපෙත්, ගොයුමින් වහන්ස.

බුදුරජුහු – එසේ නම්, 'සත්‍රීපරිහරණාදියෙන් යුක්ත, එ ගෙයින් ම බඹු හා නොගැළැපෙන, තෙවිදුදර බමුණෝ තමන් හා නොගැළපෙන ගති ඇති බඹු හා එකතුවට මරණින් මතු පැමිණෙත්' යන්න නොකරුණෙකි, නොවන දූයෙකි. වාසෙට්ඨයෙනි, මේ තෙවිදුදර බමුණෝ බඹලොවට මඟැ යි නො මඟෙකින් ම යන්නාහු, නොනුවණෙහින් මිසදිට්හිත් ගැලෙති. එසේ ගැලී හෙව 'සුව ඇති බිමකට නැඟෙමු'යි පතනුවෝ නොමඟින් යන්නෝ දූකි ආයාසයට පැමිණෝත්. එහෙයින් මේ තෙවිදුදර බමුණන් 'බඹු හා එක්වන්නට මඟැ' යි දක්වන දහම මහ ලැහැබෙකි, මහ තොටක් නැති දිය නැති වනයෙකි. තෙවිදු හදුරනුවනට දුක් දෙන වැසනයෙකි.

වාසෙට්ඨ – පින්වත් ගොයුමාණන් වහන්සේ බඹු හා එක් වනුවට මඟ දන්නා සේකැ යි මා අසා ඇත.

බුදුරජුහු – වාසෙට්ඨය, මනසාකට ගම මෙයට නොදුරෙහි නො වේ ද?

වාසෙට්ඨ – එසේ ය, නොදුරෙහි ය, ගොයුමාණන් වහන්ස.

බුදුරජුහු – කිම? මනසාකට ගමැ උපන් එහි වැඩුණු මිනිසකු එ ගමින් නික්මෙන්නා හා ම යමකු ඔහු වෙතින් එ ගමට මඟ විචාළොත් පළඹූ වැන්නා මඟ සිතමින් උත්තර දෙනුවට කල් ගෙවයි ද?

වාසෙට්ඨ – නැත, ගොයුමන් වහන්ස.

බුදුරජුහු – කවර හෙයින?

වාසෙට්ඨ – ඔහු එ ගමැ උපන් බැවින් එහි ම වැඩුණු බැවින් එහි මඟ තොට හොඳට දන්නා හෙයිනි.

බුදුරජුහු – එසේ ම තථාගතයනට බඹලොව හෝ බඹලොවට යන මඟ ඇරැබැ හෝ විචාළොත් ඒ ගැන සිතමින් කල් යවන බවෙක් නො වෙයි. වාසෙට්ඨයෙනි, මම් බඹහු ද දනිමි. බඹලොව ද දනිමි. එයට මඟ ද දනිමි. එ මඟින් ගොස් බඹලොවැ උපන්නවුන් ද දනිමි.

වාසෙට්ඨ – පින්වත් මහණ ගොයුමාණන් වහන්සේ බඹහු හා එක් වනුවට මඟ දෙසති යි මම් ඇසීමි. වහන්සේ එය කුළුණු පෙරදැරි වැ මට දක්වන සේක් වා. බමුණුදරු වූ මා අවාමඟින් ඔසොවා බඹලොව්මඟැ තබන සේක් වා.

15. **බුදුරජුහු** – වාසෙට්ඨයෙනි, අසාගන්න. මොනොවට සිතැ තබා ගන්න. එය තොපට පවසන්නෙමි.

වාසෙට්ඨ – එසේ ය, ගොයුමාණන් වහන්ස.

බුදුරජුහු – බුදුරජෙක් ලොවැ පහළ වැ දහම් දෙසයි. කුලපුතෙක් එයසා පැහැද, පැවිදි වැ, සුළුසිල් මැදුම්සිල් මහසිල් යන තුන්වැදැරුම් සිල් රකිනුයේ සිවුපිරිසිදු සිල් සපුරා, සතිසම්පජඤ්ඤ-යෙන් ද යථාලාභසන්තොෂයෙන් ද යුත් වැ සමාධි වඩා කාමච්ඡන්දාදි නීවරණ දුරු කෙරෙයි. තමා නීවරණ දුරු ලූවා දක්නා ඔහු සිතැ

සතුට වේ. සතුටු සිතැත්තේ ප්‍රීත වේ. ප්‍රීතයහු ගේ නම්කය සංසිඳේ. නම්කය සංසුන් වූවාහට සුව ඇති වේ. සුවපත්තහු සිත එකඟ වේ.[217] එසේ වූ හෙ තෙම එක් දිගෙක ද තව දිගෙක ද යි මෙසේ පිළිවෙළින් සදික්හි ම, මුළුලොව්හි ම, හැම සතුන් කෙරෙහි මෙත් පතුරුවා දෑහැනින් යෙදී වෙසෙයි. කාබලැති සක්පුඹුවකු ලෙහෙසියෙන් ම සිවු දිග ම විහිදූ යන පරිදි සක පුඹුනා සේ, හේ හැම දික්හි පහසුයෙන් ම මෙත් පතුරුවයි. මෙසේ නැංවූ මෙත් දහන් බෙලෙන් හේ කම්වැදූරි කමුන් ගේ බල මැඩ මරණින් මතු බඹලොවැ උපදනේ ය. මේ බඹා හා එක් වන මඟෙක.

තව ද, කරුණා මුදිතා උපේක්ෂා යන එක එකකුත් සට කී පරිදි ම වඩා දහන් ලැබ වසනුයේ ද සිය රූඅරූ දහන්කම් බෙලෙන් කම්වැදූරිකමුන් බල[218] මැඩ මරණින් මතු බඹලොව්හි උපදනේ ය. මේ එක් එක් (කරුණාදි) අප්‍රමාණ්‍යයක් වඩනු බඹලොවට මඟ ය, බඹා හා එක්වනුවට මඟ ය. වාසෙට්ඨය, මෙසේ මේ බඹවෙහෙර ඇති මහණ සත්‍රීපරිග්‍රහ වෛර ව්‍යාපාද කිලිටිසිත් යන මේ කිසිත් නැත්තේ ය, වශවර්තී (තමා වශයෙහි සිය සතන් පවත්වත්නේ) ය. මෙසේ වූ හෙ තෙම බඹා හා ගැළැපේ ද? නො ගැළපේ ද?

වාසෙට්ඨ – ගැළැපෙයි, ගොයුමාණන් වහන්ස.

බුදුරජුහු – වාසෙට්ඨයෙනි, මෙසේ කලැ සත්‍රීපරිහරණ වෛරව්‍යාපාදදියෙන් දුරු වූ වශවර්ති වූ ඒ මහණ එසේ ම සත්‍රීපරිහරණාදියෙන් දුරු වූ බඹා හා එක්වීම සිදු වන දෑයෙකි.

---

217. සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් පරිදි යි 218. මෙත්දහන් යනු ද මෙත්සිත්මිදුම (මෙත්තාචේතෝවිමුත්ති) යනු ද අපිණාව ම ය. මෙතැ ශි (පමත්තා ශි) කී කලැ උපචාරඅපිණා දෙක ම ගැනේ. මෙත්දහන් අප්‍රමාණ සේ වඩන ලදුයේ අසීම වේ. එ සෙයින් එයින් සසීම (කාමාවචර) කම් මැඩ ඊළඟ භවයෙහි ප්‍රතිසන්ධිදනයට තමාට ඉඩ ගනී. කරුණා මුදිතා උපේක්ෂා යන තුන්බඹවෙහෙර ද මෙසේ ම ය.

මෙසේ වාසෙට්ඨ භාරද්වාජ දෙදෙනා දහම් දෙසූ තියා මැනැවැ යි පසසා, තෙරුවන් සරණ ගියහ

[වේදයෙහි ආ යාගහෝම බඹලොව් මඟ නොවන බව, බමුණන් බඹා වත් බඹා හා එක් වන මඟ වත් නොහඳුනනා බව සතරබඹවෙහෙර ම බඹා හා එක් වන මඟ බව යන මොහු මෙහි දැක්වුණහ.]

මහා වග්ගය

14. මහාපදාන සූත්‍රය

එක් සමයෙක්හි භගවත් බුදුරජුහු සැවැත් නුවර නිසා දෙව්රම ළුණුවරණකිළියෙහි[219] වෙසෙති. එ සෙමෙහි දිනෙක පස්වරුයෙහි හිඳුම්හලැ රැස් වැ හුන් වහන්දූවරුන් අතරැ බුදුරජුන් ගේ පෙර දැ දක්නා නුවණ ඇරැබ කතාවෙක් පහළ විය. බුදුරජුහු ඔවුන් කතාව දිවකනින් අසා වදරා එහි වැඩියහ. පණවා තුබුණු අස්නැ වැඩහිඳ 'දූත් මහණෙනි, කවර නම් කතාවෙකින් හුන්නහු ද? කිනම් කතාවෙක් අඩාළ වී දැ?' යි අසාවදාළහ.

2. 'වහන්ස, බගවත් සාමිදරුවන්සේ ගේ පෙර දැ දක්නා නුවණ ඇරැබ කතා කරමින් උනුම්හ'යි ඔහු කිහ. "මහණෙනි, පෙරැ වුසුම පිළිබඳ දහම්කතාවක් අසනු රිසියහු දැ?"යි බුදුරජුහු අසාවදාළහ.

"එසේ ය, වහන්සැ"යි කියා එය දෙසනුවට ඔහු බුදුරජුන් අයැදූහ. බුදුරජුහු ද විපස්සී ආදි සත්බුදුවරුන් පවත් විතරින් වදාළහ.

[මෙහි එය සැකෙවින් දැක්වෙයි:]

3. **කාලපරිච්ඡේදය** –

මෙයින් යටැ එකානූවන කපැ **විපස්සී** නම් බුදුරජුහු ද, මෙයින් යටැ එක්තිස්වන කපැ පළමු අතුරුකපැ **සිඛී** නම් බුදුරජුහු ද, ඒ මහ කප්හි ම දෙවෙනි අතුරු කපැ **වෙස්සභූ** නම් බුදුරජුහු ද,

---

219. කරේරිකුටිකා යනු පෙළෙහි එන සැටි යි. කරේරි යනු ළුණු-වරණ ය එ කිළිය දෙරැ ළුණුවරණ රුකක් වූ බැවින් ඒ කරේරිකුටිකා (ළුණුවරණකිළි) නම් විය. දෙව්රමැ කරේරිකුටි කෝසම්බකුටි ගන්ධකුටි සළලඝර යැ යි මහ කිළි සතර දෙනෙක් වූහ. සළලඝරය පසේනදි කොසොල්රජු විසින් කැරැවිණ. සෙසු තුන අනෙපිඩුසිටුහු විසින් කැරැවිණ. කරේරිකුටිය කණුඋඩැ කැරැවුණෙකි.

මේ මහබදුරු කප්හි පළමු අතුරු කපෑ **කකුසඳ** නාම් බුදුරජුහු ද, දෙවෙනි අතුරුකපෑ **කෝණාගමන** නම් බුදුරජුහු ද තෙවෙනි අතුරු කපෑ **කස්සප** නම් බුදුරජුහු ද, සිවුවන මේ අතුරු කපෑ මම් (ගොයුම්බුදුරජුහු) ද යි සතර දෙනෝක් බුදුරජුහු ය.

4. ජාතිපරිච්ඡේදය –

ඔබ හැම අතුරෙන් විපස්සී බුදුරජුහු කැත්කුලයට අයත් වූහ. **සිඛී වෙස්සභූ** යන දෙ බුදුරජුහුත් කැත්කුලයට අයත් වූහ.

කකුසඳ කෝණාගමන කස්සප යන බුදුරජුහු බමුණු කුලයට අයත් වූහ.

මම් (ගොයුම් බුදුරජුහු) කැත්කුලයට අයත්මි.

5. ගෝත්‍රපරිච්ඡේදය –

විපස්සි සිඛී වෙස්සභූ යන තුන් බුදුරජුහු **කොණ්ඩඤ්ඤ** නම් පෙළපතට අයත් වූහ.

කකුසඳ කෝණාගමන කස්සප යන තුන් බුදුරජුහු **කසුප්** පෙළපතට අයත් වූහ.

මම් (ගොයුම් බුදුරජ) ගොයුම් පෙළපතට අයත්මි.

6. ආයුෂ්පරිච්ඡේදය –

විපස්සි බුදුරජුනට පරමායු වස් අසූදහසෙකි.

සිඛී බුදුරජුන් පරමායු වස් සැත්තෑ දහසෙකි.

වෙස්සභූ බුදුරජුන් පරමායු වස් සැටදහසෙකි.

කකුසඳ බුදුරජුන් පරමායු වස් සතළිස්දහසෙකි.

කෝණාගමන බුදුරජුන් පරමායු වස් තිස්දහසෙකි.

කස්සප බුදුරජුන් පරමායු වස් විසිදහසෙකි.

මට (ගොයුම් බුදුරජුනට) පරමායු අල්ප ය.

මෙ සමයෙහි වැඩි ම කලක් ජීවත් වනුයේ හවුරුදු සියයක් හෝ එයට මඳක් වැඩි කල් හිඳී.[220]

---

220. දිගා ඇතියෝ මෙ කාලෑ දුලබ්හ. විශාඛාඋපාසිකා, පොක්ඛරසාදි බමුණු, බ්‍රහ්මායු බමුණු, සේල බමුණු, පාවාරිය සිටු, අනඳ තෙරණුවෝ, මහසුප් තෙරණුවෝ යන මොහු හවුරුදු 120 ක් ද, අනුරුත් තෙරණුවෝ 150 ක් ද, බක්කුල තෙරණුවෝ 160 ක් ද ජීවත් වූහ.

7. **බෝධිපරිච්ඡේදය** -

විපස්සී බුදුරජුහු **පලොල්** රුකක් මුලැ ද, **සිඛී** බුදුරජුහු **ඇටඹ** රුකක් මුලැ ද, **වෙස්සභූ** බුදුරජුහු **සල්** රුකක් මුලැ ද, **කකුසන්ධ** බුදුරජුහු **මහරි** රුකක් මුලැ ද, **කෝණාගමන** බුදුරජුහු **දිඹුල්** රුකක් මුලැ ද, **කස්සප** බුදුරජුහු **නුග** රුකක් මුලැ ද බුදු වූහ. ගොයුම් බුදු නම් වූ මම් **ඇසතු** රුකක් මුලැ බුදු විමි.

8. **අග්‍රශ්‍රාවකපරිච්ඡේදය** -

විපස්සී බුදුරජුන් ගේ **ඛණ්ඩ තිස්ස** නම් අක්සවු දෙනමෙකි. **සිඛී** බුදුරජුනට **අභිභූ සම්භව** යි දෙ නමෙකි. **වෙස්සභූ** බුදුරජුනට **සෝණ උත්තර** නම් දෙ නමෙකි. **කකුසන්ධ** බුදුරජුනට **විධුර සඤ්ජීව** නම් දෙ නමෙකි. **කෝණාගමන** බුදුරජුනට **භියොස උත්තර** නම්. දෙ නමෙකි. **කස්සප** බුදුරජුනට **තිස්ස** භාරද්වාජ නම් දෙ නමෙකි. මට **සාරිපුත්ත මොග්ගල්ලාන** නම් අක්සවු දෙ නමෙකි.

9. **ශ්‍රාවකසන්නිපාත** -

විපස්සී බුදුරජුන් ගේ ශ්‍රාවකසන්නිපාත (සව්වන්ගේ මහ රැස්වීම්) තුනෙක. එයින් පළමු වැන්නෙහි සව්වෝ එක්සිය සැටි දහසෙක. දෙවැන්නෙහි එක්සිය දහසෙක, තෙවැන්නෙහි අසූදහසෙක.

සිඛී බුදුරජුන් ගේ ශ්‍රාවකසන්නිපාත තුනෙක. එයින් පළමුවැන්නෙහි සව්වෝ එක්සිය දහසෙක, දෙවැන්නෙහි අසූ දහසෙක, තෙවැන්නෙහි සැත්තෑදහසෙක

වෙස්සභූ බුදුරජුන් ගේ ශ්‍රාවකසන්නිපාත තුනෙක. එයින් පළමුවැන්නෙහි සව්වෝ අසූදහසෙක, දෙවැන්නෙහි සැත්තෑ දහසෙක, තෙවැන්නෙහි සැටදහසෙක.

කකුසන්ධ බුදුරජුන් ගේ ශ්‍රාවකසන්නිපාත එකෙක. එහි සව්වෝ සතළිස්දහසෙක.

කෝණාගමන බුදුරජුන් ගේ ද ශ්‍රාවකසන්නිපාත එකෙක. එහි සව්වෝ තිස්දහසෙක.

කස්සප බුදුරජුන් ගේ ශ්‍රාවකසන්නිපාත එකෙක. එහි සව්වෝ විසිදහසෙක.

මගේ (ගොයුම් බුදුරජුන් ගේ) ශ්‍රාවකසන්නිපාත එකෙක. එහි සව්වෝ එක්දහස්දෙසිය පනසෙක.

10. **අග්‍රශ්‍රාවකයුගලයා** –

විපස්සී බුදුරජුන් අක්ළවටු **අශෝක** නම් තෙරණුවෝ ය.

සිඛී බුදුරජුනට **ඛෙමංකර** නම් තෙරණුවෝ ද, **වෙස්සභූ** බුදුරජුනට **උපසන්ත** නම් තෙරණුවෝ ද, **කකුසන්ධ** බුදුරජුනට **බුද්ධිජ** නම් තෙරණුවෝ ද, **කෝණාගමන** බුදුරජුනට **සොත්ථිජ** නම් තෙරණුවෝ ද, **කස්සප** බුදුරජුනට **සබ්බමිත්ත** නම් තෙරණුවෝ ද අක්ළවටු වූහ. මට (ගොයුම් බුදුරජුනට) **ආනන්ද** නම් තෙරණුවෝ අක්ළවටු වෙති.

11. **මාතා පිතෘ නගර** –

විපස්සී බුදුරජුන් පියාණෝ බන්ධුමත් රජ ය, මවු බන්ධුමතී දේවී ය, රජදහන බන්ධුමත් නුවර ය. **සිඛී** බුදුරජුන් ගේ පියාණෝ **අරුණ** නම් රජ ය, මවු අරුණවතී දේවී ය, රජදහන අරුණවතී නුවර ය. **වෙස්සභූ** බුදුරජුන් ගේ පියාණෝ **අනුපම** නම් රජ ය, මවු **යසවතී** දේවී ය, රජදහන **සුපත්ත** නුවර ය.

කකුසන්ධ බුදුරජුන් ගේ පියාණෝ **අග්ගිදත්ත** නම් බමුණු ය, මවු විසාඛා නම් බැමිණී ය, රජදහන **ඛෙමවතී** නුවර ය. එහි අදිපති **ඛෙම** නම් රජ ය.

කෝණාගමන බුදුරජුන් ගේ පියාණෝ **යඤ්ඤදත්ත** බමුණාණෝ ය, මවු **උත්තරා** නම් බැමිණී ය. රජදහන **සෝභවතී** පුරය ය. එහි අදිපති **සෝභන** නම් රජු ය. **කස්සප** බුදුරජුන් ගේ පියාණෝ **බ්‍රහ්මදත්ත** බමුණු ය. මවු **ධනවතී** බැමිණී ය, රජදහන බරණැස් නුවර ය, එහි අදිපති **කිකී** රජ ය.

මා **පියාණෝ** **සුද්ධෝදන** රජ ය, මවු **මායා** දේවී ය, රජදහන **කපිලවත්‍ථු** පුරය ය.

12. බුදුරජුහු මෙ පවත් විතරින් වදාරා නැඟී වෙහෙර වත්හ. එයින් නොබෝ වේලෙහි වහන්දූ අතර "ඇවැත්නි, ඒ බගවත්හු මෙ නම් මෙ නම් දූ ගොත් ආ-පමණ අක්සවු ඇත්තෝ වූහ යි, මෙසේ වූ මහ සවුමුළුදෙවනු (මහාශ්‍රාවක සන්නිපාත) ඇත්තෝ වූහ යි ඉකුත් කල්හි වූ බුදුවරුන් ගේ තතු දක්නා බගවත් සාමිදරුවන් වහන්සේ ගේ මහ නැණ-තෙදස - මහ ඉදුමත්බව අසිරි ය, පුදුම එළවන සුලු ය. යම්

දහම්දෑවක්[221] පිළිවිදි බැවින් ඔබ ඒ බුදුවරුන් ගේ ඉකුත්වත් තුමූ ම දුටුවෝ ද? නැතහොත් කිසි දේවතා කෙනෙක් මෙ පවත් ඔබට කිවූ දෑ?" යි මෙසේ කතාවෙක් උපන.

13. මේ කතාව අඩාල කල්හි ම බුදුරජුහු සමවතින් නැඟී සිටැ එහි වැඩියහ. පණවා තුබූණු අස්නැ වැඩහුන්හ. ඉක්බිති 'තෙපි දැන් කවර කතාවෙකින් උන්හු දෑ?" යි අසා වදරා, මෙ නම් කතාවෙකිනැ යි වහන්දෑවරුන් කී කලැ, "මහණෙනි, ඒ ඉකුත් කල්හි වූ බුදුවරුන් ගේ ජාති ආදි සියලු පවත් දක්නා දහම්දෑව තථාගතයන් විසින් ම මොනොවට පිළිවිදුනා ලද්දේ ය. මහණෙනි, ඉකුත් කල්හි වූ දෑ පිළිබඳ දහම් කතාවක් අසනු රිසියහු දෑ?" යි වදරා, 'එසේ යැ, වහන්සැ'යි ඔවුන් කී කලැ මතු දැක්වෙන ඉකුත් වත් වදළහ.

14. මහණෙනි, මෙයින් යටැ එක්අනූ වන කපැ **විපස්සී** සම්මාසම්බුදුරජුහු ලොවැ පහළ වූහ. ඔබ දැයින් කැත් වූහ. ගොතින් කොණ්ඩඤ්ඤ වූහ. ඔබ ආයු පමණ හවුරුදු අසූ දහසෙක. ඔබ පළොල් රුක් මුලැ බුදු වූහ. ඔබ අක් සවු යුවල **ඛණ්ඩ** තෙරණුවෝ ද **තිස්ස** තෙරණුවෝ ද වූහ. ඔබ ගේ මහ සවු-මුළුදෙවුම් තුනෙක. එයින් පළමුවැන්නෙහි එක් සිය අටසැට දහසක් රහත්හු වූහ, දෙවැන්නෙහි සියදහසෙක් ද, තෙවැන්නෙහි අසූදහසෙක් ද රහත්හු වූහ. ඔබ අක් උවටු **අසෝක** නම් තෙර කෙනෙක.

ඔබ පියාණෝ බන්ධුමත් නම් රජ් ය, මවු බන්ධුමතී දේවී ය. රජදහන බන්ධුමතී නගරය ය.

මහබෝසත්හු තුසී දෙව්ලොවින් සැවැ සිහිනුවණැතී වැ මවු කුසැ පිළිසිඳ ගතිති. මේ ධම්තා ය (දහම් නියමයෙක)[222] 1

221. දහම්ද — ධම්ධාතුව. ධර්‍මයන් ගේ සවභාවය ධම්ධාතු නම. ධම්ධාතු යනු චතුස්සත්‍ය යැ යි දික්සඟිවිකාව කළ ධම්පාල තෙරුන් ගේ මතය යි 'බුදුරජුහු වාසනා සහිත සියලු කෙලෙස් වැනැසූවාහ එහෙයින් මේ ධම්ධාතුව මොනොවට පිළිවිදූහ. එබැවින් සර්‍වඥතාඥාන දශබල-ඥානාදි සියලු බුදුගුණ පහළ විය. රහත්බව ධම්ධාතු නමැ යි කිසි ඇදුරෝ ද, සර්‍වඥතාඥානය ධම්ධාතු නමැ යි අන් ඇදුරැ කෙනෙක් ද, කියත්' යනු ටීකායෙහි සඳහන් වේ.

222. 'ධම්තා' යනු කම් චිත්ත සෘතු බීජ ධම් යන නියාම පසින් ධම්නියාමය යි. මේ නියාමධම් නියාමදීපනී ආදියෙහි සවිස්තර ව දක්වා තිබේ .

15. බෝසතුන් මවු කුසැ පිළිසිඳ ගත් කොහොහි දෙවියන් ගේ දෙව් තෙද ද මැඩ, හිරුසඳුන් එළිය ද වැද්ද නො හෙන ලෝඇඳිරි නිරය ද[223] එකලු කෙරෙමින් මහ එළියෙක් පහළ වෙයි. ඒ එළියෙන් එහි සත්හු උනුන් දක්නෝ තමන් හැර තව ද සත්හු එහි ඇතැ යි දැනැ ගනිති. මේ දසදහසක් ලෝදා වෙවුලයි.[224] මේ ද දහම්නියමයෙක. ii

ඒ බෝසතුන් මව කුසැ පිළිසිඳ ගත් කලැ ඔබට ද ඔබ මවට ද රකවලට සිවුවරම් දෙව්රජ්හු සිවුදිගැ සිටිති.[225] මේ ද දහම්නියමයෙක. iii

බෝසත් මව නිසඟින් ම සිල්වත් ය. බෝසතුන් සිය කුසැ ඔත් පසු එයට පෙරැ සේ අන් තවුසක්හු හෝ පිරිවැජ්ජක්හු වෙතින් සිල් නො ගෙනැ, තොමෝ මැ ං සිල් ඉටා ගන්නී ය.[226] මේ ද දහම් නියමයෙක. iv

බෝසතුන් කුසැ ඔත් පසු ඔබ මවට පිරිමියකු අරමුණු කොට සරාග සිතෙක් නො උපදී. කිසි පිරිමියකු විසිනුත් සරාග සිතින් ඇය වෙත ළං වියැ හැකි ද නො වේ.[227] මේ ද දහම්නියමයෙක. v

බෝසතුන් කුසැ ඔත් පසු මවට කිසි දු ගිලන්බවෙක් නො වේ. ඕ හැම ලෙසින් සුව පත් වැ හිඳී වෙරෙළුම්ණෙකැ

---

223. 'ලෝඇඳිරිය' (ලෝකාන්තරික නිරය). තුන් තුන් සක්වළක් මැද ආකාශයේ පරිමාණයෙන් (වටින්) යොදුන් අට දහසක් පමණ තන්හි මෙය වේ. හිරුඑළිය නො වදනා එය බෝසත් පිළිසිඳගත් කොණෙහි වූ එළියෙන් මොහොතක් එකලු වෙයි. 224. පොළෙෝ සැලෙන හේතු අටෙකි. උපග්‍රන්ථය බලනු 225. එක් සක්වළෙහි සතර දෙනා බැගින් දසදහසක් සක්වළින් ආ සතළිස් දහසක් වරම් රජ්හු අරක්ගත්හ යි ද, මේ සක්වළැ වරම් රජ්හු කඩු ගෙන සිරිගහන් ගබ තුළැ ද සෙස්සෝ ගබඩා දෙර පටන් සක්වළ ඉම දක්වා ද ප්‍රේතපිශාචාදීන් පලවා හරිමින් රකවල් ගත්හයි ද අටු වණීතාහි පෙනේ. ඒ ප්‍රේතාදීන් දුක්මෙන් බෝසත්නට හෝ මවට බියක් නො වුව ද ගෞරව වශයෙන්, සිය යුතුකම් වශයෙන් දෙවියෝ මුර කරති 226. බුදුරජුන් උපදනට පෙර තවුසන් ගේ පිරිවැජියන් ගේ පාමුළැ වැඳ උක්කුටුක වැ මිනිස්සු සිල් ගනිත් මායා බිසෝ අසිත තවුසා වෙතින් සිල් ගත්තු බෝසත්කුසැ ඔත් පසු තොමෝ ම සිල් සමාදන් කොට ගත්තු. 227. ඉදින් යමෙක් බෝසත්මව කරා සරාග සිතින් එළඹෙන්නට තැත් කොහේ නම් ගේ දෙව්හැකිලියෙන් බැඳේ. පා ඔසොවන්නට ද අසමත් වේ.

ඇමුණුණු හුය පැහැදිලි වැ දක්කෑ හෙනු සේ ම මව සිය කුසැ ගොත් සියලු අඟපසඟින් පිරිපුන් පුතු දකී.[228] මේ ද දහම් නියමයෙක. vi

බෝසතුන් උපන් සත්දිනෙන් මව කළුරිය කොට තුසී පුරැ උපදී.[229] මේ ද දහම් නියමයෙක. viii

බෝසත්මව දස මස පිරී කල්හි ම පුතු වදයි.[230] මේ ද දහම් නියමයෙක. viii

බෝසතුන් බිහි වූ කෙනෙහි පළමුවෙන් දෙවියෝ ද අනතුරු වැ මිනිස්සු ද ඔබ පිළිගනිත්.[231] මේ ද දහම්නියම–යෙක. ix

මව කුසින් බිහි වූ බෝසතාණන් පා බිම තබන්නට පෙරැ ම සිවුවරම්රජ්හු පිළිගෙන, 'දේවිනි, සතුටු වන්න, ඔබට මහපිනැති පුතෙක් උපනැ'යි කියා ඔබ මව ඉදිරියේ තබත්.[232] මේ ද දහම්නියමයෙක. x

කිසිදු කිලිටි දියෙකින් නොවැකී, කසීසළුවෙක තුබූ මිණිරුවනක් සේ, පිරිසිදු ව ම බෝසත්හු බිහි වෙති.[233] මේ ද දහම්නියමයෙක. xi

---

228 අන් සත්හු පක්වාශය මත වැතිරැ ආමාශයට යට වැ උදර–පටලයට පිටු දී මවු ගේ පිටකටුව නිසා උත්කුටුක වැ දෙමිටු මත්තෙහි හනුව තබා වැසි සමයෙහි රුක්බිලයෙහි වඳුරන් මෙන් ගැහැටී හිඳිත්. බෝසත්හු පිට කටුවට පිටු දී ඉදිරි පසට හැරී පලක් බැඳ හිඳිති පෙරැ කළ පිත් හෙයින් ඔවුන් ගේ වාසතුව (වසන කුසය) ශුඬ වේ. එහි සම සියුම් වේ. එබැවින් මවට දරුවා පෙනෙයි. 229 බෝසතුන් මව කුසැ උපදිනුයේ, මවට දසමස් සත් දිනක් ආයු ඉතිරි වැ තිබියැ දී ය. එ හෙයින් බෝසතුන් උපන් සත් දිනෙන් මව කළුරිය කෙරෙයි. ඇය ගේ කළුරිය කිරීම බෝසත් උපන් කරුණින් නො වේ. සිය ආයු ගෙවුණ බැවිනි. 230 සත්මසින් ද නව දස එකොළොස් මසින් ද උපන්නේ ජීවත් වේ. අට මසින් උපන්නේ ජීවත් නො වේ බෝසත්හු දසමසක් ම පිරී තැන බිහි වෙති. 231, 232 බෝසතුන් බිහි වූ කෙනෙහි සුදවැසි බඹහු අවුත් ඔබ පිළිගනිත්. කිරිමවුන් ගේ වෙසින් සුදවැසිබඹහු එහි යි ඇතැමෙක් කියත්. බඹවෙසින් ම අවුත් රන්දැලින් පිළිගත්හ යි ද, එයට අනතුරු වරම්රජ්ජු අඳුන්පෙවෙණියෙන් ද එයට අනතුරැ මිනිස්සු දුහුල් සුඹුළින් ද පිළිගත්හ යි ථෙරවාද අටුවාහි දක්වෙයි 233 අන් සතුන් සේ යෝනි මඟැ ගැටෙමින් බෝසත්හු බිහි නො වෙත්. එහි නො ගැටී ම නික්මෙති යි ථෙරවාද අටුවායි දක්වෙයි. අප බෝසත්හු මව ගේ දකුණැලයෙන් සෑඩියෙන් නික්මුණහ යි ලලිතවිස්තරාදි සකුබණපොත්හි දක්වෙයි. මේ පිළිබඳ විවිධ මත අප ලියූ ශාක්‍යසිංහාවදනයේ (බුඬචරිතයේ) උපග්‍රන්ථයේ අංක 2–14 බලා දත යුතු

බෝසතුන් බිහි වූ කෙනෙහි ඔබ ත් ඔබ මව ත් සඳහා උණුසුම් දියදහරෙකුත් සිසිල් දියදහරෙකුත් අහසින් වැටෙත්.[234] මේ ද දහම්නියමයෙක. xii

16. මවකුසින් බිහි වූ ම බෝසත්හු (බිහි වූ කෙනෙහි ම) සම පයින් බිමැ පිහිටා සිටැ සේසත් යැටින් උතුරැ දිගට සත් පියවරක් යෙත්. හැම දිගුත් ද බලත්.[235] 'ලොවැ අගිම්, දෙට්ම්, සෙට්ම්, මේ මං අන්තිම ඉපත්ම යැ, මෙයින් මතු බෙවෙහි උපතෙක් මට නැතැ'යි සීනද කෙරෙත්.[236] මේ ද දහම් නියමයෙක. xiii

බෝසතුන් මවු කුසින් බිහි වූ කෙනෙහි දෙව් පබාං ද මැඩැ මහ එළියෙක් ලෝ පුරා පැතිරැ යෙයි.[237] මේ ද දහම් නියමයෙක. xiv

ලෝඇදිරි නිරයෝ ද ඒ එළියෙන් එකලු වෙත්.[238] මේ ද දහම් නියමයෙක. xv

[මේ හැම ඒ විපස්සි කුමරුන් ඉපැත්මෙහි පහළ විය.]

කුමරුන් උපන් කලැ එ පවත් බන්ධුමත් රජුට දැන්විණ. රජ ද දුහුල්සුඹුලෙක තබා ගෙනා කුමරුන් දිටී. දැකැ නිමිතිපටු බමුණන් කැඳවා උනට කුමරුන් දැක්වී ය.

17. ඔහු කුමරුන් බලා "දේවයිනි, සතුටු වන්න. මහ තෙදබලැති පුතණු කෙනෙක් ඔබට උපන්හ. මෙවැනි පුතණු කෙනෙකුන් ලත් ඔබට වූයේ මහත් ලාභයෙක, මෙ කුමරු දෙතිස් මහපුරිස් ලකුණු ඇත්තෝ ය. එ ලකුණු ඇති වැ උපන්නෝ ගිහිගෙහි රැඳුණාහු සත්රුවනින් හෙබි සක්විති රජාණ කෙනෙක් වන්නාහ. පැවිදි වූවාහු අරහත් සම්මා-සම්බුදු වන්නාහ"යි කීහ. ඉක්බිති ඔහු එ කුමරුන් කෙරෙහි වූ දෙතිස් මහපුරිස්ලකුණු දැක්වූහ:

---

234. උණුසුම් දියදහර රිදීමුවා කටාහයෙක ද සිසිල් දිය දහර රන්මුවා කටාහයෙක ද වැටේ යැ යි අටුවාහි එයි. 235, 236 මවකුසින් බිහි වූ කෙනෙහි සීනද කළා සේ පෙළෙහි අව ද මිනිසුන් අතින් බිම බට පසු යැ යි අටුවාහි දැක්වෙයි. ඔබ සත් පියක් උතුරට වැඩියේ පොළොව පිට ම ය පෙනෙමින් ම ය. වතකුදු නැති ව ය එහෙත් වත් හා අබරණ හැඳැපැලැඳ සොළොස් වස් ඇත්තකු අහසින් යන සෙයින් ඔබ ගමන එයි වූ මිනිස්නට හැඟිණැ යි තෙවළාදර මුලලාහය තෙරහු වදළහ යි අටුවාහි එයි 237, 238 මේ එළිය පහළ වනු ධම්තා ය දෙතිස් පෙරනිමිති පෙළෙහි නො ආයේ ය, ඒ අටුවාහි ම පෙනෙයි

i. මොනොවට පිහිටි පා,
ii. දෙපාහි හැම ලෙසින් පිරිපුන් සක්ලකුණු,
iii. දික් විලුම්,
iv. දිගැඟිලි,
v. මොළොක් ලා අත් පා,
vi. දැල් අත් පා,
vii. උස් බොලට,
viii. ඒණිමුවන් ගේ බඳු කෙංඩා,
ix. දෙදන නොනැමී දිගු අත්,
x. කොපෙහි ගිලී සිටි පුරිස්නිමිත්ත,
xi. ගත රන්පැහැය,
xii. සිවියෙහි දූලි නොඇලෙන සියුම් බව,
xiii. එක් එක් ලොම්කූපයෙහි එක් එක් රෝමය,
xiv. උඩු අක් ඇති දකුණට කරකැවී සිටි නිල්වන් ලොම්,
xv. ඇද නැති සිරුර,
xvi. පිරුණු දෙ අත් පිටු ඈ උස් තැන්,
xvii. සිහකු ගේ බඳු පිරුණු උඩු කය,
xviii. පිරුණු පිටුදෑලවර මැද කොටස,
xix. තමන් බඹය තරම් ම උස් වූ සිරුර,
xx. සම වට කර,
xxi. උඩුඅක් වැ ගෙලැ බැඳුණු රස නහර,
xxii. පිරුණු දෙහනු,
xxiii. සාලිස් දත්,
xxiv. සම දත්,
xxv. විවර නැති දත්,
xxvi. ඉතා සුදු දත්,
xxvii. පුළුල් දිව,
xxviii. බඹ හඬ,
xxix. සුනිල් දෙනෙත්,

xxx. වස්සකු ගේ බඳු සිනිඳු ඇස්ගුළි,
xxxi. සිනිඳු සුදු උණ්ණලොම් ද,
xxxii. පිරුණු නළල හා පිරිපුන් හිස,
යන මොහු ඒ දෙතිස් මහපුරිස් ලකුණු ය.[240]

18. බන්ධුමත් රජ බමුණන් බස් අසා පැහැද උනට කරළු ද තවත් රිසි හැම දෑ ද දී උන් සතුටු කොට යැවී ය.

ඉක්බිති කිරි පොවනු ද නාවනු ද සාත්තු කරනු ද වඩා ගෙන හිඳිනු ද යන එක එකට කුමරුන් සඳහා වෙන වෙන ම කිරිමවුන් යෙදී ය. එ කුමරුනට ශීතෝෂ්ණාදියෙන් පීඩාවක් නොවනු පිණිස දව රැ දෙක්හි ම එ කුමරුන් මත්තෙහි සේසතෙක් දරනු ලැබී ය. එ කුමරහු පියුමක් සේ ජනප්‍රිය වූවාහු කිරිමවුන් විසින් මාරුවෙන් මාරුවට ඇකයෙන් දරනු ලබන්නාහු ද වූහ.

තව ද ඔබ කුරවිකෙවිල්ලන් බඳු මිහිරි කටහඬ ඇත්තෝ වූහ. උපතින් ම දව රැ දෙක්හි හාත්පස යොත්නක් තැන් දක්නා හෙන කර්මවිපාකජ දිව්‍යැසෙක් ද ඔබට වී ය. ඔබ උපතින් ම දෙවියන් සේ ඇසි පිය නො හෙලා බලන්නෝ වූහ. එ හෙයින් ඔබට **විපස්සී** යි නම් විය. එ කුමරහු පිය රජ් නඩු අසන වේලෙහි ඔහු ඇකයෙහි උන් තැනැත්තෝ වෙසෙසින් පිරික්සා යුක්ති පසිඳිත්. එ හෙයින් ද වෙසෙසින් ම එ කුමරුනට **විපස්සී** යන නම තහවුරු විය.

19. තව ද බන්ධුමත් රජ **විපස්සී** කුමරුනට වැසි හිමත් ගිමන් යන තුන් රිතුයෙහි වසනුවට සුදුසු සේ මාලිගා තුනක් කරවා එහි හැම සුව පහසු එළවා තැබ්බී ය. කුමරාණෝ ඒ තුන් මාලිගාහි ඒ ඒ රිතුයෙහි පිය රජුහු විසින් යොදන ලද නටන ගයන වයන වමියන් විසින් පිරිවැරුණෝ සුවසේ කල් යැවූහ.

20. බොහෝ හවුරුදු සිය ගණනකට දහස් ගණනකට පසු දවසෙක විපස්සී කුමරාණෝ මනා යානයෙක නැඟ එබඳු ම යානයන්හි නැඟුණු පිරිවර ජනයා ඇති වැ මගුලුයන් බලා ගමන් ගත්හ. එසේ යන ඔබ අතරමඟ ජරපත් මහල්ලකු දුටු. දැක 'මේ කවරැ'යි රියැදුරා ගෙන් අසා දැන, තමාත් ජරාවට හසු වෙතැ යි සලකා කලකිරුණාහු පෙරැළී මාලිගාව බලා ම ආහ. අවුත් ජරා දුක ඇති වනුවට හේතු වූ ඉපැත්මට නින්දා කරන්නාහු ගැඹුරු සිතිවිල්ලෙහි යෙදී හුන්හ.

---

240. මේ දෙතිස් පුරිස් ලකුණු මෙහි ම මතු ලක්ඛණ සූත්‍රයෙහි එයි.

බන්ධුමත් රජ රියැදුරා අතින් පුත් කුමරාණන් උයන් ගමනැ තොරතුරු පුළුවුත. රියැදුරු වූ පවත් සියල්ල සැළ කළ. රජ තෙම කුමරාණන් ගිහිගෙහි කලකිරෙනු වළක්වා රඳවා ගන්නා අදහසින් කුමරුනට වඩාත් පස්කම් සුව එළැවී. නැවැත ද බොහෝ කලෙකින් පසු කුමරාණෝ පළමු සේ ම උයන් බලා යන්නාහු, ගිලනකු දැක රියැදුරා ගෙන් අසා දැන කලකිරී පෙරළී මාලිගාවට ම ආහ. ගමනැ තොරතුරු ඇසූ රජු කුමරුනට පෙරටත් වඩා පස්කම්සුව එළැවී.

බොහෝ කලෙකින් පසු යළිදු විපස්සී කුමරාණෝ උයන් කෙළි පිණිස ගියහ. එසේ යන්නාහු මඟදී මළසිරුරක් දුටුහ. දැක රියැදුරා පිළිවිසැ දැන, මහත් සේ කලකිරී, පෙරළී රජ මැඳුරට ම ගියහ. ගොස් පළමු සේ ම සිතිවිල්ලේ ගිලී හුන්හ. රියැදුරා ගෙන් ගමනේ තොරතුරු අසා දත් පිය රජ පළමු සේ ම වඩවඩාත් ඔබට පස්කම් සුව එළැවී.

21. බොහෝ කලක් ඇවෑමෙන් තව වරෙක රජකුමරාණෝ උයන් බලා නික්මියහ. එසේ ගිය ඔබට කසාවත් හන් පෙරෙවි පැවිද්දෙක් හමු විය.[240] 'ඒ කවරු'යි රියැදුරා ගෙන් අසා එ පැවිද්දා වෙතට රිය පදවන්නැ යි කුමරාණෝ කීවු ය. හේ ද එය කෙළේ ය. කුමරාණෝ පැවිද්දා අමතා, 'ඔබ හිස ද ඇඳුම් ද අන් ජනයා ගේ සේ නො වේ. ඒ කිම් දැ?'යි විචාළහ. 'දේවයිනි, මම් පැවිද්දෙකිමි'යි හේ කීව. 'ඔබ කුමට පැවිදි වූහු දැ?'යි කුමරාණෝ පුළුවුත්හ. 'ධර්මචර්යාව, ශමචර්යාව, කුශලචර්යාව, පුණ්‍යක්‍රියාව, අවිහිංසාව, සත්ත්වානුකම්පාව මැනැවැයි[241] යන ඇ සලකා පැවිදි වීමි'යි හේ කීව. එයසා කුමරාණෝ 'මමත් පැවිදි වන්නෙමි'යි සිතූහ. ඉක්බිති පෙරළා මලිගාවට ගියාහු එහිදී ම කෙහෙරවුලු බහවා කසාවත් හැඳ පෙරෙවැ පැවිදි වූහ.

'විපස්සී කුමරාණෝ පැවිදි වූහ'යි ඇසූ බන්ධුමතී නුවරැ සූවාසූදහසක් ජනයෝ ද ඔබ අනුව පැවිදි වූහ. බෝසතාණෝ

---

240. බෝසතුන් කාම් සුවෙහි ගිලුණා දැක ශුද්ධාවාසික බඹුන් ජරා-රූපාදි පූර්වනිමිති දැක්වූ බව අර්ථවර්ණනාහි ආයේ ය. මේ සතර නිමිති දැක පැවිදි වීම බොධිසත්ත්ව සිරිති. දීර්ඝායුෂ්ක බෝසත්හු ඒ සාරමසින් දුටුහ. අපබෝසත් ඒ සතර ම එක් දිනෙහි ම දිටී'යි දීඝනිකාය අර්ථ-වර්ණනායෙහි දැක්විණි. ජාතක අටුවාදියෙහි සතර දිනෙක ම මේ දිටී යැ යි කියනා ලදී. 241. ධම්මචය්‍යා, ශමචය්‍යා, කුශලචය්‍යා, පුණ්‍යක්‍රියා අවිහිංසා, සත්ත්වානුකම්පා යනු දශකුශලයෝ ම ය. 'අවිහිංසා' යනු විශෙෂයෙන් කරුණාවේ පූර්වභාගය ය 'අනුකම්පා' යනු මෛත්‍රියේ පූර්වභාගය යි.

ඒ පැවිදි පිරිස විසින් පිරිවරන ලද්දාහු ගම්-නියම්ගම්-රජදහන්හි සැරිසරා වසිති. නැවැත එසේ පිරිස් පිරිවර ඇති ව, ආකිණ්ණ ව වසනු නො සුදුසු යැ යි සලකා, සිය පිරිස ගෙන් වෙන් වූහු, හුදෙකලා ව වුසූහ. එ දුටු පැවිදි පිරිස අන් අනෙක ගියහ. බෝසතාණෝ ද අන් මඟෙකින් වැඩියහ.

22. මෙසේ පිරිසෙන් වෙන් වූ විවේකී වැ වසන විපස්සී බෝසතාණෝ 'අහෝ! මේ ලොවැස්සා දුකට බටුයේ, පුනපුනා උපදනේ ද දිරනුයේ ද මියෙනුයේ ද යළි උපදනේ ද වෙයි. එහෙත් මේ ජරාමරණ දුක්හි කෙළවරෙක් දුකින් මිදීමෙක් පැණෙ ද්‍රෑ?'යි සිතන්නට වන්හ. 'කුමක් ඇති කල්හි ජරාමරණ වෙයි දෑ? යි 'කිමෙක පසයෙන් ජරාමරණ වෙයි දෑ?'යි නුවණින් බලන බෝසතාණනට 'ජාතිප්‍රත්‍යයෙන් (උපන් බැවින්) ජරාමරණ වේ' යැ යි දැනීම ඇති විය. ජාතිය (ඉපැත්ම) 'කෙසේ වෙයි දෑ?'යි නුවණින් බලනුවෝ **'භවප්‍රත්‍යයෙන් ජාතිය වේ'** යැ යි දුටුහ. ඒ භව ආදිය කෙසේ වෙයි දෑ?' යි වඩ වඩා නුවණ යවා බලන්නාහු **උපාදානප්‍රත්‍යයෙන් භවය ද, තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදානය ද, වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව ද, ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව ද, ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය ද, නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතන ද, විඥානප්‍රත්‍යයෙන් නාමරූප ද, නාමරූප ප්‍රත්‍යයෙන් විඥානය ද වේ'**[242] යැ යි දුටුහ.

23. ඉක්බිති 'විඥානය නාමරූපදෙක නො ඉක්මෙයි. (විඥානය නාමරූපයටත් නාමරූප විඥානයටත් ප්‍රත්‍යය වෙයි) මෙතෙකින් උපදනේ ය, දිරන්නේ ය, මියෙන්නේ ය, ච්‍යුත වන්නේ ය, යළි උපදනේ ය' කියා හෝ වේ. ඒ වනාහි නාමරූපප්‍රත්‍යයෙන් විඥානය ද, විඥානප්‍රත්‍යයෙන් නාමරූපය ද, නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතනය ද, ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය ද, ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව ද, වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව ද, තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදානය ද, උපාදානප්‍රත්‍යයෙන් භවය ද, භවප්‍රත්‍යයෙන් ජාතිය ද, ජාතිප්‍රත්‍යයෙන් ජරා මරණ ශෝක පරිදේව දුක් දොම්නස් උපායාස යන මොහු ද පහළ වෙති' යන මේ ප්‍රතීත්‍යසමුත්පාදය යි. මෙසේ මේ හුදු දුක්කඳැ ඉපැත්ම වේ. මේ දුක් ඉපැත්ම ය, මේ දුක්ඉපැත්ම යැ'යි පෙර නො ඇසූ දහම්හි හැඳිනීම (තරුණ විදර්ශනාව) ඒ බෝසතාණනට පහළ විය.

---

242. මේ පටිච්චසමුප්පාදය ගැන මෙහි උපග්‍රන්ථය බලනු.

නැවැත ඔබට කුමක් නැසීමෙන් ජරා මරණ ආදිය නිරුඬ වේ දැ?'යි සිතෙක් වි ය. නුවණින් මේ එක එකක් පාසා මෙනෙහි කරත් ම සලකා බලත් ම **'ජාතිනිරෝධයෙන් ජරාමරණ නිරෝධය ද, භවනිරෝධයෙන් ජාතිනිරෝධය ද, උපාදාන නිරෝධයෙන් භවනිරෝධය ද, තෘෂ්ණානිරෝධයෙන් උපාදානනිරෝධය ද, වේදනානිරෝධයෙන් තෘෂ්ණානිරෝධය ද, ස්පර්ශනිරෝධයෙන් වේදනානිරෝධය ද, ෂඩායතනනිරෝධයෙන් ස්පර්ශනිරෝධය ද, නාමරූපනිරෝධයෙන් ෂඩායතන නිරෝධය ද, විඥානනිරෝධයෙන් නාමරූපනිරෝධය ද, නාමරූපනිරෝධයෙන් විඥානනිරෝධය ද වේ යැ** යි පැතිණ.

24. ඉක්බිති බෝසතාණනට **'නාමරූපනිරෝධයෙන් විඥානනිරෝධය ද, විඥානනිරෝධයෙන් නාමරූපනිරෝධය ද, නාමරූපනිරෝධයෙන් ෂඩායතනනිරෝධය ද, ෂඩායතනනිරෝධයෙන් ස්පර්ශනිරෝධය ද, ස්පර්ශනිරෝධයෙන් වේදනානිරෝධය ද,................ ජාතිනිරෝධයෙන් ජරා මරණ ශෝක පරිදෙව දුක් දෙම්නස් උපායාස** යන මොවුන් ගේ **නිරෝධය** ද වේ. මෙසේ මේ හුදු දුක්කඳ නිරුඬ වේ යැ'යි ද, සත්‍යාවබෝධ මාර්ගය මා විසින් ලද්දේ යැ යි ද, **'මෙසේ දුඃඛයා ගේ නිරෝධය වේ'** යැ යි ද පෙර නො ඇසූ ධර්ම විෂයයෙහි නුවණැස (නිරෝධ සංජානන මාත්‍රය හෝ **උත්ථාන ගාමිනී බලවද්විදර්ශනාව**) පහළ වි ය.

25. මෙසේ ඒ බෝසතාණෝ ප්‍රත්‍යයත් ප්‍රත්‍යයනිරෝධයත් දැන ඉන් පසු පංච උපාදානස්කන්ධයන් ගේ යටැ තමන් දුටු පරිදි ඉපැත්මත් විනාශයත් අනුවැ බලන්නාහු **'රූපය මෙ සේ ය, රූපයේ ඉපැත් ම මෙසේ ය, රූපයේ නිරෝධය මෙසේ ය, වේදනාව මෙසේ ය, වේදනාව ගේ ඉපැත්ම මෙසේ ය** .... යන ආදීන් උදයව්‍යයය පිරික්සමින් වුසූහ. මෙසේ පංච උපාදාන ස්කන්ධයන් ගේ උදයය ද ව්‍යයය ද අනුව බලන බෝසතාණන් ගේ සිත (විවසුන්නුවණ වැඩි යැමෙන්) කාමාදි සියලු ආස්‍රව කෙරෙන් මිදුණේ ය. (ඒ බෝසත්හු) සියල් කෙලෙස් නසා සම්‍යක්සම්බුඩත්වයට පැමිණියහ.

26. ඉක්බිති 'දහම් දෙසුවොත් මැනැවැ'යි **විපස්සී** බුදුරජුනට සිත් විය. ධර්මගාම්භීර්‍ය්‍ය සලකන ඔබට සත්ත්වයන් කාමයන්හි දැඩි සේ ඇලී ඉන්නා බවත්, එසේ ඉන්නා තාක් ඔවුන් විසින් මේ ගැඹුරු ප්‍රතීත්‍යසමුත්පාදයත් නිවනත් අවබෝධ කළ නොහෙන බවත්, එසේ ඇති කල දම් දෙසීම තමනට වෙහෙසක් ම බවත් සිතුණේ ය. විපස්සී බුදුරජුන් ගේ ඒ චිත්ත

පරිවිතර්කය දුටු එක්තරා මහබඹෙක් 'භාග්‍යවතුන් වහන්සේ දම් දෙසීමට මන්දෝත්සාහ වීම ලොවට මහත් හානියෙකැ'යි සලකා ධර්මාවබෝධයට උත්සාහවත් ව වහා එහි වුත් බිමැ දන ගසා දෑහොත් මුදුන් තබා වැඳ, දහම් දෙසන්නට අයැදී ය. දහම් අසා අවබෝධ කිරීමට උත්සාහවතුන් ඇති බව ද දැන්වී ය. තෘෂ්ණායෙන් බැඳුණවුනට ධර්මය අවබෝධ කළ නො හැකි බැවින් දම් දෙසීමට සිත පසු බට වූ බව එ භගවත්හු වදාළහ. මහබඹහු වඩ වඩා උත්සාහවත් ව දෙවෙනි වර ද තෙවෙනි වර ද අයැදූහ.[243]

27. විපස්සී බුදුරජුහු බඹහු ගේ ඉල්ලීමෙන් ද සතුන් කෙරෙහි කුළුණින් ද බුදු ඇසින්[244] ලොව බලා පොකුණෙහි දියෙන් මතු නො වූ ද, දියට සම ව නංගා වූ ද, දියෙන් ඉහළ නැංගාවූ ද පියුම් සේ, සත්‍යාවබෝධයට සුදුසු සේ නුවණින් මේරූ නො මේරූ සතුන්[245] දුටුහ.

මහබඹා බුදුරජුන් ගේ අදහස දැන—

"සමතැස් ඇති මහා නැණවතාණන් වහන්ස, කඳු මුදුනෙක සිට හාත්පස බිම සිටියවුන් දක්නා සේ නුවණමුවා පාය නැඟ, සොවින් පහ වූ ඔබ වහන්සේ සොවට බට ජාති ජරාදි දුකින් මැඩුණු ජන සමූහයා දැක වදාළ මැනැව.[246]

---

245. සත්ත්වයන් කෙලෙසුන් ගෙන් හරිත බවත් ධර්මයේ ගැඹුරු බවත් එය අසා තේරුම් ගන්නට තරම් උත්සාහ නැති, තෘෂ්ණාවට ම වහල් වූවනට ධර්මදේශනා කිරීම නිෂ්ඵල බවත් සැලැකීමෙන් ධර්මදේශනානුත්සාහය විය. එ බව දත් මහ බඹහු වනුයේ හානියෙකැ යි සලකා උත්සාහවත් ව ධර්මය තේරුම් ගන්නට සුදුසු පරිදි සැරැසී අවුත් බුදුරජුන් අයැදූහ. 244. 'බුදු ඇස' නම් ඉන්ද්‍රියපරෝපරිය ඤාණයත් ආසයානුසයඤාණයත් යන දෙකට නමෙකි. 'සමන්තචක්ඛු' යනු සර්වඥතාඥානය යි 'ධම්මචක්ඛු' යනු සෝවාන් සකෘදාගාමි අනාගාමි යන තුන් අවස්ථාහි වූ ම මාර්ගඥානයෝ යි. 245. 'නුවණ මේරූ නොමේරූ සත්ත්වයෝ - අල්පරජස්කයෝ (ප්‍රඥා ඇසෙහි මඳක් කෙලෙස් ධූලි වැකුණෝ), මහාරජස්කයෝ (කෙලෙස් ධූලියෙන් බොහෝ සේ වැසුණු නුවණැස ඇත්තෝ), තීක්ෂ්ණේන්ද්‍රියයෝ (ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් තියුණු ව ඇත්තෝ), මෘදින්ද්‍රියයෝ (ශ්‍රද්ධාදීන් නොතියුණු ව ඇත්තෝ), ස්වාකාරයෝ (ශ්‍රද්ධාදීන් මනාඅයුරින් ඇතියෝ), දුරාකාරයෝ (ශ්‍රද්ධාදීන් නොමනා අයුරු ඇත්තෝ), සුවිඥාප්‍යයෝ (කී දෑය පහසුයෙන් තේරුම් ගැන්විය හැක්කෝ), දුර්විඥාප්‍යයෝ (තේරුම් ගැන්වීම දුෂ්කර අය). පරලොවත් වර්ජ්‍ය (දුශ්චරිත) යනුත් භය සේ දක්නා සුල්ලෝ, එ සේ නො දන්නා සුල්ලෝ යැ යි මෙසේ මුහුකුරා නො මුහුකුරා නුවණැත්තෝ. 246. ප්‍රඥා නම් වූ ප්‍රාසාදයෙහි සිට ලොව බලන බුදුරජුනට පින් නො කළාහු දනමඩල සමීපයේ උන්නාහු ද, බුදු ඇසට නො පෙනෙත්. පින්කළ විනේයයෝම දුරැ සිටියාහු ද ගින්නක් සේ හිම්වත් පව්ව සේ පෙනෙත්.

විරුවන් වහන්ස, මරයුද දිනුවාණන් වහන්ස, සාත්තු නායකයන් වහන්ස, ණයින් මිදුණු බගවතුන් වහන්ස,[247] නැඟී සිටිය මැනැව. ලොවැ හැසුරුණ මැනැව. දම් දෙසුව මැනැව. දහම් අවබෝධ කරන්නෝ වන්නාහ" යි කී ය.

28. එ කලැ **විපස්සී** සම්බුදුරජ්හු ඒ මහබඹහට—

"දහම් ඇසීමට කන් ඇති යම් කෙනෙක් වෙත් නම්, ඔවුනට අමා දෙරවල්[248] හැර තබන ලදහ. ඔහු සැදැහැව විහිදුවත් වා (ශ්‍රද්ධා භජනය එළවා තබත් වා). බ්‍රහ්මය, අසා අවබෝධ කරන්නට තරම් සැදැහැව නැත්තනට දම් දෙසීම කයට වචනයට හුදු වෙහෙසකැ යි එයින් වන වැඩෙක් නැතැ යි සිතා ප්‍රගුණ වූ ධර්මය සත්නට නො දෙසීමි" යි වදාළහ.

ඉක්බිති මහබඹා තමා කළ ආයාචනය බුදුරජුන් ඉවැසූ නියා සලකා, වැඳ පැදකුණු කොට, එහි ම අතුරුදන් විය.

29. එයින් පසු බුදුරජ්හු "පළමුවෙන් කාට දම් දෙසම් දැ?" යි නුවණින් බලා දන ඉදුබෙලෙන්[249] සැණෙන් **බන්ධුමතී** නුවර **ඛෙම** නම් මුවවනයට වැඩ, රජපුත් **ඛණ්ඩ** කුමරාටත් පෙරෙවි පුත් **තිස්සයා**ටත් උයන්පල්ලා අතේ පණිවුඩ යැවූහ. ඔහු ද එහි ආහ.

විපස්සී බුදුහු ඔවුනට අනුපු කතායෙන්[250] බණ වදාළහ. එයින් ඔවුන් සිත් පහන් වි ය. ඉක්බිති සිවුසස් වදාළහ. එයසා ඒ දෙදෙන සෝවාන් ව පැවිද්දත් උපසපුවත් ඉල්වූහ. ඔහු ද එ බුදුරජුන් වෙතින් ඒහිභික්ෂුප්‍රව්‍රජ්‍යෝපසම්පත් ලැබූහ.

---

247. වීර්‍යවත් බැවින් බුදුහු වීර නමු. දේවපුත්‍ර මෘත්‍යු ක්ලේශ යන තුන්මරුන් දිනූයෙන් විජිතසංග්‍රාම (මරයුද දිනුවාණෝ) නමු. ජාතිකාන්තාරාදියෙන් නික්මෙනු පිණිස විනේයජන නමැති ගැල් පදවනු සමත් බැවින් සාත්තුනායකයහ. කාමච්ඡන්ද නමැති ණය නැති බැවින් අනණ (ණයින් මිදුණු) තැනැත්තෝ ය. 248 අමාදෙරවල් (අමෘතද්වාර) නම් ආර්‍යමාර්ග යි. අමෘතයට (නිවනට) ද්වාර බැවින් අරියමග අමාදෙර නම්. 249 ඉදුබෙලෙන් විපස්සී ආදි අන් බුදුවරු ප්‍රථම ධර්මදේශනයට අහසින් වැඩියහ. අප බුදුහු මඟ දී උපකයා හමු වන්නට බලා පයින් ම වැඩියහ. ඛෙම මුවවනය=මේ ඉසිපතනය ම ය. එකල බැවහර වූ නම ය. 250. අනුපු කතා (ආනුපූර්වී කථා)=දානකථා, ශීලකථා, ස්වර්ග කථා, කාමාදීනව, කාමලාමකතා, කාමසංක්ලේශ, නෛෂ්කාම්‍යානුශංස යන පිළිවෙළ අනුව කැරෙන අනුශාසනය යි.

30. ඉක්බිති බුදුරජ්ජුහු ධර්‍මකථායෙන් ඔවුනට දෙලෝ වැඩ[251] දක්වූහ. කලණ දහම්[252] ගැන්වූහ. උනන්දු කළහ. සතුටු කළහ.[253] සංස්කාරයන් ගේ දෝෂ[254], ලාමක බව, සංස්කාරප්‍රත්‍යයෙන් ම වන වෙහෙස, නිවනේ අනුසස්[255] වදාළහ. මේ ධර්‍මකථාව අසා ඔහු රහත් වූහ.

විපස්සී බුදුරජුන් බන්‍ධුමතී නුවරට වැඩ ඛෙම නම් මිගදායයෙහි වසන බව ද, ඛණ්ඩ තිස්ස දෙදෙන ඒ බුදුරජුන් වෙත පැවිදි වූ බව ද අසා බන්‍ධුමතී නුවර අසූසාරදහසක් ජනයෝ ඛෙම මිගදායයට ගොස් බුදුරජුන් දුටුහ. ඔවුනට බුදුරජ්ජුහු අනුපූ කතායෙන් දම් දෙසූහ. එයසා ඔවුන් සිත් මොළොක් වැ පහන් වැ ගිය කලැ චතුස්සත්‍යය වදාළහ. ඔහු සෝවාන් වැ ඒහිභික්‍ෂුප්‍රව්‍රජ්‍යෝපසම්පත් ලදුහ. ඉක්බිති බුදුරජුන් දෙසූ සංස්කාරයන් ගේ දෝෂ් ද ලාමකබව ද කෙලෙ- සීම ද කාමයන් ගෙන් නික්මීමේ අනුසස් ද සිවු සස් ද අසා රහත් වූහ.

31. මුලදී විපස්සී කුමරුන් හා පැවිදි වූ අසූසාරදහසක් දෙනා ද 'විපස්සී බුදුරජුන් බන්‍ධුමතී පුරයට වැඩ ඛෙම මිගදාය- යෙහි වෙසෙති යි, දම් දෙසති' යි අසා ඔබ කරා අවුත් වැඳ පසෙක උන්හ. ඔවුනට ද බුදුරජ්ජුහු ආනුපූර්වීකථාව වදරා ඉක්බිති සිවුසස් දෙසූහ. එයසා ඔහු සියල්ලෝ ද සෝවාන් ව ඒහිභික්‍ෂුප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි උපසපන් වූහ. ඉක්බිති දෙසූ බණ අසා රහත් වූහ.

32. මෙසේ එ සමයෙහි බන්‍ධුමතීරාජධානියෙහි එක් ලක්‍ෂ අටසැට දහසක් භික්‍ෂූහු වෙති. ඔවුනට ධර්‍මදූත මෙහෙයෙහි යෙදෙන්නටත් සාවුරුද්දකට වරක් පාමොක් දෙසන්නටත්

---

251. දෙලෝවැඩ = අනිත්‍යතා, දුඃඛතා, අනාත්මතා, ස්කන්‍ධ, ධාතු, ආයතන, ප්‍රතීත්‍යසමුත්පාද, පංචස්කන්‍ධයන් ගේ උදය ව්‍යය යන මොවුන් දක්වීම මෙලෝවැඩ දක්වීම නම්. අපාය දුක් කුසල් හා තද්විපාක දක්වීම පරලෝ වැඩ දක්වීම නම්. 252. කලණදහම් (කල්‍යාණ ධර්‍ම) නම් සිවුපිරිසිදු සිල්, තෙලෙස් ධුතාංග, දශ කථාවස්තු ආදිය යි. 253. උනන්දු කළහ=දෙතිස් කම්කරුටොලු පස්විසි මහ බිය දක්වා සසර දුකින් මිදී- මෙහි ද, පරලෝ වැඩ දක්වා කුසල් කැරුමෙහි ද උත්සාහවත් කළහ. සතුටු කළහ = ලත් ගුණයෙහි සතුට ඇති කළහ. මහත් අනුසස් දක්වූහ. 254. සංස්කාරදෝෂ = ඉහත ප්‍රථමමාර්ගාධිගමය පිණිස කාමාදීනව වදාළහ. එයින් මතු සකෘදගාමිමාර්ගාදිය ලබනු පිණිස සංස්කාරයන් ගේ දොස් වදාළහ. 255. නිවනේ අනුසස් = නිවන ප්‍රණීත (උතුම්) බව, ආරක්‍ෂා ස්ථාන බව ප්‍රතිෂ්ඨාදි බව

බන්ධුමති නුවරට පැමිණෙන ලෙස අණවන්නටත් විපස්සි බුදුරජුනට සිත් වී ය.[256] බුදුරජුන් ගේ කල්පනාව දැනගත් එක් මහබඹෙක් අවුත් 'ඒ මැනවැ'යි කියා 'ධම්දූත මෙහෙයට භික්ෂූනට අවසර දෙන සේක් වා'යි අයැද වැඳ අතුරු දහන් වී ය.

33. ඉක්බිති විපස්සී බුදුරජුහු සවස සමවතින් නැඟී සිට භික්ෂූන් අමතා තමනට වූ කල්පනාවත් මහාබ්‍රහ්මයා ගේ ආයාචනයත් සඳහන් කොට,

“මහණෙනි, තොපට අනුදනිමි. බොහෝ දෙනාට වැඩ පිණිස, සැප පිණිස, ලොවට අනුකම්පා සඳහා, දෙව්මිනිස්-නට වැඩ පිණිස, හිත පිණිස, සැප පිණිස සැරි සරවු. සව්‍යංජන කේවලපරිපූණ් ධම්ය දෙසවු. පිරිසිදු බඹසර පවසවු. අල්පරජස්ක සත්ත්වයෝ ඇත. ධම්ය නො ඇසීමෙන් බුහු පිරිහෙති. දහම් දැනගන්නෝ වන්නාහ. එහෙත් මහණෙනි, සාවුරුද්දකට වරක් පාමොක් උදෙසනු වස් බන්ධුමතී-රාජධානියට පැමිණියැ යුතු”යැ යි වදාළහ.

ඉක්බිති භික්ෂූහු බොහෝ සෙයින් එක් දිනෙන් ම දනවු සැරි සරා ගියහ. දඹදිවැ ද එ සෙමෙහි නුවර අසූසාරදහසෙක් වෙයි. එක් වසක් ගෙවුණ තැන 'නිදුකාණනි, එක් වසෙක් ගත වි ය. තව පස්වසෙක් ඉතිරි ව ඇතැ'යි පස් වසෙකින් පසු බන්ධුමතී රාජධානියට පාමොක් උදෙසීමට යැ යුතු යැ'යි දේවතාවෝ හඬ නැඟුහ.

මෙසේ ගත වූ හවුරුදු ගණනත් ඉතිරි හවුරුදු ගණනත් දක්වා හැම හවුරුද්දක් ගෙවුණ තැන දේවතාවෝ භික්ෂූනට පාමොක් උදෙසන කාලය මතක් කළහ. සාවුරුද්ද ගෙවුණ තැන ද එ පවත් දැන්වූහ.

34. ඉක්බිති ඒ මහණහු කෙනෙක් තමන් ගේ ම ඉදු-බෙලෙන් ද කෙනෙක් දේවතාවන් ගේ ඉදුබෙලෙන් ද බන්ධුමතී-රාජධානියට පැමිණියහ.

එහි විපස්සී බගවත් අරහත් සම්මා සම් බුදුරජුහු ඒ බික් සඟන මැද මෙසේ පාමොක් උදෙසූහ:

“ඉවැසීම නම් උතුම් තපස ය.

බුදුවරු හැම ලෙසින් ම නිවන උතුමැ යි කියත්.

256. මෙ සිත වූයේ සම්බෝධියෙන් සත්හවුරුදු සත්මස් සත් දිනෙකින් පසු ය.

පරහට හිංසා පීඩා කරනුයේ පැවිද්දෙක් නො වේ. පරා පෙළනුයේ මහණෙක් නො වේ.

සියලු අකුසල් නො කරනු ද,

(ලොවී ලොවුතුරා) **කුසල් සපයනු ද,**

තමා සිත පිරිසිදු කරනු ද කටයුතු දූ ය. මේ බුදු-වරයන් ගේ සස්න යි.

කිසිවකුටත් වචනයෙන් උපවාද නො කරනු,

කයින් පීඩා නො කරනු,

පාමොක් සිල් රැක්මෙන් හැසිරෙනු,

විවික්ත සෙනසුන් සොයනු,

යන මේ ද කටයුතු ය' යනු බුදුවරයන් ගේ ශාසන යි."

25. බුදුරජ්ජු මෙතෙකින් විපස්සිබුඩුචරිතය වදරා ඉක්බිති මේ දූ තමන් සිය නුවණින් දුටුවා මතු නොව දේවතාවන් ද අවුත් කී බව ද වදාළහ:

"මහණෙනි, එක් කලෙක මම් උක්කට්ඨා නුවර සමීපයෙහි සුභග වනයෙහි වෘක්‍ෂරාජ-මූලයෙහි වෙසෙමි. එ සමයෙහි 'ගත වූ දීර්ඝ කාලයෙහි ශුඩාවාසය[257] හැර අන් මා නො වුසූ තැනෙක් නැතැ' යි ද 'ශුඩාවාස දෙවියන් කරා ගියොත් මැනැ-වැ'යි ද මට සිත් විය. ඉක්බිති බල ඇත්තකු වක් කළ අතක් දිගු කරන, දික් කළ අතක් වක් කරන තරම් ඉක්මනින් සිය ඉදුහයෙන් අවිහ දෙව්ලොවට පැමිණියෙමි.

නොයෙක් දහස් ගණන් **අවිහ** දෙව්හු මා වෙත අවුත් වැඳ පසෙක සිට "නිදුකාණන් වහන්ස, මෙයින් එක් අනූවන කපෙහි විපස්සී බුදුරජ්ජු ලොවැ පහළ වූහ.* එ බුදුරජ්ජු ගෝත්‍රයෙන් කොණ්ඩඤ්ඤ නම් වූහ.*.....එ බුදුරජුන් ගේ දම්සක් පැවැත්වීම මෙසේ වී ය.....* අපි එ බුදුරජුන් වෙත බඹසර රැක කාමරාගය දුරු කොට (අනාගාමී ව) මෙහි උපන්මහ'යි කීහ. ඉක්බිති තවත් නොයෙක් දහස් ගණන් දේවතාවෝ මා වෙත එළැඹ වැඳ පසෙක සිට,

---

257. අවිහ අතප්ප සුදස්ස සුදස්සී අකණිට්ඨක යන තල පස පංච ශුඩාවාසයෝ ය අනාගාමී රහත් යන ශුඩසත්ත්වයනට ආවාස වූ බැවින් මොහු ශුඩාවාස නම් වෙති.

* ජාති ගෝත්‍ර ආයුපරිච්ඡෙදදිය ඉහතැ කී පරිදි මෙ තැනට ද ගත යුතු.

"නිදුකාණන් වහන්ස, මේ බදුරුකපෙහි ම දැන් පහළ ව ඉන්නා අර්හත් සම්‍යක්සම්බුඩයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ය. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ජාතියෙන් ක්‍ෂත්‍රිය සේක......ඒ අපි භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර රැක කාමරාගය නසා මෙහි පැමිණියම්හ"යි කිහ.

36. ඉක්බිති මම අවිහ දෙවියන් හා අතපප දෙවියන් කරා එළැඹිමි. ...ඉක්බිති අවිහ අතපප යන දෙ බඹලෝ වැසි දෙවියන් හා සුදස්ස දෙවියන් වෙත ද, එ සියල්ල හා සුදස්සී දෙවියන් වෙත ද, ඉක්බිති එකී සියලු දෙනා හා අකණිට්ඨක දෙවියන් වෙත ද ගියෙමි. නොයෙක් සිය ගණන් දහස් ගණන් ලක්‍ෂ ගණන් දෙවියෝ මා වෙත පැමිණ වැඳ පසෙක සිට තම තමන් විපස්සි ආදි ඒ ඒ සත් බුදුවරුන් ගේ සසුන්හි බඹසර රැක අනාගාමි ව එහි උපන් බව පවසා, ඒ බුදුවරුන් ගේ ජාතිගෝත්‍රපරිවෙජ්ඤදිය වෙන වෙන ම කිහ.

37. මහණෙනි, මෙසේ ජාති නාම ගෝත්‍ර ආයුෂ්ප්‍රමාණ ශ්‍රාවකයුග ශ්‍රාවකසන්නිපාත වශයෙන් අතීත බුදුවරයන් ගේ තතු සිහිකරන යමක් ඇද්ද, ඒ ධර්මධාතුව තථාගත වූ මා විසින් ම පිළිවිදුනා ලදී. දෙවතාවෝත් මෙ පවත් මට දැන්වූහ.

බුදුරජුන් වදාළ දහම්කතාව[258] භික්‍ෂුහු සතුටින් පිළිගත්හ.

[මෙහි විපස්සී ආදි සත් බුදුවරුන් ගේ චරිත දැක්විණ.]

15. මහානිදාන සූත්‍රය.

එක් සමයෙක බුදුරජුහු **කුරුරටැ කම්මාසදම්ම** නම් නිගමයෙහි වෙසෙති. එ සෙමෙහි අනඳ තෙරණුවන් ඔබ වෙත එළැඹ වැඳ පසෙක හිඳ කී බසෙකින් මේ ධම්කථාව පහළ විය.

2. **අනඳ තෙරණුවෝ** – වහන්ස, අසිරියෙක! පුදුමයෙක!! මේ පිළිසමුපා[259] දහම කොතරම් ගැඹුරු නුමුදු, කොතරම් ගැඹුරු පෙනුමක් ඇති නුමුදු, මට පැහැදිලි වැ වැටැහේ.

258. මේ සුතුර බණවර 126 කින් යුක්ත කොට වදරන ලදි. මෙ තරම් ලොකු අන් සුතුරෙක් ත්‍රිපිටකයෙහි ම නැත. එහෙයින් මේ සූත්‍රාන්තරාජ නම් වෙයි. 259. පිළිසමුපා - පටිච්චසමුප්පාද.

බුදුරජුහු - අනඳයෙනි, එසේ නො කියවු. පිළිසමුපාව ඉතා ගැඹුරු ය, ඉතා ගැඹුරු පෙනුම ඇත්තේ ය. මෙය අනුබෝධ නොකිරීමෙන්[260] ප්‍රතිවේධ නො කිරීමෙන්[261] මේ සත්මුළුව අවුල් වැ ගිය හුයක් සේ, අවුල් වූ පෙහෙර හුයක් සේ නොහොත් කිරිලි කසල්ලක් සේ අවුලෙන් අවුලට පැමිණියේ, මේ ප්‍රත්‍යයාකාර-ධර්මය අවබෝධ කැරැ ගත නො හැකි වූයේ, මිසදිටෙන් බැඳී ගැට ගැසී අවාදුක, සසරදුක ඉක්මියැ නො හැක්කේ එහි ම රැඳෙයි.

3. අනඳයෙනි, 'ජරාමරණයට පසයෙක් ඇද්ද?'යි විචාළොත් ඇතැ යි කියැ යුතු.

'ඒ කවරේ ද?'යි විචාළොත් 'ජාතිය'යි කියැ යුතු.

ජාතියට ප්‍රත්‍යයෙක් ඇද්ද? ඇත.

ඒ කවරේ ද? භවය යි.

භවයට ප්‍රත්‍යයෙක් ඇද්ද? ඇත.

ඒ කවරේ ද? උපාදානය යි.

උපාදානයට ප්‍රත්‍යයෙක් ඇද්ද? ඇත.

ඒ කවරේ ද? තෘෂ්ණාව යි.

තෘෂ්ණාවට ප්‍රත්‍යයෙක් ඇද්ද? ඇත.

ඒ කවරේ ද? වේදනාව යි.

වේදනාවට ප්‍රත්‍යයෙක් ඇද්ද? ඇත.

ඒ කවරේ ද? ස්පර්ශය යි.

ස්පර්ශයට ප්‍රත්‍යයෙක් ඇද්ද? ඇත.

ඒ කවරේ ද? නාමරූපය යි.

නාමරූපයට ප්‍රත්‍යයෙක් ඇද්ද? ඇත.

ඒ කවරේ ද? විඥනය යි.

විඥනයට ප්‍රත්‍යයෙක් ඇද්ද? ඇත.

ඒ කවරේ ද? නාමරූපය යි.

---

260. ඤාතපරිඤ්ඤා වශයෙන් අනුබෝධ නො කිරීමෙන්. 261. තීරණපරිඤ්ඤා පහානපරිඤ්ඤා වශයෙන් ප්‍රතිවේධ නො කිරීමෙන්. උපග්‍රන්ථය බලනු.

මෙසේ මෙ කී හැම පැණ විසැඳිය යුතු සි. මෙහි කී පරිදි,

නාමරූපප්‍රත්‍යයෙන්		විඥානය ද,
විඥාන	,,	නාමරූපය ද,
නාමරූප	,,	ස්පර්ශය ද,
ස්පර්ශ	,,	වේදනාව ද,
වේදනා	,,	තෘෂ්ණාව ද,
තෘෂ්ණා	,,	උපාදානය ද,
උපාදාන	,,	භවය ද,
භව	,,	ජාතිය ද,
ජාති	,,	ජරාමරණ ද ශෝක ද පරිදේව ද දුක්දොම්නස් ද වෙත්. මෙසේ මේ සියලු දුක් කඳේ ඉපැත්ම වේ.

4. **'ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණය වේ'** යන්න මෙසේ දත යුතු.

මෙහි දෙවු ගඳෙවු යක් බූ මිනිස් සිවුපා කුරුලු සප් යන මොවුන් ගේ ඒ දෙවුබව් ගඳෙවුබව් ඈ විසින් කිසි තැනෙක ඉපැදීමෙක් කොහෙත් මැ නො වී නම්, එසේ කලැ ජරාමරණයෙක් පැණේ ද?

අනඳ – වහන්ස, එසේ කලැ ජරාමරණයෙක් නො පැණෙයි.

බුදුරජුහු – එ බැවින් ජාතිය ජරාමරණයේ හේතුව ය, නිදානය ය, සමුදය ය, ප්‍රත්‍යය (කාරණ) ය.

5. **'භවප්‍රත්‍යයෙන් ජාතිය (උත්පත්තිය) වේ'** යන්න මෙසේ දත යුතු:

අනඳයෙනි, කාම රූප අරූප යැ යි තුන්වැදෑරුම් වූ භවය කිසිවකුට කො තැනෙක වත් කොහෙත් ම නො වේ නම්, එ කලැ උත්පත්තියෙක් පැණේ ද?

අනඳ – නො පැණේ, වහන්ස.

බුදුරජුහු – එබැවින් භවය ජාතියට හේතුව (කාරණය) වේ.

6. **'උපාදානප්‍රත්‍යයෙන් භවය වේ'** යන්න මෙසේ දත යුතු:

අනඳයෙනි, කාමුපාදන දිට්ඨුපාදන සීලබ්බතුපාදන අත්තවාදූපාදන යන සිවු උපාදන යමකුට කො තැනෙකත් කොහෙත් ම නො වී නම්, එසේ කලැ ඔහුට භවයෙක් පැණෙයි ද?

අනඳ – නො පැණෙයි, වහන්ස.

බුදුරජුහු – එබැවින්, **භවයට හේතුව (කාරණය) උපාදනය වේ.**

7. **'තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදනය වේ'** යන්න මෙසේ දත යුතු:

අනඳයෙනි, රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා යැ යි සවැදෑරුම් වූ තෘෂ්ණාව යමකු තුළ කොහෙත් ම කිසිවක් කෙරෙහිත් නො වී නම්, එසේ කලැ ඔහු ගේ උපාදනයෙක් පැණෙයි ද?

අනඳ – නො පැණේ, වහන්ස.

බුදුරජුහු – එබැවින් **උපාදනයට හේතුව (කාරණය) තෘෂ්ණාව ය.**

8. **'වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ'** යන්න මෙසේ දත යුතු:

අනඳයෙනි, චක්ඛුසම්ඵස්සජ[262] සෝතසම්ඵස්සජ ඝාණසම්ඵස්සජ ජිව්හාසම්ඵස්සජ කායසම්ඵස්සජ මනෝසම්ඵස්සජ යැ යි සවැදෑරුම් වේදනාව යමකුට කිසි තැනෙකත් කොහෙග ම නො වී නම් තෘෂ්ණාව ඔහු තුළ පැණෙයි ද?

අනඳ – නො පැණේ, වහන්ස.

බුදුරජුහු – එබැවින් තෘෂ්ණාවට හේතුව (කාරණය) වේදනාව ය.

---

262. චක්ෂුර්විඥානය හා රූප අරමුණ එකට ගැටුමෙන් උපදනා වේදනාව චක්ඛුසම්ඵස්සජ වේදනා යි. සෝතසම්ඵස්සජවේදනාදියත් මේ නයින් දත යුතු.

9. අනඳයෙනි, මෙසේ වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව පහළ වේ.

තෘෂ්ණාප්‍රත්‍යයෙන් පර්යේෂණය (රූපාදි අරමුණු සෙවීම) වේ.
පර්යේෂණ ,, ලාභය (රූපාදිය ලැබීම) වේ.
ලාභ ,, විනිශ්චය (ඉටු අනිටු ආදි වශයෙන් අරමුණු බෙදා ගැනීම) වේ.
විනිශ්චය හේතුයෙන් ඡන්දරාගය (ඒ රූපාදීන් කෙරේ ඇල්ම)වේ.
ඡන්දරාග ,, අධ්‍යවසානය (මම ය මගේ යැ සි දැඩි සනිටුහන) ඇති වේ.
අධ්‍යවසාන ,, පරිග්‍රහය (අයත් කොට ගැන්ම) වේ.
පරිග්‍රහ ,, මාත්සර්යය (මසුරුබව) වේ.
මාත්සර්ය ,, ආරක්‍ෂාව (වස්තුව රැක බලා ගැන්ම) වේ.
ආරක්‍ෂා ,, සතුරන් වළකනු පිණිස දඬු මුගුරු අවි ගැනුම්, කලහ විරෝධ විවාද පරොස්බස් කේලාම් මුසවා දූ යි නොයෙක් අකුශලයෝ පහළ වෙත්.

10. **'ආරක්‍ෂා හේතුයෙන් සතුරන් වළකනු පිණිස දඬු මුගුරු අවි ගැනුම් ආදිය වේ'** යන්න මෙසේ දත යුතු.

වස්තු රක්නට දොර වැසීම් ඈ විසින් යමකු ගේ රකවලෙක් කොතැනකත් කොහෙත් ම නැත් නම්, ඒ හේතුයෙන් විය යුතු දඬු මුගුරු ගැනුම් ඈ අකුසල්හු පහළ වෙත් ද?

අනඳ – නැත, වහන්ස.

බුදුරජුහු – එබැවින් මෙ **රකවළ** ම දඬු මුගුරු ගැනුම් ආදියට හේතු (කාරණ) වේ.

11. අනඳයෙනි, **'මසුරුකම හේතු කොට ගෙන රකවළ වේ'** යන්න මෙසේ දත යුතු:

කිසි වස්තුවක් කෙරෙහි කිසිවකු ගේ කොහෙත් ම මසුරු බවෙක්, 'මේ මට ම මිස අන්හට නො වේ වා' යි සිතන බවෙක් නො වී නම්, ඔහු ගේ රකවලෙක් වන්නේ ද?

අනඳ – නැත, වහන්ස.

බුදුරජුහු – එබැවින් මේ **මසුරුබව** ම **රකවළට** හේතු වේ.

12. අනඳයෙනි, **පරිග්‍රහ (අයත් කොට ගැනුම්) හේතු-යෙන් මසුරුබව වේ** යන්න මෙසේ දත යුතු:

'මේ මගේ යැ' යි (පරිග්‍රහයෙක් - තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් කිසිවක් දැඩි කොට ගැන්මෙක්) කොහෙත් ම නො වී නම් මසුරුබවෙක් පහළ වන්නේ ද?

අනඳ - නැත, වහන්ස.

බුදුරජුහු - එබැවින් **මසුරුබව පරිග්‍රහ හේතුයෙන් වේ.**

13. අනඳයෙනි, **'අධ්‍යවසානයෙන් (මම ය මගේ යි බලවත් සනිටුහනින්) පරිග්‍රහය වේ'** යන්න මෙසේ දත යුතු:

'මෙය මගේ ය' යන දැඩි සනිටුහනෙක් කිසිවෙකුත් කොහෙත් ම යමකුට නො වී නම්, ඒ දෑ තමා අයත් කොට ගැන්මෙක් (පරිග්‍රහයෙක්) වන්නේ ද?

අනඳ - නැත, වහන්ස.

බුදුරජුහු - එබැවින් අධ්‍යවසානය (මගේ යැ යි දැඩි සනිටුහන) පරිග්‍රහයට හේතු වේ.

14. අනඳයෙනි, **ඡන්දරාග හේතුයෙන් අධ්‍යවසානය වේ** යන්න මෙසේ දත යුතු:

යමකු තුළ කිසි ම අරමුණක් කෙරෙහි කොහෙත් ම ඡන්දරාගය (දුර්වල හෝ බලවත් ඇල්ම) නො වී නම්, ඔහුට අධ්‍යවසානයෙකුත් පහළ වේ ද?

අනඳ - නැත, වහන්ස.

බුදුරජුහු - එබැවින් අධ්‍යවසානයේ හේතුව, නිදානය ඡන්දරාගය යි.

15. අනඳයෙනි, **විනිශ්චය (ඉටු අනිටු විසින් අරමුණු විනිසිනුම්) හේතුයෙන් ඡන්දරාගය** වේ යන්න මෙසේ දත යුතු:

ඉටු අනිටු වශයෙන් අරමුණු විනිශ්චය කිරීම යමකු තුළ මුළුල්ල ම නිරුද්ධ වී නම්, එ කලැ ඡන්දරාගය ඔහු තුළැ පහළ වන්නේ ද?

අනඳ - නැත, වහන්ස.

බුදුරජුහු - එබැවින් විනිශ්චයය ඡන්දරාගයේ හේතුව යි (නිදානය යි).

16. අනඳයෙනි, **ලාභහේතුයෙන් විනිශ්චයය වේ** යන්න මෙසේ දත යුතු:

අරමුණු ලැබීමෙක් කොහෙත් ම නො වී නම්, ඉටු අනිටු විසින් විනිශ්චයයෙක් වන්නේ ද?

අනඳ – නැත, වහන්ස.

බුදුරජුහු – එබැවින් විනිශ්චයයේ නිදානය ලාභය යි.

17. අනඳයෙනි, **පර්යේෂණහේතුයෙන් (අරමුණු සෙවීමෙන්) අරමුණු ලැබීම වේ** යන්න මෙසේ දත යුතු:

පර්යේෂණ (අරමුණු සෙවීම) සර්වප්‍රකාරයෙන් ම දුරු වී නම්, ලාභය (අරමුණු ලැබීම) වන්නේ ද?

අනඳ – නැත, වහන්ස.

බුදුරජුහු – එබැවින් පර්යේෂණය ලාභයේ නිදානය යි.

18. අනඳයෙනි, **තෘෂ්ණාහේතුයෙන් පර්යේෂණය වේ** යන්න මෙසේ දත යුතු:

කාමතෘෂ්ණා භවතෘෂ්ණා විභවතෘෂ්ණා වශයෙන් ත්‍රිවිධ වූ සියලු තෘෂ්ණාව ම යමකු තුළැ නිරුඩ වී නම්, ඔහු ගේ අරමුණු සෙවීමෙක් වන්නේ ද?

අනඳ – නැත, වහන්ස.

බුදුරජුහු – එබැවින් තෘෂ්ණාව අරමුණු සෙවීමේ (පර්යේෂණයා ගේ) නිදානය (හේතුව) යි.[263]

අනඳයෙනි, මෙසේ (**වට්ටමූලක සමුදචාර වශයෙන් ද්විවිධ වූ) තෘෂ්ණාව වේදනාප්‍රත්‍යයෙන් ම වේ. ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව වේ** යන්න මෙසේ දත යුතු:

19. චක්ඛුසම්ඵස්සාදි ස්පර්ශයෙක් කොහෙත් ම යමකු තුළ නො වී නම්, වේදනාවෙක් පහළ වෙයි ද?

අනඳ – නැත, වහන්ස.

බුදුරජුහු – එබැවින් ස්පර්ශය වේදනාව ගේ නිදානය යි, හේතුව යි, ප්‍රත්‍යයය යි.

---

263. වස්තු සෙවීමෙහි ඇල්ම වූ **ඒෂණතෘෂ්ණාව** ද, සෙවූ දෑයෙහි ඇල්ම වූ **ඒෂිතතෘෂ්ණාව** දූ යි දෙවැදෑරුම් වූ තෘෂ්ණාව සමුදචාරතෘෂ්ණා නම්. සසරැ පැවැත්මට මූලික වූ තෘෂ්ණාව වට්ටමූලකතණ්හා නම්. වට්ටමූලකතණ්හාවත් ඒ සමුදචාරතණ්හාවත් වේදනාප්‍රත්‍යයයෙන් මැ වෙත්.

20. **නාමරූපප්‍රත්‍යයෙන් ස්පර්ශය** වේ යන්න මෙසේ දත යුතු:

විඳීම් හැඳිනීම් ආදි ආකාර සවභාවයන්[264] නිසා ම නාමධර්මසමූහයට වේදනාසංඥදි වශයෙන් පැණැවීම (බැව-හරය) වේ. ඒ විඳීම් ආදි ආකාර සවභාව නැති කල්හි ශබ්දඥනානුගත වැ මනෝද්වාරයෙහි මනෝසම්ඵස්සය වන්නේ ද?

අනද – නැත, වහන්ස.

බුදුරජුහු – යම් රූපපන (පෙරළෙන) ලක්‍ෂණයක් ඇති කලැ රූප යැ යි පැණැවීම වේ ද, ඒ ආකාර ලක්‍ෂණය නැති කලැ (රූපයක් නැති බැවින්) ප්‍රතිඝස්පර්ශය (රූපස්කන්ධය වාස්තු කොට පහළ විය යුතු ස්පර්ශය) පහළ වන්නේ ද?

අනද – නැත, වහන්ස.

බුදුරජුහු – නාමය රූපය යැ යි පැණැවීමට කාරණ වූ යට කී ආකාර සවභාව දෙක ම නැති කල (නාම රූප යැ යි ගත යුතු ධර්මයකුත් නැති හෙයින්) මනඃසංස්පර්ශය වත් ප්‍රතිඝසංස්පර්ශය (රූපස්කන්ධය වාස්තු කොට පහළ වන ස්පර්ශය) වත් පහළ වන්නේ ද?

අනද – නැත, වහන්ස.

බුදුරජුහු – නාමරූප යැ යි නම් ලබන ඒ ආකාර සවභාව-යන් නැති කලැ ස්පර්ශයෙක් පැණෙන්නේ ද?[265]

අනද – නැත, වහන්ස.

බුදුරජුහු – එ බැවින් නාමරූපය ස්පර්ශයේ නිදානය යි, හේතුව යි, ප්‍රත්‍යයය යි.

21. **විඤාන ප්‍රත්‍යයෙන්**[266] **නාමරූප** වේ යන්න මෙසේ දත යුතු.

ප්‍රතිසන්ධිවිඥානය මවු කුසැ පහළ නො වී නම්, ශුද්ධකලාපනදවශේෂ නාමරූපයෙක් කලලරූපාදිභාවයෙන් මිශ්‍ර වැ එහි පහළ වන්නේ ද?

---

264 වේදනාදීන් කෙරෙහි උනුනට වෙනස් වූ, ඒ ඒ ධර්මයට ම විශේෂවූ **ලක්‍ෂණ** මෙහි ආකාර නම් 265 *පංච ප්‍රාසාදයන්හි පහළ වන්නේ ද යනු අර්ථ යි 266. මෙහි 'නාම' යන්නෙන් වේදනා සඥ සංස්කාර යන ස්කන්ධත්‍රය අභිප්‍රේත යි.

අනඳ – නැත, වහන්ස

බුදුරජුහු – විඥානය මවු කුසැ පහළ වැ ච්‍යුත වුවොත්[267] නාමරූපයෙක් වන්නේ ද?

අනඳ – නැත, වහන්ස

බුදුරජුහු – විඥානය ච්‍යුත වූ කල හුදෙකලා නාමරූපයෙක් පහළ වැ වැඩී මිහිකිරීමට පැමිණේ ද?

අනඳ – නැත, වහන්ස.

බුදුරජුහු – එබැවින් විඥානය නාමරූපයේ හේතුව යි, නිදානය යි, ප්‍රත්‍යයය යි.

22. **නාමරූපප්‍රත්‍යයයෙන් විඥානය වේ** යන්න මෙසේ දත යුතු:

(වේදනාදී ස්කන්ධ තුනත් වාස්තුරූපත් ඇසුරු නො කොට විඥානය පහළ නො විය හෙන බැවින්) විඥානය නාමරූපයෙහි පිහිට නො ලද්දේත්, ජාතිජරාමරණාදි අනාගත දුඃඛරාශිය පහළ වන්නේ ද?

අනඳ – නැත, වහන්ස.

බුදුරජුහු – එ බැවින් නාමරූපය විඥානයා ගේ හේතුව යි, නිදානය යි, ප්‍රත්‍යය යි.

විඥානයට නාමරූපයත් නාමරූපයට විඥානයත් ප්‍රත්‍යයය වන කල ම ජාති ජරා ආදිය වේ. (අන්‍යෝන්‍ය ප්‍රත්‍යය හේතුවෙන් පවත්නා මේ විඥාන සහිත නාමරූපයට) සත්ත්ව-පුද්ගලාදි ව්‍යවහාරය වේ. ඔවුන් ගේ අන්‍යෝන්‍ය ප්‍රත්‍යයශක්ති-යෙන් සන්තති වශයෙන් පැවැත් ම (සංසාරවර්තය) වේ. වේදනාසංඥාදි වශයෙන් පැණැවීම පිණිස වූ ස්කන්ධපංචකය ද මෙතෙකින් (විඥාන-නාමරූප උභයට ප්‍රත්‍යය වන කල ම) වේ.

23. මේ ප්‍රතීත්‍යසමුත්පාදවිභාගය අනුබෝධ ප්‍රතිවේධ නො කළ සත්ත්වයෝ අවුල් වී ගිය හුයක් සේ මිථ්‍යාදෘෂ්ටියෙන් බැඳී වෙළී ගියාහු, සසර මුලාව දිවැ හැවිදිත්. එයට හේතු වූ ආත්මදෘෂ්ටිය කොතෙකින් පණවත් ද? යත්:

---

267. ප්‍රතිසන්ධි සිත හා එක විටැ පහළවූ කර්මජ රූපයෝ ඒ ප්‍රතිසන්ධි සිත පටන් පහළ වන භවාංග සිත් පෙලෙහි සන්තොලොස් වන භවාංගය පහළ වීමට ප්‍රත්‍යය නො වෙත් නම්, එයින් වන ච්‍යුතිය මෙහි කියන ලදි.

'ආත්මය රූපවත් ය, කුඩා ය'[270] කියා හෝ

'ආත්මය රූපවත් ය, අනන්තය'[271] කියා හෝ

'ආත්මය අරූපී ය, කුඩා ය'[272] කියා හෝ

'ආත්මය අරූපී ය, අනනත ය'[273] කියා හෝ ආත්මවාදී තෙමේ ආත්මවාදය පණවයි.

24. මේ සතර දෘෂ්ටීන් ම පණවන්නාහු වර්තමාන භවය ම සම්බන්ධ ආත්මයක් හෝ මරණින් මතු පවත්නා ආත්මයක් පණවත්. තමා පිළිගත් පරිදි නොවූ ඒ 'ආත්මය' එසේ ම යැ යි අන්‍යයාට පිළිගැන්වීමට ඒ හැම ශාශ්වතවාදියෙකුත් උච්ඡේදවාදියෙකුත් සිතයි.

මෙසේ යට කී ඒ සතර දෘෂ්ටි ගත්තාහු **රූපිපරිත්තත්තානුදිඨි, රූපිඅනන්තත්තානුදිඨි, අරූපිපරිත්තත්තානුදිඨි, අරූපිඅනන්තත්තානුදිඨි** යන මෙයින් බැඳුනාහු යැ යි කියැ යුතු.

එහෙත් ආර්‍ය්‍ය පුද්ගලයෝත් උගත් ධර්මධරයෝත් ඒ කිසි ආත්මදෘෂ්ටියක් නො පණවත්. නැති ආත්මයක් ඇති සේ ඔප්පු කිරීමට නො සිතත්. එසේ වූ ඔහු ඒ දෘෂ්ටීන් ගෙන් නො බැඳුණහ යි කියැ යුතු.

25. ආත්මවාදී තෙමේ **'වේදනාව ආත්ම යැ යි'** කියා හෝ **'වේදනාව ආත්මය නො වේ, ආත්මය විඳීම් රහිත යැ යි'**[274] කියා හෝ **වේදනාවත් ආත්ම නො වේ, ආත්මය විඳීම් නැත්තෙකුත් නො වේ, ආත්මය විඳී, ආත්මය විඳීම ස්වභාවය කොටැත්තේ යැ'**[275] යි කියා හෝ වරදවා දකී.

ආනන්දය, **වේදනාව ආත්මයැ යි** දෘෂ්ටිගත්තහුට "සුඛ දුඃඛ උපෙක්ෂා යැ යි වේදනා තුනෙකි. මෙ වේදනා තුනින් කවරක් ආත්ම වශයෙන් දකිහි දැ?'' යි මෙසේ කිය යුතු.

---

270 නොමහත් කිසුණු එළිය ආත්ම කොට සැලැකුයේ මෙසේ සිතයි 271. අනන්ත කොට මහත් සේ වඩන ලද කිසුණු එළිය ආත්ම යැ යි ගත්තේ මෙසේ සලකයි 272. නොමහත් කිසුණු එළිය උගුල්ලා එයින් සිතට ගැණෙන අහස (නොමහත් කසිණුග්ඝාටිමාකාසය) හෝ එය අරමුණු කරන නාමධර්ම හෝ ආත්ම වශයෙන් සලකනුයේ මෙසේ සිතයි. 273 මහත් කොට අනන්ත ලෙස වඩනා ලද කසිණඑළිය උගුළුවා ලත් අනන්ත අහස හෝ එය අරමුණු කරන නාමධර්ම හෝ ආත්ම වශයෙන් සලකනුයේ මෙය පණවයි. 274. මේ රූපය ආත්ම යැ යි දෘෂ්ටිගත්තහුගේ මතය යි. 275. මෙයින් විඥාන සංඥා, සංස්කාර තිදෙන ආත්ම කොට සලකන්නහු ගේ දෘෂ්ටිය දක්විණි.

සුඛවේදනාව ඇති කලැ අන් වේදනා දෙකින් කිසිවෙක් නැත. සුඛවේදනාව ම එවිට ඇති වේ. අන් වේදනා දෙකින් එකක් ඇති කල ද එය ම විනා ඉතිරි වේදනා කිසිවෙක් නැත.

ඒ සුඛ දුඃඛ උපේක්‍ෂා යන තුන් වේදනා ම අනිත්‍ය ය. ප්‍රත්‍යයයෙන් සංස්කෘත ය, ප්‍රතීත්‍යසමුත්පන්න ය, ක්‍ෂීණ වන ගෙවෙන බිඳෙන සුලු ය. වේදනාව ආත්ම යැ යි ගත්තේ වේදනා තුනින් යමක් ඇති කලැ එය ආත්ම යැ යි ද, එය නිරුද්ධ කල්හි ආත්මය පිටත් වැ ගියේ යැ යි ද මෙසේ ඉහාත්ම භාවයෙහි අනිත්‍ය වූ ද සැප දුකින් මිශ්‍ර වූ ද ආත්මයක් දකී.

ආනන්දයෙනි, **'වේදනාව ආත්මය නො වේ යැ යි ද, ආත්මය නො විඳී යැ යි'** ද කී තැනැත්තහු අතින් 'විඳීමක් නැති තැන **මම වෙමි** යි යන අහංකාරයක් ඇති විය හැකි ද?' යි පිළිවිසිය යුතු යි.

ආනන්ද – විඳීමක් නැති තැන **මම වෙමි** යි අහංකාරය විය නො හැක්ක, වහන්ස.

26. **බුදුරජුහු** – වේදනාවක් නැති තැන **මම වෙමි** යි හැඟීම නොවියැ හැකි බැවින් ආත්මය විඳීම් රහිත යැ යි කියන්නහු ගේ කථාව ද වැරැදි යි.

වේදනාව ආත්මය නුවූවත් ආත්මය වේදනායෙන් යුක්ත යැ යි කියන්නහු ගෙන් 'වේදනාව මුළුල්ල නිරුද්ධ වූවොත්, වේදනාව කොහෙත් ම නැති තැනැ 'මම වෙමි' යි අහංකාරයක් ඇතැ යි කියැ හැකි ? යි' ඇසියැ යුතු

ආනන්ද – එසේ නොකිය හැකියි, වහන්ස.

27. **බුදුරජුහු** – එබැවින් ඒ ආත්මවාදියා ගේ පැණැවිම ද නො පිළිගත හැකි යි.

මෙ කී දිට්ඨිසමනුපස්සනා තුනින් ම දුරු වූ මහණ තෙමේ රූපාදී පසින් කිසිවක් ආත්ම ආත්මීය වශයෙන් වරදවා නො ගනී. නොගත්තේ තෘෂ්ණාවට[276] නො පැමිණේ. තෘෂිත නො වන්නේ ක්ලේශපරිනිර්වාණයෙන් පිරිනිවේ. එසේ කෙලෙසුන් ගෙන් මිදුණු සිතැති මහණහට 'තථාගත තෙම මරණින් මතු ඇතැ' යි කියා හෝ 'නැතැ' යි කියා හෝ 'ඇත්තේත් නැත්-තේත් නො වේ' යැ යි කියා හෝ දෘෂ්ටියක් වෙතැ යි නොකියැ

276. තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් භවපිපාසා නැත්තේ වෙයි.

යුතු. කවර හෙයින? එ මහණ ලෝවහරක් එයට වාසනු වූ ධාතු ආයතනනත් විශිෂ්ට නුවණින් දැන කෙලෙසුන් ගෙන් මිදුණේ ය. එසේ මිදුණු මහණ එකි ධම් නො දකි නො දනී යැ' යි හෝ එ මහණහට 'තථාගත තෙම මරණින් මත්තෙහි වේ' ආදි දෘෂ්ටි ඇතැයි හෝ නො කියැ යුතු.

28. අනදයෙනි, **විඥානස්ථිති** (සිත පිහිටන තැන්) සතෙකි. සිතට **ආයතන** (වාසස්ථාන) දෙකෙකි.[277]

විඥානස්ථිති සත නම්:

i. කයිනුත් ප්‍රතිසන්ධිසංඥයෙනුත් එනුනට වෙනස් වූ සත්ත්වයෝ ය. ඔහු නම්: මිනිස්සුත් ෂට් කාමාවචර දෙවියෝත් ඇතැම් විනිපාතික ප්‍රේතයෝත් ය.

ii. කයින් වෙනස් වූ ප්‍රතිසන්ධිසංඥයෙන් සමාන වූ සත්ත්වයෝ ය. ඔහු නම්: ප්‍රථමධ්‍යානයෙන් උපන් බ්‍රහමකායික දෙවියෝ ය.

iii. කයින් සමාන වූ ප්‍රතිසන්ධිසංඥයෙන් ඔවුනොවුනට වෙනස් සත්ත්වයෝ ය. ඔහු නම්: ආභස්සර දෙවියෝ ය.

iv. කයිනුත් ප්‍රතිසන්ධිසංඥයෙනුත් ඒකත්වය ඇති සත්ත්වයෝ ය. ඔහු නම්: සුභකිණ්හක දෙවියෝ ය.

v. ආකාසානඤ්චායතනූපග සත්ත්වයෝ ය,

vi. විඤ්ඤාණඤ්චායතනූපග සත්ත්වයෝ ය,

vii. ආකිඤ්චඤ්ඤායතනූපග සත්ත්වයෝ ය යන මොහු ය.

31. අසඤ්ඤසත්තායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යනු **ආයතන දෙක ය.**

32. මෙ විඥනස්ථිතිසතත් ආයතන දෙකත්, අවිද්‍යාසමුදයයෙන් රූපසමුදය යැ යි ආදි නයින් වන හටගැන්මත්, අවිද්‍යානිරෝධයෙන් රූපනිරෝධය වේ යන ආදි නයින් වන නිරෝධයත්, රූපාදීන් නිසා පහළ වන කායික මානසික සැප විඳීමුත්, රූපාදීන් ගේ අනිත්‍ය බව දුක් බව පෙළෙන සුලු බව යැ යි කියන ලද දෝෂත්, ඒ රූපාදීන් කෙරෙහි වන ඇල්ම දුරුකිරීමත්, නිස්සරණයත් ඇති සැටි දැන, ඒ රූපාදි කිසිවක් තෘෂ්ණා වශයෙන් දෘෂ්ටි වශයෙන් දැඩි කොට නො ගැන්මෙන්

277. දිට්ඨිසමනුපස්සනාදියෙන් දුරු වූ මහණ නො ලග්නා විඥනස්ථිත් ආයතනත් දක්වනු වස් මෙ තැන මෙය වදාරන ලදි.

කෙලෙසුන් කෙරෙන් මිදුණු මහණ තෙමේ ඒ විඤ්ඤාණස්ථිතීන්ගෙනුත් ආයතන දෙකෙහිත් ඇලෙන්නට හැකි නො වේ. එසේ ඒ විඤ්ඤාණස්ථිතීනුත් ආයතනත් දැන මිදුණු මහණ **ප්‍රඥාවිමුක්ත** (ප්‍රඥාව හේතුකොට ගෙන ම කෙලෙසුන් ගෙන් මිදුණේ) නම් වේ.

33. ආනන්දයෙනි, මේ **විමෝක්ෂ** අටෙකි.[278] එ නම්:

i. සිය සිරුරෙහි කෙස් ආදියෙහි කිසුනු පිරියම් කොට, බාහිර ප්‍රතිභාග නිමිත්ත අරමුණු කොට ලත් සතර රූප ධ්‍යාන සමාපත්ති, ii. සිය සිරුරෙන් පිටත්හි බාහිර පරිකර්ම ප්‍රතිභාග නිමිත්තෙහි ලත් රූපධ්‍යාන සමාපත්ති, iii. බාහිරවූ ඉතා පිරිසුදු නීලාදි වර්ණයෙහි පිරියම් කොට ලත් ශුභ (අතිපවිත්‍ර) ප්‍රතිභාග නිමිත්තෙහි ලත් රූපධ්‍යාන සමාපත්ති, iv. ආකාසානඤ්චායතන ධ්‍යානසමාපත්තිය, v. විඤ්ඤාණඤ්චායතන ධ්‍යානසමාපත්තිය, vi. ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානසමාපත්තිය, vii. නේවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානසමාපත්තිය, viii. නිරෝධසමාපත්තිය යන අට යි.

34. අනුලෝම වසයෙන් (මුල පටන් අග දක්වා) ද, පිළිලෝම වසයෙන් (අග සිට මුල දක්වා) ද, අනුලෝම පිළිලෝම වසයෙන් ද, කැමැති තැනෙක කැමැති සමවතකට කැමැති තෙක් කල් සමවැද සිටීම් වශයෙන් ද, කැමැති විටෙක ඉන් නැඟී සිටීම් වශයෙන් ද, යට කී අෂ්ට විමෝක්ෂයන් වඩන, මේ අත්බව්හි ම කෙලෙස් නසා ඵලඥානයත් ඵලසමාධියත් ලබා වසන මහණ තෙමේ **උභතෝභාගවිමුක්ත**[279] නමි.

මෙයට වඩා උසස් ප්‍රණීත වූ (උතුම් වූ) උභතෝභාග-විමුක්තියෙක් (දෙපසින් මිදීමෙක්) නැත.

[පටිච්චසමුප්පාදයේ ගැඹුරු බව, එහි අනුබෝධ ප්‍රතිවේධ නැති හෙයින් සත්ත්වයන් සසර සරන බව, උපනිඃශ්‍රය ප්‍රත්‍යය වශයෙන් අකුසල් හටගන්නා පරිදි, සප්ත විඤ්ඤාණස්ථිති, අෂ්ට විමෝක්ෂ යන මොහු මෙහි දැක්වුණාහ.]

---

278. විමෝක්ෂ නම් සතුරු නීවරණයන්ගෙන් මොනොවට මිදුණු ධ්‍යානාලම්බනයෙහි තදින් පිහිටි ධර්මයෝ ය. සමාපත්ති අටෙකි. 279. අරූප සමාපත්තියෙන් රූපකාය කෙරෙන් ද සතර මාර්ගයෙන් නාමකාය කෙරෙන් ද මිදුණ පුද්ගල තෙමේ උභතෝභාගවිමුක්ත (දෙපසින් ම මිදුණේ) යැ යි කියනු ල.බේ. රූපසමාපත්ති උපදවා සිට ධ්‍යාන පාදක කොට රහත් වූ පුද්ගලයා ද, අනාගාමී ව සිට නිරෝධසමාපත්තියෙන් නැඟී රහත් වූ පුද්ගලයා ද මෙයින් අභිප්‍රේත යි.

16. මහාපරිනිර්වාණ සූත්‍රය.

එක් සමයෙක භගවත් බුදුරජුහු **රජගහ** පුර අසල වූ ගිජුකුළු පව්වෙහි වැඩ වෙසෙති. එ සෙමෙහි දිනක් අජාසත් රජු විසින් මෙහෙයන ලද මගද මහමැති **වස්සකාර** බමුණු බුදුරජුන් වෙත් ගොස් සුවදුක් කතා කොට පසෙක හිඳ ගත. එසේ හිඳ, අජාසත් රජුහු වැදූරජුන් හා සටනට සැරසෙන බව කී ය.

2. එ විට බුදු රජුහු පවන් සලමින් පිටු පසැ සිටි අනඳ තෙරුන් අමතා 'පෙරැ තමන් වැදූ රජුනට වදාළ i. නිතර එක් රැස්වීම, ii. සමග ව රැස්වීම, සමග ව සභායෙන් නැගී සිටීම, සමඟ ව කටයුතු කිරීම, iii. පෙර වැදූ රජුන් නො පැණවූ දූයක් නො පැණවීම, පැණැ වූ දූ නො සිඳීම, පණවා ඇති සියලු අණපණත් නො පිරිහෙලා රැකීම, iv. වැඩිමහල්ලනට යටත් පැවැත්ම, සුවච බව, ගරුබුහුමන් කිරීම, v. කුලවමියන් කුලකුමරියන් බලාත්කාරයෙන් තමන් වෙතට නො පැමිණැවීම, vi. දේවාලයවලට කැර ගෙන ආ දැහැමි පූජා අත් නො හැරීම. vii. සිය රටට නො පැමිණි රහතුන්හට එන්නටත් ආ රහතුන්හට එහි සුව සේ ඉන්නටත් සැලැසීම යන අපරිහානිය ධර්‍ම සත ඔහු රක්නාහු දැ?' යි විචාරා, 'ඒ නො පිරිහෙලා රකිති' යි අනඳ තෙරුන් කී විට, 'ඒ අපරිහානිය ධර්‍ම සත රක්නා තාක් ඔවුනට වැඩි දියුණුවක් ම විනා පිරිහීමක් නො වෙතැ' යි වදාළහ. ඉක්බිති වස්සකාරයාට ද කතා කොට තමන් විසල්පුර වසන එක් සමයෙක වැදූවනට සත් අපරිහානිය ධර්‍ම දෙසූ බවත්, එහි පිහිටා සිටුනා තාක් ම ඔවුනට හානියක් නො වන බවත් පැවැසූහ.

3. එයසා වස්සකාර බමුණු 'මෙකී දහම් එක එකෙකින් සමන්විත වූවහුට ද වැඩක් විනා පිරිහීමක් නො වන තැන, මෙ සතින් ම සමන්විත වූ කලැ කිසි සේත් පිරිහීමක් නො වෙතැ'යි ද ඔවුනට සංග්‍රහ කොට යහලු වීමෙන් හෝ ඔවුන් උනුන් බිඳුවීමෙන් හෝ විනා සටනෙකින් වැදූවන් මැඩලනු අජාසත් රජුට නොහැකි යැ'යි ද කියා නික්ම ගියේ ය.[280] ඔහු ගිය නො බෝ වේලෙහි බුදුරජහු අනඳ තෙරුන් බණවා, රජගහ

---

280. තමන් වහන්සේ නො වදළත් අජාසත් රජ කීප දිනෙකින් ගොස් ලිච්ඡවීන් නසන්නේ ය. මෙසේ වදළ විට යුධාරම්භ කිරීම කල් දමා ඔවුන් ගේ සමගිය බිඳුවන්නට තැත් කරන්නේ තුන් වසක් ඉක්මවන්නේ ය. මෙසේ ලිච්ඡවීනට ලඟදී ම විය හැකි වූ ජීවිතහානිය නවතා තව වසී තුනක් ජීවත් වන්නට මඟ සැලැස්වූ සේක. ඔවුන්ගේ විනාශය පෙර අකුසලයෙක විපාක විසින් වන, නොවැළැක්විය හැක්කකි.

අසල ඉන්නා සියලු භික්ෂූන් උවටින්හලෑ රැස් කරවා, එහි වැඩ, ඔවුනට අපරිහානිය ධර්ම (භික්ෂූන් ගේ අභිවෘද්ධියට හේතු වූ ධර්ම) දෙසූහ.

4. ඒ අපරිහානිය ධර්ම නම්:

i. භික්ෂූන් නිතර පාහේ බෙහෙවින් එක්රැස් වීම, ii. සමඟ වැ රැස්වීම, සමඟ වැ නැගිටීම, සමග වැ සංඝකර්ම කිරීම, iii. තථාගතයන් වහන්සේ නොපැණවූවක් නො පැණැවීම, පණවන ලද සිකපද නො පිරිහෙලා රැකීම, iv. පැවිදි උපසපත් වැ බොහෝ කල් වූ වැඩි සිටි මහ තෙරුනට ගරු බුහුමන් කිරීම, ඔබ වචනයට කන් දීම. v. තෘෂ්ණාවට වහල් නොවීම, vi. වන සෙනසුන බලා පොරොත්තු වීම, (එහි භාවනානුයෝගී වීම.), vii. නොපැමිණි පියසිල සබ්රම් සරුත්ගේ පැමිණීම ද පැමිණියවුන් ගේ ඵාසුවිහරණය ද සැලැසීමෙහි එළැඹ සිටි සිහියෙන් විසීම. **මේ පළමු අපරිහානිය ධර්ම සත ය.**

5. i. සිවුරු සෙවීම් ආදියෙහි මුළු කාලය ම නො ගෙවා ඒ ඒ කටයුතු පැමිණි වේලාවේදී ම කිරීම, ii. ආලාප සංලාප කථායෙහි ඇලී කල් නොගෙවීම, iii. නිද්‍රායෙන් කල් නො ගෙවීම, iv. ගණසඞ්ගණිකායෙහි නොඇලීම, v. ලාමක අදහසිනුත් ලාමක අදහස් ඇත්තවුන් ගෙනුත් දුරු වීම, vi. පාපමිත්‍රසේවනයෙනුත් ඔවුනට අවනත බැව්නුත් වෙන් වීම, vii. ප්‍රථමධ්‍යානාදිමාත්‍රයක් ලත් පමණින් තෘප්තියට නොපැමිණ මතුමත්තෙහි උසස් ගුණ ලැබීමට ද තැත් කිරීම. **මේ දෙවෙනි අපරිහානිය ධර්ම සත ය.**

6. i. සැදැහැවත් වීම, ii. පව පිළිකුල් කිරීම. iii. පවට බිය වීම, iv. බොහෝ ඇසූ පිරූ තැන් ඇති වීම, v. පටන්ගත් කායික චෛතසික වීර්‍ය ඇති වීම, vi. එළැඹෑ සිට සිහි ඇති බව, vii. ප්‍රඥ සම්පන්න වීම. **මේ තෙවෙනි අපරිහානියධර්ම සත ය.**

7. i. සතිසම්බොජ්ඣඞ්ගය වැඩීම,[281] ii. ධම්මවිචයසම්-බොජ්ඣඞ්ගය වැඩීම, iii. විරියසම්බොජ්ඣඞ්ගය වැඩීම, iv. පීති-සම්බොජ්ඣඞ්ගය වැඩීම, v. පස්සද්ධිසම්බොජ්ඣංගය වැඩීම, vi. සමාධි සම්බොජ්ඣඞ්ගය වැඩීම, vii. උපෙක්ඛාසම්බොජ්ඣ-ඞ්ගය වැඩීම. **මේ සිවුවන අපරිහානිය ධර්ම සත ය.**

281. සම්බොජ්ඣඞ්ග (සම්බෝධ්‍යංග) සම්බෝධිය නංවා ලන එයට සහකාරී බලවත් ප්‍රත්‍යයයෝ යි. සම්බෝධි යනු මාර්‍ගඥානය යි. සති විරිය පඤ්ඤා, පස්සද්ධි එකග්ගතා තත්‍රමජ්ඣත්තතා යන චෛතසිකයෝ මාර්‍ග සිත්හි මාර්‍ගඥානයෙහි අවයව වී පහළ වුවාහු පිළිවෙළින් සතිසම්බොජ්ඣාදි නම් ලබත්.

8. i. අනිච්චසඤ්ඤව වැඩීම,[282] ii. අනත්තසඤ්ඤව වැඩීම, iii. අසුභසඤ්ඤව වැඩීම, iv. ආදීනවසඤ්ඤව වැඩීම, v. පහාණසඤ්ඤව වැඩීම vi. විරාගසඤ්ඤව වැඩීම, vii. නිරෝධසඤ්ඤව වැඩීම. **මේ පස්වනා අපරිහානිය ධර්ම සතය.**

9. i. සබ්රම්සරුන් කෙරෙහි හමුයෙහිත් නොහමුයෙහිත් මෙත් සහගත ව කායකර්මය එළැවීම, ii. සබ්රම්සරුන් කෙරෙහි හමු නොහමු දෙතන්හි ම මෙත් සහගත ව කතා කිරීම, iii. සබ්රම්සරුන් කෙරෙහි මෙත් සහගත ව මනඃකර්මය එළැවීම (සිතීම), iv. දැහැමින් ලත් පසය සබ්රම්සරුන් හා පොදුවේ වැළැඳීම, v. සබ්රම්සරුන් හා සිල් ගුණයෙන් සමාන වැ විසීම. vi. සබ්රම්සරුන් හා දිටුයෙන් (සම්දිටුයෙන්) සමාන වැ විසීම. **මේ සවැනි කොට වදාළ අපරිහානිය ධර්ම සය ය.**

බුදුරජුහු මෙ අපරිහානිය ධර්ම වදරන්නාහු, මෙහි පිහිටා සිටිනා තාක් භික්ෂූන් ගේ අභිවෘධිය ම මිනා පිරිහිමක් නොවන බව් වදාළහ.

10. ටික කලක් බුදුරජුහු ගිජුකුළ පව්වෙහි වුසූහ. එසේ වසන්නාහු,

ශිල නම් සමාධි නම් ප්‍රඥා නම් මෙසේ යැ සි ද, ශිලයෙහි පිහිටා වැඩු සමාධිය ද එසේ ම සමාධියෙහි පිහිටා වැඩු ප්‍රඥාව ද මහත් පල ඇතැ සි ද, ප්‍රඥාපරිභාවිත වු සිත කාමාදි ආශ්‍රවයන් ගෙන් මොනොවට මිදේ යැ'සි ද, මෙසේ ශීල සමාධි ප්‍රඥා පිළිබඳ කථාව ම බහුල කොට ඇති ධර්ම කථායෙන් භික්ෂූනට ඔවා දුන්හ. පිරිනිවෙන කාලය ළඟ බැවින් හැමතැන දී මෙ ශීල සමාධි ප්‍රඥා පිළිබඳ කථාව ම බෙහෙවින් වදාළහ.

11. බුදුරජුහු ටික දිනක් රජගහපුර වැස අනඳ තෙරුන් හා එයින් නික්මැ **අම්බලට්ඨිකා** උයනෙහි රාජාගාරකයට වැඩ එහි වුසූහ. ටික දිනෙකින් පසු එයින් නික්මැ **නාලන්‍දා**වට වැඩියහ. එහි පාවාරික අඹවෙනෙහි වුසූහ. මෙ සමයෙහි සැරියුත් තෙරණුවෝ බුදුරජුන් කෙරෙහි තමන් ගේ පැහැදීම දක්වා දික් කථාවක් කළහ.[270] බුදුරජුහු ටික දිනෙකින් පසු පළොල් (පාටලී) ගමට වැඩියහ

282. අනිච්චානුපස්සනා අනත්තානුපස්සනා අසුභානුපස්සනාදි සත් අනුපස්සනා හා එක් වැ පහළ වන එහෙයින් ම සත්වැදෑරුම් වූ සංඥාචෛතසිකය ම අනිච්චසඤ්ඤාදි විසින් සතක් කොට දක්විණ මොහු ලොව් සිත්හි යෙදුණාහු ලොව්හ, ලොවුතුරුසිත්හි යෙදුණෝ ලොවුතුරු හ. විසුඩිමග්ගයේ මග්ගාමග්ගඤාණදස්සනවිසුඩි විස්තරයේ පටන් ඉදිරියට බලනු. 270. මෙය මතු සම්ප්‍රසාදනීය සුත්‍රයෙහි පහළ වන්නේ ය.

12. පලොල්ගැමි උවසුවෝ ඔබ එහි වැඩි පවත් අසා තමන් අළුතැ කරවා නිමැවූ ආගන්තුකාවාස ගෙයට එ දිනැ සැන්දෑවේ ඔබ වැඩම කැරැවූහ. එහිදී ඔබ ඔවුනට ශීල විපත්තියේ දෙසුත් ශීලසම්පත්තියේ අනුහසුත් වදළහ:

සිල් රක්නහු නොපමා බැවින් දනවත් වීම,

සිල්වතා යැ යි පැසැසුම් හඬ පැතිරීම,

සබයට යත නොබා යෑම,

සිහි මුළා නොවී කලුරිය කිරීම,

මරණින් මතු සුගතියේ ඉපිදීම

යන මේ පස සිල් රැක්මේ අනුසස් ය.

පණිවා ඇති යෙදුණහුට දැහැමි රැකියාවක් කැරැගන්නට ඉඩ නොලැබීම,

හිර ගෙවල වැටීම් ආදි ගිරහැර විඳින්නට වීමෙන් සම්පත් හානිය,

දුශ්ශීලයෙකැ යි අපකීර්තිය,

බියසුලු ව සබයට යෑම,

සිහි මුළාව කලුරිය කිරීම,

මරණින් මතු දුගතියෙහි ඉපැදීම,

යන මොහු දුසිල්බවේ දෙස් ය.

13. බුදුරජුහු රැ බොහෝ වේලා පලොල්ගැමි උවසුවනට බණ වදරා ඔවුන් නික්මැ ගිය පසු විවේක සැපයෙන් කල් යැවූහ.

එ සමයෙහි අජාසත් රජු ගේ නියෝගයෙන් **සුනිධ වස්සකාර**[283] යන මගද මහඇමැතියන් විසින් වැදූවන් මැඩැලනු පිණිස එහි කරවන නුවරෙහි ගෙ මැදුරු ඈතට අරක් ගන්නා කුදුමහත් දේවතාවන් බුදුරජුහු දිවැසින් දුටුහ. දැක එ බව් පසු ද අලුයම්හි අනඳ තෙරුනට වදළහ. ඒ නැංවෙන නුවර **පැළලුප් (පාටලිපුත්‍ර)** නම් වන බව ද, **ගින්නෙනුත් දියෙනුත්** ඇතුළත ජනයා ගේ අතරැ වන **භේදයෙනුත්** එය වැනැසෙන බව ද[284] වදළහ.

283. සුනිධ වස්සකාර දෙදෙන අජාසත් රජුහු මහ මැතියන. තුමූ සස්නා නො පැහැදුණ ද, බුදු උවටු වූ සිය රජුහු ගෙන් නිගා ලැබෙති යි ඔහු සිත් ගන්නා පිණිසත් බුදුරජුන් සිරිපා පහස ලත් තැනා සෞභාග්‍යය ඇති වනැ යි හදනත බැවිනුත් මෙසේ බුදුරජුනට නිමැතුම් කළහ. 284. එනුවර කොටසක් ගින්නෙනුත් එක් කොටසක් ගංගානදියට ගොදුරු වීමෙනුත් එක් කොටසක් කේලාම් අසා භින්න වූ ජනයන් ගේ උනුන් භෙදයෙනුත් යැ යි තුන් පරිද්දෙකින් තුන් වරෙක වැනසෙන්නේ යැ යි වදළසේ ය.

14. එ දිනැ **සුනිධ වස්සකාර** දෙදෙන බික්සඟහා සහිත බුදුරජුන් නිමතා සිය ආවාස ගෙට වැඩම කරවා බොජුන් වැළැඳවූහ. බුදුරජුහු බොජුන් අවසනැ,

"යම් පෙදෙසෙකැ නුවණැත්තෙක් වෙසේ ද, හේ එහි දී සිල්වත් සංයත වූ බ්‍රහ්මචාරීනට අන්නපානයෙන් සංග්‍රහ කොට, එ පෙදෙසට අරක් ගත් දෙවියනට ඒ දානමය පින පමුණුවා නම්, ඔහු විසින් පින් දීමෙන් පුදන ලද බුහුමන් කරන ලද ඒ දෙවියෝ ඔහු පුදත්, ඔහුට බුහුමන් කරත්. මවක ලෙහි ද පුතකුට සේ ඔහුට අනුකම්පා කරත්. දෙවියන් විසින් අනුකම්පිත ඒ පුරුෂ සොඳුරු දෑ දකි" යැ යි බණ වදරා හුනස්නෙන් නැඟී වැඩියහ.

බුදුරජුන් නුවරින් නික්මෙන දොර දැන ගනු රිසියෙන් ඒ ඇමැතියෝ ඔබ පසුපස්සෙන් ගියහ. බුදුරජුහු නුවරැ යම් දොරෙකින් නික්මුණෝ ද එය එතැන් පටන් කොට **ගොයුම්-දොර (ගෞතම ද්වාර) නම් විය.**

15. බුදුරජුහු ගංගා නදිය තෙරට වැඩ, ඉදුබෙලෙන් තික්ෂූන් හා එතෙරැ පිහිටියහ. දෙගොඩ තලා ගලන ගංගානදිය තරනුවට ඔරු පාරු ආදිය සොයන ජනයා දුටු බුදුරජුහු,

"මඳ දියකඩක් තරිනුවට මේ මහ දෙනෝ පසුරු බඳී. සිවු මහවතුරු තිණූ පැණවත්හු එ කිසිත් නැති ව එ තෙර ගියහ" සී වදළහ.

16. ඉක්බිති එ තැනින් නික්මැ **කෝටිග්‍රාමයට** වැඩියහ. එහිදී **'දුක, දුක් හේතුව, නිවන, නිවන් මග යන සතර දහම් අනුබෝධ ප්‍රතිවේධ නො කළ හෙයින් තමන් ද සිය සව්වන් ද ගත වූ දික් සසර හැසුරුණු නුමුත් දැන් ඒ දහම් අනුබෝධ ප්‍රතිවේධ කොට ඇති බැවින් මෙයින් මතු සසර ගමනෙක් නැතැ'** යි ද වදළහ.

17. බුදුරජුහු ටික දිනෙකින් පසු **කෝටිග්‍රාමයෙන්** නික්මැ, **ඤාතික**ග්‍රාමයට වැඩ, එහි **ගිංජකාවසථ**යෙහි (ගඩොළුගෙහි) වුසූහ. එහිදී එ ගමැ කළුරිය කළ **සාළ්හ** මහණ **නන්ද,** මෙහෙණ ආදීන් ගේ පරලොව ගති විචාළ අනඳ තෙරුනට එය වදරා **'ධර්මාදර්ශයෙන්**[285] යුක්ත වූවහු සම්බෝධිපරායණ වෙති' යි වදරා ඒ **ධර්මාදර්ශ** ධර්මය විස්තර කළහ.

---

285. ධර්මාදර්ශ නම් ලොවුතුරු සැදැහැව යි.

18. ටික දිනෙකින් පසු බුදුරජුහු **විසල්පුර අම්බපාලි** වනයට වැඩියහ. එහි දී **සතිසම්පජඤ්ඤයෙන් කල් යැවීමට** භික්ෂූනට අනුශාසන කළහ. **අම්බපාලි** ගණිකාව බුදුරජුන් වෙත ගොස් බණ අසා පසු ද, දනට නිමතා ගියා ය. බුදුරජුහු එහිදී තමන් දක්නට ආ ලිච්ඡවීන් මහණුනට පෙන්නා **තව්තිසා වැසි දෙවියන් නොදුටුවන් විසින් ලිච්ඡවින් බැලූව මනා යැ යි, ඔවුන් ගේ ශෝභාව තව්තිසාහි දෙවියන් ගේ ශොභාව බඳු යැ' යි** වදාළහ. බුදුරජහු, අම්බපාලිය ගේ දන පිළිගත් බැවින්, ලිච්ඡවීන් එ දිනට කළ නිමැතුම නො පිළිගත්හ.

19. බුදුරජුහු එහි කිහිප දිනක් වැස එයින් නික්මැ **බේළුව** ගමට වැඩියහ. භික්ෂුහු ද බුඩනියෝගය පරිදි **විසල්** පුර අසලැ තත්හි තත්හී වස් එළැඹියහ. මේ වස් කාලයේ දී බුදුරජුනට දරුණු ආබාධයෙක් ඇති විය. බුදුරජුහු **'තව දස මංසකින් පිරිනිවන් පාන්නෙමි'යි** ඉටා පුර්භාග වීර්යයෙනුත් ඵලසමාපත්තියෙනුත් ඒ රෝගය මැඬැ පැවැත්වූහ.

20. බුදුරජුන් ගිලන් බැවින් නැගී සිටි කලැ ආනඳ තෙරණුවෝ ඔබ අසනීපය දක්මෙන් තමනට සිහි එළඹවා ගන්නට නො හැකි තරම් වූ ශෝක ඇති වූ බවත් එහෙත් භාග්‍යවතුන් වහන්සේ පශ්චිමාවවාදය නො වදරා පිරිනිවන් නො පානා බව සලකා සිත සනසාගත් බවත් සැළ කළහ. එවිට බුදුරජුහු තමන් ගේ **දහම්හි ගුරුමුෂ්ටි වශයෙන් රැක ගත් කිසිත් නැති** බවත් **සියලු ධර්ම** එළිදරවු කොට වදරා ඇති බවත්,

"මම ම භික්ෂු සංඝයා පරිහරණය කරන්නෙමි, භික්ෂු සංඝයා මා උදෙසා ම වේ වා" යි ඊර්ෂ්‍යාමාත්සර්‍ය සහගත අදහසක් තමන් තුළ නැති බවත් බෝරුක්මූලදී ම ඒ සියල්ල සුන්කළ බවත්,

තමන් ජීර්ණ වෘඩ අසූවයස් මහල්ලකු බවත්, ජරපත් රියක් වක්‍රබන්ධනාදියෙන් සකසා රැක ගන්නා සේ සිය සිරුර රහත්පලසමවත් බලයෙන් බඳනා ලදු ව යැපෙන බවත්,

පලසමවතින් කයට පහසුව ඇති බවත්,

එ බැවින් තමා ම, ධර්මය ම, පිහිට කොට, පිළිසරණ කොට ගෙන විසිය යුතු බවත්,

එසේ වසන සිල්වත් භික්ෂූන් සිය සස්නෙහි අග්‍ර ම පදයෙහි පිහිටියන් වන බවත් වදාළහ.

21. ඉක්බිති පෙරවරුයෙහි විසල්පුර පිඩු පිණිස හැසිර වළඳ චාපාල චෛත්‍යස්ථානයට වැඩ දිවාවිහාරණය කළහ. එහිදී අනඳතෙරුන් බණවා, **සතර ඍද්ධිපාද වැඩුවහු විසින් ඒ ඒ කලැ මිනිස්නට ජිවත් විය හැකි සම්පූර්ණ ආයුකාලය[286] හෝ එයට වැඩිවූ ද මදක්කල් සිටිය හැකි බව** තෙවරක් ම පැවැසූහ. බුදුරජුන් වදාළ මේ වචනයේ අදහස අනඳ තෙරණුවෝ නොවටහා ගත්හ. එහෙයින් 'තව කලක් වැඩ ඉන්නැ' යි ආයාචනා කිරිමට තෙරුනට නො සිතිණ.

21. අනඳ තෙරුන් එතැනින් ඉවත් වූ කෙණෙහි පිරිනිවෙන ලෙසට මරු අයැදී.[227] තව **තෙ මසක් ඇවෑමෙන් තමන් පිරිනිවන් පානා බව** බුදුරජුහු වදාළහ. මෙසේ වදරා '**මෙ තුන් මසින් මත්තෙහි සමවත් නො සමවදින්නෙමි**' යි සිත පහළ කළහ. එකෙණෙහි මහත් පොළෝ සැලුමෙක් විය. දෙව්බෙර පැළිණ (අහස් ගිගුරුම් විය).

මෙහි තතු සැලැකූ බුදුරජුහු "**බුඩමුනි තෙම භවයත් නිවනත්** (ස්කන්ධ පංචකය අනිත්‍ය ය. නිවන නිත්‍ය යැ යි ආදි වශයෙන්) **මැන බලන්නේ භවයේ දොසුත් නිවනේ අනුහසුත් දැක, භවගාමිකාම් අසීමාගීඥානයෙන් දුරු කළේය. හේ විවසුන්හි ඇලුණේ ශමථභාවනායෙන් සංසිඳුණේ තමා තුළැ පහළ වූ ක්ලේශරාශිය, මහායෝධයකු සන්නාහයක් බිඳැලන්නා සේ ශමථවිදර්ශනාබලයෙන් බිඳ දැමි යැ**" යි උදන් ඇනූහ.

22. මහත් ප්‍රතිවිචලනයත් මෙඝගර්ජනාත් දැසූ අනඳ තෙරණුවෝ බුදුරජුන් වෙත ගොස් පොළෝ සැලෙන්නට කරුණු විචාළහ.

---

286. සම්පූර්ණ ආයුකාලය. බුදුරජුනට ආයුෂ අසංඛ්‍ය ය. ඍතු භෝජන අනුව ඒ පිරිහෙයි. බේළුව ගමේ දී මරණාන්තික වේදනාව සමාපත්ති බලයෙන් දසමසක් ම මැඩ පවත්වා වුසූහ. එසේ ම මේ භද්‍රකල්පය මුළුල්ලේ ම සමවත් බලයෙන් වැඩ ඉඳිතත් බුදුරජුහු සමර්ථ හ. එහෙත් ඉන්ද්‍රියබඩ ශරීරය තම් දත් වැටිම් ආදියෙන් දිරිමට පැමිණේ. බුදුරජුහු දත්වැටිම් ආදිය තෙක් නො සිට පස්වන ආයුකොටසේ දී පිරිනිවෙත්. අගසවු මහසව්වන් පිරිනිවි පසු හුදෙකලා ව සිටිය යුතු ද වේ. මේ මහාශිව ස්ථවිර මතය යි. 'ආයුෂ්කල්ප' යන්නෙන් ඒ ඒ කාලයෙහි මිනිසුන් ගේ පරමායුෂයැ යි කෙනෙක් ගනිති

287. මහාපරිනිර්වාණ සූත්‍රයේ පෙනෙන පරිදි මාරයාචනය කැරුණේ චාපාල චෛත්‍යස්ථානයේදී ය. සංයුක්ත වර්ගීනායෙහි මෙය උදේනචෛතියේදී කැරුණක් සේ දක්විණි. බුඩචරිතයෙන් අට වන සතියේ දී මරහු බුදුරජුනට පිරිනිවනට අයැදූහ යි පෙළඅටුවා දෙක්හි එයි.

බුදුරජ්හු "අනඳයෙනි, පොළෝ සැලෙනුයෙහි කරුණු අටෙක:

i. පොළොව ජලය ආධාර කොට ගෙන ද, ජලය වායුව ආධාර කොට ගෙන ද, වායුව ආකාශය ආධාර කොට ගෙන ද සිටියේ ය. එ බැවින් වායුව සැලෙත ජලය සැලේ, ජලය සැලෙත පොළොව සැලේ.

ii. චේතෝවශිය ලත් ඉදුමත් පෘථිවිසංඥව ස්වල්ප ලෙසත් අප්සංඥව අප්‍රමාණ ලෙසත් වැඩූ දෙවියා හෝ මිනිසා කැමැත්තේ මේ පොළොව සොලොවයි.

iii. බෝසත්හු බුදු වන අත්බවැ මව කුසැ පිළිසඳ ගැන්මෙහි ධර්‍මතා විසින් පොළෝ සැලේ.

iv. බෝසත්හු මව කුසින් බිහි වන කෙණෙහි පොළෝ සැලේ.

v. බෝසත්හු බුදු වන කෙණෙහි පොළෝ සැලේ.

vi. බුදුරජක්හු පළමුයෙන් දහම්සක් පැවැත්විමෙහි පොළෝ සැලේ.

vii. බුදුවරයක්හු ආං-සකර හරිනුයෙහි පොළෝ සැලේ.

viii. බුදුවරයක්හු අනුපාදිසෙස් පිරිනිවෙනින් පිරිනිවෙනුයෙහි පොළෝ සැලේ.

මේ පොළෝ සැලෙනුවට කරුණු අට යැ" යි වදළහ.

20. ඉක්බිති තමන් කිසිදු දෙව්මිනිස් කෙනෙකුනට ද, මරණයට ද නොබිය බව් දක්වනුවෝ,

"අනඳයෙනි, කැත් බමුණු ගැහැවි මහණ සිවුමහරුජි තව්තිසාවැසි මර බඹ යැ යි මේ පිරිස් අටෙක. මම් නොයෙක් සියගණන් කැත්පිරිස් බමුණුපිරිස් ගැහැවිපිරිස් සිවු මහරජ-යෙහි දෙව්පිරිස් තව්තිසාදෙව්පිරිස් මරපිරිස් බඹපිරිස් කරා එළැඹුණෙමි. මෙ ලොවැ ඒ ඒ රටැ කැත් පිරිස් ආදීන් කරා ද අන්ලොව්හි ඔවුන් බඳු පිරිස් කරා ද මා එළැඹුණා ද එළැඹැ ඔවුන් හා කතායෙහි යෙදුණා ද දනිමි. එහි දී ඔහු මා තමන් බඳු පැහැ සටහන් ඇතියකු තියායෙන් තමන් බඳු කට හඬ ඇතියකු තියායෙන් හඳුනති. එහෙත් ඔවුනට බණ කියන මා 'අසෝ නම් තැනැත්තෝ යැ' යි නො දනිති. දම්දෙසා නික්මැ ආ පසු ද ඔහු මා නො දනිති. මෙසේ ඔවුන් හමු වැ දහම් දෙසන මා තුළැ මේ කිසිවකු කෙරෙහි කිසි දූ බියෙක් නැත. "(එසේ •

කලැ. මේ එක් මරදෙව් පුතකුට කුමට බාම් ද? එහෙත් පෙරැ බුදු වීමෙන් අට වන සතියේ මරහු බෝමැඩ වෙත අවුත් පිරිනිවෙන්නට කලැ යි අයැදූ සඳ, සිවුවණක් සවුපිරිසැ සියලු මඟ පල ලත් බුහුසු දහම්දර වියතුන් බහුල වැ දෙව්මිනිසුන් අතරැ මෙ සස්න පැතිර යන තෙක් නො පිරිනිවෙමි' යි මා කී බස නිසා ද, දැන් සිවු පිරිසැ බුහුසු වියතුන් වුව මනා පමණ ම ඇති බැවින් ද, මගෙන් වියැ යුතු ලෝ වැඩ කරනුයෙහි සමත් සව්වන් ඇති බැවින් ද මරහු ඇයැදුම ඉවැසීමි. මෙසේ කිසිවකුට බියෙකින් නො වැ අභීත ව ම එළැඹැ සිටි සිහි නුවණ ඇත්තෙම් ම ආයුසංඛාරය හළෙමි") යි වදළහ.

21. මෙයට පසු තමන් කිසිවකුටත් නො බාන තියාවට තව ද කරුණු දක්වන්නාහු **අභිභායතන** අට ද **විමෝක්ෂ** අට ද දක්වා වදළහ.

අභිභායතන නම්:

i. සිය සිරුරැ (කෙස් ඈ ගි පැහැ අරමුණු කොට) කිසුණු පිරියම් වඩා සුවණී හෝ දුවීණී කුඩා ප්‍රතිභාග නිමිත්තෙහි ලත් ධ්‍යානය,

ii. සිය සිරුරැ කිසුණු පිරියම් වඩා බැහැරැ වූ සුවණී හෝ දුවීණී දූයෙක පැහැයෙන් උපන් මහත් ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදූවූ ධ්‍යානය,

iii. බැහැරැ ම වූ සුවණී හෝ දුවීණී දූයක් අරමුණු කොට පරිකම් වඩා ලත් කුඩා ප්‍රතිභාග නිමිත්හෙහි ලත් ධ්‍යානය,

iv. බැහැරැ සුවණී හෝ දුවීණී දූයක් අරමුණු කොට පිරියම් වඩා ලත් මහත් ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදූවූ ධ්‍යානය,

v. සියල්ල ම පිරිසිදු නිල් පැහැ වූ බාහිර අරමුණෙක පිරියම් වඩා ලත් ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදූවූ ධ්‍යානය,

vi. එසේ ම සියල්ල රන්වන් අරමුණෙහි ඉපැදූවූ ධ්‍යානය,

vii. සියල්ල රත් පැහැ අරමුණෙහි ඉපිදූවූ ධ්‍යානය,

viii සියල්ල සුදුපැහැ අරමුණෙහි ඉපිදූවූ ධ්‍යානය යන අට ය.

---

288. අභිභායතන යනු සසම්ප්‍රයුක්ත ධ්‍යානචිත්තය යි. මැඩ ලනු ලබන කසිණ අරමුණු ඇත්තෝ ය යන අරුතින් මොහු අභිභායතන නම් හ. තියුණු නුවණ ඇත්තේ කිසුණු අරමුණ මැඩ, එයට සමවදිනු බැරැරුම් සැ යි නො සිතා, ලෙහෙසියෙන් ම, ප්‍රතිභාග නිමිත්ත උපදනා හා ම අපිණාව උපදවයි. මෙසේ ලත් ධ්‍යානය අභිභායතන නම.

22. **විමෝක්ෂ**[289] නම්·

i. සිය සිරුරෙහි කෙස් ඇති කිසුණු පිරියම් වඩා බැහැර දූයෙක ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදවූ රූපධ්‍යානය,

ii. බාහිර පරිකර්මනිමිත්තයෙන් ලත් ප්‍රතිභාගනිමිත්තයෙහි ඉපැදවූ රූපධ්‍යානය,

iii. බාහිර පිරිසිදු පැහැ දූයෙහි පිරියම් කොට ලත් ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදවූ රූපධ්‍යානය,

iv. ආකාසානඤ්චායතන ධ්‍යානය,

v. විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය,

vi. ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය,

vii. නේවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය,

viii. නිරෝධසමාපත්තිය යන අට දෙන ය.

23. මෙයට පසු අනඳ තෙරණුවෝ කපක් ම වැඩ ඉඳිනුවට බුදුරජුන් අයැදූහ. බුදුරජ්හු ඒ ආයාචනය කළ යුතු අවදිය ඉක්මැ ගිය බව වදරා, සංස්කාරයන් ගේ අනිත්‍යතාව දක්වා ඔවා දී, තව තෙමසෙකින් තමන් පිරිනිවන් පාන බව් වදළහ. ඉක්බිති විසල්පුරෙහි කූළාරගලට වැඩ එය හාත්පස නොයෙක් තන්හි වුසූ භික්ෂූන් එහි රැස් කරවා, උනට සත්තිස් බෝපැකි දහම් වඩන ලෙසට ඔවා දී, තව තෙමසෙකින් තමන් පිරිනිවෙන බව ඔවුනට ද වදළහ.

බුදුරජ්හු එ දින සවසැ නික්මැ **භණ්ඩගාමයට** වැඩ කිහිප දිනක් එහි වුසූහ. එහි දී දහම් දෙසනුවෝ, ආර්‍ය ශීල, ආර්‍ය සමාධි, ආර්‍ය ප්‍රඥා, ආර්‍ය විමුක්ති යන සිවු දහමුන් අනුබෝධ ප්‍රතිවේධ නො කළ කරුණින් දික් සසරෙහි මුළා වැ හැවිද්ද ද, දූන් එ සතර දහම් අනුබෝධ ප්‍රතිවේධ කොට ඇති හෙයින් සසර ගමන සිඳිණැ යි ද වදළහ.

24. කිහිප දිනෙකින් පසු භණ්ඩගාමයෙන් නික්මැ **හත්ථි-ගාම අම්බගාම ජම්බුගාම** යන ගම් පසු කොට **භෝගනගරයට** වැඩ, එහි **ආනන්දචෛත්‍ය** විහාරයෙහි රැඳුණහ. මෙහි දී **සතර මහා අපදේශ** දෙසූහ.

---

289. **විමෝක්ෂ** — 'සතුරු නීවරණ කෙරෙන් මිදුණාහ' යන අරුතින් ද, ධ්‍යාන අරමුණෙහි දූඩි ලෙස බැඳුණාහ (අධිමුක්ත හ) යන අරුතින් ද **විමෝක්ෂ** නම් හ. පසු කී අරුතට අට වන **විමෝක්ෂය** නො ගැනේ.

මහාඅපදේශ නම්:

i. 'භාග්‍යවතුන් වහන්සේ ගෙන් මෙය අසන ලද' යි කී පමණින් නො ගෙන සූත්‍රයත් විනයයත් හා ගැළපේ දැ යි බලා ගැළපෙතොත් පිළිගැන්ම,

ii. සංඝයා ගෙන් මේ අසන ලද යි කී පමණින් නො ගෙන සූත්‍රයත් විනයයත් හා සසඳ බලා ගැළපෙතොත් පිළිගැන්ම,

iii. බොහෝ උගතුන් අනින් අසන ලද යි කී පමණින් නො ගෙන සූත්‍රයත් විනයයත් හා සසඳ බලා ගැළපේ නම් පිළිගැන්ම,

iv. උගත් තෙර කෙනකුන් ගෙන් අසන ලද යි කී පමණින් නො ගෙන සූත්‍රයත් විනයයත් හා සසඳ බලා ගැළපෙ-තොත් පිළිගැන් ම යන සතර ය.

25. බුදුරජ්ජු කිහිප දිනෙකින් පසු **භෝගනගර**යෙන් ද නික්ම බික්සඟන පිරිවරා **පාවා නුවරට** වැඩියහ. එහි **චුන්ද කාර්මාර** පුත්‍රයා ගේ අඹවෙනෙහි ලැගුම් ගත්හ. බුදුරජුන් වැඩි පවත් ඇසූ **චුන්ද** තෙම එහි අවුත් බණ අසා පසුදාට දනට නිමන්ත්‍රණය කොට ගියේ ය. නිමන්ත්‍රිත පරිදි භාග්‍යවතුන් වහන්සේ පසු දින සංඝයා සහිත ව චුන්දයා ගේ ගෙට වැඩියහ.

26. චුන්ද තෙමේ ද මිහිරි අන්නපානයෙන් බුදුපාමොක් මහසඟන පිදී ය. බොජුන් අවසනැ බුදුරජ්ජු චුන්දයාට දහම් දෙසා සතුටු කළහ, ගුණදහම් වැඩුම්හි දිරි ගැන්වූහ. එයට පසු එ තැනින් නික්ම වැඩියහ. ඉක්බිති බුදුරජ්ජු ඒතාක් කල් සම්වත් බෙලෙන් (නිතර සමවත් සමවැදීමෙන්) යට පත් කොට තුබුණු ආබාධය මතු වී නැඟ එන්නට ඉඩ දෙනුවෝ, (සමවත් බෙලෙන්) එය මැඩැලීම හළහ.[291] එයින් තුන් මසෙකින් පෙරැ දී යට පත් වූ ආබාධය යළි මතු විය. [එහෙත් චුන්දයා ගේ සිතිඳු බොජුන් වළඳ තුබුණු හෙයින් පළමු සේ මෙ වරැ එය දරුණු නො වී ය.]

27. බුදුරජ්ජු කයැ මතු වූ දුක් වේදනාව සිහිනුවණින් ඉවසා කුසිනාරා පුර බලා නික්මුණහ. මඟ දී ඔබට කලාන්ත බව විය.[292] එ බැවින් එක් රුකක් මුලැ අනඳ තෙරුන් ලවා

291, 292. කුමට මෙසේ කළාහු ද? යත්: බුදුසිරුරැ පවා රෝගාබාධයනට ගොදුරු වෙතැ යි සව්වන් සිත්හි ගන්වා, ඔවුන් සසරැ කලකිරුවනුවටත් බුදුසිරුරට ලොවුතුරාබවක් නංවනුවට ඉඩ නොතබනුවටත් ය.

සඟළසිවුර එළවා එහි වැඩහිඳ, අසැලූ වූ හොයෙන් දිය ගෙන්වා වැළැඳූහ. එ වේලෙහි එහි පැමිණි **පුක්කුස** නම් මල්ල රජකුමරුට දහම් දෙසා ඔහු උවසුබව්හි පිහිටුවූහ.

28. පුක්කුස තෙම මට සිලිටි රන්වන් වසත්‍ර දෙකෙකින් බුදුරජුන් පිදී බුදුරජුහු එයින් එකක් පිළිගෙන, අනෙක අනඳ තෙරුනට දෙවූහ. ඔහු නික්මැ ගිය පසු අනඳ තෙරණුවෝ තමන් ලත් වතත් බුදුරජුනට එළැවූහ. බුදුරජුහු එයින් එකක් හැඳ අනෙක පෙරෙවූහ එ විට බුදුසිරුර ඉතා ම බැබැළිණ. එ බව අනඳතෙරණුවෝ බුදුරජුනට සැළ කළහ. 'බුදු වන ද රෑ ද (කඳපිරිනිවතින්) පිරිනිවෙන ද රෑ ද බුදුසිරුර ඉතා ම බබළන බව් ද, එ ද රෑ පැසිම් යමැ කුසිනාරා නුවර මල්ල රජුන් ගේ උපවත්තන සල්වෙනෙහි යුගසල් රුක් අතරෑ ගහනැ හෙවැ තමන් පිරිනිවන් පාන බව් ද බුදුරජුහු වදළහ.

29. එයින් පසු කුකුත්‍ථා නදිය කරා වැඩ, දිය සනහා පැන් වළඳ එයැ තෙරෑ අඹවනයට වැඩ, චුන්ද තෙරුන් ලවා සඟළ සිවුර සතරපට කොට පණවා එහි සිංහශයනායෙන් සැතැපුණහ. එයට පසු අනඳ තෙරුන් බණවා 'චුන්දයා දුන් බොජුන් වළඳ තථාගතයෝ පිරිනිවුණහ' යි කිසිවකු චුන්දයා කුළ විපිළි-සර ඉපැදැවියැ හැකි බවත්, එහෙත් තමන් බුදු වන ද සුජාතාව එළැවූ බොජුනත් පිරිනිවෙන ද චුන්දයා එළැවූ බොජුනත් අන් සියලු බොජුන්දන්වලට වඩා පලයෙන් ද අනුහසින් ද මහත් බවත්, සම්පල සමඅනුහස් ඇති බවත්, එයින් චුන්දයා විසින් ආයු වණ් සැප යශස් සගසුව අධිපති බව ලබා දෙන මහ පිනක් ඉපැයූ බවත් තමන් වෙතින් ම අසා දත් බව ඔහුට කියා, ඔහු විපිළිසර දුරු කළ යුතු යැ යි වදළහ. ඉක්බිති,

'දෙන්නහුට පින් වැඩෙයි, සිල්වත්හට වෙර[293] නො වැඩේ. නුවණැත්තෝ අපි නුවණින් පව් දුරු ලයි. මෙසේ ඒ පව් දුරුලා සිටියේ රාදෙස් මොහ නැසීමෙන් සඋපාදි-ශේෂ නිර්වාණධාතුයෙන් පිරිනිවිෂයේ යැ' යි වදුරා

චුන්දයා ගේ දානය ද තමන් ගේ දක්ෂිණාගී බව ද පසසනුවෝ උදන් ඇනූහ.

---

293 ප්‍රාණඝාතාදි පස් පව් වෙර පස යි. ගුණදහමට වෛරී බැවින් ද වෛරයට හේතු වන බැවින් ද පස් පව් වෙර නම්.

30. එයින් පසු හිරණ්‍යවතී නදිය තැර, කුසිනාරාපුර වැඩ, එහි **මල්ල** රජුන් ගේ උපවත්තන නම් සල්උයනට වැඩියහ. ඉක්බිති ආනඳතෙරුන් බණවා, එහි යමා සල්රුක් අතර ඇඳක් පණවවා,[294] එහි දකුණැලයෙන් සිංහශය්‍යායෙන් සැතැපුණහ.

31. එ සමයෙහි ඒ යමා සල්රුක්හු නොකල්හි පිපි මලින් සැදුණහ. බූමාටු දෙවියෝ ඒ රුක් සොලොවන්නාහු බුදුරජුනට පුද විසින් ඔබ සිරුර මත මල් වැගිරවූහ. දිව මඳාරාමල් ද අහසින් වගුළ. දෙව් සඳුන්සුණු ද අහසින් වට. දෙව් පසඟතුරු ගොස අහසැ පැවැත්විණ. මෙය සලකා බුදුරජුහු ආනඳ තෙරුන් බණවා,

'ආනඳයෙනි, මේ ආමිස පුද පමණින් බුදුන් පිදුවා නම් නො වන්නේ ය. යමෙක් නවලොවුතුරා දහමට අනුරූ දහම් වූ පූර්භාග[295] ප්‍රතිපත් පුරනුයේ, අනුදම්සැරි වැ වෙසේ නම්, හේ ම පරම පූජායෙන් තථාගතයන් පුදන්නේ නම් වේ. එ බැවින් ධර්මානුධර්මප්‍රතිපන්න ව සාමීචිප්‍රතිපන්න ව, අනුධර්ම-චාරි ව වසන්නමුයි මෙසේ හික්මියැ යුතු'යි වදාළහ.

32. ඉක්බිති ළඟැ පවන් සලමින් සිටි උපවාන තෙරුන් ඉවත යැවූහ. ආනඳතෙරණුවෝ එයට කරුණු විචාළහ. එවිට එයට කරුණු වදාරන්නාහු, තමන් දක්නට බොහෝ දුරසිට ද දෙවියන් අවුත් අතුරු සිදුරු නැති සේ එක් රැස් වැ සිටුනා බව් ද, උපවාන තෙරුන් මහ ඉදුමත් කෙනෙකුන් බැවින් ඔබට පිටුපසැ සිටුනා දෙවියන් ඔබ සිරුර විනිවිදැ තමන් දැක්ක නො හෙනබව ද, තෙරුන් ගේ හේතුයෙන් අන්තිම බුද්දැක්ම නොලැබිණැ යි ඇතැම් දෙවියන් දෙස් කියන බව ද, තමන් එය දැක තෙරුන් ඉවතට යැවූ බව ද වදාළහ.

---

294 එහි ඇඳෙහි ඉස පැත්තෙහි සල්රුක් පෙළෙක් ද පා පැත්තෙහි සල්රුක් පෙළෙක් ද වූහ. දෙ පෙළට සිටි මේ සල්රුක්හු යටින් මුල්වලින්ද උඩින් අතුපතරින් ද එකට බැඳුණෝ ය. එහි ක්‍රීඩා පිණිස පැමිණෙන රජුන් සඳහා සුරක්‍ෂිත වැ තැබුණු ඇඳෙක් විය. එය සඳහා මේ කියනු ලදි. ආනඳ තෙරණුවන් මේ ඇඳ පණවා වටින් තිර ඇදවූ බව අටුවායෙහි පෙනේ.

295 පූර්භාගප්‍රතිපත් නම් මහණුන් මෙහෙණින් විසින් පිරියැ යුතු ධූතාංගසමාදාන ද ගෝත්‍රභූඥානය තෙක් පැවැත්වියැ යුතු ශමථ විදර්ශනා-භාවනා ද යන සියලු පිළිවෙත යි. උපාසක උපාසිකාවන් විසින් පිරිය යුතු ධර්මානුධර්මප්‍රතිපත් නම් පන්සිල් අටසිල් පුරනු, දන් දෙනු, සුවඳපුද මල්පුද කරනු, මවට පියාට උවටන් කරනු, දැහැමි මහණ බමුණන් උවටනු යන පිළිවෙත් ය. මේ මල් ඈ පුද මහණමෙහෙණින් ගේ චාරිත්‍රශීලයෙහි ඇතුළත් ය.

33. ඉක්බිති එහි රැස් වූ දෙවියන් අතුරෙහි 'සරාග දෙවිහු අඬා වැලැපෙති යි ද, විරාගී (අනාගාමි රහත්) දෙවිහු අතිස මෙනෙහි කෙරෙමින් ඉවසා සිටිති' යි ද වදාළහ. එක්බිති ආනඳතෙරණුවෝ මෙ දිනැ විත්තභාවනා වැඩූ බොහෝ භික්ෂූන් තන් දෙසින් එන බැවින් ඔවුන් දක්නට ලැබෙන නුමුත් බුදුරජුන් පිරිනිවනින් පසු මෙබඳු අවසථාවක් නොයෙදෙතැ යි කීහ. එ විට බුදුරජුහු සිත්බවුන් වැඩූ පැවිද්දන් එක් තැනැ ම හිඳ දක්කැ හැකි වන තැන් දක්වන්නාහු,

'අවුන් දක්නා සැදැහැවතාට සිතැ සංවේග දනවන තැන් සතරෙකැ යි ද, ඒ තථාගතයන් මව කුසින් බිහි වූ තැන, බුදු වූ තැන, පළමු ම දහම්සක් පැවැත් වූ තැන, පිරිනිවි තැන යන සතර පොළැ යි ද, මෙසෙවු තන්හි චෛත්‍යවන්දනා පූජනාහි යෙදී හැවිදුනාහු මළ හොත් සුගතියෙහි උපදිති' යි ද වදාළහ.

34. ආනඳ තෙරණුවෝ මහණුන් විසින් මාගමුන් කෙරෙහි පිළිපැදියැ යුතු සැටි විචාළහ.

'පැවිදි තැන් විසින් මාගමුන් දෙස නො බැලියැ යුතු' යි ද,

'යම් හෙයෙකින් මාගමුන් හමු වුව ද (දක්නා ලද නුමුදු) ඔවුන් හා කතාබස් නො කළ යුතු'යි ද,

'කතා කළ යුතු ම කරුණක් එළැඹ සිටියොත් ඇය ඇයගේ වයස අනුව මව හෝ සොහොයුරිය හෝ දුව සේ සිතා ගෙන එළැඹැ සිටි සිහියෙන් කතා කළ යුතු යැ' යි ද වදාළහ.

35. 'බුදුරජුන් පිරිනිවි පසු ඔබ ගේ සිරුරට කෙසේ සත්කාර කටයුතු දැ? යි' තෙරණුවෝ විචාළහ.

'බුදුසිරුරට සත්කාර කැරුමෙහි පැවිදි තැන් මිඩංගු නො වියැ යුතු යැ' යි ද, 'පැවිදි තැන් විසින් විවසුන් වඩා රහත් වන්නට වැර වැඩියැ යුතු යැ' යි ද, 'බුදුසිරුර පුදනුවට නුවණැති ගිහියෝ සිටිතැ' යි ද වදාළහ 'ගිහියන් විසින් එයට සත්කාර කළ යුතු සැටි කෙසේ දැ?' යි අනඳතෙරහු පුළුවුත්හ. බුදුරජුහු 'සක්විත්තක්හු සිරුරට මෙනැ'යි වදරා, සක්විති සිරුරට සත්කාර කරන සැටි විස්තර කළහ.

36. ඉක්බිති 'ලොවුතුරාබුදු, පසේබුදු, බුදුසවු, සක්විතිරජ යන සතර දෙනා ස්තූප නංවා පුදනු ලබනට සුදුසු පුගුලෝ යැ'යි ද, 'ඔබ උදෙසා කළ තුඹු[295] දැක පැහැදැ වැඳුමෙන් පිදුමෙන් මරණින් මතු සුගතිගාමී වෙතැ යි' ද වදාළහ. මෙ බස්

295. තුඹු = ස්තූප

ඇසූ අනඳ තෙරණුවෝ 'අද ම බුදුරජුන් පිරිනිවෙති'යි සිතනුවෝ ඉවත් වැ ගොස් මණ්ඩලමාලයෙහි දෙරබා කෙළවරැ අගුළු-කණුයෙහි එල්බැ ගෙන විලාප කිය කියා හැඬූහ. බුදුරජුහු එ වග දැන මහණකු බණවා, 'අනඳයන් කැඳවා ගෙනෙන්නැ' යි වදළහ. අනඳ තෙරණුවෝ ද ආහ. බුදුරජුහු ඔබ අමතා, "අනඳයෙනි, නො හඬන්න, නො සොවින්න. සියලු පිය මනා දූසින් වෙන් වනු, අන් අයුරකට පැමිණෙනු කලින් ම මා කිවා නො වේ ද? උපන් පහළ වූ දෑ කැඩෙන බිඳෙන සුලු ය. එසේ කලැ 'ඒ නො පලුදු වේ වා'යි කිසිවකු ඊසිනුත් වලක්වා-ලියැ නො හැක්ක. අනඳයෙනි, තෙපි ඉතා බොහෝ කලක් තථාගතයනට දෙහිතක් නැති වැ ඒකාන්තයෙන් හිතවත් වැ, හමුයෙහිත් නො හමුයෙහිත් එක් සිතින් නොපමණ මෙත්-සහගිය කා විසි මුනි කමින් උවටන් කළහු ය. අනඳයෙනි, තෙපි පෙරැ පිරූ බොහෝ පින් ඇත්තවු ය. නො පමා වවු. කල් නො යාදී ම රහත් වන්නහු යැ" යි වදළහ. ඉක්බිති භික්ෂූන් අමතා අනඳතෙරුන් ගේ ගුණරැස විදහා පෑහ. එයැසූ අනඳ තෙරණුවෝ ශෝකය තුනී කොට ගෙන, 'වහන්ස, මේ දුගීමසථාන වූ සුළු නුවර හැර **චම්පා රාජගහ සාවත්ථි සාකේත කෝසම්බි බාරාණසී** යන මහනුවරෙක දී ම පිරිනිවන් පානා සේක් වා' යි කීහ.

39. එ විට බුදුරජුහු 'කුසිනාරාව සුළු කොට නො සිතියැ සුතු යැ' යි ද 'පෙරැ එය **සුදසුන්** නම් සක්විති රජුහු ගේ රජදහන වී යැ' යි ද වදරා **මහාසුදස්සන සූත්‍රය** වදළහ. එයින් පසු තමන් එදා රෑ පැසිම්යමැ පිරිනිවෙන බව් අනඳ තෙරුන් අත මල්ල රජුනට දන්වා යැවූහ. එයසා මල්ල රජුහු හඬනුවෝ වැළැපෙනුවෝ සල්උයනට අවුත් බුදුරජුන් දැක වැන්දහ.

40. මෙ අතරැ **සුභද්‍ර** නම් පිරිවැජ්ජෙක් ද 'බුදුරජුන් මැදුම් යමැ පිරිනිවෙති'යි අසා, තමා සැක පසිඳගනු පිණිස එහි විත් අනඳ තෙරුනට එ වග සැළ කෙළේ ය. 'භාග්‍යවතුන් වහන්සේට වෙහෙස නො කළ මනා'යි අනඳ තෙරණුවෝ පිරිවැජියා නවතාලූහ. ඔබ දෙදෙනා ගේ කතාව ඇසූ බුදුරජුහු අනඳ තෙරුන් බණවා, පිරිවැජියාට තමන් වෙත අවුත් ප්‍රශන විචාරන්නට ඉඩ සැලැසූහ.

41. සුභද්‍ර ද 'බොහෝ දෙනා අතරැ සාධු සම්මත පූරණකස්සපාදි තොටුගුරුහු වූහ. ඔහු තමන් පිළින කළ පරිදි ම ඔවුන් ගේ සිඩාන්ත නෛර්‍යාණික (සසරින් නික්මෙනුවට ඉවහල්) වේ ද? නැද්ද?' යි විචාළේ ය.

බුදුරජ්හු ඔහු පැණය විසඳනුවෝ, ඔවුන් දහම් නෛර්‍යාණික නො වේ යැ' යි දක්වන්නාහු, **"අරි අටැඟි මග නැති සස්නැ සෝවාන් ඈ සිවු මහණහු නැතැ යි, අරිඅටැඟි මග ඇති සස්නැ ම ඔහු ඇතැ යි, ආරබ්ධවිදර්ශක සතර දෙනා ද මාර්ගස්ථ සිවු දෙනා ද ඵලස්ථ සිවු දෙනා ද යි යන දෙලොස්පුගුලන් නැති අන්‍ය ශාසන හිස් යැ යි, භික්ෂූන් නිසි පරිදි පිළිවෙත් පුරතොත් ලොව රහතුන් ගෙන් හිස් නො වෙතැ"**යි වදාළහ. දෙසුම් අවසනැ සුභද්‍ර තෙම පැහැද පැවිදි උපසපත් බව් ලැබී ය හේ බුදුරජුන් දුන් කමටහන් වඩා නොබෝ වේලාවෙකින් රහත් විය. මේ බුදුරජුන් ගේ පශ්චිම ශ්‍රාවකයා ය.

42. ඉක්බිති බුදුරජ්හු අනඳ තෙරුන් ඇමැතූහ. **'තමන් පිරිනිවි පසු ශාස්තෘහු නැතැ යි නො සිතියැ යුතු යැ'** යි ද, **'තමන් ඇවෑමෙන් තමන් දෙසූ දහම්විනය දෙසා ශාස්තෘ වෙතැ'** යි ද,

'තමන් ජීවත් ව ඉන්නා කලැ භික්ෂූන් උනුනට 'ඇවැත්-නි'යි (ආවුසො යි) ඇමැතූ නුමුත් තමන් පිරිනිවි පසු වැඩි මාලු භික්ෂුහු නවක භික්ෂුහට නමින් හෝ ගෝත්‍රයෙන් හෝ 'ඇවැත්නි' යි කියා හෝ ඇමැති යැ යුතු යැ' යි ද, **නවක භික්ෂුහු විසින් වැඩිමාලු භික්ෂුහට 'වහන්සැ'යි හෝ 'ආයුෂ්මත්නි'යි හෝ ඇමතියැ යුතු යැ'** යි ද වදාළහ. ඉක්බිති **'සංඝයා කැමැත්තේ නම්, කුඩා අනුකුඩා සිකපද සමූහනන කෙරේ වා'**යි ද[296] වදාළහ.

43. ඉත්පසු බුදුරජ්හු තමන් පිරිනිවි පසු **ඡන්න** තෙරුනට බ්‍රහ්මදණ්ඩනය[297] (මහ දඬුවම) කළ යුතු යැ' යි වදරා එය කරන සැටි පැවසූහ. ඉක්බිති, බුදුරජුන් කෙරේ හෝ දහම් කෙරේ හෝ අරි සඟන කෙරෙහි හෝ පිළිවෙත කෙරෙහි හෝ

---

296. ඛුද්දානුඛුද්දකාපත්ති ගැන මත බෙහෙවි. මිලිඳුපැණයෙහි මිලිඳු රජු ගේ පැණය විසඳන නාගසෙන තෙරුණුවෝ 'දුකුලාව කුඩා ඇවැතැයි' ද දුබ්භාසිත ආපත්ති අනුකුඩා ඇවැතැ' යි ද විසැඳූ වග දක්වේ. 297 භික්ෂුනට යම් භික්ෂුවක් ගැරැහුම් ඇනුම් බැණුම් කෙරේ නම්, කිසිවකු ගේ අවවාදයක් නො පිළි ගනී නම්, ඔහු භික්මෙන තුරු සංඝයා ඔහුට ඔවාදීම නවත්වනු බ්‍රහ්මදණ්ඩන යි. කිසි තෙර කෙනකුට ද ගරුසරු නැති ව මුරංඩු බැවින් ඔහු හැසිරෙන බැවින් ඔහු සඳහා මේ මහදඬුවම පැණැවිණ.

සැකයක් සම්කුට් ඇතොත් විචාරත්නැ' යි වදාළහ. භික්ෂූහු නිහඬ වැ හුන්හ. තෙරණුවෝ එය දැක කිසි ම මහණකුට බුඩාදීන්හි සැකයෙක් නැතැ යි සතුටු වැ තම පැහැදීම පැවැසූ හ.

44. මෙයින් පසු බුදුරජුහු භික්ෂූන් අමතා, **'මහණෙනි, දැන් තොප අමතමි. සංඛාරදහම්හු නැසෙන සුල්ලහ. එ බැවින් නොපමාසෙන්** (එළැඹැ සිටි සිහියෙන්) **සියලු පැව්දි කිස සපයවු'** යි වදාළහ. මේ බුදුරජුන් ගේ අවසන් වචනය ය.

ඉක්බිති බුදුරජුහු පළමු දහන්සමවත පටන් පිළිවෙළින් නේවසඤ්ඤානාසඤ්ඤායතන සමවත තෙක් ද, එයින් පසු නිරෝධසමාපත්තියට ද සමවත්හ. එයින් නැඟී යළි නේවසඤ්ඤානාසඤ්ඤායතනයට ද එයින් නැඟී ආකිංචඤ්ඤ-යතනයට ද මෙසේ පිළිලොම් විසින් පළමු රූදහන තෙක් ම ද පිළිවෙළින් සමවත්හ. පළමු රූදහනින් නැඟී දෙවෙනි රූ දහනට ද, එයින් නැඟී තෙවෙනි දහනට ද, එයින් නැඟී සිවුවන දහනට ද සමවත්හ. ඒ සිවුවන රූ දහනින් නැඟීම හා ම නූපදිසෙස් පිරිනිවන්දුයෙන් පිරිනිවී වදාළාහ.

45. එ කෙණෙහි බිහිසුණු මිහිසැලුම් විය. අහසැ දෙව්බෙර පැළිණ (අහස ගිගුරුම් විය).

බුදුරජුන් පිරිනිවනට අනතුරු ව මහබඹ තෙම

"ලොවැ තමනට සමයකු නැති බලපත් මෙබඳු තථාගත බුදුරජුහු යම් සේ පිරිනිවියාහු ද, එසේ ලොවැ හැම සත්හු ම දිවි තොර විමෙන් සිරුර මෙහි හැරදමන්නාහ"යි කිය.

එ කෙණෙහි ම **සක්දෙව් ද,**

'අහෝ! සකර දහම්හු අනිස්හ, ඉපිදෙන නැසෙන සුළු හ. ඉපිද නැසී යෙත්. ඒ සකර දහමුන් සංසිඳෙනු (නිවන) සුව යැ' යි පැවැසී ය.

බුදුරජුන් පිරිනිවි කෙණෙහි ම **අනුරුත්** තෙරණුවෝ ද **'තෘෂ්ණාචලන නැති, නිවනැ එල්බැ සාලුරිය සාල, තර සිතැති, අටලෝ දහමින් නො සැලෙන ගුණැති මා සාමිදරු මුනින් ගේ ආශ්වාස ප්‍රශ්වාස කෙනෙක් දැන් නැත. නො හැකිළි (මොනොවට පුබුදු) සිතින් වේදනාව ඉවැසූහ. පහනක් නිවෙනු සේ ඔබ සිතැ විමෝක්ෂය (හැම ලෙසින් ම නිවුනු බව)' වි යැ'** යි වදාළහ.

එ කෙණෙහි ම **අනඳතෙරණුවෝ** ද,

'සියලු උතුම් ගුණයුවලින් යුත් සම්මාසම්බුදුරජුන් පිරිනිවි කෙණෙහි ම මහත් බිහිසුණු ලොමුදහගන්වන බිහිසැලුමෙක් වියැ'යි වදළහ

46. බුදුරජුන් පිරිනිවි ඇසිල්ලෙහි අවීතරාග මහණහු බිමැ හෙවැ හඬන්නට වලප්නට වූහ. වීතරාගීහු (අනාගැමිහු ද රහත්හු ද) සකර දහමුන් සැටිය සලකන්නාහු ඉවැසූහ.

ඊ ඉතිරි ස්වල්ප කාලය තුළැ අනුරුත් අනඳ යන දෙ තෙරණුවෝ අනිත්‍යප්‍රතිසංයුක්ත කථායෙන් රැස් වැ සිටි පිරිසට අනුශාසන කළහ.

ඉක්බිති අනුරුත් තෙරණුවෝ බුදුරජුන් පිරිනිවි බව අනඳ තෙරුන් අතැ මල්ල රජුනට දන්වා යැවූහ. එයැසූ කුසිනාරා නුවරැ මල්ල රජ්ජුහු රැස් වැ හඬා වැලැපුණහ. එතැන් සිට සත් දිනක් මහ පෙරහැරින් බුදුසිරුර පිදූහ. එසිත් පසු සක්විති රජකුගේ සිරුරට කරන සියලු සත්කාර කොට ස්වකීය මුකුට-බන්ධන නම් චෛත්‍යස්ථානයට මහපෙරහැරින් ගෙන ගියහ.

47. **මහසුප්** තෙරුන් එහි වඩනා තුරු ම සැයට ගිනි ඇවිලැවියැ නො හැකි වූහ. තෙරණුවෝ වැඩ දරසෑය පැදකුණු කොට, සිරිපා පැත්තෙන් චිතකයන් රන්දෙනත් විවෘත කොට, බුදුසිරිපා යුවල සිය හිස මතැ තබා ගෙන වැන්දහ. තෙරුන් හා ඔබ පිරිස වැඳ අවසන් වූ ඇසිල්ලෙහි චිතකය තෙමේ ම ඇවිල ගත.

දැවුණු සිරුරෙහි, බුදුරජුන් කැරැ තුබුණු අදිටන් පරිදි, **සතර දල දා ද, දෙ අකු දා ද, නලල් දා ද** යන සත් ධාතුහු නො ම විසුරුණාහ. සෙස්ස අබ කඩහාල් මුංබියලි පමණට විසිරිණ.

ඉක්බිති වැස්සෙන් ද, සල්රුක්හි අතුපතරින් ගලා හුණු දියෙන් ද, මල්ල රජුන් ඉසි සුවඳ ජලයෙන් ද සැයේ ගිනි නිවිණ.

මල්ල රජ්ජුහු රන් දෙණෙකින් නුවරට ධාතු වැඩම කරවා නුවරුත් කැටුව සත්දිනක් මහ පුදපෙරහැරින් එය පිදූහ.

48. **අජාසත්** රජ ද, **ලිච්ඡවී** රජ්ජුහු ද, **ශාක්‍ය** රජ්ජුහු ද, (අල්ල කප්ප රට) **බුලි** රජ්ජුහු ද, (රාමග්‍රාමවාසී) **කෝලිය** රජ්ජුහු ද, **වෙඨදීපක** බ්‍රාහමණ ද, පාවාපුරැ **මල්ල** රජ්ජුහු ද එහි ඉගොස්

කුසිනාරාව හාත්පස සිට වෙන වෙන ම ධාතු කොටස් ඉල්ලා පණිවුඩ යැවූහ. මල්ල රජ්ජු ධාතු නොදී 'සටන් කරම්හ' යි දන්වා යැවූහ. මෙහිදී **ද්‍රෝණ** නම් රාජගුරු බමුණා ඉදිරිපත් ව කරුණු කියා ඔවුන් සමාධාන කොට ඔවුනට ඒ ධාතූන් අට කොටසකට බෙද දුන්නේ ය. ධාතු බෙදූ රන් නැළිය තෙමේ ඉල්ලා ගත්තේ ය.

මෙයට පසු ව පැමිණි **පිප්පලිවන**නගර වාසී **මෝරිය** රජ්ජු ආදාහන ස්ථානයෙන් අඟුරු ගෙන ගියහ.

ධාතු ගෙනගිය ඒ ඒ රාජාදිහු ඒවා නිදන් කොට ස්තූප කරවා පිදූහ. **ද්‍රෝණ** ද තමා ලත් නැළිය නිදන් කොට **කුම්භස්තූප** නම් චෛත්‍යයක් කැරැවී ය. **මෝරිය** රජ්ජු අඟුරු නිදන් කොට අංගාරස්තූප නම් චෛත්‍යය කැරැවූහ. මෙසේ සියලු ස්තූපයෝ දශ දෙනෙක් වූහ.

[මෙහි බුදුරජුන් පිරිනිවන් පාන්නට වැඩි ගමනේ විස්තරය ද, පිරිනිවීම ද, පිරිනිවන් පෑ පසු ධාතු පූජා ද, දැක්විණ.]

---

17. මහාසුදශ්ශීන සූත්‍රය.

එක් කලෙක (පිරිනිවන් සමයෙහි) බගවත් බුදුරජ්ජු කුසිනාරා නුවර සමීපයෙහි **මල්ල** රජුන් ගේ **උපවත්තන** නම් සල්වෙනෙහි සමා සල්රුක් අතර පිරිනිවන් හැඳෙහි වැද හෙති. **එ** කලැ අනඳ තෙරණුවෝ 'කුසිනාරා පුරය ගල් හෙල් ආදියෙන් විෂම වූ කුඩා නුවරෙකැ'යි කියා '**චම්පාරාජගෘහාදි** මහ නුවරෙක ම පිරිනිවන් පානු මැනැවැ' යි සැළ කළහ.

2. එවිට බුදුරජහු කුසිනාරාව දුගීම කුඩා නුවරෙකැ යි සුළු කොට නො සිතියැ යුතු බව වදාරා, එ නුවර ශ්‍රෙෂ්ඨ බව දක්වන්නාහු එය පෙර **මහසුදසුන්** සක්විති රජුට වාස ස්ථාන වූ නියාව වදාළහ:

"පෙර මේ **කුසිනාරාව මහසුදසුන්** නම් සක්විති රජු ගේ රජදහන විය. එ සමයෙහි මෙ පුරය **කුශාවතී** නම් විය. එය නැගෙනහිරිනුත් බටහිරිනුත් දිගින් දොළොස් යොදුන් ද උතුරු දකුණු දෙදිගින් පුළුලින් සත් යොදුන් ද වී ය.

ආලකමන්ද,[298] රාජධානිය සේ සියල්ලෙන් සමෘධ විය. දිවා රෑ දෙක්හි හස්ත්‍යශ්ව රථ හෙරි ආදීන් ගේ හඬින් ඒකනින්නාද විය. රුවන්මුවා පවුරුවලින් යුත් විය. සියල් නුවරගින් ගෙබියේ විය.

3. ඒ මහසුදසුන් රජ චක්‍රරත්න හස්තිරත්න අශ්වරත්න මණිරත්න ස්ත්‍රිරත්න ගෘහපතිරත්න පරිනායකරත්න යන සප්තරත්නයෙන් සමන්විත විය. එ රජ මහඟු යානයක් නැඟ චක්‍රරත්නානුසාරයෙන් ලොව සිවු දිගට ගියේ ය. එහි විරුඩ රජ්ජුහු ඔහු දැක යටහත් වූහ, කිකරු වූහ. සක්විති රජ ඔවුනට පස් පවින් වැළැකී දැහැමින් රජය කරවත්නැ'යි අණ දී පෙරළා සිය රජදහනට ආ ය.

රජු ගේ ඇතා ද අසු ද මහ ඉදුමත්හ. මිණිරුවන රෑ හාත්පස එකළු කිරීමෙහි සමත් ය. බිරිය (ස්ත්‍රී රත්නය) නව යොවුනෙන් හා බිරියක තුළ‍ැ පිහිටිය යුතු සියලු ගුණයෙන් සමන්විත ය. ගැහැවිරුවන (මහසිටු) ද නිධාන දැක්මෙහි සමත් වූ කර්මවිපාකජ දිවැසින් සමන්විත විය. පරිනායකරත්නය (දෙටුපුත්) ද සියලු කෘත්‍යසංවිධානයෙහි සමත් ය, පරසිත් දත්නා නුවණ ඇත්තේ ය.

එ රජ වූ කලී වර්ණය ආයුෂ නීරෝග බව ජනප්‍රිය බව යන සතරෙන් සෙසු සියලු ජනයා ඉක්මැ සිටියේ ය.

5. ඒ රජ මහජනයා ගේ ප්‍රයෝජනයට ජලජපුෂ්පසංඡන්න මහඟු පොකුණු කැරැවි ය. එ පොකුණු තෙර මිනිසුන් නෑවීමට පුරුෂයන් ද නවතාලි ය. රිසියන් ගේ ප්‍රයෝජනයට අන්න පාන වස්ත්‍ර යාන ආදිය ද තැබිවිය. බ්‍රාහමණගෘහපතිකයෝ රජු ගේ සත්ක්‍රියාවලට උපකාර වශයෙන් මහත් ධනය ගෙනවුත් දුන්හ. රජ ඒ ප්‍රතික්‍ෂෙප කොට තමා ගෙනුත් වැඩිපුර ධනය ගෙනයන්නට ඔවුනට පැවැරී ය. තමන් ගෙනා දැ පෙරළා සිය ගෙවලට ගෙනැ යැම නො හොබනේ යැ යි සිතූ ඔහු රජු ගේ රුචිය ගෙන රජු සඳහා ප්‍රාසාදයක් තැනැවීමට සැරසුණහ.

6.. එකල රජු ගේ රුචිය දත් සක්දෙව් තෙමේ විස්කම්හු එවා ධර්ම නම් මහපායක් තිමැවවී ය.

298. මේ වෙසුවුණු නම් යක්රජුහු රජදහන යි සකුසෙන් ආලකානන්‍ද යි වැහැරැවෙයි.

රජ ද එයට ඇවැසි උයන් පොකුණු ආ සියල්ල කරවා, මහණබමුණන් කැඳවා, ඔවුන් රිසි රිසි දූයින් පුද, ඒ බම්ප්‍රාසාදයට නැංගේ ය. ඉක්බිති තමා ගේ මේ මහර්ඩියට හේතුව කවරැ?යි බලනුයේ, පෙරැ තමා පිරූ **දානය, ආත්ම-දමනය, ශීලසංයමය** යන තුන් කුශලයන් ගේ විපාක යැ යි299 දුටුයේ ය. දැක **මහාව්‍යූහ** නම් කුළාරය වෙත එළැඹ එහි දෙරැ සිටැ **"කාමවිතක්ය, මෙතෙකින් ම නවතුව. ව්‍යාපාද-විතක්ය, මෙතෙකින් ම නවතුව, විහිංසාවිතක්ය, මෙතෙකින් ම නවතුව"**යි උදන් ඇනී ය.

7. එයින් පසු කුළාරයට වැද සමාදි වඩා සතර රූදහන් උපදවා විසී ය. ඉක්බිති එ කුළාරයෙන් නික්මැ රුවන්මුවා කුළාරයට වැද **මෛත්‍රී කරුණා මුදිතා උපේක්ෂා** යන සතර බඹ විහරණයෙන් කල් යැවී ය. බොහෝ කලෙකින් පසු රජු ගේ **සුභද්‍රා** නම් අග් බිසෝ වස්ත්‍රාභරණයෙන් සැරැසී ඇතොවුරැ සත්‍රීන් හා ගොස් මහාව්‍යූහ කුටාගාරයෙහි දෙරබායෙහි එල්බැ ගෙන සිටියාහ. රජ ඇය දැක මෙ ධ්‍යානාගාරය තොප හා වසන තැනෙක් නො වේ. එ බැවින් ඔහි ම නවතිවු, මෙහි ඇතුළට නො එවු'යි කී ය.

8. ඉක්බිති එක් පුරුෂයකු අමතා කුටාගාරය අබිමුවැ තල්වෙනෙහි යහණක් පණවා එහි සිංහශය්‍යායෙන් හොත්-තේ ය. දේවී තොමෝ රජු ගේ විශේෂයෙන් පහන් වූ ඉඳුරන් දැක, 'මේ රජු කලුරිය කරන සමය යැ' යි සිතා, රාජ-සම්පත්තිය විස්තර කොට පාමින් 'එහි ඇලුණ මැනවැ යි, ජීවත් වීමේ බලාපොරොත්තුව ඇති කැරැ ගත මැනැවැ'යි කිවා ය. එ විට රජ ඇය ගේ කථාවේ දෙස් දක්වා 'සියලු ප්‍රිය මනාප දූයින් වෙන් වීම සවභාවයෙකැ' යි ද 'සම්පත් ආදියෙහි අපේක්ෂායෙන් කලුරිය කිරීම නො මැනැවැ'යි ද කියා, 'මේ රාජසම්පතෙහි අපේක්ෂායෙන් කලුරිය නො කරන සේ තමා ගෙන් ඉල්ලා සිටිය යුතු යැ' යි පැවැසී ය. එයසා දේවී හැඬුවා ය. කඳුළු වැගුරුවා ය. කඳුළු පිස දමා රජු කී පරිදි ම සම්පත් ඈහි ඇලුම් නො කරන ලෙස රජුට අනුශාසන කළා ය.

---

299. මේ එයින් පෙරැ අත්බැවෙක සාසුප් බුදුසස්හෙහි තෙර කෙනෙක්හට සිවු පසයෙන් උපස්ථාන කොට පන්සිල් හා පොහෙවස් රැකීමේ ඵලයක් බව සැලකු සැපි යි මෙහි ආත්මදමනය යන්නෙන් පොහෙවස අභිප්‍රෙත ය.

9. රජ ද නොබෝ වේලායෙහි කලුරිය කෙළේ ය. රජුට වූ මරණාන්තික වේදනාව මිහිරි බොජුන් වැළඳුවකු හට ඇති වන භක්තකලාන්තය වැනි වීය: කලුරිය කළ එ රජ බඹලොවැ උපන්නේ ය.

මෙසේ ඒ සුදසුන් සක්විති රජ රජසුව විඳ ඉක්බිති දහම්පායෙහි බඹසර රැක සතර බඹවෙහෙර වඩා බඹලොව ගියේ ය.

බුදුරජුහු මෙ මහාසුදශීනචක්‍රවර්ත්ති චරිතය විස්තර කොට එ සමයෙහි සුදශීන රජ වූයේ තමන් ම යැ යි ද, එ වකට පැවැති සියලු නගරයනට අග්‍රවූ කුශාවතී පුරය සිය වාසස්ථාන වී යැ යි ද වදරා, එහි තමන් ගේ රාජ සම්පත් විඳීම විස්තර කොට පහත සඳහන් පරිදි අනිස් බව පැවැසූහ:

10. "බලව! අනඳයෙනි, ඒ සියලු සංස්කාරයෝ ඉක්මැ ගියහ. නිරුඩ වූහ. පෙරළුණහ. මෙසේ සංස්කාරයෝ අනිත්‍ය හ. අධ්‍රැව හ. අස්වැසිලි රහිත හ. එ බැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරිය යුතු ම ය. නො ඇලිය යුතු ම ය. සියලු සංස්කාරයන් කෙරෙන් මිදිය යුතු ම ය. මෙසින් පෙරළු ස වරක් ම සක්විති රජ ව (කලුරිය කිරීම් විසින්) මෙ නුවරළු සිය සිරුර හැර දැමීමි. මේ සත්වන ශරීර-නිඃක්ෂෙපය යි. මිගේ අටවන ශරීරනිඃක්ෂෙපයකට තැනක් ලොවැ කිසි තැනෙකත් නො දකිමි (පුනර් ජන්මයක් නැති බැවිනි)" යි වදළහ. ඉක්බිති

"සංස්කාරයෝ ඒකාන්තයෙන් අනිත්‍ය හ. ඉපැත්ම ද නැස්ම ද ස්වභාවය කොටැතියහ. ඔහු ඉපිද නැසෙත්. ඔවුන් ගේ සංසිඳීම (නිවන) සැප යැ"යි වදළහ.

[මෙ සූත්‍රයෙහි කුසිනාරාව පෙර සක්විතිරජුනට වාසස්ථාන වූ බව ද, එහි මහාසුදශීන සක්විති රජු රැජැයැවූ බව ද, තමන් ඒ සුදශීන රජ බව ද, මෙසේ ආත්ම සයෙක ම සක්විති ව එ නුවරදී මළබව ද, මෙ එහිදී ශරීරනිඃක්ෂෙපය කරන සත්වන වාරය බව ද, සංස්කාර අනිත්‍ය බව ද දැක්විණ.]

———

18. ජනවසභ සූත්‍රය.

එක් සමයෙක බුදුරජ්ජුහු **නාතික** ගම සමීපයෙහි ගිංජකාවසථයෙහි වසන්නාහු, ඒ හාත්පස **කාශි කෝශල වජ්ජී මල්ල චේති වංශ කුරු පංචාල මච්ඡ සූරසේන** යන ජනපදවලැ සිට කළුරිය කළ සත්වයන් ගේ පරලොව් ගති හෙළි කැරැ වදාරති.

නාතික ගමෙහි සිට කළුරිය කළවුන් ගෙන් අනාගාමීහු පනසකටත් වැඩි ය, සකෘදගාමීහු අනූවකටත් වැඩි ය, සෝවාන්හු පන්සියකටත් වැඩි ය. ඔවුන් ගේ මරණින් මතු ගති ඇසීමෙන් නාතික ගමැ වැසියෝ ඉතා සතුටු වූහ.

2. මේ පවත් ඇසූ අනඳ තෙරණුවෝ මගද රට නැසී ගිය බොහෝ සත්වයන් ඇති බවත්, ඔවුන් ගැන නො වදාළොත් අංග මගධ දෙ රටැ ශ්‍රාවකයන් නො සිටියා සේ සිතන්නට ඉඩ ඇති බවත්, සේනිය බිම්සර රජ දිවි හිමි කොට තෙරුවන් හැදූහු බැතිමත් සත්වකු බව ප්‍රසිඬ කාරණයක් බවත්, ඔහු ගැන භාග්‍යවතුන් වහන්සේ කිසිත් තව ම නො වදාළ බවත්, ඔහු ගැන වදාළොත් එය බොහෝ ජනයා ගේ පැහැදීමටත් සුගති ගමනටත් හේතු වන බවත්, තව ද භාග්‍යවතුන් වහන්සේ බුදු වූ මගද රටෙහි සිට නැසී ගිය සත්වයන් ගේ ගති නොවදාරා හැර දැම්මොත් එයින් මගද රට වැසි තෙරුවන්හි පහන් ජනයන් දීන සිතැති විය හැකි බවත් සිතූහ. සිතා රැ අලුයම්හි බුදුරජුන් වෙත එළැඹ සිය කල්පනාව සැළ කොට වැඳ පැදකුණු කොට නැගී ගියහ.

3. ඉක්බිති බුදුරජ්ජුහු පිඬු පිණිස හැසිර වළඳා, පෙරළා වැඩ, පා සෝදා ගිංජකාවසථයට පිවිස, පැණැවුණු අස්නෙහි වැඩ හිඳ, මගද රටැ වුසූ තුනුරුවනට පහන් ජනයා ගේ ගතීන් බලා දුටුහ. යළි සවස් වේලෙහි වෙහෙර ඉදිරියෙහි සෙවණෙහි පණවා තුබුණු අස්නෙහි වැඩ හුන්හ. එකලැ අනඳ තෙරණුවෝ අවුත් වැඳ පසෙක ඉඳගත්හ. එයට පසු පහත සඳහන් වන කථාව විය:

4. **අනඳ තෙරණුවෝ** – භාග්‍යවතුන් වහන්සේ අද විශේෂ උපශාන්ත දර්‍ශන ඇති සේක. ඉන්ද්‍රියයන් විප්‍රසන්න හෙයින් භාග්‍යවතුන් වහන්සේ ගේ මුඛවර්‍ණය වෙසෙසින් බබළන්නා සේ ය. වහන්ස, අද භාග්‍යවතුන් වහන්සේ ශාන්ත විහරණයෙකින් කල් ගෙවූ සේ පෙනේ (සැප දිනක් ගත කළා සේ පෙනේ).

බුදුරජුහු – අනඳයෙනි, තොප නැසී ගිය මගද රටැ සව්වන් ගැන සඳහන් කොට ගිය කෙණෙහි මම් පිඬු පිණිස හැසිර වළඳා ඉක්බිති පා සෝදා ගිංජකාවසථයට වැද මගද රටැ සව්වන් ගේ ගති බලන අදහසින් පණවා තුබුණු අසුනැ ඉඳ ගතිමි. එසේ හිඳ බලා ඔවුන් ගේ ගති දිටිමි. එකල්හි නො පෙනී සිටි යක්‍ෂයෙක් 'භාග්‍යවතුන් වහන්ස, මම් **ජනවසභ** නම් වෙමි. සුගතයන් වහන්ස, මම් **ජනවසභ** නම් වෙමි' යි කී ය. අනඳයෙනි, ජනවසභ යන නමක් මෙයින් පෙර ඇසුවා මතෙක ඇද්ද?

අනඳ – මතෙක නැත වහන්ස, එහෙත් වහන්ස, ඒ **'ජනවසභ'** යන නම ඇසීමෙන් මා සිරුර ලොමුදහ ගත. වහන්ස, ජනවසභ යන නම තිසි ලෙස ලැබූ තැනැත්තහු සුලු පටු යකකු නම් නො විය යුතු' යි මේ සිත මට වී ය.

5. **බුදුරජුහු** – අනඳයෙනි, ඒ තමා ගේ නම කියා අනතුරු වැ මනා පෙනුම් ඇති යකෙක්[300] මා හමුයෙහි පහළ වී ය. එයට පසු "භාග්‍යවතුන් වහන්ස. මම් බිම්සර වෙමි. සුගතයන් වහන්ස, මම් බිම්සර වෙමි. වහන්ස, මේ වෙසවුණු දෙව්-රජුහු ගේ සහචර වූ සත්වන වාරය වේ. වහන්ස, ඒ මම් මෙයින් සැව මිනිස් රජක්හු වීමට ද සමතිමි. මෙ දෙව්ලොවින් සැව ජන්ම සතක් ද ඒ මිනිස්ලොවින් සැව ජන්ම සතක් දැ යි ජන්ම තුදුසක් දෙව්ලෝහි මෙයින් පෙර මම් විසීමි. වහන්ස, මා අපායෙහි නො වැටෙන්නකු බව (සෝතාපන්නයකු බව) මම් දනිමි. වහන්ස, දැන් සකෘදගාමී වීමට මගේ ආශාව ඇතැ" යි හේ යක් තෙම කී ය. මම් ඔහු ගේ ඒ කථාව අසිරි තියාවි වදූරා 'තමා ගේ විශේෂාධිගමය කොතැනෙකින් ලද්දූ යි දැන ගත්තේහි දැ?' යි ඇසීමි.

300. මෙහි යක් යනුයෙන් දෙවියෙක් හැඟැවිණ ඒ බිම්සර රජු ය. හේ මැරී වෙසවුණු පිරිසෙහි සෙනෙවි වැ උපන පෙර දූයෙහි බණ අසා එක්සියදසදහසක් ජනයාට දෙවු උවසු විය එහෙයින් ජනවසභ නම් විය

6. ‘භාග්‍යවතුන් වහන්ස, ඔබගේ ශාසනයෙන් පිටාතර අන් තැනෙකින් නො ලදිමි. පෙර යම් දිනෙක (රජගහපුර තල්වනයෙහි දී) භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ඒ කාන්තයෙන් වෙසෙසින් පැහැදුණෙම් ද, එ තැන් පටන් කොට අපාය ගමනින් මිදුණෙමි, මා අපායයෙන් මිදුණු බව් දනිමි. සෙදූගැමි බව් පිණිස මා තුළ ආශාව ද ඇත. වහන්ස, මම මෙහි විරූඪක මහරජු වෙතට වෙසවුණු මහරජු විසින් කිසි කටයුත්තක් පිණිස එවනු ලදිමි, භාග්‍යවතුන් වහන්සේ ගිංජකාවසථයට පිවිස මගද රට නැසී ගිය සච්චන් ගේ ගති දැකීමට සිත යොමා සිටින්නා දැක්කෙමි. වහන්ස, වෙසවුණු මහරජු සිය පිරිසෙහි දී ඒ භවතුන් ගේ පරලොව ගති කියන්නා අසා පිළිගත් මට භාග්‍යවතුන් වහන්සේ දැක එ පවත් සැළ කරන්නට සිත් වීය. භාග්‍යවතුන් වහන්සේ සාරා දූත් එළැඹෙන්නට හේතුව මේ කරුණු යි.

7. වහන්ස, පෙර එක් ඇසළ පුණු පෝ දිනෙක තව්තිසා දෙව්ලොව සුදම් සෙබෙහි දෙවියන් ගේ මහත් මුළුදෙවුමෙක් වී ය. ධෘතරාෂ්ට්‍ර විරූඪක විරූපාක්‍ෂ වෛශ්‍රවණ යන සතර වරම් දෙව් රජුහු සභාවේ පෙර දකුණු අපර උතුර යන සිවු දිගැ පිළිවෙළින් අරක් ගෙන උන්හ. බුදුසසුනෙහි බඹසර රැක එහි අළුත උපන් දෙව්හු එ සෙබෙහි අන් දෙවියනට වඩා වර්‍ණයෙනුත් යශසිනුත් බැබැලුණහ. එසින් තව්තිසා වැසි දෙවියෝ ‘දෙව් පිරිස වැඩේ, අසුර පිරිස පිරිහේ’යැ යි ප්‍රීත වූහ. දෙවියන් ගේ ඒ ප්‍රීතියත් සතුටත් අනුව සක්දෙව් ද සතුටු වූයේ, බුදුසස්නෙහි බඹසර රැකා දෙව් ව ඉපිද සෙසු දෙවියන් වර්‍ණයෙනුත් යශසිනුත් අබිබවා බබළන ඒ අළුත් දෙවියන් දැක බුදුන් දහම් වදිමින් තමා ඇතුළු දෙවියන් සතුටු වන බව් පැවැසී ය.

8. “ඉක්බිති තෙතිස් දෙව්රජුහු සාකච්ඡා කොට සෙනසුන්හි වස් එළැඹි භික්‍ෂූනට ආරක්‍ෂාසංවිධානය කිරීම සිවුවරම් රජුනට පැවරූහ. ඔහු ද එය පිළිගෙන සතුටු ව, සිය අසුන්හි හුන්හ. අනතුරු වැ සියලු දෙව් **පබා** මැඩ මහත් එළියෙක් උතුරු දෙසින් පැතිර ආ ය. එවිට සක්දෙව් එය හැඳින දෙවියන් අමතා බඹහු පැමිණෙන බව් කී ය. දෙව්පිරිස බලා පොරොත්තු වූහ. නොබෝ වේලායෙහි **සනත්කුමාර** මහ

බඹ **පන්සිළු** දෙව්පුතු වැනි කුමරවෙසින්[301] දෙවියන් අතුරෙහි පහළ වී ය. හේ අහසැ පළක් බැඳ හිඳ ඒ සභාව බලා, ප්‍රමුදිත ව ඉන්නා දෙවියන් දැක, "බුදු සස්නැ බඹසර රැක දෙව්ලොව ඉපිදැ වණ්ණයෙන් යශසින් අන් දෙවියන් මැඩ බබළන ඒ අළුත් දේවතාවන් දක්නා ඉන්‍ද්‍රයා සහිත දෙව්හු බුදුන් දහම් වඳිමින් සතුටු වෙති" යි බ්‍රහම සවරයෙන්[302] පැවැසී ය. ඉක්බිනි හේ අත්බව් තෙතිසක් මවා තව්තිසාහි තෙතිස් දෙවියන් ගේ පළඟ තෙතිසෙහි හිඳ දෙවියන් අමතා තෙරුවන් සරණ ගියහු සිල් රැක්කහු මරණින් මතු සදෙව්ලෝහි උපදනා බව[303] කී ය. ඒ අසුන් අයන් එකී එකී දෙවියා තම තමා ගේ අස්නැ සනත්කුමාර බඹා හිඳ කථා කෙළේ යැ යි සිතී ය.

9. ඉක්බිති සනත්කුමාර බඹ තොම තමා මවාගෙන ගුන් වෙස් තෙතිස හැර එක් පුද්ගලයෙක් ම වැ සක්දෙව්ඳු ගේ පළඟෙහි හිඳ දෙවියන් අමතා බුදුරජුන් විසින් ඡන්‍දිඬිපාද, වීරියිඬිපාද, චිත්තිඬිපාද, විමංසිඬිපාද යන සතර ඍඬිපාදයන් පණවා වදාළ බවත්, කවදුන් ඍඬිමත් වූවත් මෙ සතර ඍඬිපාද වැඩූ බවත්, තමා පෙරැ ඒ සතර වැඩූ බැවින් එසේ වූ ඍඬියක් ඇත්තකු වූ බවත්, භාග්‍යවතුන් වහන්සේ සැප ලැබීමට මාගී වූ අවකාශාධිගම තුනක්[304] වදාළ බව කියා, එහි විස්තරයත්, එයින්පසු සතර සතිපඨානයන් හා

. 301. කුමාරවේශයෙන් සියලු දෙව් වරු පන්සිළුහු ගේ (පංචශිඛයා ගේ) රූපයට ඇලුම් කෙරෙත්. එ බැවින් සනත්කුමාරයා ද ඔහු ගේ වේෂයෙන් පෙනී සිටී. සිය වෙසින් නො සිටියේ කිම? පහත් පහත් දෙව්ලෝවලැ දෙවියෝ ඉහළ ඉහළ භූමිවලැ දෙවියන් (ඔවුන් සිය රූ දුබී කොට මවා නො ගත හොත්) දක්නට අසමර්ථ තව්තිසා වැසි දෙවියෝ ද සනත්-කුමාරයා ගේ පියෙවි රුව දක්නට නො සමත්හ එතරම් සියුම් බැවිනි. 302. බ්‍රහ්ම සවරය (බඹහුගේ කටහඬ) අෂ්ටාංග සමුපෙත යි (අංග අටෙකින් යුක්ත යි) ඒ අංග අට නම්: පහසුවෙන් ශබ්දය මුවින් පිටවීම (විස්සට්ඨතා), අදහස වහා අවබොධ කරවන බව (විඤ්ඤෙය්‍යතා), මිහිරි බව (මංජුතා), කණට සැප එළවන බව (සවණීයතා), සැපිවු බව (අතර බිඳුම් රහිත බව - බින්දුතා), පැහැදිලි (නොවිසිරුණු) බව (අවිසාරිතා), ගැඹුරු බව (ගම්භීරතා), ඇත ඇසෙන බව (නින්නාදිතා) 303 චිමනි නැති ව සරණයෙහි පිහිටා සිල් රැක්කවුන් ගැන ම මෙය කියන ලදි. 304. අවකාශාධිගම යනු ඉඩ ලබාගැනීම යන අර්ථ ඇත්තේ යි. ප්‍රථම ධ්‍යානය පංචනීවරණයන් මැඩ තමහට ඉඩ ලබාගෙන සිටී එහෙයින් එ ප්‍රථම අවකාශාධිගමය පළමු ඉඩ ලැබීම යැ යි) කියනු ලැබේ. චතුර්ථ ධ්‍යානය සැප දුක් මැඩ තමහට අවකාශ ගෙන සිටී නු යි දෙවෙනි අවකා ශාධිගමයැ යි කියන ලදී මෙයට දෙවෙනි තෙවෙනි ධ්‍යාන ද ඇතුළති. රහත්මග සියලු කෙලෙසුන් මැඩ තමහට අවකාශ ලබයි. එහෙයින් තෙවෙනි අවකාශාධිගම යැ යි කියන ලදී. ශ්‍රෝතආපත්ති සකෘදාගාමි අනාගාමි යන මං තුන දා මෙහි ඇතුළති.

එහි විභාගයත්, සමාධිපරිෂ්කාර ධර්ම[305] සතත් දක්වා, නිවන්දොර හැර ඇති බවත්, දෙවියන් අතුරෙහි අළුත උපන් බොහෝ දෙනා තෙරුවන්හි පැහැද බඹසර[306] රැක සෝවාන් සකෘදගාමී අනාගාමී වූ බවත් සැළ කළේ ය.

16. මෙයැසූ වෙසවුණු රජ 'මෙබඳු ශාස්තෘවරයෙක්, මෙබඳු ධර්මයෙක්, මෙබඳු ගුණලාභයෙක් තවත් ඇද්ද!'යි පුදුම වීය. ඔහු සිතූ අදහස දුටු **සනත්කුමාර** තෙම අතීතයේත් අනාගතයේත් මෙබඳු ශාස්තෘත් ද, ධර්මය ද, මාර්ගඵලප්‍රාප්තිය ද වූ බව ද වන බව ද පැවැසී ය. වෙසවුණු රජ මේ කථාව අසා සිය පිරිසට දැන්වී ය. මෙසේ මේ පවත් ජනවසභ තෙම බුදුරජුනට සැළකෙළේ ය. බුදුරජුහු ද නුවණින් බලා වදරා එය අනඳ මහ තෙරුනට වදාළහ. අනඳ තෙරණුවෝ සිවුවණක් පිරිසට පැවැසූහ.

[මෙ සූත්‍රයෙහි බුදුසස්නෙහි බඹසර රැකීමේ අනුසස්, තව්තිසා දෙවියන්ගේ රතනත්‍රය ප්‍රසාදය, සතර ඍද්ධිපාද හා අවකාශාධිගම් තුන සැප ලැබීමටත් සතර සතිපට්ඨාන මාර්ගඵල ලාභයටත් සප්ත සමාධිපරිෂ්කාර සම්‍යක්සමාධිය ගේ වැඩීමටත් හේතු වන බව ප්‍රකාශ කරමින් දෙවියනට සනත් කුමාරයා කළ අනුශාසනය ඇසූ වෙසවුණු රජ එය ජනවසභ යක් රජුට දැන්වීම, ඔහු එය බුදුරජුනට දැන්වීම, බුදුරජුන් එය නුවණින් බලා දැන මගදරටැ උපාසකයන් ගේ පරලොව් ගති වදරන අවසථායෙහි භික්‍ෂූනට දෙසීම දැක්විණ]

19. මහාගෝවින්ද සූත්‍රය.

බගවත් බුදුරජුන් රජගහ පුර අසලැ ගිජුකුළු පව්වෙහි වසන සෙමෙහි පන්සිළු[307] නම් ගඳඹ දෙව්පුත් එක් රැයෙක එළැඹියේ ය. එළැඹ ඔබ වැඳ පසෙක සිටියේ ය. සිටැ අවසර ගෙන පහත සඳහන් වන පුවත පැවැසී ය:

---

305 සමාධිපරිෂ්කාර යනු අ:සී සම්‍යක්සමාධිය ගේ පිරිවර ධර්ම යි. ඔහු නම් සම්‍යග්දෘෂ්ටි, සම්‍යක්සංකල්ප, සම්‍යග්වචන, සම්‍යක්කර්මාන්ත, සම්‍යගාජීව, සම්‍යග්ව්‍යායාම, සම්‍යක්සමාධි යන සප්ත ධර්මයෝ යි 306 මෙතනැ බඹසර යනු ශාසනබ්‍රහ්මචර්‍යාව යි. 307 පන්සිළු (පංචසිඛ). හිස මත්තෙහි බඳනා ලද කොංඩා ගැට පසක් ඇති බැවින් මෙ තෙම පන්සිළු නම් විය. පෙර අත්බැවෙක ගොපලුදරුවෙක් වැ අන් දරුවන් හා එක්වැ මගියනට නවාතැනට හල් ද පොකුණු නැති තන්හි පොකුණු ද ශේදඹු පාලම් ඇවැසි තන්හි ශේදඹුපාලම් කෙළේ ය තවත් නොයෙක් කුසල් රැස් කෙළේ ය ළපැටි වියෙහි ම මළ හෙ තෙම සිවුමහරජයෙහි උපන. ඔහු අත්බව රන් කඳක් බඳු විය. පෙර අත්බව්හි සේ ම හිසැ බන් කොංඩා පසක් - ඇති දරු වෙසින් ම මෙ තෙම හැසිරෙයි.

'වහන්ස, ගිය වස්පවුරුණු පොහෝදිනැ රෑ සුදම් සෙබෙහි තව්තිසාවැසි දෙවියන් ගේ සභාවෙක් විය. භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර රැක අළුත තව්තිසාහි උපන් දෙවියෝ වණ්ණයෙනුත් යශසිනුත් අන් දෙවියනට වඩා බබළති. ඒ කාරණයෙන් තව්තිසාහි දෙවියෝ සතුටු වෙත්. 'දෙව් පිරිස වැඩේ' යැ යි, අසුර පිරිස පිරිහේ යැ' යි ප්‍රීත වෙත්. සක්දෙවිඳු ඔවුන් ගේ ප්‍රසාදය දැන,

''භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර රැක මෙහි උපන් දෙවියෝ වණ්ණයෙනුත් යශසිනුත් අන් දෙවියන් අබිබවත්'' යැ යි ද ''මෙයින් ඉන්‍ද්‍රයා සහිත තව්තිසා වැසි දෙව්හු බුදුන් දහම් වඳිමින් සතුටු වන්නාහ''යි ද කියා දෙවියන් ගේ සතුට අනුමත කෙළේ ය.

2. ඉක්බිති සක්දෙවිඳු 'භාග්‍යවතුන් වහන්සේ ගේ අෂ්ට ප්‍රකාර ගුණය අසන්නට කැමැති දැ?''යි ඔවුන් විචාරා, කැමැති බව ඔවුන් කී විට,

i. බුදුරජුන් ලොවට හිත පිණිස පිළිපන් බව,
ii. සාන්දෘෂ්ටික පණ්ඩිතගෝචර ධර්මය දෙසූ බව,
iii. හොඳ නරක දෙක තෝරා බේරා තිසි ලෙස දෙසූ බව,
iv. නිවනත් එයට ම සුදුසු ප්‍රතිපත්තියත් වදාළ බව,
v. ආර්‍ය පුද්ගලයන් හා ඒකාරාමතා ඇති බව,
vi. පැහැදුණු ක්‍ෂත්‍රියාදීන් පිදූ ප්‍රත්‍යයය මානමදැදියෙන් තොර වැ වළඳන බව,
vii. යථාවාදිතථාකාරිතා යථාකාරිතථාවාදිතා ව (අන් හට තමන් දෙසන සේ හැසිරෙන බව, හැසිරීමට අනුව දෙසන බව),
viii. ආර්‍ය මාර්‍ගයෙන් කෙලෙසුන් නසා වසන බව

යන මෙ අංග අටින් බුදුරජුන් සම්පූර්ණ බවත්, ඔබ හැර එයින් සම්පූර්ණ අන් පුද්ගලයකු පෙරැ තමා නො දුටු බවත්, දැනුත් නො දක්නා බවත් කියේ ය.

3. එය අසා දෙව් කෙනෙක් 'භාග්‍යවතුන් වහන්සේ වැනි ශාස්තෘහු සිවු දෙනෙක් ලොවැ පහළ වන්නාහු නම්, දම් දෙසන්නාහු නම්, කොතරම් හොඳ දැ!' යි කීහ. එවිට අන්

දෙවි කෙනෙක් 'සිවු නමක් තබා තුන් නමක් පහළ වූවොත් දම් දෙසුවොත් කොච්චර යෙහෙක් දැ!' යි කීහ. එවිට අන් කෙනෙක් 'තිදෙනෙක් සිටිත් වා. දෙදනකුත් පහළව දම් දෙසුවත් ලොවට කොච්චර හොඳෙක් දැ!' යි කීහ.

එවිට සක් දෙවිඳු

'එක් ලෝකධාතුවෙක එක් විට (එක් කාලයෙහි) සම්මාසම්බුදුවරුන් දෙනමක් නො පහළ විය හැක්කැ යි ද, භාග්‍යවතුන් වහන්සේ ලොවට හිත පිණිස දිඝ කාලයක් නිරෝග ව වැඩ උන්නොත් ඉතා යෙහෙකැ!යි' ද කී ය.

4. ඉක්බිති ඒ රැස් වූ දෙවියෝ තමන් රැස් වූ කටයුත්ත ගැන සාකච්ඡා කොට එය සිදු කිරීම සිවුවරම් රජුනට පැවැරූහ. ඔහු ද එය පිළිගෙන සිය අසුන්හි හුන්හ.

එයට අනතුරු වැ උතුරු දිගින් මහ එළියෙක් පැතිර ආ ය. එය බඹහු ගේ පැමිණීමට පෙර නිමිති යැ යි සක්දෙවිඳු දෙවියනට දැන්වී. සියලු දෙවියෝ බඹහු පැමිණීම බලා පොරොත්තු ව සිය අසුන්හි උන්හ*.

5. ඉක්බිති සනත්කුමාර බඹ නො පෙනී හිඳ

'භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර රැකා දෙව්ලොවැ ඉපිද අන් දෙවියන් වර්ණයෙනුත් යශසිනුත් අබිබවා බබලන බුදුසවු දෙවියන් කාරණ කොට ගෙන ශක්‍රයා ඇතුළු සියලු තව්තිසා වැසි දෙවියෝ බුදුන් දහම් සංඝයා වඳිමින් සතුටු වෙතැ'යි අෂ්ටාංග සමුපේත බ්‍රහමස්වර විහිදුවා කී ය.

එවිට දෙව්හු තමන් ඒ කරුණුත් සක්දෙවිඳු කී තථාගත ගුණ අටත් දැන ම සතුටු වන බව පැවැසූහු. එයසා මහබඹහු ඒ යථාභූත බුදුගුණ අට කියන සේ සක් දෙවිඳු අයැදූහ. සක්දෙවිඳු ද එය බඹුනටත් කී ය.

6. ඉක්බිති සනත්කුමාර බඹහු පංචසිඛවේශයෙන් එහි පහළ ව අහසැ පලඟින් හිඳැ 'බුදු වූ අත්බැවැ භාග්‍යවතුන් වහන්සේ ගේ ප්‍රඥමහිමය කියනු කිම! ඉතා පෙරැ සසරැ සරන කලත් මහාප්‍රඥ වී යැ'යි භගවත්නාහු ගෝවින්ද චරිතය ගෙනහැර පෑහ:

* සනත් කුමාර බඹහු ගේ පියෙවි රුව තව්තිසාහි දෙවියනට නො පෙනෙයි. එ බැවින් හේ දළ අත්බවක් මවාගෙන එහි පහළ වෙති. දෙවියෝ ද එවේලෙහි පළක් බැඳ දෙහොත් මුදුන් තබා වැඳගෙන ඉඳිත්. බඹහු යම් පුටුවෙක උන්නොත් එය අඝත් දෙවි ඉතා ප්‍රීත වේ.

7. (ඒ සැකෙවින් මෙසේ ය:) පෙර **දිසම්පති** නම් රජෙක් වී ය. ඔහු පෙරවියා **ගෝවින්ද** නම් බමුණෙකි. දිසම්පති රජු ගේ පුත්‍ර වූ **රේණු** කුමරු ත් ගෝවින්දයා පුත් ජෝතිපාල මාණවයාත් අන් ක්ෂත්‍රියයන් සදෙනෙකුත් මිත්‍රයෝ ය. ගෝවින්දයා ගේ මරණින් පසු ඔහු පුත් පෙරෙවි තනතුර ලද. පියා සේ ම රාජකාර්‍ය කිසිත් [illegible] කරනුයෙන් ජෝතිපාලයා **මහාගෝවින්ද** නමින් ප්‍රසිද්ධ විය. දිසම්පති රජු ගේ මරණින් පසු රේණු කුමර රජ විය. රේණුහු ගේ යහළු සත් රජුහු කලින් කල ඔහු දක්නට එන්නාහ. එන විට අන් රජුන් ගේ රාජ්‍ය මැදින් ද එන්නට වීමෙන් රටවැසියා ගේ අප්‍රසාදයට හේතු දූ විය හැකි බැවින් එය නොවනු පිණිස රේණුහු ගේ රාජ්‍යය දක්වා එක එක රජක්හු ගේ රාජ්‍යය දිගට ම සිටුනා පරිදි රට බෙදලීමට ඒ රජහු සත්දෙන ම ඒකමතික ව ඒ කටයුත්ත මහාගෝවින්දයාට බාර කළහ. මහාගෝවින්ද පඬි ද බොස්ගෙඩියට සවි කළ ගරාදි සයක් ඇති රථරෝදයක් මෙන් රේණු රජු ගේ රාජ්‍යය මැදි කොට එය කරා දිගට ම සිටි මායිම් ඇති කොට රාජ්‍ය බෙදා දුණ.

8. රේණුහු ගේ ජනපදය මැදි කොට එය දසාවට දිගට ම පිහිටි එ රාජ්‍යයෝ නම් කාලිංගයන් ගේ **දන්තපුරය ද,** අස්සකයන් ගේ **පෝතන** පුරය ද, අවන්තීන් ගේ **මාහිස්සති** පුරය **ද,** සෝවිරයන් ගේ **රෝරුක** පුරය ද, විදෙහින් ගේ **මිථිලාව ද,** අංගරට **චම්පාව** ද, කාසින් ගේ **බාරාණසිය** ද යන සත සි. මෙහි රජය කැරූ වූ රජහු නම්: පිළිවෙළින් **සත්තභූ, බ්‍රහ්මදත්ත, වෙස්සභූ, භරත, රේණු, ධතරඨ** නම් දෙදෙනෙක් යන මොහු යි. මොහු **සප්තභාරතයෝ යි** දත්නා ලදහ. එ රජුහු සදෙනා ද මහාගෝවින්ද පඬිහු සිය අනුශාසකපදයෙහි තැබූහ.

තව ද එ පඬිහු ඒ සත්රටෙහි සත් බමුණු මහසල් කුලයනට ද, සත් සියයක් ස්නාතක[308] බ්‍රාහ්මණයනට ද වේද ඉගැන්වූහ.

9. කල් යෑමෙන් 'මහාගෝවින්ද බමුණා බඹහු සියැසින් දකී, ඔහු හා කථා කෙරේ'යැ යි ඔහු ගේ කීර්තිඝෝෂයෙක් රටේ නැගිණ. එයසා ''මම් බ්‍රහ්මයා නො දකිමි. ඔහු හා සල්ලාපත් නො කරමි. 'වැසි සාර් මස මුළුල්ලෙහි කරුණාධ්‍යානය

308. ස්නාතක - බමුණකු ගුරුහු යටතේ වේද වේදාංග උගනිමින් බඹසැරි ව සාල් ගෙවා ගෘහස්ථයකු ලෙස දිවිය අරඹන්නට පළමු සමෘතිශාස්ත්‍රයෙහි නියමිත පරිදි ස්නානය කළ යුතු යි. මේ ස්නානය කෙළේ ස්නාතක නම්.

වඩන්නා බඹා දකිනැ' යි 'ඔහු හා දෙඩනැ'යි මහලු ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍යයන් කියන්නා ඇසීමි. මේ වැසි සාර මසැ කරුණා-ධ්‍යානය වැඩීම් නම් සෙහෙකැ''යි සිති. සිතා රේණු රජුටත් සෙසු සරජුනටත් තමා ගෙන් වේද උගන්නා සියලු ශිෂ්‍යයනටත් සිය බිරියනටත් ඒ කාලය ඇතුළත බොජුන් ගෙන යන්නහු හැර අන් කිසිවකු තමා වෙත නො ඉයැයුතු බව කියා, නුවර පෙරදිගැ විවේකයට සුදුසු පරිදි වූ ගෙයක් තනවා එහි වැද, වැසි සිවු මස මුළුල්ලෙහි කරුණාධ්‍යානය වැඩි ය. බොජුන් ගෙන යන්නහු විනා අන් කිසිවෙක් ඔහු වෙත් නො පැමිණියේ ය.

10. සිවුමස ඇවෑමෙන් බඹහු පැමිණෙනැ යි බලා පොරොත්තුව ඔහුට වි ය. **සනත්කුමාර** බඹ ඔහු අදහස දැන **මහාගෝවිඳ** බමුණා ඉදිරියෙහි පහළ වී ය. පෙර කිසි කලෙක නො දුටු විරූ බ්‍රහ්මරූපය දැක හේ භීත වැ 'ඔබ කවුරු දැ?' යි බඹහු විචාළේ ය. තමන් **සනත්කුමාරයා** බව බඹ කි ය. එ විට ආසනාදියෙන් ආගන්තුක සත්කාර කෙළේ ය. ඉක්බිති සනත්කුමාරයා ගෙන් ලත් අවසර ඇති බමුණු තෙමේ බඹ ලොවට මඟ විචාළේ ය. **'මමත්වය හැර ඒකී ව කරුණාධ්‍යානයෙහි ඇලි ආමගන්ධ නැති ව බඹසර රක්නා පුද්ගලයා බඹලොවට පැමිණේ යැ'** යි සනත්කුමාරයා කී ය.

11. එ විට මහාගෝවිඳ පඬිහු මමත්වය බැහැරලීම් ආදි තමා තේරුම් ගත් බවත් තමාට ඒ වැටහෙන සැටිත් කියා 'ආම්ගන්ධ නැති ව ය' යන්න තමා නො දන්නා බව කියා එය විචාළ හ.

'ක්‍රෝධය, බොරු කිම, වංචාව, මිත්‍රද්‍රෝහි බව, තද මසුරු බව, අභිමානය, ඊර්ෂ්‍යාව, තෘෂ්ණාව, ලාභ ලෝල බව, පරහිංසාව, ලෝභය, වෛෂය, මදය, මෝහය යන මොවුන් බඹලොව යන මඟැ හෙළූ අකුල් වූ **ආමගන්ධ** යැයි ද, මෙකී තුදුස් කිළිටෙන් යුක්තයෝ කුණුගඳ ඇත්තෝ යැ යි ද බඹ කී ය.

මෙ කී ආමගන්ධයන් ගෙන් වැළැකී හිඳීම ගිහිගෙහි ඉන්නහුට අමාරු යැ යි කියා ගෝවිඳ පඬිහු තමන් පැවිදි වන රිස්ස කියා පෑහ. එයට ඒ කාලය වේ යැ යි කියා බඹ අතුරුදහන් විය.

12. ඉක්බිති ගෝවිඳ පඬිහු රේණුරාජාදි සත් රජුනට ද සිය බමුණු සිසු පිරිසට ද සිය බිරියනට ද දන්වා පැවිදි වූහ. රේණු ආදි සත් රජහු ද සත් බ්‍රාහමණ මහාසාරයෝ ද

සනාතකයන් සත්සියග ද සතළිස් බිරියෝ ද නොයෙක් දහස් ගණන් ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ සත්පුරුෂයෝ ද ගිහි ගෙය හැර මහාගෝවින්ද පඬිහු අනුවැ පැවිදි වූහ.

ඒ මහ පිරිස පිරිවර කොට ගෙන **මහාගෝවින්ද** තවුසාණෝ ගම්නියම්හි සැරිසැරූහ. ඔවුන් ගිය ගිය තැනැ රජුනට රජකු සේ ද බමුණනට බඹහු සේ ද ගැහැවියනට දෙවියකු සේ ද වූහ. අනතුරක් වූ විට මිනිස්සු **"නමො මහාගොවින්දස්ස බ්‍රාහ්මණස්ස, නමො සත්තපුරොහිතස්ස"**යි[309] කියනසුළු වූහ.

මහාගෝවින්දයෝ සතර බඹවෙහෙර වඩා වූසූහ. සිය සව්වනට ද එය දෙසූහ. ඈදුරු බස පිළිපැද ධ්‍යාන ලැබුවෝ, මරණින් පසු සිය ඈදුරාණන් හා බඹලොවැ උපන්හ. දහන් නො ලද්දුවෝ දෙව්ලෝ ගියහ.

මෙසේ උන් හැම දෙනා ගේ පැවිද්ද නිෂ්ඵල නො වී ය."

13. මේ සනත්කුමාර බඹහු දෙව්සෙබෙහි කළ කථාව ය. මෙය තමා ඇසූ පරිදි ම පන්සිළු බුදුරජුනට කි ය. කියා, 'භාග්‍යවතුන් වහන්සේ මෙය සිහි කරන සේක් දැ?'යි පුළුවුත. තමන් එය සිහි කරන බවත් එ කලැ මහාගෝවින්ද පණ්ඩිත වූවත් තමන් බවත් බුදුරජුහු වදාළහ. වදුරා, එ සමයෙහි තමන් ඒ දෙසූ මග බඹලොවට විනා නිවනට නො වූ බවත්, නිවන්මග නම් ආයර්‍ය අෂ්ටාංගික මාර්ගය ම බවත්, එය මෙ අත්බව්හි ම සපුරා වැඩිය හැකි නොවූවත් බොහෝ දුරට පිරීමෙන් සෝවාන් සෙදැගැමි හෝ අනගැමි වන බවත්, මෙසේ මේ අරි අටැඟි මග නම් වූ මහබඹසර පුරත්නත් ගේ පැවිද්ද සඵල බවත් වදාළහ.

14. පන්සිළු ගඳෙවුපුත් බුදුරජුන් වදාළ බස මුදුනෙන් පිළිගෙන වැඳ පැදකුණු කොට අතුරු දහන් වැ ගියේ ය.

[මෙහි බුදුරජුන් හා **පන්සිළු** දෙව්පුතු ගේ සංලාපය, සසුන්හි බඹසර රැක්මේ අනුසස්, සක්දෙව්හු බුදුගුණ දට පැවැසීම, තව්තිසාවැස්සන් තෙරුවන්හි පැහැදීම, සනත්-කුමාර බඹු ගෝවින්ද චරිතය කිම, එ පවත් දැන්වූ පන්සිළුවාට බුදුරජුන් මහබඹසර අගය දෙසීම දැක්විණ.]

---

309. මහාගොවින්ද බමුණාහට නමස්කාර වේ වා, සත්රජුන් පෙරෙවියාට නමස්කාර වේ වා.

20. මහාසමය සූත්‍රය

එක් සමයෙක බුදුරජ්හු සැහැ රටෙහි කිඹුල්වත් පුර අසල මහ වෙනෙහි[310] පන්සියයක් පමණ[311] රහතුන් හා වැඩ වෙසෙති. එ සමයෙහි බුදුරජුන් ද බික්සඟන ද දක්නා පිණිස දසදහසක් ලෝදෙයෙන් බොහෝ දෙවියෝ එහි රුස්වූහ.

2. එ කලැ සුදවැසි[312] සතර දෙනෙක් බඹුහු එය දැක භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹුණොත්, එළැඹැ තමන් වෙන වෙන ම එක එක ගයක් කිව්වොත් මැනැවැයි සිතූහ.[313] සිතා වහා අතුරු දහන් වැ බුදුරජුන් හමුයෙහි[313] පහළ වැ ඔබ වැද පසෙක සිටියහ. ඔවුන් ගෙන් එක් බඹෙක් අවුත්,

"වෙනෙහි මහ මුළු දෙවුමෙකි. දෙව්බුඑහු රැස් වැ සිටිත්. (ඔවුන් දැක) **ඇපි ද තුන් මරුන් දිනූ[314] සඟන දක්නට මේ දහම්සමාම් ආම්හ"සි**

කියා බුදුරජුන් වැඳ සිටියේ ය.[315]

3. තව ද බඹෙක් අවුත්, "ඒ මහ සමාගමයෙහි මහණ වහන්දෑ තමන් සිත් සමාදියෙහි පිහිටුවූහ. ඍජු කළහ. රියැ යෙදූ අසුන් සියලු යොත් අතින් ගෙන නවතන්නා සේ මේ සියලු පන්සියක් නුවණැති වහන්දෑ අරමුණෙහි මැදහත් වැ සිටින්නාහු ඉඳුරන් රකිත්. ඔබ දක්නට අපි ආම්හ" සි කියා වැද ගොස් තමා සිටි තැන ම රැඳුණේ ය.

310. මහවෙනෙහි - කිඹුල්වත් පුර නොදුරු වූ මහාවනය සවශංජාත ය. 311. පන්සියක් පමණ රහතුන් - බුදුරජුනට පිරිවර පිණිස ශාක්‍ය කෝලිය කුල දෙකින් පන්සියක් පමණ කුමරහු ඔබ වෙත පැවිදි කරවන ලදහ. බුදුරජ්හු ඔවුන් හිමවතට ගෙන ගොස් කුණාල ජාතක දේශනාව වදාළහ. එයසා ඔහු හැම රහත් වූහ. මෙහි පන්සියක් රහතුන් යැ යි දක්වුණේ ඔවුන් සඳහා ය. 312. සුදවැසි - ශුඬාවාස නම් අනාගැමි රහත් බඹුන් ඉන්නා බඹලෝ ය. එහි වැසි බඹහු සුදවැසියෝ ය. 313. ඔවුන් බුදුරජුන් හමුයෙහි පහළ වූ නියා පෙළෙහි පෙනෙනුදු, ඔවුන් බඹලොවැ දී ගාථා ගොනාගෙන සක්වළැ සතර පැත්තේ මුවවිටැ බට බව ද, පෙරදිගැ සක්වළ මුවවිටැ බටුවන් නිල්කිසුණු සමවැද නිල් රැස් විහිදුවමින් ද, දකුණු අවර උතුරු යන තුන් දෙසැ සක්වළ මුවවිටට බටුවන් පිළිවෙළින් පීතකසිණ ලෝහිතකසිණ ඕදාතකසිණ සමවැද තමතමන් සමවත් සමවත් අනුවැ, රන්වන් රත්වන් සුදුවන් රැස් විහිදුවමින් අවුත් වැද සිට ගාථා කී බව ද අටුවාහි දක්වේ. 314. තුන්මරුන් දිනූ - තුන්මරුනට නො පැරැදුණු, එද ම තුන්මරුන් මැඩ මරයුදෙන් ජය ගත් රහත්හු මෙහි අභිප්‍රේත ය. තුන්මරහු නම් ක්ලේශමාර, මෘත්‍යුමාර, දේවපුත්‍රමාර. 315. 'ඔහු මේ ගාථා කියා වැඳ ගොස් සක්වළ මුවවිට ම සිටියහ'යි සනු අඩවණිනාගත පරිදි යි.

තෙවෙනි බඹෙක්,

"පසැස්[316] ඇති බුදුරජුන් විසින් මොනොවට හික්මවන ලද ඒ තරුණ පැවිදි නමැති ඇත්තු තෘෂ්ණා චලන නැත්තාහු කෙලෙස් උල් සිඳ, කෙලෙස් කණයම සිඳ, කෙලෙස් ඉඳුකිල උදුරා, උපක්ලේශ නැති ව, නිමල ව, සතරදිගැ කිසිදු අවහිරයක් නැත්තාහු[317] සිත් සේ හැසිරෙත්. ඒ උතුමන් දක්නට ආම්හ" කියා වැඳ ගොස් තමා කලදී සිටි තැන ම රැඳුණේ ය. ඉක්බිති අන් බඹෙක් අවුත්, "බුදුරජුන් සරණ ගියාහු අපායට නො යන්නාහ. මරණයෙහි දී මිනිස් කය හැරලා දෙව්මුළුව සපුරන්නාහ (දෙවියන් අතරැ උපදනාහ)"යි කියා වැඳ තමා කලින් සිටි තැන ම නැවැතුණේ ය.

4. එ කල්හි බුදුරජුහු භික්ෂූන් බණවා, 'මහණෙනි, තථාගතයන් ද භික්සඟන ද දකිනුවට බෙහෙවින් දස දහස් ලෝදැහි දෙවියෝ රැස් වූහ. පෙරැ සිටි ලොවුතුරා බුදුවරුන් සම්බන්ධයෙන් මෙ පමණ ම දෙවියෝ රැස් වූහ. මතු පහළ වන ලොවුතුරා බුදුවරුන් සම්බන්ධයෙන් ද මෙ පමණ ම දෙවියෝ රැස් වන්නාහ. මහණෙනි, තොපට මේ රැස් ව සිටින දෙව්මුළුවන් ගේ නම් කියන්නෙමි. එය අසවු. මොනොවට මෙනෙහි කරවු. කියන්නෙමි"යි වදාළහ. "එසේ යැ වහන්සැ"යි ම ඔහු බුදුරජුනට පිළිවදන් දුන්හ. බුදුරජුහු "මහණෙනි, දෙව්මුළුහු පැමිණියහ. ඔවුන් දැනගනිවු"යැ යි වදාළහ. ඒ මහණහු ද බුදුරජුන් හස්න අසා වැර වැඩූහ.

6. ඒ මහණුනට එයින් අමනුෂ්‍යයන් දක්නා නුවණ පහළ විය. ඇතැම් රහත්හු දෙව්බඹුන් සියයක් දුටුහ. සමහරු දහසක් ද, අන්හු කෙනෙක් සැත්තෑදහසක් ද, කෙනෙක් සියදහසක් ද දුටුහ. සමහරු පමණ නො කළ හැකි ගණන් දෙවියන් බඹුන් දුටුහ. හැම දික් දෙව්බඹුන් ගෙන් පැතිරැගෙන වැසී තිබිණ. බුදුරජුහු ඒ සියල්ල අභිඥා නුවණින් දැන වෙන් වෙන් කොට සලකා බලා, සව්වන් බණවා, "මහණෙනි, දෙව්මුළුහු පැමිණියහ. මා පිළිවෙළින් නම් විසින් තොපට පැවැසෙන ඔවුන් දැනගනිවු"යි වදරා, දේවසමූහයන් ගේ නම් සඳහන් කළහ:

---

316 පසැස්: මසැස, දිවැස, පැණැස, සමතැස (සියල්ලදක්නා නුවණ), බුදුඇස (සිවුසස් දක්නා නුවණ.) 317. පරමසත්‍යාවබෝධය ඇත්තවුනට කිසිදු දිශාක අවහිරයෙක් නැත.

2. කිඹුල්වත් නුවර වැසි, ඉදුමත් තෙදවත් යසස්වත් පැහැපත් සත්දහසක් යක්කු (බූමාටු දෙවියෝ) රහත් බික් සඟනා දක්නට ඒ වන පෙදෙසට ආහ. එබඳු ම තෙදබලැති හේමවත පර්වතයෙහි[318] වැසි සදහසක් යක්කු (බූමාටු දෙවියෝ) ද, **සාතගිර**[319] පවු වැසි තුන්දහසක් යක්කු (බූමාටු දෙවියෝ) ද, **වෙස්සාමිත්ත** පව්වැ වැසි පන්සියයක් යක්කු (බූමාටු දෙවියෝ) ද, රජගහනුවරැ **විපුලගිරි** වැසි යකුන් සියදහසකටත් වැඩි ගණනක් විසින් සෙවුනා ලබන **කුම්භීර** නම් යක්සෙනෙවි ද එහි පැමිණියහ.

3. පෙරදිගට අදිපති ගඳෙවුදෙවියනට රජ වූ **ධෘතරාෂ්ට්‍ර** මහරජ ද, ඔහු පුත් **ඉඳුරු** යන නම් ඇති මහ තෙදබලැති බොහෝ දෙවියෝ ද, දකුණු දිගට අදිපති, කොම්බුවනට (කුම්භාණ්ඩයනට) රජ වූ **විරූඪ** රජ හා ඉඳුරු යන නමැති ඔහු පුත් බොහෝ දෙවියෝ ද, පැසිම් දිගට අදිපති, දේව-නාගයනට අධිපති **විරූපාක්ෂ** දෙව්රජ හා ඉන්‍ද්‍ර යන නාමැති ඔහු පුත් බොහෝ දෙව්හු ද, උතුරුදිගට අදිපති, යකුනට රජ වූ **කුවේර** (වෙසවුණු) රජ හා ඉන්‍ද්‍ර නම් වූ ඔහු පුත් වූ බොහෝ දෙව්හු ද සතුටු වත්නාහු ඒ භික්ෂුසමිතියට පැමිණියහ. ඒ කිඹුල්වත් අසල වෙනෙහි පෙර දිගැ ධෘතරාෂ්ට්‍ර ද දකුණැ විරූඪක ද පැසිම්දිගැ විරූපාක්ෂ ද, උතුරැ කුවෙර ද යන සිවු වරම් රජුහු දිලියෙමින් මහවනයට අරක් ගෙන සිටියහ.

4. ඒ වරම්රජුන් ගේ දස වූ කපට ගති ඇති මායාකාර වූ **කුටෙණ්ඩු, වේටෙණ්ඩු, විටු, විටුඩ, චන්දන, කාමසෙට්ඨ, කින්නුඝණ්ඩු, නිඝණ්ඩු, පනාද, ඕපමඤ්ඤ** යන යක්හු ද, **මාතලී** දෙව්සැරි ද, **චිත්‍ර** ද **සේන** ද යන ගඳෙවු දෙ දෙනා ද, **නළකාර** දෙව් රජ ද, **පන්සිළු** ද, **තිම්බරු** ගඳෙවුරජ ද, ඔහු ගේ දූ වූ **සූරියවච්චසා**[320] දෙව්දූ ද, තවත් ගඳෙව්වෝ ද තමන් රජුන් හා භික්ෂුසමිතියට ආහ.

5. ඉක්බිති නාභස (අහස් වැසි) දිව්‍ය නාගයෝ ද විසල්පුරැ වැසි නාගයෝ ද, **කම්බල අස්සතර**[321] **පායාග නාගයෝ** ද[322] සිය නෑයන් හා ආහ. **යමුණා** වැසි නයි ද, ධෘතරාෂ්ට්‍ර

318. මේ හිමවත සමීපයේ වූ පර්වතයෙකි. 'හිමවතො සමීපෙ ඨිත-පබ්බතො' යනු ටීකා යි. 319. සියයක් ගිරීන් එක්වැ සැදුණු මහපව්ව සාතගිර නම් විය. 320. සුරියවච්ච යනු හිරුරැසි. එබඳු දීප්ති ඇත්තී සුරිය-වසා නම. මෝ භද්‍රා නමින් ද ප්‍රකට ය. 321. පායාග යනු ප්‍රයාගවාසීහු ය. 322. කම්බල අස්සතර නාගයෝ සුපේරුපාදයෝ වසත්ල. සුපර්ණයන් විසින් මැඩලියැ නො හැකි මහ තෙදැත්තෝ ල.

නාග කුලයට අයත් නයි ද, **ඓරාවන** මහානාගයා ද ආහ. නයින් ඇදගෙන යන **චිත්‍ර සුපණී** නම් දෙව්ගුරුළුවෝ ද ආහ. එදා නාරජුනට බියෙක් නො වී ය. බුදුරජුහු දෙව් ගුරුළුවන් ගෙන් ඔවුනට උවදුරු නො වන සැටියක් කළහ. නයින් ගුරුළුවෝත් මොළොක් බසින් උනුන් අමතන්නාහු බුදුරජුන් සරණ ගියහ.

6. විදුරත්හු (සක්දෙව්) විසින් දිනන ලද, මුහුදු වසන, ඔහු සොහොයුරු වූ, මහ තෙදබලැති **කාලකංජ දානවේඝස වෙපචිත්ති සුචිත්ති පහාරාද** යන අසුර රජුහු ද, **නමුචිහු** ද[323] ආහ. බලිඅසුරයා පුත් **වෛරෝච** නම් වූ සියක් අසුරයෝ ද, සිය සෙනඟ හා **රාහු** අසුරිඳු කරා ගොස් 'භික්සඟන දක්නට යන්නට කලැ'යි දැන්වූහ.

7. **අපෝදේව,**[324] **පඨවිදේව, තේජෝදේව, වායුදේව, වරුණ, වාරුණ, සෝම, යස** යන නම් ඇති දෙවිහු ද, **මෙත්තාකායික කරුණාකායික** දෙවිහු ද ආහ.

විෂ්ණු, සහලි, අසම යන දෙවිහු ද, **යම** නම් දෙවිහු දෙදෙනා ද, සඳු ඇසුරු කරන දෙවිහු ද,[325] හිරු ඇසුරු කරන දෙවිහු ද, නකත්තරු ඇසුරු කරන දෙවිහු ද මන්ද-වලාහක දෙවිහු[326] ද දෙව්නිකාවනට අදිපති දෙව්රජුන් පෙරටු කොට ආහ. සක්දෙව් රජ ද ආ යෑ.

8. **සහභූ, අරිට්ඨක, රෝජ, උම්මාපුප්ඵනිභාසි, වරුණ, සහධම්ම, අච්චුත, අනේජක, සූලෙය, රුචිර, වාසවනෙසි** යන දෙවිහු ද, **සමාන, මහාසමාන, මානුස, මානුසුත්තම, ඛිඩ්ඩාපදූසික, මනෝපදූසික, හරි, ලෝහිතවාසි, පාරග,**

---

323. මුහුදු වැසි අසුරන් හා මරදෙව්පුතු ද එක් ව ආයේ සමාන අදහස් ඇති බැවිනැයි අටුවාහි දැක්විණ. වේපචිත්ති අසුරයාගේ ප්‍රත්‍යෙක්ෂ නමුචි නමින් හැඳින්වේ. 324 ආපෝදේව යනු ආපෝකසිණභාවනා වඩා ඊළඟ අත්බැවැ සගෙහි උපන්නෝ ය තේජෝදේව ආදිහු ද මෙ අනුව නමින් දත යුතු. 325. පොළොවැ බුම්මාටු දෙවියනට අධිපති දේවතා මහීදේවතා යැ යි හැඳින්වෙන්නා සේ ම සඳමඬල හිරුමඬල නකත්තරු ඇසුරු කොට වසන දෙවියනට අදිපති දෙවිහු ද සඳ දෙව් හිරුදෙව නකත්දෙව් නමින් හැඳින්වෙති. විසුද්ධිමග්ග අටුවාහි සඳමඬල එකුන් පනස් යොත්තෙක, හිරුමඬල පනස්යොත්තෙකැ යි දැක්වුණ නෑන සඳමඬල හිරුමඬල යනු සඳමඬල නිසා පිහිටි හිරුමඬල නිසා පිහිටි සඳ දෙව්හු හිරුදෙව්හු විමන් ය යනු අප මතය යි. 326 වාතවලාහක අබ්භවලාහක උණ්හවලාහක යන තුන් වලාහක දෙවියෝ ම මන්දවලාහක නමින් දැක්වුණහ වලාකුළු ආධාර කොට වසන දෙව් වෙසෙසකි.

මහාපාරග යන දෙව්හු ද, **සූකක, කරුමහ, අරුණ, වෙඝනස, ඕදතගය්හ, විචක්ඛණ, සදමතත, හාරගජ, මිස්සක, පජ්ජනත**[326] යන දෙව්හු ද,

9. **ඛෙමිය, තුසිත, යාම, කඨක, ලම්බිතක, ලාමසෙට්ඨ, ජෝති, ආසව, නිම්මානරති, පරනිම්මිතවසවත්ති** යන දෙව්හු ද ආහ.

මෙසේ මේ **දශක** සයෙක (සැට වගයෙක) දෙවියෝ නන් පැහැසපු ඇත්තාහු, තමනට සමානයන් ද කැටුව, වැස නිමි ජන්ම ඇති (සසර ඉපැද්ම අවසන් කළ), (රාගද්වෙෂමෝහ නැමැති) උල් නැති, (කාම භව දෘෂ්ටි අවිද්‍යා යන) සතර ඕඝ තරණය කොට සිටි, ආස්‍රව නැති, කළුබව ඉක්මෑ (කෙලෙස් දුරලා) පුන්සඳු සෙයින් සිරියෙන් බබළන බුද්ධනාගයන් වහන්සේ **දක්**නමු' යි කියා මෙහි සඳහන් නම් පිළිවෙළ අනුව ඒ මහ වනයට ආහ.

10. **සුබ්‍රහ්ම පරමාත්ම** යන බුදුපුත් (ආර්යභූමියට පැමිණි) බඹහු ද, සනත්කුමාර බ්‍රහ්ම ද එහි ආහ.

සෙසු බඹුන් මැඩ සිටිනා මහබඹහු දහසක් දෙනා ද, ඔවුනට ඉසුරු වූ මහබඹහු දස දෙනෙක් ද ආහ. ඔවුන් මැද සියදහසක් බඹුන් පිරිවර කොටැති හාරිත මහ බඹ ද ආ ය.

11. සක්දෙව් ප්‍රධාන ව නික්මුණු ඒ සියලු දෙව්මුළු ද, හාරිත මහබඹ ප්‍රධාන ව නික්මුණු සියලු බඹ පිරිස ද වෙතට මරසෙන් එළැඹියේ ය. 'එවු, ගනිවු, බඳිවු. මේ සියලු දෙව්මුළුව රාගයෙන් බඳිනා ලද්දේ වේ වා. මොවුන් වටා පිරිවරවු. මොවුන් කිසිවකුත් නො මුදවු' යැ යි මර තෙම අතින් බිම පැහැර විදුලිය සහිත මහ වැස්සක් සේ බිහිසුණු හඬ පවත්වා, සිය සෙන් යැවී. එහෙත් දෙව් පිරිස තමා වසයට ගත නො හැකි වූයේ පසු බැස ගියේ ය.

12. බුදුරජ්හු ඒ සියල්ල දැන, සව්වන් අමතා, 'මහණෙනි, මරසෙනඟ ආ ය. තෙපි තමන් විසින් කළ යුතු දෑය දනිවු (පල සමවත් සමවදිවු)' යි වදාළහ. ඔහු ද බුද්ධානුශාසනය අසා, සමවත් සමවදනට තැත් කළහ. මරසෙන්හු කිසිත් කළ නො හැකි වූහු, වීතරාග ආර්යයන් කෙරෙන් ඉවත් ව ගියහ.

---

327 පජ්ජන්න යනු පර්ජන්‍ය යි පජ්ජුන්න යනු ප්‍රද්‍යුම්න යි. බොහෝ පොත්හි පජ්ජන්න යැ යි විය යුත්ත පජ්ජුන්න යැ යි ඇත්තේ ලිපිදෝෂයෙකි.

ඔවුන් ගේ ලෝමයකුදු සොලොවනු නො හැකි වූහ. මර තෙම එය සලකා, “මර යුද දිනූ, බිය ඉක්මි, යශස් ඇති, ජනයා අතර ප්‍රකට, ඒ සියලු බුදුසව්වෝ ආයසී දෙව්බඹුන් හා සතුටු වෙත්” යැ යි කී ය.[328]

[මෙහි කිඹුල්වතැ මහවෙනෙහි දෙව් බඹුන් රැස් වනු ද, ඔවුන් ගේ නම් ද, මරහු ගේ නිෂ්ඵල උත්සාහය ද, අරිසව්වනට මරහු කළ පැසැස්ම ද දැක්විණ]

21. සක්කපඤ්හ සූත්‍රය

එක් සමයෙක බගවත් බුදුරජ්හු මගද රටැ රජගහ පුරට පෙර දිගැ වූ අඹසඬු නියම්ගමැ[329] උතුරැ පැත්තේ වේදිය පව්වෙහි **ඉඳුසල්**ලෙනැ[330] වැඩ වෙසෙති.

2. එ සමයෙහි දිනෙක සක් දෙව්රජ පන්සිළු ගඳෙවුපුතු පෙරටු කොට ගෙන දෙව්පිරිසක් හා එහි ගියේ ය. ගොස් දෙරින් පිටතැ සිටැ පන්සිළුහු බුදුරජුන් වෙත යැවී ය. හේ ද තම බේළුවපාණ්ඩු වීණාව[331] අතැ ඇති වැ ගියේ, පසෙක සිටැ වෙණ වැයී ය. 'වන්දෙ තෙ පිතරං භද්දෙ' ඈ විසිත් බුදුරජුන් ද දහම් ද රහතුන් ද කම්සුව ද ඇරැබැ තමා ගොතා ගත් ගාපෙළක් ද ගැයී ය. බුදුරජුහු එයසා, 'තොප ගැයුම් වැයුම් එකක් අනෙක හා සැසැඳේ' යැ යි වදරා, 'තෙපි මේ ගාපෙළ කවරද ගෙතුහු දැ?' යි අසා වදාළහ.

328. මේ මහසමය සුත දෙවියනට ප්‍රිය මනාප යැ යි ද, මංගල වශයෙන් පිරිත් කියන්නහු විසින් අළුත් ඉඩම්හි මෙය ම කිය යුතු යැ යි ද, දෙවියෝ මෙය අසනු රිස්සෙන් කන් එළවා ඇවිදිති' යි ද මෙහි අටුවාහි සඳහන් වේ.
329. අම්බසණ්ඩා නිගමයෙහි. 330. ඉඳුසල්ලෙන (ඉන්ද්‍රශාලගුහා) - පර්වත දෙකක් අතරෙහි මෙ ගුහාව වී ය. එහි දෙරැ ඉඳුසල් රුකක් වූයෙන් ඉන්දසාලගුහා නම වී. බිත්ති කවුළු ආදිය සොද එය බුදුරජුනට පිදූහ.
331. බේළුවපාණ්ඩුවීණාව. මෙය කලින් වසවත් මරු සතු ව තුබුණේ ලු. 'බුදු වීමෙන් පසුත් වර්ෂයක් බුදුරජුන් ගේ සිදුරු සොයා නො දුටු මර තෙම ඒ වර්ෂය අවසන්හි බුදුරජුන් වෙත ගොස් සිය බලාපොරොත්තු කඩ වූ බව දක්වමින් නිබ්බේජනීය ගාථා කීයේ ය. කඩ වූ බලාපොරොත්තු ඇති ශෝක පීඩිත වූ ඔහුට තමාගේ බේළුව පාණ්ඩු වීණාව බිමැ වැටෙනු ද නො දැනුණේය. එය බිමැ වැටුණා දුටු ශක්‍ර තෙම එය ගෙන පංචසිඛයාට දුන්නේ යැ' යි සුත්‍රනිපාතවණ්ණනායෙහි දැක්විණ. මේ කතාව පරිදි පන්සිළුට මෙය ලැබුණේ බුදුරජුන් ගේ බුද්ධත්වයෙන් වසකට ද පසු ය. එ තෙක් එය තුබුණේ මරදෙව්පුත් වෙත ය. එහෙත් බෝසතුන් උපන් බුදු වූ සත දෙ දින ම පන්සිළුහු එය වැයූ බවක් ජාතකඨවණ්ණනාදියේ දැක්වෙයි. මේ විමැසියැ යුතු තැනෙකි.

3. 'වහන්ස, මේ මා ගෙතුයේ බගවතුන් වහන්සේ බුදු වූ නොබෝ කල්හි තිල්දලා නි තෙරැ අජපල්නුග රුක් මුලැ වැඩ වසන සමයෙහි ය. එ සමයෙහි මම් තිම්බරූ නම් ගඳෙවු රජුගේ දූ වූ භද්‍රා කන්‍යාව පාවාගනු රිසියෙම් වීමි. එහෙත් හි සිඛණ්ඩි නම් අන් දෙව්පුතක්හු කෙරේ පිළිබඳ සිතැත්තී වූ ය. එ කලැ මම් බෙළුවපඬු වෙණ සඳගෙන තිම්බරූ රජු වෙත එළැඹ ඒ ගා ගෙතා ගයා වෙණ වැයිමි. ඔහු දූ භද්‍රා එය අසා තමා බුදුරජුන් ගුණ අසා ඇත ද, ඔබ නො දුටු බව කිවු ය. එහෙත් ඔබ ගැන කරුණු කි බැවින් එදා තමා හා සමාගමයට අවසර ඇති බව් පැවැසූ ය. එ දින ඇය හා සමහම් ලදිමි. එයින් පසු තව ම ඇය හා සමහමක් නො ලදිමි'' යි පන්සිළු කී ය.

3. පන්සිළුහු බුදුරජුන් හා කතාව ඇරඹුවා ඇසූ සක්දෙව් ඔහු බණවා, තමා නමින් බුදුරජුන් නමදින සේ ඇණැවී ය. පන්සිළු ද 'දෙවියන් සහිත සක්දෙවිඳු බගවතුන් වහන්සේ වඳී යැ' යි කියා වැන්දේ ය. එවිට බුදුරජුහු ''පන්සිළුව, ඇමැති පිරිවර සහිත සක්දෙවිඳු සුවපත් වේ වා. දෙව් මිනිස් අසුර නා ගඳෙවු ඈ හැම සත්හු සුව කැමැත්තෝ ය. තථාගතවරු මෙ සක්දෙව් බඳු මහයසස් ඇතියන් ගේ වැඳුම පිළිගැනුම් විසින් මෙසේ වැඩුම්බස් කියති'' යි වදාළහ.

4. මෙයින් බුදුරජුන් හා කතාවට අවසර ලත් සක් දෙවිඳු සිය පිරිවර හා ඉඳුසල් ලෙන් පිවිසැ වැඳ පසෙක හිටියේ ය. එයින් පසු ඔබ අතර පහත දැක්වෙන කථාව පහළ විය.

බුදුරජුහු – බොහෝ කටයුතු ඇති ආයුෂ්මත් කෞශික-යන් ගේ[332] මෙහි ඊම අසිරි ය.

සක්දෙව් – වහන්ස, කලක් ම බගවතුන් වහන්සේ දක්නට එන අදහස ඇත්තෙම් වීමි. එහෙත් තව්තිසාහි දෙවියන් ගේ ඒ ඒ කටයුතු හෙයින් එන්නට අවසරයක් නො ලදුයෙම් මෙ තෙක් ඉයැ හැකි

332. කෝසිය (කෞශික) යනු ගෝත්‍ර වශයෙන් සක්දෙවිඳුට බැවහර වූ නමෙකි. වේදයෙහි ඉඳු නමින් දැක්වෙන්නේ බෞද්ධ පොත්හි දැක්වෙන සක්දෙව් නො වේ, රූපක කොට දැක්වුණු භූතශක්ති විශේෂයෙකි. බෞද්ධ පොත්හි එන ශක්‍රයා පුද්ගලයෙකි. දෙදෙනාට ම පොදු වූ ඉඳු නාමය ඇති බැවින් වෛදික ඉඳුයාට වැහැරවුණු බොහෝ නම් බෞද්ධ සක්දෙවිට ද බැවහරයෙහි ආයේ ය.

නො වීමි. වහන්ස, ඔබ සැවැතැ සරලාගාරක යෙහි[333] වැඩවසනා දවසෙක ඔබ දක්නට එහි ගියෙමි. එ වේලෙහි ඔබ එක් සමාදියෙකින් හුන්හ. වෙසුවුණු රජුහු පරිචාරිකා වූ භූඤ්ජතී දේවිදූ ඔබ ඉදිරියෙහි දෙහොත් මුදුනැ තබා වැඳ ගෙන සිටියා ය. මා නමින් ඔබ වඳනට ඈයට කීමි. 'ඔබ සමවතෙහි හුන් බැවින් ඒ ඔබ දක්නට වේලාව නො වේ යැ' යි ඕ කිවු ය. බගවතුන් වහන්සේ ඒ සමවතින් නැඟී සිටි පසු මා නමින් ඕ ඔබ වැන්දු ද? බගවතුන් වහන්සේ ඈය කී බස සිහි කරන සේක් ද?

4 **බුදුරජුහු** - දෙවිඳ, ඕ ඔබ නමින් මා වැන්දු ය. ඈය කී බස ද මතක ය. එතැනින් නික්මුණු ඔබ රියෙහි සක්හඬ අසන්නෙම් ම සමවතින් නැඟී සිටියෙමි.

සක්දෙව් - වහන්ස, 'ලොවුතුරා සම්මාසම්බුදු කෙනෙකුන් පහළ වූ කලැ සුර පිරිස වැඩෙතැ' යි 'අසුර පිරිස පිරිහෙතැ' යි අපට පෙරාතු ව තව්තිසාහි ඉපැදූ සිටි දෙවියන් කියනු ඇසීමි. එය සබා යැ යි සියැසින් දැක දනිමි. වහන්ස, කිඹුල්වත් පුරැ තෙරුවන්හි පහන් සිල්වත් **ගෝපිකා** නම් සැහැදුවක් වූ ය. ඕ පිරිමි වැ උපදිනුවට රිසිය වඩා කාබුත් මරණින් මතු මා පුත් ව ඉපැද **ගෝපක** දෙව්පුත් නමින් පළට වැ වෙසෙයි. බගවතුන් වහන්සේ වෙතැ වූ තවත් තුන් පැවිදිතැන් කෙනෙක් සිය රිසිය පරිදි ගඳෙවු නකාහි[334] ඉපැද මට උවටනට එත්. ගෝපක දෙව්පුත් ඔවුන් දැක, 'බගවතුන් වහන්සේ වෙත බඹසර රැකා මෙ සේ හීන ගඳෙවු නකායෙක උපන් සේ නොසරි යැ' යි කී ය. එය ඇසූ දෙදෙනෙක් පළමු රූදහන් වඩා එය පාදක කොට විවසුන් වඩා අනගැමි වැ එ කෙනෙහි සැව බඹපෙරෙවි දෙවියන් අතුරැ ඉපැද විශේෂාධිගම ලදහ. අනෙකා ගඳෙවුනකා

333. ජේතවනයෙහි ම හොරලිනයෙන් තැනුණු කුටියෙක් විය. එය සරලාගාරක නමින් හැඳින්විණ 334. මොහු මිනිස් වත්හට පෙර ද ගඳෙවු දෙව් නකාහි ඉපැද උන්හෝ ය. පෙර අත්බැවැ වුත් සුවෙහි ලොල් වූහු දහන් උපදවා ද ගඳෙවු දෙවියන් අතරැ උපන්හ.

කෙරෙහි ඇලුම් හරනට නො පොහොසත් වූයේ එහි ම රැඳිණ. වහන්ස, එහි දෙදෙනෙක් බඹපෙරෙවි ලොවැ ඉපිද වෙසෙසි මහ පල ලදහු ද, මම් ද එය ලබනු රිසියෙමි. ඔබෙන් අවසර ලදෙත් ඒ විචාරන්නෙමි.

5. **බුදුරජුහු** – දෙවිඳ, තමාට රිසියෙන පැණක් විචාරන්න, එය විසඳ පැහැදිලි කරන්නෙමි.

[මහපැණ තුදුස]

සක්දෙව් – වහන්ස, සත්හු සතුරු උවදුරු නැති ව වසන රිස්සහ. එහෙත් සතුරු උවදුරු ඇති ව ම වෙසෙත්. කවර හෙයින් මෙය මෙසේ වෙයි ද?[335]

බුදුරජුහු – දෙවිඳුනි, ඉරිසියාව ද මසුරු බව ද යන දෙකින් බැඳුණු බැවින් සතුරු උවදුරු ඇ වෙයි.[336]

සක්දෙව් – එසේ ය, වහන්ස. මෙහි මගේ සැක දුරු විය. වහන්ස, ඉරිසියාව ද මසුරු බව ද යන දෙකට කිමෙක් නිදන් වෙයි ද? කුමක් ඇති කලැ ඒ පහළ වෙයි ද? කුමක් නැති කලැ එය පහ වෙයි ද?

---

335. දන් දී පූජා කොට මතු සතුරන් ගෙන් උපද්‍රවාදියක් නැති ව රිසි සේ සම්පත් අනුභව කරම්හ යි ප්‍රාර්ථනා කළාහු ද සතුරු උපද්‍රවාදිය ඇත්තෝ වන්නාහ. එයට හේතුව කවරේ ද? යනු මෙහි අදහස යි. 336. දන් දී පුද පූජා කොට 'සතුරු උවදුරු නැති ව සැප විඳින්නට හැකි වෙම් වා' යි පැතුව ද ඉරිසියාවත් මසුරු බවත් ඇතියනට පරලොව දී සැප හා ම සතුරු වියවුල් ද වෙයි. වසන ඉඩමට මසුරු වූයේ මරණින් මතු යක් ව හෝ ප්‍රේත ව කසල හිසින් උසුලමින් හැසිරෙයි. කුලයෙහි මසුරු බැවින්, කුලයෙහි (ගෙහි) ඇති දූ වියදම් කිරීමෙන් කුලය පිරිහෙතැ යි නැවෙන්නහුට ලේ වමනා අතිසාර පවා ඇති වේ. ලාභයෙහි මසුරු බැවින් සඟ සතු දූ, ගණයා සතු දූ තමා ම තනි අයිතිය ඇත්තක්හු සේ පරිභෝග කොට යක් වැ ප්‍රේත වැ පිඹුරු වැ හෝ උපදිත්. ශරීරශෝභාව නිසා ලැබෙන පැසැසුමට මසුරු බව් හේතුයෙන් ද, අනුන්ගේ ශෝභාදියට පිරිහෙලීමෙන් ද ධර්මමාත්සර්යයෙන් ද පර ලොව්හි දී දුර්වර්ණ ද කෙලෙතොලු ද වෙත්. ආවාසමාත්සර්යයෙන් නිරයේ ලොහො ගෙහි පැසෙත්. කුලයෙහි මසුරු බැවින් අල්පලාභ වෙත්. ලාභමාත්සර්යයෙන් ගූථනිරයෙහි උපදිත් කීර්තිමාත්සර්යයෙන් සසරැ කිත් පැසැසුම් නො ලබත්. ධර්මමාත්සර්යයෙන් ගිනිඅඟුරුනිරයේ ද උපදිත්. ඊර්ෂ්‍යා මාත්සර්ය සංයෝජන දෙක නැසෙන්නේ සෝවාන් මඟිනි. ඒ තාක් සතුරන් නැත්තෙම් වෙම් වා යි පැතුව ද සතුරන් ඇති වීම් ආදියෙන් නො මිදෙත්.

බුදුරජුහු – ප්‍රියයන් අප්‍රියයන් හේතු කොට ගෙන ඉරිසියාවත් මසුරත් දෙක ම වෙයි. ප්‍රිය අප්‍රිය කියා කෙනෙකුත් නැති කලැ ඉරිසියාව හෝ මසුර නො පහළ වේ.[337]

6\. **සක්දෙව්** – සතුන් හෝ වතු පිටි ඈ දූ ප්‍රිය හෝ අප්‍රිය වනුයේ කවර හෙයින් ද? ප්‍රිය අප්‍රිය යන්න කුමක් නැති කලැ නො මැති වේ ද?

බුදුරජුහු – ඡන්ද හේතුයෙන් ප්‍රිය අප්‍රිය දෙක ඇති වේ. ඡන්දය නැත හොත් ප්‍රියයැ යි අප්‍රියයැ යි එකෙක් නැත.[338]

සක්දෙව් – ඡන්දය කවර හෙයින් පහළ වේ ද? කෙසේ එය නැති වේ ද?

බුදුරජුහු – විනිශ්චයවිතර්කහේතුයෙන්[339] ඡන්දය උපදී. විනිශ්චයවිතර්කය නැති කලැ ඡන්දය ද නැත.

සක්දෙව් – විනිශ්චයවිතර්කයට හේතු කවර යැ? එය කෙසේ නැති වේ ද?

බුදුරජුහු – තෘෂ්ණා ප්‍රපංච සම්ප්‍රයුක්ත සංඥ කොටස්හු[340] විනිශ්චය විතර්කයට හේතු වෙත්. ඔවුන් නැති කලැ විනිශ්චයවිතර්කය ද නැත.

337\. තමාට ප්‍රිය වූ අය දක්නට නැති කලැ එය ඉවැසිය නො හැක්ක අන් අය ඔවුන් ඇසුරු කරනු හෝ ඔවුන් තමන් වෙතට ගනු හෝ අසන දකින විට ඊර්ෂ්‍යාව උපදී. තමාට ප්‍රිය දූයක් හෝ පුගුලකු අනුන් ඉල්ලුවොත් නො දී මසුරු කරයි. තමහට අප්‍රිය දූ හෝ පුගුලන් නුමුදු අනුනට ලැබෙනු නො ඉවසන්. තමහට එවැන්න අප්‍රිය වුවත් අනුනට දීමෙහි මසුරු වේ. 338. ඡන්දය නම් තෘෂ්ණාමාත්‍රය යි. ඒ පරියේසන ඡන්දය (රූපාදිය සෙවීමේ ආශාව), පටිලාභඡන්දය (රූපාදිය ලැබැ ගැන්මේ ආශාව) පරිභෝග ඡන්දය (රූපාදිය බුත්හි විඳීමේ ආශාව), සන්නිධිඡන්දය (රැස් කොට තබාගැන්මේ ආශාව), විස්සජ්ජන ඡන්දය (තමා අරක්ගන්වනු හෝ පිරිවරනු පිණිස අන්‍යයනට ධනය දීමේ ආශාව) යැ යි පස් වැදෑරුම් 339 'මෙ නම් රූපයාගේ අගය මෙ පමණ වේ. මට අයත් කොටස මෙ පමණ ය. අන්හට අයත් කොටස මෙ පමණ ය. මෙ තෙක් හිඳ න් කරමි, මෙතෙක් පරහට දෙමි' යි බෙද බෙදා කල්පනා කිරීම විනිශ්චය විතර්කය යි මේය ඡන්දයට-තණ්හාවට-හේතු යි. 340 එක්සියඅට වැදෑරුම් තෘෂ්ණාවිනිශ්චය තෘෂ්ණාවිචාරය මෙහි තෘෂ්ණාප්‍රපංච නම්. එය සත්ත්වයා මත්බවට ප්‍රමාදයට පමුණුවන හෙයින් ප්‍රපංච නම්. ප්‍රපංච නම් ප්‍රමාදය යි. ඉටු අනිටු වශයෙන් තෘෂ්ණාව පෙර දූරි කොට ඇති විනිශ්චයය-බෙදීම තෘෂ්ණා විචාරය යි. තෘෂ්ණා ප්‍රපංචය හා එක්ව සෙදුණු සංඥ කොටඨාසයෝ මෙහි අභිප්‍රෙතයහ.

7. **සක්දෙව්** – කෙසේ පිළිපන් මහණ තෙම තෘෂ්ණාප්‍රපංච සංඥ කොටසුන් ගේ නිරෝධයට සමත් වේ ද? ඒ මඟට බටුයේ වෙයි ද ?

බුදුරජුහු – සොම්නස් දෙම්නස් උපේක්ෂා යන එකි එකී වේදනාවෙක් සෙවියැ යුතු නොසෙවියැ යුතු විසින් දෙවැදෑරුම් වෙයි. එයින් සෙවියැ යුතු වේදනා කුසල්පස වැඩෙනුවට හේතු යැ. නොසෙවියැ යුතු වේදනා අකුසල්පස වැඩෙනුවට හේතු වෙයි. සවිතකීසවිචාර වේදනාවනට වඩා අවිතකී අවිචාර වේදනා ප්‍රණීත ය. මෙහි සෙවියැ යුතු වේදනා සෙවුනා මහණ තෙම තෘෂ්ණාප්‍රපංච කොටසුන් ගේ නිරෝධයට පමුණුවන මඟට බටුයෙක් වේ.

8. **සක්දෙව්** – වහන්ස, එසේ ය. දැන් මෙ කරුණෙහි මා තුළැ වූ සැක දුරු විය.[341] වහන්ස, කෙසේ පිළිපන් මහණ තෙම පාතිමොක්ඛසංවරය පිණිස බටුයේ නම් වේ ද ?

බුදුරජුහු – දෙවිඳුනි, කායසමාචාර වාක්සමාචාර යන එක එකෙක් සෙවියැ යුතු නො සෙවියැ යුතු විසින් දෙවැදෑරුම්. කායික හෝ වාචසික වූ යම් සමාචාරයක් සෙවුනාහට අකුසල් පිරිහේ නම්, කුසල් වැඩේ නම්, එය සෙවියැ යුතු. යමක් සෙවුනා හට අකුසල් වැඩේ නම්, කුසල් පිරිහේ නම්, එය නො සෙවිය යුතු. පර්යේෂණය ද සෙවියැ යුතු නො සෙවිය යුතු විසින් දෙවැ-දෑරුම්. යමෙකින් අකුසල්පිරිහේ නම්, කුසල් වැඩේ නම්, එය සෙවියැ යුතු. යමක් සෙවු-නාහු ගේ කුසල් පිරිහේ නම්, අකුසල් වැඩේ

---

341. භාග්‍යවතුන් වහන්සේ රහත්බව කුළුගන්වා දේශනාව කළ සේක. සක්දෙව් මෙයසා සෝවාන් වී ය. ආයු පිරිහී ගිය බැවින් එ කෙණෙහි භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේදී ම ගේ ච්‍යුත ව අළුත් ශක්‍රාත්මභාවයක් ඇති ව උපන්නේ ය. මළා වූ දෙවියන් ගේ ශරීරය අතුරු දන් වනු බැවින් එහි හුන් අන් දෙවියෝ ඔහු මළ බව නොදත් හ. ඔහු මැරි උපන් බව දත්තෝ ශේත් භාග්‍යවතුන් වහන්සේත් ම ය.

නම්, ඒ පිරියෙස්ම නො කළ යුතු.[342] මෙසේ පිළිපන් මහණ පාතිමොක්ඛසංවරය පිණිස පිළිපන්නේ වේ.

සක්දෙව් – නිදුකාණනි, මෙහි ලා මගේ සැක දුරු විය. කෙසේ පිළිපන් මහණ ඉන්ද්‍රියසංවරය පිණිස බටුයේ නම් වේ ද ?

බුදුරජුහු – දෙව්රුනි, රූ සද ගඳ රහ පහස දහම් යන අරමුණු සය එක එකක් සෙවියැ යුතු නොසෙවියැ යුතු විසින් දෙවදෑරුම් වේ.

සක්දෙව් – වහන්ස, 'රූ සද ගඳ රස පහස දහම් යන මේ යම් කිසි අරමුණක් සෙවුනාහට කුසල් පිරිහේ නම්, අකුසල් වැඩේ නම් ඒ අරමුණ සෙවියැ යුතු යැ'[343] යි ඔබ සැකෙවින් වදළ වචනයේ අදහස මට මෙසේ වැටහේ. වහන්ස, මෙසේ ඔබ පැණවිසැඳුම ඇසීමෙන් මෙහි මගේ සැක දුරු විය.

9. නිදුකාණන් වහන්ස, සියලු මහණබමුණෝ එක ම වාදයක් එක ම ආචාරයක් එක ම ලබ්ධියක් එක ම නිෂ්ඨාවක් ඇත්තෝ ද ?

බුදුරජුහු – දෙව්රුනි, සියලු මහණ බමුණෝ එක ම වාදයක් (එක ම දෘෂ්ටියක්) .... එක ම නිෂ්ඨාවක් ඇත්තෝ නො වෙති.

---

342. සෙවියැ යුතු කායසමාචාරාදිය දක්වනු විසින් පාතිමොක්ඛසංවරය මෙහි දක්විණ. මේ ශීලකථාව සම්පථ විසින් ද ප්‍රඥප්ති විසින් ද කියැ යුතු ය සම්පථ විසින් කියන්නහු විසින් නො සෙවියැයුතු කාය සමාචාරය ප්‍රාණඝාත අදත්තාදානාදි විසින් කියැ යුතු. ප්‍රඥප්ති වශයෙන් කියන්නහු විසින් කාදෙරු පැණැවූ සිකපද ඉක්මීම් විසින් කියැ යුතු. වාක් සමාචාරය ද මුසවා ඈ දුසිරිත් නො සෙවිය යුතු. සම්පථ වශයෙන් ද වාදෙරු පැණවූ සිකපද ඉක්මෙනු ප්‍රඥප්තිව්‍යතික්‍රමණ වශයෙන් දත යුතු පිරියෙසුම් (පර්‍යේෂණ) කායවාක් දෙකින් ම ය. මෙය කායචාර වාක් චාර දෙකින් සරත ද ම ය. එහෙත් ආජීවට්ඨමකසීලය දක්වනු පිණිස එය වෙන ම කියන ලදි. 343. රාගාදිය ඉපදීමට හේතු වන රූප ශබ්දාදිය සේවනය නො කට යුතු යි. එහෙත් අසත්පුරුෂයාට ශ්‍රද්ධාව සසර කලකිරීම් ආදි කුශල පක්ෂය ඇති වීමට හේතු වන දිය අද්දා දුසීන්ගේ ගීතිකා වුව ද ඇසිය යුතු යි. එහි දෙසෙක් නැති. යම් රසයක් සෙවුනාහට ආහාරයෙහි පිළිකුල ඇති වේ නම් ශරීරශක්තිය ලැබීමෙන් විවසුන් වඩන්නට ප්‍රත්‍යය වේ නම් එබඳු රසය සෙවිය යුතු යි

සක්දෙව් – නිදුකාණනි, කවර හෙයින් ඔහු එක ම වාදයක් . ... එක ම නිෂ්ඨාවක් ඇත්තෝ නො වෙත් ද?

බුදුරජුහු – දෙවිඳුනි, ලොව නොයෙක් අදහස් නත් අදහස් ඇත්තේ ය. එසේ වූ ලොවැ සත්හු තම තමන් ගත් අදහස්හි ම දැඩි ලෙස එල්බැ ගෙන 'මෙය ම ඇත්ත ය, සෙස්ස හිස් යැ' යි වහරවත්. එහෙයින් සියලු මහණබමුණෝ එක ම වාදයක් .... එක ම නිෂ්ඨාවක් ඇත්තෝ නො වෙති.

10. **සක්දෙව්** – නිදුකාණනි, සියලු ම මහණබමුණෝ අත්‍යන්ත නිෂ්ඨාව (පරම අස්වැසිල්ල), යෝගක්ෂේමය (නිවන) ඇත්තෝ ද? නිවන් පිණිස ආයර්‍යමාර්ගයෙන් යන්නෝ ද? අත්‍යන්තය (නිවන) කෙළවර කොටැත්තෝ ද?

බුදුරජුහු – දෙවිඳුනි, සියලු මහණබමුණෝ අත්‍යන්තනිෂ්ඨාව ඇත්තෝ නො වෙති.........අත්‍යන්තය (නිවන) කෙළවර කොටැත්තෝ නො වෙති.

සක්දෙව් – නිදුකාණනි, කවර හෙයින් මහණබමුණෝ අත්‍යන්ත නිෂ්ඨාව ඇත්තෝ නො වෙත් ද? .... අත්‍යන්තය (නිවන) කෙළවර කොට ඇත්තෝ නො වෙත් ද?

බුදුරජුහු – දෙවිඳුනි, තෘෂ්ණාව නසන මඟින් ගොස්, මිදුණු (නොහොත් නිවන් අරමුණු කොට කෙලෙසුන් ගෙන් මිදුණු) මහණබමුණෝ ම අත්‍යන්තනිෂ්ඨාව ඇත්තෝ වෙති. ....අත්‍යන්තය (නිවන) කෙළවර කොට ඇත්තෝ වෙති.[344]

සක්දෙව් – එසේ ය වහන්ස, මෙහි මගේ සැක දුරු විය වහන්ස, තෘෂ්ණාව ලෙඩෙකි, ගඬෙකි, හුලෙකි. තෘෂ්ණාව සතුන් ඒ ඒ භවයට තල්ලු කෙරෙයි.

---

344. මෙහි තුදුස් ප්‍රශ්න කෙනෙකි- 1. ඊර්ෂ්‍යාමාත්සර්‍ය, 2. ප්‍රියාප්‍රිය, 3. ඡන්ද, 4 විතර්ක, 5. ප්‍රපංච, 6. සෞමනස්‍ය, 7. දෞර්මනස්‍ය 8. උපේක්ෂා, 9. කායසමාචාර, 10. වාක් සමාචාර, 11. පර්යේෂණ, 12. ඉන්ද්‍රියසංවර 13. අනෙකධාතුසංවර, 14. අත්‍යන්තනිෂ්ඨා යන එක එකක් ගැන ඇසූ ප්‍රශ්න යි.

මේ තෘෂ්ණා හේතුයෙන් සත්ත්වයෝ උස් ද පහත් ද වෙත්. වහන්ස, අන් මහණුන් බමුණන් අතින් විචාරන්නට අවකාශයකුත් නොලත් ප්‍රශ්න භාග්‍යවතුන් වහන්සේ විසඳ වදාළ සේක. මා තුළැ වූ සැක නැමැති උල භාග්‍යවතුන් වහන්සේ උදුරා ලූ සේක.

බුදුරජුහු – දෙවිඳුනි, මෙ ප්‍රශ්න තෙපි අන් මහණ බමුණනුත් විචාළහු ද?

සක්දෙව් – විචාළෙමි වහන්ස,

බුදුරජුහු – ඔහු කෙසේ ඒ විසඳූ ද? එය කිම තොපට බරෙක් නො වේ නම් කියවූ.

සක්දෙව් – භාග්‍යවතුන් වහන්සේ හෝ අන් එබන්දකු ඉන්නා තැනෙක එය කීම මට බරෙක් නො වේ. වහන්ස, වනවාසී තවුසන් වෙත් ගොස් ඒ පැණ විචාළෙමි. ඔහු ඒ තේරුම් නො ගෙන 'ඔබ කවුරු ද?' යි මා පුළුවුසිත්. මා සක්දෙව් බව කී විට දෙව්රජ බව ලබන්නට මා කළ කම් විචාරති. එවිට ඔවුනට මා ඇසූ පරිදි පුහුණු කළ පරිදි දම්[345] දෙසමි. ඔහු 'සක්දෙව් දුටුමු. අප විචාළ දෑ හේ විසැඳී යැ' යි මෙ පමණෙකින් සතුටු වෙත්. මා ඔවුන් ගේ ශ්‍රාවක විය යුතු තැන, ඔහු මගේ ම ශ්‍රාවකයෝ වෙති. වහන්ස, මම් වනාහි දූන් සෝවාන් වූ බුදුසව්වෙකිමි.

බුදුරජුහු – දෙවිඳුනි, අද පත් සතුට වැනි සතුටකට තොප පෙර පැමිණියා ඇද් ද?

සක්දෙව් – එසේ ය, වහන්ස.

බුදුරජුහු – එ කෙසේ ද?

---

345. එ නම් සප්ත ව්‍රතපද යි.

මපියන් පෝෂිත කිරීම, පවුලේ වැඩිමහල්ලනට සටත් පැවැත්ම, මෘදු වචන කීම, කේලාම් නො කීම, දානපති බව, සත්‍යවාදී බව, ක්‍රෝධ නො කිරීම

යන සත සප්ත ව්‍රතපද නම්. මෙ සමාදන් ව ගෙන වැස ඉන් මරණින් මතු ශක්‍රත්වය ලැබී.

සක්දෙව් - වහන්ස, පෙර දේවාසුර සංග්‍රාමයෙහිදී අසුර-සෙන් පරදවා ජය ගත්[345] මට මහත් සතුටෙක් වී ය. එහෙත් එය අවි ගෙන හැසිරීම් සහිත ව පවත්නා සතුටෙකි. නිවන පිණිස නො පවත්නෙකි. භාග්‍යවතුන් වහන්සේ ගෙන් දහම් අසා මා ලත් සතුට නම් දණ්ඩ ශස්ත්‍ර ගෙන හැසිරීමක් නැති, නිවන පිණිස ම පවත්නෙකි.

බුදුරජහු - දෙවිඳුනි, කවර කරුණක් දැක තෙපි මෙසේ සතුටු වහු ද?

සක්දෙව් - වහන්ස, කරුණු සයක් දකිමින් සතුටු වෙමි. ඒ කරුණු සය නම්:

මෙහි දැන් ඔබ ඉදිරියෙහිදී ම සැව එ කෙණෙහි ම යළිත් සක්දෙව් ව මා උපන්බව,

මෙසින් මරණින් මතු සුගතියෙක නො මුළා ව උපදින බව,

එසේ මිනිසත් බව ලද කල ආනන්තර්‍ය්‍ය කර්මාදි අකාරණ-යෙන් වෙන් ව සිහි නුවණින් වසන බව,

එසේ සමචර්‍ය්‍යායෙන් කල් යවන මා සකෘදාගාමී වුවොත් යළි මිනිස්ලොවැ නො උපදනා බව,

එයින් සැව මෙහි ම දැනටත් වඩා උතුම් සක්දෙව් රජක්හු වන බව,

එ කලැ දෙව්ලෝහිදී අනාගාමී ව ඉන් සැව ශුද්ධාවාස බඹලොවැ උපදනා බව-

යනු ඒ කරුණු සය යි. මෙ කරුණු දක්නා මම් මෙසේ මා ලත් මහත් සතුට දන්වමි.

සක්දෙව් තමා ගේ සතුට පවසනුයේ ගාථා නවයෙකිනුත් එය දක්වා දෙව්පිරිස හා තමා ඒතාක් ඇදහූ බ්‍රහ්මසමය හැර බුදුරජුන් සරණ ගිය බව දක්වා පැසැසී ය. ඉක්බිති

345. දේවාසුර සංග්‍රාමය. කිසි කලෙක මහ මුද මත්තෙහි දෙවියන්-ගේත් අසුරයන්ගේත් යුද්ධය වේ. එහිද කැපුම් කොටුම් ආදි වශයෙන් අන්‍යෝන්‍ය ඝාතකයෙක් නැත. හුදෙක් දරුමෙණ්ඩක යුද්ධයෙන් ලමුවා එළරුකඩ දෙකක් පොර අන්වා ලබන දිනුම් පැරදුම් පමණි.

පන්සිළු අමතා, බුදුරජුන් හා කථාවට ඔහු තමහට අවකාශ ලබා දෙවූ කාරණයෙන් ඔහු තම පිය තනතුරෙහි ද ගඳෙව්-වන්ගේ රජ තනතුරෙහි ද පිහිටුවා, ඔහු පැතූ භද්‍රාව ලබා දෙන බව ද පැවැසී ය.

ඉක්බිති දෙවිඳු බිම් අල්ලා,

'නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස' යි[346] කියා තෙවරක් උදන් ඇනී ය.

බුදුරජුන් මේ පැණ විසඳීම් විසින් දෙසූ දහම් අසා සක්දෙව් සෝවාන් වී ය. අන් අසූදහසක් පමණ දෙවියෝ ද මඟපල ලත්හ.

[මෙහි සක්දෙව් පන්සිළු දෙව්පුතු යවා බුදුරජුන් හා කථාවට ඉඩ ගැනීම, පන්සිළු බුදුරජුන් ඉදිරියේ ගී ගයමින් වෙණ වැයීම, බුදුරජුන් ඔහු ගේ ගායනවාදනයෙහි සම්මිතාව වදාරා, ඒ ගී කවදා ගෙත් දැ' යි ඇසීම, පන්සිළු එහි පවත් කීම, මෙතිදී කථාවට අවසරලත් සක්දෙව් බුදුරජුන් හා කථාසංලාපයට වැසීම, දෙව්පුතකු ව උපන් ගෝපිකාව ගේ පුවත, හීනගන්ධර්ව නිකායයේ උපන් තුන් භික්ෂූන් ගේ පුවත, සක්දෙව්හු ගේ ප්‍රශ්න, බුදුරජුන් ඒ විසැඳීම, සෝවාන් වූ සක්දෙව් සිය සතුට පැවැසීම, පංචසිඛයාගේ යශෝලාභය, ශක්‍රාදි දෙවියන් ගේ අධිගමලාභය යන මෙතෙක් දෑ දැක්විණ.]

---

22. මහාසතිපට්ඨාන සූත්‍රය

එක් සමයෙක බගවත් බුදුරජුහු කුරුරටැ **කම්මාසදම්ම**[347] නම් නියම්ගමැ වැඩ වෙසෙති. එහි දී 'මහණෙනි'යි මහණුන් ඇමැතූහ. 'වහන්සේ'යි ඔහු පිළිවදන් ඇස්සූහ. බුදුරජුහු මෙය වදාළහ:

2. මහණෙනි, සතුන් ගේ පිරිසිදුව පිණිස, සෝ හැඬුම් වැලැපුම් ඉක්මෙනු පිණිස, දුක්දොම්නසුන් වැනැස්ම පිණිස,

---

346. 'ඒ භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේ වා' යනු අර්ථ යි. 347 බොහෝ පෙර අපබෝසතාණෝ මෙහි දී කම්මාසපාදයා (පෝරිසාදයා) දමනය කළහ. එහෙයින් මෙය කම්මාසදම්ම නම් විය.

අරි අටැඟි මඟට බැසගනු පිණිස, නිවන් පසක් කරනු පිණිස මේ එක ම මඟ[348] වෙයි. එ නම් සතර සිවටන්හු ය.[349] ඒ සතර කවරහ? යත්:

මෙහි මහණ කෙලෙස් තවන වැර ඇත්තේ, නුවණින් දන්නේ, සිහි ඇත්තේ, මේ රූ කය කෙරෙහි අනුරෝධ විරෝධ දෙක (ඇල්ම හා ද්වේෂය) සංහිඳුවා කායානුපස්සී වැ (කය අනුව බලනුයේ) වෙසෙයි. වේදනාවන්හි......වේදනානුපස්සී වැ, සිතෙහි....චිත්තානුපස්සී වැ ....දහම්හි ධම්මානුපස්සී වැ වෙසෙයි. [මෙසේ මෙහි දැක්වුණු කායානුපස්සනා වේදනානුපස්සනා චිත්තානුපස්සනා ධම්මානුපස්සනා යන මොහු සතර සිවටන්හු ය.]

කායානුපස්සනාව

3. මහණ තෙම කෙසේ කයෙහි කායානුපස්සී වැ වෙසේ ද?

(ආනාපාන පබ්බය)

මෙහි මහණ වනයකට හෝ රුක්මුලකට හෝ ශූන්‍යාගාරයකට ගියේ පළක් බැඳ උඩුකය කෙළින් සිටුවා, සිහිය අරමුණට අභිමුඛ කොට එළවා හිඳී. හේ සිහි ඇති ව ම හුස්ම ගනී, හුස්ම පිටත් කෙරෙයි. දික්හුස්මක් හෝ ගනුයේ දික් හුස්මක් ගනිමියි ද, පිට කරනුයේ දික්හුස්මක් පිටත් කෙරෙමි යි ද, ලුහුඬු හුස්මක් හෝ ගනුයේ ලුහුඬු හුස්මක් ගනිමි'යි ද පිට කරනුයේ පිට කරමි යි ද නුවණින් දනී.

---

348. මේ පූර්වභාගප්‍රතිපත්තිය යි ආර්‍ය්‍යමාර්ගය නො වේ. මෙය පිළිපැදීමෙන් ආර්‍ය්‍යමාර්ගයට බැසෙයි. 349. සිවටන්හු = සතිපට්ඨානයෝ. විපස්සනා අරමුණෙහි පිහිටු වූ සිහිය ම සතිපට්ඨාන නම. එය කාය වේදනා චිත්ත ධම්ම යන අරමුණු සතර දෙනා ගේ වශයෙන් සිවුවැදෑරුම් වේ. කවර හෙයින් මෙසේ සතර දෙනෙක් වෙත් ද? මන්දතණ්හාචරිතයාට ඕලාරික වූ කායානුපස්සනාව සුදුසු වෙයි තියුණු තණ්හාචරිතයාට සියුම් වූ වේදනානුපස්සනාව ද, මන්දදිට්ඨිචරිතයාට අතිප්‍රභේදරහිත චිත්තානුපස්සනාවද, තියුණු දිට්ඨිචරිතයාට අතිප්‍රභේදවත් වූ ධම්මානුපස්සනාව ද යි අනුපස්සනා සතරෙක් විය සුභ සුඛ නිච්ච අත්ත විසින් විපල්ලාස සතරෙකි. එයින් සුභ විපල්ලාසය දුරලනුවට අසුභභාවය දක්වන කායානුපස්සනාව පළමුවෙන් දක්විණ. ඊළඟට සුඛවිපල්ලාසය දුරලනුවට දුක්ඛවී ඇ දක්වන වේදනානුපස්සනාව ද, ඊළඟට නිච්චවිපල්ලාසය දුරලනුවට චිත්තානුපස්සනාව ද අත්තවිපල්ලාසය දුරලනුවට ධම්මානුපස්සනාව ද දක්විණ.

සියලු හුස්ම-කය මුල මැද අග යන හැම තැන් ම නුවණින් වටහා ගනුයේ, හුස්ම ගන්නෙමි යි ද, හුස්ම පිට කරන්නෙමි යි ද දැන එය පුරුදු කෙරෙයි. ගන්නා හෝ පිට කරන ඖලාරික වූ හුස්ම සංහිඳුවනුයේ මෙසේ වූ හුස්මක් ගන්නෙමි යි ද පිට කරන්නෙමි යි ද දැන පුරුදු කෙරෙයි.

සමත් ලියනවඩුවකු හෝ ඔහු අතැවැස්සකු හෝ (බෙර ඈ දික් මහත් බඩු) ලියන්නහු (අත් පා ඈ) දිගු කොට අදනහු 'දික්කොට අදනෙමි' යි ද, ලුහු කොට අදනහු 'ලුහු කොට අදනෙමි' යි ද දන්නාක් මෙන්, කායානුපස්සී මහණ තෙම දික් කොට හුස්ම ගනුයේ ද පිට කරනුයේ ද, මෙසේ හුස්ම ගනිමි යි පිට කරමි යි දනී. සියලු හුස්මැ මුල මැද අග නුවණින් වටහා ගනුයේ හුස්ම ගන්නෙමි යි ද හුස්ම පිට කරන්නෙමි යි ද දැන පුරුදු කෙරෙයි. ඖලාරික හුස්ම සංහිඳුවනුයේ ද මෙසේ වූ හුස්ම ගනිමි යි හෝ පිට කරමි යි දැන පුරුදු කෙරෙයි.

4. මෙසේ සිය කයෙහි (හුස්මෙහි) හෝ අනුන් ගේ කයෙහි (හුස්මෙහි) හෝ තමන් අනුන් දෙ දෙනා ගේ ම කයෙහි (හුස්මෙහි) හෝ කායානුපස්සී වැ වෙසෙයි. හුස්මෙහි ඉපැත්ම හෝ වැනැස්ම හෝ ඉපැත්ම වැනැස්ම යන දෙක ම හෝ දක්නේ කායානුපස්සී ව වෙසෙයි. ඔහුට 'හුස්ම ඇත. පුගුලෙක් නැතැ'යි හෝ සිහිය එළැඹ සිටියේ වෙයි. මෙසේ එළැඹ සිටි සිහිය මතුමත්තෙහි නුවණ ද සිහිය ද වැඩෙනු පිණිස වෙයි. මෙසේ වූ හෙ තෙම තෘෂ්ණාතිඃශ්‍රය රහිත ව ද වෙසෙයි. ලොවැ කිසිවක් මේ මගේ ආත්ම යැ යි හෝ ආත්මීය යැ යි (තමන්සතු යැ යි) කියා නො පිළිගනී.

(ඉරියාපථ පබ්බය)

5. තව ද යන්නේ 'යෙමි' යි ද, සිටියේ 'සිටියෙමි' යි ද, හුන්නේ 'හුන්නෙමි' යි ද, හෝනේ 'හෝනෙමි' යි ද[350] නුවණින් දනී. කය පිහිටුවූ පිහිටුවූ සැටියෙන් ඒ ඒ ඉරියව්ව දැනගනී. මෙසේ සිය කයැ හෝ මෙරමා කයැ හෝ සිය කය මෙරමා කය යන දෙක්හි ම හෝ ඉරියවු අනුව කායානුපස්සී ව

350. ඉරියවු පැවැත්විමෙහි දී යැම් ආදිය කරන්නෙක් නැතැ යි ද, යැම් ආදිය කරනු පිණිස පහළ වන සිතින් උපදනා වායුව පැතිරැ සිරුරැ යැම් ආදිය වේ යැ යි දනිමින් ඒ ඉරියවු ඇති වන සැටි හෝ තමන් ගේ හෝ අනුන් ගේ හෝ දෙ දෙනා ගේ ම හෝ කායෙහි දකිමින් ඉරියාපථ-පරිග්ගාහක සිහිය වැඩීම මෙයින් කියන ලදි.

වෙසෙයි. ඒ ඒ ඉරියව්වෙහි ඉපැත් ම හෝ නැස්ම හෝ ඒ දෙක ම හෝ දක්නේ කායානුපස්සී වැ වෙසෙයි. ඔහුට 'ඉරියවුකය ඇත, සතෙක් පුග්ලෙක් නැතැ' යි කියා හෝ සිහිය එළැඹියේ වෙයි. ඒ සිහිය මතු මත්තෙහි නුවණ වැඩෙනු පිණිස ද සිහිය වැඩෙනු පිණිස ද වෙයි. හේ තෘෂ්ණා දෘෂ්ටි යන නිඃශ්‍රය නැතිව ද වෙසෙ යි. ලොවැ කිසිත් ආත්ම ආත්මීය වශයෙන් නො ගනී. මෙසේත් මහණ කායානුපස්සී ව වෙසෙයි.

(චතුසම්පජඤ්ඤ පබ්බය)

6. තව ද මහණ ඉදිරියට යැමෙහි ද පෙරළී ඊමෙහි ද, ඉදිරි බැලීමෙහි ද, අනුදික් බැලීමෙහි ද නුවණින් දැන එය කරනුයේ වෙයි. අත් පා නැමීමෙහි දිගු කිරීමෙහි, පාසිවුරු දැරීමෙහි, බොජුන් වැළැඳීමෙහි, පැන් පීමෙහි, කැවිලි කෑමෙහි, මී සකුරු ආ රස විඳීමෙහි, මල මූ පහ කිරීමෙහි, හිඳීමෙහි, නිදගැන්මෙහි, නිදි වැරීමෙහි, කීමෙහි, නිහඬ වීමෙහි යන මේ හැම ක්‍රියායෙක්හි නුවණින් දැන එය කරන්නේ වෙයි.[351]

මෙසේ හේ සිය කයැ හෝ මෙරමා කයැ හෝ ඒ දෙක්හි ම හෝ කායානුපස්සී වැ වෙසෙයි. ඉදිරියට යැම් ආදී ඉපැත්ම හෝ වැනැස්ම හෝ ඒ දෙක ම හෝ දක්නේ කායානුපස්සී වැ වෙසෙයි. 'ඉදිරියට යැම් ආ ක්‍රියා පැවැත්වීම ම ඇත. සතෙක් පුගුලෙක් නැතැ'යි එළැඹැ සිටි සිහිය වෙයි. එය මතුමත්තෙහි නුවණ ද සිහිය ද වැඩෙනු පිණිස වෙයි. හේ තෘෂ්ණාදෘෂ්ටිනිඃශ්‍රය නැති ව වසනුයේ ද වෙයි. මෙසේත් මහණ කායානුපස්සී වැ වෙසෙයි.

(පටික්කූලමනසිකාර පබ්බය)

7. තව ද මහණ පත්ලෙන් උඩ කෙසගින් යටැ මතු පිටින් වූ සම කෙලවර කොට ඇතුළතැ නොයෙක් අසුචියෙන් පිරී සිටි මෙ සිරුර ම පස්විකයි. කෙස් ය, ලොම් ය, නිය ය, දත් ය, සම ය, මස් ය, නහර ය, ඇට ය, ඇටමිදුලු ය, වකුගඩු ය, හදවත ය, අක්මා ය, දලබු ය, බඩදිව ය, පපුමස ය, අතුනු-වැටිය ය, අතුනුබහනය, නොදිරූ අහර ය, අසුචි ය, හිස් මොල ය, පිත ය, සෙම ය, සැරොව ය, ලෙහෙ ය, ඩහදිය ය, මේදතෙල ය, කඳුළු ය, වුරුණුතෙල ය, කෙල ය, සොටු ය,

351. මේ සාත්ථකසම්පජඤ්ඤ සප්පායසම්පජඤ්ඤ ගෝචරසම්පජඤ්ඤ අසම්මෝහසම්පජඤ්ඤ යැ යි සම්පජඤ්ඤ සතරෙකි. උපග්‍රන්ථය බලනු

සඳමිදුලු ය, මුං ය යන මොහු මෙ සිරුරෙහි ඇත්හ. ඇස් ඇති මිනිසකු උඩින් යැටින් මුව ඇති, මෑ තල සහල් ඈ නන්වැදෑරුම් ධාන්‍ය පිරූ මල්ලක් ලිහා 'හැල් මෙ පමණ ය, වී මෙ පමණ ය මුං මෙ පමණ ය, මෑ මෙ පමණ ය, තල මෙ පමණ ය, සහල් මෙ පමණ යැ' යි වෙන වෙන ම සලකා බලන්නා සේ, මහණ තෙම මෙ කයැ පතුලින් උඩ කෙසගින් යටැ සම ඉම් කොට ඇති කෙස් ලොම් ඈ සියලු දෙතිස්වැදෑරුම් කුණු කොටස් වෙන් වෙන් කොට නුවණින් සලකා බලයි.

මෙසේ සිය කයැ හෝ මෙරමා කයැ හෝ ඒ දෙකයෙහි ම හෝ කුණු කොටස් නුවණින් බලනුයේ කායානුපස්සී වැ වෙසෙයි. එසේ වූ හේ ඒ කුණුකොටසුන් ගේ ඉපැත්ම හෝ නැස්ම හෝ ඒ දෙක ම හෝ නුවණින් බලනුයේ කායානුපස්සී ව වෙසෙයි. ඔහුට 'මෙහි කුණුකොටස් රැසෙක් ම වේ, සතෙක් පුගුලෙක් නැතැ' යි සිහිය එළැඹ සිටියේ වෙයි. එය නුවණ ද සිහිය ද වැඩෙනු පිණිස පවතී. එසේ වූ හේ තෘෂ්ණාදෘෂ්ටි-නිඃශ්‍රයයෙන් තොර වැ වෙසෙයි. ලොවැ කිසිත් තෘෂ්ණා දෘෂ්ටි විසින් නො ගනී. මෙසේත් හේ කයෙහි කායානුපස්සී වැ වෙසෙයි.

(ධාතුමනසිකාර පබ්බය)

8. තව ද මහණ තෙම මෙ කය සිටි පිහිටි පරිදි ම මෙ කයැ පෘථිවිධාතු තේජෝධාතු ආපෝධාතු වායෝධාතු යන සතර මහාභූතයෝ ඇත්හ. දක්‍ෂ ගෝඝාතකයකු හෝ එවැත්තකු ගේ අතැවැස්සකු හෝ දෙනක මරා සිවුමං හන්දි-යෙකැ කොටස් කොට බෙදා ඉන්නා සේ, මහණ තෙම මෙ සිරුර සිටි පිහිටි පරිදි මෙ කයැ මේ පෘථිවිධාතුය යන ඈ විසින් මේ මේ ධාතු ඇතැ යි නුවණින් දනී.

මෙසේ මහණ තමා හෝ මෙරමා හෝ දෙ දෙනා ගේ ම හෝ ධාතු කය නුවණින් බලනුයේ කායානුපස්සී වැ වෙසෙයි. එසේ වූ හේ සතර ධාතූන් ගේ ඉපැත්ම හෝ නැස්ම හෝ ඒ දෙක ම හෝ පුන පුනා බලනුයේ කායානුපස්සී වැ වෙසෙයි. ඔහුට 'මෙහි ධාතුමාත්‍ර ම වූ කය ඇත. සතෙක් පුගුලෙක් නැතැ' යි සිහිය එළැඹියේ වෙයි. එය නුවණ ද සිහිය ද මාත්‍ර මත්තෙහි වැඩෙනු පිණිස පවතී. මෙසේ වූ හේ තෘෂ්ණා දෘෂ්ටි නිඃශ්‍රය නැති ව වසන්නේ ද වෙයි, ධාතුසමූහයක් වූ සිරුරු-ලොවැ කිසිත් ආත්මාදි විසින් නො ගනී. මෙසේ මහණ කයෙහි කායානුපස්සී වැ වෙසෙයි.

(සිවථිකා පබ්බය)

9. තව ද මහණ අමුසොහොනැ ලූ මැරී දවසක් ගිය හෝ දෙ දවසක් ගිය හෝ තුන් දවසක් ගිය හෝ, ඉදිමුණු, නිල් වූ, පූයා වගුරුවන සිරුරක් දක්තේ, එහි සැටිය 'මගේ මේ කයත් මෙබඳු යැ' යි තම සිරුරෙහි හෙලා බලයි. මෙසේ තමා ගේ හෝ මෙරමා ගේ හෝ දෙ දෙනාගේ ම හෝ කයෙහි අශුභය නුවණින් බලනුයේ කායානුපස්සී වැ වෙසෙයි. සිරුරැ ඉපැත්ම හෝ නැස්ම හෝ එ දෙක ම හෝ නුවණින් බලනුයේ කායානුපස්සී වැ වෙසෙයි. මෙසේ වූ ඒ යෝවැදූරි මහණහට 'ඉදිමී නිල් වැ ගිය පූයා වගුරුවන අශුභ ස්වභාවයෙක් ඇත. සතෙක් පුගුලෙක් නැතැ' යි සිහිය පිහිටියේ වෙයි. එය මත්තෙහි නුවණ ද සිහිය ද වැඩෙනු පිණිස පවතී මෙසේ වූ හේ තෘෂ්ණාදෘෂ්ටි – නිඃශ්‍රය නැති ව වෙසේ, ලොවැ කිසිත් ආත්මාදි විසිත් නො ගනී. මෙසේත් මහණ තෙම කයෙහි කායානුපස්සී වැ වෙසෙයි (පළමු සිවථිකය යි)

10. තව ද මහණ තෙම කවුඩත් හෝ උකුස්සත් හෝ ගිජුලිහිණියත් හෝ බල්ලත් හෝ සිවලුත් හෝ අන් විවිධ ප්‍රාණීන් හෝ විසින් කනු ලබන සොහොනැ ලූ මිණියක් දැක. සිය සිරුරත් එබඳු යැ යි එහි සැටිය තම සිරුරැ හෙලා බලයි......... (දෙවෙනි සිවථිකය යි)

11. සොහොනැ දමන ලදු වැ ලේමස් ඇති නහරින් බැඳුණු ඇටසැකිල්ලක් වූ මිණියක් දැක සිය සිරුරත් එබඳු යැ යි සසඳා බලයි ....(තෙවෙනි සිවථිකය යි)

12. සොහොනැ දමන ලදු වැ මස් සිඳී ගිය ලෙගෙ වැකි නහරින් බත් ඇටසැකිල්ලක් වූ සිරුරක් දැක සිය සිරුරත් එබඳු යැ යි සසඳා බලයි.........(සිවුවන සිවථිකය යි)

13. සොහොනැ දමන ලදු වැ මස්ලේ සිඳුණු නහරින් බත් ඇටසැකිල්ලක් වූ සිරුරක් දැක එහි සැටිය තම සිරුරැ හෙලා බලයි.........(පස්වන සිවථිකය යි).

14. සොහොනැ දමන ලදු වැ අත්ඇට පාඇට ඈ තැන තැන විසිරැගිය ඇටරැස දැක එහි සැටිය තම සිරුරැ හෙලා බලයි........ (සවන සිවථිකය යි)

15. තව ද මහණ සොහොනෙහි වූ සුදු පැහැ මිණිඇට දැක එය සිය සිරුරැ හෙලා බලයි.........(සත්වන සිවථිකය යි)

16. තව ද මහණ තෙමේ සොහොනැ වූ වසක් ඉක්මැ ගිය තැන තැන රැස් වැ ඇති ඇති මිණීඇට කැබැලි දැක එහි සැටිය සිය සිරුරැ හෙලා බලයි.........(අටවන සිවපිකය යි)

17. තව ද මහණ සොහොනැ වූ කුණු වූ සුණු වූ මිණී-ඇට දැක තමා සිරුර ද මෙසේ වෙතැ යි එහි සැටිය සිය සිරුරැ හෙලා බලයි. මෙසේ සිය සිරුරෙහි ද මෙරමා සිරුරෙහි ද ඒ සිරුරු දෙක්හි ම ද කායානුපස්සී ව වෙසෙයි. මෙසේ වූ සිරුරැ ඉපැත්ම හෝ නැස්ම හෝ එ දෙක ම හෝ බලනුයේ කායානුපස්සී වැ වෙසෙයි. මෙබඳු වූ යෝවැදූරි මහණ හට, 'ඉදිමීම් ආදී විසින් අශුභ සවභාවය ඇත, සතෙක් පුගුලෙක් නැතැ' යි සිහිය එළැඹැ සිටියේ වෙයි. එය මතුමත්තෙහි නුවණ ද සිහිය ද වැඩෙණු පිණිස පවතී. එසේ වූ හෙ තෙම තෘෂ්ණා දෘෂ්ටිනිඃශ්‍රය නැත්තේ වෙසෙයි. මෙසේ වූ කය නැමැති ලොවැහි කිසිත් ආත්ම ආත්මීය වශයෙන් නො ගනී. මෙසේ මහණ කයැ කායානුපස්සී වැ වෙසෙයි. (නව වන සිවපිකය යි)

වේදනානුපස්සනාව (2)

18. මහණ කෙසේ නම් වේදනාවන්හි වේදනානුපස්සී ව (වේදනා අනුව බලනුයේ) වෙසේ ද? මෙහි මහණ තෙමේ සුඛ දුක්ඛ අදුක්ඛමසුඛ යන තුන් වේදනායෙන් කවරක් හෝ විඳිනුයේ මෙනම් වේදනාව විඳිමි යි නුවණින් දනී. සාමිස (පංචකාම නිංශ්‍රිත) සුඛ වේදනාව, නිරාමිස (නෛෂ්කාම්‍යනිඃශ්‍රිත) සුඛ-වේදනාව, සාමිස දුඃඛවේදනාව, නිරාමිස දුඃඛවේදනාව, සාමිස අදුඃඛාසුඛ (උපේක්‍ෂා) වේදනාව, නිරාමිස අදුඃඛාසුඛ වේදනාව යන කවර වේදනාවක් හෝ විඳිනුයේ මෙ නම් වේදනාව විඳිමි යි නුවණින් දනී.

මෙසේ තමා කෙරෙහි වූ හෝ තමා ගෙන් පිටත්හි වූ හෝ තමා කෙරෙහිත් තමා ගෙන් පිටත්හිත් වූ හෝ වේදනා-වන්හි වේදනානුපස්සී ව වෙසෙයි. වේදනාවන් ගේ ඉපැත්ම හෝ නැස්ම හෝ ඒ දෙක ම හෝ බලනුයේ වෙසෙයි. මෙසේ වූ ඔහුට 'අසථිර වූ ක්‍ෂණික විඳීම් මාත්‍ර ඇතැ' යි සිහිය එළැඹ සිටියේ වෙයි. එය මතුමත්තෙහි නුවණ ද සිහිය ද වැඩෙනු පිණිස වෙයි. එසේ වූ හේ තෘෂ්ණා දෘෂ්ටි නිඃශ්‍රය නැත්තේ වෙසෙයි. හෙ තෙම ලොවැ කිසිත් (කිසිදු වේදනාවක්) ආත්ම ආත්මීය විසින් නො ගනී. මෙසේ මහණ තෙම වේදනාවන්හි වේදනානුපස්සී වැ වෙසෙයි.

චිත්තානුපස්සනාව (3)

19. මහණ තෙම කෙසේ නම් සිතෙහි චිත්තානුපස්සී ව (සිත අනුව බලන්නේ) වෙසේ ද?

මෙහි මහණ තෙම සරාග සිත හෝ සරාග සිතැ යි දනී. වීතරාග සිත හෝ වීතරාග සිතැ යි දනී.

සදෝෂ සිත, වීතදෝෂ සිත, සමෝහ සිත, වීතමෝහ සිත, හැකුළුණු සිත, වික්ෂිප්ත (විසුරුණු) සිත, මහද්ගත සිත, අමහද්ගත සිත, සඋත්තර සිත, අනුත්තර සිත, සමාහිත සිත, අසමාහිත සිත, විමුක්ත සිත, අවිමුක්ත සිත[352] යන මේ එකී එකී සිතක් ඒ ඒ ඇති සැටියෙන් ම දනී.

මෙසේ තමා කෙරෙහි වූ හෝ මෙරමා කෙරෙහි වූ හෝ තමා මෙරමා දෙදෙනා කෙරෙහි ම වූ හෝ සිත් ඒ ඒ යථා-ස්වභාවයෙන් දක්නේ චිත්තානුපස්සී ව වෙසෙයි. ඒ සිත්වලැ ඉපැත්ම හෝ නැස්ම හෝ ඒ දෙක ම හෝ දක්නේ චිත්තානු-පස්සී වැ වෙසෙයි. එසේ වූ ඔහුට ඉහත දැක්වුණු පරිදි 'සොළොස් වැදෑරුම් වූ සිත (ඒ ඒ අවස්ථාවට සුදුසු පරිදි පහළ වන චිත්තනමාත්‍ර) ඇත. සතෙක් පුග්ලෙක් නැතැ' යි සිහිය එළැඹ සිටියේ වෙයි. එය මතුමත්තෙහි නුවණ ද සිහිය ද වැඩෙනු පිණිස වෙයි. මෙසේ වූ හෙ තෙම - තෘෂ්ණා දෘෂ්ටි-නිඃශ්‍රය රහිත වැ වෙසේ. චිත්තලෝකයෙහි කිසිවක් ආත්ම ආත්මීය වශයෙන් නො ගනී. මෙසේ ම මහණ තෙම සිතෙහි චිත්තානුපස්සී ව වෙසෙයි.

ධම්මානුපස්සනා (4)

(නීවරණ පබ්බය)

මහණ තෙම කෙසේ නම් දහම්හි ධම්මානුපස්සී ව වෙසේ ද? යත්: මෙහි මහණ තෙම පස් නීවරණයන්හි[353] ධම්මානු-පස්සී වැ වෙසේ: තමා කෙරෙහි ඇති කාමච්ඡන්දය තමා කෙරෙහි ඇතැ යි ද, තමා කෙරෙහි නැති කාමච්ඡන්දය

---

352. පිනම්ද්ධයෙන් යුක්ත සිත හැකුළුණු සිත යි. විසුරුණු සිත යනු උද්ධච්චයෙන් යුක්ත සිත ය. මහද්ගත සිත යනු රූපාවචර අරූපාවචර සිත් ය. අමහද්ගත සිත් යනු කාමාවචර සිත් ය සඋත්තර සිත යනු කාමාවචර සිත් ය, අනුත්තර සිත යනු රූපාවචර අරූපාවචර සිත් ය. මෙහි ද රූපාවචරය සඋත්තර ය, අරූපාවචර සිත අනුත්තර යි. ලොවුතුරා සිත් මෙ තැනට නො ගැනෙයි. 353. නීවරණ - උපග්‍රන්ථය බලනු.

තමා කෙරෙහි නැතැ යි ද දනී. නො උපන් කාමච්ඡන්දය උපදනා කරුණු ද, උපන් කාමච්ඡන්දය පහ වන කරුණු ද, පහ වූණු කාමච්ඡන්දය මතු නොඋපදනට කරුණු ද දනී.

මෙසේ ම තමා කෙරෙහි ඇති ව්‍යාපාදය ද, ථිනමිද්ධය ද, උද්ධච්චකුක්කුච්චය ද විචිකිච්ඡාව ද ඇතැයි දනී. තමා කෙරෙහි නැති ව්‍යාපාදදිය නැතැ යි දනී. නො උපන් ව්‍යාපාදදිය උපදනට කරුණු ද, උපන් ව්‍යාපාදදිය පහ වන කරුණු ද, පහ වූ ව්‍යාපාදදිය මතු නො උපදනට කරුණු ද දනී.

මෙසේ තමා කෙරෙහි වූ හෝ මෙරමා කෙරෙහි වූ හෝ තමාත් මෙරමාත් දෙ දෙනා කෙරෙහි වූ නීවරණයන්හි ධම්මානුපස්සී ව වෙසෙයි. මෙසේ බවුන් වඩන ඔහුට මේ මේ මොහොතැ මේ මේ නීවරණ ඇතැ යි සිහිය එළැඹ සිටියේ වෙයි. එසේ එළැඹ සිටි සිහිය මතුමත්තෙහි නුවණ ද සිහිය ද වැඩෙනු පිණිස වෙයි. හේ කාමච්ඡන්දදීන් ගේ නිඃශ්‍රය නැති ව වෙසෙයි. මේ නීවරණ අතුරෙහි කිසිවක් ආත්ම ආත්මීය වශයෙන් නො ගනී. මෙසේ මහණ තෙම පංචනීවරණයන්හි ධම්මානුපස්සී වැ වෙසෙයි.

(ඛන්ධ පබ්බය)

21. තවද මහණ තෙම උපාදනසක්‍ඛන්ධ[354] පසෙහි ධම්මානුපස්සී වැ වෙසෙයි. ඒ කෙසේ ද?

මෙහි මහණ තෙම රූප වේදනා සංඥ සංස්කාර විඥන යන උපාදනස්කන්ධ පස අතුරෙන් එකි එකී ධර්මයක් 'මේ රූපය මෙතෙකැ යි, මේ වේදනා......... සංඥ ....සංස්කාර.... විඥන මෙ තෙකැ යි ද, මෙයින් පිටත් රූප............විඥන නැතැ යි ද, මොවුන් ගේ එකී එකී දහමෙක ඉපැත්ම මෙසේ යැ යි ද, නැස්ම මෙසේ යැ' යි ද උපාදනස්කන්ධයන්හි ධම්මානුපස්සී වැ වෙසෙයි. මෙසේ තමා ගේ හෝ මෙරමා ගේ හෝ දෙදෙනා ගේ ම හෝ උපාදනස්කන්ධ ධර්මයන්හි ධම්මානුපස්සී ව වෙසෙයි. ඔහුට 'මේ රූපාදි උපාදනස්කන්ධමාත්‍රයෝ ඇත. සත්වයෙක් පුග්ගලෙක් නැතැ'යි සිහිය එළැඹ සිටියේ වෙයි. එය මතු මත්තෙහි නුවණ ද සිහිය ද වැඩෙනු පිණිස පවතී. හේ මෙසේ වූයේ තෘෂ්ණා - දෘෂ්ටි - නිඃශ්‍රය කෙරෙන් තොර ව ම වෙසෙයි. උපාදනස්කන්ධ ලෝකයෙහි කිසිත් ආත්මආත්මීය වශයෙන් නො ගනී. මෙසේ මහණ තෙම ස්කන්ධධර්මයන්හි ධම්මානුපස්සී වැ වෙසෙයි.

---

354. උපාදනගෝචර වූ, ආශ්‍රව සහිත වූ ස්කන්ධ උපාදනස්කන්ධ නම්.

(ආයතන පබ්බය)

22. තව ද මහණ තෙම ආධ්‍යාත්මික බාහිර යැ යි ද්විවිධ වූ ආයතන සයෙහි ධම්මානුපස්සී වැ වෙසෙයි. කෙසේ ද?

මෙහි මහණ තෙම චක්ඛු සොත ඝාණ ජිව්හා කාය මන යන ආධ්‍යාත්මික ආයතන සය ද, ඔවුන් ගේ ගෝචර වූ රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ධම්ම යන බාහිර ආයතන සය ද, ඔවුන් ගේ එක් වීමෙන් උපදනා කාමරාගාදි සංයෝජන ද, නූපන් සංයෝජන උපදනට කරුණු ද, උපන් සංයෝජන පහ වන්නට කරුණු ද, පහ වූ සංයෝජන යළි නො පහළ වන්නට කරුණු ද දැන ගනී.

මෙසේ තමා ගේ හෝ මෙරමා ගේ හෝ දෙදෙනා ගේ ම හෝ ආයතනධර්මයන්හි වරින් වර ධම්මානුපස්සී ව වෙසෙයි. මෙසේ ධම්මානුපස්සි ව වසන ඔහුට රූපාරූපධර්මමාත්‍ර වූ ආයතන ඇතැ යි (සතෙක් පුද්ගලෙක් නැතැයි) හෝ සිහිය එළැඹ සිටියේ වෙයි. එය මත්තෙහි නුවණ ද සිහිය ද වැඩෙනු පිණිස වෙයි. මෙසේ වූ හෙ තෙම තෘෂ්ණා දෘෂ්ටි ඇසුර නැති ව ම වෙසෙයි, ආයතනලෝකයෙහි කිසි ද දෑයක් ආත්ම ආත්මීය විසින් නො ගනියි. මෙසේ ආධ්‍යාත්මික බාහිර යැ යි ද්විවිධ වූ ෂඩායතන ධර්මයන්හි ධම්මානුපස්සී වැ වෙසෙයි.

(බොජ්ඣඞ්ග පබ්බය)

23. තව ද මහණ තෙම සප්ත බෝධ්‍යංග ධර්මයන්හි ධම්මානුපස්සි ව වෙසෙයි. කෙසේ ද?

මෙහි මහණ තෙම සති ධම්මවිචය විරිය පීති පස්සද්ධි සමාධි උපෙක්ඛා යන මේ බෝධ්‍යංග[355] අතුරෙන් 'මෙ නම් බෝධ්‍යංගය මා කෙරෙහි ඇතැ' යි තමා කෙරෙහි ඇත්තා වූ සම්බෝධ්‍යංගය හෝ දන්නේ වේ. මෙ නම් සම්බෝධ්‍යංගය මා කෙරෙහි නැතැ යි තමා කෙරෙහි නැති සම්බෝධ්‍යංගය හෝ දනී. තමා කෙරෙහි නො පහළ වූ සම්බෝධ්‍යංගය ඉපැත්මට කාරණය දනී. උපන් සම්බෝධ්‍යංගය භාවනායෙන් සම්පූර්ණ වන්නට කරුණු ද දනී.

---

355. චතුස්සත්‍යාවබෝධය කරන පුද්ගලා බෝධි නම. චතුස්සත්‍යාවබෝධයට ඉවහල් වන සිහි ආදි ධර්ම සමූහය ද බොධි නම්. බෝධිහු ගේ අවයව බෝධ්‍යංග නම්.

මෙසේ තමා කෙරෙහි ඇති හෝ මෙරමා කෙරෙහි ඇති හෝ තමන් මෙරමා දෙදෙනා ම කෙරෙහි ඇති හෝ බෝධ්‍යංග ධර්‍මයන්හි ධම්මානුපස්සී වැ වෙසෙයි. බෝධ්‍යංගයන් ගේ ඉපැත්මට කාරණ වූ ධර්‍මයන්හි ම හෝ බෝධ්‍යංගයන් ගේ නැඟීම පිණිස පවත්නා ධර්‍ම කෙරෙහි හෝ ඒ දෙ දහම්හි හෝ ධම්මානුපස්සී වැ වෙසෙයි. ඔහුට බෝධ්‍යංග ධර්‍මයෝ ඇතැ යි සිහිය එළැඹ සිටියේ වෙයි. එය මතුමත්තෙහි නුවණ ද සිහිය ද වැඩෙනු පිණිස වෙයි. මෙසේ වූ හෙ තෙම තෘෂ්ණා – දෘෂ්ටි – නිඃශ්‍රය නැති ව ද වෙසෙයි. ලොවැ කිසිත් ආත්ම ආත්මීයාදි විසින් නො ගනී. මෙසේ මහණ තෙම සත් බොදඟ දහම්හි ධම්මානුපස්සි ව වෙසෙයි.

(සච්ච පබ්බය)

24. නව ද මහණ තෙම සතර ආර්‍ය්‍යසත්‍යයන්හි ධම්මානුපස්සී වැ වෙසෙයි. ඒ කෙසේ ද? යත්:

මෙහි මහණ තෙම මේ දුඃඛාර්‍ය්‍ය සත්‍ය යැ යි, මේ දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍යයැ යි, මේ දුඃඛනිරෝධාර්‍ය්‍යසත්‍යයැ යි, මේ දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යයැ යි ද තත් වූ පරිදි දනි.

එහි දුඃඛාර්‍ය්‍යසත්‍යය කවර යැ? ඉපැත්ම ද දිරුම ද ලෙඩ ද, මරණය ද ශෝක පරිදේව කායික දුක් මානසික දුක් දැඩි ආයාස යන මොහු ද දුක්හ. කැමැති දෑ නො ලබනු ද දුක් ය. සැකෙවින් උපාදානස්කන්ධ පස ම දුක් ය.

එහි **ඉපැත්ම** යනු ඒ ඒ සතුන් ඒ ඒ සත්වගෙහි අණ්ඩජාදි විසින් කිසි යෝනියෙක ඉපැත්ම ය, ස්කන්ධ පහළ වීම ය, ආයතනයන් ලැබීම ය.

දිරුම යනු ඒ ඒ සත්වගෙහි සතුන් ගේ කඩදත් බව, කෙස් ලොම් පැසීම, සම රැළි ගැසීම, ආයු පිරිහිම, ඉඳුරන් මුහුකිරීම යන මෙය යි.

මරණ නම් ඒ ඒ සතුන් ඒ ඒ සත්වග කෙරෙන් චුත වනු ය, ස්කන්ධයන් ගේ භේදය ය, ස්කන්ධයන් ගේ අතුරුදහන් වීම ය, මිය යෑම ය, සිරුර හැර දැමීම ය.

ශෝක නම් කිසි ව්‍යසනයෙකින් යුක්ත වූවහුට සිතැ ඇති වන ශෝචනය, සිරුර විශලවන ආකාර සොවිනා බව ය.

පරිදේව නම් හැඬීම ය, ගුණ කියමින් වැලැපීම ය.

දුක් නම් කයෙහි පහළ වන නො මිහිරි කටුක වේදනාව ය.

දොම්නස් නම් සිතැ උපදනා නොමිහිරි කටුක වේදනාව ය.

උපායාස නම් ව්‍යසනයෙකින් දුකෙකින් පහස්නා ලද්දහු සිතැ උපදනා දැඩි ආයාස ය, හඬන්නට පවා නො හැක්කහු සිතැ පහළ වන අනොතර්සෝකය ය*.

කැමැති දෑ නො ලබනු දුක් ය යනු කවර යැ? ජාති-ජරාමරණාදිය සවභාවය කොටැති සත්හු ඒ ජාති ජරා මරණාදි දුක් නො එතොත් යෙහෙකැ යි කැමැති වෙත්. එහෙත් කැමැත්ත පරිදි එය නො වේ. මේ කැමැති දෑ නො ලබනු දුක් යැ යනු ය. **සැකෙවින් උපාදානසකඣ පස දුක් ය** යනු-යෙහි උපාදානසකඣ යනු රූප වේදනා සංඥ සංසකාර විඥන යන පස ය. මෙසේ මේ දුඃඛාර්‍ය සත්‍යයැ යි කියනු ලැබේ.

25. දුඃඛසමුදයාර්‍ය සත්‍යය කවර යැ?

පුන පුනා සසර උපදවන, නන්‍දිරාග සහගත, ඒ ඒ තැනැ සතුටු වන (ඇලෙන) කාමතෘෂණා භවතෘෂණා විභවතෘෂණා යි ත්‍රිවිධ වූ තෘෂණාව ය. මෙය ලොවැ ප්‍රිය වූ මිහිරි වූ චකඛු සෝත ඝාණ ජිව්හා කාය මනස යන මේ තැන් සයෙහි උපදී, පුන පුනා උපදී. ලොවැ ප්‍රිය වූ රූප සද්ද ගන්‍ධ රස ඵොට්ඨබ්බ ධම්ම යන විෂය සයෙහි උපදී, පුන පුනා උපදී. ලොවැ ප්‍රිය වූ මිහිරි වූ චකඛුවිඤ්ඤාණ සෝතවිඤ්ඤාණ ඝාණවිඤ්ඤාණ ජිව්හා-විඤ්ඤාණ කායවිඤ්ඤාණ මනෝවිඤ්ඤාණ යන ස අරමුණෙහි උපදී, පුන පුනා උපදී

ලොවැ ප්‍රිය වූ මිහිරි වූ චකඛුසම්ඵස්ස සෝතසම්ඵස්ස-ඝාණසම්ඵස්ස ජිව්හාසම්ඵස්ස කායසම්ඵස්ස මනෝසම්ඵස්ස යන මෙහි ද,

ලොවැ ප්‍රිය වූ මිහිරි වූ චකඛුසම්ඵස්සජ වේදනා, සෝත සම්ඵස්සජ වේදනා, ඝාණසම්ඵස්සජ වේදනා, ජිව්හාසම්ඵස්සජ වේදනා, කායසම්ඵස්සජ වේදනා, මනෝසම්ඵස්සජ වේදනා යන මෙහි ද, ලොවැ ප්‍රිය වූ මිහිරි වූ රූපසඤ්ඤා සද්ද සඤ්ඤා ගන්‍ධ-සඤ්ඤා රසසඤ්ඤා ඵොට්ඨබ්බසඤ්ඤා ධම්මසඤ්ඤා යන මෙහි ද

* ඤාතිව්‍යසනාදිනා ඵුට්ඨස්ස පරිදෙවනම්පි අසක්කුනන්තස්ස අන්තොගත-සොකසුස භුසො ආයාසො උපායාසො (ටීකා).

ලොවැ ප්‍රිය වූ මධුර වූ රූප සංචේතනා සද්දසංචේතනා ගන්ධ-සංචේතනා රසසංචේතනා ඵොට්ඨබ්බසංචේතනා ධම්මසංචේතනා යන මෙහි ද,

ලොවැ ප්‍රිය වූ මධුර වූ රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා යන මෙහි ද, ලොවැ ප්‍රිය වූ මධුර වූ රූපවිතක්ක සද්දවිතක්ක ගන්ධවිතක්ක රස-විතක්ක ඵොට්ඨබ්බවිතක්ක ධම්මවිතක්ක යන මෙහි ද,

ලොවැ ප්‍රිය වූ මධුර වූ රූපවිචාර සද්දවිචාර ගන්ධවිචාර රසවිචාර ඵොට්ඨබ්බවිචාර ධම්මවිචාර යන මෙහි ද මේ තෘෂ්ණාව උපදී, පුන පුනා උපදී.

මේ දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍යය නම් වේ.

26. දුඃඛනිරෝධාර්‍ය්‍යසත්‍යය කවර යැ?

ඒ යට කී කාමතෘෂ්ණාදි විසින් ත්‍රිවිධ වූ තෘෂ්ණාව ගේ නිරවශේෂ ප්‍රහාණය යි.

පහ වන නිරුද්ධ වන ඒ තෘෂ්ණාව කවර තන්හි පහ වේ ද? යත්: ලොවැ ප්‍රිය වූ මධුර වූ දෑය කෙරෙහි ඒ තෘෂ්ණාව පහ වෙයි, නිරුඬ වෙයි.

ලොවැ ප්‍රිය මධුර දෑය නම් කවර යැ? චක්ඛු ආදි අජ්ඣත්ති-කායතන සය ද, රූපාදි බාහිරායතන සය ද, චක්ඛුවිඤ්ඤාණාදි විඤ්ඤාණ සය ද, චක්ඛුසම්ඵස්සාදි සම්ඵස්ස සය ද, චක්ඛුසම්ඵස්සජ වේදනාදි වේදනා සය ද, රූපසඤ්ඤාදි සඤ්ඤා සය ද, රූප-සංචේතනාදි සංචේතනා සය ද, රූපතණ්හාදි තණ්හා සය ද, රූපවිතක්කාදි විතක්ක සය ද, රූපවිචාරාදි විචාර සය ද යන මොහු සියල්ලෝ ලොවැ ප්‍රිය මධුර දෑ ය. මොවුන් කෙරෙහි මේ තෘෂ්ණාව පහ වෙයි, නිරුද්ධ වෙයි. මෙය දුඃඛනිරෝධාර්‍ය්‍ය සත්‍යය නම් වේ.

27. දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය කවර යැ? ඒ සම්මාදිට්ඨි සම්මාසංකප්ප සම්මාවාචා සම්මාකම්මන්ත සම්මා-ආජීව සම්මාවායාම සම්මාසති සම්මාසමාධි යන මේ අංග අට වූ මඟ ය.

එහි **සම්මාදිට්ඨි** නම් දුකෙහි ද දුක් හේතුයෙහි ද දුක් නැස්මෙහි ද දුක් නසනුවට යන පිළිවෙතෙහි දෑ යි යන සිවු සස්හි නුවණ යි.

සම්මාසඞ්කප්ප නම් නෙක්ඛම්මසංකප්ප අව්‍යාපාදසංකප්ප අවිහිංසාසංකප්ප යි තුන් වැදෑරුම් සංකල්පනා යි.

සම්මාවාචා නම් මුසාවාද පිසුණවාචා ඵරුසවාචා සම්ඵප්පලාප යන සතර වාග්දුශ්චරිතයෙන් වැළැක්ම ය.

සම්මාකම්මන්ත නම් ප්‍රාණඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාර යන තුන් කායදුශ්චරිතයෙන් වැළැක්ම ය.

සම්මාආජීව නම් නොදැහැමින් ඉපැයූ දැයින් කරන වැරැදි ආජීවය හැර දැහැමි දිවියෙන් දිවි පැවැත්වීම ය.

සම්මාවායාම යනු නූපන් අකුසල් නොඋපදනට ද උපන් අකුසල් පහ වනුවට ද නූපන් කුසල් උපදනුවට ද උපන් කුසල් වඩනුවට ද වැර වැඩීම ය.

සම්මාසති නම් කායානුපස්සී ව වේදනානුපස්සී ව චිත්තානු-පස්සී ව ධම්මානුපස්සී ව සිහි නුවණ ඇති ව ලෝභ ව්‍යාපාද පහ කොට වසන්නහු ගේ එළැඹ සිටි සිහිය ය.

සම්මාසමාධි නම් පළමුවන දෙවෙනි තෙවෙනි සිවුවන දහන් ලැබ වසන්නහු ගේ අරමුණෙහි සිත එකඟ බව ය. මේ දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාර්‍ය සත්‍යය යි.

28. මෙසේ තමා කෙරෙහි වූ හෝ මෙරමා කෙරෙහි වූ හෝ තමන් මෙරමා දෙදෙනා කෙරෙහි ම වූ හෝ චතුස්සත්‍ය ධර්‍මයන්හි ධම්මානුපස්සී ව වෙසෙයි. ඔවුන් ගේ පහළ වීමට ප්‍රත්‍යය වූ ධර්‍ම හෝ ඔවුන් ගේ නැස්මට කරුණු වූ ධර්‍ම හෝ ඒ දෙවගය ම හෝ අනුව බලනුයේ ධම්මානුපස්සී ව වෙසෙයි.

මේ බවුන්හි යෙදී වසන මහණහට ‘දුඃඛාදි සවභාවයෝ ඇත්හ. සතෙක් පුහුලෙක් නැතැ’ යි සිහිය එළැඹ සිටියේ වෙයි. එය මතු මත්තෙහි නුවණ ද සිහිය ද වැඩෙනු පිණිස වෙයි. මෙසේ වූ හේ තෘෂ්ණාදෘෂ්ටිනිඃශ්‍රය නැති වැ වෙසෙයි. චතුස්සත්‍යධර්‍ම අතුරෙහි වූ කිසිත් ආත්මාදි විසින් නො ගනී. මෙසේ මහණ තෙම ධර්‍මයන්හි ධම්මානුපස්සී ව වෙසෙයි. යමෙක් මේ සතර සතිපඨානයන් සත්වසක්, සවසක්, පස්වසක්, සිවුවසක්, තෙවසක්, දෙවසක්, එක්වසක්, සත්මසක්, සමසක්, පස්මසක්, සිවුමසක්, තෙමසක්, දෙමසක්, එක්මසක්, අඩමසක්,

සතියක් මෙසේ වඩන්නේ නම්, ඔහුට මෙ අත්බැව්හි ම රහත් බව හෝ, උපාදාන ඉතිරි වැ ඇති කලැ අනාගාමි බව හෝ අවශ්‍යයෙන් ලැබෙන්නේ ය.[356]

සතුන් ගේ පිරිසිදුව පිණිස සෝ හැඬුම් වැලැපුම් ඉක්මෙනු පිණිස දුක්දොම්නසුන් වැනැස්ම පිණිස අරිඅටැඟිමඟට බැස ගනු පිණිස, නිවන් පසක් කරනු පිණිස මේ එක ම මඟ වේ යැ යි කියනලද්දේ මේ සතිපට්ඨානභාවනාව සඳහා ය.

මෙ දෙසුම ඇසූ මහණහු මෙය සතුටින් පිළිගත්හ.

['මෙහි සතර අනුපස්සනා දක්වීම් වශයෙන් ආනාපාන, චතුඉරියාපථ, චතුසම්පජඤ්ඤ, පටික්කූලමනසිකාර, ධාතුවවත්ථාන, නවසීවථික යැ යි කායානුපස්සනා තුදුසක් ද, වේදනානුපස්සනා චිත්තානුපස්සනා නීවරණපරිග්ගහ ඛන්ධපරිග්ගහ ආයතනපරිග්ගහ බොජ්ඣංගපරිග්ගහ සච්චපරිග්ගහ යන සත ද යි සියලු කමටහන් එක් විස්සෙක් දක්විණ.]

---

23. පායාසි සූත්‍රය

එක් සමයෙක **කුමරකසුප්** මහතෙරණුවෝ කොසොල් රටැ **සේතව්‍ය** නුවරැ උතුරැ දෙසැ ඇව්වේරිය වෙනෙහි වෙසෙති. එ සෙමෙහි දිනෙක **පායාසිරාජඤ්ඤ**[357] නම් ධනවත් බමුණෙක් බමුණු ගැහැවි පිරිසක් හා ඔබ දක්නට ආ ය. අවුත් සුව දුක් විචාරා පසෙක හිඳ ගත. ඉක්බිති මහතෙරුන් හා සාකච්ඡාවට බට.

2. **පායාසිරාජඤ්ඤ** – භවත් කාශ්‍යපයනි, 'මම් පරලොවෙක් නැතැ'යි, 'ඕපපාතික[358] සත්හු නැතැ'යි 'කම්විපාක කියා දෙයෙක් නැතැ'යි යන දෘෂ්ටිය ඇත්තෙකිමි.

කුමරකසුප් තෙරණුවෝ – මෙහි ඔබ ම විචාරමි. රාජන්‍යයෙනි, හිරු සඳු දෙදෙන මෙ ලොව ද? නැත හොත් පර ලොව ද? ඔහු දෙව්ලොවට අයත්හු ද? මිනිස්ලොවට අයත්හු ද? මෙහි ඔබ පිළිගැන්ම කෙසේ ද?

---

356. මේ කියනලද්දේ මධ්‍යම වෛනෙය පුද්ගලයා ගැන යි. තියුණු **නුවණ** ඇති වෛනෙය ජන තෙමේ මොහොතක් ඇතුළත වුව ද, නවත් **කල් ගියොත්** උදේ කමටහන් ලදුවහු සවස වුව ද අධිගම ලබනුයෙහි සමත් වේ. 357. රාජන්‍ය **යනු** අනභිෂික්ත රජ ය. 358. ඕපපාතික යනු මෙතැන මැරී **උපදනා** සත්හු ය.

පායාසි – භවත් කාශ්‍යපයිනි, හිරු සඳුහු පරලෝ ය. මෙ ලොව නො වෙත්. ඔහු දෙවියෝ ය මිනිස්සු නො වෙත්.[359]

කුමර – රාජන්‍යයෙනි, ඔබේ මෙ බසින් ම 'පරලෝ ඇත, ඕපපාතිකයෝ ඇත. කම්පල ඇතැ'යි සිඞ වේ. ඒ දූ එසේ ඇතැ යි ඔබට සිතේ වා.

පායාසි – ඔබ මෙසේ වදල ද 'පර ලොවෙක් නැතැ'යි ම, 'ඕපපාතිකයෝ නැතැ'සි ම, කර්මයනට විපාක නැතැ'සි ම කියා මට සිතේ.

කුමර – එසේ සිතෙන්නට කරුණු ඇද්ද?

3. **පායාසි** – ඇත, භවත් කාශ්‍යපයිනි, පව් කළ නෑයන් මිතුරන් මරණාසන්න වැ හොත්තවුන් වෙත එළැඹ, 'ඔබ පව් කළ බැවින් අපායෙහි ඉපැද්දයුතු. එසේ උපන්නොත් ඒ බව මට දන්වවු'යි කිමි. ඔහු ද මැනැවැයි පිළිගත්හ. ඔවුන් මැරී කලක් ගත වූ නමුදු තව ම මං වෙත ඒ කිසිවෙක් නායේ ය. දූතයකු හෝ නො එවූහ. එහෙයින් 'පරලෝ නැතැ'යි යන ආදි විසින් මා තුලැ වූ දෘෂ්ටිය නො හරිමි.

කුමර – රාජන්‍යයෙනි, ඔබේ සේවකයන් ඔබට වරදක් කළ එකකු අල්ලා ගෙනා කලැ, ඔහු හිස සිඳින්නට ඔබ අණ කළොත් ඔහුත් එසේ ම කරන්නාහ. එයැසු වරදකරු වධකයන් බණවා, තම නෑ දූ මිතුරනට දන්වා සමු ගෙන එනු පිණිස ඔවුන් වෙත යන්නට අවසර ඉල්ලුවොත් ඔහු ඔහුට එයට අවසර දෙත් ද? නැත හොත් ඔහු හඬා වලපිද්දී ම උහු හිස සිඳලත් ද? මෙහි ඔබ අදහස කෙසේ ද?

---

359. මේ දේශනාවට නොබෝ කලෙකින් පෙර බුදුරජුහු සුධාභෝජන ජාතකය වදළහ. එහි හිරුමඬල ඇසිර එ නමින් හැඳින්වෙන දෙව්පුත්හු ද, සඳ මඬල ඇසිර සඳ දෙව්පුත්තු ද ඇතැ යි වදළහ ඒ කථාව රටැ පැතිරිණ. මේ තෙමේ ද ඒ කථාව ඇසී ය. එහි දෙව්පුත්තු නැත්හ යි කිය නො හැක්කේ යැ යි සිතින් හේ මෙසේපැවැසී ය.

පායාසි - භවත් කාශ්‍යපයිනි, වධකයන් ගෙන් ඔහුට එය පිණිස අවසරයෙක් නො ලැබේ. ඔහු හඬද්දී වලපිද්දී ම ඌ තිස සිඳුනාහ.

කුමර - රාජන්‍යයනි, එසේ නම් පව් කොට නිරයේ උපන්නහුට නිරාපල්ලන් ගෙන් මෙහි ඔබ වෙත එන්නට කොයින් අවසරෙක් ලැබේ ද? නො ලැබේ ම ය. එබැවින් ඔබ ගත් දෘෂ්ටිය හරිනු මැනැවි.

3\. **පායාසි** - භවත් කාශ්‍යපයිනි, මෙ තෙකින් මා පිළිගැත්ම හැර දමනු නො හැක්ක. එයට තවත් කරුණු ඇති බැවිනි.

කුමර - ඒ කවර කරුණු ද?

පායාසි - මගේ ඇතැම් නෑ මිතුරෝ තමන් පිළිගත් පරිදි පින් කළාහු වූහ. ඔවුන් මැරෙන්නට ළං වූ සමයෙහි තමන් කළ පින් හෙයින් සගෙහි උපන් කලැ මා වෙත අවුත් එ බව දන්වන්නැ යි කීමි. 'ඔහු ද එසේ කරම්හ'යි පිළිත කළහ. එහෙත් ඒ කිසිවෙක් තව ම නායේ ය, දූතයකු හෝ මා වෙත නො එවී ය. එ බැවින් පරලොවක් නැතැ යි ආදීන් කියමි.

කුමර - රාජන්‍යයෙනි, අශුචි පිරුණු වළෙක වැටී හොත්තක්හු ඔහුගේ නෑදෑ ආදීන් විසින් ගොඩ ගනු ලැබ පිරිසිදු වූවහු යලින් ඒ අසූචි වළෙහි ගැලෙනු රිසි කෙරෙයි ද?

පායාසි - භවත් කාශ්‍යපයෙනි, ඔහු එයට රිසි නො කෙරෙති.

කුමර - රාජන්‍යයෙනි, මිනිස්සු දෙවියනට අසූචි සේ පිළිකුල් හ. දෙවි වැ සිටිනා ඔහු දුගඳ අසූචි වළක් බඳු පිළිකුල් වූ මිනිස්ලොවට කෙසේ නම් එන්නාහු ද? මෙහි ඔබ ගේ තර්කය බිඳ වැටිණ. එ බැවින් තෙල දෘෂ්ටිය හැරදමන්න.

4\. **පායාසි** - මෙ තෙකින් මා ලබ්ධිය දුරු ලිය නො හෙමි. මට එයට කරුණු ඇත. පමිත් වැළැකුණු මගේ ඇතැම් නෑ දූ මිතුරන් මැරෙන සමයෙහි

ඔවුන් වෙත එළැඹ, 'මහණ බමුණන් කියනා බස සැබෑ නම්, කුසල් කළ තෙපි මරණින් මතු තව්තිසා දෙව්ලොවැ උපදින්නාහු ය. එසේ උපන්නොත් මා වෙත අවුත් දන්වන්නැ යි කීමි. ඔහු ද මැනැවැ යි ගිවිස්සහ. එහෙත් තව ම ඒ කිසිවෙක් නො ආයේ ය, දූතයකු හෝ නො එවූහ. මෙයින් ද පරලොවක් නැතැ යි ම........ ය මට වැටහෙන්නෙ.

කුමර – රාජන්‍යයෙනි. මිනිස් හවුරුදු සියයෙක් තව්-තිසාහි දෙවියනට එක් රෑ දවලෙක් වෙයි. එබඳු දින තිසෙක් ඔවුනට මසෙකි. එසේ දොළොසක් ඔවුනට හවුරුද්දෙකි. එබඳු හවුරුදු දහසෙක් උනට පරමායු වෙයි. කුසල් කොට එහි උපන් ඔබ නෑ මිතුරෝ එහි උපන්නාහු 'අපි මෙහි දෙතුන් දිනක් දෙව්සුව විඳ ඉන් පසු පායාසිරාජඤ්ඤයන් වෙත ගොස් මෙහි පවත් කියම්හ'යි පමා වුවොත් ඔහු ඔබ ගේ ජීවිත කාලය තුළැ දී මෙහි එනු හැකි වන්නෝ ද?

පායාසි – භවත් කාශ්‍යපයෙනි, එය නම් වියැ හැකි නො වන්නේ ය. එහෙත් තවුතිසා නම් ලොවෙක දෙවියෝ ඇතැ යි ඔහු දීඝායුෂ්කග යි තමුරු කිහු ද? මෙය මම් නො පිළිගනිමි.

කුමර – රාජන්‍යයෙනි, පහැ සටහන් ද ඉර සඳ තරු ද නොදන්නා දුඅඳ මිනිසෙක් "කළු සුදු ආ පැහැය ඇතැ යි, ඉර සඳ තරුහු ඇතැ යි සමහරු කියත්. එහෙත් මම් ඒ නො දනිමි. එබැවින් අන්හු එය දක්නාහ යි ද නො පිළි-ගනිමි"යි කියා නම් ඔහු බස සරි යැ යි ඔබ පිළිගනින් ද?

පායාසි – ඒ දුඅඳහු ගේ බස පිළිගත යුතු නො වේ.

කුමර – රාජන්‍යයෙනි, ඔබ පෑ තර්කයත් ඒ දුඅඳහු ගේ බස බඳු ය. මේ මසැසින් පර ලොව දක්නැ හැකි නො වේ. බවුන් වඩන්නෝ දහන් උපදවා දිවැස ලබත්. ඔහු එයින් මෙ ලෝ

පර ලෝ දෙක ද ඕපපාතික සතුන් ද දකිත්. පර ලොව දක්ක හැක්කේ දිවැසිනි. මසැසින් නො වේ. එ බැවින් පර ලෝ ඇ මසැසට නො පැණෙන පමණින් නැතැ සි ඔබ ගත් ලබ්ධිය දුරලියැ යුත්තෙක.

5. **පායාසි** – භවත් කාශ්‍යපයිනි, ඔබ එසේ කිව ද ඒ පර ලොව් ඇ නැතැ සි ම මට සිතේ.

කුමර – එසේ කියනුයේ කවර හෙයින් ද?

පායාසි – කාශ්‍යපයිනි, ලොවැ ගුණදම් පුරන මහණ බමුණෝ වෙති. තමත් මරණින් මතු සුගති සැප ලබති යි හඳහන බැවින් මරණය යහපතැ යි සිතක් ඔවුනට පහළ විය යුතු. එසේ වතොත් ඔහු විෂ කා හෝ අවියෙකින් පැහැරගෙන හෝ බොටුවැ වැල ලා ගෙන හෝ ප්‍රපාතයකට පැන හෝ නැසෙන්නාහ. එහෙත් ඔහු එසේ නො කරති. එයින් මරණින් මතු තමනට සුගති සැප ලැබෙති යි ඔවුන් ද හඳහන බවෙක් නො පෙනේ. මෙය ද පර ලෝ නැතැ යි යන ආදි ලබ්ධි ගැන්මට කරුණු ය.

කුමර – රාජන්‍යයෙනි, පෙර බමුණකුට දෙ අඹු කෙනෙක් වූහ. එකියක පුතෙක් විය. ඔහු දසදෙළොස් විය පත් සෙමෙහි ඉතර බිරිය ද ගැබ් ගත්තු ඇය වදන්නට ළඟ කල්හි බමුණා මෙළේ ය. එවිට බමුණු කුමර කුඩා මවට කතා කොට, තම පියා සතු ධනය තමාට පවරනු මැනැවැ යි කී ය. එයසා බැමිණි කියන්නී, 'මා වදන තෙකට බලා පොරොත්තු වව. කුමරකු වැදීම් නම් හේ ද ධනයෙන් කොටසකට හිමි වන්නේ ය. කුමරියක වැදීම් නම්, ඕ තට බිරිය වන්නී යැ'යි කීවු ය. තෙවෙනි වර දක්වා ම බමුණු දරු ධනය ඉල්ලා ඇවිටිලි කෙළේ ය. තෙවෙනි වර බැමිණී සැතක් ගෙන යහන්ගබ වැද 'මෙහි කුමරෙක් ඇද්ද? කුමරියක් ඇද්ද?'යි බලමි යි සිය බඩ පළා ගත්ති ය. මෙයින් ඕ තම දිවියත් දරුවාත් සම්පතත් යන සියල්ල

නසා ගත්තී ය. රාජන්‍යයෙනි, බොහුමණීන් පර ලොවැ සැප ලබන්නට සිතනුයේ ඒ අඳබල් බැමිණිය සේ වැනැසෙන්නේ ය. නුවණැති ගුණවත් මහණ බමුණෝ ආයුකාලය ගෙවෙන තෙක් ඉවසා හිඳිත්. වඩ වඩා කල් ජීවත් වන්නාහු වඩ වඩා පින් කරන්නාහ. එ බැවින් පරලෝ නැති බවට ඔබ පෑ කරුණින් පර ලොවක් නැති සෙයෙක් නො දැක්වෙයි.

6. **පායාසි** – භවත් කාශ්‍යපයිනි, ඔබ එසේ කිව ද පර ලෝ ඈ නැතැ යි සිතන්නට තව කරුණු ඇත. මෙහි මගේ සේවකයෝ වරදකරුවකු ගෙනවුත් 'මොහුට දඬුවම් අණවන්නැ'යි මට කිහ. මම් උනට මූ නොමරා මහ සැළියෙක ලා එහි මුව වසා තෙත්සමින් වෙළා ඝන ලෙස මැටි බදුම ගසා, ඒ සැළිය ලිප තබා, ගිනි දල්වවු'යි කීම්. උහු ද එය කළහ. දැන් ඔහු මළා වියැ යුතු යැ යි හැඟුණු විට සැළිය උදුහොත් බාවා මැටිඅලෙවූ ඉවත් කරවා සැළියේ මුව හැර ඔහු ගෙන් නික්මෙන ජීවය දකිනුවට පිරික්සුම් සහිත ව බලා උනිමි. එහෙත් එවැන්නෙක් දිස් නො වී ය. මෙයින් ද 'පර ලෝ නැත' යන ආදි ලබ්ධිය නො හරිමි.

කුමර – රාජන්‍යයෙනි, ඔබ දවලෙක නිදන විටෙක සිත්කලු අරම් පොකුණු ඈ කිසිවෙක සිනෙන් ඇවිද්දු දුටුවා ඇද්ද?

පායාසි – එසේ ය.

කුමර – ඔබ ඒ සීනය දකින වේලේ ඔබේ සත්‍රීහු ඔබ වටා රකවල් ගෙන සිටියෝ ද?

පායාසි – එසේ ය.

කුමර – එ වේලෙහි ඔබ වටා සිටි ඒ සත්‍රීහු ඔබෙන් නික්මැ යන ජීවය[360] දුටුවෝ ද?

පායාසි – එය නො වියැ හැක්කෙකි.

360. පායාසි තෙම සීන දක්නා කලැ ඇති වන චිත්තාචාරය ජීව නමැ යි සලකන්නෙකි. එ බැවින් ඔහුගේ ගැන්ම පරිදි තෙරණුවෝ 'ජීව' යන්න වදාළහ.

කුමර – රාජන්‍යයෙනි, ජීවත් වන ඔහු ජීවත් වන ඔබේ ජීවය පිවිසෙන්නහු හෝ නික්මෙන්නහු හෝ නො දුටුහු නම්, මළාහු ගේ පිවිසෙන හෝ නික්මෙන ජීවයක් ඔබ කෙසේ දකින් ද? රාජන්‍යයෙනි, ඔබ ගත් වැරැදි ලබ්ධිය දුරු ලන්න.

7\. **පායාසි** – ඔබ එසේ වදාළ ද මගේ ලබ්ධිය නො හරින්නට මට කරුණු ඇත. දිනෙක මගේ සේවකයෝ සොරකු මා වෙත ගෙනාහ. 'තරාදියෙන් මොහු කිරා දුනු දියෙන් බෙල්ල වෙළා හුස්ම හිර කොට මරා යළිත් කිරවූ යැ' යි මම ඔවුනට ඇණැවීමි. ඔහු ද එය කළහ. මළ තැනැත්තේ පණ ඇති වැ සිටින සමයෙහි හැල්ලු ය, මෘදු ය, කම්මණ්‍ය ය. මළ පසු ඉතා බර ය, ඉතා දැඩි ය, අකම්මණ්‍ය ය. මෙයින් ද පර ලොවෙක්, පරලොවට මෙයින් සැව යනුයෙක් නැතැ යි, කම්විපාක නැතැ යි මට සිතෙයි.

කුමර – රාජන්‍යයෙනි, දවස මුළුල්ල ම ගින්නෙන් රත් වූ ගිනිදැල් සහිත යවට තරාදියෙන් කිරා, එය නිවුණු පසුත් කිරා බැලූවොත් එයින් කොයි වාරයේ ඒ යවට වඩා හැල්ලුත් මෘදුත් කම්මණ්‍යත් වේ ද? එය රත් වැ තුබුණු කල්හි ද? නැත, ශීත කල්හි ද?

පායාසි – එය ගින්නෙන් දිලිසෙන කල්හි ම වඩා හැල්ලු ද මෘදු ද කම්මණ්‍ය ද වේ. නිවුණු පසු වඩා බර ද තද ද අකම්මණ්‍ය ද වේ.

කුමර – රාජන්‍යයෙනි, එසේ ම මෙ සිරුර ජීවිතේන්ද්‍රියය ඇති කල්හි ම, උෂ්ණසුම ඇති කල්හි ම, සිත හා එක් වැ පවත්නා කල්හි ම, හැල්ලු ද මෘදු ද කම්මණ්‍ය ද වේ. මෙයින් ද පරලොව් ඇැ නැතැ යි යන්න සිඹ නො වෙ.

8\. **පායාසි** – භවත් කාශ්‍යපයිනි, මා ගත් දෘෂ්ටියට තවත් කරුණු ඇත. දවසෙක මගේ සේවකයෝ වරද කළක්හු මා වෙත ගෙනාහ. මම ඔවුනට 'මූ සිවි සම් මස් නහර ඇට ඇටමිදුලු නො බිඳ

මරවු' යැ යි ඇණැවීමි. උහු ද එසේ ම කළහ. ඔහු ගෙන් නික්මෙන ජීවය දකිමි'යි සිතා මැරෙනුවට පළමු ඌ උඩුකුරු කොට හෙළැවීමි, දකුණැලයෙන් ද හෙළැවීමි. වම් ඇලයෙන් ද හෙළැවීමි. කෙළින් සිටුවිමි, හිස යැටිකුරු කොට පා උඩුකුරු කොට සිටුවිමි, අතින් තැළැවීමි, කැටින් ගැස්විමි, දංඩෙන් තැළැවීමි, අවියෙන් පැහැරැවීමි, ඈත මෑත ඔබ මොබ පෙරළැවීමි. මේ කිසිවෙකිනුත් ඔහු ගෙන් නික්මෙන ජීවයක් නොදුටු බව ඔහු කීහ. ඔහු ඇස ඇත. රූප ද ඇත. එහෙත් රූප නො දකී. කන් නැහැය දිව කය ඇත. සද ගඳ රස හැපෙන දෑ ඇත. එහෙත් ඒ අරමුණු ගැන්මෙක් නැත. මෙයින් ඔහු මළ බව සබා වුවත් ඔහු ගෙන් නික්මුණු ජීවයක් නැති බැවින් පරලොවට ගිය දෑයෙක් නැත. මේ කරුණ ද සළකා පරලොවක් ඕපපාතිකයෙක් කම්පල-යෙක් නැතැ යි කියමි.

කුමර – රාජන්‍යයෙනි, පෙර සක්පිඹින්නෙක් සකක් ගෙන පිටිසර පෙදෙසකට ගියේ ය. ගමකට වැද ගම් මැදෑ දී මහ හඬින් සක පිඹ එය බිම තබා පැත්තකට වි උන්නේ ය. සක්හඬ ඇසුවෝ 'මේ කන්කලු හඬ කාගේ දෝ'යි එති රැස් වැ විචාළහ. 'සකේ හඬ යැ' යි සක් පිඹින්නා කී ය. එවිට ඒ මිනිස්සු සක වටා රැස් වැ 'පින්වත් සක, හඬව' යි කියමින් සක උඩුකුරු කොට ද යැටිකුරු කොට ද දකුණැල-යට ද වම්ඇලයට ද උඩු අතට ද යට අතට ද පෙරළූහ. අතින් කැටින් දංඩෙන් අවියෙන් පහර දුන්හ. ඔබ මොබ පෙරළූහ. එහෙත් සක හඬ නො නැංවිය. සක්පිඹින්නා එය දැක සක ගෙන තුන් වරක් පිඹ යැංගී ගියේ ය. එවිට මිනිසාත් උත්සාහයත් වාතයත් යන තුන හා සකෙහි සම්බන්ධය ඇති කලැ මැ ශබ්දය නැගෙන බවත් ඒ නැති කලැ ශබ්දය නො නැගෙන බවත් පිටිසැරියෝ දැනගත්හ. එ පරිද්දෙන් ම ජීවිතේන්ද්‍රියය උෂ්ණය සිත

යන තුනේ සම්බන්ධය ඇති කල්හි ම සිරුර සෑම් ඊම් ඈ ඉරියවු පවත්වයි. දැකීම් ඇසීම් ආදි කෘත්‍ය කරයි. ජීවිතේන්ද්‍රියාදිය එක් නොවූ කලැ ඉරියවු පැවැත්වීම් ආදිය නො කෙරෙයි. මේ කරුණුවලින් පරලොව් ඈ නැතැ යි යන්නෙක් සිඬ නො වේ. එබැවින් පරලොව නැත යන ආදි විසින් ගත් දෘෂ්ටිය හළ මැනැව.

9. **පායාසි** – ඔබ එසේ වදුරත් නුමුත් මා ගත් දෘෂ්ටිය නො හරිමි. දිනෙක මා වෙත ගෙනා වරද කළකුහු 'ජීවය දකිමි' යි හම ගැස්වීමි. ජීවය නො දිටිමි. සිවිය සිඳැවීමි. ජීවයක් නම් නො දිටිමි. මෙසේ පර ලොවට යන කිසිත් නැත්-තෙන් පරලොවක් නැතැ යි ආදීන් කියමි.

කුමර – රාජන්‍යයෙනි, පෙරැ වෙළෙඳ පිරිසෙක් ගිනි පුදන තවුසකු වසන අසපුවෙක රැයක් නවාතන් ගෙන පසු දා නැගී ගියේ ය. දවසෙක තවුසා කිසිවක් ලබනු රිසියෙන් ඒ වෙළෙඳුන් ගේ ගමට එළැඹියේ එක් තැනෙක උඩුකුරු වැ හෝනා අසරණ ළදරුවකු දිටී ය. 'මා බලා ඉන්දැදී මෙ තෙම නො මැරේ වා' යි තවුස් තෙම එ ළදරුවා සිය අසපුවට ගෙන ගොස් පෝෂිත කෙළේ ය. ඔහුට දස හවුරුදු වයස් වූ කල දවසෙක තවුසා ඔහු බණවා, 'දරුව, මම් දනව්වට යෙමි. මා එන තුරු තෝ ගිනි පුදව, ගින්න නිවුණොත්, — මේ වෑය ය, මේ දර ය, මේ ගිනි ගානා දඬු දෙක ය — මෙයින් ගිනි උපදවා ගිනි පුදව' යි කියා නික්මැ ගියේ ය. ඔහු ගිය පසු ඒ දරු කෙළිදෙලෙහි යෙදුණෙන් ගින්න නිවිණ. එවිට හෙ තෙම ගිනි උපදවමි' යි ගිනි ගානා දඬු දෙක වෑයෙන් සැස්සේ ය. ගිනි නො උපනි. එය දෙකට තුනට පැළී ය. එහෙත් ගිනි නො උපන. එය කැබැලි සියයක් වන තුරු ද පැළී ය. ගිනි නො උපන. වෙනෙහි ලා කොටා සුළඟෙහි පිඹ හළේ ය. ඉනුත් ගිනි නො ලද්දේ ය. දරු තෙම දනවු ගිය තවුසා පෙරළා ආ විට මේ සියලු පවත්

කී ය. එ විට තවුසා නොමගින් ගිනි උපදවනු නො හැක්කැ යි කියා, ගිනි ගානා දඬු දෙකක් ගෙන දරුවා බලාහින්ද්දී ම ගිනි ඉපැදූ ය. රාජන්‍යයෙනි, ඒ ළදරුවා සේ ඔබ ද නොමගින් පරලොව සොයති. මේ ලාමක දෘෂ්ටිය හැර පියන්න. මේ මිසදිට ඔබට බොහෝ කල් අවැඩ පිණිස පවතී.

10. **පායාසි** – භවත් කාශ්‍යපයිනි, ඔබ එසේ වදාල ද මා ගත් දිට හැරපියනු නො හැක්කෙමි, පසේනදි කොසොල් රජ ද, අන් රජ්හු ද මා පරලොවක් නැතැ යි දිටි ගෙන ඇති නියා දන්නාහ. මා මෙය හැරපුවොත් 'අඥ බලෙක. නොවියතෙක, වැරැදි දිටු ගෙන සිටියෙකැ' යි මට ගරහන්නාහ.

කුමර – රාජන්‍යයෙනි, මහ ගැල්සාත්තුවක් ගෙන ගමන් ගත් සාත්තුනායකයකුට දෙතුන් දිනෙකින් පසු කතරමහෙකදී මඩතැවැරුණු රෝද ඇති රියෙක නැඟ එන දුනු හී ගත් රත් ඇස් ඇති හෙල මානෙල් මල්දම් පලන් මොනොවට හත් වස්ත්‍ර ඇති කලුපැහැ මිනිසෙක් හමු විය. ගැල්නාවා ඔහු දැක තොරතුරු විචාරනුයේ, 'ඉදිරි මඟ වැසි ඇද්ද?' යි පුළුවුත. 'එසේ ය, ඉදිරි මඟ තණ දිය දර සුලබ ය. මේ ගැල්හි ඇති තණ දිය දර හැම ඉවත ලා හැල්ලු කොට ගවයන් නො වෙහෙසා පහසු ලෙසින් යන්නැ' යි අනෙකා කිව. ගැල්නාවා ද දුරදිග නොබලා එය පිළිගෙන සිය ගැල්හි තුබූ තණ දර ඈ ඉවත ලවා ගැල් හැල්ලු කරවා ගමන් ඇරැඹී ය. එහෙත් ඉදිරි මඟ කිසි දු තැනෙක දිය බිඳෙකුත් නො වී ය. අහරක් පැනක් නැත්තාහු සියල්ලෝ සසිත් පවසිත් මිරිකුණහ. කලාන්ත වැ හොත් ඔහු හැම යකුනට ගොදුරු වූහ. කලකට පසු අන් ගැල්නාවෙක් ද ගැල් පුරා බඩු පටවා එ මගින් ම ආ ය. පළමු ගැල්නාවා රැවැටූ තැනැත්තෝ මොහු හමුවට අවුත් 'ඉදිරි මඟ දිය දර ඈ ඇතැ යි ගැල් හැල්ලු කොට යව' යි කී ය. ගැල්නා තෙම

සිය පිරිස බණවා 'මෙ තෙම අප නෑයෙක් මිතුරෙක් නො වේ. මොහු බස කෙසේ පිළි-ගනුමෝ ද? තණ දර දිය බිඳකුත් ඉවත නො ලවූ. ඒ හැම තිබෙන පරිදි ම රැක ගෙන ගැල් පදවවු' යි ඇණැවී ය. ඔහු ඉදිරි මඟැ කිසිදු තැනෙක තණ හෝ දර හෝ දිය නො-දුටුහ. යකුනට ගොදුරු වූ පළමු පිරිස ගේ ඇටසැකිලි පමණක් දුටුහ. ගැල්නාවා සිය පිරිසට එහි තතු කියාදී සිය ගැල්හි පරණ වූ බඩු ඉවත ලවා කලින් ගොස් එහි වනසට පත්තන් ගේ ගැල්හි වූ අළුත් බඩු සිය ගැල්හි පටවා ගෙන නික්මැ ගොස් කතර ඉක්මැ මිනිස්පියට පැමිණියේ ය. රාජන්‍යයෙනි, අනුවණ ගැල්නාවා දුර දිග නොබලා ක්‍රියා කොට මහත් වනසට පැමිණියා සේ ඔබ ද නොනුවණින් ක්‍රියා කොට වනසට පැමිණෙති. අනුවණ ගැල්නාවා ගේ පිරිස සේ ම ඔබ බස් ගන්නෝ ද වැනැසෙති. එ බැවින් ඔබ ගෙන ඇති මිසදිට හැරපියනු මනා ය.

11. **පායාසි** – ඔබ වදළත් මෙය කළ නො හැක්ක. ඔබ වදළා කිරීමෙන් පසේනදී කොසොල් ආදිහු මා නිගන්නාහ.

කුමර – රාජන්‍යයෙනි, හූරන් රක්නා මිනිසෙක් ගමකට ගියේ එහි ගම් කෙළවර අසුචි රැසක් දිටි. තමා ගේ හූරනට ගොදුරු පිණිස මෙය ගෙන ගියොත් මැනැවැ' යි හේ සිතී. ඉක්බිති තමා උතුරුසළුවෙහි වියැළි අසුචි පොදියක් බැඳැ හිසැ තබා ගෙන ගියේ ය. මගදී හේ මහ වැස්සකට හසු විය. වැස්සෙන් තෙමී අසුචි දිය වී වැගුරුණේ ය. ඔහු මුළු සිරුර අසුචියෙන් වැකුණේ ය. මිනිස්සු ඔහු දැක 'හෙම්බල, ඇඟ පුරා පෙරෙන මේ අසුචි පොදියක් හිසින් ගෙන යනුයෙහි තෝ පිස්සෙහි දැ?' යි ගැරැහූහ. එවිට හෙ තෙම 'හෙම්බල, මෙහි පිස්සෝ තෙපි ය. තොප කුමක් කිව ද මගේ සූරුතල් හූරනට කෑම වුව මනා නො වේ දැ?' යි කී ය.

රාජන්‍යයෙනි, ඔබ බස ඒ අසුචි ගෙන ගිය මිනිසා ගේ කතාව බඳු ය. ඔබ තෙල ලාමක දෘෂ්ටිය හැරපියනු මනා ය.

12. **පායාසි** – කාශ්‍යපයිනි, ඔබ කෙසේ වදාළ ද මා දිට දුරු කරනු නො හැක්ක. එය දුරුලුවොත් පසේ-නදි කොසොල්රජ ආදීන් ගෙන් මට ගැරහුම් වෙයි.

කුමර – රාජන්‍යයෙනි, පෙරැ දෙදෙනෙක් පසැටින් කෙළියහ. එකෙක් පැරුදුණ ගුළිය ගිලි. එය දුටු අනෙකා 'යහළු, තෝ දිනහි. පසඇට දෙව, බිලියම් කරත්නෙමි' යි පසැට ඉල්ලා ගෙන විෂ යොදා යළි දී කෙළිය පටන් ගත. පැරුදි තැනැත්තේ පළමු සේ ම පසැට ගිල්-ලේ ය. එවිට අනෙකා තියුණු විෂ යෙදූ පසැට ගිලිනුයේ එහි විෂ ඇති බව නො දනි. හෙම්බල, පසැට ගිලපිය. පාප ධූර්තය ගිලපිය, තට එහි දරුණු පල ඇති වන්නේ යැ' යි කි ය. රාජන්‍යයෙනි, ඔබ ඒ සොර අක්‍ෂධූර්තයා වැන්න, තෙල ලාමක දෘෂ්ටිය හැරපියන්න.

13. **පායාසි** – භවත් කාශ්‍යපයෝ එසේ වදාරති. එහෙත් මා දෘෂ්ටිය හැරපුවොත් මට ගරහන්නෝ රටේ එමට ය.

කුමර – රාජන්‍යයෙනි, මිතුරෝ දෙදෙනෙක් කිසි ධන-යක් සපයා ගනු රිස්සෝ ධනයෙන් වැඩුණු දනව්වක් බලා නික්මුණහ. ගමකට වන් ඔහු හනවැහැරි ගොඩක් දැක එයින් මිටි දෙකක් බැඳ ගෙන නික්මුණහ. ඔහු අන් ගමෙකදී හනහුල් රැසක් දුටුහ. එකෙක් 'හනවැහැරි ඉවත ලා හනහුල් ගෙන යම්හ' යි කියා හනහුල් මිටියක් බැඳගත. අනෙකා 'මේ හන මිටිය බොහෝ දුරු සිට ගෙනාමි. එබැවින් එය ඉවත ලිය නො හෙමි' යි ඒ ගෙනා හනමිටිය ම කරු ගසා ගෙන ගියේ ය. අන් ගමෙක දී හනරෙදි රැසක් ඔහු දුටුහ. හනහුල් ගෙනා තැනැත්තේ හුල්බර බිම හෙලා හනරෙදි මිටියක් බැඳ ගත. අනෙකා 'මෙය දුරු සිට

ගෙනායෙමි' යි හනම්විය ම කර ගැසාගෙන ගියේ ය. තව ගමෙකදී ඔහු කොමුවැහැරි රැසක් දුටුහ. හනරෙදී ගෙනායේ එය බිමැ ලා කොමුවැහැරි බරක් බැඳ ගත. අනෙකා පළමු හනම්විය ම කර ගැසා ගෙන ගියේ ය. තව දුරක් ගිය ඔහු කොමුපිලි රැසක් දුටුහ. කොමුවැහැරි ගෙනා තැනැත්තේ ඒවා බිමැ ලා කොමුපිලි බරක් බැඳ ගත. තවත් ඉදිරියට ගිය හෙ තෙම මගදී ලැබුණු කපුරැසක් දැක එය ද, ඉන්පසු කපුපිලි ලැබ එය ද, එයට පසු කලුලොහො ද, එයට පසු තඹ රැසක් ද, එයින් පසු කලු ඊයම් ද, එයිනික්බිති සුදු ඊයම් රැසක් ද, එයින් පසු රිදී රැසක් ද, එයට පසු රන්කාසි රැසක් ද දැක පිළිවෙළින් නොඅගනා දැ බිම ලා වඩ වඩා අගනා දැ මිටි බැඳ ගනුයේ අවසනැ රන්මසු බරක් බැඳගෙන ගියේ ය. අනෙකා ඒ හැම දැක දැකත් 'මේ හනම්විය බොහෝ දුර යිට ගෙනාමි, මෙය ඉවත ලියැ නො හෙමි' යි පළමු හනම්විය ම කර ගැසා ගෙන ගියේ ය. ඔවුන් සිය ගමට පෙරළා පැමිණි කලැ හනම්විය ගෙන ආවහු ගේ නෑමිතුරෝ මුසුප්පු වූහ. රන්මසු ගෙනාවහු ගේ නෑමිතුරෝ ඔහු ප්‍රීතියෙන් පිළිගත්හ. රාජන්‍ය යෙනි, ඔබ හනම්විය කර ගැසා ගෙන ගියාහු බඳු වනු නො යෙදෙයි, තෙල ලාමක දෘෂ්ටිය හැර පියනු මනා ය.

14. **පායාසි** – පින්වත් කාශ්‍යපයිනි, ඔබ ගේ පළමු උපමායෙන් ම මම් පැහැදිණිමි. එහෙත් ඔබේ උපමා සහිත විසිතුරු කතාව අසනු රිසියෙන් ඔබ බස නො පිළිගන්නක්හු මෙන් මෙතෙක් දුර කතා කෙළෙමි. වහන්ස, ඔබේ දෙස්ම ඉතා මැනැව, ඉතා අගනේ ය. යැටිකුරු කොට තුබුණක් උඩුකුරු කරන්නක්හු සේ, වැසුණු දැයක් වැසුම් හැර විවරන්නක්හු සේ මංමුළාවූවක්හට පාර පෙන්වන්නක්හු සේ, ඇස් ඇතියනට රූප දක්කැකි වනුවට පහනක් දල්වන්නක්හු සේ, ඔබ විසින් සත්‍යය මැනැවින් පැහැදිලි කොට දක්විණ. ඒ මම් මහණ

ගොයුමන් වහන්සේ ද ඔබ දහම ද, ඔබ අරී සඟගණ ද සරණ යෙමි. අද පටන් කොට මා සරණ ගිය උවසකු කොට සලකත් වා, මම මහ දනක් දෙනු රිස්සෙමි. පින්වත් කාශ්‍යපයන් වහන්සේ එහි ලා මට අනුශාසන කෙරෙත් වා

කුමර – රාජන්‍යයෙනි, ප්‍රාණවධ කොට කැරෙන යාගය අනුසස් නැත්තේ ය. මිථ්‍යාදෘෂ්ටි මිථ්‍යා- කල්පනා මිථ්‍යාවචන මිථ්‍යාකර්මාන්ත මිථ්‍යාජීව මිථ්‍යාව්‍යායාම මිථ්‍යාස්මෘති මිථ්‍යාසමාධි ඇති පුගුලනට කළ පූජාව මහත් පල මහත් අනුසස් ඇත්තේ නො වෙයි. තවානෙක නො ලූ නිසරු බීජ නිසරු කෙතෙක වපුලොත් වැස්ස ද නිසි සේ නො ලැබුණොත් එය වැඩී සරු පල උපදවන්නේ ද? ගොවියා එයින් පොහොසත් වන්නේ ද?

පායාසි – භවත් කාශ්‍යපයිනි, එයින් සරු පලදාවෙක් නො වේ. ගොවියාට ද මහත් වැඩෙක් නො වේ.

කුමර – රාජන්‍යයෙනි, එසේ ම මිථ්‍යාප්‍රතිපත්ති ඇත්ත- නට දෙන දන මහත් පල ගෙන නො දෙයි. සම්‍යග්දෘෂ්ටි ආදි විසින් වූ මනා පිළිවෙත් ඇත්තනට දුන් දන ම මහත් පල උපදවයි. සරු බිමැ සරු බීජ වපුළ කලැ වැස්ස ද සුදුසු පරිදි ලදහොත් සරු පලදාවෙක් වෙයි ද?

පායාසි – එසේය, භවත් කාශ්‍යපයිනි.

කුමර – රාජන්‍යයෙනි, ගුණවත් උතුම් පුගුලනට දුන් දනත් එසේ ම මහ පල ගෙන දෙයි''.

මෙයට පසු පායාසිරාජඤ්ඤ බමුණු මහණුනට බමුණනට දුගියනට මගියනට යදියනට මහ දන් පැවැත්වී ය. මරණින් පසු හේ සිවු මහ රජයෙහි සේරිස්සක නම් රිදී විමනෙක උපන.

[මෙහි පායාසිරාජඤ්ඤයා හේ දශවස්තුවක මිථ්‍යාදෘෂ්ටිය ද කුමරකසුප් මහතෙරුන් කරුණු දක්වා එය බිඳැලූ නියා ද, අවසනැ පායාසිහු සස්නැ පැහැදුණු වග ද දැක්වි.ණි.[361]]

මහාවග්ගය නිමියේ ය.

361. මෙයට මිදක් සමාන ජෛන සූත්‍රයෙක් ද ඇත. උපග්‍රන්ථය බලනු.

24. පාථික සූත්‍රය.

එක් සමයෙක බගවත් බුදුරජුහු **මල්ල** රට, **අනුපිය** නිගමය නිසා වෙසෙති. ඔබ දවසෙක පෙරබත් වේලේ ඒ නිගමය බලා වඩනාහු පිණ්ඩපාත ගමට තව කල් නො පැමිණියෙන් **භග්ගවගොත්ත** පිරිවැජියා ගේ අරමට වැඩියහ. පිරිවැජි තෙම ඔබ මහත් ආදරයෙන් පිළිගෙන තමා අස්න ඔබට පණවා දී තෙමේ මිටි අස්නෙක හිඳ ගත. එසේ හුන් හෙ තෙම ළඟ දිනෙක ලිච්ඡවිපුත්‍ර **සුනක්ඛත්තයා** අවුත් තමා භාග්‍යවතුන් වහන්සේ ගේ සවු බව හළ සි කී පවත් පවසා 'ඒ සබා දැ'යි බුදුරජුන් අතින් විචාළේ ය. බුදුරජුහු එහි සියලු පවත් විස්තර කරන්නාහු ඔහුට දහම් දෙසූහ:

2. "භාග්ගවය, දිනෙක සුනක්ඛත්තයා මා වෙත අවුත්, ඔහු මා කෙරෙන් ඉවත් වැ යන බව කී ය. 'මගේ ඉල්ලීමෙන් හේ මා වෙත විසී දැ?'යි ඇසූ කල, 'නැතැ'යි හේ කිව. 'මා වෙත ම වසන ලෙසට ගිවිස ගෙන හේ මා වෙත විසී දැ?'යි ඇසීමි. එය ද 'නැතැ'යි හේ කිව. 'එසේ කල මෙහි කව-රෙක් කවරකු හැරපියන්නේ ද? හැර පියන කෙනෙක් හෝ හැරපියනු ලබන කෙනෙක් හෝ නැතැ'යි කියා ඔහු ගේ කථාවේ දෙස පෙන්වා දිනිමි.

මා උතුරුමිනිස් දැමින් ඉදුපෙළහර නො පාති යි ද, එය ඔහු මා කෙරෙන් ඉවත් වැ යැමට කරුණු යි ද හේ පැවැසී ය.

'උතුරුමිනිස්දැමින් පෙළහර කරන්නෙමි' යි 'එ බැවින් මා වෙත වසන්නැ' යි මා තොප හා පොරොන්දුවකට බැඳුණා ඇද්ද? නැත හොත් 'මම් ඔබ වෙත වසමි. මට උතුරුමිනිස් දැහැමින් පෙළහර පෑව මැනැවැ' යි තොප මා පොරොන්දුවකට බැඳගත්තා ඇද්ද?' යි මම් ඔහු විචාළෙමි. 'එ වැන්නෙක් නො වී' සැ යි හේ කිව. එ විට ඔහු මා පෙළහර නො පාති යි මට දෙස් පවරනු නො සරි බව හෙළි කොට කියා 'පෙළහර කිරීම හෝ නොකිරීම දුක්නැස්ම පිණිස පවත්තේ දැ?' යි ඇසීමි. 'නැතැ' යි හේ කිව. දුක් නසන කාරියට පෙළහරෙන් වන වැඩක් නැති කල 'පෙළහර නො පාති' යි, 'එ හෙයින් හැර යෙමි' යි මට දෙස් නඟනු නොසුදුසු බව කීමි. එ විට ලෝකෝත්පත්ති-වංශකථාවා මා නො දෙසීම ඔහු මා වෙතින් ඉවත් වැ යන්නට හේතුවක් කොට හෝ කියා පෑ' ය. 'ලෝකෝත්පත්ති කථාව කියා දෙමි' යි පොරොන්දුවකට මා

බැඳුණා ඇද්ද? නැත හොත් තොප එසේ පොරොන්දුවකට මා බැඳගත්තා ඇද්ද?' යි ඇසීමි. 'නැතැ' යි හේ කී ය. 'ලෝකෝත්පත්ති වංශකථාව දැනගැන්ම දුක් නැසීමට කරුණු වේ දැ?'යි ඇසීමි. 'නැතැ' යි හේ කී ය. 'එසේ කලැ එය මා නො කියතැ යි ඔහු මට නැඟු ද්වේෂය කරුණු නැතිව කල එකෙකැ යි නොසුදුසු එකෙකැ' යි කීමි. කලකට පෙරැ වැදූගම්හි (විසල්පුරැ) දී තෙරුවන් ගුණ වණා දුන් පැවිද්ද හැර ගිය විට 'මෙ තෙම මහණදම් රක්නට නොසමත් බැවින් උපැවිදි වැ ආයේ යැ' යි රටෙන් දෙස් අහන්නට වන බව් ද කීමි. එහෙන් හේ සස්නෙන් ඉවත් වැ ගියේ ය.

3. භාවගීය, කලකට පෙරැ මම් **බුලු** රටැ **උත්තරකා** නිගමයෙහි වසනුයෙම් දිනෙක සුනක්ඛත්තයා හා පිඩු පිණිස ගම් වතිමි. මඟ දී හෙ තෙම බලු-වත් රකිමින් හොත් **කෝරක්ඛත්තිය** නම් නිරුවත් තිවටක්හු දැක මේ රහතෙකැ' යි සිතී ය. මම් ඔහු සිත දැක ඔහුට වූ සිතිවිල්ලෙහි වරද කීමි. 'වහන්සේ රහත්බවට මසුරුකම් කරන සේක් දැ?' යි හේ පුළුවුත. රහත්ගුණයෙහි මා මසුරු නොවන බවත් නොරහතකු රහතකු කොට සිතාගැන්ම වරද බවත් මම් කීමි. ඔහුට වූ මිථ්‍යාමතය අවැඩට හේතු වන බැවින් එය දුරැ ලත්නැ යි අවවාද කෙළෙමි. ඔහු රහතකු කොට ගත් කෝරක්ඛත්තියයා සත්වන දා අලසකරෝගයෙන්[362] මැරී කාලකංජක අසුරයෝනියෙහි උපදනා බවත් ඔහු සිරුර **බීරණත්ථම්භක** සොහොනට ඇද දමනු ලබන බවත්, රිසි නම් එහි ගොස් ඔහු ගතිය ඒ මළකඳින් අසා දත හැකි බවත් කීමි.

4. සුනක්ඛත්තයා ගොස් මා කී බස් සියල්ල කෝරක්ඛත්තියයාට සැල කෙළේ ය. මා කී සේ නොවන්නට කන බොන සැටි ද ඉගැන්වී ය. දවස් ද ගැන්තේ ය. එහෙත් කෝරක්ඛත්තියයා සත්වන දා අලසක රෝගයෙන් මළේ ය. ඔහු මළසිරුර බීරණත්ථම්භක සොහොනට ඇද දැමූහ. සුනක්ඛත්තයා ගොස් මළසිරුරැ පිටට අත ගසා උපන් තැන් ඇසී ය. එය නැගිට තමා අසුරයොනැ උපන්බව් කියා වැද හොත්තේ ය.[363] සුනක්ඛත්තයා අවුත් වැද පසෙක උන් කලැ 'මා කී සේ වී ද නො වී දැ? යි, 'උතුරුමිනිස්දහමින් පෙළහර

362 අලසකරෝග යනු යැපිබඩ වාතය පිරීමෙන් හෝ යැපිබඩ ඉදිමීමෙන් වන විශූචිකාරෝගයෙකි. 363. අසුරනිකායෙහි ඉපැද සිටි කෝරයා බුදුරජුහු ඉදුබෙරලන් ගෙන්වා මළසිරුරට ආමිෂට කොට ඔහු ඉපිද ඉන්නා අත්බවෙහි තතු ඔහු ලවා කියැවූහ.

කැරිණි ද? නැද්ද?' යි ඇසීමි. මා කී සේ ම ඒ සියල්ල වී යැ යි ද උතුරුම්නිස්දහමින් පෙළහර කැරිණැ යි ද හේ කී ය. එසේ කලැ උතුරුම්නිස්දහමින් පෙළහර නො කරතැ යි මට නැඟූ දෙස නොකරුණේ කළ එකෙකැ යි පෙන්වාදිනිමි. එහෙත් එය අසා ම හේ ඉවත් වැ ගියේ ය.

5. භාගීව ය, එක් කලෙක විසල්පුරැ මහවෙනෙහි කුළාර හලෙහි වෙසෙමි. එ සමයෙහි එ නුවරැ ව්‍රත පද සතක් සමාදන් වැ ගත් කළාරමට්ටුක නම් නිවටෙක් ලාභයෙන් යශසින් අක්පත් වැ වෙසෙයි. ඔහු ගේ ව්‍රතපද නම්: නිරුවත් වැ හිඳීම, රා මස් විනා බත් හෝ කොමු නොවැළැඳිම, පැදුම් දෙසින් උදේන දෙවොලින් එපිට නොයෑම, පැළදිගින් සත්තම්බ දෙවොලින් එපිට නොයෑම, උතුරුදිගින් බහුපුත්‍රක දෙවොලින් එපිටැ නොයෑම යන සත යි.

සුනක්ඛත්තයා ඔහු වෙත ගොස් ප්‍රශ්න ඇසී ය. හේ උත්තර දීගත නුහුනුයේ කිපිණ. සුනක්ඛත්තයා 'රහතන්හට වරදක් කෙළෙමි' යි කමාව යැදී ය. මත්තෙහි ප්‍රශ්න නො විචාරණ නියාවට ගිවිස්වා හේ කමාව උන. මෙවැනි දෑ කොට අවුත් මා වෙත හුන් සුනක්ඛත්තයාට එවැන්නකු රහතකු කොට ගැන්මෙහි වරද පැවැසීමි. 'වහන්සේ රහත්බවට මසුරු සේක් දැ?' යි හේ ඇසී ය. රහත්බවට මා මසුරු නොවන බවත් එහෙත් නොරහතකු රහතකු කොට ගැන්ම නොමඟට වැටෙනුවට ද අවැඩට ද හේතු වන බවත්, ඔහු රහතකු කොට පිළිගත් කළාර මටඨුකයා නොබෝ කල්හි ම තමා රක්නා ව්‍රත හැරපියා ලාභයෙන් යශසින් ද පිරිහී ඇවිදිමින් සිට මියෙන බවත් කීමි. මා කී පරිදි ඒ සියල්ල විය එයින් පසු සුනක්ඛත්තයා මා වෙත අවුත් හුන් කලැ 'කළාරමටඨුකයා පිළිබඳ වැ මා කී දෑ එසේ ම වූයේ නො වේ දැ?' යි ඇසීම. 'එසේ ම වී යැ' යි හේ කී ය. මෙසේ කලැ පෙළහරෙක් කැරිණි ද, නැද්ද?' යි ඇසීමි. පෙළහරෙක් කැරිණැ යි හේ පිළිගත. එබැවින් මා පෙළහර නොකරන කරුණින් ඔහු මගෙන් ඉවත් ව යන බව කියන කතාව වැරැදි බව ඔහුට පෙන්වා දිනිමි. එයත් අසමින් ම ය ඔහු බැහැර ගියේ.

6. භාගීවය, එක් කලෙක විසල්පුර අසල මහවෙනෙහි කුළාරහල් වෙහෙරැ වෙසෙමි. එ කලැ පාථිකපුත්‍ර නම් නුවටෙක් ලාභාග්‍ර ව යශෝග්‍ර ව එ නුවරැ වෙසෙයි. හේ මා හා ඥාන වාදයෙන් වාද අරඹන බවත් මා එක් පෙළහරක් කරන කලැ

තමා දෙ පෙළහරක් කරන බවත් කියා හැව්දි. ඔහු එසේ කියන පවත් සුනක්ඛත්තයා අවුත් මට දැන්විය. ඔහු තමන් ගේ වචන ද ඒ සිත ද ඒ දෘෂ්ටිය ද නොහැරපියා මා හමුවට එනු නො හෙන බව මම් කිමි. 'ඔවැනි බස් නො වදුරන්නැ' යි හේ කී ය. 'එසේ කියනුයේ කවර හෙයිනැ?' යි ඇසිමි. 'පාටිකපුත්‍රයා සිය වචනයත් සිතත් දෘෂ්ටියත් නො හැරපියා ම අවොත් ඔබ බස බොරු වියැ හැක්කැ' යි හේ කී ය. තථාගතයන් බොරු වන බස් හිස් බස් නො කියන බව ඔහුට කිමි. 'වහන්සේ එසේ වදුරන්නේ පාටිකපුත්‍රයා ගේ සිත දැන ගෙන ද? නැත හොත් දෙවියකු ගෙන් අසා දැන දැ?' යි හේ පුළුවුත. 'ඒ දෙපරිද්දෙන් ම යැ' යි කියා, මා සිනින් ඔහු තතු දත් සැටින් නොබෝදා මියැ තව්තිසාහි උපන් අජිත නම් ලිච්ඡවි සෙනෙවියා අවුත් එ පවත් මට කී සැටින් මම් කිමි. ඉක්බිති බොජුනින් පසු දිවාවිහරණයට පාටිකපුත්‍රයා ගේ අරමට මා යන බව ද පැවැසීමි. එ විට සුනක්ඛත්තයා මහණ වහන්දෑ දෙදෙනෙකුන් ගේ පෙළහරෙක් වන්නේ යැ' යි කැන් බමුණුගැහැවියනට ද තොටුවනට ද මහණුනට ද දන්වා හැව්ද්දේ ය.

ඉක්බිති පසුබත්හි පාටිකපුත්‍රයා ගේ අරමට ගියෙමි. කැන් බමුණු ඇ බොහෝ දෙනා එහි රැස්වූ හ. එයසා පාටිකපුත්‍රයා තැති ගෙන තින්දුකඛාණුක පිරිවැජ්ජහු අරමට පලා ගොස් වනහඬුයෙක ගල්පෝරුවෙක ලැග හුන්නේ ය. මිනිස්සු එපවත් අසා ඔහු කැඳවාගෙන එන්නට පුරුෂයකු යැවූහ. එනු තබා හුන් තැනින් නැඟී සිටින්නට ද හේ නොසමත් විය. 'එමි එමි' යි කියන්නේ ම ගල්පොරුව මත ගැටෙයි. දූත පුරුෂ නොයෙක් සේ කියාත් ඔහු ගෙන එනු නොහැකි ව පෙරළා අවුත් එ පවත් දැන්වී ය.

7. එක් ලිච්ඡවි ඇමැත්තෙක් 'ඔහු ගෙනෙන්නෙමි' යි නැඟී ගියේ ය. ඔහු ද බැරි ව පෙරළාආ කළැ පිරිවැජියක්හු අතැවැසි **ජාලිය** නමැත්තෙක් ද ගොස් ඔහු ගෙනෙන්නට යත්න කෙළේ ය. එහෙත් පාටිකපුත්‍රයා නො එන්නේ ම ය. එවිට ඒ ජාලියයා කිපී 'සිංහයකු කා ඉතිරි කොට ලූ දෑ කා තර වූ සිවලක්හු සිංහනාද කරන්නට තැත් කළහු සේ, බුදුනට දුන් දැසින් ඉතිරි වූ දෑ කා උඩඟු වූ තා බුදුන් හා ගැටෙන්නට සිතුවා නො යෙදේයැ' යි නොයෙක් කරුණු කියා ගරහා ද උන් තැනින් උහු නගා සිටුවනු නො හැකි ව හැරී ආයේ ය. අවුත් සියල් පවත් සැළ කෙළේ ය. එ විට 'සිය මිගදෙඩුමත් සිතත්

දෘෂ්ටියත් නොසියා මා වෙත ඉයැ නො හැක්කැ' යි කියා පැමිණ සිටි පිරිසට දහම් දෙසා තෙදකිසුණු සමවත් සමවැද අහස් නැඟ පෙළහර පා කූළාරහල් වෙහෙරට ම පෙරළා ආමි. එ වේලෙහි අවුත් වැඳ සිටි සුනක්ඛත්තයා බණවා 'පාටිකපුත්‍රයා පිළිබඳ වැ මා කී දෑ එසේ ම වි ද නො වී දෑ?' යි ඇසිමි. 'ඒ එසේ ම වී' යැ යි හේ පිළිගත. 'පෙළහර කැරිණි ද? නැද්ද?' යි ඇසිමි. 'පෙළහර කැරිණැ' යි හේ කී ය. මෙසේ කලැ උතුරු මිනිස්දමින් පෙළහර නො කෙරෙති යි මට නිකරුණේ දෙස් නැඟු සේ නො වපි යැ යි කීමි. සුනක්ඛත්තයා බැහැර ගියේ එය ද අසමින් ම ය.

8. භාග්ගවය, ලෝකෝත්පත්තිවංශකථාව ද දනිමි. එයින් මත්තෙහි ද සර්‍වඥතාඥනය තෙක් සියල්ල ම දනිමි. එහෙත් ඒ මා දන්නා දෑ තෘෂ්ණා දෘෂ්ටි මාන විසින් පරාමර්‍ශන නො කෙරෙමි. එසේ වූ මා විසින් මා තුළැ ම ක්ලෙශනිර්‍වාණය දක්නා ලදි. යමෙක දැනීම තථාගතයනට අනයව්‍යශනයකට නොවැටෙනුවට හේතු වේ නම් එය මේ තමා තුළැ වූ කෙලෙස් නිවීම දැනගැනීම ය.

භාග්ගවය, බඹහු විසින් ඉසුරුහු විසින් ලොව මැවිණැ යි පණවත්නවුන් ගේ ලෝකෝත්පත්තිකථාව කෙසේ දෑ?' යි මා ඔවුන් අතින් ඇසූ විට උත්තර දීගත නො හී ඔහු මා අතින් ම එහි විස්තර පුළුවුසිත්. මම් ඔවුනට මෙසේ කියමි:

"දික් කලෙකින් පසු ලොව නැසෙසි. එ සමයෙහි සත්හු බෙහෙවින් ආභස්සර බඹලොවැ[361] උපදිති. යළි දු ලොව ඇති වූ පසු අහසැ හිස් බඹවිමනෙක් පහළ වේ. ආභස්සර-යෙන් පින් හෝ ආයු ගෙවී ච්‍යුත වූ කිසිවෙක් ඒ හිස් බඹ විමනෙහි ඕපපාතික වැ උපදී. හේ ධ්‍යානමය ප්‍රීතිය ම අහර කොටැති ව සවයම්ප්‍රභ ව ආකාශචාරී වැ ශුභස්ථායී ව වෙසෙයි. දික් කලක් හුදෙකලා වැ වුසූ ඔහුට නවත් සත්හු ඇත් නම් මැනැවැ යි සිතෙයි. කල් යැමෙන් ආභස්සරයෙන් ච්‍යුත වූ තව ද සත්හු එහි කලින් කලැ උපදිති. පළමු ඉපැදැ සිටියේ 'මා සිතූ බැවින් මොහු උපන්හ. මම් සිනින් මොවුන් මැවීමි'යි දෘෂ්ටි ගනී. පසු ව උපන්නෝ ද ආයුෂයෙන් වර්‍ණයෙන් තේජ-සින් තමනට වැඩී සිටි පූර්‍වපුරුෂයා දක ඔහු මැවුම්කරු බඹහු කොට ඊශ්වරයා කොට සලකත්. කලකට පසු උන්

361. මෙහි මූල පිටැ බ්‍රහ්මජාලසූත්‍රය බලනු. 362. ශුභස්ථායි = ශෝභන උයන් විමන් ආදියෙහි සිටින්නෝ, ශුභ වර්‍ණාදිය දරන්නෝ.

ගෙන් කෙනෙක් එයින් සැව මිනිස් ලොවැ උපදිති. ඔවුන් ගෙන් ද කෙනෙක් දහන් වඩා පෙර ජාතිය දක්නෝ, එයින් එපිට නො දක්නෝ, ඒ පූර්වපුරුෂයා තව ම එහි හිඳුනා ද දැක, 'හේ මහබඹ ය, ඉසුරා ය, නිත්‍ය ය, ශාශ්වත ය, අපි වනාහි අනිත්‍යයම්හ, මැරෙන සුල්ලම්හ'යි සිතා ඒ දෘෂ්ටිය පණවත්.[363] මේ ඊශ්වරනිර්මාණවාදය මුලින් ම ඇති වූ සැටි යැ'යි කියමි. මේ කථාව අසා ඔහු මා කියේ ඔවුන් අසා ඇති පරිදි මැ යැ යි පිළිගනිත්.

9. භග්‍රවය, ඇතැම්හු ක්‍රීඩාප්‍රදෝෂ මූලක ලෝකෝත්පත්ති වංශකථාවක් පණවත්. 'ඔවුන් ගේ කථාව සබා දැ?'යි මා ඇසූ විට සැබැවැ'යි ඔහු පිළිගනිත්. 'ක්‍රීඩාප්‍රදූෂ්‍යයන් මුල් කොටැති ලෝකෝත්පත්තිකථාවක් කෙසේ ඇති වූවක් කොට ඔහු පණවත් දැ?'යි අසමි. උත්තර දිය නොහී ඔහු මා අතින් ම විචාරත්. මම් ඊනට මෙසේ කියමි: ක්‍රීඩාප්‍රදූෂ්‍ය නම් දෙව්වෙසෙසෙක් ඇත.[364] කෙළිසුවෙහි අධික ව ඇලුණු ඔහු සිහිමුළායෙන් අහර ගත යුතු වේලාව ඉක්මෙත්. එක් බොජුන් වේලක් නුමුදු වැළැකුණු පසු නිරතුරු අහර පැත් ගත්ත ද ඔහු මියෙත් ම ය. මෙසේ දෙව්ලොවින් සැව මෙහි ඉපිද දහන් වැඩූ කිසිවෙක් පෙර ජාති සිහි කරනුයේ, පෙර අත්-බැවින් එ පිට නො දැක කරුණු නො අතට සිතා ගෙන ඒ දෙව්ලෝහි එකලැ සිටියෝ තව ම ජීවත් වෙති. අපි වනාහි මියගියම්හ' යි සිතා 'එහි අධික වේලා කෙළිසුවෙහි නො ඇලුණුවුන් ගේ සිහි මුළා නො වේ. මෙසේ හෙයින් ඔහු නිත්‍ය හ, ශාශ්වත හ. ඇපි වූ කලී ඉතා බොහෝ වේලා කෙළිසුවෙහි ඇලුණමෝ මලම් හ, ඒ අපි අනිත්‍යයම් හ, අශාශ්වතයම් හ' යි පණවති. මෙසේ සිය ඇදුරන් ඉගැන්වූ ලෝකෝත්පත්තිවංශ-කථාව තෙපි පණවහු දැ?' යි ඇසීමි. 'එසේ ය, ආයුෂ්මත් ගෞතමයන් කියන පරිදි ම අපි සිය ඇදුරන් ගෙන් අසා දතුම්හ' යි ඔහු කියත්.

10. භාග්‍රවය, මනඃප්‍රදෝෂමූලක ලෝකෝත්පත්තිවංශ-කථාවක් ඇතැම් මහණබමුණෝ පණවත්. එය කෙසේ වූයෙක් දැ? යි ඔවුන් අතින් විචාළ විට ඔහු උත්තර දීගත නොහී මා ම විචාරත්. මම් ඔවුනට මෙසේ කියමි: මනඃප්‍රදෝෂක (මනෝපදූසික) නම් දෙවි කෙනෙක් වෙති. ඔහු මෙරමා යසිසුරු දැක ඉවැසිය නොහී කෝපාග්නියෙන් උනුන් දෙස බොහෝ

363. මෙහි ම 12 වන පිටැ ඒකත්‍යශාශ්වතවාද විභාගය බලනු.
364. මෙහි ම 13 වන පිටැ දෙවෙනි ඡේදය බලනු.

වේලා රවා බලා හිඳ ඒ හේතුයෙන් මියෙත්. ඔවුන් ගෙන් ඇතැම් කෙනෙක් මිනිස්ලොවැ ඉපැද දහන් වඩා පෙර අත්බව පමණක් දැක ඒ උනුනට විෂට සිත් නැති දෙවියෝ නිත්‍ය හ, ශාශ්වත හ. ඈපි වනාහි විෂට සිතැගියෝ වූම්හ. එයින් මළම්හ, ඒ ඈපි අනිත්‍යයම්හ, අධ්‍රැවයම්හ, මරණයට යම්හ' යි පණවත්. මෙසේ වූ ලෝකෝත්පත්ති වංශකථාවක් තෙපි ආචාර්‍යවාද විසින් පණවවු දෑ?' යි මා ඇසූ විට 'එසේ යැ' යි ඔහු පිළිගනිත්.

11. භාග්ගව ය, ලොව හේතුරහිත ව ඉබේ ම පහළ වී යැ යි (යදෘච්ඡාසමුත්පන්න යැ යි) සිය ඇදුරන් ඉගැන්වූ දහමක් පණවන මහණ බමුණු කෙනෙක් ද වෙති. ඔවුන් එය පණවනු සත්‍ය දෑ? යි විචාළ මට 'එසේ යැ' යි ඔහු පිළිත කෙරෙත්. මේ ලෝඋපත්ප්‍රවත කෙසේ උපන්නේ දෑ?' යි විචාළ කළ උත්තර දිගත නොහි ඔහු මා ම පුළුවුසිත්. මම් ඔවුනට මෙසේ කියමි අසංඥසත්ත්ව නම් දේවනිකායයෙන් සැව මිනිස්ලොවැ උපන් කිසිවෙක් පැවිදි වැ දහන් වඩා චිත්තසමාධි උපදවා ආපසු සිහි කොට බලා මෙ අත්බවැ මැ ප්‍රතිසන්ධිසංඥව පහළ වූවා දකී. එයින් පෙරැ සංඥවක් වූ කලක් නො දකී. හේ 'මම් පෙර අසත් වැ අවිද්‍යමාන වැ මෙ කල්හි ම සත් බවට (විද්‍යමා-නත්වයට) පැමිණියෙමි' යි සිතා එය පණව යි. තොප පණවනුයේ මෙසේ වූ යදෘච්ඡාසමුත්පන්නවාදය නො වේ දෑ?' යි විචාළ මට එසේ යැ යි ඔහු උත්තර දෙති.

12. භාග්ගව ය, මෙසේ ඔවුන් ගේ ලෝකෝත්පත්තිවංශ කථාව ද දනිමි. එයින් වැඩි ශිල සමාධි ආදි සම්‍යඥානාදෘනය තෙක් සියල්ල ද දනිමි. එහෙත් ඒ දැනීම තෘෂ්ණා දෘෂ්ටි මාන විසින් පරාමර්ශන නො කරමි. එසේ වූ මා විසින් තමා කෙරෙහි ම කෙලෙස්නිවීම පසක් කරන ලදි. තථාගතයනට අනයව්‍යසනයකට නො වැටෙනුවට හේතු වනුයේ මේ ආධ්‍යාත්මික කෙලශනිර්‍වෘතිය දැනගැන්ම යි. භාග්ගවය මෙසේ කියන මට ඇතැම් මහණබමුණෝ ශුභවිමෝක්ෂයට[363] සමවත් තැනැත්තේ ශුභාශුභ සියල්ල අශුභ සේ දනී යැ යි මහණ ගොයුම්හු කියතැ යි ද, එබැවින් හේ පෙරළුණු සිතැත්තෙකැ යි ද, ඔහු සව්වෝත්, එ බඳු ම පෙරළි සිතැත්තාහු යැ යි ද අභූතයෙන් දෙස් නඟත්. භාග්ගවය, මම් එසේ නො කියමි. එහෙත් ශුභවිමෝක්ෂයට සමවැද ඉන්නා වේලෙහි 'මෙය ශුභ යැ' යි ශුභවිමෝක්ෂය දැන ගනී යැ යි කියමි

---

363. ශුභවිමෝක්ෂ යනු වර්ණකසිණ සමාපත්තිය යි

13. **භාග්ගවගෝත්‍ර** – වහන්ස, භාග්‍යවතුන් වහන්සේත් භික්ෂුවුත් විපරීත ලෙසින් හැඳින නොකරුණේ දෙස් නඟන ඔහු ම විපරිත අදහස් ඇතියෝ ය. වහන්ස, ශුභවිමෝක්ෂය ලැබ වසත හැකි වනු පිණිස මට දහම් දෙසනුවට සමර්ථ සේකැ යි මම් භාග්‍යවතුන් වහන්සේ කෙරේ පැහැදිණිමි.

බුදුරජුහු – භාග්ගවය, අන්‍ය ලබ්ධි ගත්, වෙනස් ම අපේක්ෂා ඇති, අන් පිළිවෙතෙක ම පිහිටි, අන් තොටු කුලයෙක ඇදුරු වූ යුෂ්මතා මේ ශුභ විමෝක්ෂය ලැබ වසනුයෙහි සමත් නො වෙහි. එ බැවින් මා කෙරෙහි පහළ කළ පැහැදීම ම මොනොවට රැක ගත මැනැව.

භාග්ගව – එසේ නම් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මා තුළැ වූ පැහැදීම ම මොනොවට රැකගනිමි.

[සුනක්ඛත්ත, කෝරක්ඛත්තිය, කළාරමට්ඨුක, පාථිකපුත්‍ර යන මොවුන් පිළිබඳ තොරතුරු, ඒකත්‍යශාශ්වතවාදදි සතර වාද ඇතුළත් කොට බුදුරජුන් භාග්ගවගෝත්‍රයාට කළ දෙසුම, ඔහුගේ පැහැදීම යන මෙතෙක් දෑ මෙහි ඇතුළත් ය.]

---

25. උදුම්බරික සූත්‍රය

එක් සමයෙක භගවත් බුදුරජුහු රජගහ නුවරට නොදුරු නොළං තන්හි වූ **ගිජ්ඣකූළපව්වැ** වැඩ වෙසෙති. එ සමයෙහි **නිග්‍රෝධ** නම් පිරිවැජ්ජෙක් මහත් පිරිවැජි මුළුවක් හා උදුම්බරිකා දේවිය ගේ පිරිවැජිඅරමැ වෙසෙයි.

2. දිනෙක **සන්ධාන** නම් ගැහැවියෙක් ඉරමුදුන් වේලෙහි බුදුරජුන් දක්නට යනුයේ උදුම්බරිකාව ගේ පිරිවැජිඅරමට ගියේ ය. නිග්‍රෝධ පිරිවැජි ගැහැවියා එන්නහු දැක එතෙක් මහ හඬින් නොයෙක් තිරිසන් කතාහි යෙදී සිටි සිය පිරිස නිහඬ කෙළේ ය. සන්ධාන ගැහැවි ද එහි පැමිණ පිළිසඳර කතා කොට පසෙක ඉඳගත. ඉඳගෙන, 'මේ අන් තොටු පිරිවැජිවරු මහ හඬින් නන් කතාහි ඇලී කල් ගෙවත්. භගවත් බුදුරජුහු එයට ඉදුරා ම වෙනස් ලෙස නිශ්ශබ්ද වනවාසයෙහි ඇලුණාහ'යි කී ය. එයැසූ නිග්‍රෝධ තෙම, "ගැහැවිය, ඒ මහණ ගොයුම් කවුරු හා සංලාප කෙරෙයි ද?

කවුරු හා කතා කොට උතුරු පසුතුරු දී වියත්බවට පැමිණේ ද? මහණ ගොයුම්හු බෝමැඩැදී ලත් නුවණ ශූන්‍යාගාරයන්හි හුදෙකලා වැ හිඳීමෙන් අභාවිතතා හේතුයෙන් නටුයේ ය. හේ අවිසාරද වූයේ, පිරිස් මැදට වදිනුයෙහි පසු බාතේ ය. කතාබස්හි නො සමත් ය. කිසිවකු තමා වෙතින් පැණ පුළුවුසිති සි බියෙන් ගම්කෙළවරැ සෙනසුන්හි ගැත්නෙයි. 'කිසිවක් ඇහැ වැදේ ඡේ' යි බියෙන් අයින් වෙවී යන එකැස් කණ දෙනක මෙනි. ඔහු මෙහි අවොත් එක් පැණයෙන් ම ඔහු මුව පියවමි. හිස් කළයක් සේ පෙරළා හැම පැත්තෙන් ම බැඳ තබමි''යි කී ය.

3. බුදුරජුහු ඔවුන් ගේ කථාව දිවකතින් අසා, ගිජ්ඣකුළයෙන් බැස, **සුමාගධා** පොකුණැ තෙරැ **මයූරනිවාපයට** වැඩ එළිමාතේ සක්මනෙහි යෙදුණහ. නිග්‍රෝධ තෙම සක්මනෙහි යෙදුණු බුදුරජුන් දිටී. දැක ඔබ එහි වැඩියොත් සිය සව්වන් හික්මවන සැටි විචාරමි යි සිය පිරිස නිහඬ කොට බුදුරජුන් වෙත ගියේ ය. ගොස් අයැද ඔබ සිය අරමට වැඩම කරවා ගෙන ආයේ ය. ඔබට අස්නක් එළවා, තෙමේ මිටි අස්නෙක හිඳගත.

4. ඉක්බිති ඔබ දෙදෙනා ගේ සංවාදය විය:-

බුදුරජුහු - නිග්‍රෝධයෙනි, තෙපි දැන් කවර කතාවෙකින් හුන්නහු ද? තොප කවර කතාවෙක් අඩාළ වී ද?

නිග්‍රොධ - වහන්ස, සුමාගධා තෙරැ මයූරනිවාපයෙහි සැක්මෙන ඔබ දැක, ඔබ මෙහි වැඩියොත් ඔබ සිය සව්වන් හික්මවන සැටි විචාරමැ'යි කීමි. මේ කථාව අඩාළ විය. එ වේලේ ඔබ මෙහි වැඩියාහ.

බුදුරජුහු - නිග්‍රෝධයෙනි, අන්‍ය ලබ්ධි ඇති, වෙනස් අපේක්ෂා ඇති, අන් පිළිවෙතෙකැ පිහිටි, අන් තොටු ආයතනයෙක ගුරු වූ තොපට මා සව්වන් හික්මවන සැටි දත නො හැක්ක. තොප ගේ උත්සාහයෙන් පව් දුරැලීම (තපෝජුගුප්සාව) කෙසේ සම්පූර්ණ වේ ද? කෙසේ අසම්පූර්ණ වේ දැ? යි ප්‍රශ්න කරවූ.

[සිය දහම තබා අනුන් ගේ දහම් අතේ විචාරන්නට පවරන ශ්‍රමණ ගෞතමයෝ අසිරිමත් මහානුභාව ඇති කෙනෙකැ යි පිරිවැජියෝ හඬ නැගූහ. නිග්‍රෝධ තෙම ඔවුන් නිහඬ කොට කතාවට බට.]

5. **නිග්‍රෝධ** – වහන්ස, ඇපි තපෝජුගුප්සාව කියන්නම්හ, එය ම සරු කොට ගත්තම්හ. එහි සයින් ද ඇලුණම්හ. ආත්මකලමථානුයෝගී වම්හ. කෙබඳු වූ තපෝජුගුප්සාව පරිපූණි ද කෙබඳු වූ තපෝජුගුප්සාව අපරිපූණි ද?

බුදුරජුහු – නිග්‍රෝධයෙනි, මෙහි තවුසා නිරුවත් යැ. සිට ගෙන මලමූ පහ කිරිම් ආදි විසින් ශිෂ්ටාචාරයෙන් තොර ය. කැම සා අත ලෙවී. බික් පිළිගන්නට කැඳවූ විට නො එයි. සිටින්– නැ යි අයැදු කලැ නො සිටී. වේලාගෙන් පළමු එළැවුණ බොජුන් නො පිළිගනී. තමා උදෙසා පිළියෙල කළ බොජුන් නො ගනී. නිමතා පිළියෙල කළ බොජුන් නො ගනී. සැළිමුවින් නඟා දුන් බොජුන් නො ගනී. සැළිපැසින් නඟා දුන් බොජුන් නො ගනී. එළිපත හෝ දංඩක් හෝ මොහොලක් අතරැ කොට (එළිපත් ආදියෙන් එහා ගෙයැතුළැ) තුබූ බොජුන් නො ගනී. බොජුන් වළඳනා දෙදෙනෙකු ගෙන් එකකු නැගී සිට එළැවූ අහර නො පිළිගනී. ගැබින්නක දුන් බොජුන් නො ගනී. කිරි පොවන්නියක දුන් බොජුන් නො ගනී. පුරුෂයකු හා වාසයට පැමිණි සත්‍රියක දුන් බොජුන් නො ගනී. කිහිප දෙනෙකුන් සහල් ඈ ලබා ගෙන (සම්මාදම් කොට) පිළියෙල කොට එළැවූ බොජුන් නො ගනී. ළඟැ හුන් සුනඛයාට නොදී තමාට දුන් අහර නො ගනී. මැස්සන් ගැවැසෙන තැනින් එළැවූ අහර නො ගනී. දියමස් ගොඩමස් නො පිළිගනී. රහමෙර නො පිළිගනී. සස්‍යයෙන් කළ කාඩි නො පිළිගනී. එක් ගෙයෙකින් ම ලත් බොජුනින් (හෝ එක් බත් පිඩෙකින්) ම යැපෙයි. දෙ ගෙයෙකින් ලත් බොජුනෙන් ම (හෝ දෙ බත් පිඩෙකින් ම) යැපේ......තුන් ගෙයෙකින්......සිවුගෙයෙකින් ....ගෙ පසෙකින්.........ස ගෙයෙකින්......... සත් ගෙයෙකින් ලත් බොජුනෙන් (හෝ සත් බත් පිඩෙකින් ම) යැපේ. එක් කුඩා නිකෂා– පාත්‍රයෙකින්.........පාත්‍ර දෙකෙකින්.........පාත්‍ර

තුනෙකින්......පාත්‍ර සතරෙකින්.....පාත්‍ර පසෙ-කින්......පාත්‍ර සයෙකින්......පාත්‍ර සතෙකින් යැපේ. දිනක් හැර දිනක්, දෙදිනක් හැර දිනක්, තෙදිනක් හැර දිනක්, සිව් දිනක් හැර දිනක්, පස් දිනක් හැර දිනක්, ස දිනක් හැර දිනක්, සත් දිනක් හැර දිනක් හෝ අහර ගනි...... අඩමසක් හැර දිනක් හෝ අහර ගනි.

අමු පලා බුදී. බොඩහමු තණඇට බුදී. සියදෑ වීයෙන් දිවි පවත්වයි. සොම්මරුත් සම් ලියාලූ කසට බුදී. මැලියම් දියසෙවෙල් බුදී. වීපිටි වළඳයි. වළන් සේදූ තැනැ හුණු දඹුබත් බුදී. මුරුවට වළඳයි. තණකොළ කයි. ගොමවැරැටි කයි. වනමුල්පල වළඳයි. රුක්නෙන් තමන් ම හුණු පල වළඳයි.

හණවැහැරි හඳී. හණතුල් මිශ්‍ර රෙදි හඳී. මළ සිරිරෙන් ඉවත් කොට ගත් රෙදි හඳී. එරුතණ ආදියෙන් වියූ අගය අඩු රෙදි හෝ අඳී. එකෙක් පාංශුකූල වස්ත්‍ර ද, එකෙක් රුක්හි පිටැ සුඹුළින් කළ වස්ත්‍ර ද, එකෙක් අඳුන් දිවිසම් ද, එකෙක් මැදින් පැළැ අඳුන්දිවිසම් ද, එකෙක් කුසවැහැරි ද, එකෙක් නියඳවැහැරි ද, එකෙක් කෙහෙමුවා කම්බල ද, එකෙක් අස්ලොම්මුවා කම්බල ද, එකෙක් මහමුහුණු පියාපත්මුවා වස්ත්‍ර ද දරයි. එකෙක් කෙහෙ රවුලු උදුරයි. එකෙක් උත්-කුටුක ව ම ඉඳී, උත්කුටුක ව ම යෙයි. කටුමත්තෙහි ඉඳිනු සිටිනු අෑ ඉරියවු පවත්වයි. පුවරුවෙක හෝ සැතැපෙයි. උස් බිම්කාංඩියෙක ම හෝ සැතැපෙයි. එක් ඇලයෙකින් ම හෝ සැතැපෙයි. දූලි වැකි ඇඟ ඇති වැ හිඳී. එළි මාතේ ම හෝ වෙසෙයි. පළමු අතුළ පරිදි වූ අස්නැ ම හෝ ඉඳියි. අශුචි කයි. සිහිල් දිය හැරපියයි. (පහන්දෙර මද්දහන ඉරබස්නා වේලාව යන) තුන් සැන්දෑයෙහි පව් සෝදනුවට දියැ ගැලේ. මෙසේ ඇති කලැ තපෝජුගුප්සාව[364] පරිපුණ් ද? නැත හොත් අපරිපුණ් ද?

6. **නිග්‍රෝධ** – වහන්ස, මෙසේ ඇති කලැ ඒකාන්තයෙන් තපෝජුගුප්සාව පරිපුණ් ය.

බුදුරජුනු – නිග්‍රෝධයෙනි, තොපප මතය පරිදි මෙසේ පරිපුණ් වූ තපෝජුගුප්සාව ද කෙලෙසන බොහෝ දෑ ඇත.

---

364 තපෝජුගුප්සා යනු වීර්‍යයෙන් පව් දුරලීම ය.

නිග්‍රෝධ – ඒ කවරේ ද වහන්ස?.

බුදුරජුහු – නිග්‍රෝධයෙනි, තපස සමාදන් කොට ගෙන එ පමණින් ම තෘප්ත වනු ද, මෙයින් හැම ගුණදහම් ම පිරිණැ යි සිතනු ද, 2 තමා උස් තන්හි ලා අනුන් හෙලා දකිනු ද, 3 තපෝ-ගුණයෙන් මදයට ප්‍රමාදයට පැමිණෙනු ද, 4 තපෝගුණයෙන් ලාභ සත්කාර කීර්ති උපදවා එපමණින් තෘප්ත වනු ද, 5 තපෝගුණ පෙන්වා ලාභ සත්කාරාදිය උපදවා එයින් උඩඟු වැ තමා උස් තන්හි ලා තබා මෙරමා පහත් තන්හි හෙලා දකිනු ද, 6 තපෝගුණ මගින් ලාභසත්කාරාදිය උපදවා එයින් මදයට ප්‍රමාදයට පැමිණෙනු ද, 7 තපස සමාදන් ව ගෙන 'මේ මිහිරි ය, මේ නොමිහිරි යැ' යි බොජුන්හි වෙනස සලකනු ද. කුසපුරා වැළඳුවහුට මිහිරි බොජුනක් ලැබුණු කල කලින් ලත් බොජුන නොවැළැඳිම් නම් මැනැවැ යි එහි ලොල් ඇති ව ම එය අනෙක-කුට දෙනු ද, ලත් බොජුන් තමා ම පස්විකනුත් නැති ව ම වළඳිනු ද, 8 අනුන් ගෙන් ලාභ සත්කාර කීර්ති පතා තපස සමාදන් කොට ගනු ද, 9 අන් මහණකු බමුණකු මූලබීජාදිය වළඳනු දක ප්‍රත්‍යය බහුල බවට පැමිණි-යෙකැ යි නිගනු ද, 10 අන් මහණකු බමුණකු ගරුැ බුහුමන් ලබනු දක රූක්‍ෂ පැවැතුම් ඇති තමාට මෙබඳු සත්කාර නැතැ යි ඊර්ෂ්‍යා හෝ මසුරුකම් කරනු ද, 11 අනුනට පෙනෙන සේ තපස් කරනු ද, 12 තමා තපෝගුණ පෙන්නමින් හැසිරෙනු ද, 13 යමකට රිසි කෙරෙමින් ම නොරුස්නේ යැ යි හෝ රිසි නැති ව ම රුස්නේ යැ යි කියනු ද, තමා මහ වරද සඟොවා මෙරමා සුළු වරද මහත් කොට කියනු ද, 14 තථාගතයන් හෝ ඔබ සව්වකු හෝ දෙසන දහම පිළිගත යුතු සේ පෙනෙද්දීත් නොපිළිගනු ද, 15 ක්‍රෝධ වෛර කරනු ද, 16 මකුබව, ඊර්ෂ්‍යාව, මසුරුබව, ශඨ බව, මායාව, තදබව, අතිමානය, ලාමක ආශාවනට

වශග බව, මිසදිටු බව, ආදානගාහි බව යන මේ හැම එක එකෙක් ම තපෝජුගුප්සා කෙලෙසන දූ ය.[365] නිග්‍රෝධය, මෙකී දූ තපෝජුගුප්සාව කෙලෙසන දූ ද? නො කෙලෙසන දූ ද?

නිග්‍රෝධ – වහන්ස, මොහු හැම තපෝජුගුප්සාව කෙලෙසන දූ ය. තවුසකු මේ හැම උපක්ලේශයන් ගෙන් ම වුව ද යුක්ත විය හැක්ක. එකෙකින් යුක්ත වනු කියනු කිම?

බුදුරජුහු – නිග්‍රෝධයෙනි, තවුසා ඒ යම් යම් උපක්ලේශයෙකින් වෙන් වැ වෙසේ නම්, ඒ ඒ කරුණින් ඔහු ගේ තපස ශුද්ධ ය. ඒ උපක්ලේශ සියල්ලෙන් ම වෙන් වේ නම්, ඒ සියලු කරුණින් ම ශුද්ධ ය. මෙසේ ඇති කල්හි ඔහු ගේ තපස පිරිසිදු ද? නැද්ද?

නිග්‍රෝධ – වහන්ස, එය ඒකාන්තයෙන් පිරිසිදු ය. අග්‍රප්‍රාප්ත සාරප්‍රාප්ත ද වේ.

7 **බුදුරජුහු** – නැත, නිග්‍රෝධයෙනි මෙතෙකින් තපෝජුගුප්සාව අග්‍රප්‍රාප්ත සාරප්‍රාප්ත නො වේ. එකී උපක්ලේශයන් ගෙන් මිදුණු කරුණින් තපස සාරවත් රුකෙක පිට පොත්ත[366] බඳු සුළු ගුණයකට පැමිණියේ නම් වේ.

---

365. තපෝජුගුප්සාව කෙලෙසන දූ, තවුසන් ගේ තපස කෙලෙසන දූ මෙයි කියන ලදි. මෙසේ ම සස්නෑ මහණුනු ගේ මහණදම කෙලෙසන දූ ද බොහෝ ය. ඔහු අටුවාහි මෙසේ දක්වෙති: ධුතංගධර වැ එතෙකින් තෘප්ත විම, 'මම ධුතංගධරයෙමි'යි ආදින් සිතා තමා උස් තැනැ තබා අනුන් හෙලා දැකීම, ධුතංගයෙන් ම කෙලෙස් නැසේ යැ යි එය රහත්බව සේ සැලැකීම, තමා ධුතංගධර බව් ආදියෙන් ලාභකීර්ති ඉපැදවීම, එයින් තෘප්ත විම, ලාභී වැ උඬගු ව අනුන් හෙලා දක්ම, ධුතංගාදියෙන් ලාභ කීර්ති උපදවා එයින් මත් ව මුසපත් ව ඉඳිම, තොා පස්විසා කැදර ව සිවු පසය වැළැඳීම, ලාභකීර්ති පතා ධුතංගරැකිම් ආදිය, මොවුනට ධුතංග පමණකුන් නැතැ යි අන් මහණුනට නිගා කිරිම, අනුන් ගේ ලාභකීර්තියට ඊර්ෂ්‍යා කිරිම, අනුනට පෙනෙන්නට තපස් කිරිම, කිසිවක් කෙරෙහි රිසිය ඇති ව හිඳ එයට රිසි නැති සේ කියා පෑම, අනුන් ගේ සුළු වරද මහත් කොට කියා පෑම, ගුණවත් මහණකු ඉදිනු අසා ඔහු සේ මහණකම අප සතු ය, ශේ අප අතවැස්සෙකැ' යි කිම, ක්‍රෝධ වෛර කිරිම, මකු බව, ඊර්ෂ්‍යාව, මසුරුකම, ශඨ බව, මායාව, තද බව, අභිමානය, ලාමක ආශාවනට වාල් බව, උච්ඡේදදෘෂ්ටික බව, ආදානගාහී බව යන මේ එක් එකෙක් මහණකම කෙලෙසන දූ ය.

නිග්‍රෝධ – වහන්ස, කොතෙකින් තපස අග්‍රප්‍රාප්ත සාරප්‍රාප්ත වේ ද?

බුදුරජුහු – නිග්‍රෝධයිනි, මෙහි තවුස් තෙම චාතුර්‍යාම සංවරයෙන් සංවෘත වෙයි. ඒ කෙසේ ද? ප්‍රාණවධ අදත්තාදාන මෘෂාවාද කාම්සුව යන සතරෙන් තෙමේ වැළැකේ නම්, අනුන්ත් වළක්වා නම්, ඒ ප්‍රාණවධාදියෙහි යෙදෙනවුනට අනුමතියකුත් නො දෙයි නම්, මෙසේ හේ චාතුර්‍යාමසංවරයෙන් හැමුරුණේ නම් වේ. හේ ඒ යාමසංවරශීලය මතුමත්තෙහි වඩයි. අරණ්‍යාදි කිසි විවික්තසථානයෙක වෙසෙසි. දහවල් බොජ්තිත් පසු පළක් බැඳ කය කෙළින් තබාගෙන බවුන් අරමුණට සිත යොමු කොට පංච නීවරණ කෙරෙන් සිත මුදා, එක් දිශාවෙක දෙ දිශාවෙක යන ආදි පිළිවෙළිත් හැම දිශාහි ම සියලු සතුන් කෙරේ මෙත් වඩා.........සියලු සතුන් කෙරෙහි කරුණාව හෝ වඩා............ මුදිතාව වඩා.........උපේක්‍ෂාව වඩා එයින් සියලු ලොව පැතිර ගෙන ස්පර්‍ශ කොට වෙසෙයි මෙසේ ඇති කල්හි ඔහු ගේ තපස පිරිසිදු ද? නැද්ද?

නිග්‍රෝධ – පිරිසිදු ය, වහන්ස, අග්‍රප්‍රාප්ත ද සාරප්‍රාප්ත ද වේ.

8. **බුදුරජුහු** – නිග්‍රෝධය, මෙතෙකින් තපෝජුගුප්සාව අග්‍රප්‍රාප්ත සාරප්‍රාප්ත නො වේ. ත්වක්ප්‍රාප්ත (රුකැ පොත්තට යටින් වූ සිවිය බඳු සුළු ගුණයකට පැමිණියේ) වේ.[366]

නිග්‍රෝධ – වහන්ස, කොතෙකින් තපස අග්‍රප්‍රාප්ත සාරප්‍රාප්ත වේ ද?

---

366. රුකෙක පොත්තට යැටින් සිවිය ද එයට යැටින් එලය ද, එයටත් යැටින් හරය ද වේ. තොටුවනට ලැබෙන ලාභසත්කාර තපස් රුකේ අතු කොළ මෙනි පන්සිල් එහි පිට පොත්ත මෙනි. අට සමවත් සිවිය මෙනි. පෙර ජාති දක්නා නුවණ එලය මෙනි. දිවැස අරටුව මෙනි. දිවැස රහත්බව කොට ඔහු සලකත්. ඒ ඔවුන් ගේ තපසේ සාරය යි. බුදුසසුන් රුකෙහි ලාභසත්කාර අතුපතර ය. ශීලය පිට පොත්ත යි. ධ්‍යාන සමාපත්ති සිවිය ය. ලොව් අභිඥාවෝ එල ය. මගඵල අරටුව ය.

බුදුරජුහු – නිග්‍රෝධයෙනි, තවුසා චාතුර්‍යාමසංවරයෙන්[367] හැමිරී විවිකත සථානයෙක හිඳ නීවරණ මැඩ මෛත්‍රී කරුණා මුදිතා උපේක්ෂා යන සතරෙන් එකක් බවයි. හේ දහන් වඩා සිවුවන දහන ද ලැබ පෙර ජාති දක්නා නුවණ වඩා පෙර ජාති එකක් දෙකක් යන ආදි පිළිවෙළින් වඩා බොහෝ සංවතී විවතී කල්ප ගණන් නමුදු අතීතය සිහි කෙරෙයි. නිග්‍රෝධයෙනි, මෙසේ ඇති කල්හි ඔහු ගේ තපස පිරිසිදු ද? නැද්ද?

නිග්‍රෝධ – ඒකාන්තයෙන් පිරිසිදු ය, වහන්ස, අග්‍රප්‍රාප්ත සාරප්‍රාප්ත ද වෙයි.

බුදුරජුහු – නැත නිග්‍රෝධයෙනි, මෙතෙකින් තපස අග්‍ර-ප්‍රාප්ත සාරප්‍රාප්ත නො වේ. එහෙත් ඵල්ගු ප්‍රාප්ත (එළය ලදුයේ) නම් වෙයි.

නිග්‍රෝධ – වහන්ස, කොතෙකින් එය අග්‍රපාප්ත සාරප්‍රාප්ත නම් වෙයි ද?

9. **බුදුරජුහු** – නිග්‍රෝධයෙනි, තවුස් තෙම චාතුර්‍යාම සංවර-යෙන් සංවෘත වැ විවිකත සථානයෙක හිඳ නීවරණ මැඩ මෛත්‍රිකරුණාදීන් අතුරෙන් කිසි අප්‍රමාණ්‍ය ධර්මයක් බවා ධ්‍යාන ලැබ පූර්වේනිවාසා-නුසමෘතිඥනය උපදවයි. එයින් පසු සතුන් ගේ ච්‍යුති උපපත්ති දක්නා නුවණ අතට සිත නමා හැර එය දක්නා දිවැස ලබයි. හේ එයින් මරණයට ළං ම වූ ද මරණින් පසු කම් වූ පරිදි ඒ ඒ ගතියෙහි උපන්නාවූ ද සතුන් දකී. මෙතෙකින් ඔහුගේ තපෝජුගුප්සාව පිරිසිදු ද නැද්ද?

---

367. චාතුර්යාමසංවරං – මෙහි යාම යනු කොටස යි. සතර කොටසෙකින් සංවරය චාතුර්යාම සංවර නම්. සියලු ඇල්දියෙන් වැළැක්ම, සියලු පවින් වැළැක්ම, ආස්‍රවනිරෝධ සංවරය, පාපනිර්ජරාව (ක්‍රමයෙන් කම් දුරලීම) නිවටුන් ගේ චාතුර්යාමසංවරය යි. මෙහි 25 වන පිටෑ 9 වන ඡේදයෑ සිවුහැවුරුම යනුයෙන් දක්වා ඇත්තේ එයයි. මෙහි දැක්වෙන චාතුර්යාමසංවරය නම් ප්‍රාණවධ අදත්තාදාන මෘෂාවාද පංච කාම සැප යන සතරෙන් වැළැක්ම යි. අහිංසා සත්‍යමස්තෙය-බ්‍රහ්මචර්‍යාපරිග්‍රහා යමාඃ' යි යෝගදර්ශනයෙහි ප්‍රාණවධවිරති මෘෂාවාදවිරති අදත්තාදානවිරති කාමවිරති අපරිග්‍රහ යන පස යම යෑ යි දැක්විණ.

නිග්‍රෝධ – පිරිසිදු ය, වහන්ස, ඒකාන්තයෙන් පිරිසිදු ය. අග්‍රප්‍රාප්ත ද සාරප්‍රාප්ත ද වෙයි.

10. **බුදුරජුහු** – එසේ ය, නිග්‍රෝධයෙනි. මෙතෙකින් බාහිර ශාසනයෙහි (බුදුසස්නෙන් පිටත් ආගමයන්හි) තපෝජුගුප්සාව අග්‍රප්‍රාප්ත සාරප්‍රාප්ත වේ. නිග්‍රෝධයෙනි, තෙපි මා සව්වන් හික්මවන ධම්ක්‍රමය විචාළහු ය. එය වනාහි තොපගේ යටකි තපෝජුගුප්සාසාරයට වඩා උතුම්.

පිරිවැජි පිරිස – මෙහි ඇදුරාත් අපිත් නටුවම්හ. දිවැස ලබනුවට වැඩි තරම් දැයක් අපි කිසිසේත් නො දනුම්හ.

සඬාන ගෘහපති – නිග්‍රෝධයෙනි, ඔබ මහණ ගොයුම් කවරකු හා කථාසංලාප කෙරෙයි ද යි..... ඔහු මෙහි ආවොත් හිස් කළයක් සේ හැම පැත්තෙන් ම බැඳ තබමි' යි කිවා නො වේ ද? කරම් යි ඔබ කි සපත්කම් දැන් කළ මැනැව.

[නිග්‍රෝධ තෙම නිහඬ වැ කර බාගෙන සිනිඳිලි සිතමින් හුන්නේ ය.]

බුදුරජුහු – නිග්‍රෝධයෙනි, තොප ඒ වචන කිවා සැබෑ ද?

නිග්‍රෝධ – සැබැව වහන්ස. මුස බැවින් එසේ කිමි.

බුදුරජුහු – නිග්‍රෝධයෙනි, තොප ගේ වයෝවෘද්ධ ආචාර්‍ය ප්‍රාචාර්‍යයන් ගෙන් තොප අසා ඇත්තේ කෙසේ ද? පෙරළු සිටි රහත් සම්මාසම්බුදුහු සිය සව්වන් හා එක් වැ හඬ නඟා නිරිසන් කතාහි යෙදී උන්හ යි කියා ද? නැත හොත් දැන් මා ඉන්නා සේ චිත්තවිවේකයට යෝග්‍ය වන සේ නිශ්ශබ්ද ජනවිවිත්ත සෙනසුන්හි වෙසෙති යි කියා ද?

11. **නිග්‍රෝධ** – වහන්ස, ඔබ සේ අරණ්‍යසථ ජනවිවිත්ත නිහඬ සෙනසුන්හි වෙසෙති යි කියා ය.

බුදුරජුහු – නිග්‍රෝධයෙනි, බුඞිමත් වූ මහලු වූ ඔබට 'ඒ භගවත් තෙම සිවු සස් දැන අනුනටත් දෙසා යැ යි, තෙමේ දැමුණු ඉඳුරන් ඇති ව අනුනටත් ඉඳුරන් දමනුවට, තෙමේ ශාන්ත වැ අනුනටත්

ශමථය පිණිස, තෙමේ එ තෙර වැ අනුනටත් එ තෙරැ වනු පිණිස, තෙමේ කෙලෙස්ගිනි නිවාගෙන අනුනටත් කෙලෙස්ගිනි නිවනු පිණිස දහම් දෙසා' යැ යි මේ සිත නො වී ද?

නිග්‍රොධ - වහන්ස, මා මුළු බැවින් එසේ කීමෙන් කළේ වරදෙකි. මගේ ආයතිසංවරය පිණිස මා මුළු බැවින් කළ වරදක් සේ එය පිළිගන්නා සේක් වා.

බුදුරජහු - එසේ පිළිගනිමි නිග්‍රෝධයිනි. වූ වරද පිළිගෙන පිළියම් කිරීම, ආයතිසංවරයට පැමිණීම ආර්‍ය විනයයෙහි වැඩීමෙකි. නිග්‍රෝධයෙනි, මම මෙසේ කියමි. ඍජු සවභාව ඇත්තේ මා වෙත ඒ වා. මම ඔහුට උගන්වමි, දහම් දෙසමි. මා අනුශාසන පරිදි පිළිපදනෝ කුලපුත්‍රන් ගිහි ගෙන් නික්මීමේ පරමාර්ථය වූ රහත්පලය මෙ අත්බව්හි ම සත් වසක් තුළ දී ම පසක් කරන්නෝ ය. සත් වසෙක් තිබේ වා, ෂවසක් පස් වසක්, සිවුවසක්, තෙවසක් දෙ වසක් වසක්, සත් මසක්, ස මසක්, පස් මසක්, සිවු මසක්, තෙ මසක්, දෙමසක්, මසක්, අඩමසක්, සතියක් තුළ දී ම[368] හෝ පසක් කොට ලැබ වසන්නෝ ය.

12. නිග්‍රෝධයෙනි, තොප මා අතැවැසි කැරැගනු රිසි වැ, තොප තොප ගේ ධර්මතන්ත්‍රයෙන් ඉවත් කොට මා සස්න තොපට ගන්වනු රිසි වැ, තොප තොප ගේ ආජීවයෙන් ඉවත් කරනු රිසි වැ, තොප ගේ ඇදුරන් අකුසලැ යි ඉගැන් වූ දෑයෙහි පිහිටුවනු රිසි වැ, ඔවුන් කුසලැ යි ඉගැන් වූ දැයින් තොප වෙන් කරනු රිසි වැ මෙය මා කියතැ යි තොපට සිතෙනු හැක්ක. ඒ එසේ දැන ගනු නො වටී. දැන් තොප ගේ ඇදුරු වැ ඉන්නා තැනැත්තේ මතුත් තොප ඇදුරු වේ වා. තොප දැන් පිළි-ගෙන ඇති ධර්මතන්ත්‍රය ද ආජීවය ද තොප කුසල් ලෙස අකුසල් ලෙස පිළිගෙන ඇති දෑ ද එසේ ම තොප පිළිගෙන ඇති පරිදි ම තිබේ වා. ඒ තොප ගෙන ඇති කිසිවෙකින් තොප ඉවත් කරන්නට මෙය මා කියනුවා නො වෙයි. වැලි, සසර දුක

---

368 තියුණු නුවණ ඇත්තේ උදේ කමටහන් ගෙන වඩා සවස අධිගම ලබනුයෙහි ද සමති.

උපදවන අකුසල්හු තොප සිත් සතන්හි අප්‍රහීණ වැ රැඳී සිටිති. සිත කෙලෙසන ඒ අකුසල් පහ වනු පිණිසත් සිත පිරිසිදු කරන ශමථ විදර්ශනාවන් වැඩෙනු පිණිසත් ප්‍රඥව ගේ පිරුණුබව [369]මහත්බව මෙ අත්බව්හිදී ම තමන් ම පසක් කරනුවට මහ වූ පිළිවෙතට බස්වනු පිණිසත් මේ දහම් දෙසමි.”[370]

13. බුදුරජුන් මෙය වදාළ කලැ ඒ සියලු පිරිවැජියෝ කර බාගෙන බිම බලා සිනිවිල්ලේ සෙදී හුන්හ. බුදුරජුන් වදාළ කාරණය සැබෑ දැ?යි පිරික්සනු වස් සසුන්බඹසර රක්නට වත් සිතෙක් ඔවුන් ගෙන් කිසිවකුටත් පහළ නො වී ය.

බුදුරජුහු මෙසේ ඒ පිරිවැජි අරම්හි සිංහනාද කොට අහස් නැඟ ගිජුකුළු පව්වෙහි පිහිටි සේක. සන්ධාන ගැහැවි ද එ වේලේ ම රජගහපුර පිවිසියේ ය.

[සන්ධාන ගෘහපති හා නිග්‍රෝධ පිරිවැජියා ගේ සංලාපය බුදුරජුන් පිරිවැජි අරම් වැඩීම, තපෝජුගුප්සාවේ විස්තර, තවුසන් ගේ චාතුර්යාමසංවරය, අප්‍රමාණ්‍යභාවනා, තවුස්සස්නැ මුදුන, බුදුසස්නැ මුදුන, අන් තොටුවන් තම සව්වන් කැරැ-ගැනුම් පිණිස බුදුරජුන් දහම් නොදෙසන බව යන මේ දෑ මෙහි දක්විණ.]

---

26. චක්‍රවර්තති සූත්‍රය.

එක් සමයෙක බගවත් බුදුරජුහු **මගද** රටැ **මාතුලා** නුවරැ වැඩ වෙසෙති. එ සමයෙහි මහණුන් අමතා මෙසේ වදාළහ:

“මහණෙනි, ආත්මය (තමා) විප (ආරක්‍ෂාස්ථාන) කොට ඇති ව,[371] ආත්මය (තමා ම) ශරණ කොට (පිහිට කොට) ඇති ව, අන් සරණක් (පිහිටක්) නැත්තෝ ව (අපේක්‍ෂා නො කොට) වසවු. ධර්මය විප කොටැති වැ අන් සරණක් නො මැත්තෝ වැ වසවු. මහණෙනි, මහණ තෙම කෙසේ නම් ආත්මය විප කොට ඇති ව, ආත්මය ශරණ කොට ඇති ව, ධර්මය විප කොට ඇති ව, ධර්මය ශරණ කොට ඇති වැ අනන්‍යශරණ වැ

---

369. ප්‍රඥව ගේ පිරුණු බව යනු මාගිඥානය යි. ප්‍රඥව ගේ මහත් බව යනු ඵලඥානය යි. 370 මෙය අසා ඔවුනට එ අත්බව්හි අධිගමයක් නොවූව ද මත්තට උපනිඃශ්‍රය විය. 371. මෙහි ආත්මය (අත්ත - තමා) යනු ද ලොවි ලොවුතුරා දහම් ය.

වෙසේ ද? යත්: මහණෙනි, මේ සස්නැ මහණ කයෙහි කායානුපස්සී වැ, සිත්හි චිත්තානුපස්සී වැ, වේදනාවන්හි වේදනානුපස්සී වැ, දහම්හි ධම්මානුපස්සී වැ වැර ඇති ව, සිහි නුවණින් යෙදී (කාය චිත්ත වේදනා ධර්ම සංඛ්‍යාත) ලොව්හි ඇල්මත් දොම්නසත් දුරලා වෙසෙසි[372]

2. මහණෙනි, පියා ගෙන් තමනට උරුම වැ පැමිණි ගොදුරු බිමැ[373] හැසිරෙවු. සිය පියා ගෙන් පැමිණි ගොදුරු බිමැ හැසිරෙන්නවුන් ගේ සිදුරක් අරමුණක් මාර තෙමේ නො ලබයි. මෙසේ කුසල් දහම් සමාදන් කොට ගෙන පැවැත්මෙන් පින් ද පින්පල ද වැඩේ. මහණෙනි, පෙර දළ්හනේමි නම් සක්විති රජෙක් විය. බොහෝ කලෙකින් පසු හෙ තෙම මිනිසකු බණවා 'දෙව් සක්රුවන[374] තුබුණ තැනින් මදක් හෝ මුළුල්ල ම හෝ ඉවත් වුවොත් මට දන්වව'යි කී ය. ඒ මිනිසා ද බොහෝ කලකට පසු එය තුබුණු තැනින් ඉවත් වූ සේ දැක, එ පවත් රජුට දැන්වී ය. එ විට රජ තෙම දෙටු පුත් කැඳවා සක්රුවන තුබුණු තැනින් ඉවත් වූ බව ද, එසේ වූ කලැ සක්විති රජු වැඩි කලක් ජීවත් නොවන බව ද තමා අසා ඇතැ යි කියා, එතෙක් මිනිස්ලොවැ සැප වින්ද බැවින් දැන් දෙව්ලෝ සැප සොයනුවට කල් පැමිණියේ යැ යි දැන්වි ය. එයින් පසු දෙටු පුතුට රජය පවරා තෙමේ කෙහෙ රවුලු බහවා තවුස් පැවිද්දෙන් පැවිදි විය. එයින් සතියෙකින් සක්රුවන අතුරුදන් විය. එබව මිනිසෙක් එකල රජැයැ වූ රජුට සැල කෙළේ ය. හේ එයසා සෝ පත් ව රාජර්ෂි වෙත ගොස් සමග එ පවත් දැන්වි ය. රාජර්ෂි ඔහු අස්වසා එය පියා ගෙන් ලත් දෑවැද්දක් නොවන බව කියා සක්විති වත් පුරව' යි ඔවා දින. සක්විති වත් පුරන ඔහුට පුන් පසොළොස් වක් පොහො ද දිය සනහා පෙහෙවස් ඉටා පහයේ උඩුමාල්තෙලෙහි ඉන්න විට දෙව් සක්රුවන පහළ විය හැකි බව ද කී ය. රජ තෙම **සක්විතිවත්** විචාළේ ය. රාජර්ෂි ඔහුට දස සක්විති වත් දැක්වි ය:—

---

372. මේ සතරසිවටන් වැඩීම යි. 373. ගොදුරුබිම - ගැවැසියැ යුතු පෙදෙස. නොගැවැසියැ යුත්තේ අගෝචර ස්ථාන යි. අගෝචර ස්ථාන යනු පංචකාම වස්තු යි. ගෝචර ප්‍රදේශ (ගොදුරුබිම යනු) සතර සතිපට්ඨාන යි. මෙහි ඉහත දැක්වුණු සතිපට්ඨාන සූත්‍රය බලනු. 374. දෙව් සක් රුවන -දිව්‍ය චක්‍රරත්නය. මෙය පහළ වූ පසු අන් සියලු දෙවෙ:ල් නැති වෙයි. සියල්ලෝ මලින් සුවඳින් එය පුදති. උපග්‍රන්ථය බලනු.

3. a. දහමැ[375] පිහිටා දහමට ගරු බුහුමන් ඇති ව, දහම ම ප්‍රධාන කොට ගෙන වැස සිය අඹු දරුවන් ශීලයෙහි පිහිටුවා ඔවුනට කළ යුතු හැම සංග්‍රහ කරමින් ඔවුන් රැක බලා ගන්හ.

b. බලයෙන් ද ශීලයෙහි පිහිටුවා අවශ්‍ය සංග්‍රහ කලට වේලාවට කෙරෙමින් ඔවුන් රැක බලා ගන්හ.[376]

c. ක්‍ෂත්‍රියයන් ද ඔවුනට අවශ්‍ය සංග්‍රහයෙන් රැක ගන්න.[377]

d. බමුණන් ද ගැහැවියන් ද සුදුසු සංග්‍රහයෙන් එසේ ම රැක ගන්න.[378]

e. නිගමවාසීන් ද ජනපද වාසීන් ද සුදුසු සංග්‍රහයෙන් රැක බලා ගන්න.

f. මහණ බමුණන් සුදුසු සංග්‍රහයෙන් රැක බලා ගන්න.[379]

g. සිවුපාවන් ද පක්ෂීන් ද අභය දානයෙන් රැක ගන්න.[380]

h. සිය රටෙහි අධර්ම ක්‍රියා නොපවත්නා ලෙසට කටයුතු සලසන්න.

i. ධනය නැත්තවුනට ධනය දෙන්න.

j. ආත්ම දමනය කළ මහණ බමුණන් කරා ගොස් හොඳ නොහොඳ විචාරා දැන ඔවුන්ගේ අනුශාසන පරිදි ගුණ දහම්හි පවතින්න''.

මේ ආර්‍ය්‍ය චක්‍රවර්තති වත් දශය යි.

4. එ රජ සිය පිය වූ රාජර්ෂීන් කී පරිදි ම සක්විති වත් පිරි ය. එයින් ඔහුට දෙව් සක්රුවන පහළ විය. එ රජ ඒ සක්රුවනෙහි උපකාරයෙන් ලොවැ හතර දිග ම හැසුරුණේ ය සක්රුවන නැවැතුණු තැන නැවැතුණේ ය. එ රජ ගිය හැම තැන ම රජ්ජුහු ඔහු පිළිගෙන තමනට අනුශාසන කරණ සේ අයැදූහ. එ රජ ද මෙසේ අනුශාසන කෙළේ ය:

---

375. මෙහි දහම් යනු දස කුසල් ය. 376. බල සෙනඟට කල් නො ඉක්මැ බත් වැටුප් ඈ දියැ යුතු. 377. 378. කැත්තට යානවාහනාදිය දීමෙන් ද බමුණනට ආහාරපානාදිය දීයමන් ද, ගැහැවියනට බත් ධාන්‍ය බීජුවට නගුල් ගෙරි හරක් ඈ දීමෙන් ද සංග්‍රහ කළයුතු. 379. මහණ බමුණනට අවශ්‍ය පසය දීමෙන් සංග්‍රහ කළ යුතු 380. මෘගපක්ෂීනට වධ බන්ධ නො වන පරිදි රැක්ක යුතු

“පණ්වා නො කළ යුතු.
අසිනාදන් නො කළ යුතු.
මුසවා නො කියැ යුතු.
මත්පැන් නො පියැ යුතු.
තමන් සතු ද්‍ර නිසි සේ දූහැමින් වළදවු”

හැම දෙසැ ම රජ්ජු ඒ සක්විති රජු අනුව ගියහ. මෙ සේ හේ මුළු පොළොවට අදිපති ව සිය රජදහනට පෙරළා ආ ය.

5. මෙ දෙවෙනි සක්විති රජ ද, ඔහු ගෙන් පසු පිළිවෙළින් ඇති වූ තෙවෙනි සිවුවන පස්වන සවන සත්වන සක්විති රජ්ජු ද, සක්විති රජසැප වළඳ සක්රුවන තුබුණ තැනින් ඉවත් වූ විට සිය පුතුනට රජය පවරා පැවිදි වූහ. සත් වන සක්විති රජු ගේ පුත් තෙම අබිසෙස් ලැබ රජ වූයේ සක් රුවන අතුරුදන් වූ කලැ දෙම්නසට පැමිණියේ ය. එහෙත් පිය රජ වූ සෘෂිහු කරා ගොස් එ පවත් කියා සක්විතිවත් නො උගත්තේ ය.

හේ සිය මතය පරිදි රජය කැරැවිය. ඔහු ගේ සමයෙහි පෙරැ මෙන් රටෙහි වැඩීමෙක් නො වී ය. එ බැවින් ඇමැති ඈහු රජු වෙත ගොස් ඔහු සිය මතයෙන් රජය කැරැවීමෙන් රටේ පෙර සේ වැඩීමක් නො වන බවත් අපි සක්විතිවත් තමන් දන්නා බව් කියා තමන් අතින් එය විචාරන ලෙසත් ඔහුට දැන්වූහ.

6. රජ ද ඔවුන් කැඳවා සක්විතිවත් විචාළේ ය. ඔහු රජුට සක්විතිවත් කිහ. රජ ද දූහැමි රකාවල්[376] තැබී ය. එහෙත් දිළින්දනට ධනය නුදුන්නේ ය. එයින් දිළිඳු බව වැඩී ගියේ ය. දළිඳුකම පැතිර ගිය කල එක් දිළිඳු මිනිසෙක් අන්සතු **නොදුන් දෑයක් ගත්තේ ය.** මිනිස්සු ඔහු ගෙන ගොස් රජුට දැක්වූහ. රජ තෙම වූ පවත් අසා ‘නොදුන් දෑ කවර හෙයින් ගත්තෙහි දැ?’යි විචාළේ ය. ‘ජීවත් විය නො හැක්කෙම් ගතිම්’යි හේ කීව. රජ ඔහුට ධනය දී එයින් මාපියඅඹුදරුවන් රැක වැඩපොල කොට දත් පිත් කෙරෙමින් දිවි රැක ගනුව යි අවවාද කොට යැවී ය.

---

376. දූහැමිරකාවල් - යට දක්වුණු සක්විතිවත් දැසයෙන් මුල් අට

කලින් කල මෙසේ අන් සතු නොදුන් දෑ ගත් දිළින්දන් රජු වෙතට ගෙනා කලැ රජ පෙර සේ ම ධනය දී අවවාද කොට හැරියේ ය. මෑත භාගයෙහි රජු ගෙන් ධනය ලැබගන්නා අදහසින් බොහෝ අය අන්සතු දෑ සොරා ගන්නට වූහ. රජ ද ඔවුනට ධනය දිදී අවවාද කැරැ යැවී ය. නැවත එක් දිනෙක සොරකු ගෙනා විට, 'සොරුනට ධනය දී යැවීමෙන් මේ සොරකම් වැඩෙන්නේ යැ'යි සිතා එය මුලින් ම නවතනා උපායක් සලකනුයේ 'සොරු ගේ හිස සිඳිනු සුදුසු යැ'යි සිතී ය. 'ඒ සොරා තදින් බැඳ හිස මුඩු කොට වදබෙර වයමින් විදි දිගේත් මංහන්දියක් පාසාත් ගෙන ගොස් නුවරැ දකුණුදෙරින් පිටත පමුණුවා **හිස සිඳිවු යැ'යි** ඇණැවී ය. රාජපුරුෂයෝ එසේ ම කළහ.

7. අන් සතු නො දුන් දෑ ගන්නවුන් රජු හිස් සිඳුවා මරවන බව අසා මිනිස්සු ද 'අපි යම් කෙනෙකුන් සතු දෑ ගනුමෝ නම්, ඔවුන් ගේ ද (ඒ ධන හිමියන් ගේත්) හිස් සිඳිමු'යි තියුණු අවි හදා ගෙන ගම් නියමගම් නුවරවල් වනසා ධනය පැහැර ගන්නටත් මං පහරින්නටත් ඔවුන් පැහැරැ ගත් ධනයේ හිමියන් හිස් සිඳ මරන්නටත් වන්හ. මෙසේ දිළිඳු බව වැඩි යැමෙන් **සොරකම ද,** සොර කම වැඩී යැමෙන් පණිවා ද වැඩි ගියේ ය. පණිවා වැඩී ගිය කල ඔවුන් ගේ ආයු පිරිහිණි. ඇඟ පැහැය ද පිරිහිණ. මෙසේ පරපුරෙන් පරපුරට මිනිසුන් ගේ පරමායු කෙමෙන් පිරිහි ගියේ ය.

8. ඔවුනතුරෙහි වූ කිසිවෙක් සොරකමක් කොට හසු ව රජ 'ඒ සැබෑ දැ?'යි විචාළ විට 'එය නො කෙළෙමි' යි **අසත්‍ය** ම කී ය. මෙසේ **බොරු කීම ද** ඇති වී කෙමෙන් පැතිරැ ගියේ ය. එයින් පසු පරම්පරාවලැ මිනිස්සු ඒ හේතුයෙන් කලටත් වඩා ආයුෂයෙනුත් වර්‍ණයෙනුත් පිරිහුණහ.

එ කලැ එක් මිනිසෙක් අනෙකකු සොරකමක් කරන්නා දැක ගොස් රජුට කේලාම් කී ය. මෙසේ **කේලාම් කීම** ලොව ඇති ව කෙමෙන් වැඩී ගියෙන් කලටත් වඩා මතු පරපුර පිළිවෙළින් ආයුෂ වර්‍ණ දෙකින් ම පිරිහෙන්නට වී ය.

9. මෙ සමයෙහි කෙනෙක් වර්‍ණවත් හ. කෙනෙක් දුර්‍වර්‍ණ හ. එයින් දුර්‍වර්‍ණ ජනයෝ පැහැ සටහන් ඇතියවුන් කෙරෙහි ඇලුම් උපදවා **පරදාරසේවනයෙහි** යෙදුණාහ. මෙසේ

කාමමිථ්‍යාචාරය පහළ වැ ක්‍රමයෙන් එය වැඩී ගියෙන් ඊ ළඟ පරපුරවල ජනයෝ කලින් සිටි අයටත් වඩා ආයුෂ වර්ණ දෙකෙන් ක්‍රමයෙන් පිරිහී ගියහ.

ඔවුන් අතුරෙහි **පරුෂ වචනය** ඇති විය. **සම්ඵප්‍රලාපය ද** ඇති විය. ඊ ළඟ පරම්පරාව ඒ හේතුයෙන් කලටත් වඩා ආයුෂ වර්ණ දෙකින් පිරිහිණ.

ඔවුන් අතුරෙහි **අභිධ්‍යා ව්‍යාපාද** දෙක බලවත් ව වැඩී ගියේ ය. එයින් ඊ ළඟ පරම්පරාව වඩාත් පිරිහිණ. ඒ පරපුරෙහි ජනයා අතර මිථ්‍යාදෘෂ්ටිය[377] ඇති විය. එයින් ඔවුන් ගේ ඊ ළඟ පරපුර වඩාත් පිරිහී ගියේ ය. එසේ පිරිහුණු ජනයා අතුරෙහි **අධර්මරාගයත්**[378] **විෂම ලෝභයත්**[379] **මිථ්‍යාධර්මයත්**[380] යන තුන් අකුසල්හු ඇති වූහ. එයින් ඊ ළඟ පරපුර වැඩියක් ම පිරිහිණ.

10. මෙ සේ ආයුෂයෙන් වර්ණයෙන් පිරිහුණවුන් අතුරෙහි

මව කෙරෙහි වරදවා පිළිපැදීම,
පියා කෙරෙහි වැරැදි ලෙස හැසිරීම,
ශ්‍රමණයන් කෙරෙහි වැරැදි ලෙස හැසිරීම,
බ්‍රාහ්මණයන් කෙරෙහි වරදවා හැසිරීම,
සිය පවුලෙහි වැඩිහිටියනට නොයටත්බව

යන වරද පස පැතිර ගියේ ය. මෙයින් ආයුෂයෙන් ද වර්ණයෙන් ද පිරිහී අවුත් පරමායුෂ වර්ෂ සියයට බටුයේ ය.

11. (අකුසල් බහුල වීමෙන් ආයුෂ වර්ණ දෙකෙන් වඩ වඩා පිරිහී ගොස්) මෙ මිනිස් පරපුරෙහි දස හවුරුද්ද පරමායු කොටැනි සතුන් ඇති කලෙක් වන්නේ ය. එ සමයෙහි පස්වසක් වූ කුමරිය පතිකුලයට යැයුතු කොට සලකන්නාහ. ගී වෙඬරු(තල)තෙල් මී සකුරු ලුණු යන මේ රස අතුරැදහන් වන්නේ ය. කුරහන් ඒ දශවර්ෂායුෂ්ක මනුෂ්‍යයන් ගේ අග් බොජුන් වන්නේ ය. එ සමයෙහි දශ කුශල කර්මපථයෝ මුළුමනින් අතුරුදන් වන්නාහ. අකුශල කර්මපථයෝ ඉතා බලවත් ව පැතිරෙන්නාහ. ඔවුන් අතුරේ 'කුශල'ය යන

---

377. මේ දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය යි. උපග්‍රන්ථය බලනු. 378. මව කුඩාමව ඈ ඇති අයුතු තැන්හි රාගය. 379. විසම ලෝභ නම්, පරිභෝග කටයුතු ද්‍රව්‍යයෙහි වුවද ඉතා බලවත් ලෝභය යි. 380. මිථ්‍යාධර්ම යනු පිරිමින් පිරිමින් කෙරෙහිත් ස්ත්‍රීන් ස්ත්‍රීන් කෙරෙහිත් රාගය ඉපැදවීම ය.

නම වත් ඇති නො වන්නේ ය. එසේ කලැ කුසල් කරන්නෝ කොයි ද? ඔවුන් අතුරෙහි මවුන් පියන් මහණුන් බමුණන් කුලෙහි වැඩිසිටියන් නොසලකන, ඔවුනට වරදවා හැසිරෙන ජනයෝ පූජ්‍ය ද ප්‍රශංසාහී ද වන්නාහ.

12. එ සමයෙහි ජනයෝ මව සුලුමව නැඳි ගුරබිරිය යන ආදීන් ගේ වෙසෙසක් නො සලකන්නාහ. තිරිසනුන් ලෙස ඔවුන් කෙරෙහි වරදවා පිළිපදනාහ. තව ද එ සමයෙහි සත්‍වයන් තුළ වැද්දකුට මුවකු පෙනුණු කලෙක සෙයින් මවුන් පුතුන් අතරේ ද පියන් පුතුන් අතරේ ද සහෝදර සහෝදරියන් අතරේ ද උනුන් කෙරෙහි දැඩි කෝපය, වධක-චිත්තය ඇති වන්නේ ය. එකල ශස්ත්‍රාන්තර්කල්පය වන්නේ ය.

එය වැඩී ගිය කල ජනයා අතර උනුන් කෙරෙහි මෘගසංඥාව (මේ මුවෙකැ යි සිවුපාවෙකැ යි හැඟීම) වන්නේ ය.[378] ඔවුන් අතට හසුවූ දැය ආයුධ වන්නේ ය. එයින් උනුන් සිවුපාවුන් සේ සිතා කපා කොටා ගන්නාහ. එ සමයෙහි (සතියක්) සත්ත්‍ව විනාශයෙක් වන්නේ ය. දෙදෙනකුනට එක් තැන සිට පණ රැක ගන්නට හැකි නො වේ යැ යි සිතා ඇතැම් කෙනෙක් තනි තනි ව වන ලැහැප්වලට, නදීන් මැදැ වූ දූපත්වලට හෝ කඳුකරට ගොස් අල හෝ පලවැල-බොජුන් කොට ගෙන දිවි රක්නාහ. සතිය ඇවෑමෙන් ඔහු සැඟෙවී උන් තැනින් නික්ම අවුත් උනුන් දැක සතුටු සාමිචි කතා බස් කරන්නාහ. අකුසල්හි යෙදුණු බැවින් තමන් ගේ නෑයනට වූ මහත් විපත දැක 'පණිවායෙන් වැළැකෙමු' යි කියා ඉටා එයින් වැළැකෙන්නාහ. පණිවායෙන් වැළැකීම හේතු කොටගෙන ඔවුන් ගේ පරපුර කෙමෙන් ආයුෂයෙනුත් වණ්ණයෙනුත් වැඩේ. එය සලකා බලා අයිනාදන් ඈ සෙසු

378. අන්තර්කල්පය තුන්වැදෑරුම් දුර්භික්ෂාන්තර්කල්ප රෝගාන්තර් කල්ප, ශස්ත්‍රාන්තර්කල්ප වශයෙනි. ලෝභය බලවත් ව නැගුණ කල, දුර්භික්ෂාන්තර්කල්පය වේ. මෝහය බලවත් කලැ රෝගාන්තර්කල්පය වේ. මෝහය බලවත් ව වැඩුණ කලැ ශස්ත්‍රාන්තර්කල්පය වේ. අන්තර්කල්පාවසානය යනු සංවර්ත කල්පයට නොපැමිණ එයින් මෙ පිටැ අතරැ ඇතිවන සත්ත්‍ව විනාශය යි. දුර්භික්ෂාන්තර කල්පයෙන් නැසෙන්නාහු ආහාරතෘෂ්ණා බලවත් බැවින් බෙහෙවින් ප්‍රේතලෝකයෙහි උපදිත්. රෝගාන්තර කල්පයෙන් නැසෙන්නෝ අනුනට මෙබඳු ලෙඩදුක් දක්නට නො කැමැත්තාහු මෙත් සිත් ඇති බැවින් බෙහෙවින් සවර්ගයේ උපදිති. ශස්ත්‍රාන්තර්කල්පයෙහි නැසෙන්නාහු අන්‍යෝන්‍යයන් කෙරේ බලවත් වෛර හෙයින් නිරයෙහි උපදිති. විෂ්ණු පුරාණයෙහි ද මේ ශස්ත්‍රාන්තර් කල්ප කථාව සඳහන් වේ. උ. ප.

අකුසල් කෙරෙනුත් පිළිවෙළින් වැළැකෙන්නාහ. මාපිය ආදීනට නිසි ගරු බුහුමන් සත්කාර ද කරන්නාහ. මෙසේ ගුණ දහමින් වැඩෙත් වැඩෙත් ම ඔවුන් ගේ පරපුරෙහි මතු මතු ඇති වන්නෝ ආයුෂයෙන් වර්‍ණයෙන් වැඩෙන්නාහ.[379]

13. මෙසේ ක්‍රමයෙන් වැඩී ගිය **එක්** කලෙක දඹදිව සියල්ලෙන් සමෘද්ධ වන්නේ ය. බට **කැලයක් සේ** ජනගහනය වන්නේ ය. එ සමයෙහි බඩගින්නත් ආහාරකලාන්තියත් මහලු වීමත් යන තුන මිස අන් ආබාධයෙක් නො දක්නා ලැබෙන්නේ ය.

මෙද **බරණැස්** නුවර පිහිටි පෙදෙස එ සමයෙහි **කේතුමතී** නම් රාජධානියෙක් වන්නේ ය. එහි **ශංඛ** නම් සක්විති රජෙක් ඇති වන්නේ ය. එ රජු ගේ කාලයෙහි **මෛත්‍රෙය** නම් **සම්මා**-සම්බුදු **රජුහු** පහළ වන්නා හ. එ බුදුහු දැන් මා කරන්නා සේ ම දෙවිමිනිස්නට ත්‍රිවිධකල්‍යාණ වූ ධර්‍මය දෙසන්නාහ. හැම ලෙසින් පිරිපුන් පිරිසුදු ආය්‍යීමාගීය පවසන්නාහ. දැන් මා නොයෙක් සිය ගණන් භික්ෂූන් පිරිවරා හැසිරෙන්නා සේ එ බුදුහු ද බොහෝ සිය දහස් ගණන් භික්ෂු පිරිස ඇති ව හැසිරෙන්නාහ. ශංඛ රජ ද පෙරෙහි ජාතියෙක **මහාපනාද** නම් රජහු විසින් කරවනලද (දැන් ගංගා නදියෙහි ගිලී පවත්නා) ප්‍රාසාදය[380] මතු කොට ගොඩට නංවා එහි සැලක් වැස, ඉක්බිති එය අනුනට හැර දමා, මහණබමුණුආදීනට මහදන් පවත්වා **මෛත්‍රෙය** සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ වෙත පැවිදි ව මහණ දම් පුරා එ අත් බව්හි ම රහත් වන්නේ ය.

14. **මහණෙනි, ආත්මද්වීප ව ...... ධර්‍මද්වීප ව ..... ආත්ම ශරණ ව ... ධර්‍මශරණ ව ...... වසවු. මහණ තෙම කෙසේ නම් ආත්මද්වීප ව ......ධර්‍මශරණ ව වෙසේ ද? යත්: කායානු පස්සනා චිත්තානුපස්සනා වේදනානුපස්සනා ධම්මානුපස්සනා** යන මෙහි යෙදී වසනුයේ ආත්මද්වීප ව...... ධර්‍මද්වීප ව ......ධර්‍ම-ශරණ ව වසන්නේ නම් වේ.

---

379. ක්‍ෂෙත්‍ර විශුද්ධි හේතුයෙන් උපදනා දරුවෝ මෙසේ ආයුෂාදියෙන් වැඩෙත්. 380. පෙර පිය පුත් දෙදෙනෙක් පසේබුදු කෙනෙකුන්ට දිඹුල් දඬුවෙන් සාදා බට සෙවිලි කොට පන්සලක් කොට දී සිවු පසයෙන් උපස්ථාන කැරෙහි. එ පියානන් දෙව් ලොවැ උපන්හ. පුත් තෙම ඉන් සැව මිනිස් ලොව ඉපිද මහාපනාද නම් රජ විය. ඔහුට සක්දෙව් අණින් විස්කම් දෙව්පුත් සත්රුවන් සත්බුමු පායක් මැවී ය. රජ එහි විසී ය. ඔහු මළ පසු එය ගංගානදියේ යටිහොයෙහි මැඩිණී. ප්‍රයාගප්‍රතිෂ්ඨානය වූයේ ඒ ස්ථානය සමීපයේ ය. විසතර මහාපනාද ජාතකයෙන් දත යුතු.

මහණෙනි, පියා ගෙන් තමනට උරුම ව ලැබුණු ගොදුරු පෙදෙසැ හැසිරෙවු. එහි හැසිරෙන්නාහු සිය පියා ගෙන් ලත් එහි ආයුෂයෙන් ද වැඩෙන්නාහු ය. වර්‍ණයෙනුත්, සුවයෙනුත් භෝගයෙනුත්, බලයෙනුත් වැඩෙන්නාහු ය.

15. මහණෙනි, එහි භික්‍ෂුහු ගේ **ආයුෂයට කාරණය** සතර ඍද්ධිපාදයන් වැඩීම ය. හේ එය වඩා බහුල ලෙස පුරුදු කොට කැමැත්තේ නම් කල්පයක් හෝ එයට වැඩියක් කල් සිටින්නට සමර්ථ වන්නේ ය.

භික්‍ෂුහු ගේ **වර්‍ණයට කාරණය** සිල්වත් බව ය.

භික්‍ෂුහු ගේ **සුවයට** කාරණය නම් පළමු දෙවෙනි තෙවෙනි සිවුවන දහන් ලැබීමට සමාධිය වැඩීම ය.

භික්‍ෂුහු ගේ **භෝගයට** කාරණය නම් මෛත්‍රී කරුණා මුදිතා උපේක්‍ෂා යන බ්‍රහ්මවිහාරයන් වැඩීම ය.

භික්‍ෂුහු ගේ **බලයට** කාරණය නම් ආස්‍රව ක්‍ෂය කිරීමේ අවසානයෙහි (මාර්‍ග සිතට අනතුරු ව) ඇති වන අර්හත්ඵලය ලැබීමට උත්සාහ කිරීම ය.

17. මහණෙනි, මාරබලය[381] තරම් මැඩ පවත්වනු අමාරු අන් බලයක් මම් නො දනිමි. එය ද මේ රහත් පලයෙන් මැඩ පැවැතේ.

මහණෙනි, කුසල් දහම් සමාදන් ව ගෙන පැවැතීම් හේතුයෙන් මෙසේ පින් ද පින්පල ද වැඩේ".

මෙ දහම අසා හුන් භික්‍ෂුහු මැනැවින් පිළිගත්හ.

[මෙහි ආත්මද්වීපාදි වන සැටි, සක්විති රජුන්ගේ පුවත්, සක්විතිවත්, අකුසල් පහළවීම හා මිනිසුන් ගේ පිරිහීම, මතු දශවර්‍ෂායුෂ්කයන්ගේ කාලය, ශස්ත්‍රාන්තරකල්පය, යළි කුසල් වැඩීම හා මිනිසුන්ගේ අභිවෘද්ධිය, මෛත්‍රෙය බුදුරජුන් ලොව පහළ වීම, ශංඛ සක්විතිරජු පැවිදි වීම, භික්‍ෂූන් ගේ ආයු ආදිය වැඩෙන සැටි යන මේ දෑ දක්වන ලදි]

---

381. මාරබලය = දේවපුත්‍රමාර, මෘත්‍යුමාර, ක්ලේශමාර යන තුන් දෙනා ගේ බලය. දේවපුත්‍රමාර යනු අනංගයා යැ යි බුද්ධඝොෂාචාර්‍ය්‍යයෝ පපඤ්චසූදනියෙහි දක්වූහ. උපග්‍රන්ථය බලනු.

27. අග්ගඤ්ඤ සූත්‍රය.

එක් සමයෙක බගවත් බුදුරජුහු සැවැත්පුරට නුදුරු වූ පුවරම්හි[382] වෙසෙති. එ සමයෙහි වාශිෂ්ඨ භාරද්වාජ යන හෙරණුහු දෙ නම උපසපුව බලා පොරොත්තු ව තිස්සුන් වෙත වෙසෙත්.

2. දිනෙක එ දෙදෙනා සවස සමවතින් නැගී සිට වෙහෙරෙ නැගෙනහිර පසැ සෙවණෙහි සක්මන් කරන බුදුරජුන් දැක, ගොස් වැඳ ඔබ පසුපස්සෙන් සක්මන් කළහ.

එහිදී බුදුරජුන් ද එ දෙදෙනා ද අතරෙ මතු දැක්වෙන කථාව ඇතිවී ය.

3. බුදුරජුහු – වාශිෂ්ඨයෙනි, තෙපි බමුණු කුලයෙන් නික්මැ පැවිදිවූහු ය. බමුණෝ තොපට බැණුම් දෙඩුම් නො කෙරෙද්ද?

වාශිෂ්ඨ – වහන්ස, ඔහු අපට බණිති, නින්ද කරති.

භාග්‍යවතුන් – කුමක් කියා බණිත් ද, නිගා කෙරෙත් ද?

වාශිෂ්ඨ – ''බමුණා ම උසස් ය, පිරිසිදු ය, බඹහු ගේ මුවෙන් උපන් බඹපුතා බමුණා ම ය. සෙස්සෝ පහත්හ, අපිරිසිදුහ. තෙපි ඒ උතුම් බමුණුකුල හැර පහත් වූ ගෘහපති වූ කළු වූ මරුපසැ වූ බඹහු පයින් උපන් මුඩුමහණ පිරිස ඇසුරට ගියහු යැ'' යි ගරහත්.

4. බුදුරජුහු – වාශිෂ්ඨයෙනි, පැරැණියන් ගේ ලෝ උපත පිළිබඳ වංශකථාව සිහි නො කැරෙ නො දැන ඔහු එසේ දෙස් නගත්. මල්වර වූ ද ගැබිනි වූ ද වදන්නා වූ ද දරුවනට කිරි පොවන්නා වූ ද බැමිණියෝ දක්නා ලැබෙත්. බමුණෝ මෙසේ බමුණුමවක යෝනියෙන් උපන්නෝ ව ම බඹහු මුවින් උපන්මහ'යි කියන්නාහු ඒ බඹහට ද නිඳු ලැබෙන සේ[383] කතා කෙරෙත්, බොරු කියත්, එයින් බොහෝ අකුසල් රැස් කෙරෙත්.

---

382. පූර්වාරාමයෙහි, 383. බැමිණියන් ගේ කුශයෙන් උපන් ඔහු තුමූ ම බ්‍රහ්මයා ගේ මුඛයෙන් උපන්මහ යි කියා හතිත් නම්, බැමිණියන් ගේ යෝනිමාර්ගය බ්‍රහ්මයා ගේ මුඛය විය යුතු. එහෙයින් බ්‍රහ්මයා ගේ මුඛයෙන් නික්මුණම්හ යි බමුණන් කියන කථාව අවිය වරදවා කියන වැරැදි කථාවෙකැයි වදාළෝ.

කැත් බමුණු වෙස් සුදුරු යි වර්ණ සතරෙකි. මෙ සතර වර්ණයන්හි ම පර්ණ්වා ඇ, දස අකුසල් කරන ජනයෝ ද එයින් වැළැකුණෝ ද දක්නා ලැබෙත්. එසේ කලැ 'බමුණා ම උතුම, සෙස්සෝ පහත් හ'යි කියන බමුණන් ගේ කිම පඬිහු නොම පිළිගනිත්. මෙ සතරින් කොයි කුලයෙක වුව ද රහත් වූ භික්ෂුවෙක් වේ නම් හෙ තෙමේ සෙසු සියල්ලනට ම අග්‍ර ය. ගුණදහම් ම අක් බැවිනි.

5. 'දහම දෙලොව ම උතුම' යන මෙයට කරුණක් කියමි. පසේනදි කොසොල් රජ "මහණ ගොයුම්හු සැහැ කුලයෙන් නික්ම පැවිදි වූහ"යි මා දනියි. සැහැරජුහු වනාහි පසේනදි කොසොල් රජුට යටත් පැවැතුම් ඇත්තෝ ය, දූක නමදින්නෝ ය, බැහැ දක්නෝ ය, දෙහොත් මුදුන් තබා වඳින්නෝ ය. සැහැරජුන් ඒ රජුට කරන සැලකිම් බඳු වූ ම සැලැකිලි එ රජ තථාගතයනට කෙරෙයි. රජ එසේ තථාගතයනට ගෞරව යටත් පැවැතුම් කරන්නේ තමා මහණ ගොයුමනට වඩා දූයෙන් පිරිස් බලයෙන් පැහැපත් රුවින් වර්ණයෙන් පහත් යැ යි හෝ යශස් මදයැ යි සිතා නො වේ. හුදෙක් දහමට ම සත්කාර ගරුකාර බහුමාන පූජා යටත්පැවැත්ම කරන්නේ තථාගතයනට ගෞරවාදිය කරයි. මෙයිනුත් දහම ම මෙලෝ පරලෝ දෙක්හි ම උතුමැ යි දත යුතු.

6. වාශිෂ්ඨයෙනි, තෙපි නානා ජාති නාම ගෝත්‍ර කුල ඇත්තහු පැවිදි ව ඉන්නහු ය. එසේ වූ තොපෙ අනින් යමකු 'යුෂ්මත්හු කවරහු ද?'යි විචාළොත් 'අපි ශ්‍රමණ ශාක්‍යපුත්‍රියයම්හ'යි පිළිණ කරවු.

කිසිවකු විසිනුත් වෙනස් කළ හැකි නොවන පරිදි තිර ලෙස තථාගතයන් කෙරෙහි යමකු ගේ සැදැහැ පිහිටියේ නම් ඔහු විසින් 'මම් භාග්‍යවතුන් වහන්සේ ගේ ඖරස වූ මුඛයෙන් උපන්[383] ධර්මයෙන් උපන්[384] ධර්මයෙන් නිර්මිත වූ[385] ධර්මදායාදයට[386] සුදුසු වූ පුත්‍ර වෙමි'යි කියැ යුතු යි. ඒ කවර හෙයින? **ධර්මකාය බ්‍රහ්මකාය ධර්මභූත බ්‍රහ්මභූත**[387] යනු තථාගතයනට නම් ය. එ බැවිනි[388].

384. මුඛයෙන් උපන් = උරයෙහි (හද පත්ලෙහි) වැස මුඛයෙන් නික්මුණු, ධර්මඝෝෂ වශයෙන් මාර්ග ඵලයන්හි පිහිටි 385. ආර්ය ධර්මයෙන් උපන් ආර්ය ධර්මයෙන් නිර්මිත. 386. නවලෝකොත්තර ධර්ම නමැති දායාදයට (දුවැද්දට) සුදුසු 387. ධර්මමය කාය ඇත්තේ ධර්මකාය නම්. ශ්‍රෙෂ්ඨ බැවින් ධර්මය බ්‍රහ්ම නම්. එබ්‍රහ්ම (ධර්ම) මය කාය ඇත්තේ බ්‍රහ්මකාය නම්. ධර්ම සවභාවය ඇත්තේ ධර්මභූත නම්. බ්‍රහ්මභූත යනු ද ඒ ම ය. 388. බ්‍රහ්ම යනු ධර්මයට නමෙකි.

7. වාශිෂ්ඨය, දික් කලකට පසු මේ ලොව නස්නේ ය. එ සමයෙහි බෙහෙවින් සත්හු ආභාස්වර දේවනිකායෙහි උපදනාහ. ඔහු ධ්‍යානචිත්ත බලයෙන් උපන්නෝ ප්‍රීතිය ගොදුරු කොට ඇත්තාහු තමන්ගේ ම ශරීරගත ආලෝකයෙන් බබළන්නාහු ආකාශචාරී ව ශුභස්ථායී[389] ව දික් කලක් එහි සිටිත්. කල් යෑමෙන් ලොව හටගන්නා සමයෙහි ඔහු ඒ ආභාස්වර බ්‍රහ්මනිකායයෙන් සැව මිනිස්ලොවැ ඕපපාතික වැ ඉපිද ස්වයංප්‍රභ ව ආකාශචාරී ව ප්‍රීතිභක්ෂක ව ශුභස්ථායී ව කල් යවත් එ සමයෙහි මෙ (අද පවත්නා) ලෝකය හුදු දියකදෙකි. සියලු තැන හුදු අඳුර පැවැත්තේ වේ. චන්ද්‍ර සූර්‍ය නක්ෂත්‍ර තාරකාවෝ නො පැණෙති. රෑ දවල් මාස ඍතු හවුරුදු වශයෙන් පරිච්ඡේදයෙක් නො පැණේ. ගැහැනු පිරිමි වශයෙන් භෙදයෙක් ද නො පැණේ. හුදෙක් **'සත්ත්ව'** යන ව්‍යවහාර මාත්‍රය පවති.[390] නැවත කල් යෑමෙන් රස පොළොව දිය මතුපිට පැතිරී යෙයි.

8. එක්තරා කෑදර සත්ත්වයෙක් රස පොළොවැ ඇඟිල්ල ගා ලෙවකෑ ය. හේ එ රසයෙහි ඇලුණේ ය. අන්‍යයෝ ද ඔහු අනුව රස පොළෝ ඕජාව දිව ගා එහි ඇලුණාහ.

නැවැත ඔහු එ රසපොළොව පිඬු කොට කන්නට වූහ. මෙ හේතුයෙන් ඔවුන්ගේ ශරීරප්‍රභාව අතුරුදහන් විය. එය අතුරුදහන් වූ විට හිරු ද ඉන් පසු සඳු ද ඉන් පසු තරුහු ද පැනුණාහ. එයිට පසු රෑ දවල් මාස ආදීහු වූහ.

9. රස පොළොව අනුභව කිරීමෙන් කල් යෑමේ දී ඒ සත්ත්වයන්ගේ සිරුරු රළු විය, පැහැයෙන් අඩු විය. එයට පසු වර්ණවත් කිසි කෙනෙක් දුර්වර්ණයන් බලා මොවුනට වඩා

389. ශුභස්ථායී = ශෝභන උයන් විමන් කල්ප වෘක්ෂාදියෙහි සිටින්නෝ හෝ ශෝභන වස්ත්‍රාභරණ ඇති ව සිටින්නෝ. 390. ලොව හටගැන්ම ගැන දඹදිව දාර්ශනිකයෝ නානා මත දරති. ආරම්භයෙහි අඳුර වැළඳූ අඳුර ම වී ය. එ සියල්ල එකම සලිල (ජල) යෙකැ' යි ද, එහි 'අසත්' වූ අම්භීය එකම පදාර්ථය එහි තපෝ බලයෙන් සත් වී යැ යි ද, එය තුළ මුලින් ම කාමය ද ඉක්බිති බුද්ධිය (මනස) පහළ වී යැ යි ද ඒ බුද්ධිය තම් සෝගීභාව රශ්මිය වශයෙන් පෙනෙනා පදාර්ථයැ යි ද, ඒ රශ්මිය සියලු තැන්හි පැතිර පැවැත්තේ යැ යි ද, ඉන් රෙතෝධ මහිම දෙක පහළ වී යැ යි ද, එහි ප්‍රයති ස්වධා හෙවත් පුරුෂ ප්‍රකෘති දෙදෙනා ඉහළින් හා පහළින් හා ඇති වූහ යි ද උපනිෂද්ග්‍රන්ථවල පෙනේ (මෙහි අප් ගැන ඔහු නානා මත දරත්. බ්‍රාහ්මණයන් ගේ වේදයන්හි ද යුදෙව්වන්ගේ බයිබලයේ ද කොරාන් පොතේ ද එන ලෝ උපත පිළිබඳ කථාවලැ සමානත්වයෙක් ද ගුප්තාප ඇති බවෙක් ද පෙනේ.

වර්ණවතුම්හ යි අභිමානය ඉපැදවූහ. එයින් නැවත නැවත උපදවන මානාතිමානාදිහේතුයෙන් කල් යෑමේදි රසය නැති වී ය. එයට පසු මිහිරි රසැති බිම්මල් වැනි දෑයෙක් පහළ වීය. එය වළඳන්නවුන් ගේ සිරුරුවලැ බෙහෙවින් රළුබවත් විවිධ වර්ණ ඇති බවත් විය. වර්ණවතුන් දුර්වර්ණයන් හෙළා දක්මෙන් මානාතිමානාදිය වැඩිමෙන් ඒ බිම් මල් වැනි දෑ ද අතුරුදහන් ව මිහිරි රසැති බදාලතා නම් වැල්වෙසෙසෙක් පහළ වී ය. එය වළඳන්නවුන් ගේ සිරුරුවලැ දැඩි බව කලින් වූවාට ද වැඩි වීය. වර්ණයෙන් වෙසෙස ද වැඩිණි. ඔවුන් ගේ වර්ණයෙන් වූ මානය වැඩිමෙන් කල්යෑමේදී බදාලතා ද අතුරු දහන් වීය. එයින් පසු කුඩු දහඩියා නැති රසවත් හැල් වෙසෙසෙක් පහළ වී ය. එය වළඳන්නවුන් ගේ සිරුරු වඩාත් රළු විය. පැහැයෙන් වඩාත් වෙනස් වීය. මෙ සමයෙහි ඉත්‍ථිලිඟු පුම්ලිඟු පහළ වීමෙන්[391] ස්ත්‍රීපුරුෂ භේදය වී ය. කල් යෑමේදී ස්ත්‍රීපුරුෂයන් ඔවුනොවුන් කෙරෙහි රාගය ඉපිදවීමෙන් කාම-පරිදාහය පහළ වී ය. එ හෙයින් මෙවුන්දම් සෙවීම වී ය.

10. එ සෙමෙහි සත්ත්වයෝ මෙවුන්දම් සෙවුනවුන් දැක ඔවුන් දෙසට පස් හෝ අළු හෝ ගොම හෝ විසි කරත්. සතසුට සතෙක් කෙසේ නම් මෙබන්දක් කෙරේ දෑ!'යි නිග-නිත්. **එ සිරිත අනුව දැනුදු ඇතැම් රටවලැ මිනිස්සු ස්ත්‍රියක සරණ පාවාගන්න යන කල පස් අළු ගොම හෝ දමාගසත්.** එ කල 'අධර්ම' යැ යි සම්මත වූ මෙවුන්දම දැන් 'ධර්ම' යැ යි සම්මත ය. එ සමයෙහි මෙවුන්දම් සෙවූවන් මසක් දෙකක් යන තුරුත් ගමකට නුවරකට නො වැද්ද ගනිත්. බොහෝ වේලා මෙවුන්දම් සෙවූහු මෙ රහස වසාලන්නට ගෙවල් තැංවූහ.

11. එක් මිනිසෙක් උදේ හවස දෙකේ හැල් ගෙනීමට මැලි ව දෙවේලට ම සෑහෙන්නට එක් වරම එය ගෙනායේ ය. එය දත් අනෙකෙක් දෙදිනකට පමණ වූ හැල් එක් වර ම ගෙනා ය. අනෙකෙක් එය දැක තෙදිනකට සෑහෙන පමණ හැල් එක්විට ම ගෙනායේ ය. මෙසේ දින තුන හතර පස ආදී වශයෙන් වැඩී ගොස් බොහෝ දින ගණනකට හැල් එක් විට ම ගෙනෙන්නට පුරුදු වූහ. හැල් ගෙනවුත් රැස් කොට තබන්නට පටන්ගත් පසු කලෙකදී හැල්හි කුඩු ද පහළ වී ය. තව කලකට පසු දහඩියා ද ඇතිවිය. කලකට පසු හැල් කැපූ

391. ලෝකවිනාශයට පෙර ස්ත්‍රී ව සිටියනට ස්ත්‍රීලිංගය (ස්ත්‍රී ස්වභාවය) ද පුරුෂ වූවනට පුරුෂස්වභාවය ද පහළවීය.

තැන යලි කරල් නො නැඟීම ද වී ය. තැන තැන පඳුරු වශයෙන් පැල නැඟීම විය. ඉන් පසු ඔහු හැල් කෙත් බෙදා ගෙන මියර බැන්දහ.

කිසිවෙක් අන්සතු හැල් සොරා ගත. සෙසස්සෝ ඔහුට වරක් දෙකක් අවවාද කළහ. තෙවැනි වර සොරකම් කළ ඔහුට කෙනෙක් පහර දුන්හු. කෙනෙක් ගලින් ද කෙනෙක් දඬුයෙන් ද ගැසූහු. එතැන් පටන් සොරකම, ගැරහුම, බොරු කීම, දඬු ගැනීම යන මොහු ඇති වූහු.

12. ඉක්බිති එ සත්හු රැස් ව සාකච්ඡා කොට ලොවැ (වරද) පහළ වූ බැවින් නඩු අසා දඬුවම් දෙනු පිණිස ඔවුන් අතුරෙන් දැකුම්කලු මහ තෙදවත් මිනිසකු දෙවු තන්හි තබා ගත්හ. ඔහුට තමතමන් කෙත්වලින් හැල් කොටස බැගින් දුන්හ. මහාජන සම්මත වූ හේ **මහාසම්මත යැ යි** පළමු නම් ලැබී ය. කෙත්වලට අධිපති බැවින් ක්‍ෂත් යැ යි යන දෙවෙනි නමෙක් ද ඔහුට වී ය. දැහැමින් ජනයා රඳවන (සුවපත් කරන, පිණවන) හෙයින් **රජ** යැ යි තෙවෙනි නමෙක් ද වී ය. මෙ සේ අග්‍රසම්මත නමින් ක්‍ෂත්‍රියමණ්ඩලය ඇති විය. ඒ ක්‍ෂත් කුලය ඇති වීම ද තමනට සමාන ජනයා අතුරෙහි ම ධර්මයෙන් ම වි ය. මෙසේ ධර්මය ම මෙලෝ පරලෝ දෙකින් ම උතුම.

13. ඇතැම් කෙනෙක් ‘ලොවැ පව් ඇති විය. අපි එය බාහනය කරම්හ’යි (දුරලම්හ යි) සිතා එයින් වැළැකියහ. ‘පව් දුරු කරන්නෝ ය’ යන අර්ථයෙන් ඔහු බමුණු (බ්‍රාහ්මණ) නම් වූහු, මෙසේ ඔවුනට බමුණු යැ යි පළමු නම වී ය. ඔහු වනයෙහි පන්සල් කොට දහන් වැඩූහ. ගම්හි උදේ සවස පිඬු සිඟා දිවි රැක්කහ. ඔවුනට දහන (ඣාන) කරන්නෝ යන අරුත් ඇති **ඣායක** යන දෙවෙනි නම ද කලෙකදී වී ය. වෙනෙහි විසිය නුහුණු කිසි කෙනෙක් ගම් නියම්ගම් වෙත බැස ග්‍රන්ථ කරමින් උගන්වමින් විසූ හ. ඔවුන් දුටුවහු ‘මොහු ධ්‍යාන නොකරන්නෝ’ යන අර්ථය සලකා **අජ්ඣායක**යෝ යි නම් කළහ. මෙසේ **අජ්ඣායක** යන තෙවෙනි නමෙක් ද ඔවුනට විය. එ සමයෙහි හීන යැ යි සම්මත වූ **අජ්ඣායක** යන තෙවෙනි නම් දැන් ශ්‍රේෂ්ඨ සම්මත ය. ලෝකවංශකථානුකූල වැ බමුණු ගණයා ගේ නම් ද ඔවුන් ගේ උත්පත්තිය ද මෙකී පරිදි ය. ඒ උත්පත්තිය ද ඔවුනට අසමාන සත්ත්වවර්ගයා ගේ නො ව සමාන වූ ම (එක වර්ගයේ ම) සත්ත්වයන් සම්බන්ධයෙන් විය. ඒ ද ධර්මයෙන් ම ය.

14. ඇතැම් කෙනෙක් මෛථුන්දම් සෙවිනුවෝ ගෙරිරැකුම් ආදි කර්මාන්ත කළහ. ඔහු එහෙයින් **වෙස්ස**[392] නම් වූහු. මෙසේ ඒ එක් ම සත්මුළුයෙහි වෛශ්‍යයන් ඇති වීම ධර්මයෙන් ම (ඔවුන්ගේ පැවැත්ම අනුව ම) වී ය. ඇතැම්හු රළු පැවැතුම් ඇත්තෝ වූහු. රුදුරු, එහෙයින් ම සුදුරු (පහත්) කැරුම් ඇත්තෝ ය යන අරුත උඩ ඔවුනට සුදුරු යන බැවහරය විය.

15. මෙ සේ ලෝකෝත්පත්තිවංශ කථාව පරිදි ක්ෂත්‍රියාදි සතර වර්ණයන් ගේ උත්පත්තිය වී ය. ඒ ද ධර්මයෙන් ම (ඔවුන් ගේ පැවැත්ම පරිදි ම) විය. මෙසේ දෙලෝහි ම ධර්මය ම උතුම.

16. ක්ෂත්‍රියයන් ද බ්‍රාහ්මණයන් ද වෛශ්‍යයන් ද ශුද්‍රයන් ද තම තමන් ගේ ධර්මයනට (රජකම් වේද ඉගැන්වීම් ආදි තම්හට අයත් පැවැතුම්වලට) නිඳා කරමින් පැවිදි වන කාලයෙක් වී ය. එ කලැ මේ සතර මණ්ඩල අතුරෙන් **ශ්‍රමණමණ්ඩලයේ** උපත වී ය. ඒ ද සමාන සත්ත්වයන් අතුරෙහි ඔවුන් පිළිපදනා ධර්මයෙන් ම වී ය. මෙ සේ ධර්මය ම දෙලොවැ ම උතුම.

17. ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍ර යන සතර මණ්ඩලයෙහි කායික වාචසික මානසික අකුසල් කරන මිසදිටු වූ යමෙක් වේ නම් හේ දුර්ගතිගාමී වේ. එසේ ම තුන් දෙරින් සුසිරි පුරන්නේ සම්දිටු වේ, සුගතිගාමී ද වේ. ඒ සතර වර්ණයෙහි යමෙක් තුන් දෙරින් කලෙක කුසලුත් කලෙක අකුසලුත් කෙරේ නම්, කලෙක මිසදිටුත් කලෙක සම්දිටුත් වේ නම්, හේ සුවදුක් දෙක ම ලබන්නේ ය. ඒ සතර වර්ණයෙන් කවර වර්ණයෙක සත්ත්වයකු වුවත් කායසංවර වාක්සංවර මනඃසංවර යන තුනින් සංවෘත නම්, හේ බෝපැකි දහම් වඩා කෙලෙස්-පිරිනිවනින් පිරිනිවෙන්නේ ය. මෙසේ මේ සතර වර්ණයෙන් කවර වර්ණයෙක මිනිසකු වුවත් කෙලෙස් නසා රහත් වුවොත් හේ තමාගේ ධර්මයෙන් ඒ සියලු දෙනා ගෙන් ම අග්‍ර යැ යි කියනු ලැබේ. ඒ ද ධර්මයෙනි, අධර්මයෙන් නො වේ. මෙසේ ධර්මය දෙලෝහි ම උතුම.

---

392. විසු: කම්මන්තා, විස්සුත කම්මන්තා යැ යි පෙළෙහි පාඨ දෙකකි. ගෝපාලනාදියෙහි වෙන් වෙන් ව යෙදුණහ යි කියා හෝ ප්‍රචලිත කර්මාන්තයෙහි යෙදුණහ යි අර්ථ කිය හැකි. විමැසිය යුතු. විශ් යනු ගෘහවාසයෙහි (ගිහි ගෙයි) වසන්නෝ ය යනු අරුතින් (වෙස්ස යැ යි) කිය හැකි. රුද්ද (රුදුරු) ඛුද්ද (කුඩා) යන පද ම බැවහරයේ දී පෙරළී සුද්ද (ක්ෂුද්‍ර) යන්න වූ බව මෙයින් දක් වේ.

18. එහෙයින් සනත්කුමාර බඹහු විසිනුත් **“සිය ගොත් සිහි කරන ජනයා අතුරෙහි ක්ෂත්‍රියයා උතුම. අෂ්ට විද්‍යා හා පසළොස් චරණ ධර්මයෙන් යුක්ත පුද්ගලයා සියලු දෙව් මිනිසුන් අතුරෙහි උතුමැ” යි කියන ලදී.**

සනත්කුමාරයා ගේ මේ භාෂිතය මැනැවැ යි මා විසිනුත් අනුමත ය.

[වාශිෂ්ඨභාරද්වාජයන් හා භාග්‍යවතුන් වහන්සේ ගේ කථා-සංලාපය, චතුර්වර්ණයන් ගේ ප්‍රභවය, බමුණන් ගේ ජාතිවාදය හේතු රහිත බව, ආදිකල්පිකයන් ගේ ප්‍රවෘත්ති, කවර වර්ණයෙක වුවත් දැහැමි වුවහු ශ්‍රේෂ්ඨ බව, වර්ණ අතුරෙන් ක්ෂත්‍රියවර්ණය ශ්‍රේෂ්ඨ බව, ධර්මය දෙ ලෝහි ම ශ්‍රේෂ්ඨ බව යන මොහු මෙහි දක්වන ලදහ.]

---

28. සම්ප්‍රසාදනීය සූත්‍රය.

එක් සමයෙක බගවත් බුදුරජ්ජුහු **නාලන්දා** නුවර **පාවාරික** අඹ වෙනෙහි වැඩ වෙසෙති. එ සමයෙහි දිනක් සැරියුත් තෙරණුවෝ ඔබ කරා එළැඹ වැඳ පසෙක හිඳ, ‘සම්බෝධියෙන්[393] භාග්‍යවතුන් වහන්සේට වැඩි මහණෙක් බමුණෙක් පෙරත් නො වී යැ’ යි ‘දැනුත් නැතැ’ යි ‘අනාගතයෙහිත් නො වන්නේ යැ’ යි කියා තමන් තුළ ඇති පැහැදීම පැවැසූහ.

2 බුදුරජ්ජුහු ද සැරියුත් තෙරුන් කී බස අභීත සිංහනාදයෙකැ යි වදරා, ‘ඒ කාලත්‍රයගත බුදුවරුන් ගේ සිත් සිය සිතින් බලා ඒ සර්වඥවරයන් ගේ ලොව්ලොවුතුරා සිල් ආදිය ඇති සැටියෙන් පසක් කොට දැන මෙසේ කිවහු දැ?’යි අසා වදාළහ. සම්මාසම්බුදුවරයන් ගේ සියලු ගුණ දක්නට හැකි සර්වඥතාඥතාඥනයක් තමනට නැතැ යි තෙරණුවෝ කීහ. එසේ නම් කවර සැටියෙකින් මෙ බඳු සිංහනාදයක් කළහු දැ?’යි බුදුරජ්ජුහු පුළුවුත්හ. සව්පැරුම් නුවණැ සිට නයග්‍රාහයෙන් අනුමාන නුවණින් සර්වඥතාඥනය මෙසේ වියැ යුතු යැ’යි දැන තමන් එසේ කී බවත්, පංචනීවරණයන් දුරු කැරැ සතර සතිපට්ඨානයෙහි මනා කොට පිහිටි සිතැති වැ සත් බොජ්ඣඟ දහම් ඇති සැටියෙන් වඩා ම ලොවුතුරා බුදුබවට පෙරැ බුදුවරුන් පැමිණි බවත්, මතු බුදුවරුන් පැමිණෙන බවත්, වත්මනැ

393. සම්බෝධිය = සියල්ල දන්නා නුවණ රහත්මග නුවණ හෝ. දූගසම්බෝ රහත්මංනුවණින් ම සව්පැරුම්නැණ ලබත්. පසේබුදුහු එයින් ප්‍රත්‍යෙකබෝධිඥනය ලබත්. ලොවුතුරා බුදුහට සර්වඥතාඥනය ද සියලු බුදුගුණ ද රහත්මගනැණින් ම ලැබේ.

ලොවුතුරාබුදු වූ අප භාග්‍යවතුන් වහන්සේත් ඒ මඟින් ම සම්‍යක්සම්බෝධිය ලත් බවත්, යම් සවුපැරුම් නුවණෙකැ පිහිටා කාලත්‍රයවර්ති බුදුවරුන් ගේ සම්‍යක්සම්බෝධිය නිරුත්තර බව න්‍යායග්‍රාහයෙන් තමනට දත හැකි වී නම් ඒ ශ්‍රාවකපාරමීඥානය භාග්‍යවතුන් වහන්සේ තමනට වදාළ බණ අසා ම ලත් බවත්, 'එහෙයින් එබඳු ධර්මයක් වදාළ භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බුද්ධ යැ යි ඔබ දහම ස්වාක්ඛ්‍යාත මැ යැ යි ඔබ සව්මුළුවත් සුප්‍රතිපන්න මැ යැ' යි බුදුරජුන් කෙරෙහි තමන් ඉතා පැහැදුණ බවත් සැළ කළහ.

2. ඉක්බිති බුදුරජුන් කෙරෙහි තමන් පැහැදෙනුවට කරුණු වූ අනුත්තරිය ධර්ම සොළොස ද පැවැසූහ. ඔහු නම්:

i. "බගවත් බුදුරජහු කුසල් දහම්[394] පැණැවීමෙහි නිරුත්තරයහ. (අක්තම හ).

ii. ආයතන ප්‍රඥප්තියෙහි[395] නිරුත්තර හ.

iii. ගර්භාවක්‍රාන්තියෙහි[396] නිරුත්තර හ.

iv. ආදේශන කොට්ඨාසයන්හි[397] නිරුත්තරය හ.

v. දර්ශනසමාපත්තියෙහි[398] නිරුත්තර හ.

---

394. කුසල් යනු නිවැරදි නිදෙස් දහම් ය. උසස් ම කුසල් දක්වූවෝ බුදුරජ්හු ම ය. උසස් මැ කුසල් නම් සත්තිස් බෝපැකි දහම් ය. උපග්‍රන්ථය බලනු. මෙයට වැඩි තරම් කුසලක් දෙසනුවෙක් ලොවැ නැත. මෙසේ ඔබ කුසල් දෙසනුයෙහි අක්තම හ. 395. චක්ෂුරායතන රූපායතනාදිය පැණැවීමෙහි. උපග්‍රන්ථය බලනු. 396. ගැබෑ පිළිසිඳ ගැන්මෙහි. උපග්‍රන්ථය බලනු 397 ඇතැම්හු අන්‍යයන්ගේ යෑම් ඊම් ආදි නිමිත්තෙන් ඔවුන් ගේ සිත පැවැති අදහස් දැන කියති. ඇතැම් කෙනෙක් මිනිසුන් ගේ අමනුෂ්‍යයන්ගේ හෝ දේවතාවන් ගේ කථා අසා එයින් අනුන් ගේ සිත් දැන කියත්. අන් කෙනෙක් අන්‍යයන් ගේ විතක්ක විප්ඵාර ශබ්ද අසා ඔවුන් සිතූ වූ අදහස කියති. කෙනෙක් පරචිත්තවිජානන ඥානයෙන් (පරසිත් දක්නා නුවණින්) අනුන් සිත් දැන කියත්. මෙ අයුරින් පරසිත් දැනීමෙහි භාග්‍යවතුන් වහන්සේට වැඩියි වියෙක් නැත. 398. සෝතාපත්තිමග්ගාදි සතර මාර්ග දර්ශනසමාපත්ති නම. ප්‍රථමාදි ධ්‍යාන සතර ද දර්ශනසමාපත්ති නම. දෙතිස් පිළිකුල අරමුණු කොට පටන් ගත් විදර්ශනාව, ඇට අරමුණු කොට පටන් ගත් විදර්ශනාව, ශෛක්ෂ්‍යපෘථග්ජනයන් ගේ චේතෝපරියායඥානය රහත්හු ගේ චේතෝපරියායඥානය යන සතර ද දර්ශනසමාපත්ති නම්. දෙතිස් පිළිකුල අරමුණු කොට ඉපිදවූ ප්‍රථම ධ්‍යානය පාදක කොට ලැබූ සෝතාපත්තිමාර්ගය ද ප්‍රථම දර්ශන සමාපත්ති නම. ඇට අරමුණු කොට ඉපිදවූ දිවැසට පාදක වූ ධ්‍යාන සමාපත්තිය දෙවෙනි දර්ශන සමාපත්ති නම. ඒ ධ්‍යානය පාදක කොට ඉපිදවූ සකෘදගාමි මාර්ගය ද දෙවෙනි දර්ශනසමාපත්ති නම. ශෛක්ෂ්‍ය පෘථග්ජනයන් ගේ චේතස්පර්‍ය්‍යායඥානය තෙවෙනිදර්ශන සමාපත්ති නම. රහත්හු ගේ චේතස්පර්‍ය්‍යායඥානය සිවුවන දර්ශනසමාපත්ති නම.

vi පුද්ගලප්‍රඥප්තියෙහි[399] නිරුත්තර හ.

vii. ප්‍රධාන වීර්‍ය්‍යයෙහි[400] නිරුත්තර හ.

viii ප්‍රතිපත්තිදේශනායෙහි[401] නිරුත්තර හ.

ix. භාෂ්‍ය (කථා) සමාචාරයෙහි[402] නිරුත්තර හ.

x. පුරුෂශීලසමාචාරයෙහි[403] නිරුත්තර හ.

xi. අනුශාසන කොට්ඨාසයන්හි[404] නිරුත්තර හ.

xii. පරපුද්ගල විමුක්තිඥානයෙහි[405] නිරුත්තර හ

xiii. ශාශ්වතවාදයෙහි[406] නිරුත්තර හ.

xiv. පූර්වනිවාසඥානයෙහි[407] නිරුත්තර හ.

xv. දිව්‍යචක්ෂුර්ඥානයෙහි[408] නිරුත්තර හ.

xvi. සෘද්ධිවිෂයයෙහි[409] නිරුත්තර හ.”

---

399. සම්මතිකථානුකූල ව පුද්ගලයන් බෙදා දක්වීමෙහි ද භාග්‍යවතුන් වහන්සේට වැඩි සමයෙක් නැති. තථාගතයන් වහන්සේ උභතෝභාගවිමුත්ත පඤ්ඤාවිමුත්ත කායසක්ඛි දිට්ඨිප්පත්ත සද්ධාවිමුත්ත ධම්මානුසාරි යැ යි සත්කොටසකට පුද්ගලයන් බෙදා වදාළ සේක. මෙ සත්පුද්ගලයන් ගේ විභාගය මතු සංගීති සූත්‍රයේ සප්තක කාණ්ඩයෙන් දතයුතු. 400. මෙහි ප්‍රධාන යනු සප්ත බොධ්‍යංගයෝ යි. සංගීතිසූත්‍රයේ සප්තක කොටස බලනු. 401. දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාදි ප්‍රතිපත් සතර. මෙහි ප්‍රතිපත් යන්නෙන් අභිප්‍රෙත යි සංගීතිසූත්‍රයේ ප්‍රතිපත්ති යන්න බලනු. 402. කථාසමාචාරය ගැන භාග්‍යවතුන් වහන්සේ දෙසූ බණ ඇසූ මහණ තෙම බොරු නොවූ භේදකර නොවූ රළු නොවූ ශඨ නොවූ බොල් නොවූ චතුස්සත්‍යාදිය ඇසුරු කළාවූ ම කථා ඇත්තේ ය. 403. අසත්පුරුෂයන් දුහැමෙන් සෙමෙන් පිරිසිදු ජීවිතයක් ගතවනවුන් වන පරිදි දම් දෙසීමෙහි බුදුරජුනට වැඩි සමයෙක් නැත. 404. සෝවාන් ආදි ආශ්‍රමාභිඵලයනට පැමිණිය හැකිවන පිළිවෙත මග කියා පා අනුශාසන කිරීමෙහි ද භාග්‍යවතුන් වහන්සේට උත්තරීතරයෙක් නැත. 405. මෙ තෙමේ සෝවාන් වන්නේ ය. යන ආදින් ඒ ඒ අය ගේ ඒ ඒ මගින් කෙලෙසුන් නෙන් මිදීම දැනගැන්මෙහි ද භාග්‍යවතුන් වහන්සේට වැඩි වැඩි සමයෙක් නැති. 406. ශාශ්වතවාදය බෙදා දක්වීමෙහි ද භාග්‍යවතුන් වහන්සේ අනුත්තර ය. ශාශ්වතවාදවිභාගය මෙ පොතේ මුලට සඳහන් බ්‍රහ්මජාල සූත්‍රයෙන් දත යුතු. මෙතැන එහි කේවලශාශ්වතසතරින් මුල්තුන අභිප්‍රෙත යි 407. පූර්වනිවාසානුස්මෘති ප්‍රකාශකිරීමෙන් දම් දෙසීමෙහි ද භාග්‍යවතුන් වහන්සේ සියල්ලට ම ශ්‍රෙෂ්ඨ ය. 408. සත්ත්වයන් ගේ ච්‍යුත්‍යුපපත්ති දක්නා ඥානය විභාග කොට දම් දෙසීමෙහි ද භාග්‍යවතුන් වහන්සේ අනුත්තර ය. 409. ආශ්‍රවිර්ද්ධිය ලෞකිකාර්ද්ධි යැයි සෘද්ධිය විවිධ යි. පොළොව කිමිදීම් අහසින් යෑම් ආදිය ලෞකිකාර්ද්ධි නම්. පිළිකුල් සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය පැතිරවීමෙන් හෝ ධාතුසංඥාව එළැවීමෙන් අප්‍රතිකූලසංඥී ව ද නොපිළිකුල් සතුන් කෙරේ (ඉටුඅරමුණෙහි) අශුභ හෝ අනිත්‍ය සංඥාව පැතිරවීමෙන් ප්‍රතිකූලසංඥී ව ද පිළිකුල් නොපිළිකුල් අරමුණෙහි ම ප්‍රතිකූලසංඥී ව ද, ඒ දෙඅරමුණෙහි ම උපේක්ෂක ව ද විසීමෙහි ආයස්ම තෙමේ සමර්ථ ය. මෙය ආර්‍ය්‍යර්ද්ධිය යි. මෙසේ සෘද්ධිවිෂයයෙහි දේශනාසාමර්ථ්‍යයෙන් ද භාග්‍යවතුන් වහන්සේ ම අනුත්තර ය.

4. සැරියුත් තෙරණුවෝ බුදුරජාණන් වහන්සේගේ මේ අනුත්තරිය ධම් සොළොසක් එයින් තමන් ගේ ප්‍රසාදයක් දක්වා ඉක්බිති භාග්‍යවතුන්සේ අත්තකිලමථානුයෝග කාම-සුඛල්ලිකානුයෝග දෙකින් තොර බව ද, සතර ධ්‍යාන කැමැති පරිදි ලෙහෙසියෙන් නො අඩුව ලැබ වසන බව ද, කාලත්‍රයයෙහි භාග්‍යවතුන් වහන්සේට සම්බෝධියෙන් වැඩි කෙනෙකුන් ඇති නැති බව යමකු විචාළොත් නැතැ යි තමන් උත්තර දෙන බව ද, සම්බෝධියෙන් සම වූවන් (අන්බුදුවරුන්) අතීතානාගත දෙකල්හි ඇති නැති බව යමකු ඇසුවොත් ඇතැ යි කියන බව ද, එහෙත් වර්තමානයෙහි භාග්‍යවතුන් වහන්සේට එයින් සම කෙනෙක් ඇද්ද?යි ඇසුවොත් නැතැයි කියා ම උත්තර දෙන බව ද, 'එක්තරා ශාස්තෘකෙනෙකුන්ගේ ම අනුත්තර බව පිළි-ගන්නෙහිද?' යි අනුන් විචාළොත් අතීතානාගත දෙක්හි ම සම්බෝධියෙන් සම තථාගතවරුන් ඇති බවත් එහෙත් එක් කලෙක සම්බුදුවරුන් දෙනමක් පහළ විය නො හැකි බවත් භාග්‍යවතුන් වහන්සේගේ ම සම්මුඛයෙන් අසා තමන් පිළිගත් නියාව ද පවසන බවත් වදළහ.

5. ඉක්බිති මෙසේ උත්තර දීම භාග්‍යවතුන් වහන්සේ ගේ වචනයට අනුකූල වේ ද, නොවේ දැ?'යි තෙරණුවෝ විචාළහ. බුද්ධවචනානුකූල යැ යි බුදුරජ්ජු වදළහ.

මේ කථාව අසා හුන් උදායී තෙරණුවෝ මෙ තරම් මහර්ඝි ඇති මහානුභාව ඇති භාග්‍යවතුන් වහන්සේ ඒ ස්වකීය ගුණ හෙළි නොකොට අල්පේච්ඡතා ආදි ගුණ ඇති ව හිඳීම ආශචර්‍ය යැ යි ද, මෙයින් එක් ගුණයක් වත් අන්තොටු පිරිවැජ්ජනට ඇතොත් එ පමණින් ම ඔවුන් කොඩි ඔසොවාගෙන කියා හැවිදිනැ යි ද කීහ.

7. බුදුරජ්ජු උදායී තෙරුන් ගේ කථාව සබා යැ යි වදරා තථාගතයන් කෙරෙහි සැක විමති ඇතියනට මෙය පුන පුනා කියව'යි වදළ හ.

[මෙහි සැරියුත් තෙරුන් බුදුරජුන් ඉදිරියෙහි තමන් ගේ ප්‍රසාදය සැළ කිරීම, තෙ කල්හි බුදුවරුන් ගේ සම්බෝධිය සමාන බව, සැරියුත් තෙරුන් ගේ ශ්‍රාවකපාරමීඥාන ලාභය, බුදුරජුන් ගේ සොළොස් අනුත්තරිය ධම්, බුදුරජුන් අන්ත දෙකට නො පිළිපන් බව, බුදුරජුන් දෘෂ්ටධම් සුඛවිහාර චතුෂ්කය වූ සතර ධ්‍යානයන් ලැබ වසන බව, බුදුරජුනට වැඩියක්හු හෝ සමයක්හු ඇති

නැති බව් අසන්නහුට සැරියුත් තෙරුන් දෙන උත්තරය, තෙරුන් ගේ මෙ සියලු ප්‍රකාශය බුඩවචනානුකූල බව, මෙය අසා හුන් උදයී තෙරුන් ගේ ප්‍රීතිවාක්‍යය, බුදුන් රජුන් කෙරෙහි සැකවිමති ඇත්තවුනට මෙය නිතර ම දෙසිය යුතු බව යන මොහු මෙ සුතුරෙහි දක්වුණහ.]

29. ප්‍රාසාදික සූත්‍රය

එක් කලෙක බුදුරජුහු සෑ රට (ශාක්‍යදේශයේ) **වේධඤ්ඤ** ශාක්‍යයන් ගේ අඹවෙනෙහි වූ පාසෙහි වැඩ වෙසෙති. ඒ වනාහි නිවට නාපුතු **පාවා** නුවරැදි කලුරිය කළ නොබෝ කල්හි ය.

නිවට නාපුතු කලුරිය කළ පසු ඔහු ගේ සවු නිවටහු නිවට දහම සම්බන්ධයෙන් එකෙක් අනෙකකුට වෙනස් මත ඇත්තෝ කලහ කළ හ. ඔවුන් උවසු ගිහියෝ මෙසින් ඔවුන් කෙරේ කලකිරුණාහ.

2. මෙ පවත් **පාවා** නුවර වස් වුසු චුන්ද තෙරණුවෝ ගොස් **සාම** ග්‍රාමයේ හුන් අනඳ තෙරුනට දන්වූහ. අනඳ තෙරණුවෝ ද චුන්ද තෙරුන් කැටුව බුදුරජුන් වෙත ගොස් මෙ පුවත සැල කළහ. එය මුල් කොට ගෙන බුදුරජුහු මෙය වදාළහ:

3. සියලු දහම් තතු වූ පරිදි නොදැනගත් ශාස්තෲ ද ඔහු වරදවා දෙසූ ධර්මය ද නින්දා ලැබීමට සුදුසු ය. ඒ ධර්මය නොපුරන සව්වා වනාහි ප්‍රශංසාර්හ ය. එබඳු සව්වා ඒ ධර්ම පිරීමෙහි මෙහෙයන්නා ද, එය සමාදන් කරවන්නා ද, සමාදන් කොට ගන්නා ද, එසේ පිළිපදින්නා ද යන සියල්ලෝ බොහෝ නොපින් රැස් කෙරෙති.

තතු සේ දහම් නොදැනගත් ශාස්තෲ ද ඔහු වරදවා දෙසූ දහම ද එය අනුව පිළිපදින්නා ද ගැරහුම් ලැබීමට සුදුසුව හ. එය පිළිපදනහුට පසස්නේ ද, ඒ පැසැසුම් ලබන්නේ ද, එසින් වඩාත් එය පිරීමෙහි වැර වඩන්නේ ද යන සියල්ලෝ බොහෝ නොපින් රැස් කෙරෙත්.

4. තතු සේ දහම් දැනගත් ශාස්තෲ ද ඔබ ගේ ස්වාඛ්‍යාත ධර්මය ද ප්‍රශංසාර්හ ය. එය නො පුරන ශ්‍රාවකයා ගර්හා ලැබීමට සුදුසු ය. ඒ දහම් පිරීමෙහි මෙහෙයන්නා ද, එය සමාදන් කරවන්නා ද, සමාදන් කොට ගෙන පිළිපදින්නා ද බොහෝ පින් රැස් කෙරෙත්.

සියල්ල තත් වූ පරිදි දැනගත් ස්වාඛ්‍යාත ධර්මය ඇති ශාස්තෘවරයකු සච්චත් ඔහු දහම නොදතුවන් වැ ඉන්ද්‍රිය පිරිනිවන් පෑම ඒ සච්චනට පසුතැවිලි ඇති කෙරේ. සියල්ල තත් වූ පරිදි දැනගත්, ස්වාඛ්‍යාත ධර්මය ඇති, ඒ දහම් දැනගත් ශ්‍රාවකයන් ඇති ශාස්තෘවරයකු ගේ කලුරිය කිරීම ශ්‍රාවකයනට පසුතැවිල්ල ඇති නො කෙරේ.

5. මේ යට කී අංගවලින් සම්පූර්ණ වුව ද, ශාස්තෘ තෙමේ ස්ථිර වූ, වයසින් මේරූ, පැවිදි වැ කල්ගත වූයෙක් නො වේ නම්, ඒ සස්න මෙ කරුණින් (මෙ අංගයාගේ අඩු බැවින්) අසම්පූර්ණ වේ. ශාස්තෲහු ගේ ස්ථවිරභාව සංඛ්‍යාත අංගයන් ඇත් නම් එයින් එ සස්න පරිපූර්ණ වේ. එහෙත් ව්‍යක්ත වූ, හික්මුණු, විශාරද වූ, රහත්බව ලැබූ, කරුණු දක්වා පරවාද මර්දනය කොට දම් දෙසීමෙහි ප්‍රබල වූ ස්ථවිර මධ්‍යම නවක මහණ මෙහෙණියන් ද, බ්‍රහමචාරී උපාසක උපාසිකාවන් ද නැති සස්න මෙ එකි එකි අංගයෙක අඩු බැවින් නො පිරුණේ වේ. නිසරු වේ. ලාභයෙන් යශසින් අගපත් නො වේ. එකී සියලු අංගවලින් සම්පූර්ණ වූ සස්න ම සමෘද්ධත් ලාභයෙන් යශසින් අග්‍රප්‍රාප්තත් වේ.

6. මම් වනාහි මෙ සෙමෙහි ලොව පහළ වූ රහත් සම්මා-සම්බුදු ශාස්තෘ වෙමි, මගේ ධර්මය ද ස්වාඛ්‍යාත වේ, නෛර්‍යාණික වේ. ශ්‍රාවකයෝ ද මගේ ධර්මය තේරුම් ගත්තෝ වෙති. ඔවුන් ගේ මාර්ගබ්‍රහ්මචර්‍යය පරිපූර්ණ ය. ශාස්තෘ වූ මම දැන් ස්ථවිර ද චිරරාත්‍රඥ ද වෙමි. පැවිදි වූ බොහෝ කල් ඇති යෙමි ද මහලු වයසට පැමිණියෙම් ද වෙමි. ව්‍යක්තතාදි අංග-වලින් සම්පූර්ණ ස්ථවිර මධ්‍යම නවක භික්ෂු භික්ෂුනීහු ද, බ්‍රහ්මචාරී වූත් නො වූත් උපාසක උපාසිකාවෝ දැ යි අංග සම්පූර්ණ සිවු පිරිස් මට වෙති.

7. දැන් මා සස්න සමෘද්ධ ද ව්‍යාප්ත ද බහුජනසම්මත ද දෙව්මිනිසුන් අතුරෙහි සුප්‍රකාශිත ද වේ. දැන් ලොව පහළ වැ ඉන්නා වූ ශාස්තෲන් අතුරෙහි මා සේ ලාභයෙනුත් යශසිනුත් අග පත් අන් ශාස්තෘවරයකු නො දකිමි. ලොවැ පහළ වැ ඇති සියලු යති සමූහයන් අතුරෙහි මේ භික්ෂුසංඝයා සේ ලාභයෙනුත් යශසිනුත් අග පත් අන් පිරිසක් නො දකිමි. 'සියලු කරුණෙන් පිරිපුන් නොඅඩු නොවැඩි මොනොවට පැවැසුණු බඹසර යැ'යි ඇති සැටි දැන කියන්නහු විසින් දැක්විය යුත්තේත් මෙ සස්න ම ය.

8\. **රාමපුත්‍ර උද්‍රක** තෙමේ **'දක්නේ නො දකී'**[410] යන්නෙහි තේරුම මහජනයා අතින් විචාරයි. ඔවුන් එය 'නො දනුමු' යි කියා තෝරා දෙන්නට අයැදූ විට 'මනා ව මුවහත් කරන ලද කරකැත්තේ තලය ජන තෙමේ දකී. එහෙත් එහි ධාරාව (දෑවිට) නො දකී' යැ යි කියයි. "රාමපුත්‍රයා ගේ මෙ කීම කරකැත්තක් සඳහා වුව ද, හරි හැටි දැන කියන නැත්තේ මෙ සස්න සඳහා ම කියන්නේ ය. යමෙක් සර්වාකාර සම්පූර්ණ වූ මෙ සස්න සඳහා "මේ නම් දහම් කොටස මෙයින් ඉවත් කළොත් හෝ මේ නම් දහම් කොටසක් මෙයට එක් කළොත් මෙය වඩා පිරිසුදු ය, වඩා පැහැදිලි වේ' යැ යි කියා නම්, හේ **'මෙ සස්න දන්නේ ම නො දකී'** යැයි කියනු ලැබේ.

9\. "එබැවින් මෙ සස්න බොහෝ කල් සිටිනු පිණිස සියල්ලන් විසින් ම එක් වැ ඒ හැම කරුණින් පිරිපුන් දහම අරුතින් අරුත වචනයෙන් වචනය සසඳමින් සජ්ඣායනය කළ යුතු. එහි විවාද නො කළ යුතු. එය දෙවි මිනිස්නට හිත වැඩ පිණිස වෙයි. මා දෙසූ සියලු කරුණින් පිරිපුන් ඒ දහම් නම්: සතර සතිපට්ඨාන, සතර සම්‍යක්ප්‍රධාන, සතර ඍද්ධිපාද, පඤ්චෙන්ද්‍රිය, පඤ්ච බල, සප්ත බෝධ්‍යංග, ආර්‍යාෂ්ටාංගිකමාර්ග යන මොහු ය. මේ දහම් තොප විසින් ලොවට හිත පිණිස සස්නැ බොහෝ කල් සිටිනු පිණිස, සමග ව, විවාද රහිත ව, පුරුදු පුහුණු කළ යුතු.

10\. යම් සබ්‍රම්සරකු කියන දහම අරුතින් හෝ අකුරින් හෝ ඒ දෙකින් ම වරදෑ යි තොපට පැනුණොත් ඔහු කී දෑ නො ම පිළිගත යුතු. ඔහුට නින්දා පරිභව ද නො කට යුතු.

සිය වැටැහීමත් ඔහු ගේ ප්‍රකාශයත් දක්වා ඉන් වඩා සුදුසු කොයි එක දෑ?' යි ඇසිය යුතු. 'හේ තමා කී සැටි ම වඩා සුදුසු ය' යි කියා නම්, ඉවත් නො කළ යුතු. නො පිරිහෙළියැ යුතු. එහි ඇති සැටි තේරුම් ගත හැකි වනු පිණිස කරුණු දක්වාලිය යුතු.

410\. උද්‍රක තෙමේ මේ පැණය මහජනයා විචාරයි 'නොදනිමු ඇදුර, ඔබ ම විසඳන්නැ''යි ඔවුන් කී විට "මෙය ගැඹුරු ය. සැපවූ අහර ලත් විටෙක වළඳා මදක් සිතා බලා කිය හැකියැ යි හේ කියයි ඔවුන් ද සාරමසක් මහාසත්කාර කළ පසු ඒ පැණය උඩ සඳහන් පරිදි හේ විසඳයි.

11. සබ්රම්සරකු අර්ථ ව්‍යංජන යන දූහිත් ම නොවරදවා පැවැසූ ධර්මය තොප විසින් 'මැනවැ'යි පිළිගත යුතු. එයට සතුටු විය යුතු. ඔහු පසසනු යුතු. ''මම දෘෂ්ටධාර්මික ආශ්‍රවයන් ගේ[411] සංවරය ම හෝ සාම්පරායික ආශ්‍රවයන් ගේ [412]විනාශය ම පිණිස නො ව ඒ දෙක ම පිණිස දම් දෙසමි.

එහෙයින් තොපට යම් සිවුරෙක් මා විසින් අනුදන්නා ලද ද එය ශීතෝෂ්ණ මැසි මදුරු අවු සුළං දීඝීජාතික යන මොවුන් ගේ ස්පර්ශය වැළැක්ම පිණිසත් සම්බාධස්ථාන වසාගැන්ම පිණිසත් ප්‍රමාණ වෙයි.

යම් පිණ්ඩපාත භෝජනයෙක් මා විසින් අනුඥත ද එය මේ රූපකායයා ගේ ස්ථිතියට, දිවි පැවැත්මට, බඩගිනි නිවීමට, බඹසර සපයනුවට ප්‍රමාණ ය.

යම් සෙනස්නක් මා විසින් අනුදන්නා ලද ද, එය ශීතෝෂ්ණ මැසි මදුරු අවු සුළං දීඝීජාතික යන මොවුන් ගේ ස්පර්ශය දුරු ලනු පිණිසත් චිත්තවිවේකයෙන් වන සුවය පිණිසත් ප්‍රමාණ ය.

යම් ගිලන්පස බෙහෙත් පිරිකරෙක් මා විසින් අනුඥත නම්, එය රෝගහේතුයෙන් උපන් දුඃඛවිපාක වේදනාවන් නසනු පිණිස සුවය තෙක් ප්‍රමාණ වෙයි.

12 මෙය 'ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ සුඛල්ලිකානුයොගීහු යැ'යි අන්‍යතීර්ථකයන් කියන තැනෙකි. එසේ කියන ඔවුන් අතින් 'සුඛල්ලිකානුයෝගයෝ බොහෝ වෙති. එයින් ඒ කවර සුඛල්ලිකානුයෝගයෙක් දැ?'යි විචාළ යුතු.

''අනායඝී වූ සුඛල්ලිකානුයෝගයෝ'' (සැප සෙවුම්හි යෙදීම්) **සතරෙකි.** ප්‍රාණවධ කොට තමා සුවපත් කිරීම, අන්සතු දූ පැහැර ගෙන තමා සුවපත් කිරීම, බොරු කියා තමා සුවපත් කිරීම, පස්කම් සුවයෙහි ගැලී හිඳීම යනු ඒ අනායඝී, අවැඩ ගෙන දෙන, සැප විඳීමෙහි යෙදීම් සතර ය.

13. 'ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ මෙ කම්සුව විඳීම් සතරෙහි යෙදී වෙසෙති'යි අන්‍යතීර්ථකයෝ කියත් නම් 'ඇත්ත එසේ නො වේ' යැ යි තොප ඔවුනට කිය යුතු. එය නැති වරදෙකින් දෙස් නැගීමෙකි.

411, 412, උපග්‍රන්ථය බලනු.

‘නිවරද වූ, නිවන් පිණිස පවත්නා සුඛල්ලිකානුයෝග සතරෙකි. ඔහු නම්: ප්‍රථමධ්‍යාන ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යාන ලබා හිඳීම යි. ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ මේ සතර ලබා යෙදී වෙසෙති’යි අන්‍යතීර්ථකයෝ කියත් නම් ‘එසේ යැ’යි පිළිවදන් දිය යුතු. එය බොරුයෙන් නැති ගුණ වැණුමෙක් නො වේ.

මේ සතර සුඛල්ලිකානුයෝගයන්හි යෙදීමෙහි ඵලත් අනුසසුත් ඔවුන් අසනු ඇත. (මේ පාදක කොට) සෝවාන් බව සකෘදාගාමි බව අනාගාමි බව රහත් බව යන සතර ලැබීම ඒ සතර නිවැරැදි සුඛල්ලිකානුයෝගයන් ගේ ඵලත් අනුසසුන් යැ යි කිය යුතු.

14. ‘ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ ස්ථිත නො වූ ස්වභාව ඇති ව වෙසෙති’යි අන්‍යතීර්ථක පරිව්‍රාජකයන් කියනු ඇත. එවිට ‘පොළොවැ බොහෝ යටැ කැන නො සෙලැවිය හැකි පරිදි තරයේ සිටුවන ලද ඉන්ද්‍රඛිලයක් (යහුලක්) මෙන් ස්ථිර ලෙස, දිවි ඇති තෙක් නො ඉක්මිය යුතු ධර්මයෝ සම්මාසම්බුදුන් විසින් ශ්‍රාවකයනට වදාරන ලදහ’යි ද, රහත්හු විසින් ප්‍රාණඝාත අදත්තාදාන මෛථුනසේවන මෘෂාවාද ද, පෙර ගිහි කලැ මෙන් කාම රැස් කොට ඒ විඳීම, ඡන්දාගති ගමනය, ද්වේෂාගති ගමනය, භයාගති ගමනය, මෝහාගති ගමනය යන නව දෝෂ කිසි ම ලෙසෙකින් නො කට හැකි යැ’යි ද කිය යුතු.

15. ‘ශ්‍රමණ ගෞතම තෙමේ මහත් වූ අතීත කාලය ගැන ම ඥානදර්ශනය පණවයි. අනාගතය ගැන නො පණවයි. ඒ කවර හෙයින් දෑ?’යි අන්‍යතීර්ථකයන් කියනුත් ඇත. නිතර ම සියල්ල දක්නා නුවණක්[413] ගැන ඔහු අඥානයන් මෙන් මෙසේ දෙඩත් තථාගතයනට සතානුසාරී[414] නුවණ ඇත. ඕහු ඒ නුවණින් කැමැති තෙක් අතීතය සිහි කෙරෙති. තථාගතයනට බෝමුල දී ජාතිමූලය (තණ්හාව) නසමින් පහළ වූ චතුර්මාර්ගඥානයට පසු ව ‘මේ අන්ත්‍ය ජාති යැ යි ද, මතු භවයෙක් නැතැ’යි ද අනාගතය අරභයාත් නුවණ පහළ විය.

---

413. ඉන්නා සිටිනා හිඳනා හැම විට ම ආවර්ජනයක් නැති ව නිරුත්සාහක ව සියල්ල ඉබේ ම පෙනෙනා නුවණ මෙයින් අභිප්‍රේත යි. මෙය නො විය හැක්කෙකි. 414. පෙර වූ දෑ සිහි කරනා නුවණ. (සති – අනුසාරී = සිහිය අනුව ගිය)

අතීත වර්තමාන හෝ අනාගත යමක් අසත්‍ය නම්, අර්ථ නිඃශ්‍රිත නො වේ නම්, සත්‍ය වුවත් අර්ථනිඃශ්‍රිත නො වේ නම් තථාගතයෝ එය නො පවසත්. කාලත්‍රයයෙන් කවර කොටසට අයත් වුවත් සත්‍ය නම්, අර්ථ නිඃශ්‍රිත නම්, ඒ පැණය විසඳා හෙළි කිරීමෙහි තථාගතයෝ කාලඥ වෙති.[415]

16. මෙසේ කාලත්‍රයවර්ති ධර්මයන්හි තථාගතයෝ කාලවාදී භූතවාදී අර්ථවාදී විනයවාදී වෙති. එහෙයින් **තථාගත යැ යි**[416] කියනු ලැබෙත්. ලොවැ සත්ත්වයන් සොයාත් නොසොයාත් ලත් නො ලත් සියලු රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය ධර්ම යන සියල්ල දත් හෙයින් **තථාගත**[417]**යැ යි** කියනු ලැබෙත්.

සම්‍යක්සම්බෝධියට පැමිණි රෑත් පිරිනිවන් පාන දා රෑත් යන මේ දා තුරෙහි කියන, දක්වන, ගෙන හැර පාන සියල්ල එසේ ම මිස අන් හැටියෙකින් නො වන කරුණිනුත් එය වදාරන සම්මාසම්බුදුහු **තථාගත** නම් වෙත්.

යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී බැවින් ද, සියලු ලොව මැඩලීමෙහි ප්‍රබල අවිපරීත දේශනා විලාශයත් පුණ්‍යමය බෙහෙදත් ඇති බැවින් ද **තථාගත** යැ යි[418] කියනු ලැබෙත්.

17. ‘සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේ ද? නො වන්නේ ද? වන්නේත් නො වන්නේත් වේ ද? නො ම වන්නේත් නො ම නො වන්නේත් වේ ද? මේ ම සත්‍ය යැ යි සෙස්ස හිස් යැ යි කියන්නේ දැ?’ යි අන්‍යතීර්ථකයන් විචාරනු ඇත. මෙකී කිසිවක් තථාගතයන් විසින් නො වදාරන ලදැ’යි ඔවුනට කියැ යුතු.

‘ඒ කුමක් හෙයින් නො වදාරන ලද දැ?’ යි ඔවුන් විචාළොත් ‘එය වැඩකට නැත. ලොවුතුරා දහම් ඇසුරු කෙළේ නො වේ. එය සසුන්බඹසරට පටන්ගැම්මෙකුත් නො වේ. චතුස්සත්‍යාවබෝධය පිණිස- නිවන් පිණිස පවත්තේ ද නො වේ. එහෙයින් එය භගවතුන් විසින් අව්‍යාකෘත ය, නො පැවැසිණැ’ යි කිය යුතු.

---

415. සත්‍ය වුව ද කිය යුතු අවස්ථායෙහි ම මිස නැත් නම් නොවදාරති. 416. තථාගද = සත්‍යවචන ඇත්තේ ය. මෙහි දකාරයට තකාර ව තථාගත යි සිද්ධ යි 417. තථාගත = රූපාදීන් ඒ ලෙසින් ම, ඇති සැටියෙන් ම දත්. මෙහි ගත යන දැනගත් යනු අර්ථයෙහි වේ. 418 තථාගත = ක්‍රියාව වචනය ද වචනය පරිදි ක්‍රියාව ද ඇත්තා. මෙහි ගත ශබ්දය පැවැත්ම යන අරුතැ වේ. තථ-අගද = සත්‍ය හෝ පුණ්‍ය බෙහෙද ඇත්තේ.

18. **'මහණ ගෞයුමන් විසින් කිමෙක් පවසන ලද ද?'සි** අන්තොටු පිරිවැජියන් අසනු ඇත **'මේ දුක ය, මේ දුක් හේතුව ය, මේ දුක්ඛ නිරෝධය ය, මේ දුක් නිරුඞ කරන මග'යැ සි** මේ සතර භගවතුන් විසින් ප්‍රකාශිත යැ යි ඔවුනට කියැ යුතු.

'මේ සතර කවර හෙයින් ප්‍රකාශිත ද?' යි ඔවුන් අසනු ඇත.

'මේය ම අර්ථනිඃශ්‍රිත යැ යි' ධර්මනිඃශ්‍රිත යැ යි, මේය ම සසුන් බඹසරට පූර්වංගම යැ යි, සසර කලකිරීම පිණිස- සත්‍යාවබෝධය පිණිස- නිවන පිණිස පවතී යැ යි, එහෙයින් මේ සතර ම හෙළි කොට වදරන ලද' යි ඔවුනට කියැ යුතු.

19. 'තව ද පෙර අත්බව් පිළිබඳ ව දිටු ගත්තෝ ද, මතු අත්බව් පිළිබඳ වැ දිටු ගත්තෝ ද[419] හෙළි කළ යුතු පරිදි ම මා විසින් හෙළිකොට දක්වන ලදහ. එහි පෙර අත්බව් පිළිබඳ වැ දෘෂ්ටි ගත්තෝ නම් —

'ආත්මයත් ලෝකයත් ශාශ්වත යැ යි ද, ආත්මයත් ලෝකයත් අශාශ්වතයැ යි ද, ආත්මයත් ලෝකයත් ශාශ්වතත් අශාශ්වතත් වේ යැ යි ද, ආත්මයත් ලෝකයත් ශාශ්වත ම ත් නො වේ, අශාශ්වත ම ත් නො වේ යැ යි ද;

ආත්මයත් ලෝකයත් ස්වයංකෘත (තෙමේ ම පහළ වී) යැ යි ද, ආත්මයත් ලෝකයත් අනෙකකු විසින් කරන ලද යි ද, ආත්මයත් ලෝකයත් ස්වයංකෘතත් පරකෘතත් වේ යැ යි ද, ආත්මයත් ලෝකයත් ස්වයංකෘතත් පරකෘතත් නො ව අහේතුක ව ඉබේ ම පහළ වී යැ යි ද,

සැපදුක් ශාශ්වතයැ යි ද, සැපදුක් අශාශ්වත යැ යි ද, සැපදුක් ශාශ්වතත් අශාස්වතත් වේ යැ යි ද, සැපදුක් ශාශ්වත නො වේ, අශාශ්වතත් නොවේ යැ යි ද, සැපදුක් ස්වයංකෘත යැ යි ද, සැපදුක් පරකෘත යැ යි ද, සැපදුක් ස්වයංකෘතත් පරකෘතත් වේ යැ යි ද, සැපදුක් අස්වයංකෘත අපරකෘත ව යදෘච්ඡාසමුත්පන්න (ඉබේම අහේතුක ව පහළ වී) යැ යි ද

මෙසේ නානා දෘෂ්ටිවාද පණවන දෘෂ්ටිගතිකයෝ ය. මම මොවුන් වෙත ගොස් 'ආත්මයත් ලෝකයත් ශාශ්වත යැ' යි ආදි ඒ යම් දෘෂ්ටියෙක් ඔවුනට ඇත් දැ?යි විචාරමි.

---

419. මෙහි විස්තර බ්‍රහ්මජාල සූත්‍රයෙන් දත යුතු.

20. ඔහු ද මෙයින් එකක් දක්වා 'මෙය ම සත්‍යය. අන්‍ය දර්ශන හිස් යැ'යි කියත්. ඒ කථාව මම නො පිළිගනිමි. කවර හෙයින් ද? එය ම අන් පරිද්දෙකින් හගිනා සත්ත්වයෝ ද ඇත. එ බැවිනි. මේ පැණැවීමෙනුත් තමනට සම තැනැත්තකු මම් නො දකිමි. එසේ කලැ වැඩි හිටියෙක් නම් කොයින් ලැබේ ද? එතෙකුදු වුවත් මම ම එහි ලා ප්‍රඥප්ති අධිප්‍රඥප්ති[420] දෙකින් නිරුත්තර වෙමි.

21. මතු අත්බව් පිළිබඳ දිටු ගන්නෝ නම්: ආත්මය රූපී යැයි ආත්මය අරූපී යැයි ආත්මය රූපීත් අරූපීත් වේ යැයි ආත්මය රූපී නොවන්නේත් නො වේ, වන්නේත් නො වේ යැ යි, ආත්මය සංඥී යැ යි ආත්මය අසංඥී යැ යි ආත්මය නෛවසංඥ නාසංඥ යැ යි, ආත්මය මරණින් පසු සිදේ යැ යි, මෙය ම සත්‍ය යැයි සෙසු දර්ශන හිස් යැ යි පණවන්නෝ යි.

මම් මොවුන් වෙත් ගොස් එකි එකි දර්ශන විචාරමි. ඔහු එය පවසා සිය දෘක්ම ම සත්‍ය ය, සෙසු දෘකුම් හිස් යැ යි කියත්. මම් ඔවුන් ගේ ඒ කීම් නො පිළිගනිමි. කවර හෙයිනා? ඒ කරුණෙහි සමහරු අන් පරිද්දෙකින් හගිත්. එබැවිනි මේ දෘෂ්ටිප්‍රඥප්තියෙනුත් තමාට සමයක්හු මම් නො දකිමි. වැඩියක්හු කොයින් දකිම් ද? එසේ වූවත් ස්කන්ධප්‍රඥප්ති ආදි අධිප්‍රඥප්තියෙන් මම් මැ නිරුත්තර වෙමි.

මේ පෙර අත්බව් පිළිබඳ වූ ද මතු අත්බව් පිළිබඳ වූ ද විවිධ මිථ්‍යාදර්ශනයන් ගේ ප්‍රහාණය පිණිස මා විසින් සතර සතිපට්ඨානයෝ දේශිත හ".

22. මෙ වේලෙහි බුදුරජුනට පවන් සලමින් සිටි උපවාණ තෙරණුවෝ 'මෙ ධර්මක්‍රමය ආශ්චර්යයැයි ප්‍රසාද එළවන සුළු යැ' යි කියා මේ කිනම් දූ යි ඇසූහ. "**පාසාදික** (ප්‍රසාද එළවන) සූත්‍ර ධර්ම යැ යි සලකා ගනුව" යි බුදුරජුහු වදාළහ.

[මෙහි නිගටනාපුතු ගේ කලුරියෙහි ඔහු සස්න අවුල් වීම, අසම්‍යක්සම්බුද්ධ ශාස්තෲන් ගේත් සම්‍යක්සම්බුද්ධ ශාස්තෲන් ගේත් ශාසනයන් ගේ ස්වභාවය, තද්ධර්මානුයායීන් ගේ ස්වභාවය හා ඔවුන් ගෙන් ගැරහිය යුතු නො යුතු අය, තද්ධර්මපූරණයෙහි මෙහෙයන්නන් ගෙන් පව් පින් රැස් කරන්නෝ, උද්‍රකරාම පුත්‍රයා ගේ වචනයක්, එය අර්ථ නිඃශ්‍රිත නො වූ බව, බුද්ධවචනය අර්ථනිඃශ්‍රිත බව, ලොවැ ස්වාඛ්‍යාත

420. ප්‍රඥප්ති, අධිප්‍රඥප්ති. උපග්‍රන්ථ බලනු.

ශාසනය, ශ්‍රාවකයන් විසින් විවාද නො කටයුතු බව, භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්මදේශනාකාරය, සිවුපසය පස්විකුම්, සුඛල්ලිකානුයෝග, එහි ඵල, ශ්‍රාවකයන් විසින් නො ඉක්මියැ යුතු ධර්ම, බුදුරජාණන් වහන්සේ ගේ කාලත්‍රයවර්ත්ති ඥානය, ඒ නුවණින් දුටු භාග්‍යවතුන් වහන්සේ වදරන නොවදරන කරුණු, භාග්‍යවතුන් වහන්සේ ගේ තථාගතභාවය භාග්‍යවතුන් වහන්සේ හෙළි කළ නො කළ කරුණු, ඒ හෙළි කිරිමට නොකිරීමට හේතු, පූර්වාන්ත සහගත දෘෂ්ටිගතිකයෝ, අපරාන්ත සහගත දෘෂ්ටිගතිකයෝ, ඔවුන් කරා එළැඹ භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්න ඇසීම, දෘෂ්ටිවාද දුරලීමට උපාය යන මොහු ප්‍රකාශිත හ.]

---

30. ලක්ඛණ සූත්‍රය.

බගවත් බුදුරජුහු එක් කලෙක සැවැත් නුවර අසල ජේතවන විහාරයෙහි වැඩවෙසෙති. එ සමයෙහි භික්ෂූන් අමතා සක්විති බව හෝ සම්‍යක්සම්බුඩත්වය ලබන මහාපුරුෂයනට පිහිටන දෙතිස් මහපුරිස්ලකුණු වදාළහ.[421] ඉක්බිති ඒ පුරුෂලක්ෂණශාස්ත්‍රය බාහිර තාපසනිකායවලට අයත් සෘෂිවරයන් දැනැ ඉගෙන රැක ගන්නා බවත්, එහෙත් ඒ පුරුෂලක්ෂණ ඇති වීමට විශේෂ හේතු නොදන්නා බවත් වදරා, ඒ මහාපුරුෂ ලක්ෂණ ද එයට හේතු කර්ම ද කර්මසාදෘශ්‍යය ද ලක්ෂණානුසංශය ද දෙසූහ.

පෙර ජාතිවලැ කළ කර්මයනට සරි ලන (කර්මසදෘශ ව) පහළ වූ මහා පුරුෂලක්ෂණ දෙතිසෙකි. ඔහු නම්:

i. **සුප්පතිට්ඨිතපාදතා.** පෙර ජාතින්හි ත්‍රිවිධ සුචරිතයෙහි, දානශීලාදියෙහි, මාපියනට මහණබමුණනට කුලදෙටුවනට කළ යුතු සත්කාර උපස්ථාන කිරීමෙහි, ලොවුතුරු බුදුබව ලැබීමට හේතු වන අන්‍ය වූ ද විශිෂ්ට කුශල ධර්ම වැඩීමෙහි දැඩි සේ තරයේ යෙදුණු හෙයින් **සුපිහිටි පා ඇති බව** නම් මහාපුරුෂ ලක්ෂණය පහළ වී ය. මේ ලක්ෂණය දරන්නෝ අනුන් විසින් නො මැඩැලිය හැක්කෙකි.

ii. **යට යැටිපතුල්හි චක්‍ර ලක්ෂණ.** පෙර ජාතින්හි දී බොහෝ දෙනාට හිත සැප පිණිස ක්‍රියා කළ හෙයින්, අන්‍යයන් ගේ බිය තැතිගැනීම් දුරැ කැරැ දැහැමි ආරක්ෂා

---

421. මහපුරිස් ලකුණු = මහාපුරුෂයන් හඳුන්වන ශරීර ලක්ෂණ.

සංවිධානය කළ හෙයින්, පිරිවර සහිත ව දන් දුන් හෙයින්, කම්සදෘශ ව දෙයැටිපතුල්හි චක්‍රලක්‍ෂණ පහළ වී ය. මෙය දරන්නේ මහපිරිස් ඇත්තේ වේ.

iii. **ආයතපණ්හිතා,** iv **දීඝංගුලිතා,** v **බ්‍රහ්මුජුගත්තතා.** පෙර ප්‍රාණවධයෙන් ප්‍රාණහිංසායෙන් තොර වැ සියලු සත්නට හිතානුකම්පී වැ වුසූ බැවින් දික්විළුම්, දිගැඟිලි, කෙළින් පිහිටි සිරුර යන තුන් ලකුණු පහළ විය. මෙයැත්තේ දීර්ඝායුෂ්ක ද සතුරන් විසින් නො නැසියැ හැක්කේ ද වේ.

vi. **සත්තුස්සදතා.** පෙරැ ජාතීන්හී මිහිරි දෑය දන් දුන් බැවින් දෙ පිටිඅතුල්, දෙ පිටිපතුල්, දෙ උරහිස්, කර යන සත් තැන උත්සන්න බව (මාංශ බහුල බව) වේ. මෙ ලකුණ ඇත්තේ ප්‍රණීත අන්නපාන ලබන්නේ ය.

vii. **මුදුතළුණහත්‍ථපාදතා,** viii. **ජාලහත්‍ථපාදතා** පෙරැ දාන ප්‍රිය වචන අර්‍ථචර්‍යා සමානාත්මතා යන සිවු සඟරා වනින් මහජනයාට සංග්‍රහ කළ හෙයින් මොළොක් තුරුණු අතුල් පතුල් ඇති බව ද, දූල් කවුළුවකට බඳු අත්පා ඇති බව ද යන දෙලකුණු විය. මේ ලකුණු ඇත්තේ මොනොවට ලෝවැස්සා ගෙන් සංග්‍රහ ලබන මහ පිරිවර ඇත්තෙක් වේ.

ix. **උස්සංඛපාදතා.** x. **උද්ධග්ගලෝමතා.** පෙරැ බොහෝ දනනට අර්‍ථනිඃශ්‍රිත ධර්‍මනිඃශ්‍රිත වචනයෙන් කථා කළ බැවින් පිරුණු ගොප්මසැති පා ඇති බව, උඩුකුරු අක් ඇති රෝම ඇති බව යන දෙ ලකුණුහු වූහ. මෙයැත්තේ ගිහි වී නම් කාම භොගීනට අක් වේ. පැවිදි වූයේ සියල්ලනට අක් වේ.

xi. **ඒණිජංඝතා.** පෙරැ ජාතීන්හි ශිල්ප විද්‍යා උගන්වා ලෝවැස්සා සුසිරිතෙහි යොදාලු බැවින් ඹළු මුවන් ගේ බඳු කෙංඩා ඇති බව වූ මහාපුරුෂලක්‍ෂණය පහළ විය. මෙයැත්තේ ගිහි වූයේ ගිහියනට වුව මනා උපභෝග පරිභෝග වස්තූන් ද, පැවිදි වුව ශ්‍රමණ පරිෂ්කාර ද ලබන්නේ වේ.

xii. **සුඛුමච්ඡවිතා.** මානදර්‍පාදිය නැති ව මහණ බමුණන් වෙත එළැඹ කටයුතු නො කටයුතු විචාළ බැවින් දූලි කුණු නො ලග්නා සියුම් සිවිය ඇති වී ය. මෙයැත්තේ ගිහි වූයේ අන්‍ය කාමභොගීන් විසින් නො ළං විය හැකි මහ නුවණ ඇත්තේ ය. පැවිදි වූයේ මහාප්‍රාඥ වේ. බුදුරජ්ජු වනාහි මහාප්‍රාඥ ද, සක්‍යාදි නානා තැන පැතිරැ පවත්නා නුවණ

ඇති (පුථුපඤ්ඤ) ද, තෝෂබහුල ව මාගීඵල පසක් කළ නුවණ ඇති (හාසපඤ්ඤ) ද, ස්කන්ධාදියෙහි යුහු ව දුවන නුවණ ඇති (ජවනපඤ්ඤ) ද, තියුණු නුවණ ඇති (තික්ඛපඤ්ඤ) ද, විනිවිද පැවැති නුවණ ඇති (නිබ්බෙධිකපඤ්ඤ) දැ යි මෙසේ අතුල්‍ය නුවණ ඇතියෙර් වෙති.

xiii **සුවණ්ණවණ්ණතා.** පෙර ජාතීන්හි නො කිපෙන සුලු ව, අනුන් පරුෂ වචනයෙන් බැණ වදිනා කල ද, නොසතුටු පමණකුත් නො පහළ කළ හෙයිනුත්, සුවපහසු දෙන බුමු තුරුණු ආදිය දන් දුන් හෙයිනුත් රන් වන් සිවි ඇති බව විය. මේ ලකුණ ඇත්තේ සුව පහසු ගෙන දෙන ඇතිරිලි පොරෝනා වස්ත්‍ර ආදිය ලබයි.

xiv **කෝසෝහිතවත්ථගුය්හතා.** පෙර ඇත් වූ හෝ අසමග වූ නෑදෑ මිතුරන් උනුනුන් හා සම්මුඛ කොට සමග කොට සතුටු වූ බැවින් රන්කෙමියක් බඳු කෝෂය (කොපුව) තුළ සැඟෙවුණු පුරුෂව්‍යංජනය ඇති වි ය. මෙ ලකුණ ඇත්තේ ප්‍රතිපක්ෂයන් මඩනට සමත් පුත්‍රයන් (හෝ ශිෂ්‍යයන්) ඇත්තේ වේ.

xv **නිග්‍රෝධපරිමණ්ඩලතා,** xvi **ආජානුලම්බිහත්ථතා.** පෙර ජනසංග්‍රහයෙහි යෙදුණහුට සුදුස්සා සුදුසු තැන තැබීමත් ඔහුට සුදුසු දැය දීමත් හේතු කොට ගෙන සම දිගු පුළුලැති, නුගයක් සේ, සිරුර පමණ බඹයත් බඹය පමණ සිරුරත් ඇති බවද, සිට නොනැමී දන මඬුලු පිරිමැදිය හැකි අත් ඇති බව ද යන දෙ ලකුණු විය. මෙයැත්තේ ආඪ්‍ය වේ. මහද්ධන වේ. බුදුරජහු වනාහි ශ්‍රද්ධාදි සප්තාර්‍යධනයෙන් ආඪ්‍ය වෙති.

xvii **සීහපුබ්බද්ධකායතා,** xviii **චිතන්තරංසතා,** xix **සම-වට්ටක්ඛන්ධතා.** පෙර ජාතින්හි අන්‍යයන් ගුණයෙන් ධනයෙන් වැඩෙනු දැක එයට කැමැති වූ හෙයිනුත්, එය ඉවැසූ හෙයිනුත්, සිංහයකු ගේ පූර්වාර්ධ කය මෙන් සම්පූර්ණ මුළු සිරුර ඇති බව ද, පිට දැලවර මැද පිරුණු බව ද, සම වට ග්‍රිවාව ඇති බව ද යන ලකුණු පහළ විය. මෙයැත්තේ නොපිරිහෙන සම්පත් ඇති මහරජෙක් වේ. පැවිද්දෙක් නම් නොපිරිහෙන ගුණසම්පත් ඇතියේ වේ.

xx **රසග්ගසග්ගිතා.** පෙර කැට කැබිලිති ආදියෙන් සත්ත්ව හිංසා නොකළ හෙයින් තලැටක් පමණ ද අහරක්

දිවග තැබූ කෙණෙහි මුළු සිරුරු ඔජය පැතිර යනු හැකි වන සේ උඩු අක් වැ ග්‍රීවායෙහි පිහිටි සත්සියක් රස නහර ඇති බව වී ය. මෙයැත්තේ නිරෝග වේ.

xxi **අභිනීලනෙත්තතා,** xxii **ගෝපඛුමතා.** ද්වේෂයෙන් අනුන් පෙළීම් රවා බැලීම් නො කොට, සෘජු සිතින් ප්‍රිය ඇසින් බැලූ හෙයින් නිල් වුව මනා තැන දිය බෙරලිය මල් සේ ඉතා නිල් ද, රත්වත් රතු සුදු කළු පැහැ වුව මනා තන්හි ඒ පැහැ ද ඇති පිරිසිදු පස් පෑ දිස්නා ඇස් ඇති බව ද, උපන් කෙණෙහි වස්සකු ගේ බඳු ඉතා ප්‍රසන්න ඇස්ගුලි ඇති බව ද යන දෙ ලකුණු විය. මෙයැත්තේ බොහෝ දෙනාට ප්‍රිය මනාප වේ.

xxiii **උන්හීසසීසතා.** පෙරළු සුචරිතක්‍රියාහි පෙරටු ව ඉදිරි පත් ව මහ ජනයා නිසිමග හසුරුවීමෙහි ප්‍රධාන වූ හෙයින් නළල්පටින් වෙළන ලද වැනි පිරුණු නළල සහිත පිරුණු හිස වී ය. මෙ ලකුණ ඇත්තේ බොහෝ අනුවරයන් ඇත්තේ වේ.

xxiv **එකේකලෝමතා,** xxv **උණ්ණාලඤ්ඡණතා.** පෙරළු අසත්‍යයෙන් වැළැකි සත්‍ය වචන ම කී හෙයින් එකි එකී රෝමකූපයෙහි එක එකක් ම රෝම ඇති බව ද, දෙ බැම අතරැ නළල මැද දකුණතට කරකැවී පිහිටි රිදී බුබුලු සේ දිලිසෙන රෝමයක් ඇති බව ද යන දෙ ලකුණු විය. මෙය ඇත්තේ අනුව යන මහ පිරිස් ඇත්තේ වේ.

xxvi **චත්තාළිසදන්තතා,** xxvii **අවිවරදන්තතා.** කේළාම් කීමෙන් වැළැකි බිඳුණවුන් සමගි කරන වචන කී හෙයින් සම සතළිස් දත් ඇති බව ද, විවර නැති(සම්බන්ධ) වූ දත් ඇති බව ද යන දෙ ලකුණු විය. මෙයැනි තැනැත්තේ කිසිවකු විසින් බිඳිය නො හැකි පිරිස් ඇත්තේ වෙයි.

xxviii **පහූතජිව්හතා,** xxix **බ්‍රහමස්සරතා.** පරුෂවචන-යෙන් වැළැකි ප්‍රිය වචන කී බැවින් මෘදු දික් පුළුල් දිව ඇති බව ද, බඹහු ගේ මෙන් අෂ්ටාංග සමුපේත කටහඬ ඇති බව ද යන දෙ ලකුණු පහළ විය. මෙ ලකුණු ඇත්තේ ගත යුතු ඉවතැලිය නො හැකි වචන ඇත්තේ වෙයි.

xxx **සීහහනුතා.** ප්‍රලාප කථායෙන් තොර වැ අර්ථ ධර්ම නිඃශ්‍රිත වචන කී හෙයින් සිංහයකු ගේ යට හනුව සෙයින් පරිපූර්ණ උඩුයැටි දෙහනු ඇති බව වේ. මෙ ලකුණ ඇත්තේ සතුරන් විසින් විනාශ නොකටහැක්කෙක් වේ.

xxxi **සමදන්තතා.** xxxii **සුසුක්කදාඨතා.** පෙර ජාතීන්හි මිථ්‍යාජීවිකායෙන් තොර වූ හෙයින් සමදත් ඇති බව ද, දිලිසෙන ඉතා සුදු දත් ඇති බව ද වේ.

[මෙහි මහ බෝසතුන් ගේ කර්මසාදෘශ්‍යය, මහාපුරුෂලක්‍ෂණ ලක්‍ෂණානුශංස යන සතර[422] දක්වන ලදි.]

31. සිඟාලක සූත්‍රය.

එක් සමයෙක බගවත් බුදු රජහු **රජගහ** නුවර **වේළුවනාරාමයෙහි** වැඩ වෙසෙති. එ සමයෙහි සිඟාලක නම් ගැහැවි පුතෙක් උදෙන් ම නැගී සිට, ගොස් නා, ඉක්බිති තෙත් දිය කඩින් ම යුතු ව තෙත් හිස කේ ද ඇති ව දෙහොත් මුදුනැ දී, පෙර දිග, දකුණ, අවරදිග, උතුර, උඩ, යට යන දිශා සය වඳී. රජගහ පුරට පිඬු පිණිස වැඩි බුදුරජහු ඔහු සදිසා වඳින්නහු දැක, 'කුමට මෙය කරයි දැ?'යි අසාවදාළහ. මරණමංචකයේ හොත් සිය පියා සදිසා නමදින්නැ'යි කී බැවින් මෙය කරමි'යි ඔහු කී ය.[423]

'ආර්‍ය විනයයෙහි සදිසා නැමැදුම් මෙසේ පෙර දකුණු ඈ දිසාවනට වැඳීම් විසින් කළ යුත්තෙක් නො වේ' යැ යි බුදුරජහු වදාළහ.

සදිසා වඳින සැටි වදරන්නැ යි ගැහැවිපුත් අයැදී ය. බුදුරජහු ද ඔහුට **ගිහි විනය** විස්තර කොට වදාළහ:

2 "තුදුස් ලාමක ධර්මයෙන් දුරු වැ සදිසා රක්‍නා ගන්නා තැනැත්තේ දෙලොව දිනීමට පිළිපන්නෙකි.

එහි තුදුස් ලාමක ධර්ම නම්: **සතර කර්මක්ලෙශ, සතර අගති, ධන නසන සදොර** යන මොහු ය.

---

422. ප්‍රාණඝාතාදියෙන් වැළකීම් ආදිය කර්ම යි.
ඊට සරිලන විපාකය කර්මසාදෘශ්‍යය යි.
එය හඟවන සුප්‍රතිෂ්ඨිත පාදදිය ලක්‍ෂණ යි.
සතුරන් විසින් මැඩැලිය නොහැකි බව් ආදිය ලක්‍ෂණානුශංස යි.
මෙහි ලකුණු පිළිබඳ විස්තර යට මහාපදාන සූත්‍රය ද බලා දත යුතු.

423. මොහු මාපියෝ සැදැහැවත උවසුවෝ ය. ඔවුන් තෙරුවන් ඇසුරට පුතු මෙහෙයූ නුමුදු සැදැහැ නැති හෙ එය නො කෙළේ ය. ඔහු පියා මර ඇඳැ හොත්තේ පුතු හිසි මගැ යොදනු නිසාවක් සිතනුයේ දිශා සය වඳුව යි කීය. ඔහු එය කාරණු දැක බුදු රජුන් ඔහුට සදිසා නතිරා දහම් දෙසති යි සිතා මේ උපාය හෙ යෙදීය. ගැහැවි පුත් ද මර ඇඳැ හොත් පියා කී බස රකිනුයේ එතැන් පටන් කොට සදිසා වැන්දේ ය.

කම්කෙලෙස්[424] **නම්** පණිවා, අදින්නාදන්, කාමයේ වරද හැසිරෙනු, මුසවා යන සතර ය.

අගති නම් **ඡන්දාගති දෝෂාගති භයාගති මෝහාගති** යන සතර ය.

ධන නසනා සදොර නම්: රහමෙර බීම, නොකල්හි වීදිවල හැවිදිනු, නැටුම් දක්නට යනු, සූදුව, පාපමිත්‍රයන් සෙවිනු, අලසබව යන සය ය.

3. මේ ධන නසන සදොරෙන්, **රහමෙර පීමේ දොස් නම්**: ධනය අපතේ වියදම් වීම, කලහ වැඩීම, ඇස් ලෙඩ ඈ ලෙඩ වැලැඳීම, නොකටයුතු දෑ කොට අපකීර්ති ලැබීම, විළි නැති වීම, නුවණ දුබල වීම යන මොහු ය.

නොකල්හි වීදිවලැ හැවිදිනුයෙහි දොස් නම්: තමා ආරක්ෂා රහිත වීම, අඹුදරුවන් ආරක්ෂාවරණ රහිත වීම, ධනය සතුරන් විසින් ගත හැකි වීම, තමා ගැන අනුන් සැක කළ හැකි වීම, නො කළ වරද තමා පිට පැමිණීම, බොහෝ දුක් කිරිහැරවලට මූන පාන්නට වීම යන මොහු යි.

නැටුම් ඈ දක්නට යනුයෙහි දොස් නම්: නැටුම් ආදිය ඇති තැනට යනු සඳහා වුව මනා දෑ සැපැයීමෙන් කම්පාන්ත සිඳීම, ඒ නෘත්‍යස්ථානයෙහි දවස දෙක රැඳීම, එහෙයින් ගොවිතැන් ඈ කටයුතු නියම කලට නො කිරීමෙන් භෝග-හානිය, සොර සතුරන් ඔහු ගේ ධනය පැහැර ගැනීම, ලත් භෝග ද වැනැසීම යන මොහු ය.

දූ කෙළියෙහි දොස් නම්: සූදුයෙන් දිනුවහුට සතුරන් ඇති වීම, පැරැදුණහු ශෝක කිරීම, වස්තු විනාශය, ජන සමාජයෙහි ඔහු බස් නොගැනීම, මිත්‍රාමාත්‍යාදීන් ගෙන් පරිභව ලැබීම, ඔහු දූ කෙළනකු බැවින් ඔහු හා ආවාහයකට විවාහයකට කිසිවකු නොකැමැති වීම යන මොහු ය.

පාපමිත්‍රයන් සෙවිනුයෙහි දොස් නම්: අක්ෂධූර්තයන් ස්ත්‍රීධූර්තයන් සුරාධූර්තයන් නෛකතිකයන්[425] වංචනිකයන් සැහැසියන් ඔහු හා යහලු වීම, ඔහු සත්පුරුෂයනට නො කැමැති වීම, ඉන් දේ ලොවට ම අනර්ථ කැරැගැනීම යන මොහු ය.

---

424 කම්කෙලෙස් යනු කිළිටි කම් ය. 425. නෛකතිකයන් = ප්‍රතිරූප වස්තුයෙන් වංචා කරන්නන්. රන් නොවන්නක් රන් මෙන් හඟවා, රිදී නො වූවක් රිදීපැහැ ගන්වා රිදී යැ යි හඟවා, මෙසේ බොරු රන් බොරු රිදී ඈ සැබෑ රන් සැබෑ රිදී යන ආදි විසින් හඟවා රැවැටිලි කරන්නෝ නෛකතිකයෝ ය.

අලස බවේ දොස්: 'දැන් ඉතා ශීත යැ' යි කර්මාන්ත නොකිරීම, 'ඉතා උෂ්ණ යැ' යි කියා හෝ 'ඉතා සවස යැ' යි 'ඉතා උදේ යැ' යි 'ඉතා බඩගිනි යැ' යි, 'පමණට වඩා බොජුන් ගන්නා ලදැ' යි (කුස බොජුනෙන් පිරුණා වැඩි යැ යි) කර්මාන්ත නොකිරීම. මෙසේ අලසතා හේතුයෙන් කටයුතු හරනේ පිරිහේ. දිළිඳු බවට පැමිණේ.

4. **නොසෙවියැ යුතු මිතුරෝ:** අඤ්ඤදත්ථුහර, වචීපරම, අනුප්පියභාණී, අපායසහාය යන මිතුරුවෙසින් එන සතර නො මිතුරන් දුරු කරනු වටී. කිසි වාසියක් පතා ම යහලු කම් කරනුයේ **අඤ්ඤදත්ථුහර**[426] නමි. වචනයෙන් පමණක් සංග්‍රහ කරන (මෙ මෙ දැය කරමැ යි කියා මග හරින) මිතුරා **වචීපරම** නමි. හොඳක් කරතත් නරකක් කරතත් 'ඒ මැනැවැ'යි අදහස් බල බලා අනුකූල වූ ප්‍රියවචන කියන, ඉදිරියේදී ප්‍රශංසාවත් පිටත දී අප්‍රශංසාවත් කරන යහලුවා **අනුප්පියභාණී** නමි. රහමෙර පීම, නො කල්හි වීථිසංචාරය, නෘත්‍ය දර්ශනාදියට යෑම, සූදු ව යන මෙයින් යහලුකම් කරන්නා **අපායසහාය** නමි.

5. **සෙවියැ යුතු මිතුරෝ**: උපකාරී මිත්‍ර, සමානසුඛදුඃඛ මිත්‍ර, අර්ථාඛ්‍යායී මිත්‍ර, අනුකම්පක මිත්‍ර යන සිව්දෙනා සෙවියයුත්තෝ ය.

මත් පැන් පීම් ආදියෙකින් පමා වූ සිය මිතුරා රැක ගන්නා, පමා වූ මිතුරහු ගේ ධනය රක්නා, මිතුරාට බියක් උවදුරක් පැමිණි විට පිළිසරණ වන, වුව මනා දැයක් ඉල්ලා ආ මිතුරාට දෙගුණයක් දෙන මිතුරා **උපකාරී මිත්‍ර** නමි.

තමා රහස් මිතුරාට කියන, මිතුරා කී රහස් පිට නො දී රැක ගන්නා, ආපදාවෙහිදී අත් නොහරින, මිතුරා පැමිණි අනතුරෙන් බේරා ගැනීමට සිය දිවි වුව ද පුදන යහලු තෙමේ **සමානසුඛදුඃඛ මිත්‍ර** නමි.

අවවාද කොට සිය මිතුරා පවින් වළක්වන, ගුණ ධර්මයෙහි යොදන, පෙර නෑසූ ධර්ම අස්වන, සුගති මාර්ගය කියා දෙන මිතුරා **අර්ථාඛ්‍යායී සහාය** නමි.

---

426. අඤ්ඤදත්ථුහර - ඒකාන්තයෙන් කිසිවක් හැර ගනිමියි සිතා ඇසුරට එනුයේ.

මිතුරා දිළිඳුව ගිය කල ඒ දිළිඳුබව තමහට වූවක් මෙන් සලකා කණගාටු වන, මිතුරාට ලාභයක් වූ කල තමහට වූවක් සේ සලකා සතුටු වන, මිතුරා ගේ දෙස් කියනු අසා වළකාලන, මිතුරා ගේ ගුණ කියන්නහුට පසසන සහාය තෙමේ **ආනුකම්පක මිත්‍ර** නමි.

මෙ සතර සුහෘන්මිත්‍රයෝ සෙවිය යුත්තෝ යි.

6. **සදිසා රැක්ම**: පෙරදිග නම් මාපියෝ ය **දකුණ** නම් ඇදුරෝ ය. අවරදිග නම් අඹුදරුවෝ ය. **උතුරු දිග** නම් මිත්‍රාමාත්‍යයෝ ය. **යට දෙස** නම් දාසි දස් කම් කරුවෝ ය. **උඩ දෙස** නම් මහණ බමුණෝ ය.

මේ සදෙස ඉන් බියක් නො එන සේ රැක්ක යුතු. නැමැද්ද යුතු (හෙවත් ඒ මා පිය ආදිනට නිසි සංග්‍රහ කළ යුතු).

පෙරදිගට නැමැදුම: මාපියන් පෝෂිත කිරීම, මාපියන් විසින් රාජාදිනට කළයුතු මෙහෙයක් ඇත් නම් එය තමා පිටට ගෙන සිදු කිරීම, කුලවංශය නැසී යෑ නො දී රැකිම, මා පියන් මල කල පින් කොට පෙත් පැමිණැවීම යන මෙයින් මාතෘපිතෘ සංග්‍රහය පෙරදිගට නැමැදුම යි.

මාපියන් විසින් දරුවනට කළයුතු සංග්‍රහ පසෙකි: සිය දරුවන් පවින් වළක්වා ගැනීම, ගුණ දහම්හි පිහිටුවීම, සිප් සතර ඉගැන්වීම, සුදුසු කලැ කුලදුවක ආවාහ කොට දීම, සුදුසු සමයෙහි වස්තුව පැවැරීම යන පස ය.

7. **දකුණු දිගට නැමැදුම**: ඇදුරුහු දක හුනස්නෙන් නැඟී සිටීම, උපස්ථාන කිරීම, ඇදුරු බසට මනා කොට කන් දීම, ඇදුරුහු ගේ කුදු මහත් කටයුතු කිරීම, මොනොවට ඉගැන්ම යන පස් වැදූරුම් ආචාර්‍ය්‍යසංග්‍රහය දකුණුදිගට වැඳීම ය.

ඇදුරහු විසිනුත් ශිෂ්‍යයනට— නිසි ලෙස හික්මවීම, මොනොවට ඉගැන්වීම, සම ලෙස සිප් සතර ඉගැන්වීම, මිත්‍රාමාත්‍යයනට හඳුන්වා දීම, හැම අතින් ම රැක ගැන්ම යන පස්වැදූරුම් සංග්‍රහය කළ යුතු.

අවරදිගට නැමැදුම. ආදරයෙන් කථා කිරීම, අවමන් නොකිරීම, පර ස්ත්‍රීන් කරා නො යෑම, ඓශ්වර්‍ය්‍ය පැවැරීම, වස්ත්‍රාභරණ සපයා දීම යන පසින් භාර්‍ය්‍යාවට සංග්‍රහ කිරීමත් ඉහත කී පරිදි දරුවනට සංග්‍රහකිරීමත් අවරදිගට කැරෙන වැඳීම ය.

භිරින්දෑ විසිනුත් සැමියාට: ගෙහි කටයුතු සැලකිලි ඇති ව කිරීම, සැමියා ගේ පිරිවර ජනයාට මනා කොට සංග්‍රහ කිරීම, පර පුරුෂයන් ගැන සිහිනෙනුත් නො සිතීම, සැමියා ගේ වස්තුව රැක ගැනීම, කෑදබත් පිසීම් ආදි කතිව්‍යයෙහි දක්‍ෂ ව සෙදීම යන පස් අයුරින් උපස්ථාන කළ යුතු.

උතුරු දිගට නැමැදුම: දන, ප්‍රියවචන, අර්‍ථචර්‍යා, සමානාත්මතා, නො රවටා ඉල්ලූ උදවු හැකි පමණින් දීම යන පසින් කුලපුතු විසින් මිත්‍රාමාත්‍යයනට කළ යුතු සංග්‍රහය උතුරුදිගට කරන නැමැදුම ය.

මිත්‍රාමාත්‍යයන් විසිනුත් ප්‍රමත්ත වූ කල රැක ගැනීම, ඔහු ගේ වස්තුව රැකගැන්ම, බියක් පැමිණි විට පිහිට වීම, විපතේ දී පිටු නො පෑම, ඔහු ගේ දූදරුමුණුබුරන් තමන් ගේ මෙන් සැලැකීම යන පසින් කුලපුතුට සංග්‍රහ කළ යුතු.

යැටි දෙස පිදීම: දූසි දස් ආදීනට ශක්තිය වයස බලා සුදුසු පරිදි කටයුතු නියම කිරීම, වෙහෙස මහංසියට ගැළැපෙන සේ කුලිය දීම, මහලු වූ කලැ ලෙඩ වූ කලැ වැඩපල නොපවරා උවටන් හා පිළිසම් කැරැවීම, මිහිරි අහර පැන් දසාදීනටත් බෙදා දී වැළැඳීම, ඔවුන් ගේ මංගලෝත්සව දිනවල දී නිවාඩු දී වස්ත්‍රාභරණ ආහාර පානාදිය දී යැවීම යන පසින් කුලපුතු විසින් ද දසාදීනට කළ යුතු සංග්‍රහය යට දෙස නැමැදීම ය.

දූසි දස් ආදීන් විසිනුත් ස්වාමියාට කලින් පිබිදීම, ස්වාමියා නින්දට ගිය පසු නිදා ගැන්ම, ස්වාමියා දුන් දෑ පමණක් ගැනීම, කටයුතු අතපසු නො කොට කිරීම, ස්වාමියාගේ ගුණ කීම යන පසින් සංග්‍රහ කළයුතු.

උඩදෙස නැමැදුම: මෛත්‍රීසහගත කායකර්‍ම, මෛත්‍රීසහගත වාක්කර්‍ම, මෛත්‍රීසහගත මනඃකර්‍ම, වෙත පැමිණියවුනට සත්කාර කොට වුව මනා දෑ සොයා බලා හැකි නම් සපයා දීම, ආමිසයෙන් සංග්‍රහ කිරීම යන පසින් මහණ බමුණනට සංග්‍රහ කිරීම උඩ දෙස නැමැදුම් නම්.

මහණ බමුණන් විසිනුත්: ඔවාදී ඔවුන් පවින් වැළැක්වීම, දහම්හි යෙදැවීම, මෛත්සිත පැතිරැවීම, නො ඇසූ දහම් තේරුම් කැරැ සැක දුරැලීම, ස්වර්‍ග මාර්‍ගය පෙන්වා දීම යන පසින් කුලපුතුට සංග්‍රහ කළ යුතු.

සතර කම්කෙලෙශාදි තුදුස් ලාමක ධර්මවලින් වැළැක මේ සටකි සදෙස නැමැදුම කරනුයේ දෙලොවින් ම දිනන්නේ ය. මේ දෙසුම අසා සිගාලක තෙමේ පැහැද තෙරුවන් සරණ ගියේ ය.

[මෙහි තුදුස් ලාමක ධර්ත් ඉන් වැළැක නමස්කාර කළ යුතු සදිසාත් ඒ සදිසා නැමැදුම කළ යුතු සැටිත් දැක්විණ.]

---

32. ආටානාටිය සූත්‍රය.

රජගහ නුවර ගිජුකුළුපව්වෙහි වසන බුදුරජුන් වෙත එක් මැදුම් රයෙක සිවුවරම් දෙව්රජහු සිය පිරිස් හා පැමිණ වැඳ පසෙක උන්හ.

එ සිවු දෙනා අතුරෙන් වෙසුවුණු මහරජ පස් පවින් වැළැක්මට බුදුරජුන් ඔවා දෙන හෙයින් නොපහන් යකුන් ඉඳිනැයි ද, ඔවුන් ගේ පැහැදීම පිණිසත් ඔවුන් ගෙන් මහණ මෙහෙණ උවසු උවැසි යන සිවු පිරිසට උවදුරක් නොවනු පිණිසත් **ආටානාටිය**[426] පිරිත ඉගෙන[427] වදාළ හොත් මැනැවැ යි ද සැළ කෙළේ ය. බුදුරජ්හු නිහඬ වැ එය ඉවැසූහ.

වෙසවුණු මහරජ ද **විපස්සිස්ස නමත්ථු** යන ආදි ආටානාටිය පිරිත කිය.[428]

ඒ පිරිත් සුතුරේ අදහස සැකෙවින් මෙසේ ය:

---

426. ආටානාටා නගරයෙහි දී බඳනාලද බැවින් මෙය ආටානාටිය නම් විය. 427. බුදුරජුනට ඔහු ගෙන් ඉගෙනගන්නට කිසිත් නැත. සිය මුඛයෙන් කියන ලද්දට වඩා බුදුරජුන් ගේ සිරිමුවින් වදරන ලද්ද උතුම් හෙයින් අවිලංඝ්‍ය හෙයින් වෙසවුණු මෙසේ කී ය. 428. ගිහියනට පිරිත් කියැ යුතු සැටි මෙසේ ය: පළමුවෙන් ම ආටානාටිය සුතුර නො කියැ යුතු: මෙත්තාසුත්ත, ධජග්ගසුත්ත, රතනසුත්ත යන තුන් සූත්‍ර සතියක් කියැ යුතු. එයින් යක් බූ උවදුරු නො හැරුණොත් ආටානාටිය සුතුර කියැ යුතු. මෙය කියන්නහු මස් මාළු හෝ බැදපු පිටිකැවිලි නො කෑ යුතු. සොහොනැ නො විසියැ යුතු. සිරිහැර කරන්නට යක්බූපිසසුන්හට ඉඩ ලැබෙන බැවිනි. පිරිත් කියන භික්ෂුව පිරිවරා වැඩම කැරැවිය යුතු. එළිමහනේ සිඳැ මෙය නො කිය යුතු. දොර කවුළු වස්වා අඹි දරන්නන් මැදූ සිඳ මෙත් සිතින් කියැ යුතු. ආතුරයාට තිසරණ පන්සිල් දී මෙත්තා සූත්‍ර ආදිය කිය යුතු. එයිනුත් උවදුර නො හැරේ නම්, ඔහු විහාරයට ගෙන ගොස් සෑ මිදුලෙහි හොවා ආසනපූජා කරවා පහන් දල්වවා මිදුලු ඇමැද මංගලගාථා කියැ යුතු. සියලු අමනුෂ්‍යයනට රැස්වන්නට කාලඝෝෂය කට යුතු. විහාරෝපවනයෙහි

විපස්සී සිඛී කකුසන්ධ කෝණාගමන කස්සප ගෞතම යන සත් සම්මාසම්බුද්ධවරුනට[429] නමස්කාර වේ වා.

පෙරදිගට අධිපති **ගන්ධර්වරාජ ධෘතරාෂ්ට්‍ර** මහරජ ද ඔහුගේ එක්අනූවක් පුත්තු ද බුදුරජාණන් වහන්සේ දැක දුර දී ම නමස්කාර කෙරෙති. සෙසු අමනුෂ්‍යයෝ ද උන්වහන්සේ දැක වඳිති. නිතර අප මේ කාරණය ඇසූ බැවින් ගෞතම බුදුරජාණන් වහන්සේට නමස්කාර කරවු දැ?යි අප විසින් විචාරන ලද ඒ යක්කු 'විද්‍යාචරණසම්පන්න වූ ගෞතම බුදුරජාණන් වහන්සේ වඳිම්හ'යි කියති.

දකුණු දිගට අධිපති කුම්භාණ්ඩරාජ[430] වූ **විරූඪක** මහරජ ද ඔහුගේ පුත්‍රයෝ ද බුදුරජාණන් වහන්සේ දුර දී ම දැක වඳිත්. එ පිරිසැ වූ අමනුෂ්‍යයෝ ද,

අවර දිගට අධිපති නාගයනට රජ වූ **විරූපාක්ෂ** මහරජ ද ඔහු පුත්තු ද එ පිරිසැ වූ අමනුෂ්‍යයෝ ද ගෞතම බුදුරජාණන් වහන්සේ දුර දී ම දැක වඳිත්.

මහමෙර උතුරු දිගැ උතුරුකුරුදිවැ මිනිස්සු 'මේ මා අඹුදරුවෝ යැයි මගේ දේපොල යැ යි ආදීන් මමත්වයක් පරිග්‍රහයක් නැත්තාහු වෙත්. ඔහු ගොවිතැන් නො කෙරෙත්, කුඩු පොතු නැති සියඳ සුවඳ හැල් සහල් රන් බඳුනෙක ලා දුම්නැති ජෝ පහන් ගින්නෙන්[431] පිසැ බුදිති.

වෛශ්‍රවණපරිවාරක යක්ෂයෝ ධේනු-පශු-ස්ත්‍රීපුරුෂාදීන් වාහන කොට ගෙන හැවිදිත්.

ප්‍රධාන රුකට සංඝයා ඔවුන් ගේ පැමිණීම බලාපොරොත්තු බව දන්වා යැවිය යුතු. ඉක්බිති ආතුරයාට වැහී සිටින අමනුෂ්‍යයා අනිත් ඔහු කවුරු දැ? යි විචාළ යුතු. ගන්ධ මාලාදි විසින් කළ පින් සඳහන් කොට ඔහුට ඒ අනුමෝදන් කැරගන්නට කියා ඔහුට පඬුරු වශයෙන් මංගල ගාථා සංඝයා විසින් කී බව ද දන්වා සංඝයා කෙරේ ගෞරවයෙන් ලෙඩා හැර යව යි යැදිය යුතු. ඒත් අමනුෂ්‍ය තෙම ඔහු හැර නො යා නම්, එ පවත් දෙවියනට පැමිණිලි කැරැ ආටානාටිය සුතුර කියැ යුතු. අමනුෂ්‍යාධිගෘහීතයා භික්ෂුවෙක් නම් අසුන් දෙවැ සියලු අමනුෂ්‍යයනට රැස් වන්නට ඝෝෂා කැරැ සුවඳ මල් ආදිය පුද පින් දී පිරිත කියැ යුතු. මේ අටුවාහි දැක්වෙන පරිදි යි.

429. විපස්සී ආදි සත් බුදුවරුන් ගේ සව්වෝ ශුද්ධාවාසයන්හි සිටිත්. එ බැවින් ඔබ සසුන් තව ම එහි ඇත. එහෙයින් මේ සත් බුදුවරුන්ගේ නම් උමණක් මෙහි දැක්විණ. 430. කුම්භාණ්ඩනාගාදීන් ගැන උපග්‍රන්ථය බලනු. 431. දෝපහන් — උපග්‍රන්ථය බලනු.

වෛශ්‍රවණ (කුවේර) රජහට හසනි ආදී යානවිශේෂයෝ ද වෙත්. අහසෙහි මැවුණු **ආටානාටා, කුසිනාටා, පරකුසිනාටා, නාටපුරිකා, පරකුසිතනාටා** යන නගරයෝ එ රජුට වෙති, එහි උතුරෙහි **කසිවන්ත** පුරය ද එයට පැළදිගැ **ජනොඝ** පුර, **නවනවතිය** පුර, **අම්බරඅම්බරවති** පුර, **ආලකනන්ද** පුර යැ යි අන්‍ය නගරයෝ ද ඇත්හ. කුවේර රජු ගේ රාජධානිය **විසාන**[432] නමි. එ හෙයින් එ රජ **වෛශ්‍රවණ** යැ යි කියනු ලැබේ.

එ රජුට අර්ථ පරීක්‍ෂා කොට රාජ්‍ය තත්ත්වය දන්වා යවන **තතෝලා, තත්තලා, තතෝතලා, ඔජසි, තේජසි, තතෝජසී, සූර, රාජ, සූරරාජ, අරිඨ, නේමි** යන නම් ඇති මහරැටි කෙනෙක් වෙති. එහි **ධරණී** නම් මහ විලෙකි. එ තෙරැ **භගලවතී** නම් සභාමණ්ඩපය වේ. ඒ මඬුව වටා මල්පලබරින් සැදි නත් රුක් ද එහි රැව් පිළිරැව් දෙමින් ගැවැසෙන මොනර කොස්ලිහිණි ඈ නොයෙක් කුරුළුමුළුහු ද වෙත්. ඒ කුවේරයා ගේ පොකුණ හැම කල්හි ශෝභිත ව පවතී. වෛශ්‍රවණ රජ පාලනය කරන ඒ දිශාව මහමෙරින් උතුර යැ යි මහජනයා කියයි. යකුනට අධිපති ඒ **කුවේර** මහරජ ද ඔහු පුත්තු ද ගෞතම බුදුරජාණන් වහන්සේ දුර දී ම දැක වඳිත්. ඔහු පිරිසැ වූ යක්කු ද වඳිති. එපවත් ඇසූ අප විසින් එය සබා දැ'යි විචාරන ලද ඒ යක්කු '**ගෞතම ජිනයන් වහන්සේ වඳිම්හ, විද්‍යාචරණසම්පන්න ගෞතම බුදුරජාණන් වහන්සේ වඳිම්හ**'යි කියත්.

වෛශ්‍රවණ රජ මේ ආටානාටිය පිරිත කියා මෙය මොනොවට පුහුණු කොට මෙත්සිතින් කියන කිසි ම මහණක්-හට මෙහෙණකට උවසුවකුට උවැසියකට යක්‍ඛ ගන්‍ධබ්බ කුම්භණ්ඩ[433] **නාග** යන සතර ජාතීනට අයත් කිසිවකු හිරිහැර-යක් කළොත් ඔහුට සිය රජයේ ගමෙක නියම් ගමෙක සත්කාරයක් ගරුකාරයක් හෝ **ආලකනන්ද** පුරයෙහි වසන තැනක් හෝ විසීමක් හෝ යක්‍ෂසමාගමයට යන්නට අවසරයක් හෝ නො ලැබෙන බවත්, අමනුෂ්‍යයන් ඔහු විවාහයට ද නුසුදුස්සකු කරන බවත්, නොයෙක් නින්‍දා පරිභව හා

432. විසවණ යන්න උච්චාරණයෙහි දී විසාණ යැ යි වූ සේ පෙනේ. විශ්‍රවස්හු ගේ පුත් හෙයින් වෛශ්‍රවණ නම් වී යැ යි සංස්කෘත ග්‍රන්ථකාරක මත යි 433 සංස්කෘතයෙහි කුම්භාණ්ඩ කුෂ්මාණ්ඩ යැ යි රූප දෙකකි. එය පාලියෙහි කුම්භණ්ඩ කුම්භණ්ඩ යැ යි සිටී. පුරාණ ග්‍රන්ථකාරකයන්ගේ මතයේ හැටියට මේ ගණදෙවතා විශේෂයෙකි.

දඬුවම් ද කරන බවත්, සතරවරම් රජුනටත් අටවිසි යක්සෙනෙවියනටත් ඔවුන් ගේ ඇමතියනටත් ගෞරව නො කරන එකාවෙක කරන මුරංඩු අමනුෂ්‍යයන් ද ඇති බැවින් ඔවුන් යමකුට කිසි පීඩාවක් කළොත් එ බව යක් සෙනෙවියනට දැන්විය යුතු බවත් කියා ඒ යක්සෙනෙවියන් ගේ නම් ද පැවැසී ය.

ඉන්ද, සෝම, වරුණ, භාරමාජ, පජාපති, චන්දන, කාමසෙට්ඨ, කින්නුඝණ්ඩු, නිඝණ්ඩු, පනාද, ඕපමඤ්ඤ, දේවසූත, මාතලි, චිත්තසේන, ගන්ධබ්බ, නළ, රාජ, ජනෙසභ, සාතාගිර, හේමවත, පුණ්ණක, කරතිය, ගුළ, සිවක, මුචලින්ද, වෙස්සාමිත්ත, යුගන්ධර, ගෝපාල, සුප්පරෝධ, හිරිනෙත්ති, මන්දිය, පඤ්චාලචණ්ඩ, ආලවක, පජ්ජුන්න, සුමන, සුමුඛ, දධිමුඛ, මණි, මානි, චර, දීඝ, සේරිස්සක යන මොහු ඒ යක් සෙනවියන් ගේ නම් ය.

වෙසවුණු රජ මෙසේ ආටානාටිය පිරිත කියා බුදුරදුන් වැද අවසර ගෙන සෙසු වරම් රජුන් ද සිය පිරිස ද කැටුව නික්ම ගියේ ය.

පසු ද උදේ බුදුරජහු භික්‍ෂූන් බණවා වෙසවුණු රජ කී සියල්ල දන්වා ආටානාටිය පිරිත ඉගෙන පුරුදු පුහුණු කරවූ යැ යි වදාළහ.

[මෙහි සත්බුදුවරුනට නමස්කාරය, සිවු මහ රජුන් ගේ වාසස්ථානාදිය, උතුරුකුරු දිවයිනැ තතු, යක්‍ෂ සෙනාපතීන් ගේ නම්, ආටානාටිය කියයුතු සැටි, භාග්‍යවතුන් වහන්සේ වෙසමුණු රජු ගේ ඉල්ලීම පිළිගෙන මෙ පිරිත පුහුණු කරන්නැයි වදාළ බව යන මොහු දක්වන ලදහ.]

---

33. සංගීති සූත්‍රය

එක් සමයෙක භගවත් බුදුරජුහු මහත් පැවිදි පිරිසක් හා මල්ලරට සැරි සරනුවෝ **පාවා** නුවරට පැමිණ චුන්ද නම් කාමාරපුත්‍රයා ගේ අඹවෙනෙහි වෙසෙති. එපවත් ඇසූ පාවා නුවර වැසි මල්ල රජහු එහි ගොස් තමන් නොබෝ කලැ කරවා තුබුණු එ තෙක් කිසිවකු පරිභෝග නො කළ **උබ්භතක** නම් සන්ථාගාර ශාලාවට වඩින්නට ද එය එසේ මුලින් ම පරිභෝග කරන්නට ද අයැදූහ.

2. බුදුරජහු ද නිහඬව එය ඉවැසූහ. ඔහු ද වැඳ සමු ගෙන නික්මැ ගොස්, ශාලාව හැම තැන පලස් අතුරා අසුන් පණවා දිය බඳුනක් තබා පහනක් දල්වා යළි බුදුරජුන් වෙත එළැඹ වඩින්නට කල් බව දැන්වූහ.

බුදුරජ්හු ද මහණමුළුව හා එහි වැඩ පා දෙවැ සන්ථාගාරයට පිවිසැ මැද ටැඹට පිටු දී පෙරදිගට මුහුණ ලා හුන්හ. මහණහු ද පා දෙවැ එහි පිවිසැ බුදුරජුනට පිටුපසැ පැසිම් දිගැ බිතට පිටු දී පෙරදිගට මුහුණු ලා හුන්හ. පාවා නුවර මල්ල රජ්හු ද පා දෙවැ පිවිසැ බුදුරජුන් ඉදිරියෙහි පෙර දිගැ බිත්තියට පිටු පා පැසිම් දිගට මුහුණු ලා හුන්හ.

2. බුදු රජහු ඔවුනට බොහෝ වේලා දහම් දෙසා ඔවුන් ගුණදහම් වැඩීමෙහි උනන්දු කොට, නික්මැ යන්නට කල් දැන්වූහ. ඔහු ද නැගී වැඳ පැදකුණු කොට නික්මියහ. එයින් නොබෝ වේලායෙහි බුදුරජ්හු නිහඬ වැ හුන් භික්‍ෂූන් බලා, සැරියුත් තෙරුන් බණවා, 'සැරියුත, මා පිට රිදෙයි. මඳක් වේලා වැදහෙන්නෙමි[434] යි වදුරා, ඔවුනට දම් දෙසන සේ තෙරුනට නියෝග කොට පසෙකැ වූ සඟනැ සඟළ සිවුර එළා ඒ මතැ සිංහශය්‍යායෙන් හොත්හ.

3. ඒ වනාහි නිවට නාපුතු[435] කළුරිය කළ දවස් ය. ඔහු මළ පසු ඔහු සවු නිවටහු සිය සරුහු දෙසූ දහම් විනය පිළිබඳ ව එකෙක් අනෙකකුට වෙනස් මත දරනුවෝ බැණ-දෙඩා ගන්නාහු හෙදහිත්‍යා වැ හැසුරුණහ.

සැරියුත් තෙරණුවෝ මෙ කරුණු මුල් කොට ගෙන සම්මාසම්බුදු නොවූවකු දෙසූ අනෛර්‍යාණික ශාසනයෙහි සැටි එසේ යැ'යි වදුරා, **'අප සම්මාසම්බුදුරජුන් සස්න ස්වාඛ්‍යාත ය,**

---

434. අප බුදුරජුන් පෙර ප්‍රධන් වීර්‍ය වැඩූ සාදිරුද්දෙහි ඔබ කායට බොහෝ පීඩා වීය එයින් මහළු වියේදී ඔබ කායැ වාතරුජා උපන. මේ පිටැරිදුම එයින් වූයෙකි. 435. නාතපුත්ත නිගණ්ඨ තෙම නාලන්ද වැසියෙකි. උපාලි ගැහැවි බුදුසස්නැ පහන් වූ කලැ ඔහු සිනැ තැවිලි උපන. එයින් උණු ලේ වමිත විය. එයින් ම හේ ගිලන් විය. ඔහු සව්වෝ ඔහු පාවා නුවරට ගෙන ගියහ. එහිදී හේ කළුරිය කොළේ ය. මර ඇඳෙහි හොත් හේ තෙම තම දහම නෛර්‍යාණික නොවන බව සැලැකුයේ ය. එ බව සිය සව්වනට දන් කිම ද ඔවුන් එය නොපිළිගනිති යි ද සිත් ය. එසේ සිතා ඔවුන් එක එකා ළඟට කැඳවා ගුරුමුෂ්ටි වශයෙන් එකකුට කී දෑට විරුඬ බසක් අනෙකාට කී ය. එයින් ඔහු මළ පසු වෙන වෙන මත ඉරදිපත් කෙරෙමින් ඔහු සව්වෝ කලහ කළහ. මෙයින් හිමුන් ගිහිසව්වෝ කලකිරී බුදුසස්නැ පැහැදුණුහ. නමය වමසේ වන්නාට ම උපාය යොදා තබා ය නිවටනාපුත් කළුරිය කොළේ.

සුප්‍රවේදිත ය, නෛර්‍යාණික ය, කෙලෙස් සංසිඳෙනු පිණිස පවත්නේ ය. ඒ දහම් සියල්ලන් උනුනට අවිරුද්ධ බස් ඇත්තන් විසින් සුතු, විවාද නො කළ යුතු. මෙසේ මෙ සස්න බොහෝ කල් පවත්නේ ය. බොහෝ දෙනාට හිත සුව පිණිස වන්නේ යැ' යි වදරා, සියලු බුද්ධවචනය ඒකක ද්වික ත්‍රිකාදි වශයෙන් පිළිවෙළින් ගළපා මතු දැක්වෙන දහම් වදාළහ:

1

ඒ භගවත් බුදුරජුන් වදාළ **එක් දහමෙක්** ඇත. එය හැම දෙනා පිළිගත යුතු, විවාද නො කළ යුතු. ඒ එක් දහම නම්: **සියලු සත්හු අහරින් සිටුනාහ**[436] යනු යැ.

2

භගවත් බුදුරජුන් වදාළ ධම්මිකයෝ ඇත්හ. එය හැම දෙනා පිළිගත යුතු, එහි ලා විවාද නො කළ යුතු. ඒ කවර වික කෙනෙක් ද?

1. **නාම රූප දෙක** [437]
2. **අවිද්‍යා, භවතෘෂ්ණා** දෙක[438]
3. **භවදෘෂ්ටි, විභවදෘෂ්ටි** දෙක[439]
4. **අහිරික, අනොත්තප්ප දෙක** (පවට නොපිළිකුල, පවට බියනැති බව)
5. **හිරි, ඔත්තප්ප** දෙක(පවට පිළිකුල හා පවට බිය)
6. **දුර්වච බව, පාපමිත්‍රතාව**(පවිටු මිතුරන් ඇතිබව)
7. **සුවච බව, කල්‍යාණමිත්‍රතාව**(යහපත් මිතුරන් ඇතිබව)
8. **ආපත්ති දැනීම, ආපත්ති වුට්ඨාන කුශලතා** (ආපත්තින් ගෙන්නැගිටීමේ සීමාව දැනීම)

---

436. අහර - ඵලය ආහරණය කරනුයේ (උපදවනුයේ) ආහාර (අහර) නම. කබලීකාරාහාරාදි ප්‍රත්‍යය සතර ය: සියලු සංස්කාරයන් ගේ පැවැත්ම මේ ප්‍රත්‍යයයෙන් ය. මෙහි ආහාර යනු ප්‍රත්‍යයෝ යි. 437. නාම රූප - නාම යනු චිත්ත චෛතසික නිර්වාණ යන තුන ය. රූප යනු මහාභූතරූප සතර හා උපාදාය රූප සූවිස්ස ය. අරමුණට නැමෙන්නෝය යන අරුතින් චිත්තචෛතසිකයෝ නාම නම් වෙති. චිත්ත චෛතසිකයන් තමා කරා නම්වන අරුතින් නිවන නාම නම් වෙයි. රූප යනු පඨවි ආදි භූතරූප සතරත් ඒවා නිසා ඇති වන උපාදාරූප සූවිස්සත් ය. අව්ව වැස්ස ආදියෙන් පෙරළෙන්නෝ යනු රූප යන්නෙහි අරුත් වේ. 438. අවිද්‍යා යනු සිවුසස් නොදැන්ම යි. භවයෙහි ඇල්ම භවතෘෂ්ණා යි. 439. භවදෘෂ්ටි නම් ශාශ්වතදෘෂ්ටිය යි. මෙහි මුලැ බ්‍රහ්මජාල සූත්‍රයෙහි දැක්වුණු ශාශ්වතවාද විභාගය බලත්ව. විභවදෘෂ්ටි යනු උච්ඡේද දෘෂ්ටිය යි.

9. සමාපත්ති දැනීම, සමාපත්තින් ගෙන් නැඟිසිටින කාල සීමාව දැනීම,

20. ධාතුකුශලතාව, මනස්කාරකුශලතාව[440]

11. ආයතනකුශලතාව, ප්‍රතීත්‍යසමුත්පාදකුශලතාව[441]

12 ස්ථාන දැනීම, අස්ථාන දැනීම[442]

---

440. ධාතුකුශලතා නම් චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු ආදි විසින් අටොළොස් වැදෑරුම් වූ ධාතූන් ගේ තතු බෙද දැන ගනුයෙහි සමත් ශ්‍රවණ ධාරණ සංමර්ශන ප්‍රතිවේධ විසින් සිවුවැදෑරුම් වූ ප්‍රඥා යි. ශ්‍රවණ ධාරණ ප්‍රඥා ශ්‍රැතමය යි. ඉතර දෙක භාවනාමය යි. එහි ද සංමර්ශනප්‍රඥාව ලෞකික ය, විවසුන් නුවණ ය. ප්‍රතිවේධප්‍රඥාව ලෝකෝත්තර ය. මනස්කාරකුශලතා = අනිත්‍යාදීන් ලක්ෂණාදි වශයෙන් මෙනෙහි කිරීම මනස්කාර නමි. එහි කෞශල්‍යය මනස්කාරකුශලතා නමි එය ආදි-මධ්‍යාවසාන විසින් ත්‍රිවිධ ය. ආදි අවස්ථාව සංමර්ශනප්‍රඥා යි. මධ්‍ය අවස්ථාව ප්‍රතිවේධ ප්‍රඥා යි. අවසාන අවස්ථාව ප්‍රත්‍යවේක්ෂණ ප්‍රඥා යි. 441. ආයතන කුශලතා = දෙළොස් ආයතනයන් දන්නා නුවණ. මෙය උද්ග්‍රහජානන මනස්කාරජානන වශයෙන් විවිධ යි. ශ්‍රැතවශයෙන් අර්ථවශයෙන් ඉගෙනී මෙන් ධාතූන් ගේ ලක්ෂණාදියේ විභාග දැනීම උද්ග්‍රහජානන ප්‍රඥාව යි. සංමර්ශනවිධි ප්‍රතිවේධවිධි ප්‍රත්‍යවේක්ෂණවිධි දන්නා නුවණ මනස්කාරජානන ප්‍රඥා නමි. ශ්‍රවණය සේ ම උද්ග්‍රහණ ප්‍රත්‍යවේක්ෂණයෝ ද ස්වල්ප දැනීම් ඇති කරන්නෝ ය. එබැවින් ඔහු ලෞකික ප්‍රඥා යැ. ප්‍රතිවේධ ඥානය ම ලෝකෝත්තර යැ. ආදී මාර්ගක්ෂණයෙහි සංමර්ශනඥාන මනස්කාරඥානයන් ගේ නිෂ්පත්තිය (මුදුන් පැමිණීම) වේ. එබැවින් පර්‍යාය විසින් ඔවුන් ගේ ලෝකෝත්තර බවෙක් ද පෙනේ. මෙසේ සංමර්ශනඥාන මනස්කාරඥාන දෙදෙන ලෞකික ලෝකෝත්තර මිශ්‍රක යැ. ප්‍රතීත්‍යසමුත්පාදකුශලතා = අවිද්‍යාදීන් සංස්කාරාදීනට ප්‍රත්‍යය වන සැටි දැනගන්නා උද්ග්‍රහණ, මනස්-කාර, ශ්‍රවණ, සංමර්ශන, ප්‍රතිවේධ, ප්‍රත්‍යවේක්ෂණ වශයෙන් සවැදෑරුම් වූ ප්‍රඥාව. 442. ස්ථාන දැනීම = ස්ථාන (කාරණ) පිරිසිඳ දන්නා ප්‍රඥාව. මෙහි 'ස්ථාන' යනු වාසනුව යි. කාරණ යනු හේතුප්‍රත්‍යසභාව යි. චක්ෂුර්විඥානය හට ගන්නට චක්ෂුඃප්‍රසාදය වාසනු (ස්ථාන) වේ, කාරණ ද වේ. රූපය අරමුණ වේ මෙසේ ස්ථාන (හේතු) දන්නා නුවණ ස්ථානකුශලතා යි

එකී හේතු දන්මෙහි සමර්ථ වූ ඥානසම්ප්‍රයුක්ත මහ කුසල් සතර මහා ක්‍රියා සතර අභිඥාදෙසිත යන සිත්හි යෙදුණු ප්‍රඥාව යි. චක්ෂුර්විඥානයට ම විනා ශ්‍රෝත්‍රවිඥානාදියට ඇස ස්ථාන හෝ කාරණ නො වේ. මෙ බඳු අස්ථාන අකාරණ දන්නා නුවණ අස්ථාන කුශලතා යි. මේ ද උඩ කී දස සිත්හි යෙදුණු ප්‍රඥාචෛතසිකය ම ය.

තවද සෝවාන් පුහුලා සංස්කාරයක් නිත්‍ය හෝ සුඛ හෝ ආත්ම වශයෙන් ගැන්ම, ආනන්තරිය කර්ම කිරීම, පරශාස්තෘන් උදෙසීම, එක් ලෝකධාතුවෙක එක විට දෙ බුදුකෙනෙකුන් ඉපදීම, සක්විතිරජ දෙනදෙනෙකුන් එක් සමයෙහි ඇති වීම, ස්ත්‍රියක ව සම්‍යක්සම්බුද්ධ වීම, ස්ත්‍රියක ව සක්විති හෝ ශක්‍ර හෝ මාර හෝ බ්‍රහ්ම වීම, කායාදි දුශ්චරිතයන්ගේ සුඛ-විපාක ඇති වීම යන මොහු අස්ථාන යි, නො විය හැකි දෑ යි. මොවුනට විරුද්ධ වූයේ ස්ථාන යි. මොවුන් වෙසෙසා දන්නා නුවණ ද ස්ථාන-කුශලතා නමි.

13. **ඍජු බව, ලජ්ජි බව**[443]

14. **ක්ෂාන්තිය සෞරත්‍යය**[444]

15. **සාඛල්‍යය** (මෘදු වචන ඇති බව), **පටිසන්ථාරය** (පිළිසඳර)[445]

16. **අවිහිංසාව** (කරුණාව), **සුචිබව** (මෛත්‍රිය)[446]

17. **මුට්ඨස්සච්චය** (සිහිමුළාව), **අසම්පජඤ්ඤය** (නොනුවණ).

18. **සති** (සිහිය), **සම්පජඤ්ඤය** (ඥානය).

19. **ඉන්ද්‍රියසංවරභේදය, භෝජනයෙහි පමණ නොදැන්ම.**

20. **ඉන්ද්‍රියසංවරය, භෝජනයෙහි පමණ දැන්ම,**

---

443. ඍජුබව (අජ්ජවය)= අවඞ්ක බව යි. ගෝමූත්‍ර වංකතා, චන්ද්‍ර වංකතා, නාඞ්ගල වංකතා යැ යි වංක බව ත්‍රිවිධ යි. ඇතැම් මහණෙක් පළමු වයස්හි දී එක්විසි අනේෂණයන්හි ෂඩගෝචරයන්හි හැසිරෙයි. මධ්‍යම පශ්චිම දෙවයස්හි ශික්ෂාකාමී වේ. මුල් භාගය වක් ව ඉතිරි භාගය ඍජු වූ ගෝමූත්‍රධාරාව ගේ සෙයින් මුල් වයස්කොටසෙහි වූ චරිතයෙන් වක්බව ගෝමූත්‍ර වංකතා නම්. කෙනෙක් ප්‍රථම පශ්චිම දෙ වයස්හි ශික්ෂාකාමි වෙත්. මැද වයස්හි දුෂ්ප්‍රතිපත්හි යෙදෙත්. මෙසේ මධ්‍යභාගයේ වක්‍රබව චන්ද්‍රවක්‍රතා නම්. මුල මැද දෙවයස්හි ශික්ෂාකාමී ව පශ්චිම භාගයෙහි දුෂ්ප්‍රතිපන්නයහු ගේ වක්‍ර බව නාංගලවක්‍රතා (ලාංගල වක්‍රතා) නම් මේ සියලු වංකතායෙන් ම වැළැකී තුන් වයස්හි ම මනා ව සික රක්නහු ගේ එ අවංක බව ම අජ්ජව නමි. මේ කායුජ්ජුකතා චිත්තුජ්ජු-කතා යන චෛතසික දෙකෝ ම අවස්ථා යි. ලජ්ජිබව යනු හිරි චෛතසිකය යි.
444. ක්ෂාන්තිය = ඉවැසීම. අද්වේෂය ප්‍රධාන කොටැති මහ අකුසල්අට, මහා ක්‍රියා අට, අටතිස් චෛතසික යන මොහු මෙයින් කියන ලදහු.

සෞරත්‍යය = ශුචිශීලතාව, මනා ව පවින් මැළැකුණු බව. ශීලචේතනාව ප්‍රධාන කොටැති මහ කුසල් අට, මහා ක්‍රියා අට, අටතිස් චෛතසික යන මොහු මෙයින් කථිත හ 445. පටිසන්ථාර (පිළිසඳර)=ආමිසය ද ධර්මය ද යන දෙක තමන් ගෙන් අනුනට හෝ අනුන් ගෙන් තමනට නො ලැබීම් හේතුයෙන් තමන් අනුන් දෙ පක්ෂය අතර ඇති වන ඡිද්‍රය (භේදය), විවරය, අනාකරය වසාලීම පටිසන්ථාර නම්. සංග්‍රහ කිරීම යි. ආහාරාදියෙන් සංග්‍රහය ආමිසපටිසන්ථාර යි. බණ දහම් කීම කියැවීම ඉගැන්වීම ධම්ම-පටිසන්ථාර යි. 446. අවිහිංසා යනු කාරුණාව හා එහි පූර්වභාගය යි. කාරුණායන්නෙන් කරුණා බ්‍රහ්ම විහාරය ද කාරුණාපූර්වභාග යන්නෙන් එහි උපචාරධ්‍යානය ද කියන ලදි.

සුචි බව යන්නෙන් මෛත්‍රීබ්‍රහ්මවිහාරයත් එහි පූර්වභාග උපචාරධ්‍යානයත් කියන ලදි.

21. **පටිසඞ්ඛානබලය, භාවනාබලය,**[447]

22. **සතිබලය, සමාධිබලය.**[448]

23. **සමථය, විපස්සනාය**[449]

24. **සමථනිමිත්තය, පග්ගහනිමිත්තය.**[450]

25. **පග්ගහය** (වීර්‍යය), **අවික්ඛෙපය** (එකඟ බව).

26. **සීලවිපත්තිය** (දුසිල් බව), **දිට්ඨිවිපත්තිය** (මිසදිටු).

27. **සීලසම්පත්තිය** (ශීලසංවරය), **දිට්ඨිසම්පත්තිය** (ඥානය).

28. **සීලවිසුද්ධිය, දිට්ඨිවිසුද්ධිය.**[451]

29. **දිට්ඨිවිසුද්ධිය** (ඥානදර්ශනය), **දිට්ඨිවිසුද්ධිය හා යෙදුණු වීර්‍යය.**

---

447. පටිසංඛානබලය. අප්පටිසංඛා යනු අඥාන බව යි. එයින් මැඩැලිය නොහැකි සැලිය නොහැකි නුවණ පටිසංඛාන බල නමි.

භාවනාබලය – ඒ ඒ තන්හි පස්විකුම් නුවණ ද එයි මුදුන් පැමිණිච වූ ලොකෝත්තරඥානය ද, නිෂ්පර්‍යාය වශයෙන් මාර්ගභාවනා ද භාවනා නමි. ඔවුන් වඩා නිම කළාහු ගේ නොව ඔවුන් වඩාන්නාහු ගේ ම නුවණ යි. ඔවුන් වඩන්නාහට උපන් සම්ප්‍රයුක්තධර්මයන් ගේ නොසැලෙන බව ස්ථිර බව භාවනාබල නමි 448. සතිබලය = විරුද්ධ ස්වභාවයන් ගෙන් නොසැලී ස්ථිර ව සිටුනා සිහිය සතිබල නමි. සමාධිබල = කුසල්සිතැ එකඟ බව මෙහි සමාධි යි. උද්ධච්චයෙන් නො සැලෙන සේ එහි තර ව සිටුනා බව සමාධිබල යි. 449. සමථ = නීවරණ සන්සිඳුවීමයි. විපස්සනා = අනිත්‍යාදීන් විවිධාකාරයෙන් ත්‍රෛභූමක සංස්කාරයන් දැකීම විපස්සනා (විදර්ශනා) නමි. 450 සමථනිමිත්ත = ශමථයට කාරණය, පසු පසු ව උපදනා සමාධියට කාරණ වූ පළමු පළමු උපදනා සම්‍යක්සමාධිය. පග්ගහනිමිත්ත = වීර්‍යයට කාරණය. පසු පසු ව උපදනා වීර්‍යයට කාරණ වූ පළමු පළමු හට ගන්නා සම්‍යග්ව්‍යායාමය. 451. සීලවිසුද්ධි = ශීලයාගේ විශෙෂ ශුද්ධිය, මින් තෙඞි වන චිත්තවිශුද්ධි ආදියට ප්‍රත්‍යය වනුයෙහි සමත් ශීලය. දිට්ඨිවිසුද්ධි ඥානදර්ශනවිශුද්ධියටත් පරමාර්ථ විශුද්ධිය වූ නිර්වාණයටත් පමුණුවන්නට පොහොසත් සම්‍යග්දෘෂ්ටිය කම්මස්සකතාඤාණ සච්චානුලෝමිකඤාණ මග්ගඤාණ ඵලඤාණ යන මොහු දිට්ඨිවිසුද්ධි යන්නෙන් දැක්වුණාහ. මෙහි සච්චානුලෝමිකඤාණ යනු මුදුන් පත් විවසුන් නුවණ යි. අනිත්‍යදුඃඛාදි විසින් පැවැති වාක්සත්‍ය සංඥාවට අනුලෝම බැවින් ද එ පරිදි ම පිළිවිදුනා බැවින් පරමාර්ථසත්‍යයට අවිලෝම (විරුද්ධ නොවන) බැවින් ද සත්‍යානුලෝමිකඥාන යනු විවසුන්නුවණට නමෙකි.

30. **සංවේග කටයුත්තෙහි සංවේගය, සංවේග ඇත්තහු ගේ වීර්‍යය.**[452]

31. **කුසල්දහම්හි නොසතුටු බව, ප්‍රධන් වීර්‍යයෙහි අප්‍රති-වාණිතාව** (අතර නො පසුබස්නා බව).[453]

32. **විද්‍යාව, විමුක්තිය.**[454]

33. **ක්‍ෂයයෙහි නුවණ, අනුත්පාදයෙහි නුවණ.**[455]

---

452. සංවේග = ජාතිජරා ව්‍යාධි ච්‍යුති ආදි සංවේග වස්තූන් නිසක් වශයෙන් ද භයජනක වශයෙන් ද දක්නා නුවණ. සංවෙගො නාම සහොත්තප්පඤාණං යි ටීකාහි කියන ලදි. ජාති ජරා ව්‍යාධි මරණ යන සතර අරමුණු කොට උපදනා මහකුසල්සිත් සතරෙහි වූ ප්‍රඥාව යි. සංවේග ඇත්තහු ගේ වීර්‍යය යනු ජාතිජරාදීන් සංවිග්න ව එයින් මිදෙන්නට තැත් කරන්නහු ගේ සතර ප්‍රධන් වීර්‍යයෝ යි. එක්විසි කුසල් සිත් ද ඵල සිත් සතර ද යන පස්විසි සිත්හි යෙදුණු වීර්‍යචෛතසිකය මෙයින් අභිප්‍රෙත ය 453. කුසල් දහම්හි නොසතුටු බව = ශීලසමාධි ආදි මාත්‍රයෙකින් තෘප්ත නොවන බව

ප්‍රධාන වීර්‍යයෙහි අප්පටිවානිතා = නොනවත්නා බව (අප්පටිවානිතා ච පධානස්මිං) වීර්‍යප්‍රවාහය පවත්නා කල අතර නැවැත්ම පසුබැස්ම ප්‍රතිවාන නම්. අතර කඩ නොකොට ආදරයෙන් රහත් බව ලබනතුරු ම නිතොර ව වීර්‍ය වඩන බව මෙයින් කියන ලද

454. විද්‍යාව=ත්‍රිවිද්‍යාව. පූර්වෙනිවාසානුස්මෘතිඥාන, ච්‍යුතූපපත්තිඥාන, ආශ්‍රවක්‍ෂයඥාන යන තුන යි.

මුක්ති නම් මිදීමයි. ඒ චිත්තාධිමුක්ති විමුක්ති විසින් ද්විධ යි. නීවරණාදීන් ගෙන් මොහොතට මිදුණු බැවින් අෂ්ටසමාපත්තීහු චිත්තාධි-මුක්ති නමු. සියලු සංස්කෘතධර්මයන් ගෙන් මිදුණු බැවින් නිවන විමුක්ති නම්. විශිෂ්ට මිදීම් නු යි මොහු විමුක්ති නමින.

455. ක්‍ෂයයෙහි ඥානය (ඛයෙ ඤාණං) = සමුච්ඡේද වශයෙන් කෙලෙසුන් නසනුයේ ක්‍ෂය නම්, ආර්යමාර්ගය යි. එහි ඇතුළත් ප්‍රඥාචෛතසිකය ක්‍ෂයයෙහි ඥාන නම්, මාර්ගඥානය යි.

අනුත්පාදයෙහි ඥානය (අනුප්පාදෙ ඤාණං) = සතර ඵලසිත්හි යෙදුණු ප්‍රඥා චෛතසිකය යි. යම් කෙලෙස් කෙනෙක් යළි ප්‍රතිසන්ධිය ඇති කෙරෙත් ද ඔහු මාර්ගයෙන් නසනලද්දහු පුනරුත්පාදයෙහි අසමර්ථ වෙති. එසේ අනුත්පාදය කළ තැනැත්තේ ඵලාවස්ථායෙහි සිටි පුද්ගල තෙමේ යි. එහෙයින් මෙහි අනුත්පාද යනු ආර්ය ඵලය යි. නව ද, කෙලෙසුන් මාර්ගයෙන් නැසීම ද අනුත්පාද නම්. එහි අවසන්හි පහළ වූයේ ඵලය යි. එ බැවින් ක්ලේශෝත්පත්තිය නැවැත්වූ පසු, එනම් මාර්ගයට අනන්තරව ඵල සිතෙහි පහළ වන නුවණ යි.

3

භාගවත් බුදුරජුන් වදාළ ධර්මත්‍රිකයෝ:

1. **අකුසල් මුල් තුන**: ලෝභය, ද්වේෂය, මෝහය.
2. **කුසල් මුල් තුන**: අලෝභය, අද්වේෂය, අමෝහය.
2. **දුසිරිත් තුන:** කායදුශ්චරිතය, වාග්දුශ්චරිතය, මනෝ-දුශ්චරිතය.
4. **සුසිරිත් තුන**: කාය සුචරිත, වාක්සුචරිත, මනස්සුචරිත.
5. **අකුශල විතර්ක තුන**: කාමවිතර්ක, ව්‍යාපාදවිතර්ක, විහිංසාවිතර්ක[456]
6. **කුශල විතර්ක තුන**: නෛෂ්කාම්‍යවිතර්ක, අව්‍යාපාදවිතර්ක අවිහිංසාවිතර්ක[457]

---

450 කාමවිතර්ක නාම කාමයන් හා ප්‍රතිසංයුක්ත විතර්ක යි. කාම නම් රූප ශබ්දාදි පංචකාමවස්තු හෙවත් වස්තුකාම ය, ඒ කාම වස්තූන් කෙරෙහි ඇල්ම හෙවත් ක්ලේශකාමය යැ යි ද්විවිධ යි. වස්තුකාමයන් අරමුණු කිරීම් වශයෙන් කාමයන් හා ප්‍රතිසංයුක්ත බව ද, සම්ප්‍රයෝග වශයෙන් (එක් ව යෙදීමෙන්) ක්ලේශ කාමයෙහි ප්‍රතිසංයුක්ත බව ද දත යුතු. මෙසේ දෙවැදෑරුම් කාම හා ප්‍රතිසංයුක්ත වූ කල්පනාව කාම-විතර්ක යි.

ව්‍යාපාදවිතර්ක = සම්ප්‍රයෝග වශයෙන් ව්‍යාපාදය හා යෙදුණු විතර්ක.

විහිංසාවිතර්ක = සතුන් වෙහෙසනා (හිංසා කරන) කල්පනාව. ප්‍රිය මනාප සත්ත්වයන් හෝ වස්තූන් කල්පනා කරන්නහුට කාමවිතර්කය උපදී. අප්‍රිය අමනාප සත්ත්වයන් හෝ සංස්කාරයන් දෙස කිපී බලනා තැන් පටන් ඒ නසනා තුරු ව්‍යාපාද විතර්කය උපදී. මොහු නැසෙත්වා ආදීන් අන්‍ය සත්ත්වයන්ගේ විනාශය පතනා කලැ අන් සතුන් අරමුණු කොටැ විහිංසාවිතර්කය උපදී. සංස්කාරයන් (ඉන්ද්‍රියබද්ධ නො වූ, සත්ත්ව නො වූ ද) අරමුණු කොට විහිංසාවිතර්කය නො උපදී. එහි දුකට පත්-වන්නකු නැති බැවිනි.

457. නෛෂ්කාම්‍යවිතර්ක = කාමයෙන් නික්මුණෙන් ප්‍රථම ධ්‍යානය නෛෂ්කාම්‍ය නම් නිෂ්කාමභාවය යනු අර්ථ යි. සියලු ලෝභයෙන් නික්මුණු බැවින් අලෝභය ද, නීවරණයෙන් නික්මුණු බැවින් ප්‍රථමධ්‍යාන-ය ද, සියලු අකුශලයෙන් මිදුණු බැවින් සියලු කුශල ධර්ම ද, සියලු සංස්කෘත ධර්මයන් ගෙන් නික්මුණු බැවින් නිවන ද නෙක්ඛම්ම (නිෂ්ක්‍රම හෝ නෛෂ්ක්‍රම්‍ය) නම්. උපනිශ්‍රය විසින් ද සම්ප්‍රයෝග විසින් ද අරමුණු කිරීම් විසින් ද නෛෂ්කාම්‍ය (නෛෂ්ක්‍රම්‍ය)යෙන් ප්‍රතිසංයුක්ත විතර්කය නෛෂ්කාම්‍ය (නෛෂ්ක්‍රම්‍ය) විතර්ක නම් යි ටීකාහි කියන ලදී. මෙහි මේ තැනට ගැළපෙන ප්‍රධාන අර්ථය නෛෂ්කාම්‍ය යන්න යි. කාම විතර්කයට ඉදුරා විරුද්ධ වූයේ නිෂ්කාම භාවයුක්ත විතර්කය බැවිනි.

7. **අකුශල සංකල්ප තුන:** කාමසංකල්ප, ව්‍යාපාදසංකල්ප, විහිංසාසංකල්ප.[458]

9. අකුශලසංඥා තුන : **කාමසංඥා**, ව්‍යාපාද සංඥා, විහිංසාසංඥා[459]

10. කුශලසංඥා තුන : **නෛෂ්කාම්‍යසංඥා**, අව්‍යාපාදසංඥා, අවිහිංසාසංඥා[460]

11. අකුශලධාතු තුන : කාමධාතු, ව්‍යාපාදධාතු, විහිංසාධාතු.[461]

12. කුශලධාතු තුන : **නෛෂ්කාම්‍යධාතු**, අව්‍යාපාදධාතු, අවිහිංසාධාතු.[462]

13. **තුන් ධාතු** : කාමධාතු, රූපධාතු, අරූපධාතු.[463]

14. තවත් **ධාතු තුනෙක්** : රූපධාතු, අරූපධාතු, නිරෝධධාතු.[464]

තවද, අටුවාහි 'අසුභාරම්මණිකා ධ්‍යානයාගේ පූර්වභාගයෙහි කාමාවචර යැ. අශුභධ්‍යානයෙහි රූපාවචර යැ. ඒ අශුභධ්‍යානය පාදක කොට මාර්ග ඵල ලත් කල්හි ලොකෝත්තර යැ. කාම විතර්කයට ඉඳුරා විරුද්ධ බැවින් අශුභ ධ්‍යානය ම ගෙන මෙසේ කියන ලදැ'යි දක්වීණ. එබැවින් විතර්ක ගැන කියන තැන නෙක්ඛම්ම යන්නෙහි සංස්කෘතරූපය නෛෂ්කාම්‍ය යනු ම වඩා යෝග්‍ය ලෙස පෙනේ. අව්‍යාපාදවිතර්ක = ව්‍යාපාදයට ප්‍රතිවිරුද්ධ වූයේ අව්‍යාපාද යි, මෛත්‍රිය යි. එය හා යෙදුණු විතර්කය අව්‍යාපාද විතර්ක නම්. එය ධ්‍යාන ලැබෙන්නට පෙර කාමාවචර යැ. මෛත්‍රීධ්‍යානය පාදක කොට ලත් මාර්ගඵල අවස්ථාහි ලෝකෝත්තර ය. අවිහිංසාවිතර්ක = විහිංසාවට ඉඳුරා විරුද්ධ ස්වභාවය අවිහිංසා නම් යමක් හේතු කොට ගෙන සතුන් නොවෙහෙසා නම් එය යි, කරුණාව යි එය හා යෙදුණු විතර්කය අවිහිංසාවිතර්ක යි. කරුණාබ්‍රහ්මවිහාරයේ පූර්වභාගයේ දී මෙය කාමාවචර යි. කරුණා ප්‍රථම ධ්‍යානයේ දී රූපාවචර යි එය පාදක කොට ලත් මාර්ගඵලයන්හිදී ලෝකෝත්තර යි. මොවුන් ගෙන් එක් විතර්කයක් ප්‍රධාන වන කල්හි සෙසු දෙදෙන එයට අනුගාමී වෙත්.

458 කාමසංකල්පාදිහු කාමවිතර්කාදිහු ම ය මෙහි නමින් වන වෙනස මිසා අර්ථයෙන් සංකල්ප විතර්ක යනු එක ම ධර්ම යි. අනන්තවුනට අවබෝධ වන පරිදි සලකා මෙසේ ව්‍යවහාර මාත්‍රයෙන් වෙනස් කොට වදාළහ. 459. කාමසංඥා – කාමවිතර්කසම්ප්‍රයුක්තසංඥා යි ව්‍යාපාදවිතර්ක හා යෙදුණු සංඥාව ව්‍යාපාදසංඥා නම විහිංසාවිතර්කසංයුක්ත සංඥාව විහිංසාසංඥා නම මොවුන් ගේ ඉපැත්ම කාමවිතර්කාදීනට ත් පරිදි ම ය. 460. නෛෂ්කාම්‍යසංඥා = නෛෂ්කාම්‍යවිතර්කසම්ප්‍රයුක්ත සංඥාව නෛෂ්කාම්‍ය සංඥා නම. අව්‍යාපාද සංඥාදියේ අර්ථ ද මේ නය අනුව යොදා ගත යුතු. 461. මෙහි කාමධාතු ආදි විසින් දක්වුණේ කාමවිතර්කාදි විතර්ක තුන ම ය. 462. නෛෂ්කාම්‍යධාතු ආදීන් නෛෂ්කාම්‍ය විතර්කාදිය දක්විණ. 463 කාම ධාතු = කාමභවය රූප ධාතු = රූප භවය. අරූපධාතු = අරූප භවය. 464. රූපධාතු = රූපභවය. අරූප ධාතු = අරූපභවය. නිරෝධධාතු = නිර්වාණ. 'නිරුජ්ඣන්ති කිලෙසවට්ටං එත්ථාති නිරොධො සො එව පුග්ගලසුඤ්ඤතාවාචකා ධාතූති නිරොධධාතු. (ටීකා යි)

15. **තවත් ධාතු තුනෙක්** : හීනධාතු, මධ්‍යමධාතු, ප්‍රණීතධාතු.[465]

16. **තෘෂ්ණා තුන** : කාමතෘෂ්ණා, භවතෘෂ්ණා, විභවතෘෂ්ණා.[466]

17. **තෘෂ්ණා තුන අන් පරිද්දෙකින්** : කාමතෘෂ්ණා, රූපතෘෂ්ණා, අරූපතෘෂ්ණා.[467]

18. **තෘෂ්ණා තුන අන් පරිද්දෙකින්** : රූපතෘෂ්ණා, අරූපතෘෂ්ණා, නිරෝධතෘෂ්ණා.[468]

19. **සංයෝජන තුන**: සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස.[469]

20. **ආස්‍රව තුන**: කාමාස්‍රව, භවාස්‍රව, අවිද්‍යාස්‍රව.[470]

21. **භව තුන**: කාමභව, රූපභව, අරූපභව.

---

465. හීනධාතු = දොළොස් අකුසල් සිත්. අකුසල් සිත් දොළොසින් අන්‍ය ත්‍රෛභූමක ධර්ම මධ්‍යමධාතු නම් නව ලෝකෝත්තර ධර්ම ප්‍රණීතධාතු නම්. කාමතෘෂ්ණා = පංචකාම ගුණික (රූපාදි කාමවස්තු පස විෂය කොට ඇති) රාගය.

භවතෘෂ්ණා = රූපාරූප උපපත්ති භවයන් කෙරෙහි රාගය, ධ්‍යානනිකාන්තිය (ධ්‍යානයෙහි ඇල්ම), ශාශ්වතදෘෂ්ටි සහගත රාගය, භවවශයෙන් (ලත් භවයන්හි) ප්‍රාර්ථනාව මෙයින් මහද්ගතෝපපත්තිභව විෂය කොට ඇති තෘෂ්ණා, මහද්ගත කර්මභවවිෂය කොට ඇති තෘෂ්ණා, භවදෘෂ්ටිසහගත තෘෂ්ණා, භවප්‍රාර්ථනා යැ යි චතුර්විධ භවතෘෂ්ණාව දක්විණි. විභවතෘෂ්ණා = උච්ඡේදදෘෂ්ටිසහගත තෘෂ්ණාව.

466. කාමතෘෂ්ණා = පංචකාමගුණික රාගය. රූපතෘෂ්ණා = රූපභවය කෙරේ ඡන්දරාගය. අරූප තෘෂ්ණා = අරූපභවය කෙරේ ඡන්දරාගය. 467 රූපතෘෂ්ණා = රූපභවය කෙරේ ඇල්ම. අරූපතෘෂ්ණා = අරූපභවය කෙරේ ඇල්ම. නිරෝධතෘෂ්ණා = උච්ඡේදදෘෂ්ටිසහගත තෘෂ්ණාව, භව නිරොධයෙහි භවසමුච්ඡේදයෙහි තෘෂ්ණාව: මිනිසත්බව්හි සිටි සාහට තමාගේ සම්ප්‍රකාරයෙන් සමුච්ඡේදය වේවා යි භව නිරෝධය ඇරැබෑ උච්ඡේද දෘෂ්ටිය වේ. මේ නිරෝධතෘෂ්ණා යි. 468. සංයෝජන = සතුන් ක්ලේශ කර්ම විපාක යන තුනින් බඳනා බැඳුම් 469 සත්කායදෘෂ්ටි - ඇත්තා වූ ස්කන්ධයෙහි ආත්ම යැ යි ගත් දෘෂ්ටිය මෙය විසිවැදෑරුම්. උපග්‍රන්ථය බලනු.

විචිකිච්ඡා - ධර්මස්වභාවය විමසමින් තීරණයකට බැස ගත නොහැකි බව. බුද්ධාදි අට තන්හි විමතිය යි. උපග්‍රන්ථය බලනු. ශීලව්‍රතපරාමර්ශ = ශීලයෙන් ව්‍රතයෙන් ශුද්ධිය වේවා යි විපරීතග්‍රාහය.

470. කාමාස්‍රව=පංචකාමගුණිතරාගය. භවාස්‍රව = භවරාගය. අවිද්‍යාස්‍රව = සිවුසස් නොදැනීම. ආස්‍රව නම් දික් කලක් සිත්සතන්හි පල් වෙමින් පවත්නා හෝ ඇස් ආදි ද්වාර මඟින් රූපාදි අරමුණු කරා ගලා යන, බිම් විසින් භවාග්‍ර අවසන තෙක් ද, දහම් විසින් ගෝත්‍රභූ සිත තෙක් ද ගලනා පවත්නා කෙලෙස් ය.

22. **ඒසනා තුන** : කාමේසනා, භවේසනා, බ්‍රහ්මචරියෙසනා[471]

23. **තුන් විධාවෝ** (මානයෝ) : ශ්‍රෙෂ්ඨයෙමි යි මානය, සදෘශයෙමි යි මානය, හීනයෙමි යි මානය[472]

24. **අධ්ව (කාල) තුන** : අතීත, වර්තමාන, අනාගත.

25. **අන්ත (කොටස්) තුන** : සත්කාය ය, සත්කායසමුදය ය, සත්කායනිරෝධ ය.[473]

26. **වේදනා තුන** : සුඛවේදනා, දුඃඛවේදනා, උපේක්ෂාවේදනා.

27. **දුක්ඛව තුන** : දුඃඛදුඃඛතාව, සංස්කාරදුඃඛතාව, විපරිණාමදුඃඛතාව.[474]

28. **තුන් රාශි** : මිථ්‍යාත්වනියත රාශිය, සම්‍යක්ත්වනියත රාශිය, අනියත රාශි ය.[475]

---

471. කාමේසනා = කාමවස්තූන් පැතීම් සෙවීම් පරිභෝග කිරීම් වශයෙන් පැවැති රාගයත් ද එය හා එක් වැ උපන් අකුශල කායවාඞ්මනඃ කර්මත්.

භවේසනා = භවය පැතුම, භවච්ඡන්දය, භවරාගයත් ඒ ය හා එක්ව උපන් අකුශල කායික වාචසික මානසික කර්මත් = බ්‍රහ්මචරියෙසනා ලොවත් ආත්මයත් ශාශ්වතය යනා ආදීන් විපරීත ග්‍රාහයත් එය හා එක් ව උපන් අකුශල කායවාඞ්මනඃකර්මත් ය. මෙහි බ්‍රහ්මචරිය යනු තීර්ථකයන් ගේ තප උපක්‍රමයෝ ය. එය බලා පහළ වූයේ බ්‍රහ්මචරියෙසනා නම් වේ.

472. විධා=හීනාදිවශයෙන් විවිධාකාරයෙන් දහනය (සලකා බැලීම.)
473. සත්කාය=පංච උපාදන ස්කන්ධය. සත්කාය සමුදය=උපාදනස්කන්ධය ඇති කරන පූර්ව භවයෙහි තෘෂ්ණාව. සත්කායනිරෝධය=උපාදනස්කන්ධත් තෘෂ්ණාවත් යන දෙදෙනාගේ අප්‍රවෘත්තිය වූ නිවන. නිරෝධාධිගමයට උපාය බැවින් මාර්ගයත් මෙයින් ම ගැනේ 474 දුඃඛදුඃඛතා=දුක් වේදනාව. සංස්කාර දුඃඛතා=උපේක්ෂාවේදනාව. විපරිණාමදුඃඛතා=සුඛවේදනාව. සැප-යේ පෙරළීමෙන් දුක ඇති වේ. එබැවින් සැපය මෙ නමින් කියන ලදී.
475. මිථ්‍යාත්වනියත රාශිය=මිථ්‍යා (විපරීත) සවභාවය ඇති, මරණයට අනතුරු අත්බවෙහි ම විපාක දීමෙහි ඒකාන්ත වූ ධර්ම රැසඃ නියත මිථ්‍යා දෘෂ්ටියත් ආනන්තර්ය කර්ම පසත් ය. මෙහි මොවුන් ගේ සත්වන ජවන චේතනා ම අභිප්‍රේත යි සම්‍යක්ත්වනියතරාශිය= සත්‍ය (අවිපරීත) සවභාවය ඇති, තමන් ගේ නිරුද්ධ වීමට අනතුරු ඒකාන්තයෙන් සිය ඵලය දීමෙහි සමර්ථ ධර්ම රැසඃ ආර්ය මාර්ග සිත් සතර යි. අනියත රාශිය = ඒකාන්ත නො වූ ධර්ම රැසඃ නියතමිථ්‍යාදෘෂ්ටි කර්මවශයෙන් පැවැති දෘෂ්ටිසම්ප්‍රයුක්ත සිත් සතරේ සත්වන ජවන ද, ආනන්තර්ය කර්ම මිසින් පැවැති ද්වෙෂමූලක-දෙ සිතේ සත්වන ජවන ද යන සප්තම ජවන සදෙනා හැර, සතර මාර්ග සිත් ද හැර, ඉතිරි සියලු කුශලාකුශල, විපාක, ක්‍රියා, දෙපනස් චෛතසික, අටවිසි රූප, නිර්වාණ යන මොහු යි.

29. **සැක තුන :** අතීතය අරභයා සැකය, වර්තමානය අරභයා සැකය, අනාගතය අරභයා සැකය.[476]

30. **තථාගතයන් ගේ නො රැක්ක යුතු නො සඟොවාලිය යුතු තුන් තැන් :** තථාගතයන් වහන්සේ ගේ කාය සමාචාරය, වාක්සමාචාරය, මනසසමාචාරය.[477]

31. **කිංචන (පරිබෝධ) තුන :** රාග, ද්වේෂ, මෝහ.[478]

32. **තුන් ගිනි :** රාග, ද්වේෂ, මෝහ.[479]

33. **අන් ගිනි තුනෙක් :** ආහුනේය ගින්න, ගෘහපති ගින්න, දක්ෂිණාගී ගින්න.[480]

---

476. සැක තුන = සොළොස් සැකය කාල වශයෙන් තුනකට බෙදේ. උපග්‍රන්ථය බලනු. 477. තථාගතයන්වහන්සේගේ කායාදි තුන් දෙරූ වෙන ම රැක්මෙක් නො වුවමනා ය. සියල්ල නිතොර ව එළැඹි සිව් සිහියෙන් රැකුණේ ම ය. රහතුන් ගේ ද තුන් දෙර පිරිසිදු ය අල්පශ්‍රැත රහත් තෙනම් ද කිසිදු ලෝකවද්‍ය වරදකට නො පැමිණේ එහෙත් විනය ප්‍රඥප්තියෙහි දැනුම් අඩු බැවින් විහාරකාර, කුටිකාර සහකාර, සහශයන ;යන කායද්වාරික ආපත්තීනටත්, සංචරිත්ත, පදසොධම්ම, උත්තරිංඡප්පංචවාචා, භූතාරොචන යන වාග්වාරික ඇවැත් වලටත් පැමිණිය හැකි ය. ලුහු තුබු රන්රිදි ඉවැසීම් වශයෙන් රූපියපටිග්ගහණ ඇවැතට ද පැමිණිය හැකි ය. 478 කිඤ්චනා = පරි බෝධ රාගාදීහු සිතැ උපදනාහු සත්ත්වයන් සසරින් ගොඩ යෑ නොදී බඳිත් එහෙයින් ඔහු කිංචන නම් වෙති. 479 ගිනි = රාගාදි තුන් දෙන සිත් සතන්හි පහළ වන්නාහු සන්තාපය දමති. රාගය බලවත් වැ එයින් දැවි මළාහු නිදසුන් වෙති. මනෝපදෝසික දෙවියෝ ද්වේෂය බලවත් වීමෙන් දැවී මැරෙති. සිඟිමුළායෙන් කාමරතියෙහි අධික වැ ඇලී බොජුන් ගන්නා වේලාව ද ඉක්මැ මියෙන ඛිඩ්ඩාපදෝසික දෙවියෝ මෝහාග්නියෙන් වන දැවීමට නිදසුන්හ 480. ආහුනේය ගින්න = ආහුන යනු සත්කාරය යි. එය දරුවන්ගෙන් ලබන්නට සුදුස්සෝ, ආහුනේයයෝ මාපියෝ ය. ඔවුන් කෙරේ වරදවා පිළිපදනා දරුවනට දරුණු දුක් විපාක ලැබේ. එයට ප්‍රත්‍යය වන හෙයින් මා පියෝ ගිනි බඳු ය. එහෙයින් ආහුනෙය්‍යාග්නි නම් වෙත්. ගෘහපති ගින්න = ගෙහිමියා බිරියට අයත් වස්ත්‍රාදි සියල්ල සපයයි. එවැන්නහුට නොකීකරු ව පරපුරුෂයන් සෙවුනා බිරිය නිරයගාමිනී වේ. මෙසේ ගෙහිමි තෙම බිරියට ගින්නක් බඳු ය. දක්ෂිණාහී ගින්න = දක්ෂිණා යනු සිවුපසය යි. එය ලබන්නට සුදුසු භික්ෂුසංඝයා දක්ෂිණාහී නම්. ඔහු ගුණදහම් රැකුම් ආදියෙන් ගිහියනට මහොපකාරී හ. ඔවුනට වරදවා ක්‍රියා කරන ගිහියා නිරයාදියෙහි දුකට ගොදුරු වේ. එ බැවින් ඉහත කී මාපියන් සේ ම ගිහියනට ගින්නක් බඳු වෙති.

34. **තුන් කොටසෙකින් රූපයන් සංග්‍රහ කිරීම**: සනිදර්ශන සප්‍රතිඝ රූප, අනිදර්ශන සප්‍රතිඝ රූප, අනිදර්ශන අප්‍රතිඝ රූප[475]

35. **සංස්කාර තුන** : පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර, ආනෙඤ්ජාභිසංඛාර[476]

36. **තුන් පුද්ගලයෝ** : සේඛ, අසේඛ, නේවසේඛ නාසේඛ[477]

37. **තුන් තෙරහු** : ජාතිස්ථවිර, ධර්මස්ථවිර, සම්මතිස්ථවිර[478].

38. **තුන් පින්කිරියවත්** : දානමය පුණ්‍යක්‍රියාවස්තුව, ශීලමය පුණ්‍යක්‍රියාවස්තුව, භාවනාමය පුණ්‍යක්‍රියාවස්තුව.[479]

---

475 සනිදර්ශන යනු දක්නා යුතු බව සහිත යන අරුත්හි වේ. දඨ්ඨබ්බභාව සංඛාතෙන සහ නිදස්සනෙන සො වත්තතෙ සො සනිදස්සනො (අඨසාලිනී). සප්‍රතිඝ යනු හැපෙන බව ගැටෙන බව ඇති යන අරුත්හි වේ. එවිට සනිදර්ශන සප්‍රතිඝ රූප යනු චක්ෂුර්විඥානයට ගොදුරු වන, චක්ෂුසට හැපෙන ගැටෙන හමු වන රූපය යි. එනම් රූපායතනය හෙවත් රූපාලම්බනය යි. අනිදර්ශන සප්‍රතිඝ රූප යනු නොදක්නා ලබන එහෙත් ඉන්ද්‍රියයන් හා ගැටෙන රූප යි. එනම් රූපාලම්බනය හැර ඉතිරි එකොළොස් ඖදාරික රූප ය හෙවත් චක්ඛායතනාදි නව ආයතන යි. අනිදර්ශන අප්‍රතිඝ රූප යනු නො දක්නා ලබන ගැටුම් ද නැති රූප යි එනම් ධර්ම ආයතන දශය හැර ඉතිරි සියලු සුඛුම රූපයෝ යි.

476. පුඤ්ඤාභිසංඛාර යනු කාමාවචර රූපාවචර කුශල චේතනා යි. අපුඤ්ඤාභිසංඛාර යනු දොළොස් අකුශල චේතනා යි. ආනෙඤ්ජාභිසංඛාර යනු ඉංජන (සැලුම්) රහිත ශාන්ත විපාක වූ සතර අරූපාවචර කුශලචේතනා යි.

477. සෙඛ (ශෛක්‍ෂ) යනු ආධිශීල ආධිසමාධි ආධිප්‍රඥ යන තුන් සිකෙහි හික්මෙනුවෝ ය. ඔහු නම් අර්හත්ත්ව මාර්ගස්ථයා ඇතුළු සෝවාන් ආදි සත් අරී පුහුලෝ ය. අසෙඛ (අශෛක්‍ෂ) යනු හික්මීම ඉක්මි හෙයින් නැවැත හික්මීමක් අනාවශ්‍ය රහත්පල ලත් පුහුලා ය නෙවසේඛ නාසේඛ යනු සේඛ අසේඛ දෙ කොටසට ම අයත් නො වන පෘථග්ජනයා යි.

478. ස්ථවිර (ථෙර) යනු මහල්ලා ය. ජාතිස්ථවිර යනු උපතින් මහල්ලා යි. එනම් මහළු ගිහියා යි. ධර්මස්ථවිර යනු සිල්වත් බව, බහුශ්‍රැත බව, ධ්‍යානලාභි බව, ආර්යමාර්ග ඵල ලත් බව යන ස්ථවිර කාරණීය ධර්ම සතරෙන් එකක් හෝ වැඩියක් ඇත්තේ යි. සම්මතිස්ථවිර යනු උපසම්පදයෙන් දසවස් පිරුණු පසු ස්ථවිර යන සම්මතිය ලත් භික්ෂු නම ය මහළු කාලැ පැවිදි වූයේ ද ස්ථවිර යන නාම මාත්‍රයෙන් හැඳින්වෙයි මොහු සම්මතිස්ථවිර නම්හ.

479 පින්කිරිය ම ඒ ඒ අනුසසට වස්තු වූ හෙයින් පුණ්‍යක්‍රියා වස්තු නම් වේ දානය ම දානමය පුණ්‍යක්‍රියාවස්තු නම් දස පින්කිරිය වත්හු ම මේ තුනෙහි ඇතුළත් වෙති. මෙසේ යඃ දාන පත්ති පත්තානුමෝදනා යන තුන දානමය පුණ්‍යක්‍රියාවස්තු ය. ශීල අපචිති වෙය්‍යාවච්ච යන තුන ශීලමය පුණ්‍යක්‍රියා වස්තු ය. දේශනා ශ්‍රවණ භාවනා යන තුන භාවනාමය පුණ්‍යක්‍රියා වස්තුයෙහි ඇතුළත් වේ. දිට්ඨිජ්ජුකම්මය තුන් පින්කිරියවත්හි ම ඇතුළත් වේ

39. **චෝදනා වත්ථු තුන :** දැකීමෙන් චෝදනාව, ඇසීමෙන් චෝදනාව, සැකයෙන් චෝදනාව.[480]

40. **කාමෝපපත්ති තුන :** එළැඹි සිටි (නිබඳ) කාමවස්තූන් සෙවීම, තමන් කැමැති පරිදි නිර්මිත කොට කාමවස්තූන් සෙවීම, අනුන් විසින් නිර්මිත කාමවස්තූන් සෙවීම.[481]

41. **සුඛෝපපත්ති** (සැප විඳුම්) **තුන :** බ්‍රහ්මකායික දෙවියන් සේ උපදව උපදවා සුව විඳුම,[482] දහන් සුවෙන් පැහිර ගෙන ආභස්සර බඹුන් සේ දෙවෙනි දහන් සුව විඳීම, සුභකිණ්හක බඹුන් සේ තෘතීයධ්‍යානය නිසා තමින් ලත් ප්‍රණීත චිත්ත සුඛයෙන් තෘප්ත ව එය විඳීම.

42. **ප්‍රඥා තුන :** සේඛ පඤ්ඤා, අසේඛ පඤ්ඤා, නෙවසේඛනාසේඛ-පඤ්ඤා.[483]

---

480 චෝදනා වස්තු යනු චෝදනා කාරණයෝ ය. මසැසින් හෝ දිවැසින් දුටු දොසක් කාරණ කොට ගෙන කෙනෙක් චෝදනා කෙරෙති. කෙනෙක් පියෙවි කනින් හෝ දිවකනින් ඇසූ කරුණක් උඩ චෝදනා කෙරෙති. කෙනෙක් ඇති වූ සැකයක් උඩ චෝදනා කෙරෙති. මෙහි විස්තර පාලි මුත්තකවිනයවිනිච්ඡයයෙහි චෝදනාදි විනිච්ඡය කථායෙහි දක්වා ඇත.

481. මිනිස්සු උට්ඨානඵලූපජීවී ද කම්මඵලූපජීවී ද වෙත්. එ බැවින් ඒ දෙ සැටියෙන් ම තමනට එළැඹැ සිටි කාමවස්තූන් භාර්‍ය්‍යා ආදි වශයෙන් නිබද්ධ පරිභෝගයෙන් සේවන කෙරෙත්. මිනිස්සු ද චාතුර්මහාරාජිකා තාවතිංස යාම තුසිත යන සතර දෙව්ලෝහි දෙවියෝ ද, නිරිසතුන් හැර සෙසු තිරිසන් ආදි ආපායිකයෝ ද තමනට වෙන් වශයෙන් තෝරා ගත් භාර්‍ය්‍යාවන් සේවනය කරති. ඔවුන් ගේ කාමවස්තු සේවනය එළැඹැසිටි නිබඳ කාමවස්තු සෙවීම නම්. නිම්මාණරති දෙව්ලොවැ දෙවියෝ තමන් කැමැති පරිදි නිර්මිත කොට ගෙන කාමවස්තූන් සෙවිති. පරනිර්මිත වශවර්ති දෙව්ලොවැ දෙවියෝ තමන් සිත් දැන තමන් සේවකා වූ අන් දෙවියන් විසින් මැවූ කාමවස්තූන් පරිභෝග කෙරෙති, මෙවුන් දම් සෙවිති. සිනාසීම් මාත්‍රයෙන් බැලූ පමණින් වැලැඳගැනුම්පමණින් දෙවියන් ගේ කාමකෘත්‍යය සිදු වේ යැ යි ඇතැම් ඇදුරෝ කියත්. එහෙත් ඒ එසේ නො වේ යැ යි ඒ කාමාවචර දෙවියෝ මිනිසුන් සේ ම මෙවුන්දම් සෙවිති යි අටුවාහි කියන ලදි.

482. යට දෙව්ලෝහි හෝ මිනිස් ලොවැ ප්‍රථමධ්‍යාන කුශලය උපදවා මත්තෙහි විපාකධ්‍යාන සැපය විඳිත්. බ්‍රහ්මකායික හෝ බ්‍රහ්මපුරෝහිත තලයෙහි දී කුශලධ්‍යානය උපදවා බ්‍රහ්ම පුරෝහිතයෙහි හෝ මහාබ්‍රහ්ම තලයෙහි දී විපාක සැප විඳිත්

483. ශෛක්ෂප්‍රඥා = ශ්‍රෝතආපත්තිමාර්ගස්ථාදි සත් ආර්‍ය්‍යයන් ගේ ප්‍රඥාව. අශෛක්ෂප්‍රඥා = අර්හත්ඵලස්ථයා ගේ ප්‍රඥාව. නෛවශෛක්ෂනාශෛක්ෂ ප්‍රඥා = පෘථග්ජන ප්‍රඥාව.

43. **ප්‍රඥා** තුන (අන් සැටියෙකින්) : චින්තාමය ප්‍රඥා, ශ්‍රැතමය ප්‍රඥා, භාවනාමය ප්‍රඥා.[484]

44. **අවි තුන** : ශ්‍රැතායුධ, ප්‍රවිවේකායුධ, ප්‍රඥායුධ.[485]

45. **ඉන්ද්‍රිය** තුන : අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවින්ද්‍රිය.[486]

46. **ඇස්** තුන : මසැස, දිවැස, පැණැස.[487]

---

484. චින්තාමය ප්‍රඥා = අනුන් ගෙන් නොඅසා තමා ම සිත සිතා බැලීමෙන් ලබන කම්සකතාඥාන සත්‍යානුලෝමික ඥාන. මෙයින් කම්සකතාඥානය සියලු බෝසත්නට ඇති වේ. සත්‍යානුලෝම ඥානය අන්තිමභවික වූ ප්‍රත්‍යෙකබෝධිසත්ත්ව මහාබෝධිසත්ත්ව දෙදෙනාට ම ඇති වේ. සෙසු ඥාන පැරුම් පිරූ සියලු මහ පිනැතියනට ඇති වේ.

ශ්‍රැතමය ප්‍රඥා = අනුන් කරනු දැක හෝ අසා ඉගෙන ලත් සියලු නුවණ.

භාවනාමය ප්‍රඥා = සමවත් සමවත්හු ගේ නුවණ, විශේෂයෙන් විදර්ශනාප්‍රඥා මාගිප්‍රඥා දෙක.

485. ශ්‍රැතායුධය = ශ්‍රැත නම් ත්‍රිපිටක බුඩවචනය යි. එය නිසා මහණ නෙම් යුඩයෙහි ශූර යෝධයකු සේ සසර කතර ඉක්මෙ යි.

ප්‍රවිවේකායුධය = කායවිවේක චිත්තවිවේක උපධිවිවේක යැ යි විවේකය ත්‍රිවිධ යි මේ තුන් විවේකයෙහි ඇලුණේ කිසිවෙකිනුත් නිත නො වේ. එබැවින් ආයුධ බඳු ය. කායවිවේක නම්: ගණසංගණිකාව හැර ඒකී ව ප්‍රථම්ධ්‍යානාදි නෛෂ්ක්‍රාම්‍යයෙහි ඇලී විසීමයි. චිත්තවිවේක නම් ධ්‍යාන විමෝක්ෂාදීන් ගේ වශයෙන් සිත ක්ලේශසංගණිකායෙන් වෙන් කොට ගැනීමයි. උපධිවිවේක නම් නිවනයි.

486 මෙයින් පෙර නොදත් (අනඤ්ඤාත) නිවන් දහම නොහොත් සිවුසස් දහම දැනගනිමි යි සිතා පිළිපන්නාහට උපන් පඨම මග්ගසම්මාදිට්ඨිය (සොතාපත්තිමග්ගඤාණය) අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය නම්. සෝවාන් මගින් දත් සීමාව නොඉක්මැ ඒ සිවුසස් දහම් ම දන්නා නුවණ නොහොත් සෝවාන් පල නුවණ පටන් කොට රහත්මග නුවණ අවසන් කොට ඇති මඟපල නුවණ සය අඤ්ඤින්ද්‍රිය නම්. දැනුම් කිස කොළවරැ උපන් නුවණ නොහොත් රහත්පල නුවණ අඤ්ඤාතාවීන්ද්‍රිය නම්.

487. චක්ෂුඃප්‍රසාදය මසැස නම්. කසිණාලෝකය වඩා ලත් රූප දක්නා සමත් නුවණැස දිවැස නම්. සෙසු සියලු ලොවී නුවණ ද සියලු ලොවුතුරා නුවණ ද පැණැස නම්.

47. **ශික්‍ෂා තුන** : අධිශීලශික්‍ෂා, අධිචිත්තශික්‍ෂා, අධිප්‍රඥා-ශික්‍ෂා.[488]

48. **භාවනා තුන** : කායභාවනා, චිත්තභාවනා, ප්‍රඥාභාවනා.[489]

49. **අනුත්තරිය ධර්‍ම** තුන: දස්සනානුත්තරිය, පටිපදානුත්තරිය, විමුත්තානුත්තරිය.[490]

50. **සමාධි** තුන : සවිතර්‍ක සවිචාර සමාධි (ප්‍රථමධ්‍යාන සමාධිය), අවිතර්‍ක සවිචාර සමාධි (විතීය ධ්‍යාන සමාධිය), අවිතර්‍ක අවිචාර සමාධි (තෘතීය චතුර්‍ථ පංචම ධ්‍යානසමාධි).

51. **සමාධි** තුන : (අන් පරිද්දෙකින්) ශූන්‍යතාසමාධි, අනිමිත්ත සමාධි, අප්‍රණිහිතසමාධි.[491]

---

488. අධිශීලාදිය ම ශික්‍ෂිතව්‍ය වූයේ ශික්‍ෂා නමි. පංචශීල දශශීල සාමාන්‍ය ශීල නම්හ. ඊවුනට පාතිමොක්ඛ සීලය අධිශීල යි. නිවන් පතා සමාදන් ව ගත් පන්සිල් දසසිල් වුව ද අධිශීල නමි. සෙස්සන් ගේ සිල් හුදු ශීල-මාත්‍රයෝ ය. අට සමවත්හු චිත්ත නමු. විදර්‍ශනාපාදකධ්‍යානය අධිචිත්ත නමි. නිවන්පතන්නහු සමවදනා අට සමවත් ද අධිචිත්ත නමි කම්මස්සකතා ඥාණය ප්‍රඥා නමි. විවසුන් නුවණ අධිප්‍රඥා නමි. නිවන් පතන්නහු ගේ ද කම්මස්සකතාඥාණය අධිප්‍රඥා නමි. සියලු ලොවී සිල් ශීල නමි ලෝකෝත්තර ශීලය අධිශීල නමි. සියලු ලෞකික සමාධි හෝ චිත්ත නමි. ලෝකෝත්තර සමාධි අධිචිත්ත නමි. ලෞකික ප්‍රඥාව හෝ ප්‍රඥා නමි. ලෝකෝත්තර ප්‍රඥාව අධිප්‍රඥා නමි.

489. කායභාවනා රහත්හුගේ පංචද්වාරික කය කාය භාවනා නමි. පංචද්වාරික කය යනු ස්පර්‍ශාදි නාම ධර්‍ම සමූහය යි. රහත්මඟින් සියලු කෙලෙස් බිඳැලූ බැවින් එතැන් පටන් රහත්හු ගේ නාමධර්‍මසමූහය භාවිත ම ය. මෙහි භාවනා යනු භාවිත යන අරුත්හි වෙයි. චිත්තභාවනා යනු රහත්හු ගේ අට සමවත් ය. ඔබ අට සමවත් සෙස්සන් ගේ සෙයින් දුබල නො වේ. ප්‍රඥාභාවනා යනු රහත්පල නුවණ ය.

490 තමහට වඩා උතුම් දැයක් නැත්තේ අනුත්තරිය නමි. හැමගෙන් උතුම් ම දැ යි. එහි දස්සනානුත්තරිය යනු උතුම් ම දැක්ම යි. එනම් විදර්‍ශනා යි. පටිපදනුත්තරිය හෙවත් උතුම් ම පිළිපැදුම නම් ආර්‍ය්‍යමාර්‍ගය ය. විමුත්තානුත්තරිය හෙවත් උතුම් ම විමුක්තිය යනු නිවන යි. තවද දැක්ක යුතු එයට වැඩි තරම් දැයක් නැති බැවින් නිවන දස්සනානුත්තරිය නමුදු වේ. රහත්පලය විමුත්තානුත්තරිය නම් වේ.

491 ශූන්‍යතාසමාධි නම් සංස්කාර අනාත්ම වශයෙන් ගෙන විවසුන් වඩා ලත් මාර්‍ගඵලසමාධි යි. අනිමිත්තසමාධි යනු සංස්කාර අනිත්‍ය විසින් විදර්‍ශනා කොට ලත් මාර්‍ගඵල සමාධි යි. අප්‍රණිහිත සමාධි නම් සංස්කාරයන් දුක් වශයෙන් විවසුන් කොට ලත් මාර්‍ගඵලසමාධි යි.

52. **සෝචෙය්‍ය** (ශෞචෙය) තුන: කායසෝචෙය්‍ය, වචීසෝචෙය්‍ය, මනෝසෝචෙය්‍ය.[492]

53. **මොනෙය්‍ය** (මුනි බව සිදු කරන ධර්‍ම) තුන: කායමොනෙය්‍ය, වචීමොනෙය්‍ය, මනෝමොනෙය්‍ය[493]

54. **කොසල්ල** (දක්ෂ බව) තුන : ආයකෞශල්‍යය, අපායකෞශල්‍යය, උපායකෞශල්‍යය.[494]

55. මද තුන : ආරෝග්‍ය මද, යෞවන මද, ජීවිත මද.[495]

56. **ආධිපතෙය්‍ය** තුන : ආත්මාධිපත්‍යය, ලෝකාධිපත්‍යය, ධර්මාධිපත්‍යය.[496]

---

492 කායසොචෙය්‍ය යනු කාය සුචරිත ය. වචීසොචෙය්‍ය යනු වාක් සුචරිත ය, මනොසොචෙය්‍ය යනු මනස් සුචරිත ය. සොචෙය්‍යනු ශුචි බව, පිරිසිදු බව යි.

493. කායින් නො කටයුතු නො කිරීම, කටයුතු දෑය කිරීම, 'අත්ථි ඉමස්මිං කායෙ' යනාදීන් දක්වුණු පරිදි කායාලම්බනය දක්‍ෂ ගැන්ම, කයෑ හට ගැනුම් වසින් නැසීයෑම් වසින් ආස්වාද වසින් ආදීනව වසින් නිඃසරණ වසින් ඇති සැටි ලෙසින් කය පිරිසිඳ දැනීම, එසේ පිරිසිඳීම් වසින් පැවැති විවසුන් මග, එයින් කායෙහි ඡන්‍දරාගය දුරු ලීම, කායසංස්කාරය නිරුද්ධ කොට පැමිණියැ යුතු චතුර්ථධ්‍යාන සමවත යන මේ හැම කායචාරයෙන් පැවැති මෝනෙය්‍ය ධර්ම බැවින් කාය මෝනෙය්‍ය නම්. වචීමෝනෙය්‍ය = සතර වාග්දුශ්චරිත දුරු ලීම, සතර වැදෑරුම් වාක්සුචරිතය, චෝපන වචන ශබ්ද වචන යැ යි ත්‍රිවිධ වචනය ඇරබැ පැවැති ප්‍රඥව, ඒ වචනයාගේ හටගැනුම් ආදිය පිරිසිඳීමින් පැවැති විවසුන් මග, වචනයෙහි ඡන්‍දරාග ප්‍රහාණය, වාක් සැස්කාර නිරෝධය වූ ද්විතීයධ්‍යාන සමාපත්ති යන මෙ සියල්ල වචීමෝනෙය්‍ය නම්. මනෝමෝනෙය්‍ය = ත්‍රිවිධ මනෝදුශ්චරිතප්‍රහාණය, ත්‍රිවිධ මනස්සුචරිතය, එක්අසූවැදෑරුම් ලෞකික සිත් අරමුණු කොටැති ඥානය, ඒ චිත්තයන්ගේ හට ගැනුම් ආදිය පිරිසිඳ බලමින් විවසුන් වැඩීම, සිතෙහි ඡන්‍දරාග ප්‍රහාණය, චිත්තසංස්කාර නිරෝධයෙන් සංඥාවේදයිත-නිරෝධසමාපත්තිය යන මේ සියල්ල මනෝමෝනෙය්‍ය නම්.

494. ආයකෞශල්‍ය = ආය නම් වැඩීම යි නූපන් කුසල් ඉපදීමත් උපන් කුසල් වැඩීමත් මෙ නම් දහම් මෙනෙහි කිරීමෙනැ යි දන්නා සම්‍යග්දෘෂ්ටිය ආයකෞශල්‍ය නම්. නූපන් අකුසල් ඉපදීමත් උපන් අකුසල් වැඩීමත් නූපන් කුසල් නොඉපදීමත් උපන් කුසල් නිරුද්ධ වීමත් මෙ නම් ද මෙනෙහි කිරීමෙන් වේ යැ යි දන්නා සම්‍යග්දෘෂ්ටිය අපායකෞශල්‍ය නම්. ස්ථානෝච්තප්‍රඥව උපායකෞශල්‍ය නම්

495. මද=තමාගේ නිරෝග බව් ආදිය සලකා මත් වන අයුරින් පවත්නා මානය

496. ආත්මාධිපත්‍යය = මෙ නම් ද තමාට නො හොබී යැ යි තමා ගරු තන්හි ලා සලකා පව් නො කිරීම. මේ පවට ලජ්ජාවශයෙන් එයින් වැළැක්ම යි. ලෝකාධිපත්‍යය = ලෝකය ගරු තන්හි සලකා පව් නො කිරීම යි. ධර්මාධිපත්‍යය = ධර්මය ගරු තන්හි ලා සලකා පවින් වැළැක්ම යි. මේ ලජ්ජා වශයෙනි

57. **කථාවස්තු** (කථා කාරණ) තුන : අතීතයෙහි වූයෙක්, අනාගතයෙහි වන්නෙක්, දැන් ඇති දෑයෙක්.

58. **විද්‍යා** (දැනගැනුම්) තුන : පූර්වනිවාසානුස්මෘති (පෙර ජාති සිහි කරන නුවණ), ච්‍යුතිඋපපත්ති දන්නා නුවණ (දිවැස), ආස්‍රවක්‍ෂයකරඥානය (කෙලෙස් නසන මාර්ගඥානය.)

59. **විහාර** (වුසුම්) තුන : දිව්‍යවිහාරය (අෂ්ටසමාපත්ති), බ්‍රහ්ම-විහාරය (සතර අප්‍රමාණ්‍ය ධර්ම), ආර්‍ය්‍ය විහාරය (ඵලසමාපත්ති.)

60. **ප්‍රාතිහාර්‍ය්‍ය** තුන : ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය, ආදේශනප්‍රාතිහාර්‍ය්‍ය, අනුශාසනප්‍රාතිහාර්‍ය්‍ය.[497]

IV

භාග්‍යවතුන් වහන්සේ වදාළ ධර්ම චතුෂ්ක:

1. **සතිපට්ඨාන** සතර : කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා.

2. **සම්‍යක් ප්‍රධාන** සතර : නො උපන් අකුසල් නො ඉපැද්දවීමට වෑයම, උපන් අකුසල් නැසීමට වෑයම, නූපන් කුසල් උපදවන්නට වෑයම, උපන් කුසල් වැඩීමට වෑයම.

3. **ඍද්ධිපාද** සතර : ඡන්දර්ද්ධිපාද, චිත්තර්ද්ධිපාද, වීර්‍ය්‍යර්ද්ධිපාද, මීමාංශර්ද්ධිපාද[498]

4. **ධ්‍යාන** සතර : සවිතර්ක සවිචාර (ප්‍රථම) ධ්‍යාන ය, අවිතර්ක අවිචාර (ද්විතීය) ධ්‍යානය, ප්‍රීතිරහිත සුඛ ඒකාග්‍රතා සහිත (චතුර්ථ) ධ්‍යානය.

---

497. යට තෙවිජ්ජසූත්‍රය බලනු.

498 ඍද්ධිපාද : බුදුසස්නෑ යෝගභාවනායෙන් සිද්ධි ලබන (වැඩෙන) සියල්ලන්ගේ මහද්ගත ලෝකෝත්තර ධර්ම ඍද්ධි නම්. ඒ ඒ යෝගකර්මියාගේ සිද්ධිය, සමෘද්ධිය, නිෂ්පත්තිය හෝ ඍද්ධි නම් එ නම් අභිඥෙය ධර්මයන්ගේ අභිඥාසිද්ධිය, පරිඥෙය ධර්මයන්ගේ පරිඥාසිද්ධිය, ප්‍රහාතව්‍යයන්ගේ ප්‍රහාණසිද්ධිය, සාක්‍ෂාත්කාතව්‍යයන්ගේ සාක්‍ෂාත්කරණ සිද්ධිය භාවිතව්‍යයන්ගේ භාවනාසිද්ධි යෑ යි පංචවිධ යෑ. මෙ කී ඍද්ධීන් ලැබීමට බලවත් උපාය, ප්‍රධාන කාරණය ඍද්ධිපාද නම්. අධිපති ධර්මයන් ගේ විසින් ඒ චතුර්විධ යි. මහද්ගත ලෝකෝත්තර යන උත්තරිමනුෂ්‍ය ධර්ම සාමාන්‍ය (ප්‍රකෘති) ඡන්ද චිත්ත ප්‍රඥා වීර්‍ය්‍යයෙන් ලද නො හැකි යි. කිසි ම පරිබෝධයෙකින් නො වැළැක්විය හැකි, අධිපති බවට පත් ඡන්ද චිත්තාදියෙන් මැ ලැබිය යුතු ය. ප්‍රථමධ්‍යානයට පරිකර්මය ඍද්ධිපාද නම්. ඉන් ලත් ප්‍රථමධ්‍යානය ඍද්ධි නම්. එය ද ද්විතීය ධ්‍යානයට ඍද්ධිපාද වේ. ද්විතීය ධ්‍යානය ඍද්ධි නම් වේ. ශ්‍රොතආපත්තිමාර්ගය ඍද්ධි පාද නම් වේ. සකෘදාගාමි මාර්ගය ඍද්ධි නම් වේ. සෙස්ස ද මෙ නයින් ම දතයුතු. ඒ ඒ පාදකධ්‍යානය ඍද්ධිපාද නම්. ඉන් නැගිට ලත් මාර්ගය ඍද්ධි නම්.

5. **සමාධි භාවනා** සතර: මේ අත් බැවෙහි ම සැප විහරණය පිණිස පවත්නා සමාධි භාවනාව (රහත්හුගේ ඵල සමාපත්ති හා ධ්‍යාන), දර්ශනඥානය පිණිස පවත්නා සමාධි භාවනාව (මිඩය දුරු ලන එළිය හෝ පරිකර්මාලෝකය වැඩීම), සිහි නුවණ පිණිස පවත්නා සමාධි භාවනාව, ආස්‍රවක්‍ෂයඥානයට පාදක වූ සමාධිභාවනාව.

6. **අප්‍රමාණ්‍ය** සතර: මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්‍ෂා.

7. **ආරූප්‍ය** සතර: ආකාශානන්තායතන, විඥානානන්තායතන, ආකිංචන්‍යායතන, නෛවසංඥා නාසංඥායතන යන සමාපත්ති සතර.

8. **අපශ්‍රයණ** (අපස්සෙන)[499] සතර: පස්විකා සිවු පසය පරිභෝග කිරීම, නුවණින් සලකා බලා ශීතෝෂ්ණාදිය ඉවසීම, නුවණින් දැන ඉවත්වියැ යුත්තෙන් ඉවත්වීම, නුවණින් දැන දුරු කට යුතු කාම විතර්කාදිය දුරු කිරීම.

9. **ආර්‍ය්‍ය වංශ** සතර[500]: ලත් සිවුරෙන් තෘප්ත වනු, ලත් බොජුනින් තෘප්ත වනු, ලත් සෙනස්නෙන් තෘප්ත වනු, භාවනායෙහි ඇලෙනු.

10. **ප්‍රධාන** (උතුම් වීර්‍ය) සතර: සංවරප්‍රධාන, ප්‍රහාණප්‍රධාන, භාවනාප්‍රධාන, අනුරක්‍ෂණප්‍රධාන.[501]

11. **ඥාන** සතර: ධර්මයෙහි ඥානය, අන්වයයෙහි නුවණ, පරිච්ඡේද-යෙහි නුවණ, සම්මුතියෙහි නුවණ.[502]

---

499. අපශ්‍රයණ (අපස්සෙන) ඇසුරු කළයුතු දෑ. යමක් ඇසුරු කොට තුන් ශික්‍ෂා පුරන්නට හැකි වේ නම් ඒ ධර්ම අපශ්‍රයණ නමි. ප්‍රත්‍යයයන් පස්විකා සෙවීම, අධිවාසන ක්‍ෂාන්තිය, වර්ජනීය ධර්ම වර්ජනය, විනොදයිතව්‍ය ධර්ම විනෝදනයැ යි ඒ චතුර්විධ යි.

500. බුදුපසේබුදුරහත්නු ආර්‍ය්‍ය නමිහ. වංශ යනු පරම්පරාවය, ප්‍රබන්ධ-ප්‍රවෘත්තිය ය. ආර්‍ය්‍ය වූ බුදුපසේබුදු රහතුන් ගේ ගුණාන්වයය ආර්‍ය්‍යවංශ නමි

501. ඇස් ඈ සංවර කැරගන්නහුට ඇති වූ වීර්‍ය්‍යය සංවරප්‍රධාන නමි. කාමවිතර්කාදිය බැහැර ලන්නහුට උපන් වීර්‍ය්‍යය ප්‍රහාණප්‍රධාන නමි. බෝධ්‍යංග වඩන්නහුට උපන් වීර්‍ය්‍යය භාවනාප්‍රධාන නමි. අට්ඨික-සඤ්ඤාදි විසින් ලත් සමාධිය රක්නහුට උපන් වීර්‍ය්‍යය අනුරක්‍ෂණප්‍රධාන නමි.

502. ධර්මයෙහි ඥාන නමි සතරමංහි ද සතර ඵලයෙහි ද නුවණයි. අන්වයයෙහි නුවණ යනු චතුස්සත්‍යයන් ප්‍රත්‍යක්‍ෂයෙන් දැන තමා අන්දුටුම් අනුව පෙරත් මෙසේ ම සිවුසස් අවබෝධ කළහයි, මතුත් මෙසේ ම සිවුසස් අවබෝධ කරති යි දක්නා අනුමානඥානය. පරිච්ඡේදයෙහි නුවණ යනු පරසිත් පිරිසිඳැ දන්නා නුවණයි සම්මුතියෙහි නුවණ යනු උඩ කී ඥාන තුනින් අවශේෂ වූ සියලු නුවණ යි.

12. තවත් **ඥාන** සතරෙක් : දුකෙහි නුවණ, දුක් හේතුවෙහි නුවණ, දුක්නිරොධෙහි නුවණ, දුක් නසන මඟෙහි නුවණ.

13. ශ්‍රෝතආපත්‍යඞ්ග[503] සතර : සත්පුරුෂ සේවනය, බණ ඇසීම, යෝනිසෝමනස්කාරය, ධර්මානුධර්මප්‍රතිපත්තිය.

14. **ශ්‍රෝතආපන්නාඞ්ග** සතර (සෝවාන් වූවහු ගේ ගුණාඞ්ග සතර) : බුදුරජුන් කෙරෙහි අචල පැහැදීම, ධර්මය කෙරෙහි අචල පැහැදීම, සඞ්ඝයා කෙරෙහි අචල පැහැදීම, ලෝකෝත්තර සමාධියට කාරණ වූ ආර්‍ය්‍යශීලයෙන් යුක්ත වීම.

15. **ශ්‍රාමණ්‍යඵල** සතර : ස්‍රෝතආපත්තිඵලය, සකෘදගාමි ඵලය, අනාගාමි ඵලය, අර්හත්ත්ව ඵලය.

16. **ධාතු** සතර : පෘථිවි, අප්, තේජස්, වායු.

17. **ආහාර** සතර[504] : කබලීකාරාහාරය, ස්පර්ශාහාරය, මනස්සඤ්චේතනාහාරය, විඥානාහාරය.

18. **විඥානස්ථිති**[505] සතර : රූපය (රූපස්කන්‍ධය) ඇසුරු කොට හෝ අභිසංස්කාර විඥානය සිටී. වේදනාස්කන්‍ධය ඇසුරු කොට හෝ ... ...සංඥස්කන්‍ධය ඇසුරු කොට හෝ... සංස්කාර ස්කන්‍ධය ඇසුරු කොට හෝ අභිසංස්කාර විඥානය සිටී.

20. **තෘෂ්ණෝත්පාද**[506] සතර : සිවුරු, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස බෙහෙත් පිරිකර.

19. **අගතිගමන** සතර : ඡන්‍ද, ද්වේෂ, භය, මෝහ යනසතරින් අගතිගමනය වේ.

---

503. ස්‍රෝතආපත්‍යඞ්ග යනු ස්‍රෝතආපත්ති මාර්ගය ලැබීමට උපාය වූ කරුණු යි. එහි යෝනිසෝමනස්කාර යනු අනිත්‍යාදි වශයෙන් සංස්කාරයන් මෙනෙහි කිරීම යි. ධර්මානුධර්මප්‍රතිපත්ති යනු ලොවුතුරාදහමට අනුදහම් වූ පූර්වභාග ප්‍රතිපත්තිය හෙවත් විපස්සනා වැඩීමෙහි යෙදීම ය.

504 ආහාර යනු ඵලය ගෙන දෙන්නා, ඵලය උපදවන්නා යන අර්‍ථ ඇති ශබ්දයෙකි. මෙසේ ආහාර යනු ප්‍රත්‍යය යි. කබලීකාර ආහාර යනු කන බොන දෑයෙහි ඕජස යි. ඒ රූප හටගැන්මට ප්‍රත්‍යය වේ. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනා පහළ වේ. එබැවින් ස්පර්ශය වේදනාවට ආහාර (ප්‍රත්‍යය) වේ. මනෝසංචේතනා යනු පුණ්‍යාභිසංස්කාරාදි තුන යි. එයින් විපාකවිඥානය වේ. විඥානප්‍රත්‍යයෙන් නාම රූප පහළ වන හෙයින් විඥානය නාමරූපයනට ආහාර (ප්‍රත්‍යය) වේ.

505. අභිසංස්කාර විඥානය පංචවොකාරභවයෙහි රූපස්කන්‍ධය ඇසුරු කොට ද, චතුවෝකාරභවයෙහි වේදනා සංඥා සංස්කාර යන තුන් ස්කන්‍ධ ඇසුරු කොට ද, තෘෂ්ණාභිෂික්ත ව විපාකයට සුදුසු වැ සිටී.

506. තෘෂ්ණෝත්පාද යනු තෘෂ්ණාව උපදනට කරුණු ය.

21. **ප්‍රතිපත්ති** සතර : දන්ධාභිඤ්ඤ දුක්ඛපටිපදාව, ඛිප්පාභිඤ්ඤ දුක්ඛපටිපදාව, දන්ධාභිඤ්ඤ සුඛපටිපදාව, ඛිප්පාභිඤ්ඤ සුඛපටිපදාව.[507]

22. නවත් **ප්‍රතිපත්ති සතරෙක්** : අක්ෂමා ප්‍රතිපත්තිය, ක්ෂමා ප්‍රතිපත්තිය, දම ප්‍රතිපත්තිය, ශම ප්‍රතිපත්තිය.[508]

23. **ධර්මපද** (දහම් කොටස්) සතර : අනභිධ්‍යා ධර්මපදය, අව්‍යාපාද ධර්මපදය, සම්‍යක්ස්මෘති ධර්මපදය, සම්‍යක්සමාධි ධර්මපදය.

24. **ධර්මසමාදාන**[510] සතර : වත්මන්හි දුක් ගහට ඇති මතු ද ගහට ඇති කරන ධර්මසමාදානය, වත්මනැ ගහට ඇති මතු සුව පහසු දෙන ධර්මසමාදානය, වත්මනැ සුව පහසු ඇති මතු දුක් ගහට දෙන ධර්මසමාදානය, වත්මනැ සුවපහසු ඇති මතු ද සුව පහසු දෙන ධර්මසමාදානය.

---

507. දන්ධාභිඤ්ඤ දුක්ඛපටිපදා යනු පූර්වභාගයෙහි වෙහෙසෙමින් දුක සේ කෙලෙසුන් මැඩ ලොවුතුරා සමාධිය සෙමෙන් ලබන්නහු ගේ ඒ පිළිවෙත ය. ඛිප්පාභිඤ්ඤ දුක්ඛපටිපදා යනු වහා ලොවුතුරා සමාධිය ලබන නමුදු දුක සේ වෙහෙසී විවසුන් වඩන්නහු ගේ පිළිවෙත ය. දන්ධාභිඤ්ඤ සුඛපටිපදා යනු සුව සේ කෙලෙසුන් මැඩ ලොවුතුරා සමාධිය සෙමෙන් වඩන්නහු ගේ විවසුන් වැඩීමය. ඛිප්පාභිඤ්ඤ සුඛපටිපදා යනු ලොවුතුරා සමාධිය වහා ලැබෙන, සුව සේ විවසුන් වඩන්නහුගේ පිළිවෙතය.

508. අක්ෂමප්‍රතිපත්ති යනු ප්‍රධන් වීර්‍ය වඩන කල්හි ශීත උෂ්ණ ආදිය නො ඉවැසීම ය. ක්ෂමප්‍රතිපත්ති යනු ශීතෝෂ්ණාදිය ඉවැසීම ය. දම්ප්‍රතිපත්ති යනු ඉන්ද්‍රියදමනය. ශමප්‍රතිපත්ති යනු කාමවිතර්කාදි අකුශලවිතර්ක නොඉවසා සංසිඳුවීමය.

509. ධර්මපද = ධර්ම කොටස් : අලෝභ ධර්මපද නම් අලෝභ ශීර්ෂයෙන් ලත් ධ්‍යාන විදර්ශනා මාර්ග ඵල නිර්වාණ යි. අව්‍යාපාද ධර්මපද නම් අකෝපය හෙවත් මෛත්‍රී ශීර්ෂයෙන් ලත් ධ්‍යානාදියයි. සම්‍යක්ස්මෘති ධර්මපදනම් මනාවැ එළඹ සිටුවූ සිහියෙන් හෙවත් ස්මෘතිශීර්ෂයෙන් ලත් ධ්‍යානාදිය. සම්‍යක් සමාධි ධර්මපද නම් අට සමවත් හෝ අට සමවත් විසින් හෝ දශ අශුභ විසින් ලත් ධ්‍යාන මාර්ග ඵල නිර්වාණයෝ යි. අන් අයුරෙකින් අලොභධර්මපදය දශාශුභවිසින් ද අව්‍යාපාද ධර්මපදය සතර බ්‍රහ්මවිහාර විසින් ද සම්‍යක්ස්මෘති ධර්මපදය දශානුස්මෘති ආහාර ප්‍රතිකූලසංඥා විසින් ද, සම්‍යක් සමාධි ධර්මපදය දශ කෘත්ස්න ආනාපානස්මෘති විසින් ද නම් ලත් ධ්‍යානාදිය යි.

510. ධර්මසමාදාන=මෙ සතරින් පළමුවැන්න අචේලක ප්‍රතිපත්තිය යි. දෙවැන්න දැඩි කෙලෙස් ඇත්තහු දුකසේ බඹසර පිරීම යි. තෙවැන්න කම්සැපෙහි ගිලීම යි. සිවුවැන්න සිවු පසය නො ලබමිනුත් ධ්‍යාන විදර්ශනා සැප ඇත්තහු පුරන ශාසන බ්‍රහ්මචර්යයයි. විස්තර මහාධර්මසමාදාන සූත්‍රය බලා දත යුතු.

25. **ධර්මස්කන්ධ**[511] සතර: ශීලස්කන්ධ, සමාධිස්කන්ධ, ප්‍රඥාස්කන්ධ, විමුක්ති ස්කන්ධ.

26. **බල**[512] සතර: වීර්‍ය්‍යබල, ස්මෘතිබල, සමාධිබල, ප්‍රඥාබල.

27. **අධිෂ්ඨාන**[513] සතර : ප්‍රඥා, සත්‍ය, ත්‍යාග, උපශම.

28. **ප්‍රශ්නව්‍යාකරණ**[514] සතර : ඒකාංසව්‍යාකරණීය (කෙළින් ම) විසැඳිය යුතු ප්‍රශ්න, ප්‍රතිපුච්ඡාව්‍යාකරණීය (විළිවිසා විසැඳිය යුතු) ප්‍රශ්න, විභජ්ජව්‍යාකරණීය (බෙදා විසැඳිය යුතු ප්‍රශ්න) ඨපනීය (නො විසඳියැ යුතු ප්‍රශ්න)

---

511. ධර්මස්කන්ධ=ධර්මගුණ. ශීලස්කන්ධය ශීල ගුණය යි. සමාධිස්කන්ධ නම් සමාධි ගුණය යි. සෙස්ස ද මෙ නයින් ම දතයුතු. ඵලශීල ඵලසමාධි ඵල ප්‍රඥා විමුක්තිස්කන්ධ (ඵලපර්‍ය්‍යාපන්න සම්‍යක්සංකල්ප ව්‍යායාම ස්මෘති) යන සතර ධර්මයෝ මින් කියැවුණහ.

512. බල=සම්ප්‍රයුක්ත ධර්මයන් එහි ස්ථිරභාවයෙන් පවත්වන හෝ සතුරු ධර්මවලින් නො සැලිය හැකි වීර්‍ය්‍යාදි ධර්මයෝ යි. අහිරික අනොත්තප්පයෝ සව් විෂයයෙහි බලවත්හ. එහෙත් සතුරු කුශලධර්මයන්ගෙන් අකම්ප්‍ය නො වෙති. එ බැවින් ඔහු අකම්ප්‍යාර්ථයෙන් "බල" නො වෙති.

513. අධිෂ්ඨාන=ස්ථිර ව සිටීමට උපකාර වූ හෝ ආධාර වූ ධර්ම හෝ ඒ ගුණාධිකයන්ගේ සිටීම් මාත්‍රය. ප්‍රඥාදීහු ම ඒ ධර්ම හු යි ප්‍රඥාධිෂ්ඨානාදි නම් වෙති.

ප්‍රඥාධිෂ්ඨාන නම් අග්‍ර ඵල ප්‍රඥාව හෝ කර්මස්වකතා ප්‍රඥාව ආදි කොට ඇති ප්‍රඥා යි. සත්‍යාධිෂ්ඨාන නම් පරමාර්ථසත්‍යය වූ නිවන් අවසන් කොට ඇති සියලු සත්‍යය යි. ත්‍යාගාධිෂ්ඨාන නම් ආමිස පරිත්‍යාගය හෝ එය ආදි කොට ආයඞ්මාග්‍රයෙන් ක්ලේශපරිත්‍යාගය අවසන් කොට ඇති සියලු පරිත්‍යාග යි. උපශමාධිෂ්ඨාන නම් ක්ලේශව්‍යුපශමය හෝ විෂ්කම්භන ප්‍රහාණය පටන් අග්‍රමාර්ගයෙන් කෙලෙස් නිවීම තෙක් සියලු ක්ලේශ ව්‍යුපශමය යි.

514. ප්‍රශ්නව්‍යාකරණ=ප්‍රශ්න විසඳීම් සතර. 'ඇස අනිත්‍ය දැ?'යි විචාළොත් 'එසේ ය අනිත්‍ය යැ' යි කෙළින් මැ විසඳියැ යුතු. මේ ඒකාංස ව්‍යාකරණීය ප්‍රශ්නයෙකි. 'අනිත්‍ය වූ දෑ නම් ඇස දැ'යි ඇසුවොත් ඇස පමණක් නො වේ, ශ්‍රෝත්‍ර ඝ්‍රාණාදිය ද අනිත්‍ය යැ යි බෙදා විසඳියැ යුතු. මේ විභජ්‍යව්‍යාකරණීය ප්‍රශ්න යි. 'කණත් ඇසත් ඒකාකාර දැ?' යි ඇසු කලොත්, 'කවර කරුණෙකින් දැ?' යි පෙරළා ඇසිය යුතු 'රූප දක්නා කරුණීනැ'යි උත්තර දුන්හොත් 'එයින් නම් ඒකාකාර නො වෙති'යි පිළිතුරු දියැ යුතු. 'අනිත්‍ය බව සලකා අසමි'යි කීවොත්, 'ඒ කාරණයෙන් නම් එ දෙදෙන ම එකසුරු යැ'යි විසඳියැ යුතු. මේ ප්‍රතිපෘච්ඡා ව්‍යාකරණීය පැණයෙකි. "ජීවයත් ශරීරයත් එකෙක් මූ ද වෙනෙක් ද" යනු ඨපනීය ප්‍රශ්නයෙකි.

29. **කම්**[515] සතර : කළු විපාක ඇති කළු කම්, සුදු විපාක ඇති සුදු කම්, කළු සුදු මිශ්‍ර විපාක ඇති කළු සුදු මිශ්‍ර කම්, නොකළු නොසුදු විපාක ඇති නොකළු නොසුදු කම්.

30. **සාක්ෂාත් කටයුතු ධර්ම** සතර : පෙරවිසූ කඳ පිළිවෙළ සිහියෙන් පසක් කටයුතු ය. සතුන් ගේ චුති උපපත්ති දෙක දිවැසින් පසක් කටයුතු. අෂ්ට විමෝක්ෂ සහජාත නාම කයින් පසක් කටයුතු. ආශ්‍රවක්ෂයය රහත්ඵල නුවණින් පසක් කටයුතු.

31. **ඕඝ**[516] සතර : කාම, භව, දෘෂ්ටි, අවිද්‍යා.

32. **යෝග**[517] සතර : කාම, භව, දෘෂ්ටි, අවිද්‍යා.

33. **විසංයෝග**[518] සතර : කාමයෝගවිසංයෝගය, භවයෝගවිසංයෝගය, දෘෂ්ටියෝගවිසංයෝගය, අවිද්‍යායෝගවිසංයෝගය.

34. **ග්‍රන්ථ**[519] සතර : අභිධ්‍යා කායග්‍රන්ථය, ව්‍යාපාද කායග්‍රන්ථය, ශීලව්‍රතපරාමර්ශ කායග්‍රන්ථය, ඉදංසත්‍යාභිනිවේශ කායග්‍රන්ථය.

---

515. පළමුවැන්නෙන් අපායේ උපදවන දස අකුසල් ද, දෙවැන්නෙන් සවර්ගයේ උපදවන කුසල් ද, තෙවැන්නෙන් මිශ්‍රවිපාක දෙන මිශ්‍ර කර්ම ද, සිවුවැන්නෙන් කිසි ද කළු සුදු විපාකයක් නො දෙන කර්මක්ෂයකර චතුර්මාර්ගඥානය ද දක්වුණහ. මෙහි අකුසලින් තිරිසන් වුවත් ප්‍රවෘත්ති විපාක වශයෙන් තිරිසන් සමූහයට ආධිපත්‍යාදිය ද කුසලින් රජ ව උපනත් ප්‍රවෘත්තිවිපාක වශයෙන් තිරිසනුනට ආධිපත්‍යය ද දුක් වේ.

516. සත්ත්වයන් සසර සයුරෙහි පහතට ඇදගෙන යන කෙලෙස් ඕඝ නම්. කාමෞඝ යනු පංචකාමගුණීක රාගය යි. භවෞඝ යනු රූපාරූප භවයන්හි ඇල්ම යි. දෘෂ්ටෞඝ යනු දෙසැට මිසදිටු යි. අවිද්‍යෞඝ නම් සිවුසස්හි අනුවණ බව යි. මෙහි පළමුවැන්න උපපත්තිභවයෙහි ඇල්ම යි. දෙවැන්න කර්මභවයන්හි රාගය යි. තෙවැන්න භවදෘෂ්ටිසහගත රාගය යි.

517. සසරෙහි සතුන් යොදලන භවබන්ධන සතර යෝග නමි.

518. විසංයෝග යනු සසර බැඳුම් ලිහන ධර්ම යි. අශුභධ්‍යානය හා එය පාදක කොට ගෙන විවසුන් වඩා ලත් අනාගාමිමාර්ගය කාමයෝගවිසංයෝග නම්. රහත් මග භවයෝගවිසංයෝග නම්. ස්‍රෝතආපත්තිමාර්ගය දෘෂ්ටියෝගවිසංයෝග නම්. අර්හත්ත්වමාර්ගය අවිද්‍යායෝගවිසංයෝග නම්.

519. ග්‍රන්ථ යනු සසරෙහි නාම කාය හා රූප කාය ගැට ගසාලා බැඳ තබන කෙලෙස් ය. ඉදං සච්චාභිනිවෙස යනු මෙය ම සත්‍යය සෙසු සියල්ල මිථ්‍යා යැ යි දැඩි ගැන්ම ය.

35. **උපාදාන**[520] සතර: කාමෝපාදාන, දෘෂ්ටූපාදාන, ශීලව්‍රතෝ–පාදාන, ආත්මවාදෝපාදාන.

36. **යෝනි**[521] සතර : අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික.

37. **ගර්භාවක්‍රාන්ති**[522] සතර : මව කුසැ පිළිසඳ ගැන්ම මව කුසැ විසීම මව කුසින් බිහි වීම යන තුන් අවස්ථාහි ම නුවණින් තොර වූ වහු ගේ (සිහිමුළා වූවහුගේ) ගර්භාවක්‍රාන්තිය; පිළිසඳ ගැන්මෙහිදි නුවණ ඇති, ගැබැ සිටුනා, ගැබින් බිහි වන අවස්ථාහි නුවණ නැති තැනැත්තහු ගේ ගර්භාවක්‍රාන්තිය; පිළිසිඳ ගැන්මෙහි ද මවකුසැ විසීමෙහි ද නුවණ ඇති, බිහි වීමෙහිදි නුවණ නැතියහු ගේ ගර්භාවක්‍රාන්තිය; පිළිසිඳ ගැනීම කුසැ විසීම කුසින් බිහි වීම යන තුන් අවස්ථාහි ම නුවණ ඇතියහු ගේ ගර්භාවක්‍රාන්තිය.

38. **ආත්මභාව ප්‍රතිලාභ**[523] සතර : තමා ගේ චේතනා හේතු–යෙන් මියයන්නහු ගේ අත්බව, මෙරමා ගේ චේතනා

---

520 උපාදාන නම් අරමුණ දැඩි කොට ගැන්ම ය. කාම යනු රාගය යි එය ම දැඩි කොට අරමුණ ගන්නා බැවින් උපාදාන ද වේ. මිථ්‍යාභිනිවේශ වශයෙන් දෘෂ්ටියෙන් අරමුණු ගැන්ම දෘෂ්ටූපාදාන නම්. ශීලව්‍රතයෙන් සංසාර ශුද්ධිය වෙතැ යි දැඩි ගැන්ම ශීලව්‍රතෝපාදානය යි. විසිවැදෑරුම් සත්කායදෘෂ්ටිය ආත්මවාදොපාදාන යි. මෙහි අත්තවාද සීලබ්බත-පරාමාස දෙක හැර ඉතිරි සියලු මිසදිටු දෘෂ්ටූපාදාන යි.

521. යව්හාති තාහි සත්තා අමිස්සිතාපි සමානජාතිතාය මිස්සිතා විය හොන්ති යොනියො (ටීකා). සමාන ජාතික සත්ත්ව කොට්ඨාස යෝනි නම්. බිජුවටින් උපදනෝ අණ්ඩජ නම් වෙති. වැදුම්සැ උපදනෝ ජලාබුජ නම් වෙති කුණුමස් ආදි ඇතුළත උණුසුම ඇති තැන, පල් වූ ජල ආදියෙහි හෝ උපදනෝ සංසේදජ නම් වෙති. වහා අවුත් පෙනි සිටින්නාක්සේ එක්වර ම අඟපසඟ සහිත සොළොස්වස් වූවන් බඳු සිරුර ඇති වැ පහළ වනුවෝ ඕපපාතික නම්හ. මිනිස්සු ද බූමාටු දෙවිහු ද නාගසුපර්ණයෝ ද මේ සතර යෝනි ලබත්. සිවුමහරජයේ පටන් කොට උඩ දෙව්ලෝහි සියලු දෙවියෝ ද සටැ නේරයිකයෝ ද ඕපපාතිකහ. ප්‍රේතයෝ සිවුයෝනියෙහි ම උපදිත්.

522. ගර්භාවක්‍රාන්ති යනු ගැබැ පිළිසිඳ ගැන්ම ය. මෙහි පළමු ගර්භා–වක්‍රාන්තිය පිරයම් ලොව් මිනිසුන්ගේ ය. දෙවැන්න අසූමහසව්වන් ගේ ය. තෙවැන්න දගසව්වන් ගේත් පසේ බෝසතුන් ගේත් ගර්භාවක්‍රාන්තිය ය, සිවුවැන්න සර්වඥ බෝධිසත්ත්වයන් ගේ ය.

523. මෙහි පළමුවැන්නෙන් ඛිඩ්ඩාපදොසික දෙවියන් ගේ අත්බව ද, දෙවැන්නෙන් ගෝඝාතකාදීන් ගෙන් මැරුම් කන එළුබැටළු ආදීන්ගේ ද තෙවැන්නෙන් මනෝපදොසික දෙවියන් ගේ ද, සිවුවැන්නෙන් සිවු මහ රජය පටන් කොට උඩ දෙව්ලෝහි දෙවියන්ගේ ද අත්බව් දක්විණ. ඔහු ආත්මසංචේතනා පරසංචේතනා දෙකින් ම තොර වැ හුදෙක් පින් ගෙවී–මෙන් ම මියෙත්.

හේතුයෙන් මියෙන්නහු ගේ අත්බව, තමාගේ ද මෙරමා ගේ ද සංචේතනා හේතුයෙන් මියෙන්නහු ගේ අත්බව, තමා ගේ හෝ මෙරමා ගේ හෝ චේතනායෙන් තොර වැ පුණ්‍යක්ෂය-යෙන් මියෙන්නාහු ගේ අත්බව.

39. **දක්ෂිණාවිශුද්ධි**[524] සතර: පිළිගන්නා ගේ වශයෙන් නො ව දායකයා ගේ වශයෙන් දානය මහත් ඵල වීම, දායකයා ගේ වශයෙන් නො ව පිළිගන්නහු ගේ වශයෙන් දානය මහත් ඵල වීම, දායක ප්‍රතිග්‍රාහක දෙ පසින් ම දානය මහත් පල නොවීම, එ දෙ පසින් ම දානය මහත්පල වීම.

40. **සංග්‍රහ වස්තු**[525] සතර: දාන, ප්‍රිය වචන, අර්ථචර්‍ය්‍යා, සමානාත්මතා.

41. **අනාර්‍ය්‍ය ව්‍යවහාර** සතර: බොරුව, කේලම, පරොස් බස, බොල් දෙඩුම.

42. **ආර්‍ය්‍ය ව්‍යවහාර** සතර: බොරුවෙන් වැළැකුණු බස, කේලමෙන් වැළැකුණු බස, පරොස් බසින් වැළැකි කථාව, ප්‍රලාපයෙන් වෙන් වූ බස.

43. **අන්‍ය අනාර්‍ය්‍ය ව්‍යවහාර** සතරෙක්: නො දුටු දෑ දිටිමි යි කීම, නො ඇසූ දෑ ඇසිමි යි කීම, ආඝ්‍රාණය නො කළ රස නො බැලූ ස්පර්ශ නො කළ දෑ එසේ කළැ යි කීම, නො දත් දෑ දනිමි යි කීම.

44. **ආර්‍ය්‍ය ව්‍යවහාර** සතරෙක්: ඉහත කී අනාර්‍ය්‍ය ව්‍යවහාර සතරින් වැළැකී කථා.

45. තවත් **අනාර්‍ය්‍ය ව්‍යවහාර** සතරෙක්: දුටු ඇසූ, ආඝ්‍රාණාදිය කළ, දත් දෑ එ සේ නො දිටිමි යි ආදි විසින් කීම.

46. **ආර්‍ය්‍ය ව්‍යවහාර** සතරෙක්: දුටු ඇසූ ආඝ්‍රාණාදිය කළ දත් දෑ එ සේ කෙළෙමි යි කීම.

---

524. දක්ෂිණාවිශුද්ධි=මෙහි දක්ෂිණා යනු දානය ය. [illegible] ධර්මය නො වේ. ඒ දානය විශුද්ධ වීමට මහජ්ජුතික මහත්ඵල වීමට හේතු වූ කරුණු දක්ෂිණා විශුද්ධි නම්. සිල්වත්දායකයා දුස්සීලයාට දීම පළමුවැන්න යි. වෙසතුරුරජුගේ දාන මෙනි. දුස්සීල දායකයා සිල්වතාට දීම (වෝරඝාතකයාගේ දානය මෙනි.) දෙවැන්න යි. දායක ප්‍රතිග්‍රාහක දෙපක්ෂය ම දුශ්ශීල නම් ඒ තෙවැන්න යි. දෙ පස ම සිල්වත් නම් සිවුවැන්න යි.

525. සංග්‍රහවස්තු=ජනසංග්‍රහයට කාරණ වූ දෑ.

47. **පුද්ගලයෝ** සතර දෙන[526] : තමා තවන්නා, අනුන් තවන්නා, තමාත් අනුනුත් දෙදෙනා ම තවන්නා, තමාත් අනුනුත් නොතවන නිවී සැනැහී වසන්නා.

48. **පුද්ගලයෝ** සතර දෙනෙක්[527] : අනුනට නොව තමාට ම වැඩ පිණිස පිළිපන්නා, තමාට නොව අනුනට වැඩ පිණිස පිළිපන්නා, තමන් අනුන් දෙ පසට ම වැඩ පිණිස නො පිළිපන්නා, තමන් අනුන් දෙපසට ම වැඩ පිණිස පිළිපන්නා.

49. තවත් **පුද්ගලයෝ** සිවු දෙනෙක්[528] : අඳුරෙන් අඳුරට යන්නා, අඳුරෙන් එළියට යන්නා, එළියෙන් අඳුරට යන්නා, එළියෙන් එළියට යන්නා.

50. තවත් **පුද්ගලයෝ** සිවු දෙනෙක්[529] : ශ්‍රමණාචල, ශ්‍රමණ පද්ම, ශ්‍රමණපුණ්ඩරීක, ශ්‍රමණසුකුමාර.

V

භාග්‍යවතුන් වහන්සේ වදාළ ධර්ම පංචක:

1. **ස්කන්ධ** පස[530] : රූපස්කන්ධ, වේදනාස්කන්ධ, සංඥාස්කන්ධ, සංස්කාරස්කන්ධ.

2. **උපාදානස්කන්ධ**[531] පස : රූපෝපාදානස්කන්ධ, වේදනෝපාදානස්කන්ධ, සංඥෝපාදානස්කන්ධ, සංස්කාරෝපාදානස්කන්ධ, විඥානෝපාදානස්කන්ධ.

---

526. මෙහි පළමු වැන්නා අචේලකයා යි, දෙවැන්නා එළු බැටළු ආදීන් මරා රකන්නා යි, තෙවැන්නා යඥයාජකයා යි, සිවුවැන්නා සස්නෙහි මොනොවට පිළිපන්නා යි.

527. මෙහි පළමුවැන්නා වක්කලී තෙරුන් බඳු ව තමා සිල්වත් ව අනුන් සිල් රකුම් ඇති නො මෙහෙයන්නා, දෙවැන්නා උපනඳ තෙරුන් සේ තමා ශීලාදිගුණ සම්පන්න නො වී අනුන් සිල් රකුම් ඇති මෙහෙයන්නා, තෙවැන්නා දෙව්දත්නු සේ තමාත් ශීලාදියෙහි නො යෙදුණු අනුනුත් එහි නො යොදන්නා, සිවු වැන්නා මහකසුප් තෙරුන් සේ තමාත් ශීලාදිගුණ සම්පන්න ව අනුනුත් ඒ ගුණයෙහි මෙහෙයන්නා.

528. පළමුවැන්නා දුගී වැ සිටැ පව් කරන්නා, දෙවැන්නා දුගී ව සිටැ සුසිරි පුරන්නා, තෙවැන්නා තමා පොහොසත් වැ සිටැ පව් කරන්නා, සිවු වැන්නා තමා පොහොසත් වැ සිට සුසිරි පුරන්නා යි.

529. ශ්‍රමණාචල (සමණමචල) යනු සෝවාන් පුඟුලා ය. ශ්‍රමණපද්ම යනු සෙදගැමියා ය. ශ්‍රමණපුණ්ඩරීක යනු අනාගැමි පුඟුලා ය. ශ්‍රමණසුකුමාර යනු රහත් පුඟුලා ය.

530. රූපස්කන්ධය ලෞකික ය. ඉතර ස්කන්ධ සතර ලෞකික ලෝකෝත්තර විසින් මිශ්‍ර ය. ස්කන්ධ යන්නට උපාදානස්කන්ධ ද අයත් වන හෙයින් මෙසේ බෙදන ලදි.

531. උපාදානස්කන්ධ පස ම ලෞකික ය උපග්‍රන්ථය බලනු.

3. **කාමගුණ**[532] පස : ප්‍රිය රූප, ප්‍රිය ශබ්ද, ප්‍රිය ගන්ධ, ප්‍රිය රස, ප්‍රිය ස්ප්‍රෂ්ටව්‍ය.

4. **ගති** පස[533] : නිරය, තිරිසන් යෝනිය, ප්‍රේතවිෂය, මනුෂ්‍ය, දේව.

5. **මාත්සර්‍ය්‍ය** (මසුරුබව්) පස[534] : ආවාසමාත්සර්‍ය්‍ය, කුල-මාත්සර්‍ය්‍ය, ලාභමාත්සර්‍ය්‍ය, වර්ණමාත්සර්‍ය්‍ය, ධර්මමාත්සර්‍ය්‍ය.

6. **නීවරණ**[535] පස : කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච විචිකිච්ඡා.

7. **ඕරම්භාගිය**[536] (අවරභාගික) **සංයෝජන** පස : සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, කාමච්ඡන්ද, ව්‍යාපාද.

8. **උද්ධම්භාගිය**[537] (ඌර්ධ්වභාගික) **සංයෝජන** පස : රූප-රාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා.

9. **ශික්ෂා පද** (සික කොටස්) පස : ප්‍රාණඝාතයෙන් වැළැක්ම, අදින්නාදානයෙන් වැළැක්ම, කාමමිථ්‍යාචාරයෙන් වැළැක්ම, මුසාවාදයෙන් වැළැක්ම, රහමෙර පානයෙන් වැළැක්ම.

---

532. කාමගුණ යනු කාම කොටස් ය. ප්‍රිය රූප ප්‍රිය ශබ්දාදිය ය.

533. 'සුකතදුක්කතකාරීහි ගන්තබ්බා'ති ගතියො'. පව් පින් කළවුන් විසින් යා යුතු තැන් ගති නම්.

534. ආවාසයෙහි මසුරු කම ආවාසමාත්සර්‍ය්‍ය නමි. එයින් යුත් මහණ තෙම ආගන්තුක භික්ෂූන් දැක මෙහි චෛත්‍යසන්තක ද තබා ඇත කියා හෝ මෙහි සංඝසන්තක පිරිකර තබා ඇත යනා ආදීන් කියා සඟ සතු වූ ද ආවාසයේ පවා නවාතැනට ද ඉඩ නො දෙයි. එසේ ආවාසයෙහි මසුරු වූ මහණ මැරී ප්‍රේත ව හෝ පිඹුරු ව උපදී. කුලමාත්සර්‍ය්‍ය යනු දායක කුලයා කෙරෙහි මසුරුබව යි. මෙයින් යුත් මහණ තෙම තමාට උවටැන් කරන දායක පවුල් කරා අන් මහණකු ගේ ගමන පවා වළක්වයි. ලාභමාත්සර්‍ය්‍ය යනු ලාභයෙහි මසුරුබව ය. මෙයින් යුත් මහණ සඟසතු ව ලැබුණු දෑයට ද මසුරුකම් කරයි. එය අන් මහණුනට නො ලැබෙන ලෙසක් කරයි. වර්ණමාත්සර්‍ය්‍ය යනු සිය සිරුරු පැහැයෙහි සිය කීර්තියෙහි මසුරුකම යි. ධර්මමාත්සර්‍ය්‍ය යනු බණ ඉගැන්වීමෙහි මසුරුකම ය. මෙයින් යුත් මහණ තෙම දහම් ඉගෙන තමා මැඩ පවත්වතැ යි බියෙන් අන්හට දහම් නො උගන්වයි. මොහු මෙය ඉගෙන අන් සැටියෙන් අර්ථ පෙරළා ලමින් ධර්මයට හානියක් කරතැයි ධර්මානුග්‍රහයෙන් හෝ මොහු මෙය ඉගෙන උඩඟු ව පණ්ඩිතමානී ව තමාට ම හානියක් ම කර ගනිති යි පුද්ගලයා කෙරෙහි කරුණායෙන් ධර්මය නොඉගැන්වීම ධර්මමාත්සර්‍ය්‍යයෙක් නො වේ.

535. 536. 537, උපග්‍රන්ථය බලනු.

10. **අභව්‍ය** (නො විය හැකි) **කරුණු** පස : පණිවා, අදින්නාදන්, කාමමිථ්‍යාචාර, මුසවා, රහමෙර බොනු යන මේ ද රහතන්හු ගෙන් නො විය හැක්ක.

11. **ව්‍යසන** (විපත්) පස : ඥාතිව්‍යසන, භෝගව්‍යසන, රෝග-ව්‍යසන, ශීලව්‍යසන.

12. **සම්පත්** පස : ඥාතිසම්පත්, භෝගසම්පත්, ආරෝග්‍යසම්පත්, ශීලසම්පත්, දෘෂ්ටිසම්පත්.

13. **ශීලවිපත්තියේ** (දුශ්ශීල බවේ) **දොස්** පස : මහත් භෝග පිරිහීම, අපකීර්තිය, සෙබෙහි තෙද නැති බව, සිහිමුළායෙන් මරණය, මරණින් පසු දුගතියෙහි ඉපැත්ම.

14. **ශීලසම්පත්තියේ අනුසස්** පස : මහත් භෝගසම්පත්[538] ලැබීම, කීර්තිලාභය, සභායෙහි විශාරද බව, හොඳ සිහියෙන් මියයෑම, මරණින් මතු සුගතියේ ඉපැත්ම.

15. **චෝදක භික්ෂුව තුළැ වියැ යුතු ධර්ම** පස : සුදුසු වේලෙහි කියමි යි සිත, වූ දෙයකින් ම චෝදනා කරමි යි සිත, මොලොක් බසින් ම චෝදනා කරමි යි සිත, වැඩ කැමැති ව ම චෝදනා කරමි යි සිත, මෙත් සිතින් ම චෝදනා කරමි යි සිත.

16. **ප්‍රධානික** (වීර්‍ය වඩන) **භික්ෂුහු තුළැ වියැ යුතු ගුණාංග** පස : ශ්‍රද්ධාව,[539] ලෙඩ නැති බව, අවංක බව, පටන්ගත් වීර්‍ය ඇති බව, උදයව්‍යයඥනය.

17. **ශුද්ධාවාස**[540] පස : අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකනිට්ඨ.

---

538. උපග්‍රන්ථය බලනු.

539. ශ්‍රද්ධාව (සැදැහැව) සිවුවැදෑරුම්: ආගමනසද්ධා අධිගමසද්ධා ඕකප්පනසද්ධා පසාදසද්ධා වශයෙනි. පසේබෝසතුන් ගේ ද ශ්‍රාවකයන් ගේ ද උත්කෘෂ්ට වශයෙන් සර්වඥබෝධිසත්ත්වයන් ගේ ද ප්‍රණිධානයේ පටන් කොට ආ ශ්‍රද්ධාව ආගමනශ්‍රද්ධාවයි. සත්‍යාධිගමයෙන් පහළ වූ අග්‍රමාර්ගඵල සම්ප්‍රයුක්ත ශ්‍රද්ධාව අධිගමශ්‍රද්ධා නම් වේ. සෝවාන්හු ගේ අඩග වූ අචලශ්‍රද්ධාව ඔකප්පනසද්ධා නම්. ඔකප්පන යනු බුද්ධාදීන් ගේ ගුණයෙහි බැස ගෙන විපක්ෂ ධර්මයෙකින් සෙලැවිය නොහැකි සේ අචල ව සිටීම ය. "බුද්ධාදීනං ගුණෙ ඔගාහති හිත්වා විය අනුපවිසතීති ඔකප්පනා" (අඨසාලිනී). පැහැදිය යුතු ගුණයෙහි පැහැදීම පසාදසද්ධා නම්. මෙ තැන ඔකප්පනසද්ධාව අභිප්‍රෙත ය.

540. ශුද්ධාවාස යනු ශුද්ධ වූ පුද්ගලයන් වසන තැන් ය. මෙහි ශුද්ධපුද්ගල යනු අනාගාමීහුත් රහත්හුත් ය.

18. **අනාගාමිහු**[541] පස්දෙන : අන්තරාපරිනිබ්බායී, උපහච්ච-පරිනිබ්බායී, අසංඛාරපරිනිබ්බායී, සසංඛාරපරිනිබ්බායී, උද්ධංසෝතඅකණිට්ඨගාමී.

19. **චේතෝඛිල** (සිතේ දළදඬු බව්) පස : ශාස්තෘහු කෙරෙහි සැකය, ධර්මය කෙරේ සැකය, සංඝයා කෙරේ සැකය, ශික්ෂායෙහි සැකය, සබ්රම් සරුනට කුපිත ව ඉදීම. මේ පස ඇත්තහු ගේ සිත ප්‍රධානවීර්‍ය්‍යයෙහි වැඩීමෙහි නො නැමේ.

20. **චේතෝවිනිබන්ධ** (සිත බැඳගන්නා ධර්ම) පස : කාමරාගය, කායරාගය,[542] රූප රාගය,[543] කුසීද බව, බඹසර රකිමින් දෙව් සැප පැතීම.

21. **ඉන්ද්‍රිය** පස : චක්ෂුස්, ශ්‍රෝත්‍ර, ඝ්‍රාණ, ජිහ්වා, කාය.

22. **ඉන්ද්‍රිය** පස (අන් අයුරෙකින්) : සුඛ, දුක්ඛ, සෝමනස්ස, දෝමනස්ස, උපෙක්ඛා.

23. **ඉන්ද්‍රිය** පස (අන් අයුරෙකින්) : සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා.

24. **නිස්සරණීය ධාතු** (කාමාදියෙන් වෙන් වූ ධර්ම) පස : අශුභධ්‍යානය (කාමනිස්සරණීය ය), මෛත්‍රී ධ්‍යානය (ව්‍යාපාද-නිස්සරණීය ය), කරුණාධ්‍යානය (විහිංසානිස්සරණීය ය,) අරූපධ්‍යානය (රූපනිස්සරණීය ය), අර්හත්ඵලසමාපත්තිය (සක්කායනිස්සරණීය ය).

25. **විමුක්ත්‍යායතන** (මිදීමට කරුණු) පස : දහම් ඇසීම, දහම් දෙසීම, ධර්මය සජ්ඣායන කිරීම, ධර්මය නුවණින් බැලීම, එක්තරා සමාධිනිමිත්තක්[543] රැගෙන මෙනෙහි කිරීම.

---

541. ආයුෂයේ මැද කොටස නො ඉක්මැ අතර ම කෙලෙස් පිරිනිවනින් රහත් වූයේ අන්තරා පරිනිබ්බායී නම්. ආයුෂ කාලයේ මැද කොටස ඉක්ම රහත් වූයේ උපහච්ච පරිනිබ්බායී නම්. මහංසි නැති ව (අසංඛාරව) සුව සේ රහත් වූයේ අසංඛාරපරිනිබ්බායී ය. මහංසියෙන් බවුන් වඩා කෙලෙස් පිරිනිවියේ සසංඛාරපරිනිබ්බායී ය. මොහු සතර දෙනා ම ශුද්ධාවාස පසෙහි ම ලැබෙත්. අවිහය පටන් කොට සතර ශුද්ධාවාසයන් ගෙන් ඩාවරෙක හෝ ඉපිද එයින් සැව පිළිවෙළින් අකනිට්ඨයෙහි ඉපිද රහත් වූයේ උද්ධංසෝත අකනිට්ඨගාමී ය.

542. සිය කයෑ ඇල්ම කායරාග නම්. බාහිරරූපයෙහි ඇල්ම රූප-රාග යි.

543. අටනිස් අරමුණෙන් යමක් ගෙන ඉපැදූවූ සමාධිය සමාධිනිමිත්ත නම්.

26. **විමුක්තිපරිපාචනීය** (රහත් බවට නුවණ මුහුකුරුවන, රහත්බව සාදන) සංඥ පස: අනිත්‍යසංඥ,[544] දුඃඛසංඥ, අනාත්මසංඥ, ප්‍රහාණසංඥ, විරාගසංඥ

VI

භාග්‍යවතුන් වහන්සේ වදාළ ධර්ම **ෂට්ක**.

1. **ආධ්‍යාත්මිකායතන**[545] සය: චක්ෂුස්, ශ්‍රෝත්‍ර, ඝ්‍රාණ, ජිහ්වා, කාය, මනස්.

2. **බාහ්‍ය ආයතන**[546] (අරමුණු) සය: රූපායතන, ශබ්දායතන, ගන්ධායතන, රසායතන, ස්ප්‍රෂ්ටව්‍යායතන, ධර්මායතන.

3. **විඥාන සමූහ** සය: චක්ෂුර්විඥාන, ශ්‍රෝත්‍රවිඥාන, ඝ්‍රාණවිඥාන, ජිහ්වාවිඥාන, කායවිඥාන, මනෝවිඥාන.

4. **ස්පර්ශසමූහ** සය: චක්ඛුසම්ඵස්ස, සෝතසම්ඵස්ස, ඝාණ-සම්ඵස්ස, ජිව්හාසම්ඵස්ස, කායසම්ඵස්ස, මනෝසම්ඵස්ස.

5. **වේදනා සමූහ** සය: චක්ඛුසම්ඵස්සාදියෙන් ඇති වන විඳීම් සය යි.

6. **සංඥාසමූහ** සය: රූපසංඥ[547], ශබ්දසංඥ, ගන්ධසංඥ, රස-සංඥ, ස්ප්‍රෂ්ටව්‍යසංඥ, ධර්මසංඥ.

7. **චේතනාසමූහ** සය: රූපසංචේතනා,[548] ශබ්දසංචේතනා, ගන්ධසංචේතනා, රසසංචේතනා, ස්ප්‍රෂ්ටව්‍යසංචේතනා, ධර්ම-සංචේතනා.

8. **තෘෂ්ණාසමූහ** සය: රූපතෘෂ්ණා[549], ශබ්දතෘෂ්ණා, ගන්ධ-තෘෂ්ණා, රසතෘෂ්ණා, ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා, ධර්මතෘෂ්ණා.

---

544. අනිත්‍යානුදර්ශනා ඥානයෙහි උපන් සංඥාව අනිත්‍යසංඥ නමි. දුඃඛසංඥාදිය ද මේ නය අනුව දත යුතු.

545. තමා කෙරෙහි වූයේ ආධ්‍යාත්මික නම්

546. තමාගෙන් බැහැර වූයේ බාහ්‍යායතන යි.

547. රූපය අරමුණු කොට උපන් සංඥාව රූපසංඥ නමි. ශබ්ද-සංඥාදිය ද මේ නයින් දත යුතු.

548. රූපයෙහි එල්බැ උපන් චේතනාව රූපසංචේතනා යි. ශබ්ද-සංචේතනාදියත් එම නය අනුව තේරුම් ගත යුතු.

549. රූපයෙහි එල්බැ රූපය අරමුණු කොට උපන් තෘෂ්ණාව රූප තෘෂ්ණා යි. ශබ්ද තෘෂ්ණාදිය ද මේ නයින් ම දතයුතු.

9. **අගෞරව**[550] **සය** : ශාස්තෲන් වහන්සේට, ධර්මයට, සඞ්ඝයාට, ශික්ෂාවට, අප්‍රමාදයට, පිළිසඳරට, — යන සසට ගෞරව නොකිරීම්.

10. **ගෞරව සය** : ශාස්තෘ ධර්ම සංඝාදි සයට ගෞරව කිරීම්.

11. **සොම්නස් සහගත විචාර සය** : සොම්නස් ඇති කරන ප්‍රිය රූප ප්‍රිය ශබ්ද ආදි සාරමුණු හමු වූ විට ඒ පිරිසිඳ බැලීම්

12. **දොම්නස් සහගත විචාර සය** : දොම්නස් ඇති කරන අප්‍රිය රූප අප්‍රිය ශබ්දදි සාරමුණු හමු වූ විට ඒ කල්පනා කොට පිරිසිඳ බැලීම්.

13. **උපේක්ෂා සහගත විචාර සය** : උපේක්ෂාවට කාරණ වූ රූපාදි සය කල්පනා කොට පිරිසිඳ බැලීම්.

---

550. ශාසතෘ අගෞරව නම් බුදුරජුනට ගරු නොකිරීම යි. බුදුරජුන් ධරමාණ සමයයෙහි මහණනු තුන් වේලෙහි ඔබට උවටනට නොයෑම, බුදුරජුන් පාවහන් නැති ව සක්මන් කරන කලැ මහණනු පාවහන් දරා සක්මන් කිරීම, බුදුරජුන් පහත් සක්මන් මළුවෙක සක්මන් කරන කලැ මහණනු උස් සක්මන් මළුවෙහි සැක්මුම, බුදුරජුන් පහත වැඩ සිටිනා විට මහණනු උස් තැනෙක සිටීම, බුදුරජුන් පෙනෙනා තැන දෙ උර පොරොවා සිටීම හෝ කුඩ ඉසැලා සිටීම හෝ පාවහන් දුරීම, බුදුරජුන් පෙනෙනා තැන සිට නෑම හෝ මලමූ පහ කිරීම යන මේ ද ශාසතෘහට අගෞරව කිරීම් ය. බුදුරජුන් පිරිනිවි පසු ද චෛත්‍යය නො වැඳීම, චෛත්‍යය පෙනෙනා මාතයේ දෙඋර වසැ පොරොවා සිටීම් ආදි වශයෙන් බුදුරජුන් පෙනෙනා තැන සිට කරන හැම අගෞරව ම කිරීම ද ශාසතෘහු කෙරෙහි අගෞරව නම්. බණ අසන්නට එනු පිණිස කල් දුන්වූ කලැ එයට නො යෑම, සකසා බණ නොඇසීම, බණ කියන අතර කතා කරමින් ඉඳීම, ඒ බණ සකසා නො ඉගැන්ම, නො කියැවීම යනු ධර්මයෙහි අගෞරව නම්. වැඩිමහලු තෙරනු කෙරෙන් අවසර නො ලැබ බණ කීම, හිඳීම, ප්‍රශ්න ඇසීම හෝ විසැඳීම, නමාට වැඩිමාලු භික්ෂූන් ඇඟෑ ගැටෙමින් යෑම, සිටීම, හිඳීම, දුස්සපල්ලත්ථිකාව (සිවුරෙන් දනිස් බැඳ ගෙන හිඳීම), සඟ මැද දෙඋර වසා හිඳීම, සඟ මැද කුඩ හෝ පාවහන් දුරීම යන මේ ද සංඝයාට අගෞරව කිරීම් ය. එක් මහණකුට නමුදු අගෞරව කොළේ සියලු සංඝයාට ම අගෞරව කළා වෙයි. තුන් සික නොපිරීම ශික්ෂාවට අගෞරව කිරීම ය. අප්‍රමාදලක්ෂණය (සම්‍යක්-ප්‍රතිපත්තිය) නොවැඩීම අප්‍රමාදයෙහි අගෞරව කිරීම නම්. ධම්මපටිසන්ථාර ආමිසපටිසන්ථාර දෙක නොකිරීම පටිසන්ථාරයෙහි අගෞරව කිරීම නම්.

14. **සාරාණීය ධර්ම**[551] සය : සබ්‍රම්සරුන් කෙරේ මෛත්‍රීසහගත කායකර්ම, මෛත්‍රීසහගත වාක්කර්ම, මෛත්‍රීසහගත මනඃකර්ම යනු; මොවුන් එළඹවා සිටුවීම, සිවු පසය සබ්‍රම්සරුන් හා බෙදාගෙන වැළැඳීම, ශිලයෙන් සමාන බවට පැමිණීම, දෘෂ්ටියෙන් සමාන බවට පැමිණීම.

15. **විවාදමූල** සය : ක්‍රෝධ වෛර දෙකින් යුත් බව, ගුණමකු බව හා පලාසය, ඊර්ෂ්‍යා හා මාත්සර්‍ය්‍ය, ශඨ බව හා මායාව, හීන බලාපොරොත්තු ඇති දුශ්ශීල බව හා මිසදිටු බව, ගත් දෘෂ්ටියෙහි දැඩි ව පිහිටීම හා එය දුරලිය නොහැකි බව. මේ දෙස් ඇති මහණා නොහික්මුණෙකි. විවාද ඇති කරන්නෙකි. මෙ දෙස් දුරු කිරීමෙන් විවාද නො හට ගැනේ.

16. **ධාතු** සය : පෘථිවි, අප්, තේජස්, වායු, ආකාශ, විඥාන.

17. **නිස්සරණීය ධාතු**[552] (ව්‍යාපාදදීන් දුරු වීමෙන් ලැබෙන සවභාව) සය : මෛත්‍රීචිත්තවිමුක්තිය, කරුණා චිත්ත-විමුක්තිය, මුදිතා චිත්තවිමුක්තිය, උපේක්‍ෂා චිත්තවිමුක්තිය, අනිමිත්තචිත්තවිමුක්තිය, අස්මිමාන සමුද්ඝාතය.

18. **අනුත්තරිය**[553] **ධර්ම** සය : අනුත්තරිය දර්ශනය, අනුත්තරිය ශ්‍රවණය, අනුත්තරිය ලාභය, අනුත්තරිය ශික්‍ෂාව, අනුත්තරිය පාරිචර්‍ය්‍යාව, අනුත්තරිය අනුස්මෘතිය.

19. **අනුස්මෘතිස්ථාන**[554] සය : බුද්ධානුස්මෘති, ධර්මානුස්මෘති, සංඝානුස්මෘති, ශීලානුස්මෘති, ත්‍යාගානුස්මෘති, දේවතානුස්මෘති.

20. **සතත විහාර**[555] සය : රූප ශබ්දදී සාරමුණු ගැනීමේදි සොම්නස් දෙම්නස් නො කොට එළැඹ සිටි සිහි ඇති ව උපේක්‍ෂක ව ඉදීම.

---

551. සාරාණීයධර්ම = සංරජනීයධර්ම, සිතැ රඳැවියැ යුතු දෑ 'අඨාපෙ අතික්කන්තොපි න පමුස්සිතබ්බා (අටුවා)

552. සතුරු වූ ව්‍යාපාදදීන් කෙරෙන් නික්මුණු සවභාවයෝ යි.

553. තමහට වඩා උත්තරික (උතුම්වූ) ගුණ නැත්තේ අනුත්තරිය නම්. උතුම් ම වූ, උසස් ම වූ ධර්ම යි.

554. 'අනුස්සතියො'ව අනුස්සතිට්ඨානානි නාම (අටුවා) යන්නෙන් අනුස්මෘතිහු ම අනුස්මෘතිස්ථාන නම් හ.

555. ප්‍රියරූප ප්‍රියශබ්දදි අරමුණෙහි රහත්හු සතුටු නො වෙත්. අප්‍රිය රූපාදියෙහි නොසතුටු ද නො වෙත්. මෙ හැම තන්හි උපේක්‍ෂක ම වෙත්. මෙසේ සාරමුණෙහි ම රහතුන් උපේක්‍ෂක ව ඉදීම රහතුන්ගේ සතතවිහාර (නිත්‍ය විහරණ) යි.

21. **අභිජාති**[556] සය : කෘෂ්ණාභිජාතිකයාගේ කෘෂ්ණධර්ම ජනන ය, ඔහුගේ ම ශුක්ලධර්මජනන ය, ඔහුගේ ම අකෘෂ්ණ අශුක්ල ධර්ම ජනන ය, ශුක්ලාභිජාතිකයා ගේ ශුක්ලධර්ම ජනන ය, ඔහුගේ ම කෘෂ්ණධර්මජනන ය, ඔහුගේ ම අශුක්ලා-කෘෂ්ණධර්ම ජනන ය.

22. **නිර්වේධභාගීය සංඥා**[557] සය : අනිත්‍යසංඥා, අනිත්‍යයෙහි දුඃඛ සංඥා, දුකෙහි අනාත්ම සංඥා, ප්‍රහාණසංඥා, විරාගසංඥා, නිරෝධසංඥා.

VII

භාග්‍යවතුන් වහන්සේ වදාළ ධර්ම **සප්තක**

1. **ආර්ය ධන** සත: සද්ධා, සීල, හිරි, ඔත්තප්ප, සුත, චාග, පඤ්ඤා.
2. **සම්බෝධ්‍යඞ්ග** සත : සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා.
3. **සමාධිපරිෂ්කාරධර්ම**[558] සත : සම්‍යග්දෘෂ්ටි, සම්‍යක්සංකල්ප, සම්‍යග්වචන, සම්‍යක්කර්මාන්ත, සම්‍යගාජීව, සම්‍යග්ව්‍යායාම, සම්‍යක්ස්මෘති.
4. **අසද්ධර්ම**[559] සත: අස්සද්ධා, අහිරික, අනොත්තප්ප, අප්පස්සුතතා, කුසීතතා, මුට්ඨස්සතිතා, දුප්පඤ්ඤතා
5. **සද්ධර්ම**[560] සත : සද්ධා, හිරි, ඔත්තප්ප, බහුස්සුතතා, ආරද්ධවිරිය, උපට්ඨිතසති, පඤ්ඤා.

---

556. අභිජාති යනු ජාති ම ය, ඉපැදුම් ම ය. කෘෂ්ණාභිජාතික යනු කෘෂ්ණ හෙවත් නීචසම්මත කුලයෙහි උපන් තැනැත්තේ ය. කෘෂ්ණධර්ම යනු දස අකුසල් ජනන යනු ඉපැදවීම යි. ශුක්ලධර්ම යනු පින් ය. ශුක්ලාභිජාතික යනු උසස් යැ යි සම්මත කුලයෙහි උපන්නේ යි. අශුක්ලා-කෘෂ්ණධර්ම යනු සුදුත් නොවූ කළුත් නොවූ ද යි. එනම් රහත් බව යි.

557. මෙහි නිර්වේධ (නිබ්බෙධ) යනු නිවන යි. එය භජනය කරන එය කරා එළඹෙනුවට උපකාරී වන ධර්ම නිර්වේධභාගීය නම්. නිරොධානු-පස්සනාවෙහි සංඥාව නිරෝධසංඥා නම්. මේ අනිත්‍යසංඥාදීන්ගේ විස්තර විශුද්ධිමාර්ගය බලා දත යුතු.

558. සමාධියට පිරිවර ධර්ම සමාධිපරිෂ්කාර නම්. ලෞකික සම්‍යක්දෘෂ්ටි ආදි සත ද, ලෝකෝත්තරසම්‍යග්දෘෂ්ටිආදි සත ද යන තුදුස ම සමාධිපරිෂ්කාර නාමින් මෙහි දක්විණ.

559. අසත්පුරුෂ ගති, ලාමක ගති අසද්ධර්ම නම්. 560. සද්ධර්ම යනු සද්ගුණ යි.

6. **සත්පුරුෂ ධර්ම**[561] සත : ධර්මඥතා, අර්ථඥතා, ආත්මඥතා, මාත්‍රඥතා, කාලඥතා[562], පර්ෂද්ඥතා, පුද්ගලඥතා.

7. **නිර්දශ වස්තු**[563] (රහත් වීමට කරුණු) සත : ශික්‍ෂාසමාදාන-යෙහි දැඩි කැමැත්ත ද, ශික්‍ෂාත්‍රයය පිරීමෙහි කැමැත්ත ද පළමු වැන්න යි. ධර්මනිශාන්තියෙහි (විවසුන් වැඩුම්හි) බලවත් කැමැත්තත් එයින් පසු එය වැඩුම්හි රිස්ස දුරු නොවීමත් දෙවැන්න යි. තෘෂ්ණාව දුරලීමෙහි දැඩි කැමැත්තත් එයින් පසු තෘෂ්ණාව නැසීමෙහි පහ නො වූ රුචිය ඇති බවත් තෙ වැන්න යි. ප්‍රතිසංලානයෙහි (විවේකි බව්හි) දැඩි රිස්සත් එහි යෙදෙන්නට පටන් ගත් තැන් පටන් එහි රුචිය දුරු නො වී පවත්නා බවත් සිවු වැන්න යි. වීර්‍ය්‍යය පිරීමෙහි දැඩි කැමැත්තත් ඉන් පසු එහි යෙදෙමිනුත් එය සඳහා නොපහ වූ රුචිය ඇති බවත් පස් වැන්න යි. සිහියත් නිපක භාවයත් කෙරෙහි ඡන්දය ද එය පැවැත්-වීමෙහි දී එයට රුචිය දුරු නො වී පවත්නා බව ද දැස වැන්න යි. මාර්ගදර්ශනලාභයට කැමැත්තත් එය ලබන තුරු ම එයට කැමැත්ත දුරු නො වන බවත් සත් වැන්න යි.

8. **සංඥා**[564] සත : අනිත්‍යසංඥා, අනාත්මසංඥා, අශුභසංඥා, ආදීනවසංඥා, ප්‍රහාණසංඥා, විරාගසංඥා, නිරෝධසංඥා.

---

561. සූත්‍රගේයාදි ධර්ම දන්නා බව ධර්මඥතා නමි. කී බසෙහි අරුත් දන්නා බව අර්ථඥතා යි. ශීලසමාධි ආදි ගුණවලින් තමා දියුණු වී ඇති පමණ දන්නා බව ආත්මඥතා නමි. පසය පිළිගැනීමෙහි ද පරිභෝග කිරීමෙහි ද පමණ දැන්ම මාත්‍රඥතා යි.

562. ඉගැනුම් පැණපිළිවිසුම් බවුන් වැඩුම් ආදි ඒ ඒ කාර්‍ය්‍යයට සුදුසු කාලය දන්නා බව කාලඥතා නමි. කැත් ඈ අට වැදෑරුම් පිරිස දන්නා බව පරිෂද්ඥතා (පර්ෂද්ඥතා) නමි. සෙවියැ යුතු නොසෙවියැ යුතු පුගුලන් දන්නා බව පුද්ගලඥතා නමි.

563. පැවිදි වැ දසවස් වූ කල මිළ නිවටා සසරින් මිදුණු බැවින් නැවත දසවසක් නොලබනා බැවින් නිර්දශ නමැයි ද විසිවසින් මළේ නිර්විංශ නමැයි ද තිසෙන් මළේ නිස්ත්‍රිංශ නමැයි ද තිවටුන් ගේ ව්‍යවහාර යි. අනද තෙරණුවෝ මෙයසා බුදුරජුනට දැන්වූහ. බුදුරජුහු 'සත්‍ය වශයෙන් නිර්දශ යැ යි කියැ යුතු රහත් මහණහට ය. පිරිනිවි පසු යළි නොඋපදනා බැවින් දස වසක් තබා එක් මොහොතකුත් සසර කිසි ද දශාවක් (අවස්ථාවක්) නො ලබනා බැවින් රහත් තෙමේ ම අන්වර්ථ වශයෙන් නිර්දශ යැ යි නාම ලැබීමට සුදුසු යැ' යි වදරා, නිර්දශ (රහත්) වන්නට කරුණු වදළහ.

564. සංඥා සත - උපග්‍රන්ථය බලනු.

9. **බල** සත : ශ්‍රද්ධා, වීර්‍ය්‍ය, හ්‍රී, අපත්‍රපා, ස්මෘති, සමාධි, ප්‍රඥා.

10. **විඥානස්ථිති*** සත : නානාත්වකාය නානාත්වසංඥී, නානාත්වකාය ඒකත්වසංඥී, ඒකත්වකාය නානාත්වසංඥී, ඒකත්වකාය ඒකත්වසංඥී, ආකාශානන්තායතන, විඥානානන්තායතන, ආකිංචන්‍යායතන.

11. **දක්ෂිණාර්හ පුද්ගල** සත් දෙන : උභතෝභාගවිමුක්ත, ප්‍රඥාවිමුක්ත, කායසාක්ෂ්‍ය, දෘෂ්ටිප්‍රාප්ත, ශ්‍රද්ධාවිමුක්ත, ධර්මානුසාරී, ශ්‍රද්ධානුසාරී.*

12. **අනුශය*** සත : කාමරාග, ප්‍රතිඝ, දෘෂ්ටි, විචිකිත්සා, මාන, භවරාග, අවිද්‍යා.

13. **සංයෝජන** (භවබන්ධන) සත : අනුනය, ප්‍රතිඝ, දෘෂ්ටි, විචිකිත්සා, මාන, භවරාග, අවිද්‍යා.*

14. **අධිකරණ ශමථ** සත* : සම්මුඛා විනය දීම, සති විනය දීම, අමූල්හ විනය දීම, ප්‍රතිඥයෙන් කැරවීම, යේභුය්‍යසිකාව, තස්ස පාපියසිකාව, තිණවත්ථාරකය.

VIII

භාග්‍යවතුන් වහන්සේ වදාළ ධර්ම අෂ්ටක.

1. **මිථ්‍යාත්ව** අට = මිථ්‍යාදෘෂ්ටි, මිථ්‍යාසංකල්ප, මිථ්‍යාවාක්, මිථ්‍යාකර්මාන්ත, මිථ්‍යාආජීව, මිථ්‍යා ව්‍යායාම, මිථ්‍යාස්මෘති, මිථ්‍යාසමාධි.

2. **සම්‍යක්ත්ව** අට : සම්‍යග්දෘෂ්ටි, සම්‍යක්සංකල්ප, සම්‍යග්වාක්, සම්‍යක්කර්මාන්ත, සම්‍යගාජීව, සම්‍යග්ව්‍යායාම, සම්‍යක්ස්මෘති, සම්‍යක්සමාධි.

3. **දක්ෂිණාර්හ පුද්ගලයෝ** අට දෙන : සෝවාන් පුද්ගලයා, සෝවාන් බව පිණිස පිළිපදින්නා, සකෘදාගාමියා, සකෘදාගාමි ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන්නා, අනාගාමියා, අනාගාමි ඵලය සාක්ෂාත් කරණයට පිළිපන්නා, රහත් පුද්ගලයා, රහත් ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන්නා.

4. **කුසීද වස්තු** (අලස කරුණු) අට : කටයුත්තක් එළැඹ සිටි කල එහි යෙදෙන්න පෙරාතුව ම එය වෙහෙස ඇති කරන එකෙකැ යි සිතීම, කටයුත්තෙහි යෙදී 'ක්ලාන්ත වීමි'යි සිතීම, යැයුතු ගමනක් ඇති කල 'එහි යෑමෙන් ක්ලාන්ත වෙතැ' යි සිතීම, ගමන් ගොස් 'ක්ලාන්ත වීමි'යි සිතීම, යැපෙන

---

* උපග්‍රන්ථය බලනු.

පමණ ආහාර නොලත් විට 'කුස පුරා ආහාර නො ලද්දෙත් 'ක්ලාන්තයෙමි' යි සිතීම, කුස පුරා ආහාර ලැබ 'දැන් කය බර ය, අකර්මණ්‍ය ය, වෙහෙස යැ'යි සිතීම, ස්වල්ප අසනීපයේ දී 'අසනීප යෙමි නිදමි'යි සිතීම, ලෙඩින් සුවපත් ව 'මෙ සුව ලත් අළුත ම ය, නිදමි' යි සිතීම. (මෙ සේ සිතන්නේ අලස ව නිද්‍රායෙහි ඇලේ. නො ලත් ගුණ ලබන්නට හෝ ලත් ගුණ වඩන්නට හෝ තැත් නො කෙරේ.)

5. **ආරම්භ වස්තු** (වීර්‍ය්‍යට කාරණ) අට : යට කී කුසීද වස්තු අටේ විරුඬ පැත්ත. එනම් : ඒ කටයුතු ඈ කුමක් ඇති වුවත් ඉන් කුසීද නො වී නො ලත් ගුණ ලබන්නට වෑයම් කිරීම ය.

6. **දාන වස්තු** (දීමට කරුණු) අට : අමුත්තකු ගේ පැමිණීම, 'නො දෙන්නෙකැ' යි යන අපවාදයට බිය, දන් ලබන්නහු ඉන් පෙර තමාට දුන් බව සැලැකීම, දැන් තමා ගෙන් දන් ලබන්නහු ගෙන් මතු යමක් ලබන අදහස, දන් දීමේ අනුසස් සැලැකීම, බොජුන් පිසන තමා ඒ නොපිසන්නනට දිය යුතු බව සැලැකීම, දීමෙන් කීර්තිය ලබන්නට බලා පොරොත්තුව, දීම ශමථ විදර්ශන සිතට අලංකාර පිණිස පවත්නා බව සැලැකීම. (මෙයින් එකක් හෝ කිහිපයක් දන් දීමට හේතු වේ.

7. **දානෝපපත්ති** (දාන හේතුයෙන් ඇති වන දෙවෙනි භව) අට : මිනිස් ලොව, චාතුර්මහාරාජික, ත්‍රයත්‍රිංශත්, යාම, තුෂිත, නිර්මාණරති, පරනිර්මිතවශවර්ති යන සප්ත කාම ස්වර්ගීය, සිල් රැක එයට සුදුසු සේ ධ්‍යාන වඩමින් දන් දී බඹ සැප පතන්නහු ලබන බ්‍රහ්මලෝකෝපපත්තිය.

8. **පිරිස්** අට : ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ, චාතුර්මහාරාජික, තාවතිංස, මාර, බ්‍රහ්ම.

9. **ලෝක ධර්ම** අට : ලාභය, අලාභය, යශස, අයශස, නින්දාව, ප්‍රශංසාව, සුඛය, දුඃඛය.

10. **අභිභායතන** අට : සිය සිරුරෑ කෙස් ආදියේ පැහැ අරමුණු කැර කිසුනු පිරියම් වඩා සුවර්ණ හෝ දුර්වර්ණ කුඩා ප්‍රතිභාග නිමිත්තෙහි ලත් ධ්‍යානය, එසේ ම සිය සිරුරෙහි පිරියම් වඩා බාහිර සුවර්ණ හෝ දුර්වර්ණ දෑයෙක වර්ණයෙන් උපන් මහත් ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදවූ ධ්‍යානය, බාහිර ම වූ

සුවණ්ණ හෝ දුවිණ්ණ දූ ම අරමුණු කොට පරිකම් ප්‍රතිභාග නිමිති උපදවා කුඩා ප්‍රතිභාග නිමිත්තෙහි ලත් ධ්‍යානය, එ ම මහත් වූ බාහිර ප්‍රතිභාග නිමිත්තෙහි ලත් ධ්‍යානය, පිරිසිදු නිල් පැහැති සවි නිල බාහිර අරමුණෙක පිරියම් වඩා ලත් ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදවූ ධ්‍යානය, සවි පීතවණ්ණ බාහිර අරමුණෙක පිරියම් වඩා ලත් ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදවූ ධ්‍යානය, සවි රක්තවණ්ණ බාහිර අරමුණෙක පිරියම් කොට ලත් ප්‍රතිභාග නිමිත්තෙහි උපන් ධ්‍යානය, සවි ශ්වේත අරමුණෙක පිරියම් කොට ලත් ප්‍රතිභාග නිමිත්නයෙහි ඉපැදවූ ධ්‍යානය.

11. **විමෝක්ෂ** අට : සිය සිරුරෙහි කෙස් ආදියේ කිසුණු පිරියම් කොට බාහිර සුවණ්ණ හෝ දුවිණ්ණ ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදවූ රූපධ්‍යානසමාපත්ති, සුවණ්ණ හෝ දුවිණ්ණ බාහිර පරිකම් නිමිත්තෙන් ලත් ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදවූ රූපධ්‍යානසමාපත්ති, බාහිර ඉතා පිරිසිදු නිලාදිවණ්ණයෙහි පිරියම් කොට ලත් අතිපවිත්‍ර ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදවූ රූපධ්‍යාන සමාපත්ති, ආකාශානන්තායතන ධ්‍යානසමා-පත්තිය, විඤානානන්තායතන ධ්‍යානසමාපත්තිය, ආකිං-චන්‍යායතන ධ්‍යානසමාපත්තිය, නෛවසංඥානාසංඥයතන ධ්‍යානසමාපත්තිය, නිරෝධසමාපත්තිය.

IX

භාග්‍යවතුන් වහන්සේ වදාළ **නව ධම්**

1. **ආඝාතවස්තු** නවය : 'හේ මට අනර්ථයක් කෙළේ යැ' යි සැලැකීම, 'හේ මට අනර්ථයක් දූන් කෙරේ' යැ යි සැලැ-කීම, 'ඔහු මට අනර්ථයක් මතු කරනැ' යි සැලැකීම, හේ මගේ ප්‍රියයාට අනර්ථයක් කෙළේ' යැ යි සැලැකීම,
,, ,, ,, ,, දූන් කෙරේ ,, ,,
,, ,, ,, ,, මතු ,, ,, ,,
,, ,, අප්‍රියයාට යහපතක් කෙළේ යැ යි ,,
,, ,, ,, ,, දූන් කෙරේ ,, ,,
,, ,, ,, ,, මතු ,, ,, ,,

2. **ආඝාතප්‍රතිවිනය** නවය : එකකු අනෙකකුට තමා රිසි සේ අනර්ථ කිරීම නො විය හැක්කෙකැ යි, මෙය කර්මානුකූල ව වූයෙකැ යි, ඔහුට තමා ක්‍රෝධ කැරුමෙන් වන ලාභයෙක් නැතැ යි ආදි වියින් ආඝාතවස්තු නවයේ දී ම සැලැකීම.

3. **සත්ත්වාවාස*** නවය : නානාත්වකායනානාත්වසංඥී, නානාත්වකායඒකත්වසංඥී, ඒකත්වකායනානාත්වසංඥී, ඒකත්වකාය ඒකත්වසංඥී, අසංඥී, ආකාශානන්තායතනෝපග, විඥානන්තායතනෝපග, ආකිංචන්‍යායතනෝපග, නෛවසංඥානාසංඥායතනෝපග.

4. **අක්ෂණ** (බ්‍රහ්මචර්‍ය්‍යවාසය නො හැකි කාල) නවය : නිරිසතකු වූ කාලය, තිරිසන් වූ කාලය, ප්‍රේත වූ කාලය, අසුර වූ කාලය, දීර්ඝායුෂක දේවනිකායයෙක ඉපිද සිටින කාලය, ප්‍රත්‍යන්ත රටෙක ඉපිද සිටින කාලය, විපරීතදෘෂ්ටිගතික ව සිටින කාලය, අඥාන ව ඉපිද සිටින කාලය, අබුද්ධෝත්පාද කාලය.

5. **අනුපූර්ව විහාර** නවය : ප්‍රථම ධ්‍යාන, ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ථ ධ්‍යාන, ආකාශානන්තායතන ධ්‍යාන, විඥානානන්තායතන ධ්‍යාන, ආකිඤ්චන්‍යායතන ධ්‍යාන, නෛවසංඥානාසංඥායතන ධ්‍යාන, සංඥා වේදයිතනිරෝධ.

6. **අනුපූර්ව නිරෝධ**† නවය : ප්‍රථම ධ්‍යානයෙන් කාමසංඥානිරෝධ ය, ද්විතීය ධ්‍යානයෙන් විතර්කවිචාරනිරෝධය, තෘතීය ධ්‍යානයෙන් ප්‍රීතිනිරෝධ ය, චතුර්ථ ධ්‍යානයෙන් ආශ්වාස ප්‍රශ්වාස නිරෝධය, ආකාශානන්තායතනයෙන් රූපසංඥානිරෝධය, විඥානානන්තායතනයෙන් ආකාශානන්තායතනසංඥානිරෝධ ය, ආකිඤ්චන්‍යායතනයෙන් විඥානානන්තායතනසංඥා-නිරෝධය, නෛවසංඥානාසංඥායතනයෙන් ආකිංචන්‍යායතන නිරෝධ ය, සංඥාවේදයිතනිරෝධයෙන් සංඥාවේදනාවන් ගේ නිරෝධ ය.

X

භාග්‍යවතුන් වහන්සේ වදාළ **දශක**.

1. **නාථකරණ ධර්ම** දශය : සිල්වත් බව, බහුශ්‍රැත බව, කල්‍යාණ මිත්‍රයනට නැමීම, සුවච බව, සබ්‍රම්සරුන් ගේ කුදු මහත් කට යුතු කැරැදීමෙහි දක්ෂ බව, ධර්මකාමී බව, ඉතරිතර චීවර – පිණ්ඩපාත – ශයනාසන – ගිලානප්‍රත්‍යය – භෛසජ්‍යපරිෂ්කාරයෙන් සතුටු වන බව, සතර ප්‍රධාන වීර්‍ය්‍ය ඇති බව, සමෘතිමත් බව, උදයාස්තගාමිනී ප්‍රඥයෙන්* යුත් බව.

---

† පිළිවෙළින් නිරුද්ධ කිරීම * උපග්‍රන්ථය බලනු

2. **කෘත්ස්නායතන** (කසිණ අරමුණු) දශය : පෘථිවි, අප්, තේජස්, වායු, නීල, පීත, ලෝහිත, අවදාත, ආකාශ, විඥාන.

3. **අකුශල කර්මපථ** දශය : ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මෘෂාවාද, පෛශුන්‍ය, පරුෂ වචන, සම්ප්‍රලාප, අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි.

4. **කුශල කර්ම පථ** දශය : යට කී දශ අකුශල කර්මපථයෙන් වැළැකුම්.

5. **ආර්‍ය්‍යවාස** දශය : පංචනිවරණ ප්‍රහීණ කළ බව, ෂඩංගෝපේක්ෂායෙන් යුත් බව, සම්‍යක්ස්මෘතියෙන් රැකි ඉදුරන් ඇති බව, සතර අපශ්‍රය (ප්‍රත්‍යයප්‍රතිසේවන අධිවාසන පරිවර්ජන විනෝදන යන සතරෙහි නුවණින් ක්‍රියා කිරීම්), මෙය ම සත්‍ය යැ යි බොහෝ දෙනා උපදවාලූ නානාවිධ දෘෂ්ටීන් ගෙන් නොබැඳුණු බව, කාමේෂණාදි තුන් සෙවීම් දුරු කළ බව, තුන් මිථ්‍යා කල්පනා දුරලා නො කැලැඹුණු චිත්තසංකල්ප ඇති බව, චතුර්ථ ධ්‍යානයෙන් සංසිඳුණු ආශ්වාස ප්‍රශ්වාස කය ඇති බව, රාගාදි සියලු කෙලෙසුන් ගෙන් මිදුණු සිතැති බව, කෙලෙසුන් ගෙන් තමා මිදුණු බව දන්නා ප්‍රඥාව ඇති බව.

6. **අශෛක්ෂ** (අභිත්) **ධර්ම** දශය* : අශෛක්ෂ සම්‍යග්දෘෂ්ටි, අශෛක්ෂ සම්‍යක්සංකල්ප, අශෛක්ෂ සම්‍යග්වචන, අශෛක්ෂ සම්‍යක්කර්මාන්ත, අශෛක්ෂ සම්‍යගාජීව, අශෛක්ෂ සම්‍යග්ව්‍යායාම, අශෛක්ෂ සම්‍යක්ස්මෘති, අශෛක්ෂ සම්‍යක්සමාධි, අශෛක්ෂ සම්‍යග්ඥාන, අශෛක්ෂ සම්‍යග්විමුක්ති.

සැරියුත් තෙරුන් මෙ සූත්‍ර දෙසා අවසන් කළ කෙණෙහි බුදුරජුහු තෙවරක් සාධුකාර දී මෙය අනුදත්හ.

[මෙහි ඒකකවිකාදි පිළිවෙළින් බුඩදේශනාවේ දහම් කොටස් රැසක් ගළපා සකස් කොට ඇත.]

---

* මෙහි අංක 583 බලනු.

34. දසුත්තර සූත්‍රය.

එක් සමයෙක භගවත් බුදුරජුහු **චම්පා** නුවර අසලැ ගග්ගරා පොකුණු තෙර වැඩ වෙසෙති. එ සෙමෙහි සැරියුත් තෙරණුවෝ භික්ෂූන් අමතා මතු සඳහන් ධර්ම වදාළහ:

1. සියලු කුසල් පිරිමෙහි **බහූපකාර** වූ එක් ධර්මය නම් අප්‍රමාදය (එළැඹ සිටි සිහිය යි.[530]
2. **වැඩිය යුතු එක් ධර්මය** නම් සුඛසහගත කායගතා–සතිය යි.[531]
3. **පිරිසඳ දත යුතු** එක් ධර්මය නම් ආස්‍රවඋපාදානයනට ප්‍රත්‍යය වූ ස්පර්ශය යි.[532]
4. **දුරු කට යුතු** එක් ධර්මය නම් අස්මිමානය යි.[533]
5. **හානභාගිය** (පිරිහීම් පැත්ත ගත්) එක් ධර්මය නම් අයෝනිසෝමනස්කාරය (නොනුවණින් මෙනෙහි කිරීම) යි[534]

---

530. අප්‍රමාදය. (සිහි නොමුළා බව). සංයුත් සඟියේ අප්‍රමාද වග්ගයේ අප්‍රමාදය නානා ප්‍රකාරයෙන් වර්ණනා කර තිබේ. සිල් පිරීම, ඉන්ද්‍රිය සංවරය, භෝජනයෙහි පමණ දැනීම, නිදි පියා භාවනානුයෝගී වීම, ශ්‍රද්ධා, හිරි, ඔතප්, බහුශ්‍රුත බව, වීර්‍ය්‍ය වැඩීම, එළැඹ සිටි සිහිය, ප්‍රඥාව යන සප්ත සද්ධර්ම, විදර්ශනා ඥානය මුහුකුරුවාලීම, අර්ථප්‍රතිසංවිදාදි පිළිසැඹියා නුවණ, ශීල සමාධි ප්‍රඥා, විමුක්ති විමුක්තිඥානදර්ශන යන ස්කන්ධ පස වැඩීම, කාරණ අකාරණ දැක, මහාවිහාර සමාපත්ති, ආර්‍ය්‍යසත්‍යාවබොධ, සතිපට්ඨාන, බෝධිපාක්ෂිකධර්ම, විදර්ශනාඥානාදි අෂ්ටවිද්‍යා යන මේ සියලු ධර්මයන්හි අප්‍රමාදය මහොපකාරී වේ.

531. සුඛසහගත කායගතා සතිය යනු පළමු දෙවෙනි තෙවෙනි යන තුන් රූපධ්‍යාන සිත්හි යෙදුණු (අනාපාන චතුඉරියපථාදි විසින්) කය අරමුණු කොට පැවැති සිහිය යි.

532. ස්පර්ශය : මෙහි ස්පර්ශ යන්නෙන් කාමාවචර රූපාවචර අරූපාවචර සිත්හි වූ ස්පර්ශ චෛතසිකය අභිප්‍රෙත යි. ස්පර්ශය තීරණ ප්‍රඥායෙන් පිරිසිඳ ගත් කල එය අනුව සෙසු තත්සම්ප්‍රයුක්ත අරූප ධර්ම ද ඒ සියල්ල අනුසාරයෙන් රූප ධර්ම ද පිරිසිඳ දැනගන්නා ලද්දේ වෙයි. එ බැවින් මේ අර්ථය සලකා ස්පර්ශය පමණක් මෙහි දක්විණි.

533. අස්මිමානය: රූපාදි ස්කන්ධපසින් එකක් හෝ වැඩියක් කෙරෙහි 'මම් වෙමි'යි මානය අස්මි මාන නමි. මෙය දුරු වූ විට රහත්වූයේ නම් වේ. රූපරාගාදිය ද දුරුකටයුතු ම තිබිය දී ඔවුන් සඳහන් නොකොට අස්මිමානය පමණක් සඳහන් කරන ලද්දේ මෙය සත්කායදෘෂ්ටියට සමාන හෙයින් සෙස්සට වඩා දළ අකුශලයක් බැවිනි.

534. අයෝනිසෝ මනස්කාරය: (නොනුවණින් මෙනෙහි කිරීම) නම් අනිත්‍ය-දුඃඛාදීන් නිත්‍ය සැප ආදි විසින් වරදවා සැලැකීම යි.

6. **විශේෂයට පමුණුවන එක් ධර්මය** නම් යෝනිසෝමනස්කාරය (නුවණින් මෙනෙහි කිරීම)යි.

7. **දුක සේ පසක් කටයුතු එක ධර්මය** නම් ආනන්තරික චිත්ත සමාධිය (විදර්ශනාවට අනතුරු මාර්ගය) යි.[535]

8. **ඉපැදවිය යුතු එක් ධර්මය** නම් අකෝප්‍ය නුවණ[536] (ප්‍රත්‍යවේක්ෂණ ප්‍රඥාව) යි.

---

535. ආනන්තරික චිත්ත සමාධිය: අත් තන්හි ආර්‍ය්‍යමාර්ග සිතට අනතුරු ම ලැබෙන ඵල සිත මෙ නමින් දක්විණි. මෙ තන්හි ව්‍යාඛ්‍යා විපස්සනාවට අනතුරු ම ලැබෙන මාර්ග සිත අභිප්‍රෙත යි. විදර්ශනාවට අනතුරු ම ලැබෙන බැවින් හෝ ඒ මාර්ගය තමා අනන්තර ඵලදයි බැවිනි.

536. අකෝප්‍ය නුවණ: අන් තන්හි ඵලචිත්ත සම්ප්‍රයුක්ත ප්‍රඥාව මෙ නමින් අභිප්‍රෙත යි. මෙහි ව්‍යාඛ්‍යා ප්‍රත්‍යවේක්ෂණ ප්‍රඥාව මෙයින් හඟවනු ලදී. ප්‍රත්‍යවේක්ෂණ ප්‍රඥා යනු තමා ලත් මාර්ග ඵල ආපසු හැරී දකිම දනිම කරන ප්‍රඥාව ය. සෝවාන් වන්නහුගේ ශ්‍රොතආපත්තිමාර්ගවීථියෙහි සෝවාන් ඵලය අවසන් චිත්තය භවාංගයට බසී. ඉක්බිති භවාංගය සිඳ මනෝද්වාරාවර්ජන සිත ද එය ක්‍ෂණයක් පැවැත නිරුද්ධ වීමට අනතුරු ව පිළිවෙළින් යථෝක්ත ශ්‍රෝතආපත්ති මාර්ගචිත්තය පස්විසා බලන ජවන සිත් සතක් ද පහළ වෙති. නැවත ඒ භවාංගයට බැස එ නයින් ම ශ්‍රොතආපත්ති ඵල ආදීන් පස්විසන ජවනයෝ ද පහළ වෙති. මෙසේ මාර්ග සිත ද ඵල සිත ද ප්‍රහීණ ක්ලේශ ද ඉතිරි කෙලෙස් ද නිවන ද යන ප්‍රත්‍යවේක්‍ෂා කෙරේ. මා ආයේ මෙ මඟිනැ යි මඟ සැලකීම මාර්ගප්‍රත්‍යවෙක්‍ෂණය යි එයින් මේ මාලත් අනුසස යැ යි ඵලය සැලකීම ඵල ප්‍රත්‍යවෙක්‍ෂණය යි. ඒ හෙතුයෙන් මෙ නම් කෙලෙස් ප්‍රහීණ වී යැයි බැලීම ප්‍රහීණක්ලේශප්‍රත්‍යවේක්‍ෂණය යි.

මෙ නම් කෙලෙස් ඉතිරි ව ඇතැයි බැලීම වධ්‍ය (අවශිෂ්ට) ක්ලේශ ප්‍රත්‍යවේක්‍ෂණය යි.

මෙ නම් ධර්මය අරමුණු වශයෙන් ලදිමි යි නිවන බැලීම නිර්වාණප්‍රත්‍යවේක්‍ෂණය යි.

මෙසේ සෝවාන් ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ ප්‍රත්‍යවේක්‍ෂණ ඥාන පසෙකි. මෙ පරිදි ම සකෘදගාමි අනාගාමි ඵලයනට පැමිණි ආර්‍ය්‍යයන්ගේ ද පසක් පසක් බැගින් ප්‍රත්‍යවේක්‍ෂණ ඥාන දශයෙකි. රහත් වූවහුගේ ව්‍යාඛ්‍යා අවශිෂ්ටක්ලේශ නැත්තෙන් ඒ සම්බන්ධ ප්‍රත්‍යවේක්‍ෂණයෙක් ද නැත. ඔහුට ඇති වනුයේ සෙසු කරුණු සතර පිළිබඳ ප්‍රත්‍යවේක්‍ෂණය යි. මෙසේ සතර ඵලයනට පැමිණි ආර්‍ය්‍යපුද්ගලයන්ගේ සියලු ප්‍රත්‍යවේක්‍ෂණ ඥාන එකුන්විස්සකි.

ප්‍රත්‍යවේක්‍ෂණ යනු (ප්‍රති + අව × ඊක්‍ෂණ) නැවැත (ආපසු හැරී) බොහෝ සෙයින් දක්මම ය, දැනීම ය. එහෙයින් කියනු ලදී. සද්ධම්මපකාසිනියෙහි "පච්චවෙක්ඛණෙ ඤාණන්ති නිවත්තිත්වා භුසං පස්සනං ජානනං ඤාණං"

9. **විශිෂ්ට නුවණින්** (ඥාතපරිඥයෙන්) **දතයුතු** එක් ධර්මය නම් සියලු සතුන් ප්‍රත්‍යයයෙන් සිටුනා බව යි.[537]

10. සාක්‍ෂාත් කටයුතු එක් ධර්මය නම් අකෝප්‍ය චේතෝවිමුක්තිය (අර්හත්ඵල විමුක්තිය)[538] යි.

II

1. **හැම තන්හි උපකාර** වූ ධර්ම දෙක: සිහිය හා නුවණ (සතිසම්පජඤ්ඤය) යි[539]

2. **වැඩිය යුතු ධර්ම** දෙක: ශමථයත් විදර්ශනාවත් ය.[540]

3. **පිරිසිඳ දතයුතු ධර්ම** දෙක: නාමයත් රූපයත් ය.[541]

---

537. ප්‍රත්‍යයයෙන් සිටුනා: මෙය පෙළෙහි ආහාරට්ඨිතිකා (ආහාරයෙන් සිටිනා) යැ යි ආයේය. ආහාර යනු ප්‍රත්‍යය යන අර්ථ ඇත්තේ යි. මෙහි ඨිතිය (සිටීම) නම් ඒ ඒ චිත්තාදීන්ගේ ක්‍ෂණික ස්ථිතිය (ඇති බව) යි.

සියලු සංස්කෘත (සංඛත) ධර්මයනට ප්‍රත්‍යය ය අවශ්‍ය ය. ඒ නානා-විධ වූ ප්‍රත්‍යයය ද ඵලය ආහරණය (ඵලය පමුණුවන උපදවන) බැවින් ආහාර නමි.

මේ ප්‍රත්‍යයයන් දත් කල ප්‍රත්‍යයෝත්පන්න ධර්ම ද දැනගන්නා ලද්දේ නමි වේ. ඔවුන් අන්‍යෝන්‍යාපේක්‍ෂක බැවිනි.

538. අර්හත්ඵල විමුක්තිය: සියලු කෙලෙසුන්ගෙන් සිත මිදුණු බැවින් මේ චේතොවිමුක්ති යැයි ද නොසැලෙන නො පිරිහෙන බැවින් අකොප්‍ය යයි ද කියනු ලැබේ. මෙසේ අර්හත්ඵල විමුක්තිය අකොප්‍ය චෙතොවිමුක්ති නමි.

539. සම්පජඤ්ඤ: සම්පජඤ්ඤ නම් මනා කොට අනිත්‍යාදීන් දන්නා බව යි. මෙ සිහි නුවණ දෙක අප්‍රමාදදිය සේ සිල් පිරිම් ආදි සියලු කුසලයෙහි ම මහෝපකාරී ය.

540. ශමථ විදර්ශනා: කාමච්ඡන්දාදි සතුරු ධර්ම සංසිඳුවන බැවින් සමාධි ය ශමථ නමි. අනිත්‍යාදි වශයෙන් විවිධ ආකාරයෙන් ධර්මයන් දැකීම (ප්‍රඥාව) විදර්ශනා (විපස්සනා) නමි.

541. නාම රූප: අරමුණට අභිමුඛ ව නැමෙන්නෝ ය යන අරුතින් චිත්ත චෛතසිකයෝ නාම නමි වෙති. චිත්ත චෛතසිකයෝ ඔවුනොවුන් අරමුණට නමත්. එහෙයින් ද නාම නම් හ. තමා කෙරෙහි කුශල චිත්ත චෛතසිකයන් නමාලන බැවින් නිවන ද නාම නමි. මෙ තන වනාහි නාම යන්නෙන් ලෞකික චිත්ත චෛතසික අභිප්‍රෙත ය. රූප යනු ශීත උෂ්ණාදි-යෙන් පෙරළෙන ස්වභාව ධර්ම සමූහය යි. ඕහු නම් පඨවි ආදි මහාභූත රූප සතරත් ඔවුන්ගේ උපාදාය රූප විසිහතරක් ද යි යන සියලු අටවිසි රූප යි.

4. **දුරු කළ යුතු ධර්ම** දෙක: අවිද්‍යාවත් භවතෘෂ්ණාවත් ය.[542]

5. **හානභාගියා** (අපායගාමි) **ධර්ම** දෙක: දුර්වච බවත් පාප මිත්‍රයන් ඇති බවත් ය.

6. **විශෙෂභාගියා** (ගුණ විශේෂයට පමුණුවන) **ධර්ම** දෙක: සුවච බවත් කල්‍යාණ මිතුරන් ඇති බවත් ය.

7. **දුක සේ පිළිවිදිය යුතු ධර්ම** දෙක: සත්වයන්ගේ කෙලෙසීමට හේතුප්‍රත්‍යයයත්, විශුද්ධියට හේතුප්‍රත්‍යයයත් ය.

8. **ඉපැදවිය යුතු ධර්ම** දෙක: ක්ෂයයෙහි නුවණ, අනුත්පාදයෙහි නුවණ.[543]

9. **විශිෂ්ට නුවණින් දතයුතු ධර්ම** දෙක: සංස්කෘත ධාතුව (පඤ්චස්කන්ධය) ත් අසංස්කෘතධාතුව (නිවන) ත් ය.[544]

10. **සාක්ෂාත් කළ යුතු ධර්ම** දෙක: ත්‍රිවිද්‍යාත් අර්හත්ඵලයත් ය.[545]

III

1. **හැම තන්හි බහූපකාර ධර්ම** තුන: සත්පුරුෂාශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, ධර්මානුධර්මප්‍රතිපත්තිය.

2. **වැඩිය යුතු ධර්ම** තුන: සවිතර්ක සවිචාර (ප්‍රථමධ්‍යාන) සමාධිය, අවිතර්ක විචාරමාත්‍ර (ද්විතීයධ්‍යාන) සමාධිය, අවිතර්ක අවිචාර (තෘතීය, චතුර්ථ, පංචම ධ්‍යාන) සමාධිය.

3. **පිරිසිඳ දත යුතු ධර්ම** තුන: සුඛවේදනා, දුඃඛවේදනා, උපේක්ෂාවේදනා.

---

542. අවිද්‍යා භවතෘෂ්ණා: අවිද්‍යා යනු දුඃඛ සමුදය නිරෝධ මාර්ග යන සතර සත්‍යයන් ද පූර්වාන්ත (අතීත ස්කන්ධ කොටස) අපරාන්ත (අනාගතස්කන්ධ) ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්ම යන මොවුන් ඇති සැටියෙන් නොදැක්ම යි. භවතණ්හා යනු කාමාදි භවයන් පැතීම (ඕනෑකම) යි.

543. ක්ෂයයෙහි නුවණ: (ඛයෙඤාණං) යනු කෙලෙස් ක්ෂය කරන මාර්ගයෙහි වූ ප්‍රඥා චෛතසිකය යි. අනුත්පාදයෙහි නුවණ: (අනුප්පාදෙ ඤාණං) ඒ ඒ මගින් වැනැසිය යුතු ක්ලේශයන් ගේ අනුත්පාදවසානයෙහි උපන් ඵලසිත්හි වූ නුවණ අනුත්පාදයෙහි නුවණ නම්.

544. සංස්කෘත ධාතු: නොයෙක් ප්‍රත්‍යයයන් විසින් එකතු ව කරන ලද්දෝ ය යන අරුතින් පංචස්කන්ධයෝ සංඛත (සංස්කෘත) ධාතු නමි. එසේ නො වූ බැවින් නිවන අසංඛත (අසංස්කෘත) ධාතු නම්.

545. විද්‍යා: පෙරජාති දක්නා නුවණ, දිවැස, කෙලෙස් නසනා නුවණ යන තුන ත්‍රි විද්‍යා (ඥාන තුණ) නමි.

4. **දුරු කටයුතු ධර්ම**[546] තුන: කාමතෘෂ්ණා, භවතෘෂ්ණා, විභවතෘෂ්ණා.

5. **අපායගාමී ධර්ම** තුන: ලෝභ ය, ද්වේෂ ය, මෝහ ය.

6. **විශේෂගාමී ධර්ම** තුන: අලෝභ, අද්වේෂ, අමෝහ.

7. **දුක සේ පිළිවිදිය යුතු ධර්ම** තුන: කාමනිඃශරණය (අනාගාමී මාර්ගය), රූපනිඃශරණය (අර්හත්ත්ව මාර්ගය), සර්වසංස්කාරනිඃශරණය (අර්හත්ත්ව ඵලය).

8. **ඉපැදවිය යුතු ධර්ම** තුන: අතීත ස්කන්ධ කොටසෙහි නුවණ, අනාගත ස්කන්ධ කොටසෙහි නුවණ, වර්තමාන ස්කන්ධ කොටසෙහි නුවණ.[547]

9. **විශිෂ්ට නුවණින් දත යුතු ධර්ම** තුන: කාම ධාතු, රූප ධාතු, අරූප ධාතු.[548]

10. **සාක්ෂාත් කටයුතු ධර්ම** තුන: පූර්වනිවාසානුස්මෘති ඥාන, ච්‍යුතොපපාත ඥාන, ආස්‍රවක්ෂය ඥාන.[549]

IV

1. **හැම තන්හි බහූපකාර ධර්ම** සතර: සුදුසු දේශයේ විසීම, සත්පුරුෂ සේවනය, තමා ශ්‍රද්ධාදි ගුණයන්හි පිහිටුවීම, පෙර කළ පින් ඇති බව යන **චතුශ්චක්‍රසම්පත** යි.

2. **වැඩිය යුතු ධර්ම** සතර: සතිපට්ඨානයෝ යි.

3. **පිරිසිඳ දතයුතු ධර්ම** සතර: කබලීකාරාදි සතර ආහාර[550]

---

546. කාමතෘෂ්ණා නම් පංච කාමගුණික රාගය යි. භවතෘෂ්ණා නම් රූපාරූප භවයන්හි ඇල්ම යි, ශාශ්වත දෘෂ්ටි සහගත රාගය යි, භව වශයෙන් ප්‍රාර්ථනා යි. විභවතෘෂ්ණා නම් උච්ඡේදදෘෂ්ටි සහගත රාගය යි.

547. මේ අතීතාංශාදි අංශත්‍රයයේ නුවණ යි.

548. කාමධාතු රූපධාතු අරූපධාතු යනු කාමභවාදි භවතුන ය.

549. පූර්වනිවාසානුස්මෘතිඥාන යනු පෙර ජාති සිහි කරන නුවණ යි. ච්‍යුතොපපාතඥාන නම් මෙයින් මැරි උපදිනවුන් ච උපන් කෙණෙහි දක්නා දිවැස යි. ආස්‍රවක්ෂයඥාන නම් සතර මාර්ග ඥාන යි.

550. ආහාර: යනු ප්‍රත්‍යයයෝ යි කබලීකාරාහාර, ස්පර්ශාහාර, මනොසංචෙතනාහාර, විඥානාහාර යනු ඒ සතර යි.

කබලීකාරාහාර නම් බත් කැඳ ආදී භෝජනයේ ඕජස යි. මෙයින් ශරීරයේ ඕජටඨමකරූප (පඨවි ආපො තෙජො වායො වණ්ණ ගන්ධ රස ඕජො යන මෙන් නො කට හැකි සේ එකට පවත්නා අටින් යුත් රූප) නිපැදේ. ඒ රූපයන් ආහරණය, ගෙණ ඊම, ඉපැදවීම කරන බැවින් ඒ ආහාර නම්.

4. **දුරු කටයුතු ධර්ම** සතර: කාමෞඝාදි සතර ඕඝයෝ යි

5. **හානභාගිය** (අපායගාමී) **ධර්ම** සතර: කාමයෝගාදි සතර යෝගයෝ යි.

6. **විශේෂ භාගිය** (අභිවෘද්ධියට පමුණුවන) **ධර්ම** සතර: කාමයෝගාදි සතරින් මිදීම යි.

7. **දුකසේ පිළිවිදිය යුතු ධර්ම**[551] සතර: හානභාගික සමාධිය, ස්ථිතිභාගික සමාධිය, විශේෂභාගික සමාධිය, නිර්වේද-භාගික සමාධිය.

8. **උපැදවිය යුතු ධර්ම** සතර: දුකෙහි නුවණ, අන්වයයෙහි නුවණ, පර්යයෙහි නුවණ, සංවෘතියෙහි නුවණ.

9. **විශිෂ්ට නුවණින් දත යුතු ධර්ම** සතර: දුඃඛාදි චතුස්සත්‍යය.

10. **සාක්ෂාත් කට යුතු ධර්ම** සතර: ශ්‍රෝතආපත්තිඵලාදි සතර ශ්‍රාමණ්‍ය ඵල.

ඵස්සාහාර නම් චක්ඛු සම්ඵස්ස සොත සම්ඵස්ස ඝාණ සම්ඵස්සාදි සවැදෑරුම් ස්පර්ශය යි. මෙය සුඛ දුක්ඛ උපෙක්ඛා යන තුන් වේදනා ආහරණය කරන (උපදවන) බැවින් ආහාර නම් වේ. 'ඵස්සපච්චයා වේදනා' යනු සිහි කට යුතු යි.

මනෝසංචෙතනා: (සිතේ සංචේතනා) නම් ලෞකික කුශලාකුශල චේතනාවෝ යි. ඔව්හු තුන් භවයන් ආහරණය [උපදවන, ඇති කරන] බැවින් ආහාර නම් හ.

විඤ්ඤාණාහාර නම් එකුන්විසි ප්‍රතිසන්ධිවිඥානයෝ යි. නාම වශයෙන් සන්තීරණ දෙසිත, කාමාවචර මහාවිපාක සිත් අට, රූපාවචර විපාක සිත් පස, අරූපාවචර විපාක සිත් සතර යන මොහු යි. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාම රූප දෙක ආහරණය කරන බැවින් මොහු ආහාර නමු.

551. හානභාගික සමාධිය. දුර්වල ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් ඇති ප්‍රමාදවිහාරි පුද්ගලයා ගේ ලෞකික සමාධිය කාමච්ඡන්දාදි සතුරු ධර්ම සිත් සතන්හි පහළ වීමෙන් පිරිහෙන පැත්ත ගන්නේ වේ. එසේ වූ පිරිහෙන අතට නැමුණු සියලු ලෞකික සමාධිය හානභාගික සමාධි නම්. ශ්‍රද්ධාදි ඉඳුරන් දුර්වල වුවත් අප්‍රමාදවිහාරි පුද්ගලයා සමාධියෙන් නොපිරිහේ. විශේෂ වැඩීම් රහිත වුවත් ඒ නො නැසී සිටින්නේ වේ. එ බැවින් එවැන්නහුගේ ලෞකික සමාධිය ස්ථිතිභාගික නම්. තෘෂ්ණාචරිත ඇති ශ්‍රද්ධාදි ඉඳුරන් තියුණු පුද්ගලයා ගේ සමාධිය වර්ධන පක්ෂය ගන්නේ වේ. ඒ විශේෂභාගික නම්. තියුණු ශ්‍රද්ධාදි ඉඳුරන් ඇති දෘෂ්ටිචරිතයා ගේ සමාධිය විරාග පැත්ත ගන්නේ වේ. ඒ නිර්වේදභාගික නම්.

V

1. **බහූපකාර ධර්ම** පස: ප්‍රධානිකාංග **පස.**[552]

2. **වැඩිය යුතු ධර්ම** පස: ප්‍රීතිස්ඵරණතා (ප්‍රීතිය පතුරුවමින් පහළ වන ප්‍රථම ද්විතීය ධ්‍යාන දෙක්හි ප්‍රඥව), සුඛස්ඵරණතා (ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යානයන්හි ප්‍රඥව), චේතස් ස්ඵරණතා (පර සිත් දන්නා නුවණ), ආලෝකස්ඵරණතා (දිවැස), ප්‍රත්‍යවේක්‍ෂණ නිමිත්ත (ප්‍රත්‍යවේක්‍ෂණ ඥනය.)

3. **පිරිසිඳ දත යුතු ධර්ම** පස: පංච උපාදානස්කන්‍ධ

4. **දුරු කට යුතු ධර්ම** පස: පංච නීවරණ[553]

5. **හානභාගිය ධර්ම** පස: පංචචේතොඛීල (චේතස්ඛීල)[554]

6. **විශෙෂභාගිය ධර්ම** පස: ශ්‍රද්ධාදි පංචෙන්ද්‍රියයෝ යි.[555]

7. **දුක සේ පිළිවිදිය යුතු ධර්ම** පස: පංචනිඃශරණීය ධාතු[556]

8. **ඉපැදවිය යුතු ධර්ම** පස: දැනුත් මතුත් සමාධිය සැප එළවන බව දැනීම, සමාධිය ගේ ආර්‍ය්‍ය බව නිරාමිස බව දැනීම, උතුමන් විසින් සමාධිය සේවිත බව දැනීම, සමාධිය ගේ ශාන්තප්‍රණීතතාදිය දැනීම, තමා සිහි ඇතිව ම සමාධියට සමවැදීම සිහි ඇතිව ම ඉන් නැගිටීම යන දෙකරුණ දැනීම යන පස් නුවණ ඇති සම්‍යක්සමාධි පස.

---

552. ප්‍රධානිකාංගපස. විදසුන් වඩනට වීර්‍ය්‍ය කරන භික්‍ෂුව කෙරෙහි විය යුතු ගුණාංග පස: ශ්‍රද්ධාව, නීරෝග බව, අසඨ බව, ආරබ්ධ වීර්‍ය්‍ය ඇති බව, උදයව්‍යයය දක්නා ප්‍රඥව ඇති බව

553. නීවරණ=සිත භාවනාලන්නෝ. බැඳ තබන්නෝ, බාද කරන්නෝ යන අරුතින් නීවරණ නම් වෙත්. කාමච්ඡන්‍ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච-කුක්කුච්ච, විචිකිච්ඡා යන පස් දෙන යි. මින් නීවරණ බවට පැමිණී කාමච්ඡන්‍දය අර්හත්ත්වමාර්ගයෙන් ද සංයොජන බවට පැමිණී කාමරාගානුශයය අනාගාමි මඟින් ද ථීනමිද්ධ දෙක රහත් මඟින් ද උද්ධච්චකුක්කුච්ච දෙක අනාගාමි මඟින් ද, විචිකිච්ඡාව සෝවාන් මඟින් ද වධ්‍ය [දුරු කට යුතු]යි.

554. චෙතොඛීල යනු සිතේ තද බව යි. ඔහු නම් ශාස්තෘන් වහන්සේ ගැන සැකය, ධර්මය ගැන සැකය, සංඝයා ගැන සැකය, ශික්‍ෂාව ගැන සැකය, සබ්‍රම්සරුන් කෙරෙහි කෝපය යන පස යි.

555. ශ්‍රද්ධාදි පංචෙන්ද්‍රිය: ශ්‍රද්ධා, වීර්‍ය්‍ය, ස්මෘති, සමාධි, ප්‍රඥ යන පස

556. නිඃශරණීය ධාතු යනු විසංයුක්ත [වෙන්වූ] සවභාව යන අර් යි. නෛෂ්කාම්‍යය (කාමයෙන් වෙන් වීම,) මෛත්‍රී ධ්‍යානය (ව්‍යාපාද නිඃශරණය,) කරුණාධ්‍යානය (විහිංසා නිස්සරණය) අරූපධ්‍යානය (රූපනිඃශරණය) අර්හත්ත්වඵලසමාපත්ති සිත (සත්කායනිඃශරණය) යනු ඒ නිඃශරණීය ධාතු පස යි.

9. **විශිෂ්ට නුවණින් දත යුතු ධර්ම** පස: පංච විමුක්ත්‍යායතනයෝ.[557]

10. **සාක්ෂාත් කටයුතු ධර්ම** පස: ශීලස්කන්ධ, සමාධිස්කන්ධ, ප්‍රඥස්කන්ධ, විමුක්ති ස්කන්ධ, විමුක්තිඥානදර්ශන ස්කන්ධ යන පංචස්කන්ධය.

VI

1. **බහූපකාර ධර්ම** සය නම් සාරාණීය ධර්ම සය යි[558]

2. **වැඩිය යුතු ධර්ම** සය: බුද්ධානුස්මෘති, ධර්මානුස්මෘති, සංඝානුස්මෘති, ශීලානුස්මෘති, ත්‍යාගානුස්මෘති, දේවතානුස්මෘති යන සය යි.

3. **පිරිසිඳ දතයුතු ධර්ම** සය: චක්ෂුරායතනාදි ආධ්‍යාත්මික ෂඩායතනය යි.[559]

4. **දුරු කටයුතු ධර්ම** සය: රසතෘෂ්ණාදි තෘෂ්ණාසමූහ සය යි.

5. **හානභාගීය ධර්ම** සය: අගෞරව සය යි.[560]

---

557. විමුක්ත්‍යායතන නම් මිදීමට කාරණ වූ ධර්මයෝ යි. ශාස්තෘන් වහන්සේගෙන් හෝ ගරු තන් ලත් තදිය ශ්‍රාවකයකු ගෙන් බණ ඇසීම, අසා පුහුණු කළ දහම් අන්හට දෙසීම, අසා දත් ධර්මය විස්තර ලෙස සජ්ඣායනා කිරීම (පාඩම් කීම,) අසා දත් ධර්මය ඔස්සේ සිත යවා බැලීම, ඇදුරන්ගු වෙතින් කමටහන් ගෙන එයඅනුව නුවණ වැඩීම යනු එ විමුක්ත්‍යායතන පස යි. මෙකී බණ ඇසීම් ආදි එක එක කාරණයක් දියුණු කරන පමණට එහි අර්ථයත් ධර්මය (පාලිය) ත් අනේ දැනීම වැඩේ. එයින් ඔහුට සතුට ඇති වේ. සතුටු වූවහුට ප්‍රීතිය වේ. ප්‍රීතයහු ගේ නාම කය සංසිඳේ. එසේ වූ තැනැත්තේ සුඛිත වේ. සුඛිත වූවහුගේ සිත එකඟ වේ. මෙහි කී පරිදි ප්‍රීතිය ලැබූ තැනැත්තේ එය අතරෙහි වැටී යෑ නො දී කමටහන් වඩා රහත් බව ලබන්නට සමර්ථ වේ.

558. සාරාණීය ධර්ම: (සංරංජනීය) සතුට සමගිය ඇති කරවන ධර්ම: මෛත්‍රීසහගත කායකර්මය, මෛත්‍රීසහගත වාක්කර්මය, මෛත්‍රීසහගත මනඃකර්මය, ලත් ලාභය සබ්‍රම්සරුන් හා සමග ව පරිභෝග කිරීම, සෞශීල්‍යයෙන් සමාන බව, සම්‍යග්දෘෂ්ටියෙන් සමාන බව යන සදෙන සාරාණීය ධර්ම නම්.

559. ආධ්‍යාත්මික ෂඩායතන: චක්ෂුස්, ශ්‍රෝත්‍ර, ඝ්‍රාණ, ජිහ්වා, කාය, මනඃ.

560. අගෞරව සය: ශාස්තෘ, ධර්ම, සංඝ, ශික්ෂා, අප්‍රමාද, ප්‍රතිසංස්තාර (වෙත පැමිණියහු සාදර ව පිළිගැන්ම) යන සයට ගෞරව නොකිරීම.

6. **විශෙෂභාගිකා ධර්ම සය:** ගෞරව සය යි.[561]

7. **දුකා සේ පිළිවිදිය යුතු ධර්ම සය:** නිඃශරණීය ධාතුසය.[562]

8. **ඉපැදවිය යුතු ධර්ම සය:** රූපාදි සාරමුණෙන් සොම්නස හෝ දොම්නස ඇති නොකොට උපේක්ෂක ව සිහි නුවණින් යෙදී විසීම (ෂඩංගෝපේක්ෂාව).

9. **විශිෂ්ට නුවණින් දත යුතු ධර්ම සය:** දස්සනානුත්තරිය සවණානුත්තරිය, ලාභානුත්තරිය, සිකඛානුත්තරිය, පරිචරියා-නුත්තරිය, අනුස්සතානුත්තරිය[563] යන නිරුත්තර (උතුම් ම) ධර්ම සය.

10. **සාක්ෂාත් කටයුතු ධර්ම සය:** ඍද්ධිවිධඥාන, දිව්‍ය ශ්‍රෝත්‍රඥාන, පරචිත්ත විජානනඥාන, පූර්වනිවාසානුස්මෘතිඥාන, දිව්‍යචක්‍ෂුර් ඥාන, ආශ්‍රවක්ෂයඥාන යන ෂඩභිඥවෝ යි.

VII

1. **බහූපකාර ධර්ම සත:** ශ්‍රද්ධාධන, ශීලධන, හ්‍රීධන, අපත්‍රපා-ධන, ශ්‍රැතධන, ත්‍යාගධන, ප්‍රඥධන යන සප්තාර්‍ය්‍ය ධනයෝ යි.

2. **වැඩිය යුතු ධර්ම සත:** සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන බෝධ්‍යංග සත යි.

---

561. ගෞරව සය=ශාස්තෘ ධර්මාදි සයට ගෞරව කිරීම.

562. නිඃශරණීය ධාතු: විසංයුක්ත (වෙන් වූ) සවභාවයෝ මොහු සදෙනෙකි. මෛත්‍රීචිත්තවිමුක්තිය (මෛත්‍රීධ්‍යානය,) කරුණා චිත්තවිමුක්තිය, මුදිතාචිත්තවිමුක්තිය, උපේක්ෂාචිත්තවිමුක්තිය, අනිමිත්ත චිත්තවිමුක්තිය (අහිත්ඵලසමාපත්තිය), අස්මිමානසමුද්ඝාතය යන මොහු සදෙන පිළිවෙළින් ව්‍යාපාද, විහිංසා, අරති, රාග, සියලු නිමිති (රාගනිමිත්තාදි වූ ද රූප නිමිති ආදිවූ ද නිත්‍ය නිමිති ආදි වූ ද සියලු නිමිති) විචිකිච්ඡා යන සදෙනා ගෙන් වෙන් වූවෝ වෙති.

563. දශීන අතුරෙන් නිරුත්තර (දෙවු) වූයේ දස්සනානුත්තරිය නම් වේ. සෙස්සෙහි ද අව මේ අනුසාරයෙන් දත යුතු. සැදැහැවත්හු දුනී භක්තියෙන් බුදුරජුන් හෝ භික්ෂුසංඝයා හෝ දැකීම කසිත අරමුණු ආදියක් දැකීම දර්ශනානුත්තරික (උතුම් ම දැකීම) නම් එ වැන්නාහු ම රත්නත්‍රයගුණකථා හෝ බණ ඇසීම ශ්‍රවණානුත්තරික නම්. ශ්‍රද්ධාදි සප්තාර්‍ය්‍ය ධන ලැබීම ලාභානුත්තරික නම්. අධිශීලාදි ශික්‍ෂා තුන පිරීම ශික්‍ෂානුත්තරික නම්. තෙරුවනට වතාවත් කිරීම පරිචර්‍ය්‍යානුත්තරික නම්. රත්නත්‍රයයේ ගුණ සිහි කිරීම අනුස්මෘත්‍යනුත්තරික නම්.

3. **පිරිසිඳ දත යුතු ධර්ම** සත: නානත්තකාය නානත්තසඤ්ඤී (මිනිස්සු, ඇතැම් දෙව්හු, විනිපාතිකයෝ), නානත්තකාය ඒකත්තසඤ්ඤී (පළමුවෙන් උපන් බ්‍රහ්මකායික දෙව්හු), ඒකත්තකාය නානත්තසඤ්ඤී (ආභස්සර දෙවියෝ), ඒකත්තකාය ඒකත්තසඤ්ඤී (සුභකිණ්ණක දෙවියෝ), ආකාශානන්ත්‍යායතනෝපග දෙවියෝ, විඥානානන්ත්‍යායතනෝපග දෙවියෝ, ආකිංචන්‍යායතනෝපග දෙවියෝ යන සප්ත විඥාන-ස්ථිතිහු යි.

4. **දුරු කට යුතු ධර්ම** සත: කාමරාගානුසය, පටිඝානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය, මානානුසය, භවරාගානුසය, අවිජ්ජානුසය යන අනුශය සත යි.[564]

5. **හානභාගිය ධර්ම** සත: අශ්‍රද්ධාව, අහිරිකය, අනොත්තප්පය, අල්පශ්‍රැත බව, කුසීද බව, මුළා සිහිය, දුෂ්ප්‍රාඥ බව යන සත් අසද්ධර්මයෝ ය.

6. **විශේෂ භාගිය ධර්ම** සත: සප්ත අසත් ධර්මයනට ප්‍රතිපක්ෂ ශ්‍රද්ධා හ්‍රී ආදි සප්ත සද්ධර්මයෝ යි.

7. **දුකසේ පිළිවිදිය යුතු ධර්ම** සත: ධර්මඥතා, අර්ථඥතා, ආත්මඥතා, මාත්‍රඥතා, කාලඥතා, පර්ෂද්ඥතා, පුද්ගලඥතා යන සත්පුරුෂ ධර්ම සත යි.[565]

8. **උපැදවිය යුතු ධර්ම** සත: අනිත්‍යසංඥා, අනාත්මසංඥා, අශුභසංඥා, ආදීනවසංඥා, ප්‍රහාණසංඥා, විරාගසංඥා, නිරෝධ-සංඥා.

9. **විශෙෂයෙන් දත යුතු ධර්ම** සත: සප්ත නිර්දශ වස්තූහු.[566]

---

564. අනුශය: අප්‍රහීණ ව චිත්තසන්තානුගත ව හොත්නා කෙලෙස්.

565. ධර්මඥතා = සූත්‍රගේයාදි වශයෙන් වූ පාලි ධර්මය දැනීම. අර්ථඥතා (පෙළේ අරුත් දැනීම), ආත්මඥතා (ශීලසමාධිප්‍රඥායෙන් සිය පමණ මෙතෙකැ යි තමාගේ පමණ දැනීම), මාත්‍රඥතා (පිළිගැනීම් වැළැඳීම් දෙකෝ පමණ දැනීම), කාලඥතා (උදෙසීම් පැණ පිළිවිසීම් ආදියට සුදුසු වෙලාව දැනීම), පර්ෂද්ඥතා (පිරිසේ සැටි දැනීම), සෙවිය යුතු නො යුතු පුගුලන් දැනීම පුද්ගලඥතා නම්.

566. නිර්දශ වස්තු = රහතකු වීමට කාරණ වූ ධර්ම: ශික්ෂාත්‍රයය පිරීමෙහි දැඩි ඡන්දය, විදසුන් වැඩීමෙහි දැඩි ඡන්දය, තෘෂ්ණාව දුරලීමෙහි දැඩි ඡන්දය, හුදෙකලා ව ඉඳීමෙහි දැඩි ඡන්දය, කායික චෛතසික වීර්‍ය්‍ය පිරීමෙහි දැඩි ඡන්දය, සිහි ප්‍රඥා දෙක්හි දැඩි ඡන්දය, මාර්ගදර්ශනයෙහි දැඩි ඡන්දය.

10. **සාක්‍ෂාත් කටයුතු ධර්ම** සත: ක්ෂීණාශ්‍රව බල සත යි. සියලු සංස්කාරයන් අනිත්‍ය වශයෙන් සම්‍යක්ප්‍රඥයෙන් දුටු බව, කාම සැප ගිනි අඟුරු වළක් සේ කොට දුටු බව, සිත විවේකයට (නිවනට) නැමුණු බව, නෛෂ්කාම්‍යයෙහි ඇළුණු බව, තෘෂ්ණා රහිත බව, සතර සතිපට්ඨානයන් මොනොවට වැඩූ බව, ශ්‍රද්ධාදි පංචේන්‍ද්‍රියයන් මොනොවට වැඩූ බව, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය මොනොවට වැඩූ බව. මේ සප්ත බල නමා කෙරේ ඇති බව දැන රහත් භික්‍ෂු තෙමේ තමා ආශ්‍රවයන් ක්‍ෂය කළ බව් ප්‍රතිඥා කෙරේ.

VIII

1. **බහූපකාර ධර්ම** අට: නො ලත් ආදිබ්‍රහ්මචර්‍ය්‍යික ප්‍රඥාව ලැබීමටත් ලත් ප්‍රඥාව වැඩීමටත් හේතුප්‍රත්‍යය වූ ධර්‍ම අට යි. ඔහු නම්: ශාස්තෲන් වහන්සේ හෝ ගරු කටයුතු සබ්‍රම්සරකු වෙත විසීම, කලින් කල ඔහු පැණ පිළිවිස සැක දුරු කර ගැනීම, එයින් කායික මානසික සංසුන්බව් ලැබීම, සතර සංවර සිල් රැකීම, බහුශ්‍රැත බව, ප්‍රධාන වීර්‍ය්‍ය ඇති බව, ස්මෘතිමත් බව, ස්කන්ධ පස උදයව්‍යයානු-දර්ශනයෙන් දැකීම යන අට යි.

2. **බැවිය යුතු ධර්ම** අට: සම්‍යක්දෘෂ්ටි, සම්‍යක්සංකල්ප, සම්‍යග්වචන, සම්‍යක්කර්මාන්ත, සම්‍යගාජීව, සම්‍යග්ව්‍යායාම සම්‍යක්ස්මෘති, සම්‍යක්සමාධි යන අංග අට වූ ආර්‍ය්‍යමාර්ගය යි.

3. **පිරිසිඳ දත යුතු ධර්ම** අට: ලාභ, අලාභ, අයස, යස, නින්‍දා, පසංසා, සුඛ, දුක්ඛ යන අෂ්ට ලෝකධර්ම යි.

4. **ප්‍රහාණ කට යුතු ධර්ම** අට: අෂ්ට මිථ්‍යාත්වයෝ යි.[567]

5. **හානභාගික ධර්ම** අට: අෂ්ට කුසීද වස්තූහු යි.[568]

---

567. අෂ්ට මිථ්‍යාත්ව=මිථ්‍යාදෘෂ්ටි, මිථ්‍යාසංකල්ප, මිථ්‍යාවාක්, මිථ්‍යා-කර්මාන්ත, මිථ්‍යාආජීව, මිථ්‍යාව්‍යායාම, මිථ්‍යාස්මෘති, මිථ්‍යාසමාධි යන අට දෙන.

568. කුසිද වස්තු=කුසීත පුහුලා සලකනා කාරණු. සිවුරු සෙවීම් ආදි කටයුත්තක් කළ යුතු ව ඇත. එ කටයුතු කරන විට වෙහෙස ඇති වේ. එබැවින් එ සඳහා දැන් ම නිවාඩු ගත යුතු යැ යි සමාධිභාවනාදියට දැන් කල් නොවේ යැ යි හෝනා බව, එ යම් කටයුත්තක් කැර වෙහෙස ඇත්තෙමි යි සලකා සමාධිභාවනාදිය හැර දමා හෝනා බව, ගමනක් යා යුතු ව ඇතැ යි සලකා භාවනා හැර දමා ගමනට පිළියෙල වීමක් වශයෙන් හෝනා බව, ගමනක් ගොස් වෙහෙස ඇත්තෙමි යි හෝනා බව, පිඬු පිණිස හැසිර චුව මතා පමණ බොජුන් නොලදිමි යි ක්ලාන්තයෙමි යි හෝනා බව, පිඬු

6. **විශේෂ භාගික ධර්ම** අට: අෂ්ට ආරම්භ වස්තුහු යි.[569]

7. **ප්‍රතිවේධයට දුෂ්කර ධර්ම** අට: බ්‍රහ්මචර්‍ය්‍යාවාසයට නො කල් අට යි. එනම්: නිරය, ප්‍රේතඅපාය, තිරිසන් යෝනිය, දීර්ඝායුෂ්ක දේවනිකාය, ප්‍රත්‍යන්තය, නාස්තික දෘෂ්ටිය, අඥාන බව, ඉන්ද්‍රිය විකල බව යන අටට අයත් ව උපත් කාල යි.[570]

8. **උපැදවිය යුතු ධර්ම** අට: අෂ්ට මහා පුරුෂවිතර්කයෝ යි. ඔහු නම්: i මේ ධර්මය අල්පේච්ඡයාට මිස මහේච්ඡයාට නො වේ යන කල්පනාව, ii මේ ධර්මය සන්තුෂ්ටයාට මිස අසන්තුෂ්ටයාට නො වේ යන කල්පනාව, iii මේ ධර්මය ප්‍රවිවික්තයාට මිස සංගණිකාරාමයාට නො වේ ය යන කල්පනාව, iv මේ ධර්මය වීර්‍ය්‍යවතාට මිස කුසීදයාට නො වේ යන කල්පනාව, v මේ ධර්මය එළැඹ සිටි සිහි ඇත්තහුට මිස මුළා සිහි ඇත්තහුට නො වේ යන කල්පනාව, vi මේ ධර්මය එකඟ සිතැත්තහුට මිස නොඑකඟ සිතැත්තහුට නො වේ යන කල්පනාව, vii මේ ධර්මය ප්‍රඥාවතාට මිස දුෂ්ප්‍රඥයාට නො වේ යන කල්පනාව, viii මේ ධර්මය නිෂ්ප්‍රපංචයාට මිස ප්‍රපංචාරාමයාහට නො වේ යන කල්පනාව යන අට යි.

පිණ්ඩ හැසිර ඔහෑ පමණ ආහාර ලැබ වැළඳිමි. එ හෙයින් කය බර ය ආහාර ක්ලාන්තය ඇත්තෙමි යි වැද හෝනා බව, කිසි සුලු අසනීපයක් වැළැඳි කල අසනීපයෙමි යි වැද හෝනා බව, ලෙඩින් සනීපවූ අළුත ‘දුන් දුබල ය. එබැවින් සැතැපීමේ වරදක් නැතැ’ යි හෝනා බව. මෙ අප් මේ කී කරුණක් පිට දමා ධ්‍යාන වැඩීම හැර දමා හෝනා බව් අට අෂ්ට කුසීද වස්තු නමු. මොහු ගුණ හානියට කාරණ හ. එබැවින් හානභාගික නම් හ.

569. ආරම්භ වස්තු=වීර්‍ය්‍යය වැඩෙන්නට කාරණ වූ ධර්ම. යටකී කුසීද වස්තු අටට ප්‍රතිවිරුද්ධ ව භාවනා කටයුතු බව සලකන්නහුගේ කරුණු,

570. නිරය, ප්‍රෙතඅපාය, තිරිසන්යොනිය, දීර්ඝායුෂ්කදේවනිකාය, භික්ෂු ඈදින් නැති ප්‍රත්‍යන්තය, නාස්තිකදෘෂ්ටිය, අඥබව, ඉන්ද්‍රියවෛකල්‍යය යන අටට අයත් ව උපන් කාලය නොකල් නම්. මේ අෂ්ට දුෂ්ටක්ෂණ යි.

9. **විශේෂයෙන් දත යුතු** (අභිඥෙය) **ධර්ම** අට: අෂ්ට අභිභායතන යි[571]

10. **සාක්ෂාත් කටයුතු ධර්ම** අට: අෂ්ට විමෝක්ෂය යි.[572]

IX

1. **බහූපකාර ධර්ම** නවය: යෝනිසෝමනස්කාරමූලක ධර්ම නවය යි. ඔහු නම්: i නුවණින් මෙනෙහි කරන්නහුට ප්‍රමෝදය ඇති වේ. ii ප්‍රමුදිතයාට ප්‍රීතිය ඇති වේ.

---

571. අභිභායතන යනු සසම්ප්‍රයුක්ත ධ්‍යාන චිත්තය යි. මැඩපවත්වනු ලබන කසිණාරම්මණ ඇත්තේ ය යන අරුතින් ධ්‍යානචිත්තයෝ අභිභායතන නම් හ. තියුණු නුවණ ඇති පුද්ගලයා කසිණ අරමුණ මැඩගෙණ එයට සමවැදීම බරක් කොට නො ගෙන පහසුවෙන් ම ප්‍රතිභාග නිමිත්ත උපදවනු සමග ම අර්පණා ව උපදවයි. මෙසේ උපදවන ලද ධ්‍යාන අභිභායතන නම්. ඕහු අට දෙනෙකි. එ නම්: සිය සිරුරෙහි කෙස් ආදියේ පැහැය අරමුණු කැර කසින පරිකර්ම භාවනාකොට බාහිර සුවර්ණ හෝ දුර්වර්ණ කුඩා ප්‍රතිභාග නිමිත්තෙහි ලත් ධ්‍යානය, එසේ ම සිය සිරුරෙහි පරිකර්ම කොට සුවර්ණ හෝ දුර්වර්ණ බාහිර දූයෙක වර්ණයෙන් උපන් මහත් ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදූවු ධ්‍යානය, බාහිර ම වූ සුවර්ණ හෝ දුර්වර්ණ දූ ම අරමුණු කැරැ පරිකර්ම ප්‍රතිභාග නිමිති උපදවා (ඒ) කුඩා ප්‍රතිභාග නිමිත්තෙහි ලත් ධ්‍යානය, එ සේම සුවර්ණ හෝ දුර්වර්ණ බාහිර අරමුණෙහි පිරියම්කැරැ මහත්වූ බාහිර ප්‍රතිභාග නිමිත්තෙහි ලත් ධ්‍යානය, සර්ව නීල වූ පිරිසිදු නීලප්‍රභා ඇති බාහිර අරමුණෙක කිසුනු පිරියම් වඩා ලත් ප්‍රතිභාග නිමිත්තෙහි ඉපිදූ වූ ධ්‍යානය, සියල්ල පිරිසිදු පීත වර්ණ (රන්වන්) බාහිර අරමුණෙක පිරියම් කොට ලත් ප්‍රතිභාග නිමිත්තෙහි ලත් ධ්‍යානය, සියල්ල පිරිසුදු රතු පැහැති බාහිර අරමුණෙක පිරියම් කොට ලත් ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදූ වූ ධ්‍යානය, සියල්ල මනා සුදු පැහැති බාහිර වූ නිමිත්තෙහි පිරියම් වඩා ලත් ප්‍රතිභාග නිමිත්තෙහි ඉපද වූ ධ්‍යානය යන අට යි මෙහි යට කුඩා ප්‍රතිභාග නිමිත්ත යන්නෙන් කුලු වට්ටි සරාව පමණ වූ ප්‍රතිභාග නිමිත්ත ද, මහත් ප්‍රතිභාග නිමිත්ත යන්නෙන් එයට වැඩි වූ අප්‍රමාණ ප්‍රතිභාග නිමිත්ත ද දත යුතු යි.

572. අෂ්ටවිමෝක්ෂනම්: 1 සිය සිරුරෙහි කෙස් ආදියෙහි කිසුනු පිරියම් කොට බාහිර සුවර්ණ හෝ දුර්වර්ණ ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදූ වූ රූපධ්‍යාන සමාපත්ති, 2 සුවර්ණ හෝ දුර්වර්ණ බාහිර පරිකර්ම නිමිත්තෙන් ලත් ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදූ වූ රූප ධ්‍යාන සමාපත්ති, 3. බාහිර ඉතා පිරිසිදු නීලාදී වර්ණයෙහි පිරියම් කොට ලත් අභිපවිත්‍ර ප්‍රතිභාග නිමිත්තෙහි ඉපැදූවූ රූප ධ්‍යාන සමාපත්ති, 4. ආකාශානන්තායතන ධ්‍යාන සමාපත්තිය, 5. විඥානානන්තායතන ධ්‍යාන සමාපත්තිය, 6. ආකිංචන්‍යායතන ධ්‍යාන සමාපත්තිය 7. නෛවසංඥානාසංඥායතන ධ්‍යාන සමාපත්තිය, 8. නිරොධ සමාපත්තිය යන අට යි. මෙහි කී තෙවෙනි විමෝක්ෂයට යටකී පස්වන අභිභායතනය පටන් අටවන්න තෙක් සියලු සතර අභිභායතන ම ඇතුළත්. සතුරු නීවරණ කෙරෙන් මිදුණෝය යන අරුතින් ද ධ්‍යානාලම්බනයෙහි අධිමුක්ත (දුඩි සේ ඇලුණෝ) යන අරුතින් ද මොහු විමෝක්ෂ නම් හ. පසු ව' කී අරුත අට වන විමෝක්ෂයෙහි නො ලැබේ.

iii ප්‍රීතයාගේ නාම කය සංසිඳේ. iv සංසුන් කයැත්තේ සුව විඳී. v සුව ඇත්තහුගේ සිත මනා එකඟ වේ. vi සිත එකඟ කල්හි තත් වූ පරිදි දනී. viii. තත් වූ පරිදි දන්නා දක්නා තැනැත්තේ කලකිරේ. viii කලකිරෙන්නේ නො ඇලේ. ix නො ඇලීමෙන් වෙසෙසින් මිදේ.

2. **වැඩිය යුතු ධර්ම** නවය: පිරිසිදු බවට ප්‍රධාන වූ අංග (පාරිසුද්ධිපධානියංග) නවය යි. i ශීලවිශුද්ධි, ii චිත්තවිශුද්ධි, iii දෘෂ්ටිවිශුද්ධි, iv කාංක්ෂාවිතරණවිශුද්ධි, v මාර්ගාමාර්ගඥානදර්ශනවිශුද්ධි, vi ප්‍රතිපද්ඥානදර්ශනවිශුද්ධි, vii ඥානදර්ශනවිශුද්ධි, viii ප්‍රඥාවිශුද්ධි, ix විමුක්ති විශුද්ධි

3. **පිරිසිඳ දත යුතු ධර්ම** නවය: නව සත්ත්වාවාසයෝ යි.

4. **ප්‍රහාතව්‍ය** (දුරු කට යුතු) **ධර්ම** නවය: තෘෂ්ණාමූලක ධර්ම නවය යි. ඔහු නම්: තෘෂ්ණා හේතුයෙන් පර්යේෂණය, පර්යේෂණ හේතුයෙන් ලාභය, ලාභ හේතුයෙන් විනිශ්චය විනිශ්චය හේතුයෙන් ඡන්දරාගය, ඡන්දරාග හේතුයෙන් අධ්‍යවශානය, අධ්‍යවශාන හේතුයෙන් පරිග්‍රාහය, පරිග්‍රාහ හේතුයෙන් මාත්සර්‍ය්‍යය, මාත්සර්‍ය්‍ය හේතුයෙන් ආරක්ෂාව, ආරක්ෂා හේතුයෙන් දඬුගැනුම් කලහ විරෝධ විවාද පරුෂ බස් මෘෂාවාද යන අනේක අකුසල් යන නවය යි.

5. **හානභාගිය ධර්ම** නවය: නව ආඝාත වස්තු[573]

6. **විශේෂ භාගිය ධර්ම** නවය: නව ආඝාත ප්‍රතිවිනය ධර්ම යි.[574]

7. **දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම** නවය: නව නානාත්වයෝ යි. ඔහු නම්: ධාතුනානාත්ව හේතුයෙන් පහළ වන ස්පර්ශ නානාත්වය, ස්පර්ශනානාත්ව හේතුයෙන් පහළ වන වේදනානානාත්වය, වේදනානානාත්ව හේතුයෙන් පහළ වන සංඥානානාත්වය,

573. ආඝාතවස්තු = කෝපය ඇති වීමට කාරණයෝ. 1. තමාට අසුවලා අවැඩ කෙළේයැයි සිතීම, 2. දැනුදු ගේ අවැඩ කෙරේ යැයි සැලකීම. 3. මතු අවැඩ කරන්නේ යැ යි සිතීම, 4. තමාගේ ප්‍රියමනාප තැනැත්තහුට අතීතයේ අවැඩ කෙළේයැ යි සිතීම, 5. දැනුදු ඔහුට හේ අවැඩ කෙරේ යැ යි සිතීම, 6. මතුත් අවැඩ කරන්නේය යැ යි සිතීම, 7. තමාගේ අප්‍රියයාට පෙර අතීතයෙහි යහපතක් කෙළේ යැ යි සිතීම, 8. ඔහුට දැන් හේ වැඩක් කෙරේ යැ යි සිතීම, 9. හේ මතු ඔහුට යහපතක් කරන්නේ යැ යි සැලැකීම. මෙසේ සිතීම් නවය නව ආඝාත වස්තු නමු.

574. ආඝාතප්‍රතිවිනය = කෝපය දුරු කරන කරුණු, යට කී කෝපය ඇති කරන එක එක සිතීමෙන් වන අලාභය ම මිස ලාභයක් නැති බව සැලකීම යි.

සංඥනානාත්ව හේතුයෙන් පහළ වන සංකල්පනානාත්වය, සංකල්පනානාත්ව හේතුයෙන් පහළ වන ඡන්දනානාත්වය, ඡන්දනානාත්ව හේතුයෙන් පහළ වන පරිදාහනානාත්වය, පරිදාහනානාත්වයෙන් පහළ වන පර්යේෂණ නානාත්වය, පර්යේෂණ නානාත්ව හේතුයෙන් පහළ වන ලාභ නානාත්වය, ලාභනානාත්වයෙන් පහළ වන මඤ්ඤනා නානාත්වය යන නවය යි.

8. **උපදැවිය යුතු ධර්ම** නවය: අශුභසංඥාදි නව සංඥා.[575]

9. **අභිඥෙය ධර්ම** නවය: අනු පූර්විහාර නවය.[576]

10. **සාක්ෂාත් කට යුතු ධර්ම** නවය: අනුපූර්වනිරෝධ ධර්ම නවය:[577]

X

1. **බහූපකාර ධර්ම** දශය: දශ නාථකරණ ධර්ම[578]

2. **වැඩිය යුතු ධර්ම** දශය: දශ කසිණායතන.[579]

---

575. නවසංඥා=අශුභසංඥාව, මරණසංඥාව, ආහාරයෙහි පිළිකුල් සංඥාව, සියලු භවය කෙරෙහි කලකිරුණහුට පහළ වූ සංඥාව, (සබ් ලෝකයෙහි අනභිරත සංඥාව) අනිත්‍ය සංඥාව, අනිත්‍යයෙහි දුඃඛ සංඥාව, දුකෙහි අනාත්ම සංඥාව, ප්‍රහාණ සංඥාව, විරාග සංඥාව.

576 අනුපූර්වවිහාර-පිළිවෙළින් සමවැදිය යුතු සමවත් නවයෙකි. ඔහු නම්: ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන, තෘතීයධ්‍යාන, චතුර්ථධ්‍යාන, ආකාශානන්ත්‍යායතන, විඥානානන්ත්‍යායතන, ආකිංචන්‍යායතන, නෛවසංඥානාසංඥායතන, නිරොධසමාපත්ති යන නවය යි.

577. අනුපූර්ව නිරෝධ=පිළිවෙළින් නිරුද්ධ වන ධර්ම: ප්‍රථම ධ්‍යානයෙන් කාමසංඥාව ද, ද්විතීය ධ්‍යානයෙන් විතර්ක විචාර ද, තෘතීය ධ්‍යානයෙන් ප්‍රීතිය ද, චතුර්ථ ධ්‍යානයෙන් ආශ්වාස ප්‍රශ්වාස ද ආකාශානන්ත්‍යායතනයෙන් රූපසංඥාව ද, විඥානානන්ත්‍යායතනයෙන් ආකාශානන්ත්‍යායතන සංඥාව ද ආකිංචන්‍යායතනයෙන් විඥානානන්ත්‍යායතන සංඥාව ද, නෛවසංඥානාසංඥායතනයෙන් ආකිංචන්‍යායතන සංඥාව ද, නිරෝධසමාපත්තියෙන් සංඥාව හා වේදනා ද නිරුද්ධ වෙති. මොහු නව දෙන අනුපූර්ව නිරොධයෝ නම් හ.

578. නාථකරන ධර්ම-තමහට පිහිටවන ධර්ම. සිල්වත් බව, බහුශ්‍රැත බව, කලන මිතුරන් ඇති බව, සුවච බව, සබ්‍රම්සරුන්ගේ කුදු මහත් කටයුතු කැර දීම, බණදහම් ඇසීමටත් කීමටත් කැමැති බව, ලද දැයින් සතුටු වීම, අධිගමය පිණිස නො පසුබට උත්සාහය, ස්මෘතිමත් වීම, විදර්ශනා ප්‍රඥාව ඇතිබව යන අට නාථකරණ ධර්ම යි.

579. කසිණායතන (කෘත්ස්නායතන) කසිණ අරමුණු. මොහු දශදෙනෙකි. පඨවි කසින, අපෝකසින, තෙජො කසින, වායො කසින, නීලකසින, පීත කසින ලොහිත කසින, ඔදාත කසින, ආකාශ කසින, විඤ්ඤාණ කසින යනු දශ කසින අරමුණු යි.

3. **පරිඥෙය ධර්ම** දශය: චක්ෂුරාදි දශායතන

4. **ප්‍රහාතව්‍ය ධර්ම** දශය: දශ මිථ්‍යාත්ව.[580]

5. **හානභාගීය ධර්ම** දශය: දශ අකුශල කර්මපථ.[551]

6. **විශේෂභාගීය ධර්ම** දශය: දශ කුශලකර්ම පථ.

7. **දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම** දශය: දශ ආර්යවාස.[582]

8. **උත්පාදයිතව්‍ය ධර්ම** දශය: අශුභ සංඥාදි දශ සංඥා*

9. **අභිඥෙය ධර්ම** දශය: දශ නිර්ජර වස්තු. (අකුසල් දිරායෑමට කරුණු වන කුසල් වඩාලන කරුණු අට) : (මිථ්‍යාදෘෂ්ටි, මිථ්‍යාසංකල්ප, මිථ්‍යාවචන, මිථ්‍යාකර්මාන්ත, මිථ්‍යාආජීව, මිථ්‍යාව්‍යායාම, මිථ්‍යාස්මෘති, මිථ්‍යාසමාධි, මිථ්‍යාඥාන, මිථ්‍යා–විමුක්ති යන දශ මිථ්‍යාධර්මත් ඔවුන් ගේ ප්‍රත්‍යයයෙන් පහළ වන අනේක පාපධර්මත් පිළිවෙළින් සම්‍යග්දෘෂ්ටි, සම්‍යක්සංකල්ප, සම්‍යග්වචන, සම්‍යක්කර්මාන්ත, සම්‍යගාජීව, සම්‍යග්ව්‍යායාම, සම්‍යක්ස්මෘති, සම්‍යක්සමාධි, සම්‍යග්ඥාන, සම්‍යග්විමුක්ති යන දශ සම්‍යක්ධර්ම හේතුයෙන් දිරන්නාහ. ප්‍රහීණ වන්නාහ. අනේක කුශලධර්මයෝ භාවනායෙන් සම්පූර්ණ බවට පැමිණෙන්නාහ.)

---

580. දශ මිච්ඡත්ත=මිථ්‍යාස්වභාව දශය යි යට viii 4. වැන්නෙහි අෂ්ටමිථ්‍යාත්වයනට මිථ්‍යාඥාන මිථ්‍යාවිමුක්ති දෙක එක් වූ කල දශ මිථ්‍යාත්ව යි

581. කර්මපථ-කර්මයෝ සුගති දුගතීනට පථ වූවාහු කර්ම පථ නම් වෙති ප්‍රාණඝාතාදි දශය යි.

582. ආර්යවාස දශය - 1. පංචාංගවිප්‍රහීණතාව (පංචනීවරණ දුරු කළ බව) 2. ෂඩංගඋපෙක්ෂායෙන් සමන්විත බව, (ඇස් කන් නාසාදි සය රූප ශබ්ද ගන්ධාදිය අරමුණු වූ විට සතුටුත් අසතුටුත් නො වී උපේක්ෂක වීම,) 3. ඒකාරක්ෂාව (නිතර එළැඹ සිටි සිහියෙන් ආරක්ෂිත සිත ඇති බව) 4. ප්‍රතිසේවන අධිවාසන පරිවර්ජන විනෝදන යන සතර නුවණින් කිරීම, සතර අපශ්‍රය (ආධාර ධර්ම.) 5. පනුන්නපච්චෙකසච්චතා (සත්‍ය ලෙස අන්‍යයන් වෙන වෙන ම ගත් අසත්‍ය දූය නො පිළිගන සිටි බව,) 6. සමවයසට්ඨෙසනා (සංසිඳවූ කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා ඇති බව,) 7. අනාවිල-සංකප්පතා (කාම ව්‍යාපාද විහිංසා විතර්ක ප්‍රහීණ කළ බව,) 8. පස්සද්ධ කාය සංඛාරතා (චතුර්ථ ධ්‍යානය ලැබ සිටීම,) 9. සුවිමුත්තචිත්තතා (රාග ද්වේෂ මෝහයන්ගෙන් සිත මිදුණු බව,) 10. සුවිමුත්ත ප්‍රඥතා (තමාගේ රාග ද්වේෂයන් දුරු වූ බව දැනීම), මොහු දශ ආර්යවාස නමු.

10. **සාක්ෂාත් කටයුතු ධර්ම** දශය: අශෛක්‍ෂ ධර්ම දශය යි.[583]

මෙ සත්‍ය වූ ධර්ම සියය තථාගතයන් වහන්සේ විසින් අභිසම්බුද්ධයහ යි සැරියුත් තෙරණුවෝ වදාළහ.

මෙය ඒ භික්‍ෂූහු සතුටින් පිළිගත්හ†

[මෙහි ධර්ම කොටස් සියයෙක් ඒකකදශය ද්විකදශය ආදි වශයෙන් දශක කොටස් දශයකට සංග්‍රහ කොට ඇත.]

පාථිකවර්ගය යි.

දීඝසංගී භාවය නිමි.

---

583. අශෛක්‍ෂ ධර්ම-(අර්හත්ඵලයට පැමිණියහු ගේ ස්වභාව) දශය: අශෛක්‍ෂ වූ සම්‍යග්දෘෂ්ටි සම්‍යක්සංකල්ප සම්‍යග්වචන සම්‍යක්කර්මාන්ත සම්‍යගාජීව සම්‍යග්ව්‍යායාම සම්‍යක්ස්මෘති සම්‍යක්සමාධි සම්‍යග්ඥාන සම්‍යග්විමුක්ති යන දශය යි.

†මේ සූත්‍රධර්මය අසා සතුටින් පිළිගත් පන්සියයක් ඒ භික්‍ෂූහු මේ ධර්ම ම ආවර්ජනය කොට සිවුපිළිසිඹියා සහිත රහත්බව ලැබූහ.

උපග්‍රන්ථය

6 **තථාගත.** කරුණු අටෙකින් බුදුරජුහු තථාගත නම් වෙත්. තථා ආගතො ති තථාගතො, තථා ගතො ති තථාගතො, තථලක්ඛණං ආගතො ති තථාගතො, තථධම්මෙ යථාවතො අභිසම්බුද්ධො ති තථාගතො, තථදස්සිතාය තථාගතො, තථාවාදිතාය තථාගතො, තථාකාරිතාය තථාගතො, අභිභවනට්ඨෙන තථාගතො.

1 **තථා ආගතො ති තථාගතො.** පෙර බුදුවරු 'තිණ්ණො'හං තාරයිස්සාමි' යන ආදීන් අභිනීහාරය (මුල් පැතුම) කොට සමතිස් පෑරුම් පුරා අංගපරිත්‍යාග නයන-ධන-රාජ්‍ය පුත්‍ර-දාර-පරිත්‍යාග යන පස් මහා පරිත්‍යාග ද කොට, පූර්වයෝග (ගතපච්චාගතිකවත හා අභිඥසමාපත්ති නිපැදවීම). පූර්වචර්‍ය්‍යා (දානාදි පිළිවෙත්හි අතිසයින් යෙදීම). ධර්මාඛ්‍යාන (පෑරුම් පිරුමෙහි අනුසස් කීම), ඥාත්‍යර්ථචර්‍ය්‍යා (නෑයනට වැඩ සැලැසීම) යන ආදි දහම් පුරා බුද්ධචර්‍ය්‍යාහි කෙළවරට පැමිණ ආහ. සත්තිස් බෝපැකි දහම් වඩමින් ආහ. එ සේ ම අප බුදුහු ද බෝසත් සමයෙහි මෙකී සියලු දහම් පුරණුවෝ ආහ. එබැවින් 'පෙර බුදුවරුන් ආ සේ ආහ' යන අරුතින් බුදුහු **තථාගත** නම් වෙත්.

2 **තථාගත** (පෙර බුදුවරුන් සේ ගිය බැවින් ද තථාගත නම් වෙත්. පෙර බුදුහු පැසිම් බෙවෙයි උපන් ඇසිල්ලෙහි සම පයින් පොළොවෙහි පිහිටා සිට උතුරට මුහුණ පා සත් පියවරක් ගියහ. හැම දික් බලා 'මම් ලොවට අක් වෙමි' යන ආදීන් සිහනද කළහ. මේ බුදු වන අත්බැවැ බෝසතුන් ගේ ධර්මතාවෙකි. ඒ පෙර බුදුවරුන් සේ අප බුදුහු ද උපන් ඇසිල්ලෙහි උතුරු දිගට මුහුණ ලා වැඩියහ. සිනද කළහ. මෙසේ පෙර බුදුවරුන් සේ වැඩියාහු තු යි තථාගත නම් වූහ. තව ද පෙර බුදුහු නෙක්ඛම්ම අව්‍යාපාදාදි කුසල් දහමින් කාමව්‍යාපාදාදි අකුසලුන් දුරු කෙරෙමින් ගියහ. කෙළවර සිවු මගින් සක්කායදිට්ඨි ආදි කෙලෙසුන් දුරු කරනුවෝ සියලු කෙලෙස් මුලින් සිඳලූහ. අප බුදුහු ද එසේ ම ඔවුන් වැඩි මගින් වැඩියහ. එහෙයින් ද **තථාගත** (පෙර බුදුවරුන් සේ ගියාහු) නම් වෙත්.

3 **තථලක්ෂණයට පැමිණි හෙයින් ද තථාගත නම් වූහ.** තථලක්ෂණ නම් පඨවිධාතුවේ තද බව, තේජෝධාතුවේ ශීතොෂ්ණතා ලක්ෂණ, වායුධාතුවේ වි‍ස්තම්භන ලක්ෂණ, විඥනයේ විජානන ලක්ෂණ ආදි විසින් වූ ඒ ඒ දූයෙහි යථාස්වභාවයට ඥනගතියෙන් ගියහ හෙවත් ඒ හැම නුවණින් දුටුහ. එහෙයිනුත් තථයට (යථාස්වභාවයට) ආගත (ඥන ගමනින්) පැමිණි බැවින් ද තථාගත නම් වූහ.

4 **තථධර්ම** (සත්‍යධර්ම) යථාවත් ක්‍රමයෙන් අභිසම්බුඩ (තථ-ආගත) හෙයින් ද තථාගත නම් හ. තථධර්ම නම් සතර ආර්‍ය්‍යසත්‍යයෝ ය. අවිද්‍යාදි ප්‍රත්‍යයයෙන් සංස්කාරාදීන් පහළ වනුයෙහි ඔවුන් ගේ ප්‍රත්‍යයභාවය තථ ය, සත්‍ය ය. මේ සියලු තථ ධර්ම දත් බැවිනුත් බුදුහු තථාගත නමු.

5 තථාවාදි බැවින් ද බුදුහු තථාගත නම් හ. බුදුරජුන් වදාළ තාක් සියල්ල තථ ය (සත්‍ය ය, අවිපරීත ය). මෙසේ තථ (සත්‍ය) අගද (වචන) ඇති බැවින් ද ඔබ තථාගත නම් හ. **තථාගද** විය යුත්තෙහි **ද** කාරයට **ත** කාර වී තථාගත යි පද සිඩිය වූ සේ ය.

6 බුදුරජ්හු නමත් වදරන පරිදි කෙරෙති. කරන පරිදි වදරති. මෙසේ යථාවාදි තථාකාරී යථාකාරී තථාවාදී බැවින් ද තථාගද නම් වෙති. දකාරයට තකාර වී තථාගත යි සිඩ ය.

7 අගද යනු බෙහෙත් ය. තථ වූ (සත්‍ය වූ) දේශනා විලාසයත් අධික පින් ඇති බවත් නැමැති බෙහෙදින් දෙව්මිනිස් ඈ සියල්ලන් මැඩ පවත්වති. මෙසේ තථ (සත්‍ය) අගද (බෙහෙත) ඇත්තාහු නු යි ඔබ තථාගද (තථාගත) නම් වෙති.

8 **තථභාවයට ගිය හෙයින් ද තථාගත නම් හ.** දුක පිරිසිඳීම, දුඃඛසමුදය ප්‍රහාණ කිරීම්, දුඃඛනිරෝධය ප්‍රත්‍යක්ෂ කිරිම, මාර්‍ගය වැඩිම යනු සතර තථභාවයෝ ය. මේ සතර කෘත්‍ය නැමැති තථභාවයට (සත්‍ය භාවයට) ආගත (පිළිපත්) බැවින් බුදුහු **තථාගත** නම් හ. මෙහි 246 පිට ද බලනු.

9 **තුලාකූට.** තරාදියෙන් කරන වංචාව තුලාකූට නම්. මෙය රූපකූට අඞ්ගකූට ගහණකූට පටිච්ඡන්නකූට යැ යි සතර වැදෑරුම් වේ. රූපයෙන් (පෙනීමෙන්) සමාන තරාදි දෙකක් තනා ගෙන අනුන් ගෙන් බඩු මිලයට ගන්නා විට මහ තරාදියෙන් ද තමන් ගෙන් විකුණන විට කුඩා තරාදියෙන් ද කිරීම **රූපකූට** නමි. බඩු මිලයට

ගැන්මෙදී තරාදියේ පසු භාගය අහිත් තෙරපීම ද බඩු කිරා විකිණීමෙ දී තරාදියේ ඉදිරි කොට තෙරපා කිරාදීම ද **අඞ්ගකූට** නම්. බඩු මිලයට ගැන්මෙ දි එය තරාදියේ ලා තරාදිය මුලැ ලූ ලනුව අල්ලා ගැන්ම ද, බඩු කිරා විකිණී-මෙදී තරාදියේ අග ලනුව අල්ලා ගැන්ම ද **ගහණකූට** නම්. තරාදි තච්චුවෙක (ඇතුළත කුහරයක් කොට එහි) යහුණු පුරවා එය අනෙක් තච්චුවට වඩා බර ඇති සේ තනා ගෙන බඩු මිලයට ගැන්මේ දි එය පසුභායට කොට ද බඩු කිරා විකිණීමේ දී එය ඉදිරි පැත්තෙහි කොට එහි බඩු බහා ද කිරා දීමෙන් කරන වංචාව පටිච්ඡන්නකූට නම්.

10 **කාංසකූට.** කංස යනු සාමාන්‍යයෙන් රන් රිදී ආදියෙන් කළ කන බොන බඳුන් ය. එහෙත් මෙ තන්හි රන්මුවා තලුතැටිය **කාංස** යන්නෙන් හැඳින්විණ. එයින් කරන වංචාව **කාංසකූට** නම්. එක් රන් තලුතැටියක් ද එයට සමාන කොට ලොහොමුවා අන් තලුතැටි කිහිපයක් තනවා රන්වන් කරවා තබා ගෙන රන් බදුන පිරික්සවා රන්මුවා බව පිළිගත් පසු එහි මුවාවෙන් සෙසු ලොහො-බදුන් ද රන්මුවා යි පිළිගන්වා රවටා වැඩි මිලට විකිණීම මෙයින් දැක්විණ.

11 **මානකූට.** මිනිමෙන් කැරෙන වංචාව මානකූට නම්. මෙය හදයභේද සිඛාභේද රජ්ජුභේද විසින් ත්‍රිවිධ ය. එහි හදයභේද යන තන්හි හදය යනු මනින බදුනෙහි අඩිය ය. එය සිදුරු කිරීම **හදයභෙද** නම්. ගිතෙල් ආදි ද්‍රව වගී මිලයට ගැන්මෙ දී ඉක්මනින් වක්කරන්නැ යි එහි වක්කරවයි. එහි සිදුරෙන් යට බදුනට ද වැඩිපුර වැගිරෙයි. මෙයින් බදුන පිරෙන පමණට වඩා තමාට ලබාගත හැකි වෙයි. ඒ ගිතෙල් ආදිය විකිණීමෙදී ඒ සිදුරට ඇබයක් ගසා මැන විකුණයි. මේ වංචාව **හදය භෙද මානකූට** නම්. නැළි ආදියෙන් තල ආදි දෑ මනින කලැ කොතට ම පිරවීම ශිඛාකරණය යි. මිලට ගැන්මේ දි සෙමෙන් ශිඛාව පුරා ගනී. විකිණීමේ දී වේගයෙන් මනිනුයේ ශිඛාව තිසි සේ ඇති විය නොදී ශිඛාව බිඳිමින් දෙයි. තලසහල් ඈ ධාන්‍ය ගනුදෙනුයෙහි මෙය කැරේ. මෙසේ කරන වංචාව **ශිඛාභෙද මානකූට** නම්. වතුපිටි මැනීමේදී රජ්ජුභේද මානකූටය කැරෙයි. මෙහි මිනුම් යොත **රජ්ජු** නම්. දිගින් අඩු වැඩි කොට ඉඩම් මැනීමේදි කරන වඤ්චාව **රජ්ජුභෙද මානකූට** නම්.

12 **උක්කොටන - වංචන - නිකති - සාචියෝග.** "කතත්ථබබකම්මතො උඩ්ඩං කොටනං පටිහනනං උක්කොටනං" යනු ටීකා යි. කළ යුත්තෙත් වැඩිමනත් වෙහෙස කිරීම, එනම් අල්ලස් ගෙන නො හිමියන් හිමියන් කොට දක්වීම **උක්කොටන** නමි. නොයෙක් උපායෙන් අනුන් රැවැටීම **වංචන** නමි. වැද්දෙක් මුවකුත් මුවපොව්වකුත් විකුණන්නට ගෙන යයි. ඒ දුටු ධූර්තයෙක් උත් ගේ අගය විචාරයි. 'මුවා කහවණු දෙකෙක, මුවපොව්වා **එක්** කහවණුවෙකැයි හේ කියයි. ධූර්තයා මුවපොව්වා කහවණුවක් දී ටික දුරක් ගෙන ගොස් පෙරළා අවුත් 'මුවා මට දෙව'යි කියයි. 'කහවණු දෙකක් දෙව'යි වැද්දා කියයි. හේ "භවත, පළමුවෙන් මා කහවණුවක් දී ඇත. දැන් කහවණුවක් වටිනා මේ මුවපොව්වාත් ගනුව. එවිට කහවණු දෙක වෙයි. මුවා දෙව'යි කියයි. වැද්දා මුව පොව්වා ගෙන මුවා දී යෙයි. මෙ බඳු කපට කම් මෙහි **වංචන** නමින් දක්විණ. **නිකති** යනු සැබෑ මැණික් සැබෑ රන් ආදි දැයට සමාන ලෙස බොරු රන් බොරු මැණික් සාදා දෙමින් කරන රැවැටිල්ල ය. පටිභාගකරණවසෙන පන උපායකුසලතාය වඤ්චනනති නිකතිවංචනං. (ටීකා) කෙනකුගෙන් පිරිසිදු රනින් කළ බඩුවක් තවෙකෙක් ටික දිනකට ඉල්ලා ගනී. ඒ යතර එයට හැමලෙසින් පෙනීමෙන් සමාන කොට කෘත්‍රිම රනින් බඩුවක් තනවා තමා කලින් ඉල්ලා ගෙනා බඩුව ලෙස අඟවා බඩුහිමියාට ඒ බොරුරන් මුවා බඩුව දෙයි. මෙබඳු දෑ **නිකති වංචන** නමි. **සාචියෝග** යනු උඩ කී උක්කොටනාදි ක්‍රියාවෝ ම ය. එබැවින් උක්කෝටන සාචියෝග වංචන සාචියෝග නිකති සාචියෝග යැ යි මෙහි සාචියෝග තුනක් දක්විණැ යි දත යුතු.

13 **බීජගාම භූතගාම සමාරම්භ.** මූලබීජ ස්කන්ධබීජ අග්‍රබීජ පර්වබීජ බීජබීජ යැ යි බීජ වර්ග පසෙකි. මුලින් පැළ වන කසා හිඟුරු වද ඉවද කුළුරණ සුවඳහොට වම්මුතු ආදිය **මූලබීජ** නමි. කඳ ම බීජ කොටැති (කඳින් පැළ වන) ඇසතු නුග පුලිල දිඹුල් කසට හෙලකිඳි ආදිය **ස්කන්ධබීජ** නමි. අගින් පැළ වන අඳු තලා දමුනු හිරිවේරිය ආදිය අග්‍රබීජ නමි. පුරුකින් පැළ වන උක් උන බට රඹුක් ආදිය පරු (එළු) බීජ නමී. පුබ්බන්න අපරන්නාදි ඇට ම බීජ කොට ඇතියේ බීජ බීජ නමි. මේ බෙදීම ලෝකව්‍යවහාරානුකූල ව ය. පරමාර්ථ වශයෙන් නො වේ. පරමාර්ථ වශයෙන් නම්

එකී පංචවිධ බීජයන් ගේ ම මූලබීජය තේජෝධාතුව ය. සෙසු පෘථිවි අප් වායු යන තිදෙන හුදු පරිවාර ධාතුහු ය. බීජගාම යනු බීජයෝ යි. භූතගාම යනු නො බිඳුලුණු තෘණ වෘක්ෂාදිහු යි. සමාරම්භ යනු කැපීම් පිසීම් ආදිය යි. පැළවන බීජවර්ගී ද තෘණවෘක්ෂාදිය ද කැපීම් ආදිය බීජගාම භූතගාම සමාරම්භ නමි.

15 **සන්නිධිකාර පරිභෝග.** සන්නිධිකාර පරිභෝග නම්: රැස් කොට තබා පාවිච්චියට ගැනීම යි. ආහාර, පාන, වස්ත්‍ර, යාන, ශයන, ගන්ධ, ආමිස වශයෙන් ඒ සත් වැදෑරුම්.

16 **නාටසමජ්ජා** (පෙක්ඛ). කුහුඳ් විසින් (අපූරු දෑ දකිනුයෙහි ලොල් බැවින්) බැලිය යුත්ත පෙක්ඛ නමි. නැටුම්සිප් අනුව නළුවන් මුළුවක් ජන සමූහයා ඉදිරියෙහි දක්වන නැටුම් ය. සමූහයා ඉදිරියෙහි කරනලද දෑ සමජ්ජා නමි.

18 **ප්‍රතිභානචිත්‍ර.** පටිභානචිත්තන්ති අත්තනො පටිභානෙන කතචිත්තං. තමාට වැටහෙන වැටහෙන පරිදි වූ සිතියම්. බෙහෙවින් කාමුක හැඟිම් අවුස්සන චිත්‍ර ය.

19 **චණ්ඩාල.** සැඩොලුන් යකඩමුවා ගුලයෙන් කරන ක්‍රීඩාව. සණ්දෙවුන් කෙළියට ද චණ්ඩාල යන නම බැවහර යි. හණ්වැහැරි දියෙන් තෙම තෙමා උනුනට පහර දීගනිමින් කරන සැඩොලුන් ගේ ක්‍රීඩාවෙකි.

72 **තිරශ්චීන විද්‍යා.** සගමොක් දෙකට යන මඟින් බැහැර වූ, සග මොක් දෙකට යන මඟ නොවන විද්‍යා යි. සගමොක් දෙකට යන මඟින් තිරෝභූත (පිටමං) වූ හෙයින් මේ තිරශ්චීන නම් විය.

75 **ඇඟිලිපුරුක සන් තබා ගිණුම.** මේ ඇඟිලි පුරුක ඇල්ලූ කලැ සියයෙක් වේ, මේ ඇඟිලි පුරුක ඇල්ලූ කලැ දහසෙක් වේ යන ආදින් සන් තබා (සලකුණු කොට) ගණන් ගැන්ම ය. මෙය පාලියෙහි **මුද්‍දා** නමින් දැක්විණ. 'මුද්‍දා ති හත්ථමුද්‍දා ගණනා වුච්චති' යනු අටුවා යි. 'හත්ථමුද්‍දා ති හත්ථෙන අධිප්පෙතවිඤ්ඤාපනං, තං පන අංගුලිසංකොචනෙන ගණනායෙව (දීඝටීකා). මුද්‍දා ති අංගුලිපබ්බෙසු සඤ්ඤං ඨපෙත්වා හත්ථමුද්‍දා ගණනා. (මැදුම්සඟි අටුවා). සඤ්ඤං ඨපෙත්වාති ඉමස්මිං අංගුලිපබ්බෙ ගහිතෙ සතං හොති ඉමස්මිං සහස්සන්ති ආදිනා සඤ්ඤාණං කත්වා ගණනා."

(මැදුම්සඟි ටීකා)

එකදෙක ඈ පිළිවෙළින් ගිණුම. පාලියෙහි ගණනා යන්නෙන් මේය දක්විණ. අටුවාහි 'ගණනා ති අච්ඡිද්දකගණනා' යි ද 'සා පන පාරසිකම්ලක්ඛාදයො විය එකං ෙවති ආදිනා නවන්න විධිනා නිරන්තර ගණනා ති වෙදිතබ්බා''යි ටීකායෙහි ද දක්වේ. එක දෙක ඈ විසින් නවය තෙක් ගණින ක්‍රමයෙන් වහරෙහි එන පාරසික මිසර ආදින් ගේ ගිණුම් ක්‍රමය යි.

පිඩුගිණුම (සංඛ්‍යාන). අච්ඡිද්දගණනා යන්න විස්තර කරන විමතිවිනොදනියෙහි 'ආදිසඞ්ඛෙන - සංකලන - පටුප්පාදන - වොකලන - භාගහාරාදිවසෙන පවත්තා පිණ්ඩගණනා ගහිතා''යි පිඩු ගිණුමෙහි ප්‍රභේද දක්විණ. සංකලන පටුප්පාදන වෝකලන භාගහාරාදිහු එහි ප්‍රභේද හ **සංකලන** යනු එකතු කිරිම ය. පටුප්පාදන යන්නට අඩු කිරිම ය යන අරුතෙක් එංගලන්තයේ පාලිපොත් සමිතියේ පාලිඉංගිරිසි ශබ්දකෝෂයේ දක්වේ. එහෙත් පටුප්පාදන (ප්‍රාකෘතයෙහි **පඩුප්පාඅණ,** සකුයෙහි **ප්‍රත්‍යුත්පාදන**) යනු ගුණ කිරීම යි. වොකලන (ව්‍යවකලන) යනු අඩු කිරීම ය. භාගහාර යනු බෙදීම ය.

95 **උපාදන රහිත ව.** අරමුණ දැඩි ව ගැන්ම උපාදන නම්. එය කාමූපාදන දිට්ඨුපාදන සීලබ්බතුපාදන අත්තවාදූපාදන යැ යි චතුර්විධ යි. කාමය ම උපාදන වූයේ කාමූපාදන යි නොහොත් කාමවස්තූන් දැඩි කොට ගන්නා බලවත් තෘෂ්ණාව කාමූපාදන නම්. විපරීතග්‍රාහයෝ (දෙසැට දිට් ආදිහු) දිට්ඨුපාදන යි. ශීලව්‍රතයෙන් සංසාර ශුද්ධිය වෙතැ යි දැඩිගැන්ම සීලබ්බතුපාදන යි. විසිවැදෑරුම් සක්කායදිට්ඨිය අත්තවාදූපාදන නම්. තථාගත බුදුහු මේ සියල්ලෙන් මිදුණාහ.

96 **අජාසත්.** මෙ තෙම රජගහ පුර බිම්සර රජුගේ පුත්‍රයා ය. වේදේහී බිසව මොහුගේ මව ය. සර්වාස්තිවාදීන් ගේ කිසි පොතෙක මැගේ නම **වාසවී** යැ යි සඳහන් වේ. ඕ මහ කොසොල් රජුගේ දූ යැ යි මහාවිහාරික අටුවාහි දක්වේ. ඇයට වේදෙහි යන නම වූයේ පණ්ඩිත සත්‍රී යන අරුතෙන් යැ යි ද එහි දක්වේ. ජෛන පොත්වලැ දක්වෙන පරිදි ඕ නිවට නාපුත්‍ර ගේ මව වූ ත්‍රිශාලාව ගේ වැඩිමාලු සොහොයුරි ය. චේතක රජු ගේ දුවකි. මොහු කුසැ ඉන්නා කල ඇයට සැමියා ගේ දකුණු බාහුයෙන් ලේ බොන්න

දෙලෙක් උපනි. රජ එය අසා බාහුව පළවා ලේ දුන. **අජාත** ව (නො ඉපදී මැ) පියාට **ශත්‍රැ** වූ කාරණයෙන් හේ අජාතශත්‍රැ (අජාසත්) නම් වී ල. තරුණ වයස පත් කල ඔහුට උපරජය ලැබිණ. එසමයෙහි දෙව්දත් තෙර ඍද්ධි-ප්‍රාතිහාර්‍ය්‍යයෙන් ඔහු සිත් ගෙන රවටා පහදවා ගත්තේ ය. හේ කුමරු පිතෘවධයෙහි පෙළඹුයේ ය. දෙව්දතු ගේ ආශ්‍රය හේතු කොට ගෙන පියා මරන්නට සිතූ හේ පිය රජහට වද දෙවී ය. රජ මෙළේ ය. සැමියා මළ සොවින් මා බිසව ද නො බෝ කලෙකින් මළාය. එතැන් පටන් කොට රජ නින්දේදී බිය ව පිබිදේ. එබැවින් නො නිදු කල් ගෙවනු රිසියෙන් මහණ බමුණන් කරා එළැඹ සාකච්ඡායෙහි යෙදේ.

87, 90, 91, 92 **ශාස්තෘහු ස දෙන.** බුදුරජුන් පහළ වන සමයෙහි දඹදිවැ ස දෙනෙක් ශාස්තෘහු වූහ. කාශ්‍යප පූරණ, ගෝශාලමස්කරී, කාත්‍යායන කකුධ, වෛරාටිපුත්‍ර සංජය, කේශකම්බලී අජිත, ඥාතපුත්‍ර නිගණ්ඨ යන ස දෙනා ය. බෞද්ධ ග්‍රන්ථවල සේ ම ජෛනග්‍රන්ථවල ද මොවුන් ගේ තොරතුරු දක්වේ.

කාශ්‍යප පූරණ. පාලි අටුවාහි දක්වෙන පරිදි මොහු උපතින් එක් සිටක්හු ගේ දසයන් සියය පිරිණ. එහෙයින් **පූරණ** නම් වී. කාශ්‍යප නම් ගෝත්‍රයකට අයත් බැවින් කාශ්‍යප නම් වී. වැඩි වයසට පැමිණි මෙ තෙම ස්වාමියා කෙරෙන් පලා ගියේ ය. සොරු මගදී ඔහු ගේ වස්ත්‍රය හැර ගත්හ. හේ නිරුවතින් ම ගියේ ය. මිනිස්සු ඔහු දක අපිස් ගුණැති රහතෙකැ යි සත්කාර කළහ. ඔහුට පන්සියයක් පමණ සව්වෝ වූහ. මේ අටුවාහි ඔහු ගැන සඳහන් පුවත ය. මෙ තෙම අක්‍රියාවාදියෙක. කුසලැ යි සම්මත හෝ අකුසලැ යි සම්මත කවර කර්‍මයක් කළත් එයින් වන පිනෙක් හෝ පවෙක් නැතැ යි හේ පැවැසී ය. මොහු ගේ වාදය සංයුත්සඟියේ දේවපුත්තසංයුත්තකයේ නානාතිත්ථියසූත්‍රයෙහි මෙ සේ සංකෙපින් දක්වේ:

"ඉධ ඡින්දිත මාරිතෙ හතජානිසු කස්සපො
පාපං න සමනුපස්සති පුඤ්ඤං වා පන අත්තනො"

(මෙ ලොවැ අත් පා ඈ සිඳීමෙහිත් තැළුම් පෙළුම් කැරුමෙහිත් මෙරමා ධනයට හානි කැරුමෙහිත් එය කරන්නහුට පවක් හෝ මෙකී ක්‍රියායෙන් වැළැක්මෙන් පිනක් හෝ කාශ්‍යපයෝ නො දකිත්.)

මෙසේ කාශ්‍යප පූරණයා ගේ වාදය චාර්‍වාක දර්‍ශනයට බෙහෙවින් සමාන ය. මෙ තෙම කුශලාකුශල නම් දෑයක් නැතැ යි කර්‍මය නො පිළිගන්නේ විපාක ද නො පිළිගනී. එ හෙයින් අහේතුවාදී ද අප්‍රත්‍යයවාදී ද නාස්තිකවාදී ද අක්‍රියවාදී ද වේ.

ගෝශාලමස්කරී. මෙ තෙමෙ (පාලි අටුවාහි දැක්වෙන පරිදි) ගවහලෙක උපන්නේ ගෝශාල නම් වී. පිරිවැජ්ජකු ගේ පුතෙකි. සිටක්හු වෙත පුත් තන්හි වැඩුණේ ය. දිනෙක තෙල් කළයක් හිසින් ගෙන සවාමියා හා යනුයේ 'මා ඛලී' (පැකිල නො වැටෙව) යි ඔහු කියද්දිත් සැලැකිලි නැති වූයේ පැකිල වැටුණේ ය. බියෙන් පලා යන්නට සැරසුණහු දුටු සවාමියා ඔහු හැඳ තුබුණු රෙද්ද කොන අල්ලා ගත. හේ වස්ත්‍රය ද හැර දමා ඇත ගමකට පලා ගියේ ය. මිනිස්සු නිරුවත් ඔහු දැක රහතෙකැ යි සත්කාර කළහ. එ තැන් සිට ශාස්තෘවරයකු සේ පෙනී සිට සිය මතය දෙසි ල. **මක්ඛලී** යනු ඔහුගේ පළමු නමැ යි ද ගෝසාල යනු දෙවෙනි නමැ යි ද අටුවාහි ම කියන ලදි. 'මාඛලී' යන්න නිසා 'මක්ඛලී'යි නම වී නම් ඒ පුවතින් පසු ම ඒ නම විය යුතු ය. එසේ කලැ අටුවාව කියන පරිදි එය මුල් නම වනුයේ කෙසේ ද? මෙයින් තෙල්කළ පුවත බිඳ වැටේ. ජෛන පොත්හි දැක්වෙන පරිදි මංඛලයක්හු ගේ පුත් වූ බැවින් මුල දී ම **මංඛලී, මංඛල පුත්‍ර** යී නම් ලද්දේ නම් ඒ ම මුල් නම වූ කලැ ගෝසාල යනු දෙවෙනි නම වී ය' යන අටුවා කියමන සපිර වේ. මංඛලී යන්න පාලියෙහි මක්ඛලී යි වූ සේ පෙනේ. 'මාඛලී' යන්නක් නිසා ඇති වූ නමක් ඔහු ගේ අනුගාමීහු වහරවත් ද? මෙ තෙමෙ දෙවසක් නාථ පුත්‍රයා ගේ අතවැසි වැ සිට ඔහු ගේ පිරිසෙන් කොටසක් කඩා ගෙන වෙන් ව ඔහුට සතුරුකම් කෙළේ යැ යි ද ඉන් පසු ව මැරී නිරයේ උපනැ යි ද ජෛන ග්‍රන්ථවල දැක්වේ. මොහුට සතුරු වූ ජෛනග්‍රන්ථකාරයනට තෙල්කළ පුවත ලැබුණේ නම් එය ඔහු සිය පොත්හි සඳහන් කරන්නාහු ම ය. දඹදිවැ මහායාන පොතෙක ද මේ පුවත නැත. මහායානිහු **මස්කරී ගොශාල** නමින් ඔහු හඳුනති. වියලි ලා උනා දංඩක් දරන ආජීවිකයෝ මස්කරීහු ය. මෙ තෙමේ ආජීවිකනායකයෙක් ය. **නන්දවච්ඡ කිසසංකිච්ච**[1]

1 මහාසච්චක සූත්‍රය.

යන දෙදෙන මංඛලීහට දූව්යෙහි සිටි මේ ආජීවිකනිකායයේ මහ තවුසෝ ය. මංඛලීහු ගේ දර්ශනය සංසාරශුද්ධිවාදයෑ යි ප්‍රකට විය. එක්තරා කාලසීමාවක් තුළ සසර ඉදිරියට වැඩී වැඩී ගොස් ස්වභාවයෙන් ම විමුක්තියට පැමිණෙතෑ යි යනු සංසාරශුද්ධිවාදීන් ගේ මතය ය. ඔවුන් කියන පරිදි කිසි හේතුවක් ප්‍රත්‍යයක් නැති ව ධර්මතාවශයෙන් ඉබේ ම මේ සසර ගමන හා විමුක්තිලාභය සිදු වේ. මේ පරිණාමවාද විශේෂයෙකි. මෙසේ මෙ තෙම අහේතුඅප්‍රත්‍යයවාදී ද පරිණාමවාදී ද සංසාරශුද්ධිවාදී ද වේ. **උවාසගදසාඕ** (උපාසකදශාංග) නම් ජෛනසූත්‍රයෙහි දක්වෙන පරිදි මෙ ශ්‍රාවකඥ්‍යාවාසියෙකි.

කකුධකාත්‍යායන. මෙ තෙමේ පකුධකච්චායන නමුදු වේ. කච්චායන යනු ගෝත්‍රනාමය යි. දුගි ස්ත්‍රියක ගේ පුතෙකි. කුඹුක් (කකුධ) රුකක් මුල දී මවු කුසින් බිහි වූ කරුණින් කකුධකාත්‍යායන නම් වී ල. බමුණෙක් ඔහු දැක ගෙන ගොස් දරු තනතුහි තබා වැඩී ය. බමුණා මළ පසු දිවි රක්නා මගක් නැත්තෙන් තවුස්පැවිද්ද ලැබී ල. මොහු ගේ නම **ප්‍රශනෝපනිෂත්හි** ද සඳහන් වේ. මොහු ගැනත් මොහු ගේ මත ගැනත් සූයගඩංග (සූත්‍රකෘතාංග)යෙහි කරුණු දක්වේ. මෙ තෙමෙ සප්තකාය වාදියෙක්. සත්ත්වයා නම් මොහු ගේ මතයෙහි පඨවි ආපෝ තේජෝ වායෝ සුඛ දුක්ඛ ජීව යන ධර්මසමූහ සතේ සංයෝගය යි. ජෛනග්‍රන්ථයක් වූ සූයගඩංගයෙහි (සූත්‍ර කෘතාඞ්ගයෙහි) ආත්මෂෂ්ඨවාද නමින් මොහු ගේ දර්ශනය හඳුන්වා ඇත.

සන්ති පංච මහාභූයා ඉහමේගෙසි මාහියා
ආයා ඡට්ඨා පුණො ආහු ආයා ලොගෙ ය සාසඑ
දුහ ඔ න විනස්සන්ති නො ය උප්පජ්ජඑ අසං
සව්වෙ වි සව්වහා භාවා නියතීභාවමාගයා.

(සූයගඩංග. 1. 1. 1. 15—16)

(මෙහි ආත්මය සවැනි කොටැති පංච මහාභූත කෙනෙක් ඇතැයි කෙනෙක් කිහ. මේ දෙ කොටස ම නො නැසෙත්. කලදී නොවූ දෙයෙක් අමුතුවෙන් නො ම උපදී. මේ සියලු භාවයෝ හැම සැටියෙන් ම නියතිභාවයට පැමිණියාහ.) නියතිභාව යනු විය යුත්ත වන බව ය.

'කෙනෙක් අනෙකකු අවියෙකින් ඇන මැරූහු නම් එහි ධාතු මිටියක් ධාතු රැසක් මැදින් යෑම විනා මරණයෙක් නො වී ය. ආත්මය මැරිය නො හැක්කැ' යි මෙ තෙමෙ කියයි. භගවත්ගීතායෙහි දෙවෙනි සගීයේ මොහු ගේ වාදයට සමාන මතයෙක් දක්වේ.

''ය එනං වෙත්ති හන්තාරං යශ්චෛනං මන්‍යතෙ හතම්
උභෞ තෞ න විජානීතෞ නායං හන්ති න හන්‍යතෙ'

(මැරූ එකෙකුත් මරනු ලැබූ එකෙකුත් ඇතැ යි සිතන දෙ දෙනා ම ඇනි තතු නොදත්තෝ ය. මේ සත්ත්වයා නො නසයි, නො ද නැසෙයි.) මේ කකුධකච්චායනවාදය ප්‍රශ්නොපනිෂත්හි ද සඳහන් වේ. මෙ තෙමෙ නියතිවාදියෙකි.

වෛරාටිපුත්‍ර සංජය. (බෙලට්ඨිපුත්ත සංජය. මෙ තෙම බෙලට්ඨියකු ගේ (වෛරාටියකු ගේ—විරාටපුර වැසියකු ගේ) පුතෙකි. එහෙයින් බෙලට්ඨිපුත්ත (වෛරාටිපුත්‍ර) නම් විය. මොහු ගේ ප්‍රධාන නම සංජය (සංයත) ය.[1] මෙ තෙමෙ වික්ෂේපවාදියෙකි. මේ කිසිදු පැණයකට කෙළින් උත්තර නො දී ඉවතට පනී. ජෛන පොත්හි මෙ තෙම අඥානවාදී යැ යි දක්වේ.[2]

කේශකම්බලී අජිත. කෙසින් වියුණ කම්බලයක් දරන බැවින් කේශකම්බලී යි ප්‍රකට වූ මොහු ගේ නියම් නම අජිත ය. මෙ තෙම උච්ඡේදවාදී ය. මහාභූත සතරෙන් හැදී ඇති කය මරණයේදී බිඳී ගිය පසු කිසිත් ඉතිරි නො වේ යැ යි ද පරලොවෙක් නැතැ යි ද මෙ තෙම කියයි. මෙසේ මෙ තෙම අක්‍රියාවාදී ද අහේතුවාදී ද අප්‍රත්‍යයවාදී ද නාස්තිකවාදී ද වේ. ජෛන සූත්‍රකෘතාඞ්ගයෙහි මොහු ගේ වාදය මෙසේ දක්වේ.

නත්ථි පුණ්ණෙ ව පාවෙ වා නත්ථි ලොයෙ ඉඹ වරෙ
සරිරස්ස විණාසෙණං විණාසො හොඉ දෙහිණො
(සූයගඩංග. 1. 1. 1. 11)

(පිනෙක් ද නැත පවෙක් හෝ නැත. මෙයින් මතු පරලොවෙක් ද නැත. සිරුර නැසීමෙන් සත්ත්වයා ගේ විනාශය වේ. (සූයගඩංග. 1. 1. 1. 11), මෙයින් මොහු චාර්වාකවාදය අනුවගියෙකි.

1. සංයත යන සංස්කෘත ශබ්දයේ ප්‍රාකෘතරූපය සංජය ය.
2. උත්තරාධ්‍යයනසූත්‍ර xviii 22-23, සූත්‍රකෘතාඞ්ග I. 6. 27

ඤාතපුත්‍ර නිර්ග්‍රන්ථ (නාතපුත්තා නිගණ්ඨ). මේ තෙම වජ්ජි රටෙහි කුණ්ඩග්‍රාමාධිපති ලිච්ඡවීවංශික සිද්ධාර්ථ ක්‍ෂත්‍රියයා ගේ පුත්‍ර ය. ඤාතගෝත්‍රික බැවින් මේ ඥාතපුත්‍ර (නාතපුත්ත, නායපුත්ත) නමින් හැඳින්විණ. වර්ධමාන මහාවීර යන නම් වලින් ද මේ ප්‍රකට වී ය. මේ රාජපූජිත කම්වාදී ක්‍රියාවාදී තවුසෙකි. මොහු ගේ දර්ශනය ස්‍යාද්වාදය ය. චාතුර්යාමසංවරය මෙ තෙම පැණෑවී යැ යි පොත්හි එයි. සියලු ඇල් දියෙන් වැළැක්ම, සියලු පවින් වැළැක්ම, ආස්‍රවනිරෝධය, පාප නිර්ජරණය (ක්‍රමයෙන් පව් දුරලීම) යනු චාතුර්යාම සංවරයැ යි උදුම්බරිකසීහනාදසූත්‍රයෙහි දක්වා ඇත. සිසිල් දිය ආදිය පරිභොගකරන්නෝ ගිහියෝ ය මහණහු නො වෙති යි සූයගඩාඞ්ගි[1] (සූත්‍රකෘතාඞ්ගයෙහි) දක්වා ඇත. ඒ ශීතෝදකාදි සතරින් වැළැකුණෝ මහණ යැ යි හඟවන ඒ ගාථාදියෙන් පාලිපොත්හි දැක්වෙන චාතුර්යාම සංවරය ඔවුන් ගේ පොත්හි ද සඳහන් ව ඇති බව පෙනේ. ඥාත පුත්‍ර නිර්ග්‍රන්ථ තෙම සතුන් ගේ (ජීවීන් ගේ) මූලක් අගක් නැතැ යි කිය යි. මේ තෙම පෘථගාත්මවාදී ය. එක එක පුද්ගලා තුළ ඇති ජීවය කෙලෙසුන් ගෙන් මිදී අනන්ත ව මුහුකුරන්නේ යෙයි යනු ඔහු මත යි. මොහු ගේ දහමෙහි බුදුදහමට අනුලොම් වන දෑත් ඇත.

94 **ඉන්ද්‍රියසංවරය** = ඉඳුරන් හමුරා ගැන්ම. ඇස කන නැහැය දිව කය මනස යැ යි ඉඳුරෝ සදෙනෙකි. ඒවාට ගොදුරු වන රූ සද ගඳ රස හැපෙන දෑ දහම්අරමුණු යැ යි අරමුණු ද සයෙකි. ඒ ඇස්ආදියට රූපාදි යමක් හමු වූ කල්හි චක්ඛුවිඤ්ඤාණ (දකින සිත) ආදි සිත් උපදී එසේ ඇති වන සිත් පෙළෙහි ඒ අරමුණ නිසා රාගාදි කිලුටක් ඇති නො වන සේ සිත් රැක ගැන්ම ඉන්ද්‍රිය සංවර නමි. රූපයක් දුටු කලැ එහි හැඩරුව අනේ සිත් නො යැවිය යුතු. ශබ්දාදි අරමුණෙහිත් මෙසේ ම පිළිපැද්ද යුතු.

95 **සතිසම්පජඤ්ඤය** = සිහිය හා නුවණ. අරමුණෙහි මුළා නො වන සේ එළැඹ වූ සිහිය සති (ස්මෘති) නමි. සම්පජඤ්ඤය (නුවණ) සාත්ථකසම්පජඤ්ඤ සප්පායසම්පජඤ්ඤ ගෝචර-සම්පජඤ්ඤ අසම්මොහසම්පජඤ්ඤ යී සිවුවැදෑරුම්. යැම් ඊම් ආදියෙහි වැඩ ඇති නැති බව, ප්‍රයෝජන ඇති නැති

1. සීතොදගං වා තහ බිය කායං ආහාය කම්මං තහ ඉත්ථියාඕ එයාඉං ජානං පඩිසෙවමාණා අගාරිණො අසමණා භවන්ති.

(සූයගඩංග 2. 6. 8)

බව සලකන නුවණ **සාත්ථකසම්පජඤ්ඤ** නම්. යෑම් ඊම් ආදියෙහිදී එය තම කම්ටහනට සුදුසු නොසුදුසු බව, සැප නොසැප බව, එයට හානිකර හෝ වෘඩිකර බව සලකන නුවණ **සප්පායසම්පජඤ්ඤ** නම්. කවර කායිකයෙක සිටිය ද කමටහනෙහි ම යෙදී එයින් පිටත නොගොස් සිටීම දන්නා නුවණ **ගෝචරසම්පජඤ්ඤ** නම්. යෑම් ඊම් ආදියෙහි දී මේ යෑම් ආදිය පුගුලකු කරන දෑයක් නොව චිත්තක්‍රියා වායුධාතුව අත් පා ඈහි පැනිරැ යෑමෙන් වන එකෙකැ යි ඒ යෑම් ආදියේ තතු ඇති සැටියෙන් දන්නා නුවණ, එබැවින් එහි මුළා නොවන නුවණ අසම්මෝහ-සම්පජඤ්ඤ නම්.

96 **සන්තෝෂය.** යථාලාභසන්තෝෂ, යථාබලසන්තෝෂ, යථා-සාරුප්‍යසන්තෝෂ යැ යි සතුට ත්‍රිවිධ ය. චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස යැ යි සතර පසයෙන් එකිඑකී පසයෙහි තුන් තුන් සතුට ඇති වීමෙන් සතුට දෙළොස් වැදෑරුම් වේ. මහණෙක් වටිනා හෝ නොවටිනා සිවුරක් ලබයි. හේ එයින් ම සැහීමට පත් වෙයි. එයට වැඩිපුර හෝ වඩා අගනා සිවුරු ලැබුණත් නො පිළිගනී. මේ සිවුරෙහි යථාලාභසන්තෝෂ ය යි. කිසි මහණෙක් දුබල වෙයි. අගනා වුව ද බර සිවුරු දැරුම ඔහුට අමාරු වෙයි. හේ තමාගේ බර සිවුර අන් මහණකුගේ නොවටිනා නමුදු හැල්ලු සිවුරකට මාරු කොට ගනී. එයින් සැහීමට පත් වෙයි. මේ සිවුරෙහි **යථාබලසන්තෝෂය යි.** ලාභී මහණෙක් තමාට ලැබෙන මිහහු සිවුරු ආදිය තමාට වඩා එයට සුදුසු මහතෙරුනට දී තෙමේ තමාට සරි ලන චාම් සිවුරෙකින් සැහීමට පත් වෙයි. මේ සිවුරෙහි යථාසාරුප්‍ය-සන්තෝෂය යි. මේ නයින් ම පිණ්ඩපාතාදි සෙසු තුන්-පසයෙහි ද තුන්සතුට ඇති වන අයුරු දත යුතු.

97 **පළමුදහන්.** ප්‍රථම (රූප) ධ්‍යානය. ශමථභාවනාව කරනුයේ පඨවිකසිණමණ්ඩලාදි අරමුණක් ඇසින් බලා සිතට ගන්නට තැත් කරයි. කිසි විටෙක ඇසි පියා එය මතක් කළ විට සිතට එය පෙනෙන්නට වෙයි. බැහැරැ වූ ඇසට පෙනුණු අරමුණෙන් සිතට ගත් පිටපත උද්ග්‍රහ නිමිත්ත නම්. ඉන් පසු සිතට පෙනෙන ඒ අරමුණ (උද්ග්‍රහ නිමිත්ත) දෙස ම සිතින් බලා ගෙන සිත එකග බව වඩයි. අන්තිමේදී එසේ පෙනෙමින් තුබුණු උද්ග්‍රහ නිමිත්තයට වඩා සියදහස් වාරයෙකින් දීප්ත වූ විදුලිය බුබුලක් බඳු එකෙක් උද්ග්‍රහ

නිමිත්ත බිඳගෙන මතු වූණා සේ පෙනෙන්නට වෙයි. මේ ප්‍රතිභාග නිමිත්ත නමි. ඉක්බිති එය සිතින් ඉට ඉටා ක්‍රමයෙන් වඩ වඩා මහත් කොට දකින්නට තැත් කළ යුතු. එහි සිත නදින් බඳින්නට උත්සාහ කළ යුතු. සුදුසු පමණට සිතේ එකග බව වැඩුණු කල්හි විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා යන අංග පසින් යුත් වූ ධ්‍යාන සිත ඇති වෙයි. පළමුවෙන් උපන් ධ්‍යාන සිත බැවින් මෙයට ප්‍රථම ධ්‍යාන (පළමු දහන්) සිතැ යි බැවහර යි. මේ සිතෙහි වූ ධ්‍යානාංග පසින් විතර්කය යනු ධ්‍යාන සිත හා එහි සෙදුණු සෙසු චෛතසිකයන් ප්‍රතිභාග අරමුණට නැංවීම (එළැවීම) යි, විචාර නම් ඒ අරමුණෙහි චිත්තචෛතසිකයන් ගැළැපීම, ඒ අරමුණ පිරිමදින්නා බඳු ආකාරය යි. එහි සිත පිනා යැම ප්‍රීතිය යි. එයින් සිතැ වන සුවය සුඛ නමි. චිත්ත චෛතසිකයන් ඒ ප්‍රතිභාග අරමුණෙහි ම රුඳී නැවැති පැවැත්ම ඒකාග්‍රතා (එකග බව) යි. මෙසේ මේ ධ්‍යානාංග පසින් අරමුණට ළංව එය දෙස බැලීම **ධ්‍යාන** (ඣාන) නමි. **ඣාන** (දහන්) යන්නෙහි 'දැවීම' යන අර්ථයෙක් ද වෙයි. විතර්කය හේතු කොට ගෙන ථිනමිද්ධයට ඉඩ නැති වෙයි. ප්‍රීතිය ඇති කල ව්‍යාපාදයට ඉඩ නො ලැබෙයි. සුඛය ඇති කල උද්ධච්චකුක්කුච්ච නැති වෙයි. එකාග්‍රතායෙන් (ප්‍රතිභාග නිමිත්තෙහි ම සිත බැඳුණු බැවින්) කාමච්ඡන්දය වැද්ද නො හෙයි. මෙසේ විතර්කාදි අංග පස හේතු කොට ගෙන ථිනමිද්ධාදි නිවරණ පස දැවී යෙයි. මෙසේ නිවරණයන් දවන්නා යන අරුතෙක් ද **ඣාන** යන්නෙහි ඇත.

98 **දෙවෙනි දහන.** (ද්විතීයධ්‍යානය). උඩ කී පරිදි පළමු දහන ලත් තැනැත්තා එකී ප්‍රතිභාග නිමිත්තෙහි නැවැත නැවැත සිත බඳිමින් හෙවත් නැවත නැවත ඒ ධ්‍යානයට සමවදිමින් එය හොඳට හුරු පුරුදු කැරැ ගත් පසු විතර්ක විචාර නැති **ප්‍රීති සුඛ ඒකාග්‍රතා** යන තුන් අංගයෙන් යුත් ධ්‍යාන සිත පහළ වේ. මේ දෙවෙනි රූප ධ්‍යානය යි.

99 **තෙවෙනි දහන.** (තෘතීය ධ්‍යානය). උඩ කී පරිදි දෙවෙනි දහන් ලදුයේ නැවැත නැවැත එය වඩනුයේ සුඛ ඒකාග්‍රතා යන අංග දෙකින් යුත් තුන්වන රූප ධ්‍යානය ලබයි.

100 **සතර වන දහන.** (චතුර්ථ ධ්‍යානය). යට කී පරිදි තෙවෙනි දහන ලදුයේ එය යලි යලි සමවදිමින් මැනැවින් පුරුදු කැරැ ගත් කලැ උපේක්ෂා ඒකාග්‍රතා යන අංග දෙකින්

යුත් චතුර්ථ රූප ධ්‍යානය ලැබෙයි. මේ රූපධ්‍යානයන් ගේ අවසානය ය. මෙය ලැබූ පසු සෘඬිවිධඥනාදි පංචාභිඥ වැඩිය හැක්ක. එසේ ම රූපවිරාග භාවනා කොට අරූපධ්‍යාන ලබන හැක්ක. අරූප ධ්‍යාන සතරෙකි. එය ලබන සැටි සැකෙවින් මෙසේ ය: සතරවන රූදහන ලැබූයේ එය හොඳට පුරුදු කොට ඉක්බිති සිතට පැනෙන අහසෙහි කසින එළිය පතුරුවයි. ඉක්බිති ඒ කසිණ එළිය ඈතුරු දහන් වන්නට සිතයි. මේ උත්සාහය මුදුන් පත් කල්හි කසිණ එළිය නැති හිස් අහස පෙනෙයි. ඒ කිසුණු එළිය ඉගිල්ලීමෙන් පැනෙන අහස (කසිණුගඝාටිමාකාසය) අරමුණු කොට එකග බව වඩයි. අන්තිමේදී එහි හදින් සිත එකඟ ව පළමු වන අරූපධ්‍යාන සිත පහළ වෙයි. මේ ආකාසානඃචායතන කුසල් සිත නම්. මෙයට යළි යළි සම්වදීමින් එය හොඳට ම පුරුදු කොට ඉන් පසු දෙවෙනි අරූදහන් ලබන්නට සිතයි එයට සමවැද යලි එයින් නැගී සිටියි. මඳ වේලාවකට කලින් තමා තුල පහළ ව තුබුණු ආකාසානංචායතනධ්‍යාන සිත අරමුණු කරයි. එහි සිත එකඟ කරන්නට තැත් කරයි. අන්තිමේදි ඒ ආකාසානංචායතන සිත නැමැති අරමුණ එල්බ ධ්‍යාන සිතෙක් පහළ වෙයි. එය විඤ්ඤාණඤ්චා-යතනධ්‍යාන සිතයි. මේ දෙවෙනි අරූපධ්‍යාන යි. මෙය පුරුදු කොට ඉන් පසු ආකාසානංචායතන ධ්‍යාන සිතේ නැති බව අරමුණු කෙරෙයි. එය අරමුණු කොට එහි සිත එකග බව වැඩිමේදි ආකිඤ්චඤ්ඤයතන ධ්‍යාන සිත (තුන්වන අරූප ධ්‍යාන සිත) පහළ වෙයි. එය ද හොඳට පුරුදු කොට ඉක්බිති ආකිංචඤ්ඤයතන ධ්‍යාන සිත මතක් කොට ගෙන එහි සිත බැඳ සමාධිය වඩයි. එවිට සිතක් සංඥවක් ඇද්ද නැද්ද යි කිය නොහැකි තරම් සියුම් වූ නේවසඤ්ඤානාසඤ්ඤයතන ධ්‍යාන සිත පහළ වෙයි. මෙසේ ආකාසානංචායතනාදි සතර අරූප ධ්‍යාන කෙනෙස.

101 **අට සමවත්.** උඩ කී රූපධ්‍යාන සතර ද අරූප ධ්‍යාන සතර දූ යි සමවත් අටෙකි.

102 **වශිතා.** වශිතාවයෝ. ආවජ්ජනවසිතා සමාපජ්ජනවසිතා අධිට්ඨානවසිතා වුට්ඨානවසිතා පච්චවෙක්ඛණවසිතා යි වශීභාව පසෙකි. විතක්ක විචාර ආදි ධ්‍යානාංග එක එක වහ වහා මෙනෙහි කිරීමේ සමත්බව ආවජ්ජනවසිතා නමි.

තමා කැමැති ධ්‍යානයකට කැමැති විටෙක සමවදිනුයෙහි සමත් හුරු පුරුදු බව සමාපජ්ජනවසිතා නම්. තමා ඉටා ගත් තරම් වේලාවක් සමාධිය පැවැත්වීමෙහි හුරු පුරුදු බව අධිෂ්ඨානවසිතා නම්. ඉටූ පරිදි ම තමා කැමැති කෙණෙහි ධ්‍යානයෙන් නැඟී සිටිනු සමත් බව වුඨානවසිතා නම්. ඉතා වේගයෙන් ධ්‍යානාංග ප්‍රත්‍යවේක්‍ෂා කිරීමේ පුරුදු බව පච්චවෙක්ඛණ වසිතා නම්. මෙහි විස්තර විසුද්ධිමග්ගයේ චිත්තවිසුද්ධිනිද්දෙසයේ රූපධ්‍යාන විස්තරය හෝ අභිධම්මත්ථ සංග්‍රහයේ නවවන පරිච්ඡේදය විස්තර ව ඇති ටීකා ව්‍යාඛ්‍යා ආදිය හෝ බලා දත යුතු.

103 **මනෝමය ඍද්ධි.** මේ කොපුවෙන් කඩුව එළියට අදනා සේ ද, තණ ගසෙකින් එහි ගොබය අදනා සේ ද, මේ සිරුරෙන් අන් මනෝමය සිරුරක් නිකුත් කිරීම යි. මෙය කරනු කැමැති චතුර්ථධ්‍යානලාභියා චතුර්ථධ්‍යානයට සමවැද එයින් නැඟී සිට සිය කය ආවර්ජන කොට එය තුළ විවරයක් සේ ඉඩෙක් ඇති වේ වා යි ඉටයි. එය එසේ ම වෙයි. එය තුළ සිරුරෙක් වේ වයි ඉටයි. ඒ ද එසේ ම වෙයි. ඉන්පසු ඒ සිතින් මවන ලද කය කොපුවෙන් කඩුව මැත් කරන්නා සේ මැත් කෙරෙයි. මෙසේ සිතින් කයක් මවා පෑම මනෝමයර්ධි නම්. විශුද්ධිමාර්‍ගයේ ඍද්ධිවිධ නිර්දේශය බලන්නැ.

104 **ඍද්ධිවිධඥානය.** මේ එකකු බොහෝ දෙනෙකු මෙන් පෙනී සිටීම් ආදි වශයෙන් ඍද්ධිවිකුර්වණයෙහි සමත් නුවණ යි. ඉදින් තමා සිය දෙනෙකු ව පෙනෙනු රිසි නම්, චතුර්ථ-ධ්‍යානයට සමවැද එයින් නැඟී සිට සියයෙක් වෙම් ව යි පිරියම් කොට යළි දු චතුර්ථධ්‍යානයට ම සමවැද නැඟී සිට ඉටයි. ඉටන්නා හා ම සියයෙක් වැ පෙනෙයි. මෙසේ ඍද්ධි කරන නුවණ ඍද්ධිවිධඥාන යි. විස්තර විශුද්ධිමාර්‍ගයේ ඍද්ධිවිධ නිර්දේශයේ බලා දත යුතු.

105 **දිවකන් නුවණ** යනු මිනිස් කනින් නො අසනැ හැකි ළඟ දුර දෙක්හි ම වූ ශබ්ද අසා දැන්මෙහි සමත් නුවණ (දිව්‍ය ශ්‍රෝත්‍ර ඥානය)යි. අභිඥාපාදක චතුර්ථධ්‍යානයට සමවැද එයින් නැඟී සිට පරිකර්ම වශයෙන් උපන් එකඟ සිතින් කනට ඇසෙන හඬට ඇහුම්කන් දිය යුතු. මහ හඬ පටන් කෙමෙන් ඉතා ම හීන් හඬ දක්වා ඇසීමට කන් යොමු කළ යුතු. උතුරු දකුණු ආ ඒ ඒ දිගින් ඇසෙන ඒ ඒ කුඩා මහත් හඬට ද පිළිවෙළින් කන් යොමු කළ යුතු.

ඒ ශබ්ද නිමිති මෙනෙහි කළ යුතු. එයින් යම් එක් ශබ්දාලම්බනයෙක එල්බැ සමාධිය වඩන ඔහුට ඒ අරමුණෙහි චතුර්ථධ්‍යාන සිත උපදී. එය හා උපන් නුවණ දිවකන් නුවණ නමි. මෙය වැඩුවාහට පියෙවි කනට නෑසෙන දෙව්හඬ ආදිය ද අන්තිමේදී ඇසෙන්නට වේ. මෙහි විස්තර විශුද්ධිමාර්ගයේ 13 වන අභිඥානිර්දේශය බලා දත යුතු.

106 **පරසිත් දන්නා නුවණ** යනු අනුන් සිතු දෑ දත හැකි නුවණයි. මෙය ලබන හැක්කේ දිවැස ඉපැදවූවහු විසිනි. හේ කසිණාලෝකය වඩා දිවැසින් අනුන් ගේ හදවත් රූපය නිසා පවත්නා ලෙයෙහි පැහැය බලා දත් මොහුට මෙබඳු සිතෙක් පහළ ව ඇතැ යි දනී. මෙහි විස්තර විශුද්ධිමාර්ගයේ චේතොපරියඤාණ කථාව බලා දත යුතු.

මේ පිළිබඳ ව හිඳු යෝගපොතක් වූ **ඝෙරණ්ඩසංහිතාවේ** එන විස්තරය මෙසේ ය.

"හෘදයෙ' නාහතං නාම චතුර්ථං පංකජං භවෙත්
කාදිඨාන්තාර්ණසංස්ථානං ද්වාදශාරසමන්විතම්
අතිශොණං වායුබීජං ප්‍රසාදස්ථානමීරිතම් .....
එතස්මින් සතතං ධ්‍යානං හෘත්පාථොජෙ කරොති යඃ....
ඥනං චාප්‍රතිමං තස්‍ය ත්‍රිකාලවිෂයම්භවෙත්
දූරශ්‍රුතිර් දූරදෘෂ්ටිඃ ස්වෙච්ඡයා ඛගතාං ව්‍රජෙත්"

"හෘදයෙහි කකාරය ආදි කොට ඨකාරය දක්වා අකුරු සටහන් ඇති පෙතිදොළොසෙකින් යුත් අනාහත නම් සතර වන පද්මයෙක් (චක්‍රයෙක්) ඇත. එය තද ලේ පැහැ ය. වායුබීජ වූ 'යං' යන්නෙන් යුක්ත ය. දෑකුම්කලු තැනෙකැ යි කියන ලද්දේ ය .... යමෙක් මේ හදපියුමෙහි නිතර දහන් වඩා නම් ඔහුට තුන්කල් දන්නා අසමාන නුවණ ද, දූරශ්‍රැතිය (දිවකන්නුවණ) ද, දූරදෘෂ්ටිය (දිවැස) ද, ලැබේ. කැමැති සේ අහසින් යැහැකි බව ද ලැබෙන්නේය."

107 **පූර්වේනිවාසානුස්මෘතිඥානය** යනුපෙර අත්බව් නාම් ගොත් ඈ විසින් සවිස්තර ව සිහි කළ හැකි නුවණ ය. මෙය වඩනු කැමැත්තනු විසින් චතුර්ථධ්‍යානයට සම වැද එයින් නැගී සිට තමා එහි ඉඳගත් මොහොත සිහි කළ යුතු. එතැන් සිට එයින් එහා එහා කළ දෑ පිළිවෙළින් ආපසු සිහි කළ යුතු. යම් දිනෙක මේ භවයේ තමා ගේ ප්‍රතිසන්ධිය තෙක් දැක්ක හැකි වී නම් ඉන් පසු පෙර අත්බැවැ මැරෙන

මොහොතෑ තතු සිහි කළ යුතු. එයින් පසු එයින් එහා වූ දෑ ආපස්සට සිහි කළ යුතු. මේ ක්‍රමයෙන් ආත්මභාව සිය දහස් ගණන් වුව ද සිහි කළ හැක්ක. මෙය කරන සැටි විස්තර වශයෙන් විශුද්ධිමාර්ගයේ අභිඥනිර්දේශයේ පුබ්බෙනිවාසානුස්සතිඤාණකථාවේ දැක්වේ.

පෙර ජාති සිහිකිරීමේ හින්දු යොගීන්ගේ ක්‍රමය මෙසේ වෙනයි. **'සංස්කාර සාක්ෂාත් කරණාත් පූර්වජාතිඥනම්'** යි පාතංජලයෝග සූත්‍රයෙහි එයි. සංස්කාර පසක් කිරිමෙන් පෙර ජාති දැක්ම වේ යැ යි එයින් කියන ලදි. මෙ තැන සංස්කාර යනු සිතේ රැඳි පවත්නා සටහන යි. අප යමක් කිරීමේදී ඇති වන සිතිවිලි නැති වී ගියත් එහි ලකුණ හෝ සටහන තරංගයක් මෙන් සිත් සතන්හි නොනැසී පවත්නේ යැ යි වේදන්තයෙහි එන මතයෙකි. එය සංස්කාර නම්. යෝගියා සිත එකඟ කොට තම සිත් සතන් ම අරමුණු කෙරෙමින් එහි සමාධිය වැඩීමෙන් මේ සංස්කාර දැක්මෙහි සමත් වේ. ඒ මඟින් සිතින් අතීතයට යෑමෙන් අතීත ජන්මයන් දකිනු සමත් වේ යනු ඔවුන් කියන සැටි යි.

408 **දිව්‍යස.** පූර්ව පුණ්‍යකර්මබලයෙන් දෙවියනට ලැබුණු චක්ෂුඃ-ප්‍රසාදය පිත් සෙම් ශ්‍රේ ආදියෙන් බාධිත නො වූ නො කිලිටි වූ ඈත්හි වූ ද දෑ දකිනුයෙහි සමත් එකෙකි. එය දිව්‍යස ය. යෝගියා ද ශමථ භාවනා වඩා ධ්‍යාන ලබා උපදවා ගත් ඈත දෑ දකිනුයෙහි සමත් නුවණ ද යටකි දෙවියන් ගේ ඇස බඳු බැවින් දිව්‍යසැ යි වහර ලැබී ය. එය ලබන සැටි සැකෙවින් මෙසේ ය: කසිණයක් වඩා චතුර්ථ ධ්‍යානය ඉපැදූවූ යෝගියා යළි තේජෝ කසිණ ඕදාතකසිණ ආලෝක කසිණ යන තුනින් එකක් වඩා කසිණාලෝකය උපදවා එය කැමැති තාක් පෙදෙසෙක පතුරුවන්නට තරම් හුරු බව ඇති කොට ගෙන එය අරමුණු කොට උපචාරධ්‍යාන අවස්ථාවට සිත නැංවිය යුතු. ඉන් පසු චතුර්ථධ්‍යානයට සමවැද එයින් නැඟී සිට කසිණාලෝකය කැමැති තාක් පැතිරවිය යුතු. ඒ එළිය පැතිරැ සිටි තන්හි සිදු වන දෑ එවිට පෙනෙයි. මෙසේ දක්නා නුවණ දිව්‍යස නම්. මෙහි විස්තර විශුද්ධිමාර්ගයේ චුතූපපාතකථාව බලා දත යුතු.

409 **රහත් වනු.** (28 පිටු) විපස්සනා වඩනුයේ සෝවාන් වීමේදී සක්කාය දිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස යන සංයෝජන තුන මුලින් නසාලයි. හේ තව දුරටත් විවසුන් වඩා

සකෘදගාමි මාර්ගය ලබනුයේ කාමරාග ව්‍යාපාද දෙක තුනී කරයි. තව ද දුරට ඔවුන් වඩනුයේ අනාගාමි මාර්ග අවස්ථාවට පැමිණ කාමරාග ව්‍යාපාද යන සංයෝජන දෙක මුලින් ම උදුරා දමයි. ඉන් පසු තවත් විවසුන් වඩා නුවණ මුහුකුරුවා අර්හත්ත්වමාර්ග අවස්ථාව ලබයි. එහි රහත් මඟනුවණින් රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යන ඉතිරි ව තුබුණු සියලු කෙලෙසුන් මුලින් ම උදුරාලයි. මෙසේ සියලු කෙලෙසුන් කෙරෙන් මිදීම රහත් වනු යි.

109 **විදු සරණ.** (30 පිටු.) විද්‍යා හා චරණ ධර්ම. විදර්ශනා ඥනය, මනෝමයර්ධිඥනය, ඍද්ධිවිධඥනය, දිව්‍යශ්‍රෝත්‍රඥනය, පරචිත්තවිජානනඥනය, පූර්වේනිවාසානුස්මෘතිඥනය, දිව්‍යචක්ෂුර්ඥනය, ආස්‍රවක්ෂයඥනය යන අට විද්‍යා නම්. සීලසංවරය, ඉන්ද්‍රියසංවරය, බොජුන්හි පමණ දැන්ම, ජාගරියානුයෝගය, ශ්‍රද්ධාව, හිරිඔතප්දෙක, බහුශ්‍රැත බව, වීර්‍ය්‍ය, ස්මෘතිය, (සංස්කාර අනිත්‍යාදි විසින් දන්නා) ප්‍රඥව, රූපාවචර ධ්‍යාන සතර යන පසොළොස චරණධර්ම නම්.

110 **පාතිමොක්ඛසංවරයෙන්.** උපසපන් පැවිද්දනට පැණ වූ ශික්ෂාපද ශීලයෙන්. සතර පරිජි, තෙලෙස් සඟවෙසෙස්, අනියත දෙක, තිස් නිසැගිපචිති, දෙඅනුවක් පචිති, පාටිදෙසනීය සතර, පන්සැත්තෑවක් සෙඛියා, අධිකරණ සමථ සත යැ යි දෙසිය සත්විස්සක් සිකපද මහණුනට ද, පරිජි අටෙක, සඟ වෙසෙස් සතොළොසෙක, නිසගිපචිති තිසෙක, ශුද්ධ පචිති එක් සිය සසැටෙක, පාටිදෙසනීය අටෙක, සෙඛියා පන් සැත්තෑවෙක, අධිකරණ සමථ සතෙකැයි තුන්සිය එකොළොසක් සිකපද මෙහෙණිනට ද පණවා ඇත. මෙයට පරිවාර විසින් සුළුවග මහවග දෙක්හි දක්වෙන වත් ආදිය පිළිබඳ පැණවීම් ද ඇත. මෙහි හික්මීම පාතිමොක්ඛසංවර නම්.

111 **ආචාර ගෝචර.** සිකපද රැක්ම ද මිථ්‍යාජීවිකායෙන් වැළැක්ම ද ආචාර නම්. මෙහි **මිථ්‍යා ජීවිකා** යනු ගිහියන් සිත් ගැනුම් වස් ඔවුනට තෑගි බෝග දීම, චාටුකම්‍යතාව (ගිහියා උස් තන්හි තබා තමා පහත් තන්හි තබා කතා කිරීම), මුග්ගසූපතා (ගිහියන් සිත් ගනුවට සැබෑ බොරු මිශ්‍ර බස් දෙඩීම), පාරිභට්ටකතා (දායකයන් ගේ දරුවන් වඩා ගැනුම් ආදියෙන් ඔවුනට ආදර දක්වීම), ජංඝපෙසනිකතා (ගිහියන් ගේ පණිවුඩ පණත් ගෙන යෑම), වෛද්‍යකර්මාන්තය කිරීම යන ආදියෙන් දිවි පැවැත්වීම යි.

ගොචර. පළමු කොට අගෝචරය දත යුතු. වෙසඟනන්, වැන්දඹුවන්, වුලල කුමාරිකාවන් (වයස් පැමිණ ද සවාමි කුලයකට නොගොස් ගෙහි ම වසන සත්‍රීන්) පණ්ඩකයන් මෙහෙණින් මත්පැන්හල් යන මොවුන් වෙත ගැවැසීම මහණුනට නො සුදුසු ය. රජුන් මහඇමැතියන් තීර්ථකයන් තීර්ථකශ්‍රාවකයන් හා නොසුදුසු සම්බන්ධය ද මහණුනට නො වටී. මහණුනට මෙහෙණියනට උවසුවනට උවැසියනට හෝ නිගා කරන ඔවුනට අහිත කැමැති සැදැහැනැති අය ඇසුර ද මහණුනට නො වටී. මේ අගෝචර ස්ථාන ය. මොවුන් ගෙන් වැළැකී සැදැහැති කුලයන් සේවනය කිරීම ගොචර නමි.

112 **පිරිසිදු දිවෙල.** උඩ කී අනාචාර අගෝචර දෙකින් වැළැකී, ආචාර ගෝචර දෙකින් ද කුශල වූ කායවාක්සමාචාර–යෙන් ද යුක්ත වූයේ පිරිසිදු දිවෙල ඇත්තේ (පරිශුද්ධාජීව) නම් වේ.

113 **බොජුනැ පමණ දන්නෙන්.** භෝජනයේ පමණ දැනුම් දෙකෙකි. සෙවුනා පමණ පිළිගන්නා පමණ විසිනි. පසය පස්විකා (ප්‍රත්‍යවෙක්‍ෂා කොට) වැළැඳීම සෙවුනා පමණ (ප්‍රතිසෙවන ප්‍රමාණය) දැන්ම ය. දායකයා දෙන සියල්ල ම නො ගෙන පමණ දැන පිළිගැන්ම අනෙකය. බොහෝ දෑ ඇත ද දායකයා සවල්පයක් ම දෙනු කැමැත්තේ නම්, සවල්පයක් ම පිළිගත යුතු. පසය මඳක් ඇතත් දායකයා බොහෝ දෙනු කැමැති වුව ද මඳක් ම පිළිගත යුතු. දෙන දෑ බොහෝ ඇත ද දායකයාත් බොහෝ දෙනු කැමැති වුව ද දෙන තාක් සියල්ල නොගෙන තමාට සෑහෙන පමණ ම පිළිගත යුතු.

> "සවාක්ඛාතෙ භික්ඛවෙ ධම්මවිනයෙ පටිග්ගාහකෙන මත්තා ජානිතබ්බා නො දායකෙන" (අංගුත්තර – දුකනිපාත)

සී" මනාකොට දෙසන ලද සස්නෙහි පිළිගන්නහු විසින් ම පිළිගන්නා පමණ දත යුතු ය. එය දතයුත්තේ දායකයා විසින් නො වේ" යැ යි වදාරන ලද්දේ පිළිගන්නා පමණ පිළිබඳව ය.

මෙසේ පසය පිළිබඳ වූ දෙවැදෑරුම් පමණ ම දත්තේ.

114 **සිහිනුවණින්.** සතිසම්පජඤ්ඤයෙන්. මේ උපග්‍රන්ථයෙහි ම අංක 95 බලනු.

115 **තුන් ආසව.** ආසව යනු මත්පැන් ය. එසේ සිත් සතන්හි බොහෝ කල් පල් වූ කෙලෙස් ආසව නමින් දක්විණ. තව ද ඇස් ආදි ඉඳුරන් මඟින් රූපාදි අරමුණු කරා වැගිරෙන කෙලෙස් ය යන අරුතින් ද ඔහු ආසව නම් වෙත්. සූත්‍රපිටකයෙහි **කාම භව අවිජ්ජා** වශයෙන් ආස්‍රව තුනෙක් ම දක්විණ. අභිධර්මයෙහි **කාම භව දිට්ඨි අවිජ්ජා** යන සතර ම ආස්‍රව නමින් හැඳින්විණ. පංචකාමගුණිකරාගය කාමාසව නමි. ශාශ්වතදෘෂ්ටිසහගත වූ රාගය, භවප්‍රාර්ථනාව භවාස්‍රව නමි. දෘෂ්ටිසහගත රාගයැ යි කී බැවින් භවාස්‍රවයට ම මෙහි දෘෂ්ටාස්‍රවය ඇතුළත් වේ. චතුස්සත්‍යවිෂයයෙහි අනවබෝධය අවිද්‍යාස්‍රව නමි.

117 **චම්පාපුරය.** මෙය **අංග** රටැ අගනුවර ය. **චම්පා** නදියට පෙරදිගැ නදිය අද්දර පිහිටියේ ය. බොහෝ පෙරැ මෙය **මාලිනී කාලචම්පා** යන නම්වලින් ප්‍රකට විය. පසු කලැ **චම්පාපුර** නමින් ප්‍රසිද්ධ විය. ස්වර්ණභූමියට නැවින් වෙළෙඳුමේ යන වෙළෙඳුන් නිසා මහවෙළෙඳපොළක් සේ ද මෙය වඩාත් පළට විය. මෙයින් කොචින්චිනයට ගොස් බොහෝ පෙරැ පදිංචි වූවන් නිසා එහි ද පෙදෙසෙක් **චම්පා** නමින් ප්‍රකට විය. මෙ නුවරැ **ගග්ගරා** නම් රජ බිසොවක කැරැවූ **ගග්ගරා** නම් මහ පොකුණක් ගැන බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වේ. මේ නගරය වූ පෙදෙසැ කොටසෙකැ චම්පාපුර චම්පානගර නමින් කුඩා ගම් දෙකෙක් දුන් ඇත. චම්පානදිය අද චන්දන්නදී නමින් වැහැරැවේ. බුදුරජුන් දවසැ මෙ නුවරැ තුන්සියක් සිසුන් ඇති **සෝණදණ්ඩ** නම් බමුණු ඇදුරෙක් විසී ය.

119 **ඛත්තුවා හෝ ඛත්තා** (ඛත්තු). ඇසූ පැණ විසැඳීමෙහි සමත් මහ මැතියා යි අටුවාහි පෙනේ. එහෙත් සකුයෙහි **ක්ෂත්තෘ** යනු දොරටුපල්ලාට ද රියැදුරාට ද බැවහර වේ. මෙ තැන දොරටුපල්ලා යැ යි අරුත් ගැන්ම සුදුසු සේ පෙනේ.

122 **පොළොවැ ද අහසැ ද දන සමුපත්.** රජගෙ මිදුලෙහි ද උයනෙහි ද පොකුණු සාරා සත්රුවනින් පුරා තැන්පත් කළ බොහෝ ධනය බෝසතාණන් සතු වැ පැවැතිණ. මෙය පොළොවැ වූ (භූමිගත) ධනය යි. ප්‍රාසාදයන්හි කුලපර–පුරෙන් ආ බෝසත් සතු වූ මහත් ධනස්කන්ධයෙක් විය.

මේ අහසැ වූ (ආකාශගත) ධනය යි. තව ද ඔබ උපන් දවසෙහි ම පහළ වූ තුන්ගවු පමණ වූ සංඛ නම් නිධාන-යෙක් ද, අඩයොදුන් පමණ වූ ඵල නම් නිධානයෙක් ද තුන්ගවු පමණ වූ උත්පල නම් නිධානයෙක් ද යොත්නක් පමණ වූ පුණ්ඩරීක නම් නිධානයෙක් දැ යි සතර මහ නිදන් කෙනෙක් වූහ.

124 **කම්මවාදී.** කරන කර්මයෙහි ඵලවිපාක ඇතැ යි යන මතය ගත්තාහු. බෞද්ධයෝ ද ජෛන වෛදාන්තවාදී ශෛව වෛෂ්ණව ආදී කර්මානුරූප ව ලබන පරලොවක් ඇතැ යි අදහන අබෞද්ධයෝ ද කම්මවාදිහු ය.

125 **ක්‍රියාවාදී.** සුසිරිත් පිරීම මැනැවැ යි කියන්නෝ. ආගමක් පිළිපදනා හැම කෙනෙක් ම ක්‍රියාවාදීහ.

132 **වේදඬග.** වේද නම් ඍක් යජුස් සාමන් යන තුන ය. අථර්වන්වේද යැ යි එකක් එක් කොට වේද සතරක් කැරැ-ගන්නා ලද්දේ බුද්ධපරිනිර්වාණයෙන් ද කලකට පසු ය. පෙරැ තුබුණේ වේද තුනක් පමණ ය. වේදධර්ම නැමැති ශරීරයේ අවයව වූ ශික්ෂා ඡන්දස් ව්‍යාකරණ නිරුක්ත ජ්‍යෝතිෂ කල්ප යන සය වේදාංගයෝ යි.

136 **ආසව.** මෙ පොතැ අංක 198 අධෝලිපිය ද උපග්‍රන්ථ අංක 115 ද බලනු.

137 **පරමයොගසම්පත.** සිල්වත්නට ප්‍රථම ධ්‍යානය ලැබීම පහසුය. ප්‍රථම ධ්‍යානය ලැබීමෙන් පංචනිවරණ මැඩැලූවාහට චිතිය ධ්‍යානය පහසු ය. මෙ සේ ඔවුන් උසස් වන්නට වන්නට සම්බාධ අඩුබව වේ. ශීලයෙන් කාම ලෝකයෙහි සැප ලැබේ. ප්‍රථම ධ්‍යානයෙන් බඹලොවැ එක් කපක් ද, දෙවෙනි ධ්‍යානයෙන් අටකපක් ද, තෙවෙනි ධ්‍යානයෙන් සූසැට කපක් ද, සිවුවන ධ්‍යානයෙන් පන්සිය කපක් ද, ආකාශානන්තායතන ධ්‍යානයෙන් විසිදහස් කපක් ද, විඥානානන්තායතනයෙන් කප් සතළිස් දහසක් ද, ආකිංච-න්‍යායතනයෙන් කප් සැට දහසක් ද, නෛවසංඥානාසංඥා-යතනයෙන් කල්ප අසූසාර දහසක් දැ යි සමාපත්ති වශයෙන් වැඩූ කල ඒ ඒ ධ්‍යානයෙන් ක්‍රමයෙන් වඩ වඩා ඵල ආනිසංස අතිත් මහත් බව වේ.

චතුර්ථ ධ්‍යානලාභියාට විදර්ශනාඥනය ලෙහෙසියෙන් ලද හැක්ක. එහෙයින් **අප්පටට අප්පසමාරම්භ යැ.** විදසුන් සුව බඳු සුවක් ලොවැ නැත්තෙන් ඒ මහත් ඵල ඇත්තේ

නම්. සතුරු කෙලෙසුන් දුරු ලන බැවින් ඒ යඥ (පරිත්‍යාග)-යෙකි. මනෝමයර්ධිය විදශීනාඥනයෙහි පිහිටා ලබනුයේ නො වෙහෙසී ලබයි. එහෙයින් ඒ අප්පට්ට (අල්පාර්ත)ය. අල්පසමාරම්භ ය. තමත් බඳු රූප නිර්මාණයෙහි සමර් බැවින් මහත්ඵල ය. සතුරු කෙලෙසුන් පරිත්‍යාග කරනු (දුරුලනු) යෙන් යඥ නම්. නානාවිධඥනාදිය ද මනෝමය ඥනාදියේ පිහිටා ලැබීම පහසු ය. තමනට සතුරු කෙලෙස් යජනය (පරිත්‍යජනය) කරන බැවින් යඥ නම් වේ. නානාවිධය නානාවිධ විකුර්වණ දක්වීමේ සමත් බැවින් ද දිව්‍යශ්‍රෝත්‍රය දෙවිමිනිසුන්ගේ ශබ්ද අසනු සමත් බැවින් ද චෙතස්පර්යායඥනය පරසිත් දනගනු සමත් බැවින් ද, පූර්වේනිවාසානුස්මෘති ඥනය කැමැති කැමැති අතීතය සිහි කළ හැකි බැවින් ද, දිව්‍යස කැමැති කැමැති රූ දකිනු සමත් බැවින් ද වඩ වඩා මහත් ඵල ආනිසංස ඇත්තේය. ආශ්‍රවක්ෂයඥනය වූ කලී මේ හැමට ම වඩා උතුම් වූ ලෝකෝත්තරමාර්ගසුඛය නිපදවනුයෙහි සමත් බැවින් පරමයාගසම්පත නමැ යි කියන ලදී.

169 **සිංහනාද**. 'කස්බ, රළු දිවිවැටුම් ඇති ඇතැම් තවුසකු මරණින් මතු සුගතියෙහි උපන්නහු දකිමි'යි එක් සී නදෙක[1]. 'තවුසකු නිරයෙහි උපන්නහු දකිමි'යි එක් සී නදෙක[2] 'කුසල්දහම සමාදන් ව තමන් සිටුනා බව පැවැසීම එකෙක,[3] හැම අකුසල් දුරුලා තමන් සිටුනා බව පැවැසීම එකෙක[4], අකුසල්දහම් දුරුලීමෙහි තමන් සවු සඟන ම අන් තොවුසව්වනට වඩා අක් තත්හි සිටුනා බව පැවැසීම එකෙක.[5] කුසල්දහම් සමාදන් ව ගැන්මෙහි තම සව්වන් ම උසස් බව පැවැසීම එකෙක.[6] ශීලයෙන් තමනට සමයකු නැති බව පැවැසීම,[7] වීර්යයෙන් තමනට සමයකු නැති බව පැවැසීම,[8] ප්‍රඥයෙන් තමන් සමයකු නැති බව පැවැසීම,[9] විමුක්තියෙන් තමන් සමයකු නැති බව පැවැසීම,[10] තමන් සිනද කරනු ද පිරිස්මැද ම කරන බව පැවැසීම, එ ද විසාරද ව කරන බව පැවැසීම, සෙස්සන් තමන් ගෙන් පැණ පුළුවුස්නා බව පැවැසීම, පුළුවුත් තාක් පැණ තමන් විසඳන බව පැවැසීම, පැණ විසැඳීමෙන් විචාලවුන් සිත් ගන්නා බව පැවැසීම, අනුන් තමන්ගේ විසැඳුම ඇසිය යුතු කොට සලකති යි පැවැසීම, තමන්ගේ විසැඳුම අසා පහදිති යි පැවැසීම, පැහැදුණවුන් පැහැදුණ අයුර කරන බව පැවැසීම, තමන් දෙසන

පිළිවෙත සච්චන් පිළිපදනා බව පැවැසීම, එසේ පිළිපන්නන් තමන් සිත් ගන්නා බව් පැවැසීමැ යි මෙසේ මූල කී සී නද දසය තමන් සීනද කරනු ඈ විසින් පසුව දැක්වුණු එකොළොස් අයුරින් ගුණිත ව සී නද එක්සිය දසයෙක් වේ. අන් කිසි සූත්‍රෙක මේ තරම් සිංහනාදයෝ නැත. එ හෙයින් මේ **මහාසිංහනාද** නම් විය.

308 **කම්ස්ථාන මුඛ.** ශමථකම්ස්ථාන 38 කි. එය මෙ තැන කම්ස්ථානමුඛ නමින් දැක්විණ. පඨවි ආපෝ තේජෝ වායෝ නීල පීත ලෝහිත ඕදාත යන කසිණ අට ද, උද්ධුමාතක විනීලක විපුබ්බක විච්ඡිද්දක වික්ඛායිතක වික්ඛිත්තක හතවික්ඛිත්තක ලොහිතක පුළවක අට්ඨික යන අශුභ දශය ද, බුද්ධානුස්සති ධම්මානුස්සති සංඝානුස්සති සීලානුස්සති චාගානුස්සති දෙවතානුස්සති උපසමානුස්සති කායගතසති මරණසති ආනාපානසති යන අනුස්සති කම්ස්ථාන දශය ද, මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා යන බ්‍රහ්මවිහාර සතර ද, ආකාසානංචායතනාදි අරූ කමටහන් සතර ද, ආහාරෙ පටිකකූලසඤ්ඤා චතුධාතුවවත්ථාන යන දෙක දැ යි සියල්ල එකතුව තිස්අටෙකි. මේ කමටහන් වඩා ලැබූ උපාචාර අර්පණා සමාධින් පාදක කොට ගෙන විවසුන් වඩා නිවන් පසක් කළ හැක්ක. එහෙයින් කම්ස්ථානමුඛ නිවන් පිවිසෙන දොර වශයෙන් දැක්විණ.

314 **අද්ධරියාදිහු.** හෝම් කරන බිම මැනීම, පුදසුන ගොඩ නැංවීම, යඥභාජන පිළියෙල කිරීම, යඥය සඳහා දර දිය ගෙනීම, හෝමගින්න දැල්වීම, කැප කරන ගවඈ සතුන් යඥබිමට ගෙන ඊම, ඒ සතා මරා බිලි පුද දීම යන මේ කරන බමුණු වෙසෙස අද්ධරියබ්‍රාහමණ (අධ්වර්යු බ්‍රාහමණ) නම්. මේ හැම ක්‍රියායේදී ම ඔවුන් විසින් යජුර්වේදයේ එන මන්ත්‍ර දැපිය සුතු.

තිත්තිරිය බ්‍රාහ්මණ (තෛත්තිරිය බ්‍රාහමණ) යනු තෛත්තිරිය නමැති වේදශාඛාව හදාරන බමුණෝ ය. තෛත්තිරියශාඛා යන්නෙන් හැඳින්වුණේ කෘෂ්ණයජුර්වේදය යි. තිත්තිර (වටු) වෙසින් එක්තරා බමුණු කෙනෙකු විසින් උගන්නා ලද බැවින් මේ වේදශාඛාව තෛත්තිරිය යි කියන ලදි.

ඡන්දොකබ්‍රාහමණ (ඡාන්දොග්‍යබ්‍රාහමණ) යනු සාමවෙද පක්‍ෂයේ උපනිෂදයක් වූ ඡාන්දෝග්‍ය උපනිෂද්ග්‍රන්ථය හදාරන බමුණෝ යැ යි සැලැකිය හැක්ක.

බව්හාරිජ බ්‍රාහමණ (බහ්වෘක බ්‍රාහමණ) යනු ඍග්වේදය හදාරන බමුණෝ ය. **ඍච්** යනු නියත අක්‍ෂර පාද ඇති දෙවස්තව යි. ඒ බොහෝ ඇත්තෝ බහ්වෘච් නම්. ඍග් වේදය යි. එය හදාරනුවෝ බහ්වෘකබ්‍රාහමණයෝ ය.

215 **ඉසිවරු.** ඍෂිවරුන් අතුරෙන් අට්ටක යනු වේදමන්ත්‍ර රාශියක් රැසැයු සකු බසින් **අෂ්ට** යන නමින් හැඳින්වෙන ඍෂි ය. වාමක නමින් සිටි ඍෂිවරයකු ගැන දැන් වේදග්‍රන්ථවල සඳහනෙක් නැත.

වාමදේව. යනු ඍග්වේදයේ iv. 1–41, 45–48 යන මන්ත්‍ර මඳක් හැර සතර වන මණ්ඩලය මුළුල්ල ම රැසැයු ඍෂිවරයා ය. **අංගිරස** (අංගිරස්) යනු ඍග්වේදයේ නව වන මණ්ඩලයේ මන්ත්‍ර රැසැයු ඍෂි ය. **වෙස්සාමිත්ත** (විශ්වාමිත්‍ර) යනු ඍග්වේදයේ තෘතීයමණ්ඩලය සියල්ලත් නවම මණ්ඩලයේ 67, 13–15, දශමමණ්ඩලයේ 137, 5; 167 යන මන්ත්‍ර ද ධනුර්වේදය ද නීතිග්‍රන්ථයක් ද වෛද්‍යග්‍රන්ථයක් ද රැසැයු ඍෂියෙකි. **යමතග්ගි** (ජමදග්නි) යනු භෘගුපරම්පරාවේ ඍෂියෙකි. මොහු රැසැයු මන්ත්‍රයක් ගැන සඳහනෙක් වෛදිකග්‍රන්ථවලැ නැත. **භාරද්වාජ** නම් ඍෂි ඍග්වේදයේ දශම මණ්ඩලයේ 127 ස්තවයේ රචකයා ය. වසිෂ්ඨ තෙම ඍග්වේදයේ සත්වන මණ්ඩලයේ මන්ත්‍ර හා තවත් කීපයක් මන්ත්‍රවල කර්තෘ ය. **කාශ්‍යප** තෙමෙ ඍග්වේදයේ ස්තව කිහිපයෙක නිබන්ධක ය. භෘගු ඍෂි ඍග්වේදයේ නවවන මණ්ඩලයේ 65 වන ස්තවයේ ද, දශවන මණ්ඩලයේ 19 වන ස්තවයේ ද නිබන්ධකයා ය.

262 **පරිඤ්ඤා.** = පිරිසඳ දන්නා නුවණ. මෙය ඤාතපරිඤ්ඤා තීරණපරිඤ්ඤා පහාණපරිඤ්ඤා යි ත්‍රිවිධ යි. එහි යම් ප්‍රඥාවෙකින් විදර්ශනාභූමිය පිරිසිඳ දනී නම් ඒ ප්‍රඥාව **ඤාතපරිඤ්ඤා** නම්. ත්‍රෛභූමක ධර්මරාශිය ලක්‍ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථාන වශයෙන් ද ආධ්‍යාත්මික බාහ්‍ය වශයෙන් ද බෙදා පරිච්ඡේද කොට දන්නා නුවණ යි. අනිත්‍යාදි දෙසාලිස් අයුරින් තීරණ කිරීම් විසින් පිරිසිඳ දැන්ම **තීරණපරිඤ්ඤා යි.** අනිත්‍යාදි පරිවාර ආකාරවලින් ඇති උපාදානස්කන්ධ පස තීරණවශයෙන් (සංමර්ශන වශයෙන්) පිරිසිඳ දැන්ම යි. සමුච්ඡේද වශයෙන් කෙලෙස් නසනා නුවණ (මාර්ගඥානය) **පහාණපරිඤ්ඤා** යි. තව ද නාමරූපයන් ගේ

හේතු පිරිසිඳ දැන්ම ද **ඤාතපරිඤ්ඤා** නම්. කලාපසම්මසනය පටන් අනුලෝම ඤාණය තෙක් **තීරණපරිඤ්ඤා** යි. ආර්‍ය මාර්ගඥානය **පහාණපරිඤ්ඤා** යි.

851 **සම්පජඤ්ඤ සතර.** මේ උපග්‍රන්ථයේ යට අංක 95 බලනු.

853 **නීවරණ.** සග මොක් දෙකට යන මඟ හරස් වැ සිටුනා, ගුණදහම් වැඩීමට බාධක ව සිටුනා කෙලෙස් නීවරණ නම්. කාමච්ඡන්ද ව්‍යාපාද ථිනමිද්ධ උද්ධච්චකුක්කුච්ච විචිකිච්ඡා යි ඒ පස්වැදෑරුම්. තමා සිතැ කාමච්ඡන්දදිය ඒ ඒ අවස්ථාහි ඇති නැති බව ද නූපන් කාමච්ඡන්දදිය උපදනා සැටි ද උපන් කාමච්ඡන්දදිය නැති වන සැටි ද නැති කාමච්ඡන්දය යළි නොඋපදනට කරුණු ද නුවණින් සලකා බැලිය යුතු. රූපාලම්බනාදිය නිත්‍ය ශුභ සුඛ වශයෙන් වරදවා සැලැකීමෙන් (අයොනිසෝමනස්කාරයෙන්) කාමච්ඡන්දය උපදී. අශුභනිමිති ඉගැන්ම අසුබ බවුන්හි යෙදීම, ඉන්ද්‍රියසංවරය, බොජුන්හි පමණ දැන්ම, කලණමිතුරු ඇසුර, කාමච්ඡන්දදිනවකථාව යන සයින් කාමච්ඡන්දය දුරු වෙයි. කෝපයන් එයට හේතු අරමුණත් නොනුවණින් සැලැකීමෙන් ව්‍යාපාදය ඇති වේ මෛත්‍රීනිමිත්ත (මෙත්බවුනට සුදුසු අරමුණ) ඉගැන්ම, මෙත් වැඩුම, කර්‍මස්වකතාව සැලැකිම, බොහෝසේ නුවණින් කරුණු බැලීම, කලණමිතුරු ඇසුර, යෝග්‍යකථා ඇසීම යන මේවා ව්‍යාපාදය පහ වීමට හේතු යි.

අධිකුශලයන්හි උකටලී බව, කය ඔතැති බව, ඇඟ මැලි කඩමින් ඉන්නා ගතිය, පමණට වැඩිය අහර ගැන්මෙන් වන කලානතිය, සිතැ මැලි බව යන මේ හැම එකක් ම ථිනමිද්ධයට හේතු ය. අතිමාත්‍රභෝජනයේ දෙස් සැලකිම, ඉරියවු මාරු කිරීම, එළිය දෙස බැලීම, එළිමහනැ විසීම, කලණමිතුරු ඇසුර, වීර්‍යයේ අනුසස් ඇසීම යන මේ හැම ථිනමිද්ධ ප්‍රහාණයට කරුණු යි.

සිතැ කලබලගතිය, නොනුවණින් කරුණු සැලැකිම යන මෙයින් උද්ධච්චකුක්කුච්ච දෙක හැදෙයි වැඩෙයි. දහම් ඉගැන්ම, ප්‍රශ්න ඇසීම, විනය දැන්ම, වැඩිහිටියන් සෙවුම, කලණමිතුරු ඇසුර, දහම්ඔවා ඇසීම යන මේ උද්ධච්චකුක්කුච්චයන්ගේ ප්‍රහාණයට කරුණු ය.

සිය නුවණට අවිෂය දැ නොනුවණින් බලන්නට තැත් කිරීමෙන් විචිකිච්ඡාව (සැකය) උපදී. බණදහම් ඉගැන්ම,

ප්‍රශනඅ‍ෑසීම, විනය දත්ම, සැදැහැ බහුල බව, කල්‍යාණමිතුරු ඇසුර, යෝග්‍ය දහම් ඇසීම යන මේ එක එකෙක් විචිකිච්ඡාව දුරු වීමට කරුණු වේ.

361 **පායාසිරාජඤ්ඤ.** ජෛනධර්මග්‍රන්ථයන්හි පායාසි සූත්‍රයට බොහෝ සමාන සූත්‍රයෙක් පෙනේ. එහි පයේසිත් කේශී නම් තවුසකුත් අතර වූ සංවාදයෙකි.

'කුශලාකුශලයෙක් නැතැ'යි 'මෙයින් පර ලොව යන කිසිවකුත් නැතැ යි කුශලාකුශලයෝ නිෂ්ඵලහ' යි පයෙසී කියයි. 'එසේ කියන්නට කරුණු කවරු?'යි කේශි මුනි අසයි. පව්කම් කළ තම මුත්තණුකෙනෙකු සිටි බවත් ඔවුන් තමාට බොහෝ සෙනෙහැති බවත් ඔවුන් මැරී නිරයෙහි උපන් බව සැබෑ නම් තමාට සෙනෙහැති බැවින් තමා වෙත අවුත් පව් නොකරන ලෙසට අවවාද කරනු නිසැක බවත් එහෙත් පරලොවක් නැති බැවින් ඒ කිසිත් නොවූ බවත් **පයේසී** කියයි. නිරාහි උපන්නවුනට තමන් කැමැති පරිදි එයින් නික්ම මෙහි එන්නට නො ලැබෙන වග කේශී කියයි. තමා ගේ සිල්වත් මිත්තෑණියන් මියැ සගැ උපන් බව සැබෑ නම්, තමාට ලැදි වූ ඇය අවුත් පින් කරනුයෙහි මෙහෙවියැ යුතු වුව ද එවැන්නක් නොවූ බව පයේසී කියයි. පිරිසිදු දෙව්ලොවැ උපන්නහු අපිරිසිදු මිනිස් ලොවට නො එතැයි කේශි කියයි. මේ ඈ විසින් පායාසි සූත්‍රයෙහි එන දෙබස ම **කේශි පයේසී** දෙදෙනා අතර පැවැති සේ එහි දක්වෙයි. ජෛනග්‍රන්ථ දැන් තිබෙන ලෙසට වශී කොට බෙදා සකස් කරන ලද්දේ බෞද්ධයන්ගේ තෙවෙනි සංගායනාවටත් පසු ය. එබැවින් බෞද්ධයන්ගේ ත්‍රිපිටකග්‍රන්ථාශ්‍රයයෙන් ජෛනයන් ගේ ඇතැම් සූත්‍ර සැකැසුණැයි සිතාගැන්ම බැරි නැත. මෙය තවදුරටත් විමැසියැ යුතු.

374 **දෙව්සක්රුවන.** දිව්‍ය චක්‍රරත්නය. සක්රුවන ලබා ගනු රිසි රජ සිය මැදුරු පෙහෙවස් සමාදන් කොට ගෙන තමා කළ පින් අවජනේ හිඳී. මෙසේ කරන්නහු ගේ සක්විතිබව සඳහා කළ පින්කම් බෙලෙන් නැගෙනහිර දිගැ මුහුදු බිඳ ගෙන නැඟුණක් සෙයින් අහසැ එකලු කෙරෙමින් සෘතුසමුත්ථාන වැ දිවසක්රුවන පහළ වැ එ රජු කරා අහසින් පෙරළී එයි. එය දක්කුම්කලුබව ද ක්ත්කලු හඬ ඇති බව ද අහසින් යෑ හැකි බව ද, රත්

විහිදුවන බව ද, කිසි සතුරකු විසින් මැඩැලිය නොහැකි බව ද, එය අයත්හු රිසි දූ සිදු කැරැ දෙන බව ද යන ආදි තෙද බල ඇත්තෙකි.

377 **දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය.** අනුග්‍රහ වශයෙන් දුන් දූයෙහි පල නැතැ යි, පූජා වශයෙන් දුන් මහදන්හි පල නැතැ යි, මවට කරන සංග්‍රහනිග්‍රහයන්හි පල විපාක නැතැ යි, පියාට කරන සංග්‍රහනිග්‍රහයන්හි පල විපාක නැතැ යි, මෙයින් සැව උපදනාහු නැතැ යි, මෙ ලොව කියා එකෙක් නැතැ යි, පරලොවෙක් නැතැ යි, දෙලෝ තතු දැන කියන හැකි නුවණැති බුදු පසේබුදු බුදුසවු යැ යි කෙනෙක් නැතැ යි මෙසේ දස කරුණක් ඇරැබැ පැවැති වැරැදි මතය දශවස්තුක මිථ්‍යාදෘෂ්ටි නමි.

378 **අන්තරකල්ප**. කල්ප යනු වර්ෂගණනායෙන් මෙතෙකැ යි හැඟැවියැ නොහැකි තරම් වූ ලොව පිළිබඳ දීර්ඝකාල-පරිච්ඡෙද ය. ඒ මහාකල්ප අසංඛ්‍යකල්ප අන්තරකල්ප (අන්තඃකල්ප) යි ත්‍රිවිධ ය. අසංඛ්‍ය කල්ප සතරෙක් මහාකල්පයෙකි. සංවර්ත සංවර්තස්ථායී විවර්ත විවර්තස්ථායී යැ යි අසංඛ්‍යකල්ප සතරෙකි. එහි **සංවර්තකල්ප** යනු ලෝකධාතුන් නැසී යන කාලය යි. **සංවර්තස්ථායී කල්ප** යනු ලෝකධාතුන් නැසී අහස හිස් වැ තිබෙන දීර්ඝ කාලය යි. නැවැත ලෝකධාතු හැදෙමින් පවත්නා කාලය **විවර්තකල්ප** නමි. එසේ හැදී සිටිනා කාලය **විවර්තස්ථායී කල්ප** නමි. මේ එක් එක් අසංඛ්‍යකල්පයෙකැ අන්තරකල්ප (අන්තඃකල්ප) සිවුපනස බැගින් වේ. ඇතැම් ඇදුරන් ගේ මතයෙහි එක් අසංඛ්‍ය කල්පයෙක් අන්තරකල්ප විස්සෙකි. පරමායුෂය දස හැවිරිදි වූ මිනිසා ගේ කාලයෙන් පටන් ගෙන ක්‍රමයෙන් නැඟී පරමායුෂය හවුරුදු අසංඛ්‍යය වී යළි ක්‍රමයෙන් අඩු වීවී විත් අවුරුදු දහය වන තැන දක්වා මේ දෑතුරේ වූ කාලසීමාව එක් අන්තරකල්පයෙකි. මෙය මහපොළොව එක් යොදුන් තුන් ගව්වක් වැඩෙන පමණ වූ කාලසීමාව යි.

381 “අත්‍රාන්තරෙ තිවිධමාසපිතබොධිමූල—
මාවෙගවානභිෂිෂෙණයිෂුර්මුනීන්ද්‍රම්
අධ්‍යාස්‍ය **මත්තකරිණං ගිරිමෙඛලාඛ්‍ය**—
මාහූත සෛන්‍යනිවහො **නිරගාදනඞ්ගඃ**.

(පද්‍යචූඩාමණි)

මෙහි **'ගිරිමෙඛලාඛ්‍යං මත්තහත්ථිනං අධ්‍යාසය අනඞ්ගඃ නිරගාත්'** යන්නෙන් 'ගිරිමෙවුල් මතැතු නැග අනඟා නික්මිණැ'යි කියන ලදි. මෙයින් බුදුගොස් ඇදුරාණන් **මාර** යනු **අනංගයා** යි සැලැකූ බව් හැඟේ.

394 **සත්තිස් බෝපැකි දහම්.** (බෝධිපාක්ෂික ධර්ම සත් තිස). **බෝධි** යනු සෝතාපත්තිමග්ග ආදි වූ සතර මඟැ නුවණ ය. එයට **පක්ෂ** වූ ඉවහල් වූ ධර්මයෝ බෝපැකි (බෝධිපාක්ෂික) දහම් නම් හ. ඔහු නම්: සතර සතිපට්ඨාන, සතර සම්‍යක්ප්‍රධාන, සතර ඍද්ධිපාද, පංච ඉන්ද්‍රිය, පංච බල, සප්ත බෝධ්‍යංග, අෂ්ටමාර්ගාංග යන සත් කොටසැ වූ ධර්ම සත්තිස ය. මෙහි තතු අභිධර්මාර්ථසංග්‍රහයෙහි සත්වන පරිච්ඡේදයට ලියූ විස්තරයක් බලා දැන ගත යුතු.

395 **ආයතන පැණැවීමෙහි** = චක්ඛායතන රූපායතන, සෝතායතන සද්දායතන, ඝාණායතන ගන්ධායතන, ජිව්හායතන, රසායතන, කායායතන ඵොට්ඨබ්බායතන, මනායතන ධම්මායතන යැ යි දෙළොස් ආයතනයන් පැණැවීමෙහි. මෙහි චක්ඛායතන සොතායතන ඝාණායතන ජිව්හායතන කායායතන යනු චක්ෂුඃප්‍රසාදදි ප්‍රසාදරූප ය. රූපායතන සද්දායතනාදි පස ඒවාට අරමුණු වන රූප ශබ්දදි පස ය. **මනායතන** යනු නවාසූවක් සිත් ය. **ධම්මායතන** යනු සියලු චෛතසිකත් සූක්ෂම රූප සොළොසත් නිවනත් ය.

411 **දෘෂ්ටධාර්මික ආස්‍රව.** මෙ අත්බව්හි ම, මෙ ලොව්හි ම චීවරාදි සිවුපසය නිසා, සිවුපසය සෙවීම් හේතුයෙන් ද පරිභෝග කිරීම් හේතුයෙන් ද උපදනා කාමාස්‍රවාදි ආස්‍රවයෝ යි. ප්‍රත්‍යය සෙවීමෙහි මිථ්‍යාජිවහේතුයෙන් කාමාස්‍රවාදිය. වේ. ප්‍රත්‍යය පරිභෝගයෙහිදී ප්‍රත්‍යවේක්ෂා නො කොට වැළැඳීමෙහි ද කාමාස්‍රවාදිහු උපදිත්.

412 **සාම්පරායික ආස්‍රව.** පරලොවැ දුර්විපාක ඇති වීමට කරුණු වන දෑ. (පඨිපත්තිධර්මයෙහි වරදවා පිළිපත්තවුන් එයින් මුදා සම්‍යක් ප්‍රතිපත්තියෙහි පිහිටුවීම, කලහ හේතුයෙන් උපදනා පරලොව දුක්පිණිස පවත්නා ආස්‍රවයන් නසන්නට දම් දෙසීම සාම්පරායික ආස්‍රව ප්‍රතිඝාතය පිණිස ය.

420 **ප්‍රඥප්ති, අධිප්‍රඥප්ති.** ප්‍රඥප්ති යනු දිට්ඨිපඤ්ඤත්ති (දෘෂ්ටි පැණැවීම) යි. **අධිප්‍රඥප්ති** යනු ඛන්ධපඤ්ඤත්ති ධාතුපඤ්ඤත්ති ආයතනපඤ්ඤත්ති ඉන්ද්‍රියපඤ්ඤත්ති සච්චපඤ්ඤත්ති පුග්ගලපඤ්ඤත්ති යන ප්‍රඥප්ති සය යි.

430 **කුම්භාණ්ඩාදිහු.** සකුයෙහි **කුෂ්මාණ්ඩ කුම්භාණ්ඩ** යන දෙ නමින් වැහැරුවෙන දේවතා කෙනෙකි. ඔහු මහ බඩ ඇති, මහත් රහසඟ ඇතියෝ යැ යි අටුවාහි කියන ලදි. මෙසුතුරු දක්වෙන ගන්ධර්ව කුම්භාණ්ඩ නාග යක්ෂ යන මොහු හැම අමනුෂ්‍යයෝ ය. එ නම් ඇති මනුෂ්‍යජාතිහු නො වෙති. මිනිසුන් කියැ යුතු තැන 'මනුස්සා නාම ජායනති අමමා අපරිග්ගහා' යි. 'එහි මේ මා අඹුදරුවෝ යැ යි මගේ දේපොල යැ'යි ආදින් මමත්වයක් පරිග්‍රහයක් නැත්තාහු වෙති'යි කියන ලදි.

481 **ජෝතිහන් (ජ්‍යොතිෂ්පාෂාණ)** — එහි ජ්‍යෝතිෂ්පාෂාණ නම් ගල් වෙසෙසෙක් වෙයි. ඒ ගල් තුනක් තබා ඊ මතැ සහල් ලූ බඳුණ තුබූ කලැ ගලින් නැඟි දුම් නැති ගින්නෙන් එය පිසෙයි. ලං කළ විට විදුලිය උපදනා ගල්වෙසෙසක් එහි වූ බව මෙයින් හැඟෙයි.

469 **සත්කායදෘෂ්ටි.** ඇත්තා වූ රූපවේදනාදි ධර්ම සමූහය සත්කාය නමි. එහි සත්ත්ව පුද්ගල ආත්ම ජීවාදි වශයෙන් වරදවා ගත් දෘෂ්ටිය (වැරදි දැක්ම) **සත්කාය දෘෂ්ටි** නමි. එය විසිවැදැරුමි:

රූපය ආත්මය (තමා) හැටියට දැකීම,
ආත්මය රූපවත් යැ යි දැකීම,
ආත්මයෙහි (තමා තුළැ) රූපය වේ යැ යි දැකීම,
රූපයෙහි ආත්මය වේ යැ යි දැකීම,
වේදනාව ආත්මය හැටියට දැකීම,
ආත්මය වේදනාව ඇත්තෙකැ යි දැකීම,
ආත්මය තුළ වේදනාව වේ යැ යි දැකීම,
ආත්මයෙහි වේදනාව වේ යැ යි දැකීම,
වේදනායෙහි ආත්මය වේ යැ යි දැකීම,
සංඥාව ආත්මය හැටියට දැකීම,
ආත්මය සංඥාව ඇත්තෙකැ යි දැකීම,
ආත්මයෙහි සංඥාව ඇතැ යි දැකීම,
සංඥායෙහි ආත්මය ඇතැ යි දැකීම,
සංස්කාර ආත්මය හැටියට දැකීම,
ආත්මය සංස්කාර ඇත්තෙකැ යි දැකීම,
ආත්මයෙහි සංස්කාර ඇතැ යි දැකීම,

සංස්කාරයෙහි ආත්මය ඇතැ යි දැකිම,
විඥනය ආත්මය හැටියට දැකිම,
ආත්මය විඥනය ඇත්තෙකැ යි දැකිම,
ආත්මයෙහි විඥනය ඇතැ යි දැකිම,
විඥනයෙහි ආත්මය ඇතැ යි දැකිම.

476 **සැක.** (විචිකිච්ඡාව) බුඩ ධර්‍ම සංඝ ශික්‍ෂා පූර්‍වාන්‍ත අපරාන්‍ත පූර්‍වාපරාන්‍ත ප්‍රතිත්‍යසමුත්පාදධර්‍ම යන අට තැනෙහි සැකය යි. සොළොස් තන්හි සැක ය: අතීතයෙහි වීම් ද? නො වීම් ද? කවරෙක් වීම් ද? කෙසේ වීම් ද? කවරෙක් වැ සිට පසු වැ කවරෙක් වීම් ද? අනාගතයෙහි වන්නෙම් ද? නො වන්නෙම් ද? කවරෙක් වන්නෙම් ද? කෙසේ වන්නෙම් ද? කවරෙක් වැ කවරෙක් වන්නෙම් ද? මම් දැන් වෙම් ද? නො වෙම් ද? කවරෙක් වෙම් ද? කෙසේ වෙම් ද? මේ සත් තෙම කොයිබින් මෙහි ආයේ ද? කොහි යන්නේ වේ ද?" යි මෙසේ සොළොස් තැනක් ගැන උපදනා සැක යැ යි මෙසේ සොළොස් වැදෑරුම් වේ.

531 **උපාදානස්කන්ධ.** යනු තෘෂ්ණාදෘෂ්ටි දෙකින් දැඩි කොට ගනු ලබන ස්කන්ධ යි. ලොවුතුරා සිත් ආදිය ඔවුන් විසින් ගත නො හැක්ක. ඔවුනට හසු වනුයේ ලෞකික පුගුලන් පිළිබඳ ස්කන්ධ පස ය. ඔහු උපාදානස්කන්ධ නම්හ.

535 **නිවරණ පස.** මෙහි 306 පිටේ 553 අධෝලිපිය බලනු.

586 **ඕරම්භාගිය සංයෝජන.** ඕර (අවර) යනු මෑත යට කොටස යි. එ නම් කාමභවය යි. එය බජනුයේ ඕරම්භාගිය යි. කාමභවයෙහි ම පිළිසඳ ගන්වන කෙලෙස්බැඳුම් පහ ඕරම්භාගිය සංයෝජන නම. සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, කාමරාග, පටිඝ යන පස යි.

587 **උද්ධම්භාගිය සංයොජන.** **උඩ** (උඩ) යනු රූප අරූප භව දෙකයි. එය බජන, එහි පිළිසඳ ගන්වන බැඳුම් පස උඩම්භාගිය සංයොජන නම්. රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන පස යි.

588 **භෝගසම්පත් ලැබීම.** නිසි පරිදි සිල් රකිනුයේ නො පමා වෙයි. පැවිදි සිල්වතා ශ්‍රද්ධාදි ආර්‍ය්‍යධන සපයයි. ගිහි සිල්වතා මෙ ලොවැ දියුණුව පතනුයේ නොපමා බැවින් ධනධාන්‍යයෙන් වැඩේ.

564 **සංඥා. අනිත්‍ය සංඥා** යනු උපාදානස්කන්ධ පස අනිත්‍ය වශයෙන් විදසුන් වඩන්නහුට ඇති වන සංඥාව ය. අනිච්චානුපස්සනාව සහ එක් ව උපන් සංඥාව ය. අනිත්‍යානුදර්ශනය ම සංඥාශීර්ෂයෙන් අනිච්චසඤ්ඤා යි කියන ලදී. අනිච්චානුපස්සනාය සහජාතසඤ්ඤා, විපස්සනා එව වා. එසා අසඤ්ඤා පි සඤ්ඤා සීසෙන සඤ්ඤා'ති වුත්තා (පපංචසූදනී III. 96)

අනාත්ම සංඥා යනු සියලු ධර්මයන් (සංස්කාරයන් ද සියලු ප්‍රඥප්ති ධර්ම ද) අසාර වශයෙන් තමා වශයෙහි නො පවත්නා දෑ වශයෙන් තමා සතු නොවන දෑ වශයෙන් හිස් ශූන්‍ය දෑ වශයෙන් නුවණින් බලන්නහුට ඇති වන අනත්තානුපස්සනාව ම ය. මේ තන්හි **සඤ්ඤා** යන වහරින් අනුපස්සනාව දක්විණ.

අශුභ සංඥා යනු ඉදිමුණු සිරුරු ආදි දශ අශුභ අරමුණෙහි උපන් ප්‍රථමධ්‍යාන සහගත සංඥාව ය. කෙලෙස් අසුචි වැගිරෙනුයෙන් කරජකයෙහි හෝ සියලු ත්‍රෛභූමික සංස්කාරයෙහි අශුභ යැ යි පැවැති සංඥාව ය. කෙශාදි කොටස්හි අශුභාකාරය ගෙන උපන් සංඥාව ද අශුභ සංඥා නමි.

ආදීනව සංඥා යනු 'මෙ සිරුර බොහෝ ආදීනව (දෙස්) ඇත්තෙක' යන ඇ විසින් කයෙහි දෙස් දන්නා විසින් උපදනා සංඥාව හෝ සියලු භව ආදින් දෙස් දක්නා නුවණ හා යෙදුණු සංඥාව ය.

ප්‍රහාණ සංඥා යනු තදංගප්‍රහාණ විෂ්කම්භනප්‍රහාණ සමුච්ඡෙද ප්‍රහාණ ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණ නිඃශරණප්‍රහාණය යන පස් වැදෑරුම් ප්‍රහාණ අරමුණු කොට උපදනා සංඥාව යි.

විරාග සංඥා යනු විරාගානුපස්සනාඤාණයෙහි උපන් සංඥාව ය.

නිරෝධ සංඥා යනු, සංස්කාරයන් ගේ නිරෝධය අරමුණු කොට උපදනා සංඥාව, නිවන අරමුණු කොට උපදනා සංඥාව යැ යි අන්හු කියත්. මෙහි අධොලිපි අංක 282 ද බලනු.

295 පිටැ. අංක 10. **විඥානස්ථිති** ප්‍රතිසන්ධි විඥානය පිහිටන තැන්, ප්‍රතිසන්ධිය ඇති වන තැන්. මොහු නානත්තකාය නානත්තසඤ්ඤී ආදි විසින් සත් දෙනෙකි. **නානත්තකාය නානත්තසඤ්ඤී** යන තැන කයින් වෙනස් වූ—පැහැයෙන් සටහනින් ඉරියවු පැවැත්තුමෙන් එක්බඳු නොවන්නෝ නානත්තකායයෝ (හෙවත් කායනානාත්වය

ඇත්තෝ) ය. කෙනෙක් ත්‍රිහේතුක ප්‍රතිසන්ධි ද කෙනෙක් ද්විහේතුක ප්‍රතිසන්ධි ද කෙනෙක් අහේතුක ප්‍රතිසන්ධි ද ඇතියෝ නානත්ත සඤ්ඤිහු (සංඥනානාත්වය ඇත්තෝ) ය. මෙසේ **නානත්තකාය නානත්තස**ඤ්ඤිහු යනු සදෙව් ලොවැ දෙවියෝත් මිනිස්සුත් උත්තරමාතා යකිනි ප්‍රියංකර-මාතා යකිනි ආදි ඇතැම් විනිපාතිකයෝත් ය. දෙවියන් අතුරෙහි ද දෙ දෙනෙක් පැහැයෙන් සටහනින් ගමනින් කතාබහින් එක්බඳු නො වෙත්, නානාවිධ ය. ඔවුන් උපත ද එක් ම පිළිසඳ සිතෙකින් නො වේ. කෙනෙක් ත්‍රිහේතුක ප්‍රතිසන්ධි විපාක සිතෙකින් ද කෙනෙක් ද්විහෙතුක ප්‍රතිසන්ධි සිතෙකින් ද කෙනෙක් අහෙතුක ප්‍රතිසන්ධි සිතෙකින් ද උපදනෝ ය. මෙසේ කයිනුත් වෙනස් ප්‍රතිසන්ධිසංඥයෙනුත් එකෙක් අනෙකකුට වෙනස් වූවෝ **නානත්තකාය නානත්තස**ඤ්ඤිහු ය.

නානත්තකාය එකත්තසඤ්ඤිහු නම් පැහැ සටහනින් වෙනස් වුව ද එක් ම ප්‍රතිසන්ධි සිතින් උපන්නෝ ය. ලොවැ මුලදී ම උපන් බ්‍රහමකායික දෙවියෝ (**බ්‍රහමපාරිසජ්ජ බ්‍රහමපුරොහිත මහාබ්‍රහම** යන බඹලොව්හි බඹහු) ය. ඔහු හැම පැහැසටහන් ආදියෙන් වෙනස් නුවූ එක ප්‍රථමධ්‍යාන විපාක සිතින් උපන්නෝ ය.

එකත්තකාය නානත්තසඤ්ඤිහු නම් කයින් එක්බඳු ප්‍රතිසන්ධිසංඥයෙන් නො එක්බඳුවෝ ය. මොහු නම් ආභස්සර ලොවැ බඹුහු ය. ගිනිසුලෙකින් ගිනි පුපුරු නික්මෙන බඳු එළියදහර ඔවුන් කයින් නික්මේ. මෙසේ කයින් එක්බඳු වතුදු කෙනෙක් විතීය රූපධ්‍යාන විපාක සිතින් ද කෙනෙක් තෘතීය රූපධ්‍යාන විපාකසිතින් ද උපන්නෝ ය. **එකත්තකාය එකත්තස**ඤ්ඤිහු කයිනුත් ප්‍රතිසන්ධිසිතෙනුත් එක්සම අය ය. **සුභකිණ්හක** බඹුහු ය. මොවුන් ගේ සිරුරුවලින් ඒකඝණ ව රිස් විහිදෙයි. චතුර්ථධ්‍යාන උපදවා පරිත්තසුභ අප්පමාණසුභ සුභකිණ්හක බඹලෝහි උපන්නෝ ය. ඔහු හැම කයින් ද ප්‍රතිසන්ධිවිපාක සිතින් ද එක්බඳු හ. වෙහප්ඵල බඹුහු ද මේ සතර වන විඥනස්ථිතියට අයත්හ. අසංඥ සත්ත්වයෝ විඥණයක් නැත්තෝ ය. එ හෙයින් මේ බෙදීමට නො ඇතුළත්හ. සත්ත්වාවාස යන්නට ඇතුළත් වෙත්. ශුද්ධාවාස වාසිහු මේ ගණයට නො ගැනෙත්. බුදුවරුන් පහළ වූ කල්හි ම ඔබ සවු වැ අනාගාමී වැ මේ ශුද්ධාවාසයන්හි උපදිත්. ශුද්ධාවාස බ්‍රහමලෝක

පස බුදුවරුන් ගේ කඳවුරු බඳු තැන් ය. මහාශිව තෙරුන් ගේ මතය පරිදි ශුද්ධාවාස ද සතර වැනි විඥානස්ථිතියටත් සතර වන සත්වාවාසයටත් ඇතුළත් බව ය. සංඥා විඥාන ඇතැයි ද නැතැයි ද නොකියැ යුතු තරම් සියුම් බැවින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය විඥානස්ථිතීනට ඇතුළත් නො වේ.

ආකාශානන්ත්‍යායතනෝපග දෙවියෝ යනු ආකාසානඤ්චායතන ධ්‍යානය උපදවා එහි විපාක වශයෙන් ආකාසානඤ්චායතන නම් ප්‍රථම අරූප භවයෙහි උපන්නෝ ය. විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය උපදවා එහි විපාක විසින් විඤ්ඤාණඤ්චායතන නම් දෙවෙනි අරූප බඹලොවැ උපන්නෝ **විඥානානන්ත්‍යායතනෝපග** දෙවියෝ ය. ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය උපදවා එහි ඵල විසින් ආකිඤ්චඤ්ඤායතන බඹලොවැ (තුන්වන අරූතලයෙහි) උපන්නෝ ආකිඤ්චන්‍යායතනෝපග දෙවියෝ ය. මෙහි 128 වැනි පිට ද 309 පිටැ අංක 3 ද බලනු.

295 පිටැ අංක 11. **දක්ෂිණාභිපුද්ගලයෝ**= සැදැහැයෙන් දෙන දන් පිළිගන්නට සුදුසු ම සත් දෙනා.

උභතෝභාගවිමුක්ත. දෙ කොටසින් ම මිදුණේ. අරූපසමාපත්ති ලැබීමෙන් රූපකායය කෙරෙන් ද, ආර්යමාර්ග ලාභයෙන් නාමකායය කෙරෙන් ද මිදුණේ ය. ආකාසානංචායතනාදි අරූපසමාපත්ති සතර අතුරෙන් එකෙකින් නැගී සිට රහත්බවට පැමිණියෝ සතර දෙනා ද අනාගාමී වැ නිරෝධසමාපත්තියෙන් නැගී සිට රහත්බවට පැමිණි තැනැත්තේ ද යි උභතෝභාගවිමුක්තයෝ පස් දෙනෙකි.

ප්‍රඥාවිමුක්ත. ප්‍රඥාව කරණ කොට ගෙන කෙලෙසුන් ගෙන් මිදුණේ. ශුෂ්කවිදර්ශකයා ය (ධ්‍යානසමාපත්ති නොලබා රහත්ඵලය ලත් තැනැත්තා ය,) ප්‍රථමධ්‍යානාදි සතර රූපාවචර ධ්‍යාන ලබා ඒ පාදක කොට රහත්බව ලත් සතර දෙනා යැ යි **ප්‍රඥාවිමුක්තයෝ** පස් දෙනෙකි.

කායසාක්ෂී. පළමු කොට ධ්‍යාන උපදවා පසු ව නිවන් පසක් කරන තැනැත්තෝ ය. ස්‍රෝතආපත්තිඵලස්ථයා පටන් කොට අර්හත්මාර්ගස්ථයා තෙක් ආර්යපුද්ගල ස දෙන ය. 'නාමකායයෙන් අෂ්ට විමෝක්ෂයන් ස්පර්ශ කොට පසු ව නිවන සාක්ෂාත් කළේ' යනු කායසාක්ෂී යන්නේ අර්ථ යි.

දෘෂ්ටිප්‍රාප්ත (දිට්ඨිප්පත්ත) 'සංස්කාරයෝ දුක්ඛ' යි නිවන සුවැ' යි සිය නුවණින් දැන එහි කෙළවරට පැමිණියේ. මෙ තෙමෙ නානා **ක්ෂණ**යෙහි දුඃඛ ආද සතර සත්‍යයන් ගේ තතු ද එය බුදුරජුන් වදාළ නියා ද සලකනුයේ ප්‍රඥාධික බැවින් පහසුවෙන් කෙලෙස් නසයි. ප්‍රඥාධික වූ ස්‍රෝත-ආපත්තිඵලස්ථායා පටන් කොට අර්හත්ත්වමාර්ගස්ථායා තෙක් ආර්‍යපුද්ගලයෝ සදෙන ය මොහු අරූප ධ්‍යාන නොලබා නිවන් පසක් කරන්නෝ ය.

ශ්‍රද්ධාවිමුක්ත = ශ්‍රද්ධාධික වූ දුක සේ කෙලෙසුන් ගෙන් මිදෙන්නෝ ය. ස්‍රොතආපත්තිඵලස්ථයා පටන් කොට අර්හත්ත්වමාර්ගස්ථයා දක්වා ආර්‍යපුද්ගලයෝ සදෙනා ය. දෘෂ්ටිප්‍රාප්තයා ප්‍රඥාධික ය. ලෙහෙසියෙන් කෙලෙස් නසයි. ශ්‍රද්ධාධිමුක්තයා ශ්‍රද්ධාධික ය, බොහෝ මහංසියෙන් කෙලෙස් නසයි. මොවුන් දෙදෙනා ගේ වෙනස එ පමණ ය.

ධර්මානුසාරි. ප්‍රඥාව අනුව යන්නේ, ප්‍රඥාපූර්වඞ්ගම මාර්ගය වඩනුයේ. මෙ තැන **ධර්ම** යනු ප්‍රඥාව ය. ධර්මානුසාරී යනු ස්‍රෝතආපත්තිමාර්ගස්ථයා ය.

ශ්‍රද්ධානුසාරි. ශ්‍රද්ධාව පෙරදැරි කොට විවසුන් වඩා සෝවාන් වූයේ යි. ප්‍රඥාපූර්වඞ්ගම මාර්ගය වඩා සිවුසස් පසක් කරන ස්‍රෝතආපත්තිමාර්ගස්ථයා **ධර්මානුසාරි** ය. ශ්‍රද්ධාපූර්වඞ්ගම මාර්ගය වඩා සිවුසස් පසක් කරන ස්‍රෝතආපත්තිමාර්ගස්ථයා ශ්‍රද්ධානුසාරි ය.

295 පිටැ අංකය. **අනුශය** යනු අවස්ථාවක් පැමිණි විට පමණක් නැගී සිටුනා එසේ නැති විට නැත්තක්හු සෙයින් සැඟෙවී සිත්සතන්හි ලැග හෝනා කෙලෙස් ය.

295 පිටැ අංක 13. **සංයෝජන** සත. මෙහි **අනුනය** යනු කාමරාගය යි. ප්‍රතිඝ යනු ව්‍යාපාදය (ද්වේෂය) යි.

295 පිටැ 14. **අධිකරණශමථ**= අධිකරණ සංසිඳුවීම. අධිකරණ නම් කිම? මහානිද්දෙසඅටුවාහි[1] **අධිකරණ-කාරකා** යන්නට 'විනිච්ඡයපාපුණනවිසෙසකාරණං කරොන්තා'යි යූ බැවින් විනිශ්චයයක් පිණිස ඉදිරිපත් වන විශෙෂකාරණය **අධිකරණ** නම් වන බව පෙනේ. මෙසේ විනිශ්චයයට අවශ්‍ය කාරණය, නඩුව, අධිකක්‍රියාව (සාමාන්‍ය ක්‍රියාවනට වඩා උතුම් ක්‍රියාව) යන අරුත්හි අධිකරණශබ්දය වැහැරුවෙයි.

1. හෙවාවිතාරණ මුද්‍රණය 185 පිට.

අධිකරණ සතරෙකි: විවාදධිකරණ අනුවාදධිකරණ ආපත්තාධිකරණ කිච්චාධිකරණ විසිනි. මෙහි **විවාදධිකරණ** යනු 'දහමැයි නොදහමක් දක්වීම නොදහමැ යි දහම දක්වීම' යන ඈ විසින් අටොළොස්වැදෑරුම් වූ (සංඝභේදයට හේතු වන) කරුණු අතුරෙන් යමක් මුල් වැ භික්ෂූන් අතර පැන නැංග විවාදය යි. **අනුවාදධිකරණ** නම් ශීලවිපත්ති ආචාරවිපත්ති දිට්ඨිවිපත්ති ආජීවවිපත්ති යන සතරින් එකෙකින් එක් මහණකු තව මහණක්හට කරන අපවාදය (චොදනාව) යි. **ආපත්තාධිකරණ** නම් පාරාජික සංඝාදිසෙන් ථුල්ලච්චය පාචිත්තිය පාටිදෙසනීය දුක්කට දුබ්භාසිත යන ආපත්තිස්කන්ධ යි. **කිච්චාධිකරණ** නම් අපලෝකන ඤත්තිකම්ම ඤත්තිදුතියකම්ම ඤත්තිචතුත්ථකම්ම යන විනය කම් කිරීම යි.

මේ අධිකරණ සත සංසිඳුවන, නිශ්ශාවට පමුණුවන සත්වැදෑරුම්මහ **අධිකරණශමථ** නමි. ඔවුන් අතුරෙන් සම්මුඛාවිනය යේභුය්‍යසිකා යන ශමථ දෙකින් විවාදධි-කරණය ද, සම්මුඛාවිනය සතිවිනය අමූළ්හවිනය තස්ස-පාපිය්‍යසිකා යන සතරින් අනුවාදධිකරණය ද, පටිඤ්ඤාත කරණ තිණවත්ථාරක යන දෙකින් ආපත්තාධිකරණය ද, සම්මුඛාවිනයයෙන් කිච්චාධිකරණය ද සංසිඳේ.

මොවුන් අතුරෙන් **සම්මුඛාවිනය** යනු සංඝසම්මුඛතා ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගලසම්මුඛතා යන සතර සම්මුඛතා ඇති කොට ගෙන චුදිතයාත් චෝදකයාත් කැඳවා නඩුවක් සංසිඳුවීම යි. [එහි සංඝයාගේ පැමිණීම, ඡන්දාහරණය, පැමිණියවුන් කමීයට බාද නොපැමිණවීම මේවා සම්පූණි වීම **සංඝසම්මුඛතා** යි. විනිශ්චය කළ යුතු කාරණය ඇත්තක් වීම **ධම්මසම්මුඛතා** යි. **විනය සම්මුඛතා** යනු ඒ අධිකරණය සංසිඳුවන්නට බුදුරජුන් පැණැවූ ක්‍රමය යි. චුදිතයාත් චෝදකයාත් ඉදිරියට පැමිණ සිටීම පුග්ගලසම්මුඛතා යි.]

සති විනය දීම යනු සමෘතිවෛපුල්‍යයට පැමිණියක්හට හෙවත් රහතක්හට කිසිවකු චෝදනා කළ විට උන්-වහන්සේ රහතකු බව ද වරදක් නොකරන බව ද ඤත්තිචතුත්ථ කම්මවාචායෙන් සඟ මැදදී පැවැසීම යි. එයට පසු උන් වහන්සේට කරන චෝදනා සංඝයා නො පිළිගනී.

අමූළ්හවිනය දීම යනු උමතු ව සිටි මහණකු සුව වූ පසු උමතු අවදියේ කළ කී දෑ මතු කෙරෙමින් සෙසු මහණුන් විසින් හිරිහැර කළ නොහැකිවනු පිණිස සංඝයා එක් වැ ඤත්තිචතුත්ථකම්මවාචායෙන් ඒ මහණහු උමතු සමයෙහි කළ වරදින් නිදහස් කිරීම යි.

ප්‍රතිඥායෙන් කැරැවීම (පටිඤ්ඤාතකරණ) යනු තමා කළ වරද පිළිණ කළ මහණහට ආයතිසංවරය පිණිස ඇවැතට සුදුසු සේ පිරිවෙස් ඇ, දීම යි.

යේභුය්‍යසිකා යනු නඩුවක් විසැඳීමට බාධක ලෙස අරගලයක් නැගි විට එය පිළිබඳ ව ඡන්දය විමසා ධම්වාදීන් බහුල වුවොත් ඔවුන් ගේ කැමැත්ත අනුව එය සංසිඳුවීම යි. සංසිඳුවීම යි.

තස්සපාපිය්‍යසිකා යනු ඇවැත්බහුල වූ කිලිටි හැසුරුම් ඇති අලජ්ජී මහණහට දෙන දඬුවම ය. දඬුවමින් නිදහස් වන තුරු පිරිවෙස පුරන්නකු බඳු වැ ඔහු පැවැතිය යුතු. **තිණවත්ථාරක** යනු පරිජි සහවෙසෙස් ගිහියනට ගැරැහීම් ආදිය හැර සෙසු ඇවැත් පිළිබඳ ව භික්ෂූන් දෙ පිලක් ව උනුනට කරන චෝදනා විනිශ්චය කිරීම අවුල් වැඩීමට හේතු වනු පෙනුණු විට ඒවා විනිශ්චය නොකොට වසා දැමීම යි. කුණුගොඩක් තණකොළින් වසා දැමීම බඳු වැ කරන කර්මය යනු **තිණවත්ථාරක** යන වචනයේ තේරුම යි.

298 පිටැ අංක 3. **සත්තාවාස** යනු සත්ත්වයන් ගේ වාසස්ථාන යි. ශුද්ධාවාස බඹලොවත් සත්ත්වාවාසයක් වුව ද හැම කල්හි ම නැති බැවින් මෙ තැන ගණනට නො ගැණිනි. බුද්ධශූන්‍ය කල්පවලැ ශුද්ධාවාස ද හිස් ය.

නිමි

අනුක්‍රමණිකා

අ

අකණිට්ඨක 117
අකුශලකර්මපථ 299, 315
අකුසල්මුල් 268
අකුශලධාතු 269
අකුශලවිතර්ක 268
අකුශලසංකල්ප 269
අකුශලසංඥා 269
අකොප්‍යනුවණ 301
අකොප්‍යචේතොවිමුක්ති 302
අක්ෂණ 298
අක්ෂමා ප්‍රතිපත්ති 281
අගති 254
අගතිගමන 280
අගොචරස්ථාන 223
අගෝප්‍ය 23
අගෞරව 291, 307
අග්‍රබීජ 320
අග්නිදත්ත 102
අග්‍රශ්‍රාවක පරිච්ඡේද 101
අග්‍රොපස්ථායක 102
අඞ්ගක 40
අඞ්ගකූට 319
අඞ්ගවිද්‍යා 8
අඞ්ගිරස 34, 93, 340
අඟුරටැ 36
අචිරවතී 91
අච්චුත 165
අච්ඡිද්‍රගණනා 322
අජාසත් රජ 21, 130, 147, 322
අජිත (කෙසකම්බලි) 21, 24
අජිත 326
අජ්ඣායක 335
අඤ්ඤදත්‍ථුහර 255
අඤ්ඤාතාවින්ද්‍රිය 215
අඤ්ඤින්ද්‍රිය 275
අටපා කෙළිය 5
අටවිදූ 34
අට්ඨක 34, 93, 340
අඩතොලු 50
අතප්ප 117
අත්තවාදුපාදාන 322
අත්‍යන්තනිෂ්ඨාව 174
අත්‍යන්තය 174
අද්ධරිය 339
අද්ධරිය බ්‍රාහ්මණ 92
අධර්මරාගය 227
අධිකරණ 350, 351
අධිකරණසමථ 295, 350, 351
අධිකරණකාරක 350
අධිජුගුප්සා 58
අධිජේගුච්ඡය 60
අධිප්‍රඥප්ති 248, 344
අධිප්‍රඥ 58
අධිමුක්ති 58
අධිශීල 58
අධිශීලශික්ෂා 276
අධිෂ්ඨාන 282
අධ්‍යවසාන 121, 122
අධම 271
අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය 275
අනඳතෙරණුවෝ 147
අනාගාමීහු 289

අනාත්මසංඥ 347
අනාසීව්‍යවහාර 285
අනාවිලසංකප්පතා 315
අනිත්‍යසංඥ 290, 347
අනිමිත්තසමාධි 276
අනුත්තරියධර්ම 238, 240, 276, 292, 308
අනුත්පාදයෙහි නුවණ 267, 303
අනුනය 350
අනුපම 102
අනුපිය නිගමය 205
අනුපූර්වනිරෝධ 298
අනුපූර්වවිහාර 298, 314
අනුපූර්වසංඥනිරෝධ 66
අනුපපියභාණී 255
අනුබෝධ 118
අනුරුත් තෙරණුවෝ 146
අනුවාදධිකරණ 351
අනුශය 295, 305, 350
අනුසාසන කොටස 239
අනුස්මෘතිස්ථාන 292
අනෙජක 165
අනොත්තප්ප 263
අනෛර්‍යාණිකශාසනය 262
අන්ත තුන 272
අන්තර කල්ප 343
අන්තර පරිනිබ්බායී 289
අන්තානන්තිකවාද 11, 13, 14
අන්‍යයෙහි ඥනය 279
අපරාන්ත කල්පික 11, 19
අපරිහානියධර්ම 131
අපශ්‍රයණ 279
අපශ්‍රයධර්ම 315
අපාය කෞශල්‍ය 277
අපායගාමිධර්ම 304
අපායසහාය 255
අප්පටිවාණිතා 267
අප්පටට 337, 338
අප්පසමාරම්භ 337, 338
අප්‍රණිහිතසමාධි 276
අප්‍රමාණ 279
අභිජාති 293
අභිඥෙය 302, 303, 304, 309, 312, 314; 315
අභිධ්‍යාව්‍යාපාද උත්පත්තිය 227
අභිනීලනෙත්ත 252
අභිනීහාර 317
අභිභායතන 138, 296, 312
අභිභූසම්භව 101
අභිසංඛාර 273
අමරාවික්ෂෙපක 11, 14, 26
අමූලහවිනය 352
අම්බගාම 139
අම්බට්ඨ 29
අම්බපාලිගණිකා 135
අම්බපාලිවන 135
අම්බරඅම්බරවතී 260
අම්බලට්ඨිකා 1, 132
අම්බසණ්ඩා 167
අඹයැටි 1, 42
අඹහඬු 167
අයොනිසොමනසිකාර 300
අරිට්ඨක 165
අරුණ 102, 166
අරුණවතී 102
අරූපධ්‍යාන 330
අර්ථාඛ්‍යායී සහාය 255
අර්ථජාල 20
අර්ථඥතා 309
අතීත්ඛවඵලසංඥ 66
අලස බවේ දෙස් 25
අල්ලකප්ප 147
අවකාශාධිගම තුන 155
අවරදිග 256
අවහිරයක් නැත්තාහු 163
අවි 275

අවික්ඛෙප 266
අවිද්‍යා 263, 303
අවිද්‍යෝඝ 283
අවිලකුණු 9
අවිවරදන්තතා 252
අවිහ 116
අවිහිංසා 109, 265
අව්‍යාකෘත 68
අශුභසංඥා 347
අශෛක්‍ෂධර්ම 316, 299
අෂ්ටවිමෝක්‍ෂ 312
අසංස්කෘතධාතුව 303
අසංඛාරපරිනිබ්බායී 289
අසංඥී 63
අසංඥීගර්භ 24
අසංඥීවාද 17
අසද්ධර්ම 293, 305
අසම 165
අසම්පජඤ්ඤ 26
අසොක 103
අස්ථාන දැනීම 264
අස්මිමාන 300
අස්සතර 164
අහඞ්කාර 127
ඇහස්දූ කෙළි 5
අහිරික 263
අහිවිද්‍යා 8

ආ

ආකාශානන්තායතනොපග349
ආඛ්‍යාන 5
ආඝාතප්‍රතිවිනය 297
ආඝාතවස්තු 297, 313
ආචාරගොචර 30, 334
ආචාර්‍යසංග්‍රහ 256
ආජානුලම්බහස්තතා 251
ආටානාටා 260
ආටානාටිය 258
ආත්ම 222, 66
ආත්මකලම්ථානුයොගී 214
ආත්මඥතා 309
ආත්මදමනය 150
ආත්මභාව ප්‍රතිලාභ 284
ආත්මවාදය 126
ආත්මාධිපත්‍යාදි 277
ආදීනවසංඥා 347
ආදේසනා කොට්ඨාස 238
ආධිපත්‍ය 277
ආධ්‍යාත්මිකායතන 290, 307
ආනන්තරික චිත්ත සමාධිය301
ආනන්ද 102
ආනන්ද චෛත්‍යය 139
ආපත්තාධිකරණ 351
ආපත්තිදැනීම 263
ආපත්තිවුට්ඨාන කුසලතා 263
ආපස් 275
ආපෝදේව 165
ආභස්සර 209
ආභාස්වර 233
ආමගන්ධය 160
ආයකෞශල්‍ය 277
ආයතන 128, 344
ආයතනකුශලතා 264
ආයතනපබ්බය 186
ආයතනප්‍රඥප්ති 238
ආයතපණ්හිතා 250
ආයු පිරිහීම 227
ආයුෂට කාරණ 230
ආයු පරිච්ඡේදය 100
ආයුසංස්කාරය හැරීම 138
ආරක්‍ෂා 121
ආරම්භවස්තු 296, 311
ආරූප්‍ය සංඥා 65

ආර්යධන 293, 308
ආර්යවංස 279
ආර්යවාස 299, 315
ආර්යවිහාර 285
ආලකනන්ද 260
ආලකමන්ද 149
ආලොකස්ඵරණතා 306
ආවාසමාත්සර්ය 287
ආවුසොවාදය 145
ආසව 33, 166, 336
ආසව නසන නුවණ 49
ආස්‍රව 244, 270

ඉ - ඊ

ඉච්ඡානඞ්ගල 29
ඉදංසච්චාභිනිවෙස 283
ඉද්ධිවිධ නුවණ 32, 48
ඉඳුරු 164
ඉන්ද්‍ර 95, 157, 164
ඉන්ද්‍රිය 289, 275,
ඉන්ද්‍රියසංවර 27, 172, 265, 327
ඉඳුසල්ලෙන 167
ඉපැත්ම 187
ඉපිදවියැ යුතු ධර්ම 301, 309, 311, 314
ඉරියාපථපබ්බ 179
ඉරිසියාව 170
ඉසිවරු 340
ඊශ්වරනිර්මාණවාදය 210
ඊසාන 95

උ

උක්කට්ඨා 29, 116
උක්කොටන 4, 320
උච්ඡෙදවාද 18, 24
උජුඤ්ඤ 53
උඩදෙස 256
උණ්ණාලක්ඛණතා 252
උණ්හීසසීසතා 252
උතුර 256
උතුර නැමැදුම 257
උතුරුකුරු දිවැ 259
උත්තරකානිගමය 206
උත්තරා 102
උත්ථානගාමිනී විදර්ශනාව 111
උත්පාතලක්ෂණ 8
උත්පාදයිතව්‍ය ධර්ම 303, 304, 315
උදයී 240
උදයිභද්‍ර 21, 22
උද්‍රක 243
උද්ධංසොතඅකනිට්ඨගාමී 289
උද්ධග්ගලොමතා 250
උද්ධම්භාගිය 287
උද්ධම්භාගිය සංයොජන 346
උපකාරිමිත්‍ර 255
උපවර්තන 142, 148
උපවාන 142, 248
උපසන්ත 102
උපහච්චපරිනිබ්බායී 289
උපාදාන 284, 322
උපාදාන ප්‍රත්‍යය 120
උපාදානරහිත 19
උපාදානස්කන්ධ 188, 286, 345
උපාදින්නරූප 86
උපාය කෞශල්‍ය 277
උපායාස 188
උස්සංඛපාදතා 250
උබ්භතක 261
උභතොභාග විමුක්ත 129, 349
උම්මාපුප්ඵනිභාසී 165
උස් යහන් 6

ඍ - ඓ - ඕ

ඍජුබව 265
ඍද්ධිපාද 155, 278
ඍද්ධිවිධඥානය 28, 331
ඍද්ධි විෂය 239
ඓරාවත 165
ඔකාවස් 29
ඕස 283
ඕදාතගෘහ 166
ඕපපාතික 191
ඕපමඤ්ඤ 164
ඕරම්භාගිය 287
ඕරම්භාගියසංයෝජන 346

ක - ඛ

කංසකූට 319
කකුධකච්චාන 21, 25
කකුධ කාත්‍යායන 325
කකුසන්ධ 100, 101
කර්ක 166
කණහෝම 8
කණ්ණුතලා 53
කණ්හ 29
කණ්හායන 29
කත්තුවා 36, 336
කථාවස්තු 278
කන්නංගුරුවා 6
කපිලවත්ථු 102
කබලීකාරාහාර 280
කම්කෙලෙස් 254
කම්බල 164
කම්මාසදම්ම 117, 177
කරුණාකායික 165
කරුණාධ්‍යානය 160
කරුම්භ 166
කරේරිකුටිකා 99
කර්ම 283
කර්මවාදී 37, 337
කර්මවිපාක 191
කර්මසාදෘශ්‍යය 249
කර්මස්ථානමුඛ 339
කලණ දහම් 114
කල්‍යාණමිත්‍රතා 263
කසිණායතන 314
කසිවනතා 260
කසුප් පිරිවැජි 62
කසුබුලකුණු 9
කස්සප 34, 93, 100, 101
කස්සපගොත්තිය පූරණ 21
කළාරමට්ඨක 207
කාමගුණ 287
කාමරාග 37
කාම සංඥා 64, 269
කාමසෙට්ඨ 164
කාමූපාදන 322
කාමෝඝ 283
කාමෝපපත්ති 274
කායගතාසති 300
කායභාවනා 276
කායරාග 289
කායසාක්ෂි 349
කායානුපස්සනා 178
කායානුපස්සී 178
කාලකඤ්ජ 165
කාලඥ 246
කාලඥතා 309
කාලපරිච්ඡේදය (බුදුවරුන්-
ගේ) 99
කාශ්‍යප 340
කාශ්‍යපපූරණ 323
කිකී 102

කිච්චාධිකරණ 351
කිඤ්ඡන 272
කිනන්නුඝණ්ඩු 164
කිඹුල්වත් වැසි 164
කිඹුල්වත් පුර 162
කිසසඞ්කිච්ච 324
කුටෙණ්ඩු 164
කුමරකසුප් 191
කුම්භසථාන 7
කුම්භ ස්තූප 148
කුම්භාණ්ඩ 345
කුම්භීර 164
කුරුරට 117
කුලපුත්‍ර සංග්‍රහ 257
කුවේර 164, 260
කුශලකර්මපථ 299, 315
කුශලවශී 109
කුශලධාතු 269
කුශලවිතර්ක 268
කුශලසංඥ 269
කුශාවතී 148
කුශිදවස්තු 295, 310
කුසල් දහම් 238
කුසල් මුල් 268
කුසිනාටා 260
කුසිනාරා 144, 148
කුහුල්හලැ 63
කුලාරහල 50, 207
කුළුදත් 42
කෘත්ස්නායතන 299
කේතුමතී 229
කේලාම් කීමේ උපත 226
කේවලශාශවතවාද 11, 12, 19
කේශකම්බලී 326
කේසී 342
කොණ්ඩඤ්ඤ 103
කොත්තා 43
කොසඹෑ පුර 52
කොසොල් රට 29
කොහොල් රටැ 87, 91
කෝට්ග්‍රාමය 134
කෝණාගමන 100, 101
කෝමාරභච්ච 21
කෝරක්ඛත්තිය 206
කෝලිය රජුහු 147
කෝසම්බකුටි 99
කෝසම්බී 144
කෝසිය 168
කෝසෝහිතවත්‍ථගුයාතා 251
කෞශල්‍ය 277
කෞශිකයන් 168
ක්‍රියාවාදී 37, 337
ක්‍රීඩාප්‍රදූෂ්‍යක 210
ක්‍රීඩාප්‍රදෝෂමූලක ලෝකෝත්-
පත්තිකථා 210
ක්ෂමාප්‍රතිපත්ති 281
ක්ෂයයෙහි නුවණ 267, 303
ක්ලේශප්‍රහාණ 333
ක්ෂාත්‍රවිද්‍යා 8
ක්ෂාන්තිය 265
ඛණ්ඩ 103, 113
ඛණ්ඩතිස්ස 101
ඛන්ධ පබ්බය 185
ඛාණුමත 42
ඛිඩ්ඩාපදූසික 165
ඛිප්පාභිඤ්ඤ දුක්ඛ පටිපද 281
ඛිප්පාභිඤ්ඤ සුඛ පටිපද 281
ඛුලු රට 206
ඛෙම 102, 113
ඛෙමංකර 102
ඛෙමවතී 102
ඛෙමිය 166

ග – ඝ

ගණනා 322
ගති 287
ගන්ධකුටි 99
ගම්භීරා 36, 336
ගර්භාවක්‍රාන්ති 238, 284
ගිජ්ඣකූට 60, 156, 212
ගිංජකාවසථ 134
ගිහි තුන 272
ගිහි විනය 253
ගොදුරු බිම 223
ගොයි ලකුණු 9
ගොයුම්දෙර 134
ගොසු අරමැ 52
ගෝචරසම්පජඤ්ඤ 328
ගෝත්‍රපරිච්ඡේදය 100
ගෝපක 169
ගෝපිකා 169
ගෝපබ්‍රහ්මතා 252
ගෝවින්ද 158, 159
ගෝශාලමස්කරි 23, 324
ගෝසාලමක්ඛලී 23, 21
ගෞරව 291
ග්‍රන්ථ 283
ඝෝරණ්ඩ සංහිතා 332
ඝෝෂිතාරාමයේ 52

ච – ඡ

චක්‍රරත්නය 342
චක්‍රලක්ෂණ 249
චඞ්කි 91
චණ්ඩාල 5, 321
චතුශ්චක්‍රසම්පත් 304
චතුසම්පජඤ්ඤ පබ්බ 180
චත්තාලීසදන්තතා 252
චන්දන 164
චම්පා 36, 144, 159, 300, 336
චාතුර්යාමසංවර 218
චාපල්‍යය 37
චාපාල 136
චිත්තන්තරංසතා 251
චිත්තභාවනා 276
චිත්තවිමුත්ති 308
චිත්තසම්පත් 58
චිත්තානුපස්සනා 184
චිත්‍ර 164, 165
චින්තාමයප්‍රඥ 275
චුන්ද 241, 261
චුන්දකර්මාරපුත්‍ර 140
චුන්දදානානුමෝදනා 141
චේතක 322
චේතනාසමූහ 290
චේතඃස්ඵරණතා 306
චේතෝඛිල 289, 306
චේතෝවිනිබන්ධ 289
චෝදකාංග 288
චොදනාහී සඵරහු 89, 90
චෝදනාහී නොවූ සඵරහු 90
චෝදනාවස්තු 274
ඡන්ද 171
ඡන්දරාගය 121
ඡන්නක 339
ඡන්නකබ්‍රාහ්මණ 92
ඡන්න 145

ජ – ඣ – ඤ – ඨ

ජඞ්ඝාවිහරණ 91
ජනවසභ 153
ජනෝසපුර 260
ජම්බුගාම 139
ජාතිපරිච්ඡේද 100
ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ119

ජාතිසථවිර 273
ජානුසොසාණි 91
ජාලහත්ථපාදතා 250
ජාලිය 52, 208
ජීවය 196
ජෝති 166
ජෝතිපාල 159
ජෝතිපාසාණ 345
ඥතපුත්‍ර 327
ඥතිකග්‍රාමය 134
ඥන 279
ඥනදශීනය 245
ඣාන 328
ඣායක 235
ඤතපරිඤඤ 340
ඨපනීය පඤහ 282

ත – ථ

තණ්ඩුලහෝම 8
තථධම් 318
තථාගත 3,246, 317
තපස 53
තපෝජුගුප්සාව 58, 213, 216,
තපෝජුගුප්සාවාදි 58
තල්වනය 154
තවළුවහම් 55
තවබඹසැරියෝ 60
තව්තිසා 154, 157
තසසපාපියාසිකා 352
තහවුරුබව් 45
තාරුකඛ 91
තිණවත්ථාරක 352
තිත්තිරිය 339
තිත්තිරියබ්‍රාහමණ 92
තිම්බරූ 164, 168
තිරශ්චීනවිද්‍යා 321
තිරිසන් කතා 7
තිරිසන් විද්‍ය 8, 9
තිසස 103
තිසසභාරවාජ 101
තිරණපරිඤඤ 340
තුන්කුසල් 150
තුන්ගිනි 272
තුන්මරුන් 162
තුලාකූට 319
තුසිත 166
තුසිපුර 105
තෘෂණා 123, 174, 188, 270
තෘෂණාප්‍රත්‍යයයෙන් උපාදන 120
තෘෂණාප්‍රපංචසංඥ 1?2
තෘෂණා මූලකධම් 313
තෘෂණා සමූහ 290
තෘෂෙණෝත්පාද 280
තෙවෙනි දහන 329
තේජෝදෙව 165
තෛලහෝම 8
තොටුගුරුන් 21
තෝදෙය්‍ය 91
ත්‍යාගාධිෂ්ඨාන 282
ත්‍රිවිද්‍යා 303
ත්‍රිවිධා 45
ත්‍රිශාලා 322
ථක්ප්‍රාපන 218
ථුසහොම 8
ථෙර 273

ද

දකුණ 256
දක්ෂිණාහී 349
දක්ෂිණාහීපුද්ගල 295
දක්ෂිණාවිශුඩි 285
දනසම්පත් (බෝසතුන්ගේ) 336
දන්තපුර 159

දුක්ඛාභිඤ්ඤදුක්ඛපටිපද 281
දුක්ඛාභිඤ්ඤසුඛපටිපද 281
දබ්බිහෝම 8
දමප්‍රතිපත්ති 281
දරපයුවක්හු 52
දරුවනට සංග්‍රහ 256
දර්‍ශනසමාපත්ති 238
දශවස්තුක මිථ්‍යාදෘෂ්ටි 343
දශසංඥ 315
දසපාකෙළිය 5
දස්සනානුත්තරිය 276, 308
දහම උතුම් තියා 232
දහම් 223, 243
දහම් දෑවක් 103
දහම් නියම 103-106
දහමැ පිහිටා 225
දානවස්තු 296
දානවේක්ස 165
දානානුශාසන 204
දානෝපපත්ති 296
දසාදි සංග්‍රහ 257
දිවිදෑවිලි 9
දිවි ගතුවෝ 19
දිට්ඨිවිපත්ති 266
දිට්ඨිවිසුද්ධි 266
දිට්ඨිප්පත්තා 350
දිට්ඨිසම්පත්ති 266
දිට්ඨුපාදාන 322
දිරුම 187
දිවකන් නුවණ 28, 48, 331
දිවන 52
දිවැස 28, 333
දිවැස් නුවණ 49
දිව්‍යචක්ෂුර්ඥාන 239
දිව්‍යවිහාර 278
දිව්‍යශ්‍රෝත්‍රඥානය 331
දිසම්පති 159
දිසා වැඳුම 253
දීඝඞ්ගුලිතා 250
දුක් 188
දුක්බව 271
දුඃඛ බව 263
දුෂ්ට ක්‍ෂණ 311
දුෂ්ප්‍රතිවිධ්‍ය ධර්ම 301, 303, 304, 309, 311, 313, 315
දුසිරිත 268
දුඃඛනිරොධගාමී ප්‍රතිපදාර්‍ය-සත්‍යය 189
දුඃඛනිරොධාර්‍යසත්‍යය 189
දුඃඛභාව 271
දුඃඛසමුදයාර්‍යසත්‍යය 188
දූ කෙළි 254
දෘෂ්ටධර්මනිර්වාණවාද 19
දෘෂ්ටධාර්මිකාස්‍රව 344
දෘෂ්ටිජාල 20
දෘෂ්ටිප්‍රඥප්ති 248
දෘෂ්ටිවාද 19
දෘෂ්ටිවේදනා 20
දෘෂ්ටි සතර 126
දෘෂ්ටිගතිකයෝ 247
දෘෂෙට්‍යෝස 283
දෙතිස්මහපුරිස්ලකුණු 107
දෙලෝවැඩ 114
දෙවෙනි දහන 329
දෙව්බෙර 9
දේව්රම් 62, 99
දෙව්රුදක්ම 51
දෙව්සක්රුවන 223
දෙව්හඬ අසනු 51
දේවාසුරසංග්‍රාමය 176
දොම්නස් 188
ද්වේපහන් 259, 345
ද්වේෂ නවය 245
ද්‍රෝණ 148

ධ

ධතරට්ඨ 159
ධන නසන දෙර 254
ධනවතී 102
ධම්මසම්මුඛතා 351
ධම්මානුපස්සනා 184 190
ධම්මායතන 344
ධරණී 260
ධර්ම 150
ධර්මකාය 232
ධර්මවසී 109
ධර්මජාල 20
ධර්මඥතා 309
ධර්මතා 103
ධර්මදේශනාකාර(බුදුරජුන්ගේ) 249
ධර්මපද 281
ධර්මභූත 232
ධර්මානුසඝී 287
ධර්මයෙහි ඥානය 279
ධර්මසමාදන 281
ධර්මස්කන්ධ 282
ධර්මාදර්ශය 134
ධාතු 292, 280
ධාතුකුශලතා 264
ධාතුමනසිකාරපබ්බය 181
ධාතු තුන 269
ධෘතරාෂ්ට්‍ර 164, 259
ධ්‍යාන 278

න

නටසමජ්ජ 5, 321
නන්දවච්ඡ 324
නන්ද මෙහෙණ 134
නමුචි 165
නවනවතිය 260
නළකාර 164
නාගිත 50
නාටපුරිකා 260
නාතපුත්ත 21, 25, 262
නාතික 152
නාථකරණධර්ම 314, 298
නානත්තකාය ඒකත්තසඤ්ඤී 348
නානත්තකාය නානත්ත-සඤ්ඤී 347, 348
නානාත්ව 7, 313
නාන්දීගීත 5
නාභස 164
නාමරූප 124, 263, 302
නාමරූපනිරෝධ 111
නාලන්ද 1
නැටුම් ඈ දකින්නට යනු 254
නැණදසුත් 53
නිකති 320
නිගණ්ඨනාතපුත්ත 327
නිග්‍රොධ 212
නිග්‍රෝධපරිමණ්ඩලතා 251
නිඝණ්ඩු 164
නිබ්බෙධභාගිය 293
නිමිනි සතර 8
නිම්මානරති 166
නිරුත්තරසංග්‍රාමවිජය 20
නිරෝධසංඥ 347
නිජ්ජරවත්ථු 315
නිද්දසවත්ථු 309, 294
නිර්වේදභාගිකසංඥ 293
නිල්දලා 168
නිවටනාපුතු 241, 262
නිවන 86
නිවනේ අනුසස් 114

නිෂිදනශාලා 1
නිස්සරණීයධාතු 289, 292
නිඃශරණීයධාතු 306, 308
නීවරණ 31, 287, 306,
නීවරණපච්චය 184
නුග 60
නුවණ 41
නෛවසංඥානාසංඥවාද 17, 18
නෛෂ්කාම්‍යසංඥ 269
නොකල් අට 311
නොසතුටුබව 267

ප – ඵ

පඤ්චධ්‍යාන 8
පග්ගහනිමිත්ත 266
පජ්ජුන්න 166
පටික්කූලමනසිකාරපච්චය 180
පටිච්චසමුප්පාදය 110
පටිඤ්ඤාතකරණ 352
පටිපුච්ඡාව්‍යාකරණීය ප්‍රශ්න 282
පටිසංඛාන බල 266
පටිසන්ථාරය 265
පටුප්පාදන 322
පඨවිදේව 165
පණිවා උපත 226
පනාද 164
පනුන්නපච්චෙකසච්චතා 315
පන්සිළු 155, 156, 164, 167
පයෝසි 342
පරකුසිතනාටා 260
පරකුසිනාටා 260
පරදාරසෙවනාරම්භය 226
පරනිම්මිතවසවත්ති 166
පරපුද්ගලවිමුක්තිඥාන 239
පරමයාගසම්පත 49, 337
පරමසන්තුෂ්ටිය 163
පරමාත්ම 166
පරසිත් දත්නා නුවණ 28, 49, 332
පරිච්ඡේදඥානය 279
පරිග්‍රහය 22, 121
පරිඥෙය ධර්ම (පිරිසිඳ දතයුතු දෑ) 300, 302, 304, 309, 310, 313, 315
පරික්ඛාර 340
පරිදේව 187
පරිශුද්ධාජීව 335
පරුෂවචන උපත 227
පර්යේෂණය 122, 123
පර්ෂද්ඥතා 369
පහූතජිව්හතා 252
පවත්තඵලභෝජී 34
පසැස් 163
පසේනදිරජ 88
පස්විකුම්නුවණ 34
පස්සද්ධකායසංඛාරතා 315
පහාණපරික්ඛාර 340
පහාරාද 165
පළඟ 6
පළමුදහන් 328
පාටලී ගම 132
පාටිකපුත්‍ර 207
පාණිස්සර 5
පාතිමොක්ඛසංවර 30, 172, 334
පාපමිත්‍රතා 263
පාපමිත්‍රසේවනය 254
පාමොක් දෙසනු 115
පායාග 164
පායාසිරාජඤ්ඤ 191, 342
පාරග 165

පාරිසුඩ්ඩපධානියංග 313
පාවා 241, 261
පාවා නුවර 140
පාවා පුර 147
පාසාදික 248
පැණසපුව 275
පැණැස 275
පැලලුප් 133
පිඩුගිණුම් 10, 322
පිත්කිරියවත් 273
පිප්පලීවන නගරවාසී 148
පියා ගෙන් ලැබුණු උරුමය 230
පිරිත් කියැ යුතු සැටි 258
පිරිනිවන් අදිටන 135
පිරිවෙස් 61
පිරිස් අට 296
පිළිවෙළකතාව 35
පිළිසමුපාව 20, 117
පුක්කුස 141
පුඤ්ඤාභිසංඛාර 273
පුණ්‍යක්‍රියා 109
පුද්ගලයෝ 286
පුද්ගලඥතා 309
පුද්ගලප්‍රඥප්ති 239
පුරිස්ලකුණු හේතු 249
පුරුෂශීලසමාචාර 239
පුවරම් 231
පූරණ 22, 323
පූර්විනිවාසඥාන 239
පූර්වභාගප්‍රතිපත්ති 178
පූර්වාන්තකල්පික 11, 19
පූර්වේනිවාසානුස්මෘතිඥාන 28,332
පෙරදිගට නැමැදුම 256
පෙරවුසුම පිළිබඳ දහම් කතාව 99
පෙරවුසුකඳපිළිවෙළ දත්නා නුවණ 49
පෙරෙවියා ගේ අංග 45
පොකුරුසැත් 29
පොක්ඛරසාදී 91
පොට්ඨපා 62
පොළෙළා් සැලෙන කරුණු 137
පෝතන 159
ප්‍රජාපතී 95
ප්‍රධාන 270
ප්‍රධානවිසී 239, 279
ප්‍රධානිකාංග 288, 306
ප්‍රඥප්ති 248, 344
ප්‍රඥ 59, 274, 275
ප්‍රඥාධිෂ්ඨාන 282
ප්‍රඥව පිරුණු බව 222
ප්‍රඥවාදී 58
ප්‍රඥාවිමුක්ත 129, 349,
ප්‍රඥසම්පත් 58
ප්‍රඥස්කන්ධ 282
ප්‍රතිසම්පදී 124
ප්‍රතිපත්ති 281
ප්‍රතිපත්තිදේශනා 239
ප්‍රතිභානචිත්‍ර 5, 321
ප්‍රතිවේධ 118
ප්‍රතීත්‍යසමුත්පාදකුශලතා 264
ප්‍රත්‍යවේක්ෂණනිමිත්ත 306
ප්‍රත්‍යවේක්ෂණප්‍රඥ 301
ප්‍රාතිහාර්‍ය 278
ප්‍රීතිස්ඵරණතා 306
ප්‍රශ්න තුදුස 174
ප්‍රශ්නව්‍යාකරණ 282
ප්‍රහාණසංඥ 347
ප්‍රහාතව්‍ය ධර්ම 300, 303, 304, 309, 310, 313, 315
ප්‍රියාප්‍රිය ද 171
ඵස්සාහාර 305
ඵළබීජ 320

 බ

බදුලතා 234
බන්ධුමතී 102, 113
බන්ධුමත් 102
බමුණුවම් 55
බඹ 96
බඹදත් 1
බඹලොවට මඟ 97
බඹපෙරෙවි දෙවියෝ 169
බඹවිහරණ 150
බඹසර 156
බඹා හා එක් වන මඟ 92
බල 282
බලකාරණ 230
බව්හිරිය 92, 340
බහුපුත්‍රක දෙවොල 207
බහුපකාරධර්ම 300, 302, 304, 306, 310, 312, 314
බාරාණසී 144, 159
බාහ්‍ය ආයතන 290
බිජු පස 316
බිය කතා 7
බීජගාම 320
බීජබීජ 321
බුදුගුණ 3, 158
බුදුරජුන් අවසන් වදන් 146
බුදුරජුන් පැවැසූ දූ 247
බුදුරජුන් පිරිනිවීම 146
බුදුවරු (සත්) 259
බුදුසස්න 262
බුදුසිරුරට සත්කාර කළයුතු සැටි 143
බුදුහු ආයුපරිච්ඡේදය 136
බුද්ධිජ 102
බුලි රජුහු 147
බේළුව ගම 135
බේළුවපණ්ඩු වීණාව 167
බොජුනෑ පමණ දන්ම 335
බොජ්ඣංග පබ්බය 186
බොරු කීමේ උපත 226
බොරු රත් 4
බෝසතුන් දිසාවත් බැලීම 106
බෝධිපරිච්ඡේදය 101
බෝධිපාක්ෂික ධර්ම 344
බෝධ්‍යංග 308
බෝසත් මව 104
බ්‍රහම 95
බ්‍රහමජාල 20
බ්‍රහමදණ්ඩන 145
බ්‍රහමදත්ත 102, 159
බ්‍රහමභූත 232
බ්‍රහමස්සරතා 252
බ්‍රහමස්වර 155
බ්‍රහ්මුජුගතතා 250
බ්‍රාහමණ 235
බ්‍රාහමණාංග 59

භ

භගලවතී 260
භගු 34, 93
භග්ගවගොත්ත 205
භණ්ඩගාම 139
භද්‍රා 168, 177
භරත 159
භතීසංග්‍රහ 257
භව 270
භවතෘෂ්ණා 263, 303
භවදෘෂ්ටි 263
භවප්‍රත්‍යයයෙන් ජාති 119
භවෞඝ 283

භාගභාර 322
භාරවාජ 34, 91, 93, 231, 322, 340
භාණ්ඩසංග්‍රහ 256
භාවනා 276
භාවනාබල 266
භාෂ්‍ය සමාචාර 239
භියෝභාස උත්තර 101
භුංජති 169
භූතගාම 320
භූතවිද්‍යා 8
භූරිවිද්‍යා 8
භේසිකා 87
භෝගනගර 139
භෝගකාරණ 230
භෝගලාභ 346
භෝජනයේ පමණදන්ම 268, 335
භෝජනේමත්තඤ්ඤුතා 335

ම

මක්ඛලි 324
මගදරට, 42, 167, 222
මඛලපුත්‍ර 324
මඛලි 324
මඩුලු පැනීම් 5
මතුරට උවසර 10
මද 277
මනසාකට 96, 91
මනසකාර කුශලතා 264
මනඃප්‍රද්වේෂමූලකලොකෝත් - පත්ති කථාව 210
මනඃසංස්පර්ශ 124
මනායතන 344
මනෝපදූසක 210, 165
මනෝමයර්ධි 28
මනෝමය ධර්මයක් 67
මනෝමය සිරුරක් 32
මනෝසංචේතනාහාර 280, 305
මනෝසම්ඵස්ස 124
මන්දවලාහක 165
මන්මුවා ඉඳුහු 48
මයුරනිවාපය 213
මර 166
මරසෙන් 166
මරණ 187
මරුඅයැදීම 136
මල්ල 142
මල්ල රජුහු 147, 148
මල්ල රට 261, 205
මල්ලිකාව ගේ අරම 62
මසුරුබව 170
මහණගොයුම් 3
මහණදම කෙලසන දූ 217
මහතුපට්ඨාන 10
මහපුරිස් ලකුණු 249
මහබඹ 146
මහයහන් 6
මහරුව් 260
මහවෙනෙහි 162
මහසමය සූත 167
මහසුදසුන් 148, 149
මහසුජ්තෙරුන් 147
මහාඅපදෙශ 139, 140
මහාගෝවින්ද 160, 161
මහාපනාද 229
මහාපාරග 166
මහාපුරුෂවිතර්ක 311
මහාලි 50
මහාවිජිත 43
මහාව්‍යූහ 159
මහාසමය 167
මහාසමාන 165
මහාසම්මත 235
මහාසුදර්ශන 144
මාගමුන් කෙරෙහි පිළිපැදිය යුතු සැටි 143

මානසඞ් 121
මානකූට 319
මානුස 165
මානුසුත්තම 165
මාතලි 164
මාතෘපිතෘනගර 102
(පෙර බුදුවරුන්ගේ)
මාතුලා නුවර 222
මාතෘපිතෘසංග්‍රහ 256
මාත්‍රඥතා 309
මානසඞ් 121, 287
මායා 102
මාර (අනංගයා) 343, 344
මාරබලය 230
මාහිස්සති 159
මැදුම්සිල් 5, 7
මිණිලකුණු 9
මිතුරෝ 255
මිත්‍රාමාත්‍ය සංග්‍රහ 257
මිථිලා 159
මිථ්‍යාජීවය 8
මිථ්‍යා ජීවිකා 334,
මිථ්‍යාත්වයෝ 310
මිථ්‍යාදෘෂ්ටි 343, 227
මිථ්‍යාත්ව 315, 295
මිසදිටුහු 89
මිථ්‍යාධර්මය 227
මිස්සක 166
මුඛහෝම 8
මුටඨස්සච්චය 265
මුණ්ඩිය 52
මුද්ද 321
මුදුතළුණහත්පාදතා 250
මූලබීජ 320
මූෂකච්ඡින්නවිද්‍යා 8
මූෂකවිද්‍යා 8
මෘගපක්‍ෂ 8
මෘගසංඥව 228
මෙත්තාකායික 165
මෛත්‍රීචිත්තවිමුක්ති 308
මෛත්‍රෙය 229
මෝනෙය්‍ය 277
මෝරිය රජහු 148

ය

යක් 153
යක් සෙනෙවියෝ 261
යඤ්ඤදත්ත 102
යට දෙස 256
යථාලාභසන්තෝෂ 27
යදෘච්ඡාසමුත්පන්නා 12, 14, 15,210
යම 165
යමතග්ගි 34, 93, 340
යමා සල් රුක් 142
යමුනා 164
යස 165
යසවතී 102
යාගවිධා 43
යාගාඞ්ග 44
යාම 166
යෙභුය්‍යසිකා 352
යෝග 283
යෝගක්ෂෙමය 174
යෝනි 284
යෝනිසෝමනසිකාර 301

ර

රකවල 121
රජ 235
රජගහ 1, 21, 60, 130, 156, 167, 212, 253, 258
රජගෙරෙහි 1
රජ්ජුභේද 319
රසග්ගසග්ගිතා 251
රහත්වනු 28, 333

රහමෙර පිමේ දෙස් 254
රාජගහ 144
රාජන්‍ය 191
රාජාගාරකය 1, 132
රාමග්‍රාම 147
රාමපුත්‍රඋද්‍රක 243
රාශි තුන 271, 272
රාහු 165
රුචිර 165
රූප 124
රූපකූට 319
රූපතෘෂ්ණා 200
රූපනිඃශරණ 306
රූපරාග 289
රූපසංග්‍රහ 273
රූපසංඥ 65
රේණු 159
රෝජ 165
රෝරුක 159

ල

ලජ්ජිබව 265
ලම්බිතක 166
ලහඅත් කෙළි 6
ලාභය 121, 122
ලාභයට හානි කරන්නෝ 88
ලාමකධම් තුදුස 253
ලාමසෙට්ඨ 166
ලිච්ඡවි 135, 147
ලූණුවරණ කිළිය 99
ලෝ ඇඳිරිනිරය 104
ලෝකධම් 296, 310
ලෝකාඛ්‍යායිකා 7
ලෝකායත සතර 10
ලෝකෝත්පත්තිවංශ කථාව 209. 211
ලෝහිච්ච 87
ලෝහිතවාසී 165
ලෝහිතහෝම 8

ව

වංස 5
වඩකතා තුන 265
වචීපුරම 255
වඤ්චන 320
වඤ්චන සාවියෝග 4
වරම් දෙව්රජුහු 154
වරුණ 95, 165
වර්ණයට කාරණය 230
වර්ණ සතර 232
වශිතා 27, 330
වසිට්ඨ 34, 93
වස්සකාර 130, 133
වාමක 34, 93, 340
වාමදේව 34, 340
වායසවිද්‍යා 8
වායුදේව 165
වාරුණ 165
වාශිෂ්ඨ 231
වාසවනේසි 165
වාසභී 322
වාසෙට්ඨ 91
වැඩියැ යුතු එක් ධර්මය 300, 302, 304, 310, 313, 314
වැඩීම් පිරිහීම් 7
විකලැඟියන් 6
විචක්ඛණ 166
විචාර 291
විචිකිච්ඡා 646
විඥනය 125
විඥනසමූහ 290
විඥනස්ථිති 128, 280, 295, 347
විඥනාහාර 280, 305
විට්ටු 164
විට්ටුඩ 164
විදූරත්හු 165
විදුසපුව 34
විද්‍යා 278, 267

විද්‍යාචරණ 334
විධාවෝ 271
විධුරසංජීව 101
විනයසම්මුඛතා 351
විනිශ්චය 121, 122
විනිශ්චයවිතර්කය 171
විපත් 288
විපස්සනා 266
විපස්සි 99, 101, 102, 103, 108, 113
විපස්සී ආදී 259
විපුලගිරිවාසී 164
විභජ්ජව්‍යාකරණීය ප්‍රශ්න 282
විභවදෘෂ්ටි 263
විමුක්ති 59, 267
විමුක්තිපරිපාචනීය 290
විමුක්තිවාදී 58
විමුක්තිස්කන්ධ 282
විමුක්ත්‍යායතන 289, 307
විමෝක්ෂ 129, 138, 139, 296
විරාගසංඥා 347
විරූඪ 164
විරූඪක 259
විරූපාක්ෂ 164, 259
විවර්තකල්ප 343
විවර්තස්ථායිකල්ප 343
විවාද මූල 292
විවාදාධිකරණ 351
විශේෂගාමිධර්ම 304
විශේෂභාගික ධර්ම 301, 303, 305, 306, 308, 309, 311, 315
විෂවිද්‍යා 8
විෂ්ණු 165
විසඤ්ඤ 63
විසම්ලෝභය 227
විසල්පුර 50. 135, 207
විසංයෝග 283
විසාඛ 260
විහාර 278
විහිංසානිස්සරණ 306
විහිංසා සඤ්ඤා 269
වීර් සංවරය 254
වීසී 267
වෘශ්චික විද්‍යා 8
වෙරඤ්ජ 88
වෙසවුණු 152, 154
වේටෙණ්ඩු 164
වෙස්ස 236
වෙස්සභූ 99, 101, 159
වෙස්සාමිත්ත 34, 340
වේඛනස 166
වේටෙණ්ඩු 164
වේඨදීපක 147
වේතාල 5
වේදනා 172, 271
වේදනානුපස්සනා 183
වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණා 120
වේදනා සමූහ 290
වේදාංග 337
වේදිය පව්වෙහි 167
වේදේහි 322
වේධඤ්ඤ 241
වේපචිත්ති 165
වේරෝච 165
වේළුවන 253
වෛරාටීපුත්‍ර සංජය 25, 326
වෛශ්‍රවණ 260
වෛශ්‍රවණ පරිචාරක 259
වෝකලන 322
ව්‍යසන 288
ව්‍යාපාද සංඥා 269
ව්‍රතපද සත 175

ශ – ෂ

ශඞ්ඛචක්‍රවර්ත්තී 229
ශමථසී 109
ශමථවිදර්ශනා 302
ශමප්‍රතිපත්තිය 281
ශරපරිත්‍රාණ 8
ශස්ත්‍රාන්තඃකල්පය 228

ශාකුනවිද්‍යා 8
ශාක්‍ය රජ්ජු 147
ශාශ්වත වාද 239
ශාස්තෘ 241
ශාස්තෘගු ස දෙන 323
ශික්‍ෂා 276
ශික්‍ෂාපද 287
ශික්‍ෂා සමූහනන 145
ශිබාභේද 319
ශිව විද්‍යා 8
ශිෂ්‍ය සංග්‍රහ 256
ශීල 41
ශීලවාදී 58
ශීලවිපත්ති දෝෂ 58, 133
ශීලසමාධිප්‍රඥකථා 132
ශීලසම්පත් 58
ශීලසම්පත්හි අනුසස් 133, 288
ශීලස්කන්ධ 282
ශුද්ධාවාස 116, 288
ශුභවිමෝක්‍ෂ 211
ශුභසථායී 209, 233
ශූන්‍යතාසමාධි 276
ශෝක 187
ශෝභනක 5
ශ්‍රද්ධාවිමුක්ත 350
ශ්‍රමණපද්ම 286
ශ්‍රමණපුණ්ඩරීක 286
ශ්‍රමණ-බ්‍රාහමණ සංග්‍රහ 257
ශ්‍රමණ මණ්ඩලය 236
ශ්‍රමණ සුකුමාර 286
ශ්‍රමණාචල 286
ශ්‍රාමණ්‍යඵල 280
ශ්‍රාවකයන් විසින් නොඉක්මියැ
යුතුද්‍ද 249
ශ්‍රාවකසන්නිපාත 101
ශ්‍රුතායුධ 275
ශ්‍රෝතආපත්ත්‍යංග 280
ශ්‍රෝතආපත්තාංග 280
ෂඩංගෝපේක්‍ෂා 308, 315
ෂඩභිඥ 308

ස

සංයෝජන 270, 295, 350
සංයෝජනප්‍රහාණ 333
සංවත්තකල්ප 343
සංවත්තස්ථායීකල්ප 343
සංවේග 143, 267
සංවේග දනවන තැන් 143
සංසාරශුද්ධිවාදය 24
සංස්කාර 333
සංස්කාරදෝෂ 114
සංස්කෘතධාතුව 303
සක්දෙව් 146
සක්දෙව්හු ගේ සතුට 176
සක්විතිහු අනුශාසන 225
සක්විති වත් 223, 224
සඞකලන 322
සඞඛාන 322
සඞ්ග්‍රහවස්තු 285
සඞ්සසම්මුඛතා 351
සචචපබ්බය 187
සඤ්ජය (බෙලට්ඨිපුත්ත) 21, 25, 326
සංඥා 64, 347
සංඥාග්‍රය 65
සංඥා දශය 315
සංඥා නවය 314
සංඥා සත 294
සංඥා සමූහ 290
සංඥී 63
සංඥීගභී 24
සංඥීවාද 15, 17
සතතවිහාර 292
සතර යම් හැවුරුම 25
සතරවන දහන 329
සතානුසාරී 245
සති 265
සතිපට්ඨාන 248, 278
සතිබලය 266
සතිවිනය 351
සතිසම්පජඤ්ඤය 27, 135, 327
සතුරු උවදුරු 170
සත්කාය දෘෂ්ටි 345
සත්කාය නිඃශරණ 306
සත්ත භූ 159
සත්තු සසදතා 250
සත් ධාතු (නොවිසුරුණු) 147
සත්පුරුෂධර්ම 293

සත්‍යාධිෂ්ඨාන 282
සත්ත්ව 233
සත්ත්වානුකම්පා 109
සත්ත්වාවාස 313, 298, 352
සථරගු 89
සදමත්ත 166
සදිසා රැක්ම 256
සද්ධර්ම 293, 305
සනත්කුමාර 154, 156, 158, 160, 166
සනිදර්ශන සප්‍රතිඝ රූප 273
සනාතිකා කෙළිය 5
සනෙත්‍රෂය 328
සන්ධාන 212
සන්නිධිකාර පරිභෝග 5, 321
සප්ත භාරතයෝ 159
සප්ත රත්න 149
සප්පායසම්පජඤ්ඤ 328
සපරිභෝග 8
සබ්බමිත්ත 102
සමණමචල 286
සමථ 266
සමථනිමිත්ත 266
සමදන්තතා 253
සමයප්‍රවාදක 62
සමවත් 27, 330
සමවත්තකඛන්ධතා 251
සමවයසවෙස්සනා 315
සමාධි 276
සමාධිනිමිත්ත 289
සමාධිපරිෂ්කාර 293, 156
සමාධිබලය 266
සමාධිභාවනා 279
සමාධිස්කන්ධ 282
සමාන 165
සමානසුඛදුඃඛමිත්‍ර 255
සමාපත්ති 264
සමාරම්භ 320
සමුද්‍රාඛ්‍යායිකා 7
සම්පජඤ්ඤ 180, 265, 302
සම්පත් 288
සම්ඵප්‍රලාපය පහළවීම 227
සම්බෝධ්‍යංග 293
සම්මාආජීව 190
සම්මාකම්මන්ත 190
සම්මාදිට්ඨි 189
සම්මාවාචා 190
සම්මාවායාම 190
සම්මාසඞ්කප්ප 190
සම්මාසති 190
සම්මාසමාධි 190
සම්බුද්ධාවිනය 351
සම්මුතියෙහි නුවණ 279
සම්‍යක්ත්ව 295
සම්‍යක්ප්‍රධාන 278
සළලඝර 99
සරණදහම් 32
සරණසපුව 34
සරලාගාරක 169
සසඞ්ඛාරපරිනිබ්බායී 289
සහධම්ම 165
සහභූ 165
සහලී 165
සාකෙත 144
සාක්ෂාත් කටයුතු ධර්ම 283, 302, 303, 304, 310, 312, 314, 316
සාබල්‍යය 265
සාවියෝග 320
සාත්ථකසම්පජඤ්ඤ 328
සාමග්‍රාමය 241
සාම්පරායික ආස්‍රව 344
සාරාණීයධර්ම 292, 307
සාරිපුත්තමොග්ගල්ලාන 101
සාලරාජමූල 116
සාලවතිකා 87
සාවත්ථි 144
සාළහ මහණ 134
සැක 346, 272
සැවැත් 62, 99
සැහැ රට 162
සිංහ හෙරණ 50
සිංහනාද 338
සිඛණ්ඩී 168
සිඛාභේද 319
සිබී 99, 101, 102
සිගාලක 253
සියල්ල දක්නා නුවණ 245
සිල් 41
සිල්සපුව 57
සීලබ්බතුපාදාන 322
සීලවිපත්ති 266
සීලවිසුද්ධි 266

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු